330 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 330 - இல. 10
Volume 330 - No. 10

2026 නොවැම්බර් 04වන බදාදා
2026 நவம்பர் 04, புதன்கிழமை
Wednesday, 04th November, 2026



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 1803]

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [තීරුව 1805]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු]තීරු 1806-1821]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

අලි-මිනිස් ගැටුම කළමනාකරණය සඳහා වූ නව ජාතික ක්‍රියාකාරී සැලැස්ම [තීරුව 1822]

ආනයන හා අපනයන (පාලන) පනත:

රෙගුලාසි [තීරු 1828-1971]

පරිපූරක මුදල:

ඉන්ධන සඳහා මිල සහනාධාරයක් ලබා දීම සහ අස්වැසුම වැඩසටහන යටතේ අමතර දීමනාවක් ලබා දීම [තීරුව 1971]

කල්තැබීමේ යෝජනාව:

වනජීවීන් සහ වනරක්ෂිත විනාශ වීම වැළැක්වීම සඳහා මානව සහ භෞතික සම්පත් සැපයීම [තීරු 1972-1984]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තීරු 1984-2000]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

ஒழுங்கமைக்கப்பட்ட குற்றச்செயல்களைத் தடுத்தல் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப:1803]

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப: 1805]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1806 -1821]

தனி அறிவித்தல் மூல வினா:

யானை - மனித மோதல் முகாமைத்துவத்துக்கான புதிய தேசிய செயற்றிட்டம் [ப: 1822]

இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டம்:

ஒழுங்குவிதிகள் [ப:1828-1971]

குறைநிரப்புத் தொகை:

எரிபொருள் விலைக்கான மானியம் வழங்குதல் மற்றும் அஸ்வெசும திட்டத்தின்கீழ் மேலதிகக் கொடுப்பனவு வழங்குதல் [ப: 1971]

ஒத்திவைப்புப் பிரேரணை:

வன ஒதுக்கங்கள் மற்றும் வனவிலங்குகளின் அழிவைத் தடுப்பதற்காக மனித மற்றும் பௌதிக வளங்களை வழங்குதல் [ப: 1972-1984]

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப: 1984-2000]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Prevention of Organised Crimes Bill: Petitions to the Supreme Court [Col. 1803]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1805]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1806-1821]

QUESTION BY PRIVATE NOTICE:

New National Action Plan for Human-elephant Conflict Management [Col. 1822]

IMPORTS AND EXPORTS (CONTROL) ACT:

Regulations [Cols. 1828-1971]

SUPPLEMENTARY SUM:

Provision of Price Subsidy for Fuel and an Additional Allowance under Aswesuma Programme [Col. 1971]

ADJOURNMENT MOTION:

Provision of Human and Physical Resources to Prevent Destruction of Forest Reserves and Wildlife [Col. 1972-1984]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 1984-2000]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2026 නොවැම්බර් 04වන බදාදා
2026 நவம்பர் 04, புதன்கிழமை
Wednesday, 04th November, 2026

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
ஒழுங்கமைக்கப்பட்ட குற்றச்செயல்களைத் தடுத்தல் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
PREVENTION OF ORGANISED CRIMES BILL: PETITIONS TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 නොවැම්බර් 03වන දින නිවේදනයෙහි සඳහන් පෙත්සම් විස්සට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් හයක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

II
පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2026 නොවැම්බර් 04 බදාදා, එනම් අද දින, පූර්ව භාග 11.30ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2025 වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2025 වර්ෂය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2020 වර්ෂය සඳහා සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා තල් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු පී. රුවන් සෙනරත් මහතා (වැඩ බලන රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. ருவன் செனரத் - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி பதில் அமைச்சர்)
(The Hon. P. Ruwan Senarath – Acting Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා 2025 අංක 23 දරන විසර්ජන පනතේ ශීර්ෂය 119 සහ ශීර්ෂය 102 - වැඩසටහන 01 යටතේ පරිපූරක මුදල; සහ

(ii) 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (2026 ඔක්තෝබර් 01 දිනැති අංක 2508/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද)

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) මහව, ඉපලෝගම, අංක 167 යන ලිපිනයෙහි පදිංචි ඒ.එච්.එම්. සීලවති මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) මහව, කෝන්වැව, ඉහළගම යන ලිපිනයෙහි පදිංචි එච්.ඒ. සිරිවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) අඹන්පොල, අබකොලවැව, අංක 26 යන ලිපිනයෙහි පදිංචි පී.ඩී. රවීනා හර්ෂණී පුෂ්පකුමාරි මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) මහව, කෝන්වැව, පොතුවැපිටිය යන ලිපිනයෙහි පදිංචි පී.එන්. සුනිල් ශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -2208/2026- (1), ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මහතා.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මොනරාගල දිස්ත්‍රික්කයේ පිහිටි රජයට අයත් සීනි කර්මාන්තශාලා: විස්තර

மொனராகலை மாவட்டத்திலுள்ள அரசாங்கத்துக்குச் சொந்தமான சீனித் தொழிற்சாலைகள்: விபரம்

STATE-OWNED SUGAR FACTORIES IN MONARAGALA DISTRICT: DETAILS

2250/2026

2. ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ පිහිටි රජයට අයත් සීනි කර්මාන්තශාලා සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා එම කර්මාන්තශාලාවල සීනි නිෂ්පාදනය වාර්ෂිකවල එක් එක් කර්මාන්තශාලාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කර්මාන්තශාලාවලට උක් සපයන ගොවීන් සංඛ්‍යාව කර්මාන්තශාලාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම කර්මාන්තශාලා තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொனராகலை மாவட்டத்தில் அமைந்துள்ள அரசாங்கத்துக்குச் சொந்தமான சீனித் தொழிற் சாலைகளின் எண்ணிக்கையும் அவற்றின் பெயர்களும் யாவை என்பதையும்;

(ii) 2020ஆம் ஆண்டு தொடக்கம் இதுவரை, மேற்படி ஒவ்வொரு தொழிற்சாலையிலும் ஆண்டுதோறும் உற்பத்தி செய்யப்பட்ட சீனியின் அளவு தொழிற்சாலை வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு தொழிற்சாலைக்கும் கரும்பு வழங்குகின்ற விவசாயிகளின் எண்ணிக்கை தொழிற்சாலை வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iv) மேற்படி தொழிற்சாலைகளை மேலும் அபிவிருத்தி செய்வதற்காக மேற்கொள்ளப்பட்டு வரும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Will he inform this House the -

(i) number and names of the State-owned sugar factories located in the Monaragala District;

(ii) sugar production of the said factories from the year 2020 to date, annually and separately, according to each factory;

(iii) number of farmers supplying sugarcane to the said factories, separately according to each factory; and

(iv) measures that will be taken to further develop these factories?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) කර්මාන්තශාලා 02කි.

01. සී/ස ලංකා සීනි පුද්ගලික සමාගම - පැල්වත්ත ඒකකය.

02. සී/ස ලංකා සීනි පුද්ගලික සමාගම - සෙවනගල ඒකකය.

(ii) 01. සී/ස ලංකා සීනි පුද්ගලික සමාගම - පැල්වත්ත ඒකකය.

නිෂ්පාදන තොරතුරු

විස්තරය	2020	2021	2022	2023	2024	2025
සීනි නිෂ්පාදනය (MT)	23,582	30,381	24,110	28,077	27,791	27,361
එතනෝල් නිෂ්පාදනය (Liters)	5,504,451	7,954,732	7,886,247	5,019,333	3,913,648	6,542,271

02. සී/ස ලංකා සීනි පුද්ගලික සමාගම - සෙවනගල ඒකකය

නිෂ්පාදන තොරතුරු

විස්තරය	2020	2021	2022	2023	2024	2025
සීනි නිෂ්පාදනය (MT)	16,115	17,796	12,628	13,704	11,930	8,091
එතනෝල් නිෂ්පාදනය - (Litres)	3,309,172	5,082,476	3,903,948	2,502,646	1,231,651	1,590,550

(iii) 01. සී/ස ලංකා සීනි පුද්ගලික සමාගම පැල්වත්ත ඒකකය - 4,955

02. සී/ස ලංකා සීනි පුද්ගලික සමාගම සෙවනගල ඒකකය - 3,920

(iv) ඔව්.

01. සී/ස ලංකා සීනි පුද්ගලික සමාගම පැල්වත්ත ඒකකය

- එතනෝල් ගබඩා කිරීම සඳහා ලීටර් 500,000ක ධාරිතාවකින් යුතු නව ලේගරයක් පැල්වත්ත ඒකකයේ ඉදිකිරීම
- හෙක්ටෙයාර 1,500ක බිම් ප්‍රමාණයක් වගාව සඳහා වැඩි කිරීම
- ජෛව පොහොර ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම
- උක් වගාව ආශ්‍රිතව සංචාරක ව්‍යාපෘති ඇති කිරීම

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

02. සී/ස ලංකා සීනි පුද්ගලික සමාගම සෙවනගල ඒකකය

- ස්කාගාරයේ එතනෝල්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා යන්ත්‍ර සූත්‍ර නවීකරණය කිරීම

උක් ගස්වල සීනි ප්‍රතිශතය වැඩි කර ගැනීම සඳහා නව උක් ප්‍රභේද හඳුන්වා දීම

(ආ) අදාළ නොවේ.

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, පරිසර ගැටලු නිසා ජෙව පොහොර නිෂ්පාදනය කිරීම සඳහා අලුතින් කර්මාන්තශාලාවක් ආරම්භ කළා. මිලියන ගණනක් වියදම් කරලා එම ජෙව පොහොර කර්මාන්තශාලාව හදන්න කටයුතු කළා. මේ වනකොට එම කර්මාන්තශාලාව හදලා අවසන් කර තිබෙනවා. හැබැයි, මේ වනතුරු එම කර්මාන්තශාලාව තුළින් කිසිම ජෙව පොහොර නිෂ්පාදනයක් කරගෙන යන්නේ නැහැ. මේ වනකොට එහි සීනි ගබඩා කර තිබෙන ආරංචිය තමයි අපට ලැබිලා තිබෙන්නේ. විශාල මුදලක් මේ සඳහා වියදම් කරලා තිබෙනවා. එතනෝල් නිෂ්පාදනය කිරීමේදී දිනකට ඉස්කාගාරයකින් අපදියර ලීටර් ලක්ෂ තුනහමාරකට වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය වෙනවා. මා එහෙම කියන්නේ, එක ස්ප්‍රිතු ලීටරයක් නිෂ්පාදනය කරන කොට අපදියර ලීටර් 13කට වඩා වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය වන නිසායි. එම අපදියරවලින් පොහොර නිෂ්පාදනය කරන්න තමයි එම කර්මාන්තශාලාව ඇති කළේ. හැබැයි, මිලියන ගණනාවක් වියදම් කරලා එම කර්මාන්තශාලාව ඉදි කළත් තවම එහි නිෂ්පාදන කටයුතු ආරම්භ කර නැති නිසා, එම අපදියර සියල්ලම පරිසරයට තමයි මුදා හරින්නේ. එම සීනි සමාගමට අයත් ඉඩම්වල විශාල වළවල් හදලා එම අපදියර ඒවාට දැම්මත්, අපදියර පරිසරයට ඇතුළු වෙනවා. ඒ නිසා එම කර්මාන්තශාලාවේ කටයුතු කඩිනමින් ආරම්භ කළොත් මෙම පාරිසරික ප්‍රශ්නය විසඳෙනවා. ඒ වාගේම, විශාල ආදායමක් ලබා ගන්නත්, ජෙව පොහොර ප්‍රශ්නය විසඳා ගන්නත් පුළුවන් වෙනවා. එම නිසා එම කර්මාන්තශාලාව ආරම්භ කරනවාද කියන ප්‍රශ්නය තමයි මට ඔබතුමාගෙන් අහන්න තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය විෂය භාර ඇමතිතුමා වෙත යොමු කරන්නම්.

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

පැල්වත්ත සීනි සමාගම යටතේ ජනාවාස 16ක් තිබෙනවා. එම ජනාවාස 16න් ජනාවාස 10කට, වාරි ඉඩම් හෙක්ටෙයාර 2,500කට ජලය ලබා ගැනීම සඳහා පැල්වත්ත සීනි සමාගම මේ වන විට ශක්‍යතා වාර්තාව හදලා තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. උමා ඔය තුළින් හඳපානාගලට ජලය ලබා ගත්තාට පස්සේ ඒ හඳපානාගල ජලයෙන් වී වගා කරන ගොවීන්ට කරදරයක් නැතුව වී වගා කරන්න, ජනාවාස 10කට, හෙක්ටෙයාර 2,500කට ජලය ලබා දෙන්න පුළුවන් බවට ශක්‍යතා වාර්තාවක් හදලා, පැල්වත්ත සීනි සමාගම විසින් ඇස්තමේන්තුවක් සකස් කරලා තිබෙනවා, රුපියල් මිලියන 500ක. මම දන්නේ නැහැ, ගරු ඇමතිතුමාට මුදල් සම්බන්ධව කරදරයක් එහෙම තිබෙනවාද කියලා. මා හිතන්නේ නැහැ, මුදල් අඩුපාඩුවක් තිබෙනවා කියලා. ඒ රුපියල් මිලියන 500 අඩු ගණනේ අවුරුද්දකට මිලියන 100 බැගින් වන පරිදි හෝ වියදම් කරලා පැල්වත්ත ජනාවාසවලට ජලය ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පුළුවන්ද, එය එසේ කරනවාද කියන එක තමයි මා දෙවන අතුරු ප්‍රශ්නය හැටියට අහන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු අතුරු ප්‍රශ්න දෙකට පිළිතුරු අදාළ විෂය භාර ඇමතිවරයා හෝ නියෝජ්‍ය ඇමතිවරයා මඟින් ඉදිරි දවස් දෙක ඇතුළත පැවැත්වෙන විවාදයේදී අපි ලබා දෙන්නම්. *[බාධා කිරීමක්]*

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
හොඳයි. මට ඒ පිළිතුර ලබා දෙන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
අනිවාර්යයෙන් ලබා දෙනවා. *[බාධා කිරීමක්]* ඔව්, විශේෂයක් කරලා ඔබතුමාට පිළිතුර ලබා දෙනවා.

48cc ධාරිතාවෙන් යුත් යතුරුපැදි භාවිතය: රියැදුරු බලපත්‍රයක අවශ්‍යතාව

48cc மோட்டார் சைக்கிள்களின் பயன்பாடு: சாரதி அனுமதிப்பத்திர தேவைப்பாடு

USE OF 48CC MOTORCYCLES: REQUIREMENT OF DRIVING LICENCE

2295/2026

3. ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රියැදුරු බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් නොමැති හෝ විවිධ හේතු මත සාමාන්‍ය යතුරුපැදි භාවිත කළ නොහැකි ඇතැම් පුද්ගලයන් විසින් 48cc ධාරිතාවෙන් යුත් යතුරුපැදි භාවිත කරන බව දන්නේද;

(ii) පොලිස් නිලධාරීන් විසින් එම යතුරුපැදි ධාවනය කරන පුද්ගලයන්ගෙන් රියැදුරු බලපත්‍ර ඉල්ලා සිටීම සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම මඟින් අපහසුතාවට පත් වන බව දන්නේද;

(iii) මේ වන විට පවතින නීතිය අනුව 48cc ධාරිතාවෙන් යුත් යතුරුපැදියක් ධාවනය කිරීම සඳහා රියැදුරු බලපත්‍රයක් අනිවාර්ය වන්නේද;

(iv) එසේ නම්, එම යතුරුපැදි භාවිත කරන ගොවීන්, වැඩිහිටියන් සහ අඩු ආදායම්ලාභී පුද්ගලයන්

සඳහා සහනදායි නීතිමය හෝ පරිපාලන ක්‍රමවේදයක් හඳුන්වා දීමට රජයේ අවධානය යොමු වී තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சாரதி அனுமதிப்பத்திரத்தைப் பெற்றுக் கொள்வதற்குத் தகுதி இல்லாத அல்லது பல்வேறு காரணங்களால் சாதாரண மோட்டார் சைக்கிள்களைப் பயன்படுத்த முடியாத சில நபர்கள் 48cc இயந்திரத் திறன்கொண்ட மோட்டார் சைக்கிள்களைப் பயன்படுத்தி வருவதை அறிவாரா என்பதையும்;

(ii) பொலிஸ் உத்தியோகத்தர்கள் மேற்படி மோட்டார் சைக்கிள்களை செலுத்துகின்ற நபர்களிடம் சாரதி அனுமதிப்பத்திரத்தை கேட்பதனூடாகவும், சட்ட நடவடிக்கை மேற்கொள்வதனூடாகவும் அவர்கள் அசௌகரியத்துக்கு உள்ளாவதை அறிவாரா என்பதையும்;

(iii) தற்போது காணப்படுகின்ற சட்டத்தின் அடிப்படையில் 48cc இயந்திரத்திறன் கொண்ட மோட்டார் சைக்கிள்களை ஓட்டுவதற்குச் சாரதி அனுமதிப்பத்திரம் கட்டாயமானதா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி மோட்டார் சைக்கிள்களைப் பயன்படுத்துகின்ற விவசாயிகள், முதியோர்கள் மற்றும் குறைந்த வருமானம் பெறுவோருக்கு சலுகை அடிப்படையிலான சட்ட அல்லது நிருவாக முறைமையொன்றை அறிமுகப்படுத்து வதற்கு அரசாங்கத்தின் கவனம் செலுத்தப் பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அது தொடர்பான விபரங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) whether he is aware that certain individuals who are not qualified to obtain a driving licence or who are unable to use ordinary motorcycles due to various reasons ride motorcycles with an engine capacity of 48cc;

(ii) whether he is aware that individuals riding such motorcycles face hardships as police officers demand driving licences from them and initiate legal action against them;

(iii) whether a driving licence is mandatory to ride a motorcycle with an engine capacity of 48cc under the existing law;

(iv) if so, whether the government has focused its attention on introducing a concessionary legal or administrative mechanism for farmers, elderly persons, and low-income groups who ride the said motorcycles; and

(v) if so, the details in that regard?

(b) If not, why?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

මේ ප්‍රශ්නය යොමු වන්නේ 48cc - 50ccවලට වඩා අඩු - ධාරිතාවෙන් යුතු යතුරුපැදි ධාවනය කිරීමේදී රියැදුරු බලපත්‍රයක් අවශ්‍යද කියන කාරණය සහ ඒ මෝටර් සයිකල් ලියාපදිංචි කිරීම කියන කාරණය පිළිබඳවයි. ඒ සම්බන්ධවයි මේ කියන ගැටලුව මතු වන්නේ.

2009 අංක 8 දරන මෝටර් වාහන (සංශෝධන) පනත කියලා පනතක් ගෙන ආවා. එම පනතේ සංශෝධනයට අනුව රටේ නීතියක් තිබෙනවා, මේ යතුරුපැදි register කරන්න ඕනෑ සහ ධාවනය කරන කොට වලංගු රියැදුරු බලපත්‍රයක් තිබිය යුතුයි කියලා. හැබැයි, අපි දන්නවා, අපි හැමෝම තේරුම් ගන්නවා, මේ යතුරුපැදි පාවිච්චි කරන්නේ කුමන කර්තව්‍යයක් සඳහාද කියලා. සාමාන්‍ය වශයෙන් ගත්තොත්, එක්කෝ කෙහෙල් කැනක් එහි පිටුපස තියාගෙන යන්න, එහෙම නැත්නම් ගෑස් සිලින්ඩරයක් පිටුපස තියාගෙන යන්න, එහෙම නැත්නම් තමන්ගේ දරුවා උදේ පාන්දර බස් එකකට ගෙනිහින් දාන්න, එහෙමත් නැත්නම් වී මුට්ටයක් තියාගෙන යන්න වාගේ කාර්යයකට තමයි පාවිච්චි කරන්නේ. එහෙම නැතුව ඒවා වෙඩි තියලා පැනලා යන්න, හොරා කාලා පැනලා යන්න වැනි සාපරාධි ක්‍රියාවන්ට පාවිච්චි කරන බයිසිකල් නොවෙයි. ඒ පිළිබඳව අපට අවබෝධයක් තිබෙනවා. මෙය අපි හදපු නීතියක් නොවෙයි. 2009 අංක 8 දරන මෝටර් වාහන පනත සංශෝධනය වීමේදී මේ නීතිය ඇතුළත් කර තිබෙනවා. මේ පිළිබඳව සමාජයේ යම්කිසි කතිකාවක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, අපි බලාපොරොත්තු වෙනවා, මේ පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා අපි ගන්න තීන්දු තීරණ මොනවාද කියලා උපදෙස් පතන්න.

ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 48cc ධාරිතාවෙන් යුතු යතුරුපැදි ධාවනය කිරීම සඳහා A1 වාහන පන්තියට අදාළ වලංගු රියදුරු බලපත්‍රයක් ලබාගෙන තිබීම අනිවාර්ය වේ.

(ii) මෙම දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාළ නොවේ.

(iii) 48cc ධාරිතාවෙන් යුතු යතුරුපැදි ධාවනය කිරීම සඳහා සැහැල්ලු මෝටර් සයිකල් රියදුරු බලපත්‍රය ලබා ගැනීම අනිවාර්ය වේ. ඇමුණුමෙහි විස්තර දැක්වේ. ඇමුණුම **සභාගත*** කරමි.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

(iv) මෙම වර්ගයේ යතුරුපැදි ලියාපදිංචි කිරීම සඳහා සහනදායී ක්‍රමවේදයක් හඳුන්වා දීමට මෙම දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී ඇත. ඒ අනුව නිසි ක්‍රමවේදයක් සකස් කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියපු කාරණය වැරදියි. මෝටර් වාහන පනත සංශෝධනය කරලා මොපෙඩ් බයිසිකල් සඳහා ලියාපදිංචි සහතිකය සහ රියදුරු බලපත්‍රය අවශ්‍යයි කියන තීන්දුව ආවේ 2024 සංශෝධිත ඒකාබද්ධ පනත අනුව; එහි 203 වන අධිකාරය අනුව. ඔබතුමා 2009 අංක 8 දරන මෝටර් වාහන පනත සංශෝධනයේදී කියලා කියපු කාරණය වැරදියි. එම නිසා පාර්ලිමේන්තුව නොමඟ යවන්න එපා.

මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ ග්‍රාමීය ප්‍රදේශවල අඩු ආදායම්ලාභීන්, වයෝවෘද්ධ අය, එහෙමත් නැතිනම් කාන්තාවන් හා රෝගීන් තමයි එම බයිසිකල් පාවිච්චි කරන්නේ කියන එක. ඒ වාගේම එම බයිසිකල් පාවිච්චි කරන්නේ, එක්කෝ කුඹුරට යන්න, එහෙමත් නැත්නම් ළඟම මොන්ටිසෝරියට යන්න. ගමේ අතුරු පාරවල්වල තමයි ඒ බයිසිකලය පාවිච්චි කරන්නේ. එම බයිසිකලය ධාවනය කිරීම සඳහා රියදුරු බලපත්‍රයක් අවශ්‍යයි සහ බයිසිකලය ලියාපදිංචි කරන්න අවශ්‍යයි කියන කාරණය කලින් තිබුණේ නැහැ. පනතට පසුව ගෙනා සංශෝධන තමයි ඒ. එම නිසා, ඒකෙන් මිනිසුන්ට සිදුවෙන නීතිමය හා ආර්ථික අපහසුතා මහහරවා සහනයක් දෙන්න ඔබතුමන්ලා ඉතා ඉක්මනින්, කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවාද?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අන්තිම කෑල්ල අල්ලාගෙන තිබෙන්නේ. මේ පිළිතුරට අදාළ ඇමුණුම 01හි සඳහන් කොටසක් මම කියවන්නම්. "1981 අංක 21 දරන සංශෝධිත මෝටර් වාහන පනතේ 240 වගන්තිය මඟින්, පැදවීම පිණිස පැඩල් සවිකර ඇත්තා වූ ද සහ සෙන්ටිමීටර් පනහකට නොවැඩි සහ ධාරිතා පද්ධතියක් ඇති අන්තර් දහන එන්ජිමක් සහිත වාහනය 'මොපෙඩය' ලෙස අර්ථ නිරූපණය කර ඇති අතර, එම අර්ථ නිරූපණය 2009 අංක 08 දරන සංශෝධනය මඟින් පැදවීම පිණිස පැඩල් සවිකර ඇත්තා වූ ද සහ සෙන්ටිමීටර පනහකට වැඩි නොවන සිලින්ඩර් ධාරිතාවක් ඇත්තා වූ ද, අන්තර් දහන එන්ජිමක් සහිත මෝටර් සයිකලයක් අදහස් වේ ලෙස ආදේශ කර ඇත"

එම 'මෝටර් සයිකලය' මෙසේ අර්ථ නිරූපණය කර තිබෙනවා. "240 වගන්තිය (22) අනුව 'මෝටර් සයිකලය' යන්නෙන් රෝද තුනකට වැඩි නොවන රෝද ගණනකින් යුත් ගමන් කිරීම සඳහා සකස් කර ඇති මෝටර් ට්‍රයිසිකලයක් හෝ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථයක් හැර මොපෙඩ් රථයක් ඇතුළු එයට සම්බන්ධ කර ඇති යම් රථයක තාර බරද සමඟ කිලෝග්‍රෑම් දෙසියපනහක් නොඉක්මන තාර බරකින් සමන්විත මෝටර් වාහනයක් අදහස් වේ."

ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද වෙන්නේ කියන එක සම්පූර්ණ පනත කියවා ගත්තාම තේරුම් ගත හැකියි. කලින් දීපු පිළිතුරම තමයි මට කියන්න තිබෙන්නේ. අපි තේරුම් අරගෙන තිබෙනවා, මේක සමාජයේ තිබෙන ප්‍රශ්නයක් බව. මම කලින් කිව්වා වාගේ එය වැරදි කටයුතු සඳහා පාවිච්චි කරන බයිසිකලයක් නොවෙයි. අඩු ආදායම්ලාභී පවුල් වැඩි ප්‍රමාණයක් එම බයිසිකලය පාවිච්චි කරන්නේ තමන්ගේ එදිනෙදා පොඩි පොඩි දේවල් කර ගැනීම සඳහායි. මේ පිළිබඳ නීතියක් තිබෙනවා. නීතිය දැන් හැදිලා තිබෙනවා. නීතිය තිබියදී අපි නීතියට පිටින් කටයුතු කරන්නේ කොහොමද කියන ගැටලුවත් තිබෙනවා. එම නිසා ගරු කථානායකතුමනි, මම කලින් කිව්වා වාගේ අපි බලාපොරොත්තු වෙනවා, මේ පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා අපි ගන්න තීන්දු තීරණ මොනවාද කියලා උපදෙස් පතන්න. ඒක තමයි ගරු මන්ත්‍රීතුමාට දෙන්න තිබෙන උත්තරය.

ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

2009 පනත සංශෝධනය මඟින් සිද්ධ කරලා තිබෙන්නේ, මොපෙඩ් රථයක් ලියාපදිංචිය නොමැතිව ධාවනය කරන්න පුළුවන් කියන තත්ත්වයයි.

මේ 2024දී ගෙනාපු සංශෝධිත ඒකාබද්ධ පනතින් තමයි ඒකට ලයිසන් ඕනෑ කියන එක නැවත නීතියක් බවට පත් වෙන්නේ. ඒ නිසා වැරදි අර්ථකථන දෙන්න එපා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් තිබෙනවා 460cc සිට 1000ccවලටත් වැඩි එන්ජින් ධාරිතාව තිබෙන මෝටර් සයිකල්. ඒවා පසුගිය කාලයේ දිගටම අත්අඩංගුවට ගත්තා. අත්අඩංගුවට ගත් ඒවා දැන් පොලීසිවල තිබෙනවා. මම දන්නා පරිදි එන්ජින් ධාරිතාව 450cc ඉඳන් 1001cc වනතුරු ලියාපදිංචි කිරීමේ අවසරයක් තිබෙනවා. නමුත්, 1001ccට වැඩි ඒවාට තවම නීතිමය තත්ත්වයක් නැහැ. හැබැයි, එම බයිසිකල් යම්කිසි ප්‍රමාණයකුත් තිබෙනවා. ඒවා තරුණයෝ ක්‍රීඩා සඳහා සහ තරුණයන්ගේ වුවමනා සඳහා පාවිච්චි කරනවා. එම නිසා ඒ තරුණයන්ට ඒ බයිසිකල් සම්බන්ධව තිබෙන නීතිමය තත්ත්ව හා අවභිරතා ඉවත් කරලා දීලා, ඒ අත්අඩංගුවේ තිබෙන බයිසිකල් නිදහස් කරලා, ඒ අයට විධිමත් ක්‍රියාවලියක් තුළින් ධාවන පථයක හෝ සුදුසු තැනක ඒවා ධාවනය කරන්නට හැකි වන සේ අවශ්‍ය ක්‍රියාමාර්ග හදන්නට ඔබතුමන්ලා ඉදිරියේදී අමාත්‍යාංශය විධියට බලාපොරොත්තු වෙනවාද?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු මන්ත්‍රීතුමනි, අපි කමිටුවක් පත් කරලා තිබෙනවා. සාමාන්‍ය පාවිච්චියට නොවෙයි, sport utility එකක් විධියට හරි පාවිච්චි කරන්න පුළුවන්ද කියලා සොයා බලා නිර්දේශ දෙන්න කියලායි අපි කියා තිබෙන්නේ. එම කමිටුව ඒ සම්බන්ධයෙන් අධීක්ෂණය කරලා අපට නිර්දේශ ලබා දෙයි. එම නිර්දේශ අනුව අපි ඉදිරියට ක්‍රියාත්මක වෙනවා.

එන්ජින් ධාරිතාව 50cc ට අඩු යතුරුපැදි/මොපෙඩ්: ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය

50ccக்குக் குறைவான எஞ்சின் திறன்கொண்ட மோட்டார் சைக்கிள்கள்/மொபெட்கள்: பதிவு செயல்முறை

MOTORCYCLES/ MOPEDS BELOW 50CC ENGINE CAPACITY: REGISTRATION PROCESS

2299/2026

4. ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වන විට ලියාපදිංචි කර ඇති, එන්ජින් ධාරිතාව ඝන සෙන්ටිමීටර 50ට (50cc) අඩු මෝටර් සයිකල් සහ මොපෙඩ් (Moped) සංඛ්‍යාව කොපමණද;

(ii) එම මෝටර් සයිකල් සහ මොපෙඩ් ලියාපදිංචි කිරීම සඳහා වර්තමානයේ පවතින ක්‍රමවේදය කවරේද;

(iii) එන්ජින් ධාරිතාව 50cc ට අඩු මෝටර් සයිකල් ලියාපදිංචි කිරීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි, ඉදිරිපත් කළ යුතු ලේඛන සහ තාක්ෂණික අවශ්‍යතා කවරේද;

(iv) 2010 වර්ෂයට පෙර මිලදී ගන්නා ලද, එන්ජින් ධාරිතාව 50ccට අඩු මෝටර් සයිකල් සහ මොපෙඩ් ලියාපදිංචි කිරීම සඳහා සහනදායී ක්‍රමවේදයක් හෝ විශේෂ සහන කාලයක් ලබාදීම කෙරෙහි අවධානය යොමුවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் இதுவரையில் பதிவு செய்யப் பட்டுள்ள, எஞ்ஜின் கொள்ளளவு 50 கன சென்டிமீட்டருக்கு (50cc) குறைவான மோட்டார் சைக்கிள்கள் மற்றும் மொபெட்களின் (Moped) எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி மோட்டார் சைக்கிள்கள் மற்றும் மொபெட்களைப் பதிவுசெய்வதற்காக தற்போது நடைமுறையிலுள்ள முறைமை யாது என்பதை யும்;

(iii) எஞ்சின் கொள்ளளவு 50ccக்கும் குறைவான மோட்டார் சைக்கிள்களைப் பதிவு செய்வதற் காகப் பூர்த்தி செய்யப்பட வேண்டிய நிபந்தனைகள், சமர்ப்பிக்கப்பட வேண்டிய ஆவணங்கள் மற்றும் தொழில்நுட்பத் தேவைகள் யாவை என்பதையும்;

(iv) 2010ஆம் ஆண்டுக்கு முன்னர் கொள்வனவு செய்யப்பட்ட, எஞ்சின் கொள்ளளவு 50ccக்கும் குறைவான மோட்டார் சைக்கிள்கள் மற்றும் மொபெட்களைப் பதிவுசெய்வதற்காக எளிய நடைமுறையொன்றை அல்லது விசேட சலுகைக் காலமொன்றை வழங்குவது குறித்து கவனம் செலுத்தப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the number of motorcycles and mopeds with an engine capacity of less than 50 cubic centimeters (50cc) currently registered in Sri Lanka;

(ii) the procedure currently in place for registering such motorcycles and mopeds;

(iii) the conditions to be fulfilled, documents to be submitted, and technical requirements to be met for the registration of motorcycles with an engine capacity of less than 50cc; and

(iv) whether attention has been drawn to providing a concessionary procedure or a special grace period for the registration of motorcycles and mopeds with an engine capacity of less than 50cc purchased prior to the year 2010?

(b) If not, why?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මේ වන විට ලියාපදිංචි කර ඇති එන්ජින් ධාරිතාව ඝන සෙන්ටිමීටර් 50ට - 50cc - අඩු යතුරුපැදි හා මොපෙඩ් සංඛ්‍යාව 70,915කි.

(ii) සිලින්ඩර් ධාරිතාව 50ට අඩු යතුරුපැදි - මොපෙඩ් - ලියාපදිංචි කිරීම සඳහා වර්තමානයේ පවතින ක්‍රමවේදය ඇමුණුම 01 මඟින් දැක්වේ.

(iii) එන්ජින් ධාරිතාව 50cc අඩු යතුරුපැදි ලියාපදිංචි කිරීම සඳහා සම්පූර්ණ කළ යුතු කොන්දේසි ඉදිරිපත් කළ යුතු ලේඛන හා තාක්ෂණ අවශ්‍යතා ඇමුණුම 02 මඟින් දැක්වේ.
ඇමුණුම 01 සහ 02 **සභාගත*** කරමි.

(iv) 2010 වර්ෂයට පෙර මිලට ගෙන ඇති එන්ජින් ධාරිතාව 50ccට අඩු යතුරුපැදි හා මොපෙඩ් ලියාපදිංචි කිරීම සඳහා සහනදායී ක්‍රමවේදයක් සලසා දීම කෙරෙහි මෙම දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී ඇත. ඒ අනුව නිසි ක්‍රමවේදයක් සකස් කර අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඊට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

** ප්‍රශ්නකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා]

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පැයට කිලෝමීටර 20ක, 30ක වේගයෙන් යන මෝටර්සයිකල්, එහෙම නැත්නම් මොපෙඩ් වර්ගයේ මෝටර්සයිකල් ගොඩක් වෙලාවට පාවිච්චි කරන්නේ අඩු ආදායම් ලබන සමාජයේ සිටින ඉතා අහිංසක කණ්ඩායම්. මෑත වකවානුවේ ඒ අයට මතු වී තිබෙන ප්‍රශ්නය තමයි, පොලීසිය දිගින් දිගටම ඒ අය පසුපස එළවා ගිහින් ඒ බයිසිකල් අරගෙන ඇවිත් උසාවි දමන එක. ඒ ජනතාව ඒ සම්බන්ධව මැසිවිලි නඟනවා. ඔවුන් අපට කියන්නේ මේ ගැටලුව නිරාකරණය කර දෙන්න මැදිහත් වෙන්න කියලායි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 2010 වර්ෂයට කලින් ගෙන්වූ බයිසිකල්වලට රිසිට් එකක් අවශ්‍ය වන්නේ නැහැ. හැබැයි, 2010න් වර්ෂ 16කට පමණ පසුව මේ බයිසිකල් මිලදී ගත් අය ළඟ රිසිට් එකක් නැහැ. ඒ වාගේම ආනයන බලපත්‍රයක්වත්, මොකක්වත් නැහැ. ඒ නිසා මේ බයිසිකල් ලියාපදිංචි කිරීමේ ගැටලුවක් දැන් ඒගොල්ලන්ට මතුව තිබෙනවා. ඒ අයට මේ බයිසිකල් ලියාපදිංචි කරන්න වුවමනා වුණත්, දැන් එහෙම කරන්න විධියක් නැහැ, අවශ්‍ය රිසිට්පත් සහ බිල්පත් 2010 වර්ෂයෙන් පසුව ගෙන්වූ බයිසිකල්වලට නැතිවීම නිසා. 2010 වර්ෂයට කලින් ගෙන්වූ ඒවාට යම් කිසි ආවරණයක් තිබුණා. මම කියන්නේ මේ තත්ත්වය වෙනස් වෙන්න අවශ්‍ය බවයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්නේ මේ සම්බන්ධයෙන් යම් මැදිහත්වීමක් කරන්න පුළුවන්ද කියන කාරණයයි.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

අපි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර මේ සම්බන්ධව උපදෙස් ලබා ගන්නවා. ඒ උපදෙස් ලැබුණු පසු අපි ඒ පිළිබඳව කටයුතු කරනවා. මොකද, තිබෙන නීතිය වෙනස් කරන්න අපට බැහැ. තිබෙන නීතිය වෙනස් කරනවා නම් ඒ සඳහා පනත වෙනස් කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් වන උපදෙස් තමයි අපි පතන්නේ. ඒ ලැබෙන උපදෙස් අනුව අපි ඉදිරි ක්‍රියාමාර්ග ගන්නවා.

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇත්තටම ඔය පනත තුළ මේ බයිසිකල් classification එක සම්බන්ධව pedal එක තිබීම වාගේ කාරණා කිහිපයක් සඳහන් කර තිබුණාට, මේ සමහර බයිසිකල් ලියාපදිංචි කරන්න බැහැ. මොකද, මේ සමහර බයිසිකල් වර්ගවල signal lights පවා නැහැ. මෝටර් බයිසිකලයක් register කිරීමේදී signal lights වාගේ අත්‍යවශ්‍ය දේවල් තිබෙන්න ඕනෑ. මේ සමහර modelsවල ඒ මොකුත්ම නැහැ. ඒ නිසා මම හිතනවා, ඒ තාක්ෂණික පැත්තත් හරියට classify වෙන්න අවශ්‍යයි කියලා. එහෙම නැතිව, මේ බයිසිකල් ලියාපදිංචි කිරීම සඳහා නීති ගෙනාවාට ඒ බයිසිකල් හිමිකරුවන්ට ඒවා ලියාපදිංචි කරන්න බැරි වනවා. නමුත්, ලියාපදිංචි නොකර ඒ බයිසිකලය පැදගෙන යනකොට පොලීසියෙන් අල්ලා, උසාවි දාලා, දඩ ගහන ප්‍රශ්නයක් තිබෙනවා. එම නිසා මේ සම්බන්ධයෙනුත් යම් මැදිහත් වීමක් කරන්න කියලා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට යෝජනා කරනවා.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ඔව්, ගරු මන්ත්‍රීතුමනි, පූර්ණ අධික්ෂණයකින් තොරව තමයි මේ නීති ගෙනැල්ලා තිබෙන්නේ. ඒ නිසා තමයි මේ නීති වෙනස් කළ යුත්තේ කෙසේද කියන එක අපි සාකච්ඡාවට ගත යුතු වන්නේ.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල: ධාවන තත්ත්වය
இலங்கை புகையிரதத் திணைக்களத்துக்குச் சொந்தமான புகையிரத என்ஜின்கள்/ இயக்கவலுத் தொகுதிகள்: இயங்கும் நிலை
LOCOMOTIVES/ POWER SETS OWNED BY SRI LANKA RAILWAYS: RUNNING CONDITION

2457/2026

5.ගරු ධනුෂ්ක රංගනාත් මහතා
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ දිනකට අපේක්ෂිත දුම්රිය ගමන් වාර සංඛ්‍යාව සහ මේ වන විට දිනකට ධාවනය වන සැබෑ දුම්රිය ගමන් වාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සමස්ත දුම්රිය ගමන් වාර ආවරණය කිරීම සඳහා අවශ්‍ය වන දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතුව පවතින මුළු දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල සංඛ්‍යාව කොපමණද;

(iv) එම එන්ජින් සහ බලවේග කට්ටල අතරින් මේ වන විට සක්‍රිය ධාවන තත්ත්වයේ පවතින ප්‍රමාණය කොපමණද;

(v) තාවකාලිකව ධාවනයෙන් ඉවත් කර ඇති, එහෙත් නැවත ධාවන තත්ත්වයට පත් කළ හැකි මට්ටමේ පවතින දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල සංඛ්‍යාව කොපමණද;

(vi) අක්‍රිය මට්ටමේ පවතින එම දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල නැවත ධාවනයට එක් කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(vii) එම ක්‍රියාමාර්ගවල වත්මන් ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் நாளொன்றுக்கு எதிர்பார்க்கப் படும் புகையிரதப் பயணங்களின் எண்ணிக்கை மற்றும் தற்போது நாளொன்றுக்கு இயக்கப்படும் புகையிரதப் பயணங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி முழுப் புகையிரதப் பயணங்களையும் மேற்கொள்வதற்குத் தேவையான புகையிரத என்ஜின்கள் மற்றும் இயக்கவலுத் தொகுதிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) இலங்கை புகையிரதத் திணைக்களத்திடம் காணப்படும் மொத்தப் புகையிரத என்ஜின்கள் மற்றும் இயக்கவலுத் தொகுதிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி என்ஜின்கள் மற்றும் இயக்கவலுத் தொகுதிகளில் தற்போது முனைப்பாக இயங்கும் நிலையிலுள்ளவற்றின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) தற்காலிகமாக இயங்குவதிலிருந்து அகற்றப் பட்டிருப்பினும் மீண்டும் இயங்கும் நிலைக்குக் கொண்டுவரக்கூடிய மட்டத்திலுள்ள புகையிரத என்ஜின்கள் மற்றும் இயக்கவலுத் தொகுதிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(vi) செயலிழந்த மட்டத்திலுள்ள மேற்படி புகையிரத என்ஜின்கள் மற்றும் இயக்கவலுத் தொகுதிகளை மீண்டும் பயணத்தில் ஈடுபடுத்துவதற்காக இன்றளவில் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக் கைகள் யாவை என்பதையும்;

(vii) மேற்படி நடவடிக்கைகளின் தற்போதைய முன்னேற்றம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) separately, the number of scheduled daily train trips and the number of daily train trips currently operated in Sri Lanka;

(ii) the number of locomotives and power sets required to cover all the aforesaid train trips;

(iii) the total number of locomotives and power sets owned by Sri Lanka Railways;

(iv) the number that are currently in active running condition, out of the aforesaid locomotives and power sets;

(v) the number of locomotives and power sets which have been temporarily withdrawn from service but are capable of being restored to running condition;

(vi) the measures that have been taken to bring the aforesaid non-operational locomotives and power sets back into service to date; and

(vii) the current progress of the aforesaid measures?

(b) If not, why?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මගී දුම්රිය - 331යි

බඩු ප්‍රවාහන දුම්රිය - 28යි

(2025 නොවැම්බර් මාසයේ ඇති වූ "දිට්වා" සුළි කුණාටුවට පෙර)

දැනට දිනකට ධාවනය වන දුම්රිය ගමන් වාර සංඛ්‍යාව

මගී දුම්රිය - 200යි

බඩු ප්‍රවාහන දුම්රිය - 28යි

(ii) එන්ජින් - 84යි

බලවේග කට්ටල එන්ජින් - 106යි

(iii) එන්ජින් - 96යි

බලවේග කට්ටල එන්ජින් - 130යි

(iv) එන්ජින් - 49යි

බලවේග කට්ටල එන්ජින් - 82යි

(v) එන්ජින් - 47යි

බලවේග කට්ටල එන්ජින් - 48යි

(vi)
- රත්මලාන ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු උප දෙපාර්තමේන්තුවේ කර්මාන්තශාලා මඟින් අදාළ බැර අලුත්වැඩියාව සිදු කරයි.
- එමෙන්ම, ප්‍රධාන ඉංජිනේරු ධාවනබල උප දෙපාර්තමේන්තුවේ ධාවනාගාර මඟින් සුළු අලුත්වැඩියාවන් සිදු කරනු ලබයි.
- මෙයට අමතරව, තවත් එන්ජින් කිහිපයක් බාහිර පාර්ශ්ව මඟින් අලුත්වැඩියා කිරීමට සැලසුම් කර ඇත.

(vii) බාහිර පාර්ශ්ව වෙතින් ටෙන්ඩර් කැඳවා තෝරා ගන්නා ලද රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත S-II වර්ගයේ බලවේග කට්ටල එන්ජින් 03ක් බැර අලුත්වැඩියාව සඳහා භාර දී ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු ධනුෂ්ක රංගනාත් මහතා
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට මම එක් අතුරු ප්‍රශ්නයක් පමණයි යොමු කරන්නේ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දුම්රිය බලවේග කට්ටල සම්බන්ධයෙන් ඇති වී තිබෙන මෙම ගැටලුව මීට පෙරත් ඇති වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙහිදී අපට දැනගන්න ඕනෑ, මේ දුම්රිය බලවේග කට්ටල ගැටලුව නිසා දැනට දුම්රිය ගමන් වාර අවලංගු වීම් සිද්ධ වනවාද, එහෙම සිද්ධ වනවා නම් ඒක වළක්වා ගන්න කුමන හෝ වැඩ පිළිවෙළක් අනුගමනය කරලා තිබෙනවා ද කියලා.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ඔව්, ගරු මන්ත්‍රීතුමනි. දුම්රිය බලවේග කට්ටලවල අඩුවක් තිබෙනවා. ඒක vicious circle එකක් වාගේ සෑහෙන කාලයක් තිස්සේ ඇදිලා ආපු ප්‍රශ්නයක්. බලවේග කට්ටල අඩුවීම නිසා due service එක, එහෙම නැත්නම් නියමිත කාලයට service කරන්න ඕනෑ දුම්රියන් පවා service කර ගැනීමේ අර්බුදයක් මතුව

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

තිබෙනවා. ඒත් එක්කම "දිවිවා" සුළි කුණාටුවෙන් පස්සේ තැන් තැන්වල දුම්රිය කිහිපයක් හිරවෙලා තිබෙනවා. ඒ කියන්නේ, දුම්රිය මාර්ගවල සම්පූර්ණ දුර ප්‍රමාණය වන කිලෝමීටර 1,450ම මේ වන විට එකට යා වෙලා නැහැ. තැන් තැන්වලින් දුම්රිය මාර්ග කැඩිලා තිබෙන්නේ. එතකොට ඒ service එක දීමේ අර්බුදයකුත් මතුව තිබෙනවා. මේ දේවල් එක්ක තමයි මේ වැඩ කටයුතු කරගෙන යන්නේ. දැන් අපි අලුතින් වැඩක් පටන් ගත්තේ ඒකයි. ඒ තිබෙන බලවේග කට්ටල එක්ක තනි තනි එන්ජීන් සහ තනි තනි පෙට්ටි විධියට නැතිව සම්පූර්ණ දුම්රියක් සකස් කරලා එළියට දමන වැඩ පිළිවෙළක් ඒ අනුව අපට තිබෙනවා. ඒක මේ වනකොට අලුත්ගමින් එකක්, රත්මලානෙන් තුනක් විධියට සම්පූර්ණයෙන් සකස් කරලා මේ අවුරුද්ද ඇතුළත අපි එළියට දාලා තිබෙනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(2) යටතේ වූ රීතිවලින් මට පහදන්න ඕනෑ, ස්ථාවර නියෝග 31 සහ 38 පිළිබඳව. අද වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 5යි තිබෙන්නේ. හේතුව, අද දිනයේදී අගමැතිතුමිය සභාවේ නොමැති වීම. ගරු කථානායකතුමනි, හැබැයි, එහෙම නැති දවසට වුණත් සම්ප්‍රදාය තමයි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 10ක් අහන්න අවසර දීම. හැබැයි, ඉතිහාසයේ මතු වුණු මෙවැනි අවස්ථාවලදී වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 10ම අහන්න පාර්ලිමේන්තුවේ අවසර තිබුණත්,-

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
ඔය සම්බන්ධව notice දීලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
මට මේ දේ කියන්න පොඩ්ඩක් ඉඩ දෙන්නකෝ. ඔබතුමා ඊට පස්සේ උත්තර දෙන්න.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
ලේකම් මණ්ඩලය කියන්නේ ඔබතුමාගේ, - *[බාධා කිරීමක්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
මට විනාඩියක අවසරයක් තිබෙනවා නේ. ඒ විනාඩිය මම කියවාගෙන යන්නම්. සාමාන්‍යයෙන් ඉතිහාසයේ මෙවැනි අවස්ථාවක් මතු වුණාම ඒ ප්‍රශ්න 10 අහන්න අවසර දුන්නා. පක්ෂ නායක රැස්වීමේදී හෝ කථා කරලා ඒ ප්‍රශ්න 10 අපට හිමිවෙන්න තිබුණා. නමුත්, එහෙම හිමි නොවීම අපට සිදුවන අසාධාරණයක්, ගරු කථානායකතුමනි. මේ වනකොට පිළිතුරු ඇවිල්ලා තිබෙන ප්‍රශ්න ටික න්‍යාය පුස්තකයට ඇතුළත් කළා නම් හොඳයි. මොකද, අද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න 5ක් අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා මෙක ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තුව නොකර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හැටියට කටයුතු කරන්න කියලා තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
මේ Order Book එකෙන් කලින් දෙන noticesවලට අනුව තමයි වැඩ කටයුතු සිද්ධ වන්නේ, ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීමක්]*

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

අලි-මිනිස් ගැටුම කළමනාකරණය සඳහා වූ නව ජාතික ක්‍රියාකාරී සැලැස්ම
யானை - மனித மோதல் முகாமைத்துவத்துக்கான புதிய தேசிய செயற்றிட்டம்
NEW NATIONAL ACTION PLAN FOR HUMAN-ELEPHANT CONFLICT MANAGEMENT

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்*)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මම අද මේ ප්‍රශ්නය යොමු කරන්නේ අපේ රටේ බලවත් අවශ්‍යතාවක් වන ඇතුන් ආරක්ෂා කිරීමේ මෙහෙයුම් බලකායක් ස්ථාපනය කිරීම පිළිබඳවයි. දිගින් දිගටම ඇතුන් ඝාතනය කරන සංස්කෘතියක් ඇති වෙලා තිබෙනවා. ඇත්තවශයෙන්ම ඇතුන් ඝාතනය කරන තුස්තවාදී රැල්ලක්, ඝාතන රැල්ලක් ක්‍රියාත්මක වෙනවා. ඒ මිලේච්ඡයින්, දඩයක්කාරයින් නීතිය හමුවට ගෙන ඒම සහ අලි-මිනිස් ගැටුම පිළිබඳව මම මේ ප්‍රශ්නය අහනවා.

ශ්‍රී ලංකාවේ උග්‍ර වෙමින් පවතින අලි-මිනිස් ගැටුම පාලනය කිරීම සඳහා 2020 වර්ෂයේදී හඳුන්වා දුන් ජාතික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රමාණවත් නොවන බව මම ප්‍රකාශ කරමි. වර්තමාන රජයේ නව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා දී තිබෙනවා. එය මාස තුනක් ඇතුළත ජනාධිපතිවරයාට ඉදිරිපත් කරන බවට 2026.07.04 දින ප්‍රකාශ කළත් මේ වනවිට එම කාල සීමාවද ඉක්මවා ගොස් තිබෙනවා. අනෙක් අතට බලයට පත්වී වසර දෙකක් ගත වී ඇතත්, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ මේ සම්බන්ධයෙන් ලබා දුන් පොරොන්දු කොතෙක් දුරට ඉටු කර තිබේද යන්න පිළිබඳව බරපතළ ප්‍රශ්න රැසක් මතු වී තිබෙන මොහොතක මම පහත ප්‍රශ්න පරිසර අමාත්‍යවරයාට යොමු කරනවා.

1. 2026 ජූනි 15වන දින කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද නව ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා මේ දක්වා ගෙන ඇති පියවර මොනවාද? ඒ සඳහා පත් කළ විශේෂඥ කමිටුවේ සාමාජිකයින්, විෂය පථය සහ

කාල රාමුව කුමක්ද? සැලැස්ම අවසන් කර කැබිනට් මණ්ඩලයට හා ජනාධිපතිවරයාට ඉදිරිපත් කරන නිශ්චිත දිනය කුමක්ද?

2. 2020 ජාතික ක්‍රියාකාරී සැලැස්ම වර්තමාන තත්ත්වයට ප්‍රමාණවත් නොවන බව තීරණය කිරීමට පාදක වූ විද්‍යාත්මක ඇගැයීමක් හෝ ප්‍රගති සමාලෝචන වාර්තාවක් රජය සතුව තිබේද? එසේ නම්, එය සභාගත කරන්නේද? එම සැලැස්මේ ක්‍රියාත්මක කළ සහ මෙතෙක් ක්‍රියාත්මක නොකළ යෝජනා කවරේද? ඒවා ක්‍රියාත්මක නොවීමට හේතු හා ඊට වගකිව යුතු ආයතන කවරේද?

විශේෂයෙන්ම GPS radio-collaring, වාසස්ථාන කළමනාකරණ පර්යේෂණය, විදුලි වැට සහ අලි අගල් වැනි ක්‍රමවේද දියුණු කිරීම සඳහා early warning systems, camera traps යනාදී අලුත් ක්‍රමවේද පිළිබඳව සඳහන් වෙලා තිබුණා. ඒ පිළිබඳව රජයේ මතය මොකක්ද කියා අපි දැනගන්න කැමැතියි.

3. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ පොරොන්දු වූ පරිදි වනඅලි ගහනය, සංචරණ රටා සහ වාසස්ථාන පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයක් ආරම්භ කර තිබේද? එසේ නම්, එය ආරම්භ කළ දිනය, සිදු කරන ආයතනය, ඒ සඳහා වෙන් කළ ප්‍රතිපාදන සහ මෙතෙක් ලබාගෙන ඇති ප්‍රතිඵල මොනවාද? එසේ නොමැති නම්, එම පොරොන්දුව ඉටු කිරීමට නියමිත කාල සීමාව කුමක්ද?

4. අලි-මිනිස් ගැටුම කළමනාකරණය සඳහා ජීව විද්‍යාත්මක හා නව තාක්ෂණික ක්‍රමවේද සහ ජන සහභාගීත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් පොරොන්දු වී ඇති බැවින් ඒ සඳහා මේ දක්වා හඳුනාගෙන ඇති ක්‍රමවේද මොනවාද?

දැන් අවුරුදු දෙකක් ගත වෙලා තිබෙනවා. මොකක්ද ඒ සඳහා ක්‍රියාත්මක කරපු වැඩ පිළිවෙළ? ඒවා ක්‍රියාත්මක කර ඇති ප්‍රදේශ, ඒ සඳහා වැය කළ මුදල් සහ අත්පත් කරගෙන ඇති ප්‍රතිඵල මොනවාද?

5. මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදු වන, වනඅලි මරණ අවම කිරීම සඳහා නව ජාතික ක්‍රියාකාරී සැලැස්මක් තුළ අපේක්ෂිත වාර්ෂික ඉලක්ක සහ කාල රාමු ඇතුළත් කර තිබේද? එසේනම් ඒවා මොනවාද?

6. 2026.11.02 දින ආරම්භ කළ 'හස්ති සේනා' මෙහෙයුම නව ජාතික ක්‍රියාකාරී සැලැස්මේ කොටසක්ද? එසේ නොමැති නම්, එම සැලැස්ම තවමත් අවසන් කර නොමැති පසුබිමක මෙම මෙහෙයුම ආරම්භ කිරීමට පදනම් වූ විද්‍යාත්මක අධ්‍යයනයන් හා ප්‍රතිපත්තිමය තීරණ මොනවාද? එහි සාර්ථකත්වය මැනීම සඳහා නිශ්චිත නිර්ණායක - Key Performance Indicators - සහ ප්‍රගතිය ඇගැයීමේ ක්‍රමවේදයක් සකස් කර තිබේද?

7. නව ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා 2027 අය වැයෙන් වෙන් කර ඇති මුදල කොපමණද? එම ප්‍රතිපාදන අලි මංකඩ ආරක්ෂා කිරීම, වාසස්ථාන සංරක්ෂණය, විදුලි වැට නඩත්තුව, නව තාක්ෂණික ක්‍රමවේද භාවිතය සහ ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් සඳහා වෙන් වෙන් වශයෙන් වෙන් කළ මුදල් කොපමණද? සැලැස්ම සකස් කිරීමට පෙර අලි-මිනිස් ගැටුමෙන් පීඩාවට පත් ජනතාවගේ, ගොවි සංවිධානවල, විද්වතුන්ගේ, පරිසර සංවිධානවල, වනඝත්ව ලෝලීන්ගේ, ඒ වාගේම අනෙකුත් විවිධ පාර්ශ්වකරුවන්ගේ; පරිසරයට, වනඝතුන්ට - වනජීවීන්ට - ජෛව විවිධත්වයට ආදරයක් දක්වන කණ්ඩායම්වල අදහස් ලබා ගැනීම සඳහා විධිමත් මහජන උපදේශන ක්‍රියාවලියක් පවත්වා තිබෙනවාද?

අපි දැනගන්න කැමැතියි, මේ අවුරුදු දෙක තුළ විධිමත්ව ඒ වාගේ සංවාදයක් පැවැත්වුවාද කියලා.

8. වර්තමාන රජය බලයට පත්වීමෙන් පසු අපේ රටේ ඇත් පරපුර පිළිබඳව සංගණනයක් සිදුකර තිබේද? එසේ නම් එම සමස්ත සංඛ්‍යාව සහ ඔවුන් ප්‍රදේශ අනුව ව්‍යාප්ත වී ඇති ආකාරය කුමක්ද? ඔවුන් ආරක්ෂා කර ගැනීම සඳහා රජය විසින් මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි. කාවන්තිස්ස ඇතාගේ සාතනයෙන් පසුව තවත් ඇතෙක් සාතනය කරලා තිබෙනවා, කහටගස්දිගිලිය ප්‍රදේශයේ. අපේ රටේ වන සම්පත, ඇත් සම්පත ඉතාම වටිනවා. මොකද, අපේ රටේ පිරිමි අලින්ගෙන් සියයට 5ත්, 10ත් අතර ප්‍රමාණයකට තමයි දළ එන්නේ. ඒ නිසා අපි යෝජනා කරනවා, ඒ දළ ඇතුන් ආරක්ෂා කර ගැනීම විශේෂිත වූ වැඩසටහනක් හැටියට සලකා, ඇතුන් සංරක්ෂණය කිරීම සඳහා විශේෂ කාර්ය සාධක බළකායක් - tusker protection task force - ක්‍රියාත්මක කිරීම යෝග්‍යයි කියලා. එය ඉෂ්ට කරන්නය කියලා යෝජනා කරමින්, මම ගරු අමාත්‍යතුමාට මගේ ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වෙනවා.

එතුමා මූලික ප්‍රශ්න අටක් ඉදිරිපත් කළා. එතැන තිබෙනවා, තවත් අතුරු ප්‍රශ්න ප්‍රමාණයක්. එතකොට මුළු ප්‍රශ්න 27ක් තිබෙනවා, මේ ප්‍රශ්නය තුළ. ඊට අමතරව, විවිධ ක්ෂේත්‍ර හයක් පදනම් කරගෙන තමයි මේ ප්‍රශ්න 27 ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඊයේ හවස තමයි මේ ප්‍රශ්නය අපට ලැබුණේ. එතුමා මතු කළ ආකාරයට, අපේ රටේ දළ ඇතුන් සංරක්ෂණය සඳහා අපි දැනටමත් වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා, විශේෂයෙන්ම Wild Tuskers of Sri Lanka ආයතනයත්, ත්‍රිවිධ හමුදාවත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් සම්බන්ධ කරගෙන. අපේ රටේ Wild Tuskers of Sri Lanka ආයතනය සතුව හොඳ දත්ත පද්ධතියක් තිබෙනවා. ඒ දත්ත පද්ධතිය පදනම් කරගෙන ඔවුන් හඳුනාගෙන තිබෙනවා අපේ රටේ දළ ඇතුන් 17දෙනෙකු අවදානමට ලක් වෙලා තිබෙනවා කියලා. අන්න ඒ දළ ඇතුන් 17දෙනා ආරක්ෂා කිරීම සඳහා ත්‍රිවිධ හමුදාව සම්බන්ධ කරගෙන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ පරිසර අමාත්‍යාංශය දැනටමත් "හස්ති සේනා" කියන වැඩ පිළිවෙළ ආරම්භ කරලා තිබෙනවා. අවදානමට ලක් වුණු ඇතුන් 17දෙනා සැරිසරන ප්‍රදේශ ගත්තොත්, අපේ රටේ අලි ඇතුන් ජීවත් වෙන මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 80ක් ආවරණය වනවා. ඒ වැඩ පිළිවෙළ දැනටමත් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඊට අමතරව ඉතිරි සියයට 20 ආවරණය කිරීම සඳහාත් අපි ඉක්මන් වැඩ පිළිවෙළක් හදනවා, ත්‍රිවිධ හමුදාවත් සම්බන්ධ කරගෙන.

ඒ වාගේම අපි දැනටමත් ත්‍රිවිධ හමුදාවත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් සම්බන්ධ කරගෙන, වනජීවී කලාපවල මර උගුල්, බඳින තුවක්කු සහ හක්ක පටස් ආදිය සොයා ගැනීමට පුළුවන් වන විධියේ වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. ඒක සාර්ථක වැඩ පිළිවෙළක් හැටියට ඉදිරියට යනවා.

ක්ෂේත්‍ර 6කට සම්බන්ධ මේ ප්‍රශ්න 27ට පිළිතුරු දීම සඳහා මම කාලය ඉල්ලා සිටිනවා. ගරු කථානායකතුමනි, එම නිසා මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා කල් ගන්නවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මම අහපු ප්‍රශ්නයේ පොඩි කොටසකට එතුමා උත්තරයක් දුන්නා. මට ඒ කොටස පිළිබඳව කරුණු මතු කරන්නට අවස්ථාව ලබා දෙන්න.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා සඳහන් කළා ක්ෂේත්‍ර 6කට අදාළව ප්‍රශ්න 27ක් අහලා තිබෙනවා කියලා. ඇත්තවශයෙන්ම ඊටත් වඩා ප්‍රශ්න රැසක් තිබෙනවා. අපි ඒවා මතුවට අහන්නම්. ඔබතුමා "හස්ති සේනා" නමින් වැඩසටහනක් ආරම්භ කර තිබෙනවා. ඒක හොඳ දෙයක් හැටියට අපි දකිනවා. හැබැයි, මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. මේ Wild Tuskers of Sri Lanka ආයතනය සම්බන්ධ කර ගැනීම හොඳ දෙයක්. හැබැයි, ඒකේ අසම්පූර්ණභාවයක් තිබෙනවා. මම මේ අවස්ථාවේ ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, මේ කාරණය කෙරෙහි. අප්‍රිකාවේ, Ahmad, Satao, Tim, Tolstoy, Craig, Paolo, One Ton, Esau, Vronsky යනාදී ඇතුන් වෙනුවෙන් Marsabit, Tsavo, Amboseli, Chyulu Hills, Tanzania වැනි වනෝද්‍යාන සහ රටවල වෙනමම ඒ සඳහා විශේෂිත වූ බළකායක් සම්බන්ධ කර තිබෙනවා. දැන් මම ඔබතුමාට පෙන්වන්න හදන්නේ එක් ආයතනයක් එක්ක පමණක් වැඩකටයුතු කිරීමෙන් සිදුවන අඩුපාඩුව. මේක නරකක් හැටියට හඳුන්වන්න එපා. මේක පොඩි අඩුපාඩුවක්. මේක හදාගන්න පුළුවන්. දැන් ඔබතුමා කිව්වා, අවදානමට ලක් වුණු ඇතුන් 17ක් ඉන්නවාය කියලා. ඊට වඩා ප්‍රමාණයක් ඉන්නවා, ඇමතිතුමනි. ඔබතුමාට නිවැරදි තොරතුරු, දත්ත ලබාගන්න පුළුවන් Wild Tuskers of Sri Lanka ඇතුළු තවත් විශේෂිත වූ සංවිධාන කිහිපයක් තිබෙනවා. මම කියන්නේ, ඒ ආයතන සමූහයම එකතු කරගන්න කියලායි.

මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි මේ අවස්ථාවේ. දැන් ඔබතුමා සඳහන් කර තිබෙනවා ඇතුන් 17ක් ඉන්නවාය කියලා. ඊට වඩා වැඩි ප්‍රමාණයක් ඉන්නවා; 30කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා, කස්සප, මහානාම, රට්ඨ, අග්ගෝ, වාසල, මානාභරණ, සුමිත්ත, විජය, සංඛධාතු, වන්නියාන්, ලංකේශ්වර, සුරනිමල, ස්කන්ධරාජා, මහසෙන්, සුමේධ, බුලට්, වසභ, භාතු, මින්නේරිය සුමේධ, සිංහබාහු, ගජබාහු, සූර්යා, සැන්ඩෝ, ධනංජය, අර්ජුන, හීන්වැව ලොක්කා, කාශ්‍යප යනාදී වශයෙන්. එතකොට, ඇතුන් 17දෙනෙක් පමණක් ඉන්නවාය කියලා ඔබතුමන්ලා යන්නේ වැරදි දත්ත මත. මම ඔබතුමාට යෝජනාවක් කරනවා. Wild Tuskers of Sri Lanka ආයතනය පමණක් නොවෙයි, මීට වඩා සම්පූර්ණ තොරතුරු ලබාදෙන තවත් විද්වත් ආයතන ගණනාවක් තිබෙනවා. ඒ ආයතන සම්බන්ධ කරගන්න. අපත් සූදානම්, දත්ත මට්ටමින් ඔබතුමාට ලබාදිය හැකි සහයෝගය ලබා දෙන්න. කාවන්තිස්ස ඇතා පිළිබඳව චිත්‍ර ප්‍රදර්ශනයක් තිබෙනවා ලයනල් වෙන්ඩ්ට් රහලේ. මම ඔබතුමාට ආරාධනා කරනවා, ඒකත් පොඩ්ඩක් බලන්න කියලා. අර ඔබතුමා කියපු ඇතුන් 17දෙනාගේ ලැයිස්තුවේ නැති අයත් ඒකේ ඉන්නවා. ඔබතුමා සම්පූර්ණ ප්‍රශ්නයට උත්තර ඉදිරිපත් කළාම මම ආපසු ප්‍රශ්නයක් අහන්නම්. මෙන්න මේ කාරණාවත් ඔබතුමාගේ අවධානයට යොමු කර වැඩකටයුතු කරන්නය කියලා මම බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු කථානායකතුමනි, අපි ආරම්භයක් හැටියට තමයි Wild Tuskers of Sri Lanka ආයතනය සමඟ මේ වැඩ පිළිවෙළ පටන් ගත්තේ. අපි දැනටමත් මේ සම්බන්ධයෙන් තිබෙන අනෙකුත් සංවිධාන සමඟ සාකච්ඡා ආරම්භ කර තිබෙනවා. Wild Tuskers of Sri Lanka ආයතනය කිසියම් නිර්ණායක ප්‍රමාණයක් හඳුනාගෙන, ඒ නිර්ණායක මත පදනම් වෙලා තමයි මේ 17දෙනා හඳුනාගෙන තිබෙන්නේ. Wild Tuskers of Sri Lanka ආයතනය අපේ රටේ ඉන්න සියලු දළ ඇතුන් නොවෙයි 17දෙනෙක් ලෙස නම් කරලා තිබෙන්නේ. ඇතුන් විශාල පිරිසක් ඉන්නවා. ඒ අතරින් අවදානමට ලක් වෙච්ච, ඒ කියන්නේ කිසියම් තුවාලයක්, හානියක් සිදු වේ යැයි කියන අවදානමට ලක් වෙච්ච 17දෙනාට තමයි අපි ප්‍රමුඛත්වය දීලා තිබෙන්නේ. ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, අනෙක් අලි ඇතුන් සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නේ නැහැ කියලා. අපි දැනටමත් අනෙකුත් සංවිධාන සමඟත් සාකච්ඡා පටන් අරගෙන තිබෙනවා. අපි මේකේ අඩුපාඩු නිවැරදි කර ගනිමින් ඉදිරියට යන්න බලාපොරොත්තු වෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ඉදිරිපත් කළ ප්‍රශ්නයට පරිසර ඇමතිතුමා යම් පිළිතුරක් ලබා දුන්නා. එතුමා ඒක පදනම් කරගෙන අතුරු ප්‍රශ්නයකුත් ඇහුවා. ගරු ඇමතිතුමා අතුරු ප්‍රශ්නයටත් උත්තරයක් දුන්නා. තව දවසක ආයෙමත් මේ ප්‍රශ්නය අරගෙන, ඒකට උත්තර දෙන්න පාර්ලිමේන්තුවේ කාලය වෙන් කරන්න බැහැ. ගරු කථානායකතුමනි, එහෙම නම් ඔබතුමා මේ ප්‍රශ්නයට කාලය නොදී ඉන්න ඕනෑ. දැන් ආයෙමත්, -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇමතිතුමා කාලය, -

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

නැහැ, නැහැ. පොඩ්ඩක් ඉන්න. ගරු කථානායකතුමනි, ඔබතුමා ඒ ප්‍රශ්නයට අතුරු ප්‍රශ්නයක් අහන්නත් අවස්ථාව දෙනවා. ඒ අතුරු ප්‍රශ්නයට උත්තරයකුත් දුන්නා. ගරු කථානායකතුමනි, එහෙම වුණොත් තව කෙනෙකුට තිබෙන කාලය තමයි නැති වෙන්නේ. *[බාධා කිරීමක්]* නැහැ, එහෙම නම් අතුරු ප්‍රශ්නයක් අහන්න නොදී ඉන්න තිබුණා. අතුරු ප්‍රශ්නයක් අහලා අතුරු ප්‍රශ්නයට උත්තරයකුත් දීලා වෙනම දවසක අයෙත් මුල ඉඳලා යනවා. එහෙම කරන්න බැහැ නේ. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27 (2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔය කාරණය සම්බන්ධයෙන් විවාදයක් නැහැ. *[බාධා කිරීමක්]* ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමා නලින්ද ජයතිස්ස මැතිතුමාට විතරක් අවස්ථාව දීලා මට අවස්ථාව නොදී ඉන්න එපා. මොකද, වැරැදි වැටහීමක් ඇති වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමා තමයි කිව්වේ ප්‍රශ්නයේ ඉතිරි කොටසට පසුව උත්තර දෙනවා කියලා. මොකද, ක්ෂේත්‍ර 6ක ප්‍රශ්න 27ක් අහලා තිබෙනවා කියලා, එතුමායි කල් ඉල්ලුවේ. ඊට පස්සේ එතුමා ප්‍රශ්නවලින් කොටසකට උත්තර දුන්නා. ඒ කොටසට අදාළ අතුරු ප්‍රශ්නය මම ඇහුවා. ඒ නිසා මට අයිතියක් තිබෙනවා, එතුමා ඉතිරි ප්‍රශ්නවලට පිළිතුරු දුන්නාමත් අතුරු ප්‍රශ්නයක් අහන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා කල් ඉල්ලනවා නම් කිසිම පිළිතුරක් ලබා නොදී හිටියා නම් හොඳයි කියලා මම විශ්වාස කරනවා. නැත්නම් ආපහු අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්. ඒක බරපතළ ප්‍රශ්නයක්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මේ සම්ප්‍රදාය මේ විධියට ගෙන ගියොත් මේ පාර්ලිමේන්තුව හසුරුවා ගන්නේ කොහොමද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි. *[බාධා කිරීම්]* නැහැ, නැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
එක්කෝ ඒ ප්‍රශ්නයට උත්තරය භාරගෙන අතුරු ප්‍රශ්නය ඊළඟ දවසේ අහන්න ඕනෑ. අතුරු ප්‍රශ්නයත් අහනවා. *[බාධා කිරීම්]* එහෙම කරන්න බැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 සහ 2 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේ දී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීම, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. You have 14 minutes.

ආනයන හා අපනයන (පාලන) පනත: රෙගුලාසි
இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டம்: ஒழுங்குவிதிகள்
IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

[පූ.භා. 10.12]

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ඔක්තෝබර් 01 දිනැති අංක 2508/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.11.03 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - පරිපූරක මුදල - ශීර්ෂය 119 - වැඩසටහන 01 සහ පරිපූරක මුදල - ශීර්ෂය 102 - වැඩසටහන 01 ද අනුමැතිය සඳහා මා ඉදිරිපත් කරනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ගරු කථානායකතුමනි, අද විවාදයට ලක් කරන ප්‍රධාන කාරණා දෙකක් තිබෙනවා. එකක් තමයි, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි. එකී රෙගුලාසි පැනවීම සම්බන්ධයෙන් වන නීතිමය අවශ්‍යතාවක් සපුරා ගැනීම, එනම් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2026.11.03 ඉදිරිපත් කරන ලද රෙගුලාසි සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම තමයි මේ යටතේ අපේක්ෂා කරන්නේ.

මා ඒ පිළිබඳව කරුණු පැහැදිලි කිරීමක් කරන්නම්. විශේෂයෙන්ම භාණ්ඩ ආනයනයේදී, HS Codes යටතේ භාණ්ඩ ආනයනය කරන අතරතුර විවිධ නිර්ණායක, ප්‍රමිතීන් සහතික කිරීම් ඉදිරිපත් කර තිබෙනවා. දැනට ඒ රෙගුලාසි යටතේ භාණ්ඩ වර්ග 161කට තත්ත්ව සහතික, ඒ වාගේම ශ්‍රී ලංකා ප්‍රමිති තහවුරු කිරීම් ලබාගත යුතු වෙනවා.

කලින් කලට පවතින කර්මාන්තවල, ව්‍යවසායකයන්ගේ අවශ්‍යතා මත, පනවන ලද ප්‍රමිති ඉහළට ගෙන ඒම, තත්ත්ව සහතික වැඩිදියුණු කිරීම සඳහා මෝටර් රථවලට අදාළව ටයර් ආනයනය කරන කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉන්න පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කරලා passenger cars, ඒ කියන්නේ සාමාන්‍ය කාර් සඳහා ආනයනය කරන ටයර් සහ three-wheelers සඳහා ආනයනය කරන වායු පිරවූ ටයර් සඳහා වන ප්‍රමිතිකරණයන් ඇතුළත් කිරීම තමයි මේ රෙගුලාසියෙන් බලාපොරොත්තු වන්නේ.

ගරු කථානායකතුමනි, අපේ ආණ්ඩුව මේ පරිවර්තනය ඇතුළේ කරන කාර්යයන්වලදී අපට වැදගත් වෙනවා, ආයෝජනයන්ට වඩාත් හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා වන වාතාවරණය ඔවුන්ට සකස් කර දීම. ඒ කියන්නේ, ආනයනය කිරීමේදී හෝ වෙළෙඳාම් කිරීමේදී හෝ නිෂ්පාදන කටයුතු කිරීමේදී තිබෙන ගැටලු සලකා බලා ඒවා එකින් එක නිවැරැදි කරමින් ගෙන එන සංශෝධන තමයි මෙහිදී ඉදිරිපත් කරන්නේ. මෙයින් බලාපොරොත්තු වන්නේ දේශීය නිෂ්පාදන කර්මාන්ත රැක ගන්නා ගමන්ම වාහනවල ගුණත්වය පිළිබඳවත්, ටයර්වල ගුණත්වය පිළිබඳවත් සැලකිල්ලට භාජන කිරීමයි. විශේෂයෙන්ම මෙහිදී පාරේ ධාවනය කරන වාහනවල ආරක්ෂාව, අනතුරු, එමඟින් ඇති විය හැකි ප්‍රශ්න කෙරෙහිත්, ඒ කියන්නේ ආර්ථික ප්‍රශ්නවලට එහා ගිය සමාජ ප්‍රශ්න කෙරෙහිත් අවධානය යොමු කරනවා.

ඊළඟට, අද ඉදිරිපත් කරනවා පරිපූරක ඇස්තමේන්තුවක්. ඒ පරිපූරක ඇස්තමේන්තුව තමයි, බලශක්ති අමාත්‍යාංශයේ ශීර්ෂය 119 - වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන යටතේ රුපියල් බිලියන 41ක්, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ශීර්ෂය 102 - වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන යටතේ අස්වැසුම වැඩසටහනට අදාළව රුපියල් බිලියන 6ක් ලෙස අවසානයේදී රුපියල් බිලියන 47ක් වන පරිපූරක ඇස්තමේන්තුව. මේ පරිපූරක ඇස්තමේන්තුව විශේෂයෙන්ම ලබා දෙන්නේ, එනම් මේ කටයුත්ත කරන්නේ පවතින වියදම් සීමාව වැඩි නොකර, අපේ වෙන් කර තිබෙන වියදම් කළමනාකරණය කර ගැනීමක් තුළයි. මේ පරිපූරක ඇස්තමේන්තුව ගෙන ඒමට හේතුවක් වන්නේ මැද පෙරදිග පවතින යුධමය තත්ත්වය හමුවේ විශේෂයෙන්ම ඉන්ධන මිලට ඇති වුණු බලපෑම. එහිදී ඉන්ධන මිල ඉහළ ගියා; ඉන්ධන ප්‍රවාහන ගාස්තු, රක්ෂණ ගාස්තු ඉහළ ගියා. ඒ වාගේම මේ මිල ඉහළ යෑම සහ ඩොලරයට ඇති වන තෙරපුම නිසා ඇති වන බලපෑමෙන් දේශීය වෙළෙඳ පොළට, ඉන්ධන පාරිභෝගිකයන්ට ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් කියන මාස තුන තුළ ඇති වන බලපෑම අවම කර ගැනීම සඳහා තමයි මේ රුපියල් බිලියන 41ක මුදල ලබා දෙන්නේ. එකී තත්ත්වය වර්ධනය වන ආකාරය බලලා තවත් සහනාධාර ලබා දිය යුතු වනවා නම් ඒ සඳහාත් ඉදිරියේදී කටයුතු කරන්න අපි සූදානම්.

ආර්ථික කටයුතු කරන ගමන්ම සමාජය තුළ පීඩනයට ලක් වන ජන කොටස වෙනුවෙනුත් සහන සැලසීම අපි සිදු කරනවා. අපි දැනට ඒ ජන කොටස් වෙනුවෙන් ඉලක්කගත සහනාධාර ලබා දෙනවා. "අස්වැසුම" වැඩසටහන තමයි අපි එතැනදී යොදා ගන්නේ. ඒ නිසා මේ මොහොතේදීත් ඉන්ධන මිල සහ ආහාර මිල ඉහළ යෑම හේතුවෙන් උද්ධමනයට යම් තෙරපුමක් ඇවිත් තිබෙනවා. ඒ තෙරපුමට යම් ආකාරයක සහනයක් ලබා දීම සඳහාත් රුපියල් බිලියන 6ක් වෙන් කර තිබෙනවා. ඒ අනුව අන්ත දිළිඳු සහ දිළිඳු කියන කාණ්ඩ දෙකට ප්‍රතිලාභ ලබා දෙනවා. අන්ත දිළිඳු කාණ්ඩයට රුපියල් 6,250ක් වූ අතිරේකව එක් වතාවක් පමණක් ගෙවන දීමනාවක් ලබා දෙනවා. අපි එය වාරික දෙකකින් ගෙවන්නේ.

ඒ වාගේම දිළිඳු කාණ්ඩයටත් රුපියල් 4,000ක දීමනාවක් ගෙවනවා. පවතින ප්‍රතිපාදන අනෙකුත් ක්ෂේත්‍රවලින් ලබා ගෙන තමයි මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන්නේ. මේ සඳහා අතිරේක මුදල් වැය වීමක් සිද්ධ වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ඒත් එක්කම මම මේ කාරණයත් කියන්න ඕනෑ. විශේෂයෙන්ම මේ අභියෝගාත්මක අවස්ථාවේදී මේ පවතින ස්ථාවරත්වයේ ඉඳලා ඊළඟට පරිවර්තන සිදු කරන්න බලාපොරොත්තු වන සෑම ක්ෂේත්‍රයක්ම දිහා බැලුවත් පෙනෙනවා, අපි ආර්ථිකයේ සමස්ත ස්ථාවරත්වය අත්පත් කර ගනිමින් තිබෙන බව. ජාතික වශයෙන් විතරක් නොවෙයි, ජාත්‍යන්තර වශයෙනුත් විවිධ සංවිධාන ඊට අදාළව තමන්ගේ ඉදිරිපත් කිරීම් කර තිබෙනවා. එසේ ඉදිරිපත් කර තිබියදීත් සමාජය තුළ ඒ දත්ත පිළිබඳ වාද විවාද ඇති කරනවා වෙනුවට විශේෂයෙන්ම සැකය, අවිශ්වාසය, අවිනිශ්චිතතාව නිර්මාණය කරන අදහස් හුවමාරු වෙනවා. අපි ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ.

අපි දන්නවා, දශක ගණනාවක් තිස්සේ අපේ රටේ දුප්පත්කම පැතිරිලා තිබුණු බව. අපේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ තුළ ඒ දුප්පත්කම ක්‍රමිකව නැති කර ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළකයි අප ඉන්නේ. ඒ අතරතුර තිබෙන එක් වැඩසටහනක් තමයි, දුප්පත්කම සහ ඒ අවදානමට ලක් වෙලා ඉන්න කණ්ඩායම් සඳහා ක්‍රියාත්මක වන "අස්වැසුම" වැඩසටහන. "අස්වැසුම" වැඩසටහන පිළිබඳවත් වැරැදි අදහසක් සමාජගත වෙනවා. ඒ නිසා මම ඒ පිළිබඳ දත්ත කිහිපයක් ඉදිරිපත් කරන්න ඕනෑ.

සමාජ ප්‍රතිලාභ ලබා දීම සඳහා සමාජ තොරතුරු පද්ධතියක් සකස් කර ගැනීමේ වැඩසටහනක් අපේ ආණ්ඩුව එන්න කලින් සිටම ක්‍රියාත්මක වෙමින් තිබුණා. ඒ වැඩසටහන ඇතුළේ ක්‍රියාත්මක කරන එකක් තමයි, "අස්වැසුම" වැඩසටහන. 2023 "අස්වැසුම" වැඩසටහන ආරම්භයේදී සෘජු මුදල් ප්‍රතිලාභ දෙන්න අන්ත දිළිඳු, දිළිඳු, අවදානම් සහ සංක්‍රාන්ති වශයෙන් ප්‍රධාන කාණ්ඩ 4ක් තෝරාගත්තා. සංක්‍රාන්ති සහ අවදානම් කලාපයට මුලින් රුපියල් 2,500ක් ගෙවමින් තිබුණු එක, කලින් පැවැති ආණ්ඩුව විසින් 2024 දෙසැම්බර් වනකල් දීර්ඝ කරලා තිබුණා. එම වැඩසටහනට අපි අලුතින් එකතු කිරීමක් නොකළා නම්, එකී ගෙවීම් 2024 දෙසැම්බර් අවසන් වෙනවා. නමුත්, අප මොකද කළේ? ඒ පවතින තත්ත්වය තේරුම් ගත් නිසා අපි එම කාණ්ඩ දෙක සඳහා -විශේෂයෙන්ම පීඩනයට පත් වෙලා ඉන්න දුප්පත් ජනතාව වෙනුවෙන් - එකී ගෙවීම් කිරීම 2025 දෙසැම්බර් දක්වා දීර්ඝ කළා. ඒ විතරක් නොවෙයි, 2025 නොවැම්බර් මාසයේදී

අපට "දිටිවා" සුළි කුණාටුවට මුහුණ දෙන්න සිදු වුණා. ඒ නිසා අවදානම් සහ සංක්‍රාන්ති කාණ්ඩ දෙක සඳහා 2025 දෙසැම්බර්වලින් අවසන් වෙන්න තිබුණු එම ගෙවීම් අපි තවදුරටත් දීර්ඝ කළා. ඒ දීර්ඝ කිරීම කළේ, අප අත්පත් කරගත් මූල්‍ය ස්ථාවරත්වය තුළ ඉතිරි කර ගත් මුදල් පරිහරණය කරලායි. ඒ අනුව, අපි අප්‍රේල් මාසය වනතුරු සංකාන්ත්‍රික කාණ්ඩයටත්, ඒ වාගේම ජුනි මාසය වනතුරු අවදානම් කාණ්ඩයටත් එම ගෙවීම් ලබා දීම සිද්ධ කළා. ඒ අනුව දැනට එම වැඩසටහන තුළින් ප්‍රතිලාභ ලබන්නේ අන්ත දුප්පත් සහ දුප්පත් කියන කාණ්ඩ දෙකයි. එම කාණ්ඩ දෙක සඳහා වැඩසටහන ක්‍රියාත්මක වනකොට ඔවුන්ගේ තොරතුරු යාවත්කාලීන කරන්නට අවශ්‍යයි; recertification කියන කාරණය කරන්නට ඕනෑ. නමුත්, එම වැඩසටහන පිළිබඳවත් සමාජයේ යම් මත හැදුණා, සුදුසුකම් තිබෙන අයට ගෙවලා නැහැ, ගෙවන්න ඕනෑ නැති අයට ගෙවනවා කියලා. කෙසේ වෙතත්, එම වැඩසටහනේ එක් අංගයක් තමයි ඒ අය සුදුසුකම් ලබනවාද, නැද්ද, වෙනස් වෙනවාද කියලා නැවත සහතික කර බැලීම. ඒ අනුව කරපු කාර්යයක් තමයි recertification කිරීම. ඒ කියන්නේ, ඔවුන්ව නැවත පරීක්ෂාවට ලක් කරනු ලබනවා. ඒ සඳහා අවශ්‍ය දත්ත, තොරතුරු ලබා දෙනවා. ඒ තොරතුරු අනුව නැවතත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ගෙවල් මට්ටමට ගිහිල්ලා තොරතුරු ලබාගෙන තිබෙනවා. ඒ ක්‍රියාදාමයට සෑහෙන කාලයක් ගත වුණා. එහි පළමු අදියරේදී recertification එක සඳහා 3,100,000කට වැඩි ප්‍රමාණයක් ඉල්ලා සිටියා. ඒ ඉල්ලා සිටි අයගෙන් 2,383,630ක නැවත සහතික කිරීම - recertification - සිද්ධ කරලා තිබෙනවා. ඒ සහතික කිරීමේ ප්‍රතිඵලයක් විධියට දැනට ප්‍රතිලාභ ලබන කාණ්ඩවල සහ ප්‍රතිලාභ නොලබන කාණ්ඩවල වෙනස්කම් සිද්ධ වෙලා තිබෙන්නේ කොහොමද කියන ලැයිස්තුව තමයි මේ තිබෙන්නේ. මෙතැනදී ඉතා පැහැදිලිව පෙන්නුම් කරනවා, ඒ 2,383,630 ඇතුළේ, දැනට සුදුසුකම් ලබමින් හිටපු, අපි ගෙවපු ප්‍රමාණයට වඩා ඇත්තටම යම් ප්‍රමාණයක් වැඩි වෙලා තිබෙනවා කියන එක. ඒ විතරක් නොවෙයි, එම කාණ්ඩ දෙකේ එකතුව ගත්තාම ඒ 2,383,630 ඇතුළේ දැනට ප්‍රතිලාභ ලබමින් ඉන්න කාණ්ඩය පමණක් 873,000ක පමණ ප්‍රමාණයක්. නමුත්, මේ recertification එක ඇතුළේ, අර කලින් සුදුසුකම් නොලබපු අයටත් ඉල්ලීමේ ඉඩකඩ තිබුණා. ඒ අනුව 981,800ක් මේ සඳහා අලුතෙන් සුදුසුකම් ලබනවා. ඒ වාගේම තමයි 2026දී තවත් අවස්ථාවක් අපි ලබා දුන්නා, නැවත අලුතෙන් applications දෙන්න කියලා. ඒ applications දුන්නු අයගේ recertification තවම කරලා නැහැ. ඒ අනුව එතැනත් සුදුසුකම් ලැබූ 213,135කට ගෙවනවා. ඒ අනුව මේ මොහොත වනකොට - නොවැම්බර් මාසයේදී - 981,800ක් සහ 213,135ක් වශයෙන් දොළොස් ලක්ෂ ගණනකට මේ සඳහා සුදුසුකම් ලැබෙනවා; ගෙවීම සිද්ධ වෙනවා. මේ කාරණය හොඳට තේරුම් ගන්න පුළුවන් මේ recertification එකේදි මොන ආකාරයක පිරිසිදුවීමක්ද මේ දත්තවලට සිද්ධ වුණේ කියලා. මම එක දත්තයකින් පමණක් එය පෙන්නුම් කරන්නම්.

මේ මොහොත වෙනකොට - recertification එක එන්න කලින් - සමාජ සුබසාධන තොරතුරු පද්ධතිය ඇතුළේ මම කිව්ව කාණ්ඩ හතරටම අයත් නොවන, සුදුසුකම් නොලබන 936,000ක් හිටියා. ඒ 936,000න් 153,711ක් අලුතෙන් සුදුසුකම් ලබන කාණ්ඩයට එකතු වෙලා තිබෙනවා. ඒ වාගේම අනෙකුත් කාණ්ඩ දෙකෙන් දැනට ගෙවීම් නොලබන, සුදුසුකම් නොලබන කාණ්ඩයට එකතු වෙලා තිබෙනවා 124,343කුත් 77,199කුත්. ඒ අනුව මේ recertification එකෙන්, මේක සුද්ද පවිත්‍ර වීම තුළින් අලුතෙන් මෙතැනට එකතු වෙලා තිබෙනවා, 355,253ක්. ඒ වාගේම මේ ක්‍රියාවලියේදී ගෙවීම් ලබමින් ඉන්න ප්‍රමාණයකුත් ඉවත් වනවා. මේක තමයි මුදල් ගෙවීමේ ක්‍රමවේදය. ඒ methodology එකේදීත්, ගණනය කිරීමේදීත්, අර කලින් සුබසාධන ගෙවපු ක්‍රමවේදයට නොවෙයි කරන්නේ. මීට කලින් සුබසාධන ගෙවීමේදී ග්‍රාම නිලධාරි මට්ටමින්, ඒ වාගේම දේශපාලනය මැදිහත් වෙලා කරනකොට ඒ තෝරා ගැනීම්වල යම් අභිමතානුසාරී ගතියක් තිබුණා. මෙතැනදී එහෙම හිතුමතේ කාටවත් තෝරාගන්න බැහැ. ඒකට ක්‍රමවේදයක් තිබෙනවා. බහුමාන දරිද්‍රතා දර්ශකයේ නිර්ණායක 22 ඇතුළේ ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් තිබෙනවා. ඒවා තහවුරු කරගෙන, අධීක්ෂණය කරලා සුබසාධන මණ්ඩලයට ඇවිල්ලා තමයි ඒ තහවුරු කිරීම කරන්නේ. ඒ ක්‍රමවේදයේත් අඩුපාඩු තිබෙනවා නම් ඒවාත් අපි හදාගත යුතු වෙනවා. කෙසේ වෙතත්, යම් ක්‍රමවේදයක් ඇතුළේ තමයි මේ කටයුතු වෙන්නේ. එතැනදී වඩාත් සාධාරණ ආකාරයට මේ කටයුතු සිද්ධ වෙලා තිබෙනවා කියන කාරණය මම සඳහන් කරන්න ඕනෑ.

මෙහි පළමුවෙනි අදියරේ දෙවැනි කොටස සඳහා 740,000ක ප්‍රමාණයක් ඉදිරියේදී මේ ආකාරයෙන්ම ඉදිරිපත් වෙනවා. ඒ වාගේම recertification නොකරපු 313,135ක් ඉදිරියේදී ඇතුළත් වෙයි කියලා බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, මේ කාරණයත් කියලා මගේ අදහස් දැක්වීම අවසන් කරන්නම්. TIN අංකය පිළිබඳවත් මේ සමාජය යම් යම් අදහස් මතු කළා. ඒක ගන්න වැඩි කාලයක් යනවා කියලාත් කිව්වා. ඇත්තටම, සමාජ පරිවර්තනය සඳහා අපි ඉදිරිපත් කරන කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. මේ සමාජය තවත් උසස් තැනකට ඔසවා තැබීමේදී සිදු කළ යුතු කරුණු ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම බදු පදනම පුළුල් කර ගැනීම, ආදායම් එකතු කර ගැනීම වාගේම තොරතුරු හුවමාරු කර ගැනීම පහසු කර ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළක් තමයි TIN අංකය කියන්නේ. කෙසේ වෙතත්, TIN අංකය ලබා ගන්න ඕනෑය කියන ප්‍රවෘත්තියත් එක්ක මිනිස්සු අනවශ්‍ය ආකාරයට පෝලිම් ගැසුණා. එම නිසා අපි තව කාලය ලබා දීලා අදාළ නිවේදන නිකුත් කරලා තිබෙනවා, බැංකු සහ අනෙකුත් ආයතනවලට.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට අවශ්‍ය කාලය ගන්න පුළුවන්.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
හොඳයි, ගරු කථානායකතුමනි.

කිසිවෙකු TIN අංකය ලබා ගන්න පෝලිම්වල සිටිය යුතු වන්නේ නැහැ. පරිගණකගතව TIN අංකය ලබාගන්න පුළුවන්. ඒ සඳහා කළ යුතු වන්නේ, අදාළ TIN අංකය අවශ්‍ය කරන ස්ථානයකදී ඔබගේ හැඳුනුම්පත ලබා දීම පමණයි. ඒ මඟින් ඒ කාරණය ඉෂ්ට කරගන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, ණය පිළිබඳවත් මම පොඩි කාරණයක් සඳහන් කරන්න කැමතියි. සමාජයේ මතයක් හදනවා, ණය ගන්න ප්‍රමාණය වැඩියි කියලා. ඇත්තටම ණය පිළිබඳ ප්‍රශ්නය තිබෙන්නේ අපි වැඩසටහනක් ඇතුළේ ඉද්දී ණය තිරසරභාවය අත්පත් කරගන්නේ කොහොමද කියන එක අනුවයි. ණය අඩු වෙනවාද, වැඩි වෙනවාද කියන එකට වඩා වැදගත් වන්නේ ණය තිරසරභාවයයි. ණය තිරසරභාවයේදී අපට ඉලක්කයක් දීලා තිබෙනවා. අපි ඉලක්කයක් ඇතුළේ වැඩ කරනවා. ඒ ඉලක්කය තමයි, 2032දී සමස්ත ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 95කට පහත හෙළීම. මේ වෙනකොටත් අපි ඒ ඉලක්කය අත්පත් කරගෙන තිබෙනවා. ඒ කියන්නේ, වසර හතකට කලින්. අපි එයට ආසන්නම දත්තය ඉදිරිපත් කළා, ගරු

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

කථානායකතුමනි. මේ සැප්තැම්බර් මාසය වෙනකොට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට එය 92.9 දක්වා අඩු වෙලා තිබෙනවා. රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්මේන්තුවත්, මුදල් අමාත්‍යාංශයත් ණය ගැනීමේ වැඩසටහන ඇතුළේ කළමනාකරණයකින් යුතුව වැඩකටයුතු කරනවා. ඒ නිසා කිසිදු අවදානමක්, බියක් ඇති කරගත යුතු වන්නේ නැහැ. නමුත්, අපි සැලකිල්ලට භාජන කළ යුතු විශේෂ කාරණයක් තිබෙනවා. එය නිතරම මතක් කළ යුතු කාරණයක්. ඒ තමයි, මැද පෙරදිග ඇති වෙලා තිබෙන යුද්මය තත්ත්වය. ඒ යුද්මය තත්ත්වයෙන් රටේ පාරිභෝගිකයාට, ව්‍යාපාරිකයාට, ජනතාවට ඇති වන බලපෑම හැකිතාක් දුරට අඩු කරන්න ආණ්ඩුව විවිධ පියවර අරගෙන තිබෙනවා. අපි කවුරුත් දන්නේ නැහැ, මේ යුද්මය තත්ත්වය කොතැනට වර්ධනය වෙයිද කියලා. ඒ නිසා අපි ඉදිරියේදීත් ඒ තත්ත්වයට මුහුණ දෙන්න අවශ්‍ය වෙන ආකාරයට පියවර ගන්න සූදානම්. නමුත්, අපි අවබෝධ කරගත යුතු වෙනවා, මේ වාගේ ගෝලීය අවදානම් තත්ත්වයක් තිබෙනවා කියලා, ගරු කථානායකතුමනි. ඒක අපට විතරක් නොවෙයි, ලෝකයටම පොදුයි. නමුත්, අපි ඒ සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේදීත්, රාජ්‍ය ප්‍රතිපත්තිය අනුගමනය කිරීමේදීත් නිවැරදිව මැදිහත් වෙනවා.

ගරු කථානායකතුමනි, මේ කාරණයත් කියලා මගේ අදහස් දැක්වීම අවසාන කරනවා. අද ඉදිරිපත් කර විවාදයට ලක් කරන කාරණා දෙකෙන්, අපි අද අත්පත් කරගෙන තිබෙන ස්ථාවරත්වයෙන් පෙන්නුම් කරන්නේ වෙන මොකක්වත් නොවෙයි, අපි ගමන් කරන දිගු කාලීන ගමන මේ සමාජ පරිවර්තනය සඳහා අවශ්‍ය වැඩ කොටස්වල අංශ කිහිපයක් පමණයි කියන එකයි. මෙය සමස්තයක් වශයෙන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මෙහි ප්‍රතිඵල අඛණ්ඩව ලැබෙනවා. අපට වර්ෂය අවසානයේදීත්, ජනවරම ලබා දුන් කාලය අවසානයේදීත් මේ ආකාරයට ප්‍රතිඵල ලබා ගන්න පුළුවන්. මේ ප්‍රතිලාභ මහජනතාවට ගෙනියන වැඩ පිළිවෙළ ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වැඩ පිළිවෙළ 2027 වර්ෂය සඳහා වූ අය වැයේදී ඉදිරිපත් කිරීමටත් අපි බලාපොරොත්තු වෙනවා.

බොහොමත්ම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එදුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
The Hon. Mujibur Rahuman. You have 12 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු සපානායකර් අවර්කළ් අක්කිරාසනත් තිණින්රු අකලවේ, කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [මාණ්පුමිකු (තිරුමති) හේමාලි වීරසේකර] තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)

නැණී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉලක්කම් ගොඩක් කිව්වා. ඒ නිසා පැටලුණා. නමුත්, මට පැහැදිලිවම දැන ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ තමයි, කලින් අස්වැසුමලාභී පවුල් 1,900,000ක් විතර හිටියා නේ. ඔබතුමා මේ කියපු ආකාරයට එම ප්‍රමාණය 1,200,000කට විතර අඩු වෙලා තිබෙනවා නේද? ඔබතුමා කිව්වේ එහෙම නේද? එහෙම නැත්නම් මම වැරැදියට තේරුම් ගත්තාද?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(මාණ්පුමිකු (කලානිති) අනිල් ජූයන්ත)
(The Hon. (Dr.) Anil Jayantha)

මම දන්නේ නැහැ, ඔබතුමා වැරැදියට තේරුම් ගත්තාද කියලා. මම පැහැදිලි කළේ, මේ මොහොත වෙනකොට ඇත්තටම ගෙවීම් සිද්ධ වෙන්නේ දුප්පත් සහ අන්ත දුප්පත් කාණ්ඩයට කියලා. එතකොට තිබෙන්නේ පවුල් දොළොස් ලක්ෂ ගණනක්. මේ recertification එකේදි ඒ හා සමාන ප්‍රමාණයකට දැන් ගෙවනවා සහ එම ප්‍රමාණය තව වැඩි වෙන්න පුළුවන්. මොකද, දෙවැනි පියවරේදී - phase 2 එකේදි - 740,000ක් තවමත් recertification සඳහා තොරතුරු ඉදිරිපත් කරලා නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වගුව ඇතුළත් ලේඛනය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා. ඒකේ මේ තොරතුරු ඇතුළත් විස්තර තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)

මම ඒක නොවෙයි ඇහුවේ. දැන් 1,200,000කට දෙනවා කිව්වේ, දුප්පත් හා අන්ත දුප්පත් කාණ්ඩවලට නේ. එතකොට සංක්‍රාන්තික සහ අවදානම් කාණ්ඩවලින් ලක්ෂ හතක් අඩු වෙලා නේ. මම ඒකයි අහන්නේ.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(මාණ්පුමිකු (කලානිති) අනිල් ජූයන්ත)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වැඩසටහන ඇතුළේ සංක්‍රාන්තික සහ අවදානම් කලාපය 2024 අගදී අයින් වෙන්න තමයි මෙතුමන්ලාගේ ආණ්ඩුව යෝජනා කරලා තිබුණේ. ඒ ප්‍රතිලාභ දීමනාව තමයි අපි වැඩි කරලා, කාල සීමාව 2025 දක්වා දීර්ඝ කරමින් ගෙනාවේ. *[බාධා කිරීමක්]*

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපේ ආණ්ඩුවක් තිබුණේ නැහැ.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
අපි "දිවිවා" සුළි කුණාටුවෙන් පස්සේ කාලය තවත් දික් කරලා තිබෙනවා. ඒ නිසා වැරැදි අදහසක් සමාජගත කරන්න එපා. *[බාධා කිරීමක්]* ගෙවමින් තිබුණු කිසිදු කෙනෙක් මේ වෙලාවේ කපලා නැහැ. තිබෙන දත්ත පද්ධතිය පිරිසිදු කරනවා. දත්ත පද්ධතිය පිරිසිදු කරද්දී, දැනට ගෙවමින් තිබෙන්නේ අන්ත දිළිඳු සහ දිළිඳු කාණ්ඩවලට පමණයි. අන්ත දිළිඳු සහ දිළිඳු කාණ්ඩවලට පමණයි කියන කාරණය ප්‍රතිසංශෝධනය කරලා දත්ත පද්ධතිය ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ඒ අනුව, වඩාත් සුදුසුකම් ලබන කාණ්ඩ දෙකට ගෙවමින් එනවා. විශේෂයෙන් සමාජයෙන් මේ පිළිබඳව විවේචනය ආවේ, inclusion error සහ exclusion error නිසයි. ඒ කියන්නේ, සුදුසුකම් ලබන කෙනාට ගෙවන්නේ නැහැ, සුදුසුකම් නොලබන කෙනාට ගෙවනවා කියලා. එය අවම කරලා තිබෙනවා. මොකද, මේ දත්ත ලේඛනයෙන් ඉතා පැහැදිලිව පෙනෙනවා, දැනට සුදුසුකම් ලබන්නේ නැතුව හිටපු 936,448කින් 153,000ක් අලුතින් එකතු වෙලා තිබෙන බව. ඒක තමයි මේ ලේඛනයේ තිබෙන්නේ. මේ ලේඛනය අරගෙන බලන්න, මේක බොරු නොවෙයි. මේ දත්ත හරියට විශ්ලේෂණය කරලා බැලුවොත් ඒක පැහැදිලිව පෙනෙනවා. එහෙම නැතුව සංඛ්‍යාවක් අරගෙන, කලින් ලක්ෂ 14යි, දැන් ලක්ෂ 12යි කියලා වැරැදි අදහසක් සමාජගත කරන්න එපා කියන කාරණයත් මම කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 10.31]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මුලින්ම ගරු ඇමතිතුමාට මම කියන්න ඕනෑ, ඔය කියන අවස්ථාවේ අපේ ආණ්ඩුවක් තිබුණේ නැති බව. ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුව තමයි තිබුණේ. ඒ ආණ්ඩුව අපේ නොවෙයි. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා රාජපක්ෂලාත් එක්ක වැඩ කරලා ගෙනාපු ආණ්ඩුවක් ඒක. *[බාධා කිරීම්]*

මොකද, ඔබතුමන්ලා රාජපක්ෂලාත් එක්ක 2005දී ආපු ගමන තමයි 2019 වෙනකම් ආවේ, අපි නොවෙයි. අපේ ආණ්ඩුවක් තිබුණේ නැහැ. *[බාධා කිරීම්]*

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කිව්වා, ණය ගන්න වෙනවා කියලා. ඔබතුමන්ලා එදා ඇහුවේ, ඩොලර් බිලියන 42ත් කජ්ජක්ද, ඒ ණය මුදල ගෙවන්න බැරිද කියලායි. එහෙම නේද ඇහුවේ? එහෙම නේ ඇහුවේ. මොකක්ද මේ ඩොලර් බිලියන 42, මේක කජ්ජක්ද කියලා එදා ඇහුවා. එදා ජනාධිපතිතුමා කිව්වා, මේ ආණ්ඩුව ආ පසු බදු වැඩි කළේ නැහැ කියලා. නමුත් පසුගිය අය වැයේදි බදු වැඩි කළා; බදු කිහිපයක් වැඩි කළා; අලුත් බදු දැම්මා. මොකද, නොදැම්මේ? Export කරන අයට, ඊළඟට online වැඩ කරන අයට බදු ගැහුවා. ජනාධිපතිතුමාටත් වැරදි තොරතුරු දෙනවා. ඔබතුමා මෙතැනට ඇවිල්ලාත් වැරදි තොරතුරු කියනවා, ජනාධිපතිතුමාටත් වැරදි තොරතුරු දෙනවා. එහෙම වැරදි තොරතුරු දෙන්න එපා. පව්, ඒ ජනාධිපතිතුමා. එතුමා ඔබතුමන්ලා කියන දෙයක් කියනවා. අන්තිමට ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් බදු වැඩි කළා. ජනාධිපතිතුමා ඇවිල්ලා කිව්වා, වැඩි කළේ නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වන විට ලක්ෂ හතකගේ අස්වැසුම දීමනාව කපා තිබෙනවා. ඔයගොල්ලන් බලයට ආ පසු මේ වනකොට දිළිඳු ජනතාවගෙන් ලක්ෂ හතකගේ අස්වැසුම දීමනාව අයින් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන රෙගුලාසි ගැනත් කථා කරන මේ මොහොතේ මා සඳහන් කරන්න කැමැතියි, 2023 වර්ෂයේදී අපේ රටට ලොකු ආයෝජනයක් ලැබුණු බව. ඒ කියන්නේ, China Merchants Port Holdings කියන සමාගම ඩොලර් මිලියන 392ක ආයෝජනයක් සිදු කර අපේ රටේ ව්‍යාපෘතියක් ආරම්භ කරන්න 2023දී එකහත්වයකට ආවා. ඒක තමයි යටිතල පහසුකම් ලබා දෙන දකුණු ආසියාවේ ලොකුම logistics මධ්‍යස්ථානය විධියට අපේ වරාය තුළ සංවර්ධනය කරන්න තිබුණේ. එම මධ්‍යස්ථානය අපේ රට තුළ පිහිටුවන්න අවශ්‍ය ආයෝජනය එදා ලංකාවට ගෙනාවා. නමුත් අපි දැක්කා, පසුගිය ඔක්තෝබර් මාසයේ ඒ ආයෝජනය අයින් කර ගත්ත ආකාරය. ඒත් එක්කම ඇමෙරිකාව විසින් අපේ රටට grant එකක් - ත්‍යාග මුදලක්; ආධාරයක් - හැටියට ඩොලර් මිලියන 17ක් ලබා දුන්නා, වරායේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා. ඒ මුදල ලබා දෙනවාත් එක්කම තමයි චීන සමාගම ඔවුන්ගේ ආයෝජනය ඉවත් කර ගත්තේ. එතකොට ප්‍රශ්නයක් මතු වනවා, ඇයි චීන සමාගම ගියේ කියලා.

අපි දන්නවා, ලෝකයේ බල තුලනය ගැන ඇමෙරිකාව සහ චීනය අතර සීතල යුද්ධයක් තිබෙන බව. අපි ඒ ගැන නොදන්නවා නොවෙයි. මේ කලාපය ඇතුළේත් ලොකු සීතල යුද්ධයක් යනවා, බලය තහවුරු කරගන්න. එතකොට එක පැත්තකින් වරායේ logistics hub එක හදන්න - ඒ ආයෝජනය ගෙනෙන්න - චීනයට අවස්ථාව දෙන ගමන්, CCTV සවි කිරීමේ ආයෝජනය ඇමෙරිකාවට දෙනවා, සල්ලි අරගෙන. ඉතින් කවුද ඉන්නේ? එතකොට චීන්නු ව්‍යාපෘතිය කරන තැනට ගිහිල්ලා ඇමෙරිකානුවෝ CCTV සවි කරනකොට, චීන ආයෝජකයා ඉන්නේ නැහැ. එතකොට චීන ආයෝජකයා යනවා. ඒක තමයි කිව්වේ, කළමනාකරණය පිළිබඳව දිගින් දිගටම ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මේ බලවත් රටවල් අපේ රටේ කරන ආයෝජන පිළිබඳව නිවැරදිව තොරතුරු වටහාගෙන අපට ඒවා කළමනාකරණය කර ගන්න බැරි වුණොත්, ඉදිරි කාලයේදී තවත් ආයෝජකයින් ආපසු යන්න පුළුවන්. ඒ හින්දා වරායේ ඇති වුණු මේ සිදුවීම උදාහරණයකට ගන්න. ඇමෙරිකානු ඩොලර් මිලියන 392ක චීන ආයෝජනයක් තමයි අපෙන් අයින් වෙලා ගියේ. ඩොලර් මිලියන 17ක් අපට නිකම් දෙනවා කියලා, ඩොලර් මිලියන 392ක ආයෝජනයක් අපි නැති කර ගත්තා. ඒක නැති කරගන්න වුණේ, කළමනාකරණයේ ප්‍රශ්නයක් මතයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කැබිනට් මාධ්‍ය ප්‍රකාශකතුමා කරපු ප්‍රකාශයක් අපි ඊයේ දැක්කා. පසුගිය දවස්වල Asia-Pacific Broadcasting Union එකේ සමුළුව පැවැත්වෙනවා අපි දැක්කා. අපි දන්නවා, එම සමුළුව පැවැත්වීම සඳහා රජය විසින් රුපියල් කෝටි 10ක මුදලක් ලබා දී තිබෙන බව. කැබිනට් මාධ්‍ය ප්‍රකාශක ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා ඊයේ කිව්වා, ඒ සඳහා ලබා දුන්නේ රජයේ මුදල් නොවෙයි කියලා. එලෙස ලබා දුන්නේ රජයේ මුදල් නොවෙයි නම්, ජනාධිපතිතුමා Cabinet Paper එකක් දාලා ඒ සඳහා අනුමැතිය ගන්නේ මොකටද? රජයේ මුදල් වියදම් කරන්නේ නැත්නම් කැබිනට් පත්‍රිකා දාන්න අවශ්‍ය නැහැ නේ.

[ගරු මුජීබුර් රහුමාන් මහතා]

ජනාධිපතිතුමා විසින්ම Cabinet Paper එකක් දාලා රුපියල් මිලියන 101ක විතර මුදල් ප්‍රමාණයක් - රුපියල් කෝටි 10ක වාගේ ප්‍රමාණයක් - සඳහා අනුමැතිය අරගෙන තිබෙනවා. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මුදල් කියන්නේ, මහා භාණ්ඩාගාරයේ මුදල්. සංචාරකයින්ගෙන් එකතු කරන මුදල් කියන්නේ, මේ රටේ ජනතාවගේ මුදල්. ඒවා වෙන කාගේවත් මුදල් නොවෙයි. එතකොට ජනතාවගේ මුදල් තමයි ABU එකේ සමුළුව පවත්වන්න ආණ්ඩුව විසින් ලබා දුන්නේ. මීට පෙරත් මේ වාගේම සිදුවීමක් වෙලා තිබෙනවා. මම දැන් ඒකත් මතක් කරන්නම්.

සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරනවා කියලා බැසිල් රාජපක්ෂ 2014දී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මුදල්වලින් රුපියල් මිලියන 7.8ක් ලබාගෙන T-shirts 12,000ක් ගැහුවා. 2015 යහ පාලන ආණ්ඩුව යටතේ ඒකට නඩු දාලා, දැන් කොටුව මහෙස්ත්‍රාත් උසාවියේ ඒ නඩුව යනවා. පසුගිය ඔක්තෝබර් 16වැනි දා මහෙස්ත්‍රාන්තුමා වරෙන්තුවක් නිකුත් කළා, බැසිල් රාජපක්ෂව අල්ලන්න කියලා. ඒ නඩුව දාලා තිබෙන්නේ මොකටද? ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මුදල් අයථා ලෙස පරිහරණය කළා කියලා. නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, මේක ඔබතුමාගේ Cabinet Paper එකක් නොවන හින්දා ඔබතුමාට නම් ප්‍රශ්නයක් වන එකක් නැහැ. නමුත් මම මේ කියන්නේ, බැසිල් රාජපක්ෂටත් ක්‍රියාත්මක වන්නේ ඔය තියරිය නම්, ඒ වාගේම නීතිය සැමට එකයි නම්, ඒ තියරිය කාටත් එක බවයි. *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, -

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු මන්ත්‍රීතුමනි, බැසිල් රාජපක්ෂ T-shirts ගැහුවේ මැතිවරණ campaign එකටද, සංචාරක ප්‍රවර්ධනයටද?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මැතිවරණ campaign එකට තමයි. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාත් කරන්නේ campaign එකක් තමයි. හැම එක්කෙනාම කරන්නේ campaign. මම මේ කියන්නේ ඒ campaign එක, - *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඔබතුමා කියන්න, ඒක මැතිවරණ campaign එකක්ද, සංචාරක ප්‍රවර්ධනයක්ද?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මොකක්ද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
බැසිල් රාජපක්ෂ කරපු වැඩේ?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මගේ කාලය ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හොඳයි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය ලබා ගන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම කියන්නේ, සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මුදල් තමයි තමුන්නාන්සේලා, ABU - *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඔබතුමා බැසිල් රාජපක්ෂ ගැන කියන්නත් බයයි නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
බැසිල් රාජපක්ෂගේ නම මම නේ කියන්නේ. ඔබතුමා කියන්නේ නැහැ නේ. මම දැන් කිව්වේ ඒ නඩුව ගැන. ඔබතුමන්ලා ඒ නඩුව ගැනවත් කියන්නේ නැහැ නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
බැසිල් මැතිවරණයට නොවෙයි ද, ඒ මුදල් ගත්තේ?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
බැසිල් ඒ මුදල් ගත්තේ මැතිවරණයට තමයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒක නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්, ඔබතුමන්ලා ගත්තේත් ඔබතුමන්ලාගේ ප්‍රචාරණයට.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
අපි ගත්තේ සංචාරක ප්‍රවර්ධනයට.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

දෙකම එකයි. බැසිල් ගත්තේ උෟව පළාත් සභා මැතිවරණයට. තමුන්නාන්සේලා ගත්තා, ජනාධිපතිතුමාගේ ප්‍රතිරූපය හදන්න. මේ දෙකම එකයි නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට, සංචාරක ප්‍රවර්ධනය සඳහා මුදල් වෙන් කිරීමේ අයිතියක් තිබෙනවා. එහි Director Board එකට එම තීන්දුව ගන්න පුළුවන්. මීට කලින් Derana Kite Festival එකට, රග්බි තරගවලට, Colombo Marathon එකට ආදී වශයෙන් ක්‍රීඩා ප්‍රවර්ධනය හරහා සංචාරකයින් ආකර්ෂණය කර ගන්නට අර වාගේ විවිධ අවස්ථාවලදී සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් මුදල් ලබා දීලා තිබෙනවා. ඒක ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සතුව තිබෙන අයිතියක්. මේ මන්ත්‍රීතුමාට ඒක තේරුම් ගන්න පුළුවන් නේ. හැබැයි, බැසිල් රාජපක්ෂ වියදම් කරලා තිබෙන්නේ මැතිවරණ campaign එකකට. මේක, සංචාරක ප්‍රවර්ධනය සඳහා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය ලබා ගන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් අපේ ඇමතිතුමා කියනවා, මේක ගත්තේ පෞද්ගලික කටයුත්තක් වෙනුවෙන් නොවෙයි කියලා. නමුත්, ඇමතිතුමා ඊයේ press conference එකේදි කිව්වා, මේවා ආණ්ඩුවේ මුදල් නොවෙයි කියලා. මේවා ආණ්ඩුවේ මුදල් නේ. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ තිබෙන මුදල් රජයේ මුදල්. එහෙම නම් ඔබතුමා press conference එකේදි බොරු කිව්වේ ඇයි? ඇයි බොරු කිව්වේ? ඔබතුමා බොරු කියන්න එපා. මම ඔබතුමාට හරිම ආදරෙයි. මොකද, ඔබතුමා හොඳ ඇමතිවරයෙක්. නමුත්, ඔබතුමාත් එක එක ලණු කාලා ගිහිල්ලා එක එක දේවල් කියලා මාට්ටු වෙනවා. එහෙම මාට්ටු වෙන්න එපා. මොකද, මම දන්නවා නේ ඔබතුමා ගැන.

ඔබතුමා එදා මෙතැනට ඇවිල්ලා බාර්වල නම් ලැයිස්තුවක් කිව්වා. ඒවාට විරුද්ධව නඩු දමනවා කිව්වා. කෝ, නඩු දැම්මාද? දැන් ලැයිස්තුවත් නැහැ. ඒ කියපු ලැයිස්තුව අපි ඉල්ලුවා. ඔය ලැයිස්තුව දෙන්න කියලා අපි ඉල්ලුවා. ඒ ලැයිස්තුව දුන්නේත් නැහැ. ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඔබතුමාට හොඳ අනාගතයක් තිබෙනවා. ඔබතුමාට කවදා හෝ දවසක නායකයෙක් වෙන්න පුළුවන්. හැබැයි, ඔබතුමා අනුන්ගේ ලණු නම් කන්න එපා. ඔබතුමාගේ ළඟ ඉන්න අය ඔබතුමාට ලණු දෙන්න පුළුවන්. ඒ ලණු කාලා ඔබතුමා විනාශ වෙන්න එපා. මොකද, ඔබතුමාට හොඳ මොළයක් තිබෙනවා. ඒ නිසා කථා කරනකොට ඔබතුමා හොඳට මොළය පාවිච්චි කරලා කථා කරන්න කියලා මම යාළුවෙක් හැටියට ඔබතුමාට කියනවා. ඔබතුමාට තිබෙන ආදරයටයි මම මේ දේවල් කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ සාකච්ඡාව යන අතරතුරදී මම තවත් වැදගත් දෙයක් කියන්න ඕනෑ. මාලිගාවත්තේ තිබෙනවා, පී.ඩී. සිරිසේන ක්‍රීඩාංගණය. පසුගිය 31වැනි දා ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික විද්වත් සංවිධානයේ ජාතික සමුළුව එහිදී පැවැත්වුවා. ඊළඟට, මේ මාසයේ 07වැනි දා තිබෙනවා, ඔබතුමන්ලාගේ වෘත්තීය සමිති ජාතික සමුළුව. 31වැනි දා සමුළුව පවත්වන්න 27වැනි දා ඉඳලා මේ මාසයේ 07වැනි දා වෙනකල් ඒ ක්‍රීඩාංගණය වැහුවා.

ඒ ප්‍රදේශයේ ඉන්නවා, Maligawatta youth football team එකක්. ඒක, Division One තරග පැවැත්වෙන ground එකක්. අද ඒ ground එකේ ළමයින්ට සෙල්ලම් කරන්න විධියක් නැහැ. Ground එක දවස් 12ක් තිස්සේ වහලා දාලා තිබෙනවා. ඇයි එහෙම කරන්නේ? ඒක ලොකු අපරාධයක්. පොලීසියත් දමලා, ගේට්ටුවකුත් දාලා ground එක වහලා තිබෙනවා. ඒක, ඒ පළාතේ ඉන්න ළමයි සෙල්ලම් කරන ක්‍රීඩාංගණය; මිනිස්සු උදේට ගිහිල්ලා ව්‍යායාම කරන ක්‍රීඩාංගණය. ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 31වැනි දා පැවැත්වුණු රැස්වීමට 27වැනි දා ඉඳලා ක්‍රීඩාංගණය වැහුවා. දැන් ඒ රැස්වීම ඉවරයි. ඊළඟට 07වැනි දා රැස්වීමක් තිබෙනවා. ඒ නිසා දවස් 12ක් තිස්සේ ඒ ground එක වහලා තිබෙනවා.

දැන් ඔබතුමන්ලා කිව්වා, ඔබතුමන්ලා නිර්ප්‍රභූලා කියලා. හැබැයි, ප්‍රභූලා පාලනය කළ කාලයේදීත් සති ගණන් ground වැහුවේ නැහැ. නමුත් දැන් තමුන්නාන්සේලා නිර්ප්‍රභූලා කිය-කියා ප්‍රභූලාටත් එහා ගිය වැඩ කරනවා. සති ගණනක් ground එක වහලා නිසා ළමයි අනාථ වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මට තව වැඩිපුර විනාඩි දෙකක් ලබා දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමාට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අමතර විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

තමුන්නාන්සේලා දැන් අලුත් පනත් කෙටුම්පතක් ගෙනෙන්න කටයුතු කරමින් ඉන්නවා. ඒ, ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත. අපි දන්නවා, තමුන්නාන්සේලා ඒ පනත් කෙටුම්පත ගෙනෙන්න බලාපොරොත්තු වෙනවාය කියලා. අපනයනය කරනකොට GSP Plus එකට ඒ පනත් කෙටුම්පත අනිවාර්යයෙන් බලපානවා. ඒ පනත් කෙටුම්පතට ජාත්‍යන්තර සංවිධාන, අපේ රටේ මානව හිමිකම් සංවිධාන කියන සියලුදෙනාම අද වනකොට විරුද්ධ වෙලා තිබෙනවා. එහෙනම් ඒ පනත් කෙටුම්පත ගෙනෙන්නේ ඇයි? තමුන්නාන්සේලා හැම තිස්සේම කියනවා, ජනතා පාලනයක් තිබෙන්නේ කියලා. ඒ වාගේම

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ජනතාවගේ ආණ්ඩුවක්, ජනතාවාදී ආණ්ඩුවක් කියාත් කියනවා. එහෙම කියන ගමන් මර්දන නීති ගෙනෙන්නේ ඇයි? මේ මර්දන නීති අවශ්‍ය වෙන්නේ ඇයි? ජනතාවාදී ආණ්ඩුවක් නම් මර්දන නීති අවශ්‍ය වෙන්නේ නැහැ. මේ පනත් කෙටුම්පත් ගෙන එන්නේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ දිගුවක් හැටියට තමයි කියලා අපි එදා කිව්වා. ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පතත්, සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පතත් කියන පනත් කෙටුම්පත් දෙකම විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් එහාට ගිය දිගුවක් හැටියට තමයි එන්නේ කියලා අපි විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙනකොට කිව්වා. අද ඒක ඉෂ්ට වෙලා තිබෙනවා. ඒ නිසා තමයි විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ. එතකොට අපි කිව්වා, තමුන්නාන්සේලා අධිකරණයේ තීන්දුවලට බලපෑම් කරන්න, අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑම් කරන්න විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා කියලා. අද PST Bill එකයි, POC Bill එකයි ගෙනෙන්නේ වෙන මොකකටවත් නොවෙයි. තමුන්නාන්සේලාට විරුද්ධව කථා කරන, තමුන්නාන්සේලාට විරුද්ධ මත දරන සියලුදෙනාම මර්දනය කරන්න අවශ්‍ය නීතිරීති තමයි PST Bill එක සහ POC Bill එක හරහා මේ ගෙනෙන්න හදන්නේ. ඒකයි අපි මේ කියන්නේ. ඒකයි අපි සියලුදෙනාම ඒකට විරුද්ධ.

ඉදිරියේදී එන ආර්ථික ගැටලුත් එක්ක අනිවාර්යයෙන්ම ජනතාවගේ විරෝධතා වැඩි වෙනවා. ජනතා සටන් වැඩි වෙනවා. මොකද, අද වනකොට ආර්ථිකය කළමනාකරණය කිරීමට තමුන්නාන්සේලා අපොහොසත් වෙලා තිබෙනවා. අද වනකොට උද්ධමනය සියයට 8.7කට ගිහිල්ලා තිබෙනවා. අද සමාජය තුළ ගෑස් හිඟයක් ඇතිවෙලා තිබෙනවා. ඒ වාගේම තමුන්නාන්සේලා නැවත වතාවක් සියයට 2.8කින් විදුලි බිල වැඩි කරන්න ඉල්ලලා තිබෙනවා. එහෙම නම් තමුන්නාන්සේලා දන්නවා, ඉදිරි කාලයේදී ජනතා නැඟිටීමක් එනවා කියලා. ඉදිරියේදී එන ඒ ජනතා නැඟිටීම මර්දනය කරන්න - යටපත් කරන්න - අලුත් නීතිරීති ගෙනෙන්න ඕනෑ. තමන්ගේ බලය තහවුරු කර ගන්න අලුත් නීතිරීති ගෙනෙන්න ඕනෑ. යුද්ධයක් නැතිව, ත්‍රස්තවාදී ගැටලුවක් නැතිව, මේ රටේ කැරැල්ලක් නැතිව - එහෙම කිසිම දෙයක් නැතිව - මේ රටට මර්දන නීති ගෙනෙන්නේ ඇයි? ජනතාවාදී පාලනයක් නම් මර්දන නීති අවශ්‍ය නැහැ.

එදා තමුන්නාන්සේලා නිතරම කිව්ව දෙයක් තමයි අපරාධ රාජ්‍යයක් තිබුණාය කියන එක. අපරාධ රාජ්‍යයක් තිබුණාය කියමින් තමුන්නාන්සේලා ඊටත් වඩා අපරාධ රාජ්‍යයක් හදන්න අවශ්‍ය නීතිරීති මේ රටට ගෙනෙන්න හදනවා. නමුත්, ඒ නීතිරීතිවලට පටහැනිව, ඒ නීතිරීති පරාජය කරන්න අපි ජාත්‍යන්තරවත්, දේශීයවත් ඉන්න සියලු දේශපාලන සංවිධානත් එක්ක එකතු වෙලා සමගි ජන බලවේගයේ නායකත්වයෙන් වැඩ කරන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Madam, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ Point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ස්ථාවර නියෝග 92 (2) යටතේයි මම මේ කාරණය මතු කරන්නේ. මම ඊයේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ගරු කථානායකතුමා අපට වෙලාවක් දෙන්නෙම නැති නිසා ඔබතුමිය මූලාසනයේ ඉන්න වෙලාවේදීවත් මම උත්සාහ කරන්නේ වරප්‍රසාද ප්‍රශ්නයට මොකක්ද කරන්නේ කියලා දැනගන්නයි. ඊයේ වරප්‍රසාද ප්‍රශ්න 5ක් මතු කළා. ඒ එක ප්‍රශ්නයකටවත්,-

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කථානායකතුමාව දැනුවත් කරලා,-

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මෙහෙමයි. කථානායකතුමාගෙන් ගන්න බැහැ, මොකුත් උත්තරයක්. අඩුම ගාණේ ඔබතුමියවත් සාධාරණ වෙන්න. අපට මේ ප්‍රශ්නය මතු කරන්න ඉඩ දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඊයේ ගරු නියෝජ්‍ය කථානායකතුමා ස්ථාවරය පැහැදිලි කළානේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කථානායකතුමාගෙන් ඒ ගැන අහලා කියන්න. එහෙම නැත්නම් ජයලත් මහත්මයාව ගෙන්වලා අහන්නකෝ, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ලේකම් මණ්ඩලයෙන් කරුණු දැනගෙන වාර්තා කරන්නම්.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද තීරණය කරනවා කියලා කිව්වා. *[බාධා කිරීමක්]*

[පූ.භා. 10.46]

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් ජනතා නැඟිටීමක් ගැන කථා කරනවා අපි අහගෙන හිටියා. සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පතට විරුද්ධ වන්නේ ඇයි කියන එකත් ඒකත් එක්කම අපට තේරුම් ගන්න

පුළුවන්. ඒත් එක්කම ආර්ථික අර්බුදයක් ගැනත් කථා කළා. ලංකාවේ ජනතා නැඟිටීමක් එනවාය කිව්වා. අපිට තේරෙනවා, මේ යන ලයින් එක මොකක්ද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම දැන් ආසනයෙන් නැඟිටිටෙත් ඇත්තටම ඇමෙරිකාවේ Midterm Elections live results බලමින් ඉඳලා.

අපි දන්නවා, මේ වනකොට උද්ගත වෙලා තිබෙන ලෝක තෙල් අර්බුදය ගැන. යුද්ධය පටන් ගත්තාට පස්සේ, මේ අවුරුද්දේ පෙබරවාරි 28වැනි දා ඉඳලා යුද්ධයට සෘජුව මැදිහත් වන රටවලත් උද්ගත වෙච්ච ආර්ථික අර්බුදය, දේශපාලන අර්බුදයක් බවට පත් වෙලා, ඒ රටවල බල තුලනයත් වෙනස් වෙලා තිබෙනවා.

දැවැන්ත ආර්ථිකයක් තිබෙන, විදේශ සංචිත විශාල ප්‍රමාණයක් තිබෙන රටවලුත් මේ විධියට අර්බුදයට ලක් වෙලා තිබෙනකොට අපි වාගේ කුඩා ආර්ථිකයක් තිබෙන රටක් අවුරුදු දෙකක් ඇතුළත කම්පන දෙකකටත් ඔරොත්තු දෙමින් ආර්ථිකය කළමනාකරණය කළේ කෙසේද කියන එක පිළිබඳව මේ සභාවත්, මුළු රටත් දැනගත යුතුයි කියන අදහසේ අප ඉන්නවා. ඇති වෙලා තිබෙන මේ අර්බුදයට විසඳුමක් ලෙස අද ඉදිරිපත් කරන මේ පරිපූරක ඇස්තමේන්තුව තුළින් අපි ඉලක්කගත ප්‍රජාවන් වෙනුවෙන් වාගේම සමස්ත ප්‍රජාවන් වෙනුවෙනුත් මුදල් වෙන් කරනවා, අවුරුදු දෙකක් තුළ අපි හදා ගත්ත ආර්ථික ස්ථායීකරණය හරහා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා, අපි ආණ්ඩුව භාර ගන්න අවුරුදු දෙකකට කලින් - 2022 අවුරුද්දේ - රට කොතැනද තිබුණේ කියන එක. එතකොට තෙල් තිබුණේ නැහැ, ගෑස් තිබුණේ නැහැ. ලෝකයේ මෙවැනි අර්බුදයක් තිබුණේ නැහැ. හැබැයි, අපිට ඒවා ගන්න සල්ලි තිබුණේ නැහැ. ඒ නිසා ආර්ථික අර්බුදයක් නිර්මාණය වුණා. ඒ ඇති වෙච්ච ආර්ථික අර්බුදය, දේශපාලන අර්බුදයක් බවට පරිවර්තනය වෙලා regime change එකක් දක්වා තල්ලු වුණා. අද වනකොට ඇති වෙලා තිබෙන බලශක්ති අර්බුදය නිසා අපි වාගේ කුඩා රටවලට ඩොලරයේ අගය තුළින් කොච්චර pressure එකක් තිබෙනවාද කියන එක ගැන දළ වශයෙන් idea එකක් ගන්න පුළුවන්. 2025 අවුරුද්ද පුරාවටම තෙල් ආනයනය වෙනුවෙන් අපි වියදම් කළේ ඩොලර් මිලියන 4,043යි. හැබැයි, මේ අවුරුද්දේ පළමුවැනි මාස 9 තුළ - ජනවාරි ඉඳලා සැප්තැම්බර් දක්වා - පමණක් තෙල් ආනයනය සඳහා අපිට වියදම් කරන්න වෙනවා, ඩොලර් මිලියන 4,487ක වාගේ ප්‍රමාණයක්. අවුරුද්දටම තෙල් ආනයනය සඳහා වියදම් කරපු ඩොලර් මිලියන 4,043 ඉක්මවා ගියපු ප්‍රමාණයක් මේ අවුරුද්දේ පළමුවැනි මාස 9ට වියදම් කරනවා. එච්චර තෙරපුමක් තිබෙනවා, ඩොලරයේ අගය කෙරෙහි. හැබැයි, අද වනතුරුත් තෙල් බිංදුවකවත් හිඟයක් නැතුව අපි තෙල් සැපයුම ලබා දීලා තිබෙනවා, ජනතාවට සහනාධාර දෙමින්. ඒක තමයි වැදගත්ම දේ.

ඒ විතරක් නොවෙයි, අපේ රට ණය ගෙවලා තිබුණේ නැහැ; default වෙලා තිබුණේ. අපි ණය ගෙවන්න පටන් ගත්තා. වාහන ආනයනය සම්පූර්ණයෙන් නවත්වා තිබුණේ. අපි වාහන ආනයනය කරන්න අවස්ථාව දුන්නා. ඒ වෙනුවෙනුත් රටේ මුදල් ප්‍රමාණයක් එළියට යනවා. දළ වශයෙන් - සාමාන්‍යයෙන් - LCs open කරනකොට දවසකට රටින් එළියට යන්නේ ඩොලර් මිලියන 3ක්, 4ක්, 5ක් වාගේ ප්‍රමාණයක්. හැබැයි අපි දන්නවා, පසුගිය දවස්වල ඩොලර් මිලියන 30, 80, 82 දක්වා රටින් එළියට ගිය අවස්ථාත් තිබුණු බව. ඩොලරයේ අගයට එච්චර තෙරපුමක් තිබියදීත් අපි ආර්ථිකය ස්ථාවර කරගෙන ඉදිරියට ගියා. අවුරුදු දෙකක් ගත වනකොට අපි එතැනට ඇවිල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේක කළේ කොහොමද කියලා බැලුවොත්, අපේ අපනයන ආදායම සැලකිය යුතු ආකාරයකින් වැඩි වුණා කියන එක අපි දන්නවා. 2024 අවුරුද්දේ පළමුවැනි මාස 9 තුළ අපනයනවලින් - විදේශ රටවලට යවන භාණ්ඩ හා සේවාවලින් - අපිට ලැබුණේ ඩොලර් බිලියන 12.1ක ආදායමක්. 2025 අවුරුද්දේ පළමුවැනි මාස නවය වෙනකොට අපට ලැබී තිබෙනවා, ඩොලර් බිලියන 12.9ක්. අපි ඒ ප්‍රමාණය වැඩිකර ගත්තා, එක අවුරුද්දක් ඇතුළත. ඒ අවුරුද්දම අපි වැඩිම අපනයන ආදායම ලබපු අවුරුද්ද බවට පත්කර ගත්තා, ඩොලර් බිලියන 17.25ක් ලබාගෙන. ඒ විතරක් නොවෙයි. 2026 වසරේ පළමුවැනි මාස නවයේදී විතරක් අපි අපනයන ආදායම වැඩි කර ගත්තා, ඩොලර් බිලියන 13.61ක් දක්වා. ඒ තමයි අපි ආර්ථිකය ස්ථායීකරණය කරගත්ත විධිය. ඒ වාගේම 2026 සැප්තැම්බර් මාසය ලංකාවේ ඉතිහාසයේ එක මාසයක් තුළ වැඩිම අපනයන ආදායම ලබා ගත්ත මාසය බවට පත් වුණා, ඩොලර් බිලියන 1.37ක අපනයන ආදායමක් ලබාගෙන. ඒක ගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව ගත්තොත් සියයට 21ක වර්ධනයක්. එහෙම තමයි අපි ආර්ථිකය ස්ථායීකරණය කළේ.

ඒ වාගේම විදේශ ප්‍රේෂණ ගත්තොත්, ගිය අවුරුද්දේ තමයි අපට ඉතිහාසයේ වැඩිම විදේශ ප්‍රේෂණ ලැබුණේ. ඒ, ඩොලර් බිලියන 8.1ක්. ගිය අවුරුද්දේ පළමුවැනි මාස නවයේ ලැබුණු විදේශ ප්‍රේෂණ ප්‍රමාණය ඩොලර් බිලියන 5.8යි. හැබැයි, මේ අවුරුද්දේ පළමුවැනි මාස නවයේදී අපි විදේශ ප්‍රේෂණ ප්‍රමාණය ඩොලර් බිලියන 6.8ක් දක්වා වැඩි කරගෙන තිබෙනවා; බිලියනයකින් වැඩි කරගෙන තිබෙනවා. ඒ විධියට තමයි අපි ආර්ථිකය ස්ථායීකරණය කළේ. ඔච්චර කෑ ගහන කට්ටියගේ ඉතිහාසය - අවුරුදු පහක් ආපස්සට - ගත්තොත් පෙනේවි, කොහොමද විදේශ ප්‍රේෂණ ලැබී තිබෙන්නේ කියලා. 2021 අවුරුද්දේ ලැබී තිබෙන්නේ ඩොලර් බිලියන 5.49යි; 2022 අවුරුද්දේ ඩොලර් බිලියන 3.7යි; 2023 අවුරුද්දේ ඩොලර් බිලියන 5.9යි; 2024 අවුරුද්දේ ඩොලර් බිලියන 6.5යි. 2025 අවුරුද්ද අපි වැඩිම විදේශ ප්‍රේෂණ ලබාගත් අවුරුද්ද බවට පත්කර ගත්තා, ඩොලර් බිලියන 8.1ක් ලබාගෙන. ඒ විධියට තමයි අපි ආර්ථිකය ස්ථායීකරණය කළේ.

ඊළඟට, සෘජු විදේශ ආයෝජන - foreign direct investments, FDIs - අරගෙන බලමු. ගොඩක් කට්ටිය කෑගහනවා, තවම විදේශ ආයෝජන ආවේ නැහැ කියලා. එහෙම විදේශ ආයෝජන එන්නේ නැහැ රටවලට. පාට බලලා, පක්ෂයේ පාට බලලා, පක්ෂයේ නම බලලා විදේශ ආයෝජන එන්නේ නැහැ. ආර්ථිකය කොහොමද යන්නේ, inflation එක කොහොමද තිබෙන්නේ, සංචිත කොච්චර ප්‍රමාණයක් තිබෙනවාද කියලා බලලා, ratings බලලා, ලෝකයේ අනෙක් රටවල ratings බලලා තමයි විදේශ ආයෝජන එන්නේ. 2021 ඉඳලා පසුගිය අවුරුදු 5 ඇතුළත ආපු විදේශ ආයෝජන ගත්තොත්, 2021 අවුරුද්දේ ඇවිල්ලා තිබෙන්නේ ඩොලර් මිලියන 592යි; 2022දී ඩොලර් මිලියන 884යි; 2023දී ඩොලර් මිලියන 713යි; 2024දී ඩොලර් මිලියන 759යි. 2025 අවුරුද්දේ, අපි පාලනය කළ අවුරුද්දේ වැඩිම ප්‍රමාණය ඇවිල්ලා තිබෙනවා, ඩොලර් මිලියන 1,048ක් ලෙස. ඒකත් එක්ක ratings කොහොමද වෙනස් වුණේ කියලා අපි බලමු, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. සියලුදෙනාම දන්නවා, S&P Global, Fitch Ratings, Moody's කියන හැම එකකින්ම අපි default වෙලායි තිබුණේ කියන එක. නමුත් අපි B- දක්වා ආවා. ඒ වාගේම Transparency International Sri Lankaහි Corruption Perceptions Index - CPI - එකේ අපි ස්ථාන 14ක් ඉහළට ආවා. ඊළඟට, Gross National Income - GNI - එක අනුව අපි middle-income රටක් හැටියට නම් කළා. ඊළඟට ගත්තොත්, IEP එකෙන් නිකුත් කරන 2026 ගෝලීය සාම දර්ශකයට අනුව අපි ස්ථාන 30ක් ඉස්සරහට ආවා. 2024දී හිටියේ 100 වැනි ස්ථානයේ. 2026 වෙනකොට 67වැනි ස්ථානයට ආවා. ඊට පස්සේ Henley Passport Index එකේ අපි උඩට ආවා. ඊට පස්සේ Human Development

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

Index - HDI - එකේ දකුණු ආසියාවේ ප්‍රථම තැනට ආවා. ඊළඟට, ලෝක මාධ්‍ය නිදහස් දර්ශකය ගත්තොත්, අපි 2024දී හිටියේ 150වැනි ස්ථානයේ. 2026දී අපි එහි 134වැනි ස්ථානය දක්වා ඉස්සරහට ආවා. ඊට පස්සේ, ස්ත්‍රී පුරුෂ අසමානතා පිළිබඳ දර්ශකය - Gender Inequality Index - ගත්තොත්, එහි අපි ස්ථාන 29ක් ඉස්සරහට ආවා. මේවා තමයි ratings; මේවා බලලා තමයි ආයෝජකයෝ එන්නේ. අවුරුදු දෙකක් ඇතුළත ආයෝජකයන් එන්න අපි ඒ ratings ටික ඉහළට දාලා තිබෙනවා, රටේ ආර්ථිකය ස්ථාවර කරලා පෙන්වලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා ගිය අවුරුද්දේ ආපු වැඩිම ප්‍රමාණයටත් වඩා ඉදිරියේදී එයි කියලා. මේ විධියට තමයි අපි ආර්ථිකය වෙනස් කරලා තිබෙන්නේ.

කවුරු හරි කියනවා නම් මේක අපේ රටට විතරක් සීමා වෙච්ච අර්බුදයක් කියලා, ඒක සම්පූර්ණයෙන් වැරදියි. මෙතැනදී පැහැදිලිවම තේරුම් ගත යුතු කාරණයක් තිබෙනවා. 2026 පෙබරවාරි 28වන දා ඉරාන යුද්ධය පටන් ගත්තාට පස්සේ මේ අර්බුදය නිර්මාණය වෙන්නේ අපට විතරක් නොවෙයි, අපට වඩා දැවැන්ත ආර්ථික තිබෙන රටවලුත් අර්බුදයට ලක් වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට, යුරෝපයේ ප්‍රංශය. European Union එකේ indicators වගයක් තිබෙනවා. ඒගොල්ලන් කියනවා සම්පූර්ණ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 60කට අඩුවෙන් තියා ගන්න සහ අය වැය හිඟය සියයට 5ට අඩුවෙන් තියා ගන්න කියලා. අද ප්‍රංශයට මොකක්ද වෙලා තිබෙන්නේ? ප්‍රංශය කියන්නේ ලෝකයේ දැවැන්ත ආර්ථිකයක් තිබුණු රටක්, විදේශ සංචිත තිබෙන රටක්, අද මොකක්ද වෙලා තිබෙන්නේ? ඒගොල්ලන්ගේ inflation එක වැඩි වෙලා තිබෙනවා 5.4 දක්වා. අපේ 8.3ට ගිහිල්ලා තිබෙනවා. හැබැයි අපි හිටියේ කොතැනද, දැන් ඉන්නේ කොතැනද? ඒගොල්ලන් හිටියේ කොතැනද, දැන් ඉන්නේ කොතැනද? ණය ප්‍රමාණය යුරෝ බිලියන 3.6ක් දක්වා වැඩි වෙලා තිබෙනවා, GDP එකත් එක්ක සම්පූර්ණ ණය ප්‍රමාණය සියයට 119 දක්වා වැඩි වෙලා තිබෙනවා. එක indicator එකකින් ගන්න බැහැ. සමස්තයක් විධියට ගත්තාම ඒ වාගේ දැවැන්ත රටවලුත් අර්බුදයට ගිහිල්ලා තිබෙනවා. අධ්‍යාපනය සහ defence වෙනුවෙන් වෙන් කරන මුදල් ප්‍රමාණය ඉක්මවා ගිහින් තිබෙනවා ණය, පොලී වාරිකය. එච්චර අර්බුදයකට ලක් වෙලා තිබෙනවා ඒ වාගේ දැවැන්ත රටවලුත්.

සැප්තැම්බර් මාසයේදී 4.2ට තිබුණු ඉතාලියේ උද්ධමනය එක මාසයක් ඇතුළත වැඩි වෙනවා 5.4කට; ඒවා ලොකු රටවල්. ඒ වාගේම ආර්ථික වර්ධනය - economic growth එක - තිබෙන්නේ flat rate එකක; zeroවල තිබෙන්නේ. බෙල්ජියමේ වේවර් අගමැතිතුමා අස්වීමේ ලිපිය - resignation letter - භාර දෙනවා 2007 අය වැය ලේඛනයේ හිඟය සියයට 5කට බෙරා ගන්න බැරිව, five-party coalition එකත් එක්ක. මම හිතන විධියට, පිලිප් රජ්ජුරුවෝ තවම ඒ අස්වීම accept කරලා නැහැ. එච්චර අර්බුදයට ලක් වෙලා තිබෙනවා ලෝකය. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හැබැයි අපි වාගේ කුඩා රටවල් මොකක්ද කරලා තිබෙන්නේ? ආර්ථික දර්ශක ටික කළමනාකරණය කරගෙන ගිහිල්ලා, ratings උඩට දාලා ආර්ථිකය ස්ථායීකරණය කරලා පෙන්වලා තිබෙනවා.

යුරෝපයේ ගොඩක් රටවල් අර්බුදයට ගිහිල්ලා තිබෙනවා. ස්පාඤ්ඤයේ කැරලි ඇති වෙලා තිබෙනවා. ගෙවල්වල rent එක වැඩි වෙලා තිබෙනවා, අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන මුදල් ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. ඒත් එක්ක ජනතාව එළියට එනවා, ළමයි එළියට එනවා; කැරලි ඇති වෙනවා. ඒ කැරලි දිහා බල බලා තමයි කියන්නේ ලංකාවටත් කෙළවෙනවා කියලා. එහෙම වෙන්නේ නැහැ. දර්ශක වෙනස්, අපේ හැසිරීම් වෙනස්, අපි ratingsවලින් ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. කවුරු හරි බලාපොරොත්තු වෙනවා නම් ඒ යන රැල්ලත් එක්ක ඒකත් ලංකාවට පාත් වෙයි කියලා, එහෙම වෙන්නේ නැහැ. ඕක තමයි තත්ත්වය.

දළ වශයෙන් ලෝකයේ GDP per capita එක ගත්තොත්, වියදම් කරන්නේ 18,000-28,000 වාගේ. හැබැයි යුරෝපයේ රටවල් ඊට වඩා ලොකු ගාණක්, 58,000-60,000 වාගේ වියදම් කරනවා. ඊළඟට, ඒගොල්ලන් සමාජ ආරක්ෂණය - social security - වෙනුවෙන් සාමාන්‍යයෙන් ලෝකයේ average එකට වඩා වැඩි දායකත්වයක් දක්වනවා. දළ වශයෙන් ලෝකයේ average contribution එක තිබෙන්නේ සියයට 20ක්, 21ක් වාගේ. යුරෝපයේ රටවල් සියයට 28ක වාගේ තබාගෙන ඉන්නවා. ඒ වාගේ දැවැන්ත ආර්ථිකයක් තිබෙන, අධ්‍යාපනය, සෞඛ්‍යය, වැඩිහිටි අය රැක බලා ගැනීම වෙනුවෙන් දැවැන්ත විධියට මුදල් වෙන් කරන, සමාජ සුබසාධනය වෙනුවෙන් කැපවන ඒ රටවලුත් මේ තෙල් අර්බුදය, මේ යුද්ධය නිසා ඇති වෙච්ච පීඩනයත් එක්ක අර්බුදයට ලක්වෙලා තිබෙනවා. හැබැයි, අපි වාගේ කුඩා රටවල් ඒ අර්බුදය නිසියාකාරව කළමනාකරණය කරගෙන, අවුරුදු දෙකක් තුළ කොහොමද ආර්ථිකය ස්ථාවර කළේ කියන එක පිළිබඳව දළ වශයෙන් අවබෝධයක් තිබෙනවා, ජීවමාන නිදර්ශකයක් තිබෙනවා. මේ කළමනාකරණය කිරීමේ දිගුවක් විධියට තමයි අපි ව්‍යාපෘති පටන් ගන්නේ. ආර්ථිකය ස්ථාවරකරණය කළා. එහි දිගුවක් විධියට නැවතී තිබුණු ව්‍යාපෘති අපි අලුතින් පටන් ගන්නවා. තිබුණු ව්‍යාපෘති ඉක්මන් කරනවා. මේ ආකාරයෙන් තමයි අපි ඉස්සරහට යන්නේ.

ඒ සඳහා උදාහරණයක් ගත්තොත්, දෙසැම්බර් මාසයේ පළමු සතියේ ජනාධිපතිතුමා දිනයක් දීලා තිබෙනවා. අපි හිතනවා, අපට පටන්ගන්න පුළුවන් වෙයි කියලා දඹුල්ල දක්වා දිවෙන අධිවේගී මාර්ගයේ කුරුණෑගල ඉඳලා පළමු අදියරේ කටයුතු. සතයක් ණය නැතිව, සතයක් ණය පොලී ගෙවන්නේ නැතිව, ලංකාවේ මුදල්වලින්, ලංකාවේ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අපට පටන්ගන්න පුළුවන් වෙනවා, දඹුල්ල දක්වා යන අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු. ඒ දවසේ; එකම දවසේ අපි පටන් ගන්නවා රත්නපුර අධිවේගී මාර්ගයේ ඉංගිරිය දක්වා ඉදිකිරීම් කටයුතුත්. සතයක් ණය නැතිව, සතයක් පොලී ගෙවන්නේ නැතිව, ලංකාවේ මුදල්වලින්, ලංකාවේ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අපි පටන්ගන්නවා, මේ අවුරුද්දේ දෙසැම්බර් මාසයේ එකම දවසේ ඔය අධිවේගී මාර්ග දෙකේම ඉදිකිරීම් කටයුතු. මේ තමයි ආර්ථිකයේ ප්‍රතිලාභ පහළට ගලාගෙන යන විධිය. අපි ආර්ථිකයේ සුරක්ෂිතතාව හැදුවා. දැන් එහි ප්‍රතිලාභ ජනතාව වෙනුවෙන් ගලාගෙන යන විධියක් හදලා තිබෙනවා. මෙච්චර කාලයක් මේ රට පාලනය කළේ බෙල්ලේ පාළුවට ඔළුව තිබුණු මිනිස්සු. එහෙම අය නොවෙයි, පිට රටවල් පාලනය කළේ; යුරෝපය පාලනය කළේ. හැබැයි, අද මේ වාගේ කුඩා ආර්ථිකයක් තිබෙන, කවදාවත් රාජ්‍ය පාලනය කළේ නැති අප වාගේ ව්‍යාපාරයක් ඇවිල්ලා අවුරුදු 2ක් ඇතුළත ආර්ථිකය ස්ථායිකරණය කරලා තිබෙනවා. එහි දිගුවක් විධියට අපි හිතනවා, ඉදිරි අය වැය ලේඛනයෙන් අපට පුළුවන් වෙයි කියලා මේ ප්‍රතිලාභ ඉදිරියට අරගෙන යන, බිමට භෞතික සංවර්ධනය අරගෙන යන වැඩ පිළිවෙළක් කරා යන්න.

අපි මෙතැනට ආවේ පරිවර්තනයක් කරන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒක, දේශපාලන පරිවර්තනයක්, සමාජීය පරිවර්තනයක්, ඒ වාගේම ආර්ථිකයේ පරිවර්තනයක්. අපි හිතනවා, මේ ආර්ථිකයේ පරිවර්තනය ඊළඟ අය වැය ලේඛනයෙන් ජනතාවට බලාපොරොත්තු වෙන්න පුළුවන් වෙයි කියලා. ඒ නිසා කවුරු හෝ විශ්වාස කරනවා නම් පොඩි පොඩි කැළඹීම් ඇති කරලා, එක් එක් පනත් ගැන highlight කරලා මේ

යන ගමන වළක්වන්න පුළුවන් කියලා, අපි ඒකට ඉඩ තබන්නේ නැහැ. අපි අනිවාර්යයෙන්ම මේ ස්ථාවර කරගත් ආර්ථිකය ඉදිරියට අරගෙන යන ගමන් එහි ප්‍රතිලාභ ඉදිරි අය වැය හරහා ජනතාවට ලබා දෙනවා කියන පොරොන්දුව ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 10.58]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආණ්ඩුව කථා කරනවා පරිවර්තනයක් ගැන. මට පෙනෙන එක පරිවර්තනයක් නම් තිබෙනවා. ඉස්සර ඔබතුමන්ලාගේ දෙවියෝ වුණේ මාක්ස්, ලෙනින්, ස්ටාලින්, හෝ වී මින්. මේ වෙනකොට ඒක නම් පරිවර්තනය වෙලා තිබෙනවා, ඇඩම් ස්මිත්, ෆ්‍රෙඩ්රික් හයෙක්, මිල්ටන් ෆ්‍රීඩ්මන් වෙත. *[බාධා කිරීමක්]* එංගල් කියන්න එපා, පොට වරද්දා ගන්න එපා, වසන්ත ඇමතිතුමනි. ඔබතුමා පොට වරද්දා ගන්න එපා. පිට රට ගිහිල්ලාත් පොට වරද්දා ගත්තා නේ. පොඩ්ඩක් අහගෙන ඉන්න. ඉස්සර නම් මාක්ස්, ඉස්සර නම් ලෙනින්, ඉස්සර නම් ස්ටාලින්, හෝ වී මින්. දැන් මිල්ටන් ෆ්‍රීඩ්මන්, දැන් ෆ්‍රෙඩ්රික් හයෙක්, දැන් ඇඩම් ස්මිත්. *[බාධා කිරීමක්]* බලන්න, ඔය පරිවර්තනය තුළ රටේ ජනතාව අන්දවලා තිබෙනවා.

ඔබලා ජනාධිපතිවරණයේ දී, මහ මැතිවරණයේ දී signal එක දැම්මේ වමට. දැන් යන්නේ දකුණට. ඔබ දැන් නව ලිබරල්වාදයේ කප්පිත්තන් බවට පත්වෙලා; නව ලිබරල්වාදයේ පීතෘවරුන් බවට පත්වෙලා. ඇත්තවශයෙන්ම මුදල් නියෝජ්‍ය අමාත්‍යවරයා කියනවා අපට අහන්න ලැබුණා, දත්ත පද්ධතිය සුද්ද කරන්නලු, කටයුතු කරන්නේ. දත්ත පද්ධතිය සුද්ද කරන්න නොවෙයි, ඔබතුමන්ලා බලයට ආවේ දුප්පත්කම තුරන් කරන්න. හැබැයි, වැරදි දත්ත මත නිර්මාණය වුණු අස්වැසුම අවුරුදු දෙකක් ගිහිල්ලාත් විද්‍යාත්මකව, සාක්ෂි මත පදනම්ව නිවැරදි කරගන්නට ඔබට බැරි වුණා. ඒ තරම් අදක්ෂයින් ඔබ. සාමාන්‍යයෙන් දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහනකට පරිභෝජනය, නිෂ්පාදනය, ඉතිරි කිරීම, ආයෝජනය, අපනයනය කියන කොටස් පහ තිබෙන්නට ඕනෑ. ඔබතුමන්ලා එන්නට පෙරත් තිබුණේ පරිභෝජන පැත්තක් පමණයි; ඔබතුමන්ලා ආවාට පසු තිබෙන්නේත් පරිභෝජන පැත්තක් පමණයි. හැබැයි, ඇමතිවරයා මෙතැනට ඇවිල්ලා කථා කරනවා, බහුමාන දරිද්‍රතාව පිළිබඳව.

මේ මාසයේ 12වන දාට අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා 2027 අය වැය කථාව ඉදිරිපත් කරනවා. හැබැයි, අදටත් අපේ රටේ ගෘහයක ආදායම් වියදම් සමීක්ෂණය සම්පූර්ණ කරන්නට ඔබේ රජයට බැරි වෙලා තිබෙනවා. ඔබ අයවැය කථාව කියවන්නේ රටේ දරිද්‍රතා රේඛාව නොදැනයි. රටේ දුප්පතුන් කොච්චර ඉන්නවාද, කීදෙනෙකු ආහාර නොවන වියදම් සඳහා වැය කරනවාද, කීදෙනෙකු ආහාර වියදම් සඳහා වැය කරනවාද, නාගරික බල ප්‍රදේශවල, වතු බල ප්‍රදේශවල, ග්‍රාමීය බල ප්‍රදේශවල තත්ත්වය මොකක්ද කියන දත්ත ටිකවත් නැතිව තමයි ඔබතුමන්ලා අය වැයක් ඉදිරිපත් කරන්නේ. ඒ තරම්ම බැරි කට්ටියක්, ඔබ. ඒ තරම්ම අදක්ෂ කණ්ඩායමක්, ඔබ. ඇවිදින පුස්තකාල කියලායි බලයට ආවේ. ඇවිදින පුස්තකාල දන්නේ නැහැ, රටේ තත්ත්වය ගැන. ඒ මොකද, ඔබතුමන්ලා ඉන්නේ කැටි වලාකුළුවල, කෙඳි වලාකුළුවල. මහ පොළවට බැහැලා බැලුවොත් පෙනෙනවා, අද දුප්පත්කම ව්‍යාප්ත වෙලා තිබෙන බව. අපේ රටේ ජනගහනයෙන් සියයට 30-40 ප්‍රමාණයක් දුප්පත්. ඔබ දන්නවාද, අවුරුදු 18-24 වයසැති තරුණ පරපුර ගත්තාම, වැඩිම විරැකියාව තිබෙන්නේ අපේ රටේ බව? සියයට 43යි. කවුද එහෙම කියන්නේ? ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාර්තා. උද්ධමනය ඉහළ යනවා. ආර්ථික වර්ධන වේගය පහළ වැටෙනවා. දුප්පත්කම වැඩි වෙනවා. සෘජු විදේශ ආයෝජන ගෙන්වන්නට ඔබට හැකියාවක් නැහැ. අපේ රටේ කර්මාන්තශාලා වැහෙනවා; රස්සා නැති වෙනවා. මෙහේ එක කර්මාන්තශාලාවක් වහන ආයතන පිට රට ගිහිල්ලා සම්පූර්ණයෙන්ම කර්මාන්තශාලා පද්ධතියක් - industrial estate එකක්ම - හදනවා. ඒකෙන්ම තේරෙනවා, ඔබගේ අදක්ෂකම; ඔබගේ බැරිකම.

විශේෂයෙන්ම ඔබ කරන වරද මොකක්ද? ඔබ ඕනෑවට වැඩිය IMF සරණං ගච්ඡාමි වුණා. අපේ රටේ ප්‍රාථමික ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3ට තියා ගන්න කියලා IMF එක කියන කොට, ඔබ සියයට 5.4ට යනවා. බොරු නම් 'බොරු' කියන්න. ප්‍රාථමික ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3ක් ඇති කියලා IMF එක කියන කොට, ඔබ සියයට 5.4ට යනවා. කොහොමද, ඒ ඉලක්කයට යන්නේ? බදු බර වැඩි කරලා; වැඩියෙන් බදු ගහලා. රාජ්‍ය ආදායම සියයට 13.9ක් විය යුතුයි කියලා IMF එක කියන කොට, ඔබ සියයට 15.4ට යනවා. කොහොමද යන්නේ? බදු බර වැඩි කරලා; වැඩියෙන් බදු ගහලා. පුළුවන් නම්, 'බොරු' කියලා කියන්න. *[බාධා කිරීමක්]* මේ දත්ත 'බොරු' කියලා කියන්න. මේ සංඛ්‍යාලේඛන 'බොරු' කියලා කියන්න. *[බාධා කිරීමක්]* ඇත්ත වශයෙන්ම 'බොරු' නොවෙයි, මේක සත්‍යයක්.

පොළොන්නරුව ප්‍රදේශය නියෝජනය කරන අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා කෑ කෝ ගහනවා මට ඇහෙනවා. මා හිතන්නේ ඔබතුමාටත් මේ කාරණය මතක ඇති. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්න කොට කිව්වේ නැද්ද, රුපියල් ලක්ෂ 12ට විටිස් කාර් එකක් ලබා දෙනවා කියලා? කිව්වාද, නැද්ද? පුළුවන් නම් 'කිව්වේ නැහැ' කියන්න. කෝ, අද ලක්ෂ 12 විටිස් කාර් එක? කෝ, අර රුපියල් 50,000ටද කොහේද අපේ තරුණ පරපුරට ලබා දෙනවා කියපු මෝටර් සයිකල් එක? *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කෑ කෝ ගහන්න ඉස්සෙල්ලා දැන් ඒක කියලා ඉන්න. ඔබතුමන්ලා කිව්වා නේද, වරායේ ගොඩබාන මිලටම තෙල් ටික දෙනවා කියලා? දැන් කවුරුවත් ඒ ගැන වැඩිය කථා කරන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඔබගේ ආණ්ඩුව පසුගිය දවසකදී ඔක්ටෙන් 92 පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 10කින් වැඩි කළා; ඔක්ටෙන් 95 පෙට්‍රල් ලීටරය රුපියල් 15කින් වැඩි කළා; සුදු ඩීසල් ලීටරය රුපියල් 5කින් වැඩි කළා; සුපර් ඩීසල් ලීටරය රුපියල් 15කින් වැඩි කළා. වැඩි කළාද, නැද්ද? *[බාධා කිරීම්]* වැඩි කළාද, නැද්ද? *[බාධා කිරීම්]*

මම මේ අවස්ථාවේ පැහැදිලිව කියන්න කැමැතියි, ඔබතුමන්ලා මේ රටේ ජනතාවගේ ජන ජීවිත කුඩා කරලා තිබෙන බව; ජනතාවගේ අතේ තිබෙන මුදල පික්පොකට් ගහලා තිබෙන බව; බදු බර වැඩි කරලා තිබෙන බව; සෘජු බදු, වක්‍ර බදු මහා පරිමාණයෙන් වැඩි කරලා ජනතාවගේ ජන ජීවිත අතිශය ලෙස දුෂ්කරතාවට පත් කරලා තිබෙන බව. ඔබ මතක තබා ගන්න, ඔබ ජනතාවගේ ආර්ථික අයිතිය උල්ලංඝනය කරලා තිබෙන බව; ඔබ ජනතාවගේ සමාජයීය අයිතිය උල්ලංඝනය කරලා තිබෙන බව. එක පැත්තකින් ඒක කරන ගමන් ඔබතුමන්ලා අහිතකර අණ පනත් ද ගෙනෙනවා. එකක් තමයි, ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත. ඔබතුමන්ලා ගෙනෙන්නේ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත නොවෙයි, මහත්තයෝ. ඔබතුමන්ලාගේ ඒ බොරු පොරොන්දු ටික ක්‍රියාත්මක කර ගන්න බැරුව, ඔබතුමන්ලාගේ බොරු රැල්ල පවත්වා ගෙන යන්න බැරුව නිර්මාණය වන ජන බලවේගය මර්දනය කරන්න, ජනතාවගෙන් ඔබව ආරක්ෂා කරන පනත් කෙටුම්පත ගෙන එනවා. ජනතාවගෙන් ඔබව ආරක්ෂා කරන පනත් කෙටුම්පතයි ඒ ගෙන එන්නේ. දැන් බලන්න, ඒ පනත් කෙටුම්පත හරහා විශේෂයෙන්ම ත්‍රස්තවාදය පිළිබඳව අර්ථ දැක්වීම් කරලා තිබෙන්නේ කොහොමද කියලා. සාමාන්‍ය ජනතාවට තමයි ත්‍රස්තවාදයෙන් පොදු හිංසනය සිදු වෙන්නේ. දැන් ඒක පැත්තකට දාලා රාජ්‍යයක් ගැන කථා කරලා මොකක්ද කරන්නේ? ඔබතුමන්ලාගේ දේශපාලන විරුද්ධවාදීන් මර්දනය කරන්න හදනවා.

රාජ්‍යය ආරක්ෂා කිරීමේ නම දාලා විරුද්ධවාදීන් මර්දනය කරන අණ පනත් ගෙනෙනවා. ඒක ඉතාම පැහැදිලියි. එම පනත් කෙටුම්පතේ 3(1) වගන්තිය, 3(2) වගන්තියේ (ඇ) සහ (ඊ) යන ඡේද බලන්න. ඒ හැම රාමුවක් දිහාම බැලුවාම, ඔබතුමන්ලා කරන්නේ මොකක්ද කියලා පැහැදිලි වෙනවා. දේශපාලන වශයෙන් විරුද්ධ වූ කණ්ඩායම්වලට එරෙහිව පියවර අරගෙන ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කිරීමයි ඔබතුමන්ලාගේ අරමුණ; ප්‍රජාතන්ත්‍රවාදය සංකෝචනය කිරීමයි ඔබතුමන්ලාගේ අරමුණ; මානව අයිතීන්, දේශපාලන අයිතීන්, සමාජයීය අයිතීන්, ආර්ථික අයිතීන් ආදි සියල්ල උල්ලංඝනය කිරීමයි ඔබතුමන්ලාගේ අරමුණ. ඒ වාගේම දීර්ඝ කාලීනව රඳවා ගැනීමේ නියෝග, ඇප ලබා දීම ප්‍රතික්ෂේප කිරීම, නීතිඥවරයෙකු හමුවීමේ අයිතිය අහිමි කිරීම ආදිය මෙහි ඇතුළත් වනවා. ස්වාධීන සමාලෝචන කමිටුවට තමන්ට ඕනෑ ඕනෑ අය පත් කර ගන්නවා. මේ හැම දෙයකින්ම කරන්න හදන්නේ රටේ ලක්ෂ 220ක් වූ ජනතාව මර්දනය කිරීමයි. 59වැනි වගන්තියෙන් විධායකයට - ජනාධිපතිවරයාට - බලය දීලා තිබෙනවා, "ත්‍රස්තවාදියා" කවුද කියන එක නිර්වචනය කරන්න; විග්‍රහ කරන්න. ඒක ඉතාම බරපතළ, භයානක තත්ත්වයක්. ජනාධිපතිවරයාගේ මතයට විරුද්ධ මතයක් නිර්මාණය වෙලා, ඒ විරුද්ධ මතය වටා මේ රටේ ලක්ෂ ගණනින්, දසලක්ෂ ගණනින් ජනතාව පෙළ ගැහෙන කොට, පාද යාත්‍රා යන කොට, උද්ඝෝෂණ කරන කොට, කථා කරන කොට, අදහස් ඉදිරිපත් කරන කොට, රැස්වීම් පවත්වන කොට, ඒ හැම දෙයක්ම ත්‍රස්තවාදී ක්‍රියාවක් හැටියට මේ අණ පනත් හරහා ක්‍රියාත්මක කරන්න විධායකයට බලය ලැබෙනවා; ජනතා විමුක්ති පෙරමුණට බලය ලැබෙනවා; පැලවත්තට බලය ලැබෙනවා. මේ වාගේ තත්ත්වයක් තුළ ඔබතුමන්ලා කරන්නේ ඔබතුමන්ලාගේම ජන වරම අමු අමුවේ උල්ලංඝනය කිරීමයි. නමුත්, ඔබතුමන්ලාට ජන වරම ලැබුණේ ප්‍රජාතන්ත්‍රවාදය සංකෝචනය කරන්න නොවෙයි; ප්‍රජාතන්ත්‍රවාදය කුඩා කරන්න නොවෙයි; ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන්න නොවෙයි. ඔබතුමන්ලා බලයට පත් වුණේ, ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ප්‍රසාරණය කරනවා කියලා; ප්‍රජාතන්ත්‍රවාදය ව්‍යාප්ත කරනවා කියලා; රටේ හැම ජන කොට්ඨාසයකගේම ප්‍රජාතන්ත්‍රවාදී අයිතින් සුරක්ෂිත කරනවා කියලා. ඒ පොරොන්දුව මත තමයි ඔබතුමන්ලා බලයට පත් වුණේ. අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාගේ නව ලිබරල්වාදී ආණ්ඩුව එදා ජනතාවට කිව්වේ, ජනතාවගේ යුක්තිය, සාධාරණත්වය, ජන ජීවිත ආරක්ෂා කරනවා කියලා. නමුත්, අද අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාගේ නව ලිබරල්වාදී ආණ්ඩුව මේ රටේ ජනතාවගේ ජන ජීවිත කුඩුපට්ටම් කරලා, කුප්‍රකට ධනවතුන් කොට්ඨාසයක්, ධනපතියන් කොට්ඨාසයක්, ගජමිතුරු ධනවාදීන් ටිකදෙනෙක් රජ කරවන ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අන්ත නින්දිතයි කියන එක මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊයේ පෙරේදා ඉන්ධන මිල වැඩි කළා. හෙට අනිද්දා විදුලි බිල වැඩි කරන්නත් ලැහැස්ති වෙනවාලු. ඔබතුමන්ලා පොරොන්දු වුණේ, විදුලි බිල තුනෙන් එකකින් අඩු කරනවා කියලා. රුපියල් 9,000ක විදුලි බිල රුපියල් 6,000ක් කරනවා කිව්වා. රුපියල් 3,000ක බිල රුපියල් 2,000ක් කරනවා කිව්වා. අදටත් ඒ පොරොන්දු ක්‍රියාත්මක කරලා නැහැ. මේ අවස්ථාවේ අපි අනුර කුමාර දිසානායක ආණ්ඩුවට අභියෝගයක් කරනවා. ඇමෙරිකා එක්සත් ජනපදයේ Midterm Electionsවල ප්‍රතිඵලය දිහා බලන්න. ජනතා විරෝධීව, ජනතාවගේ සුබසාධනය කප්පාදු කරලා, බඩු මිල වැඩි වන තත්ත්වයක් තුළ අද ඇමෙරිකාවේ සිදු වන ඒ පරිවර්තනය දිහා බලන්න. අපි යෝජනා කරනවා, ඔබතුමන්ලාට කොන්දක් තිබෙනවා නම්, කශේරුකාවක් තිබෙනවා නම්, වහාම අපේ රටේ පළාත් සභා මැතිවරණය පවත්වන්න කියලා. එතකොට මේ රටේ ලක්ෂ 220ක් වූ ජනතාවගේ සැබෑ හඬ ඉස්මතු වෙයි.

මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට කියන්න කැමතියි, කරුණාකරලා ජනතාවට පොරොන්දු වුණු සහන ටික ලබා දෙන්න කියලා. දෙයියන්ගේ නාමයට බදු බර අඩු කරන්න. දෙයියන්ගේ නාමයට දුප්පත් ජනතාව දුප්පත්කමින් මුදා ගන්නට වැඩ පිළිවෙළක් යොදන්න. දෙයියන්ගේ නාමයට මේ රටේ තරුණ පරපුරට වැඩ කළ හැකි පරිසරයක් නිර්මාණය කරන්න. අද මේ රටේ උපාධිධාරීන් 80,000ක් රස්සා නැතිව ඉන්නවා. ඔබතුමන්ලා උපාධිධාරීන් අරගෙන ඒ අයත් එක්ක canvassing ගියා නේද? පාසල් සංවර්ධන නිලධාරීන් සමඟ ගෙයින් ගෙට ගියා නේද? ඒ අයත් එක්ක ඡන්ද එකතු කළා නේද? උපාධිධාරීන් 80,000ක් අද මහ පාරේ. උපාධිධාරීන් 80,000කට අද රස්සා නැහැ. ඒ වාගේම පාසල් සංවර්ධන නිලධාරීන්ට පොරොන්දු වුණු දේවල් ඉෂ්ට කරන්න. ගොවි ජනතාවට පොරොන්දු වුණු දේවල් ඉෂ්ට කරන්න. ජනාධිපතිකම ගන්න එදා ඔබතුමන්ලාට හොඳයි කුඹුරට බැහැලා ගොයම් කකා වී කිලෝවට රුපියල් 150යි කියන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මට කියන්නකෝ, දැන් පොළොන්නරුවේ වී කිලෝව රුපියල් කීයටද විකිණෙන්නේ කියලා. කීයටද, විකිණෙන්නේ? මම පසුගිය දිනෙක පොළොන්නරුවට ගියා. වී කිලෝව රුපියල් 80ට, රුපියල් 85ට විකිණෙන්නේ. ඒකයි ඇත්ත.

ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)
බොරු, බොරු.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හැමෝටම ඇහෙන්න මම කියනවා, අපේ ගරු ටී.බී. සරත් මැතිතුමා කියනවා, මම කියන්නේ පට්ටපල් බොරුලු. පොළොන්නරුවේ ජනතාවනි, සරත් මැතිතුමා කියනවා මම කියන්නේ, පට්ට බොරුලු. නමුත්, මම අභියෝග කරනවා අද පොළොන්නරුවේ වී කිලෝවක් විකිණෙන්නේ රුපියල් 80ට, රුපියල් 85ට කියලා. ඕනෑ නම් රුපියල් 90ටත් විකිණෙයි. හැබැයි, ඔබතුමන්ලා පොරොන්දු වුණේ, ගොයම් කකා කිව්වේ, වී කිලෝව රුපියල් 150කට ගන්නවා කියලායි. කරුණාකරලා මේ රටේ ජනතාවට තවදුරටත් බොරු කරන්නේ නැතිව යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට කරන්න කටයුතු කරන්න. ඒ සඳහා මේ රටට තිබෙන එකම විකල්පය සමඟි ජන බලවේගයයි, සමඟි ජන සන්ධානයයි. අපි අනිවාර්යයෙන්ම මේ රටේ ජනතාව වෙනුවෙන් යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට කරලා සැමට සෞභාග්‍ය ලබා දෙන යුගය බිහි කරනවා කියන එක ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, " ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[පූ.භා. 11.13]

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමාගේ කථාවෙන් පසුව කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. මොකද, එතුමා සඳහන් කළ කරුණුවලට පිළිතුරු දිය යුතුයි.

එතුමා කථාව පටන් ගත්තේ, ජාතික ජන බලවේගයේ අපි අනුගමනය කරපු ආර්ථික ප්‍රතිපත්තිය පැත්තක තියලා දැන් වෙන දිහාවක යනවා කියමිනුයි. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා තවම ඇඩම්ස් ස්මිත්ගේ පැත්තේ හිටියාට, අපි කාල් මාක්ස්ගේ පැත්තට ඇවිල්ලා ගොඩක් කල්. ආර්ථික විද්‍යාව දියුණු කරපු, ආර්ථික විද්‍යාඥයෝ බොහෝ කල් සිට ආර්ථික විද්‍යාව දියුණු කරගෙන ආවා. 1723දී උපත ලද ඇඩම්ස් ස්මිත් 1790 වෙන කල් ජීවත්ව හිටියා. ඇඩම්ස් ස්මිත්ට පස්සේ ආර්ථික විද්‍යාව දියුණු කරපු තවත් කට්ටිය හිටියා. ඔබතුමාට ඒ නම් ටික හොයා ගන්න බැරි වෙන්න ඇති. හැබැයි, අපි කාල් මාක්ස් පිළිබඳව කථා කරන්නේ නිකම් නොවෙයි. ඔහු තමයි 20වන සියවසේ ලෝකය නම් කරපු දාර්ශනිකයා. ඊළඟට, ෆ්‍රෙඩ්රික් එන්ගල්ස් කියන දාර්ශනිකයාත් ඉන්නවා. කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එන්ගල්ස් එකතු වෙලා කරපු බොහෝ දේවල් තිබෙනවා. අපි ඒවාත් අනුගමනය කරනවා. මම ඒ කාරණය ගැන දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. මාඕ සේතුං මැතිතුමා කියා තිබෙනවා, "ඔබේ සාර්ථකත්වය පිළිබඳව ඔබට මැන ගන්න තිබෙන හොඳම දේ ඔබේ ප්‍රතිවාදියාගේ විවේචනයයි" කියලා. අද විපක්ෂ නායකතුමාගේ විවේචනය ජාතික ජන බලවේගයේ ආණ්ඩුව සාර්ථක ගමනක් යනවා කියන එක සහතික කරලා තිබෙනවා. එතුමාට රිදිලා තිබෙන තරම කොච්චර ද කියලා ඒකෙන් පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට විපක්ෂ නායකතුමා උපාධිධාරීන් 80,000 ගැන කියන්න පටන් ගත්තා. ඉතිහාසයේ ඉඳලා ගත්තාම අපේ රටේ විශ්වවිද්‍යාලවලට මේ අවුරුද්දේ තමයි වැඩිම ශිෂ්‍යයෝ ප්‍රමාණයක් ඇතුළත් කර ගත්තේ. පසුගිය අවුරුදුවල ඇතුළත් කරගෙන තිබෙන්නේ ශිෂ්‍යයෝ 37,000යි, 38,000යි. සාමාන්‍යයෙන් අවුරුද්දක් තුළ විශ්වවිද්‍යාලවලින් පිට වන උපාධිධාරීන්ගෙන් සියයට 40ක්, 50ක් පෞද්ගලික අංශය එක්ක එකතු වෙනවා. තවත් සියයට 30ක් පමණ හැම අවුරුද්දේම රැකියා නැතිව ඉන්නවා. ඒ පිරිසට මෙතුමන්ලා රස්සා දුන්නාද? නැහැ. හැබැයි, අපි රස්සා දෙනකොට "උස නම් සිකියුරිටි, මිටි නම් කම්කරු" කිව්වේ නැහැ. අපි සියඹලා ගස් යට interviews පැවැත්වූයේ නැහැ. ඒ ඉතිහාසය විපක්ෂ නායකතුමා මතක් කර ගත්තොත් හොඳයි. අපි "උස නම් සිකියුරිටි, මිටි නම් කම්කරු" කියලා රස්සා දුන්නේ නැහැ. ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මේ අවුරුදු එකහමාර ඇතුළත 121,000කට රස්සා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ ඉතිහාස කථාව ආපහු ඔබතුමාට මතක් කරලා දෙන්න ඕනෑ.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා වී මිල ගැනත් බොරු කිව්වා. ඔබතුමා හිතුන හිතුන ඒවා කියනවා. හැබැයි, ඉතිහාසය පුරාවට ඒ සම්බන්ධව අරගෙන තිබෙන පියවර මොකක්ද? *[බාධා කිරීමක්]* මේ අවුරුද්දේ තමයි රජය සමස්ත වී නිෂ්පාදනයෙන් සියයට 7ක් ගත්තේ. ගරු නෙල්සන් මන්ත්‍රීතුමා ඒ ගැන හොඳට දන්නවා නේ. ඔබතුමන්ලා එලෙස වී මිලදී ගත්තා ද?

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
පොළොන්නරුවට එන්නකෝ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
පොළොන්නරුවට එන්න ඕනෑ නැහැ. ආණ්ඩුවක් විසින් ඉතිහාසයේ ප්‍රථම වතාවට මේ අවුරුද්දේ තමයි සමස්ත නිෂ්පාදනයෙන් සියයට 7ක් වී මිලදී ගත්තේ. මේ ආණ්ඩුව මැදිහත් වෙලා තමයි, ඉතිහාසයේ වැඩිම වී මිලදී ගැනීම මේ අවුරුද්දේ කළේ, ගරු මන්ත්‍රීතුමා. සමස්ත වී නිෂ්පාදනයෙන් සියයට 7ක් මිලදී ගෙන තිබෙනවා.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
කීයටද ගත්තේ?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
වී කිලෝවක් රුපියල් 120ට ගත්තේ. මේ අවුරුද්දේ විතරක්,- *[බාධා කිරීමක්]*

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නෙල්සන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වෙලාවේදී කථා කරන්න. මේ, මගේ වෙලාව.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
පොඩි කාලයක් දෙන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
පොඩි කාලයක්වත් දෙන්නේ නැහැ. මෙක මගේ වෙලාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොරු කියන එක කලාවක් කර ගත්ත විපක්ෂය, අද දවසේත් බොරුව පිළිබඳව ඉතාම හොඳ සාක්ෂි දෙනවා. *[බාධා කිරීම්]* මට කියන්න වුවමනාව තිබුණේ මෙයයි. අද දවසේත්- *[බාධා කිරීම්]*

අපි අද ප්‍රමිතිගත ටයර් ආනයනය පිළිබඳවත් සාකච්ඡා කරනවා. ඒ ගැන කථා කරන්න පෙර මම මේ කාරණය කියන්න ඕනෑ. ඒ තමයි, අද ලොකු news එකක් plant කරන්න හදනවා, පිටරටින් ගෙනෙන හාල්වලට පනවලා තිබූ බද්දක් අඩු කළාය කියලා. දැන් මේ news එක ප්‍රචාරය වෙනවා. සමහර මාධ්‍ය ඒ පුවත වැඩියෙන් ප්‍රචාරය කරනවා. ඒ නිසා සහල් පිළිබඳව ප්‍රචාරය කරන කථාව සම්බන්ධයෙන් කියන්න ඕනෑ. මොකද, සංචාරක ව්‍යාපාරයට සහ සංචාරක හෝටල්වලට Jasmine rice සහ sticky rice කියන සහල් වර්ග දෙක - ඇලෙන සුළු සහල් - ගෙන්වන්න, 2023දී ආනයන හා අපනයන පාලක ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රය යටතේ තමයි අවසර දීලා තිබෙන්නේ. ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් blanket approval එකකින් තමයි ඒ සඳහා අවසර ලබා දුන්නේ. ඒකට ක්‍රමවේදයක් තිබුණේ නැහැ. පසුගිය කාලයේ අපි මේ පිළිබඳව ආහාර සුරක්ෂිතතා කමිටුවේදී සාකච්ඡා කරලා, තීරණයක් ගත්තා. ඒ තීරණය තමයි, sticky rice සඳහා පනවා තිබූ රුපියල් 65ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉවත් කර, සහල් කිලෝවක් සඳහා රුපියල් 280ක් දක්වා බද්ද වැඩි කිරීම. විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් එම සහල් වර්ග දෙක ඉවත් කළාට පස්සේ සාමාන්‍ය බදු නීතිය යටතේ තමයි ඒවා ආනයනය කරන්නේ. මින් පසුව සාමාන්‍ය බදු නීතිය යටතේ එම සහල් ලංකාවට ගෙනෙනවා නම් සහල් කිලෝ එකක් සඳහා බදු මුදල රුපියල් 280යි. රුපියල් 280ක බද්දක් යටතේ තමයි එම සහල් කිලෝවක් ගෙනෙන්න වෙන්නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ස්වර්ණ නාඩු කීයද?

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මේකේ ස්වර්ණ නාඩු නැහැ. ඒක නිසා HS code එක බලන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි 9ක අමතර කාලයක් ලැබෙනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
බොහොම ස්තුතියි.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු ඇමතිතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න තිබෙනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
අවස්ථාව දෙන්න බැහැ. ඕනෑ නම්, මගේ කථාවෙන් පස්සේ ඔබතුමා අහන්න. මම කථා නොකරන්න ඉඳලාත් කථා කරන්න ගත්තේ, විපක්ෂ නායකතුමා කියපු සමහර බොරුවලට පිළිතුරු දෙන්න ඕනෑ නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම සහල් වර්ග ආනයනය කිරීමට අදාළ approval එක දීලා තිබුණේ විධිමත් ක්‍රමවේදයක් යටතේ නොවෙයි. එම නිසා ආහාර සුරක්ෂිතතා කමිටුවෙන් ගත් තීරණ අනුව විද්වත් කමිටුවක් පත් කරලා, රටේ සහල් අවශ්‍යතාව, ආනයනය කරනු ලබන හාල් ප්‍රමාණය සහ මෙම සහල් වර්ග ගෙනෙනකොට ඒ හරහා වෙනත් සහල් ගේනවා නම් ඒකටත් වෙන බලපෑම නවත්වන්න තමයි අපි කටයුතු කළේ. ඒ අනුව මුදල් අමාත්‍යාංශය එම සහල් වර්ග දෙකේ HS code දෙකත් එක්කම ගැසට් එක නිකුත් කරලා තිබෙනවා. එම සහල් වර්ග දෙක මොකක්ද කියලා කියන්නේ නැතුව, සමහර මාධ්‍ය බොරු කියනවා. ඒක තමයි මට කියන්න වුවමනා වෙලා තිබුණේ. එහෙම නම් කියන්න ඕනෑ, මේ HS codes දෙකේ තිබෙන්නේ මෙන්න මේ සහල් වර්ග දෙක, ඒ සහල් වර්ග දෙක සඳහා සාමාන්‍ය බද්ද පැනවුවාට පස්සේ බද්ද රුපියල් 280ක් වෙනවා කියලා. කවුරුවත් එහෙම කිව්වේ නැහැ. දැන් ආපහු රටින් හාල් ගෙන්වන්න හදනවා වාගේ මතයක් ගේන්න හදනවා. නැහැ, මේකෙන් මේ හාලුත් ගෙන්වන එක අඩපණ වෙනවා. මොකද, බද්දම රුපියල් 280ක් වුණාට පස්සේ මේ හාල්වල ගණන් වැඩි වෙනවා. ඒ නිසා ඒ හාල් ගේන්නේ නැහැ.

ඊළඟට, එතුමා වී ගැන කියන්න පටන් ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ජාතික ජන බලවේග ආණ්ඩුවේ අඛණ්ඩ දෙවැනි අවුරුද්ද. 2025 අවුරුද්දේ අපේ රටේ වී අස්වැන්න, මෙට්‍රික් ටොන් මිලියන 5.1යි. ඊයේ දවසේ ආහාර සුරක්ෂිතතා කමිටුවේ අවසාන වාර්තාව අනුව, 2026 අවුරුද්දේ මේ වන විට සියයට 97.5ක වී අස්වැන්නක් ලැබිලා තිබෙනවා. යල කන්නයේ මිලියන 2.12ක්, මහ කන්නයේ මිලියන 3.3ක් විධියට මේ වන විට මිලියන 5.4කට ආසන්න වී අස්වැන්නක් ලැබිලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකා ඉතිහාසයේ වැඩිම වී ඇස්වැන්න අපි 2026 අවුරුද්දේ ලබාගෙන තිබෙනවා. ඒ වී අස්වැන්න සහල් බවට පත් කළාට පස්සේ මෙට්‍රික් ටොන් මිලියන 3.5ක් සහල් ලැබෙනවා. එම සහල් මෙට්‍රික් ටොන් මිලියන 3.5 තුළ වැඩියෙන්ම තිබෙන්නේ සුදු සහ රතු නාඩු. රජය වී මිලදී ගැනීමේ ක්‍රියාවලියට මැදිහත් වුණා. මොකද, අපි අඛණ්ඩව කිව්වා, රජය වී මිලදී ගැනීමේ ක්‍රියාවලියට මැදිහත් වෙන්නේ,

සහල් වෙළඳපොළ තිබෙන්නේ පෞද්ගලික අංශය සතුව නිසා, ගොවියාට මිලක් ලබා දීම වෙනුවෙන් කියලා. වී මිලදී ගැනීම සඳහා රජය මහ කන්නයේ රුපියල් මිලියන 10,000ක් දුන්නා. ඒ වාගේම යල කන්නයේ රුපියල් මිලියන 8,500ක් දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ රුපියල් මිලියන 8,500ට අමතරව අපි තවත් මුදලක් දුන්නා. මොකද, පෞද්ගලික අංශයේ සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට වී මිලදී ගැනීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබුණා. ඒ ඇයි? සමහරු CRIB එකේ හිටියේ. CRIB එකේ හිටපු සමහර අයට ප්‍රශ්න තිබුණා. ඒ නිසා අපි ඒ අයත් එක්ක ගිවිසුම් ගහලා, ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා 600කට ආසන්න පිරිසකට තවත් රුපියල් මිලියන 5,000ක් දුන්නා, වී මිලදී ගැනීම සඳහා. මේ ඔක්කෝම ගත්තාම, මේ වනකොට වී මෙට්‍රික් ටොන් 212,000ක් රජය සතුව තිබෙනවා. ඒ වාගේම පෞද්ගලික අංශය සතුව තිබෙනවා, තවත් වී මෙට්‍රික් ටොන් 49,000ක් පමණ. මේ සියල්ල අරගෙන තිබෙන්නේ රුපියල් 120 මිලට. වී කිලෝව රුපියල් 120ට ගන්නකොට සියයට 7ක් රජය ගත්තා. ඒ කියන්නේ, 2026 අවුරුද්දේ මේ වනකොට අපි වී අස්වැන්නෙන් සියයට 7ක් අරගෙන තිබෙනවා. තවත් ටොන් 50,000කට ආසන්න ප්‍රමාණයක් පෞද්ගලික අංශය මිලදී ගැනීමට කටයුතු කළා.

ඒ විතරක් නොවෙයි. මේ අවුරුද්දේ pledge loan එක අපි දීලා තිබෙනවා, 236දෙනෙකුට. Pledge loan එක ගන්න අයට සියයට 4ක පොලී සහනයක් දෙනවා, ආණ්ඩුව. ඒ අයටත් සියයට 4ක පොලී සහනයක් දෙන්නේ නිකම් නොවෙයි, ඒ අයත් රුපියල් 120 ගාණේ වී කිරන්න ඕනෑ. මේ අවුරුද්දේ විතරක් 36දෙනෙක් blacklist කළා, මන්ත්‍රීතුමා. 36දෙනෙක් blacklist කරලා, ඒ අය pledge loan එක ගන්න එක නැවැත්වුවා. *[බාධා කිරීමක්]*

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
Pledge loan එකෙන් භාගයයි නේ දීලා තිබෙන්නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඉතින් ඒ අය ඇවිල්ලා ගන්න එපා යැ.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
සල්ලි නැහැ කියනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
කවුද, සල්ලි නැහැ කියන්නේ?

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
දිසාපතිතුමා කියන්නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමා, pledge loan එක දෙන්නේ නැහැ නේ දිසාපතිතුමා. *[බාධා කිරීමක්]* බොරු කියනවා කියලා ඔච්චර බොරු කියන්න එපා, ඔබතුමා. Pledge loan එක දෙන්නේ නැහැ, දිසාපතිතුමා. ගරු මන්ත්‍රීතුමාට බොරුව කියාගන්න ගියාම පැටලුණා. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, ඔබතුමා හරි. ඔබතුමා කිව්වේ pledge loan එක දෙන්නේ නැහැ කියලා නේ. Pledge loan එක දෙන්නේ බැංකුව; ගරු මන්ත්‍රීතුමනි, ඔඩපණ ණය දෙන්නේ බැංකු විසින්.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු ඇමතිතුමනි, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී අපි මේ ප්‍රශ්නය ඇහුවාම කිව්වා, දැන් ඉතුරු මුදල දෙන්න සල්ලි නැහැ කියලා. ඒ අදාළ බැංකුවලින් තමයි ඒක කියලා තිබෙන්නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මම කාලයක ඉඳන් දන්නා කෙනෙක් නේ. ඒ නිසා ඔබතුමා මේ කාරණය පටලවා ගත්ත එක ගැන තමයි මම මේ කියන්නේ. ඔඩපණ ණය දෙන්නේ බැංකු. ඔබතුමා ඔය කියන්නේ අපේ විශේෂ ව්‍යාපෘතිය යටතේ ලබා දුන් රුපියල් මිලියන 5,000 පිළිබඳව. ඒ රුපියල් මිලියන 5,000 දෙනකොට අපි යම්කිසි කාලයක් දීලා කිව්වා, ඒ කාලය ඇතුළත එම ණය මුදල ඉල්ලන්න කියලා. ඒ ණය මුදල ඉල්ලන මෝල් හිමියන්ට රුපියල් මිලියන 25ක් පොලී නැතුව අපි ලබා දුන්නා, මන්ත්‍රීතුමා. මතක තියාගන්න, රුපියල් මිලියන 25ක් පොලී නැතුව මාස 8කට දුන්නා. *[බාධා කිරීමක්]* ඒ රුපියල් මිලියන 5,000 රට පුරා භයසිය ගාණකට දුන්නා. විශේෂයෙන් යාපනයට සහ කිලිනොච්චියට රුපියල් මිලියන 400ක් වෙන්කොට තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. යාපනයේ සහ කිලිනොච්චියේ ඒ වනකොට වී අස්වැන්න විකුණා ඉවර වුණා, තව ටිකයි තිබුණේ. ඒ නිසා ඒගොල්ලන්ට ඒ රුපියල් මිලියන 400න්, මිලියන 100ක් පමණ තමයි වුවමනා වුණේ. ඉතුරු ටිකත් පොළොන්නරුවටයි, කුරුණෑගලටයි දුන්නා, මන්ත්‍රීතුමා. ඒ අනුව ඒ රුපියල් මිලියන 5,000ම දුන්නා. අපි රුපියල් මිලියන 5,000ක් දුන්නේ නිකම් නොවෙයි, මාස 8ක් පොලී නැතුව. කුඩා පරිමාණ මෝල් හිමියන්ට දුන්නා, වී කිලෝව රුපියල් 120 ගාණේ මිලදී ගන්න. මේගොල්ලන් මේවා කරලා තිබෙනවාද? නැහැ, මේවා කරලා නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, ඔබතුමා මොකක්ද කියන්නේ?

ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
ගරු ඇමතිතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, 2026දී තමයි වැඩිම වී නිෂ්පාදනය ගත්තේ කියලා. ඒ, වී මෙට්‍රික් ටොන් මිලියන 5.05යි. එතකොට ඔබතුමා දැනගන්න, 2021දී තිබෙනවා, වී මෙට්‍රික් ටොන් මිලියන 5.150ක්.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

2026දී මෙට්‍රික් ටොන් 5.4යි මන්ත්‍රීතුමා. මම කිව්වේ ඒක. එකක් කිව්වාම ඒක අහගෙන ඉන්නේ නැතුව වෙන ඒවා ඔළුවේ තියාගෙන ඉන්න එපා. ඔබතුමාත් අනුරාධපුරයේ මන්ත්‍රී කෙනෙක් නේ. ඒකයි මම කිව්වේ. 2025දී මෙට්‍රික් ටොන් මිලියන 5.1කට ආසන්නයි. 2026දී මෙට්‍රික් ටොන් මිලියන 5.4යි. 2026දී තමයි ලංකා ඉතිහාසයේ වැඩිම වී අස්වැන්න ගන්න අවුරුද්ද. මම කිව්වේ ඒක. ඒ නිසා ඔබතුමා පසුව මේ details බලාගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කථාව මම කිව්වේ නිකම් නොවෙයි. දැන් විපක්ෂ නායකතුමාත් කියන්න ගත්තා, මේ ආණ්ඩුව ඇවිල්ලා බොරු කියනවා. ජනතාවට සහන දෙන්නේ නැහැ; ජනතාවට සහන නැහැ කියලා. නැහැ, අපි නිශ්චිතව ඒ ගැන කිව්වා. අපි ජනතාවට සහන ටිකක් දෙන්න පටන් ගත්තේ නිකම් නොවෙයි. රාජ්‍ය සේවකයින්ගේ වැටුප ගත්තොත්, සියයට 68කින් අපි gross salary එක වැඩි කළා. Basic salary එක සියයට 27කින් වැඩි කළා. ලංකා ඉතිහාසයේ පෞද්ගලික අංශයේ සේවකයින්ට වැඩිම වැටුප් වැඩිවීම කවුද ලබා දුන්නේ? රුපියල් 21,000 ඉඳලා රුපියල් 30,000 දක්වා අවම වැටුප රුපියල් 9,000කින් වැඩි කරපු පළමු ආණ්ඩුව තමයි ජාතික ජන බලවේගය ආණ්ඩුව. ලංකා ඉතිහාසයේ වැඩිම පඩි වැඩිවීම අපි කළා, පෞද්ගලික අංශයේ සේවකයින්ට.

වතු සේවකයෝ ලංකාවට ඇවිල්ලා අවුරුදු 200ක් වෙනවා කියලා බොහෝ කථා කියලා ඒ අයගේ සහයෝගය ගත්ත දෙගොල්ලන් තමයි මේ අය. හැබැයි, මේ දෙගොල්ලන්ම මේ අවුරුදු 200 ඇතුළේම වතු සේවකයින්ගේ පඩි වැඩි කරන්න මැදිහත් වුණාද? නැහැ. ඒ සේවකයෝ සාමූහික ගිවිසුමෙන් විතරයි පඩි වැඩි කිරීම් කර ගත්තේ. හැබැයි, රජයක් මැදිහත් වෙලා වතු සේවකයින්ට පඩි වැඩි කළා නම් එහෙම කළේ වෙන කවුරුවත් නොවෙයි, ජාතික ජන බලවේගය ආණ්ඩුව. දවස් 25ට රුපියල් 10,000කින් පඩි වැඩි කළා. මාසයේ පඩිය රුපියල් 10,000කින් වැඩි කළා. එහෙම කළාද, මේගොල්ලන්? නැහැ. ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් විෂමතාවත් අපි ඉවත් කළා. අපි රාජ්‍ය සේවයට 121,000ක් බඳවා ගත්තා.

මේ ටික විතරක් කරලා අපි නැවතුණේ නැහැ. සමුපකාර ව්‍යාපාරය රට පුරා ගොඩනහන්න අපි කටයුතු කළා. මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන සමුපකාර ව්‍යාපාරය විනාශ කරලායි තිබුණේ. මේ අයගේ සමහර හිතවතුන් දැන් ඉන්නේ හිරගෙවල්වල. මාතර විවිධ සේවා සමුපකාර සමිතියේ රුපියල් මිලියන 5,200ක් නැහැ, සභාපති හොරා කාලා. එහි තැන්පත්කරුවන් විපක්ෂ නායකතුමා හම්බවෙන්න ආපු වෙලාවේදීත් එතුමා කිව්වා, මිනිහා සමුපකාරය හොඳට කරගෙන හිටියා නේද කියලා. හැබැයි, හොඳට කරගෙන හිටපු මිනිහා රුපියල් මිලියන 5,200කට වැඩේ දීලායි ගිහිල්ලා තිබෙන්නේ. අන්න, දැන් මිනිහා හිරේ.

ජනාධිපතිතුමා මේ අවුරුද්දේ රුපියල් මිලියන 500ක් දුන්නා, වී මෝල්වලට dryers ගන්න. ඒ අනුව වී මෝල් 50කට dryers 50ක් සවි කරනවා. රුපියල් කෝටියක් වටිනා dryer එකක් දෙනවා, දවසකට වී කිලෝ 20,000ක් ඒකෙන් වේළන්න පුළුවන්. සමුපකාර 50කට එය අපි ලබා දෙනවා. නිෂ්පාදන සමුපකාර ශක්තිමත් කරන්න ගිය අවුරුද්දේ රුපියල් මිලියන 100ක් දුන්නා. මේ අවුරුද්දේත් තව රුපියල් මිලියන 100ක් දීලා තිබෙනවා, නිෂ්පාදන ශක්තිමත් කර අපේ රටේ සමුපකාර ව්‍යාපාරය අපේ ආර්ථිකයට එකතු කරගන්න.

රටේ පහළම ඉන්න දිළිඳු ජනතාව ඉහළට ගේන්න, දිළිඳු ජනතාවට සහාය දෙන්න අපි අස්වැසුම ලබා දුන්නා. ඔව්, ඒගොල්ලන් ඔක්කෝම ටික refilter කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් අපට ලොකු චෝදනාවක්, විවේචනයක් තිබුණා. ගම්වල මිනිස්සු කිව්වා, පහසුකම් තිබෙන අය, හැකියාව තිබෙන අය මේක ගන්නවා කියලා. හරිනම්, අන්ත දුප්පත් සහ දුප්පත් පිරිස්වලට විතරයි මෙය ලබා දෙන්නේ. හැබැයි, අපි ගිය අවුරුද්දේ ඉඳන් මේ ප්‍රතිලාභ ගෙවීමේ කාල සීමාව දීර්ඝ කළා. දීර්ඝ කර නැවත ලේඛන සකස් කළා. ලේඛන සකස් කරලා දැන් එක කොටසක් දාලා තිබෙනවා.

ඊළඟට, එහි දෙවැනි කොටස ගැන අපේ ඇමතිතුමාත් කිව්වා. තව ලක්ෂ හතහමාරකට ආසන්න පිරිසක් ඉන්නවා, දෙවන වටයේ සලකා බලන්න. ඊට පසුව ලක්ෂ 12 තවත් වැඩි වනවා. මේ දේවල් කරන්නේ, නැති බැරි අයට දෙන එක නවත්වන්න නොවෙයි. තවත් කීයක් හරි වැඩි කරන්න පුළුවන් විධියක් තිබෙනවා නම් අපි ඒ සඳහා හොඳම අය තෝරනවා. හොඳම අය තෝරලා ඒ අයට තවත් කීයක් හරි වැඩි කරන්න පුළුවන් නම් ඒකත් වැඩි කරන්නයි අපේ අනාගත බලාපොරොත්තුව. ඒ නිසා මේ රටේ ජනතාවට වෙච්ච පොරොන්දු අපි ඉටු කරමින් තිබෙනවා. මේ ආණ්ඩුව රටේ ජනතාවට දීපු පොරොන්දු ඉටු කරන ආණ්ඩුවක්ය කියන එක රටේ මිනිස්සු දැන් විශ්වාස කරමින් තිබෙනවා. පත්වනකොට තිබුණාට වඩා ජනතා ප්‍රසාදයක් ජනාධිපතිතුමා දැන් දිනාගෙන තිබෙන්නේ ඇයි? කියපු දේවල් කරන නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු ඇමතිතුමනි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මීට පෙර මේ රටේ නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැතුව තිබුණා. සමහරුන්ගේ නඩු කල් ගියා. ඒ නඩු ඇහුවේ නැහැ. හැබැයි දැන්, නීතිය ක්‍රියාත්මක වනවා විතරක් නොවෙයි, අලුත් නීති හදලා, රට ශක්තිමත් කරලා, නීතිය ස්ථාපිත කරන්නත් අපි කටයුතු කරමින් තිබෙනවා. ඒ සියල්ල කරනකොට විපක්ෂයට ටිකක් අමාරුයි. ඒ අමාරුවට අදාළව විවේචන හදද්දි ඉතාම ද්වේෂ සහගත ලෙස ආණ්ඩුව විවේචනය කරන්න හදනවා. අවසාන වශයෙනුත් මම මේ කාරණය කියනවා. මාඕ සේතුං මැතිතුමා කිව්වා, ඔබගේ සාර්ථකත්වය මැනගන්න ප්‍රතිවාදියාගේ විවේචන දිහා බලන්න කියලා. ඒක තමයි අද දවසේ හොඳම එක. විපක්ෂ නායකතුමාගේ ඒ ගෙරවිල්ල ඇතුළේ, ගෝරනාඩුව ඇතුළේ තිබුණා, ආණ්ඩුව සාර්ථක ගමනක් යනවා කියන පණිවුඩය. ඒකම ඇති, රටේ ජනතාව දැන් දන්නවා, ආණ්ඩුව හොඳ ගමනක් යනවා කියලා. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[மு.ப. 11.29]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமான விவாதம் இந்தச் சபையில் நடைபெறுகின்றது. இந்த நாட்டின் பொருளாதாரத்தை வலுப்படுத்துவதிலும் அதனை நிலைநிறுத்துவதிலும் முக்கிய பங்கு வகிக்கின்ற ஒரு விடயமாகவே நாங்கள் இதனைப் பார்க்கின்றோம். விசேடமாக, ஏற்றுமதி வருமானத்தை அதிகரிப்பதற்கும் இறக்குமதிச் செலவைக் குறைப்பதற்குமான நடவடிக்கைகள் இதில் உள்ளடக்கப்பட்டு இருக்கின்றன.

இன்றைய அரசாங்கமானது, பல நல்ல விடயங்களைக் கைக்கொண்டு வருகின்றது. உற்பத்தி மற்றும் ஏற்றுமதி ரீதியான பல முன்னேற்றகரமான விடயங்களை மேற்கொண்டாலும், இறக்குமதிச் செலவு என்பது மிகவும் அதிகமாகக் காணப்படுகின்றது. 2025ஆம் ஆண்டில் இறக்குமதிச் செலவு 21.5 பில்லியன் டொலராகக் காணப்பட்ட அதேநேரம், ஏற்றுமதி மூலம் பெறப்பட்ட வருமானம் 13.6 பில்லியன் டொலராகக் காணப்பட்டது. ஆனாலும், 2026ஆம் ஆண்டு ஓரளவு முன்னேற்றகரமான நிலைமை காணப்படு கின்றது. இந்த விடயங்களை அரசாங்கம் கவனத்திற்கொள்ள வேண்டும். இந்த அரசாங்கம் இலஞ்சம் மற்றும் ஊழலுக்கு எதிராகப் பல விடயங்களைக் கையாண்டு வருகின்றது. சமத்துவத்தைப் பேண வேண்டுமெனச் சொல்லிவருகின்ற இந்த அரசாங்கம், அனைத்து மக்களையும் சரியான விதத்தில் கையாள வேண்டும்.

கடந்த அரசாங்கங்கள் கைக்கொண்டதுபோல் இந்த அரசாங்கமும் தனது செயற்பாடுகளைக் கைக்கொள்ளக்கூடாது என்பதுதான் எங்களது விருப்பமாக இருக்கின்றது. இலங்கை தமிழரசுக் கட்சி என்பது, இந்த நாட்டில் ஆட்சியைக் கவிழ்ப்பதற்கோ, நாட்டைப் பிளவுபடுத்துவதற்கோ, ஆட்சியை இல்லாமல் செய்வதற்கோ உருவான ஒரு கட்சி அல்ல. எங்களது இனம் சார்ந்த பிரச்சினைகளைக் கையாள்வதற்கும், எங்களது மக்களுக்கு இழைக்கப்படுகின்ற அநீதிகளுக்கு எதிராகக் குரல்கொடுப்பதற்கும்தான் மக்கள் எங்களைத் தெரிவுசெய்து இந்தப் பாராளுமன்றத்துக்கு அனுப்பியிருக் கிறார்கள்.

இன்று நீங்கள் ஏற்றுமதி வருமானத்தை அதிகரிக்க வேண்டுமெனவும், இறக்குமதிச் செலவைக் குறைக்க வேண்டுமெனவும் சொல்கின்றீர்கள். ஆனால், இன்றும் வெளிநாடுகளில் இருந்து பால்மா இறக்குமதி செய்யப்படுகின்றது. அதுமாத்திரமல்ல, பால் உற்பத்திப் பொருட்களும் இறக்குமதி செய்யப்படுகின்றன. மேலும், விவசாயத்துக்குத் தேவையான பொருட்களான உரம், எரிபொருள், விவசாய உள்ளீடுகள் எனப் பல பொருட்கள் இறக்குமதி செய்யப்படுகின்றன. அந்த வகையில், உற்பத்திசார் பொருளாதாரத்தை ஊக்குவிக்கும் நடவடிக்கைகளில் நாங்கள் பின்தள்ளப்பட்டவர்களாக இருக்கின்றோம். அதற்கான முக்கியத்துவத்தைக் கொடுப்பதில்லை. உதாரணத்துக்கு, பால் உற்பத்தியை எடுத்துக்கொள்வோம். இன்று தரமற்ற பால்மாவையே வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்கின்றார்கள். எமது நாட்டில் பால் உற்பத்திக்குக்குத் தேவையான அதிகமான வளங்கள் இருக்கின்றன. குறிப்பாக, பசுக்கள், எருமைகள் போன்ற கால்நடைகளிலிருந்து கூடுதலான பால் உற்பத்தியைப் பெறுவதற்கான நடவடிக்கை களை மேற்கொள்ள முடியும்.

இன்று மட்டக்களப்பு மாவட்டத்தின் மயிலத்தமடு - மாதவனை பிரதேசத்திலும், அம்பாறை மாவட்டத்தின் வட்டமடு பிரதேசத்திலும் மேய்ச்சல் தரை பிரச்சினை காணப்படுவதால், அங்குள்ள பண்ணையாளர்களின் இலட்சக்கணக்கான மாடுகளை மேய்ப்பதற்கு இடமில்லாத துர்ப்பாக்கிய நிலை காணப்படுகின்றது. அங்குள்ள மேய்ச்சல் தரையில் இருக்கின்ற மாடுகளைக் கொலை செய்கின்றார்கள். அதுமாத்திரமல்ல, அந்த மாடுகளுக்கு உண்ணுவதற்கு உணவில்லாத துர்ப்பாக்கிய நிலையும் காணப்படுகின்றது. வட்டமடு பிரதேசத்தை எடுத்துக்கொண்டால், அங்குள்ள பண்ணையாளர்கள் மிகவும் பரிதாபகரமான நிலைக்குத் தள்ளப்பட்டு இருக்கின்றார்கள். அந்தப் பண்ணையாளர்களின் மாடுகளையும் காளைகளையும் கன்றுகளையும் அங்கிருந்து Forest Department வெளியே துரத்துகின்ற நிலை காணப்படுகின்றது. அவர்கள் வாழ்வாதாரத்துக்காக எங்கு செல்வது? அவர்கள் எதை நம்பி வாழ்வது? இதனால் ஆயிரக்கணக்கான பண்ணையாளர்கள் பாதிக்கப்படு கின்றார்கள். அதேபோல், மாதவனை - மயிலத்தமடு பகுதியிலும் 5,000க்கும் மேற்பட்ட பண்ணையாளர்கள் பாதிக்கப்படுகின்றார்கள்.

மாண்புமிகு சனாதிபதி அவர்கள் மட்டக்களப்பு மாவட்டத்துக்கு வருகை தந்தபோது இடம்பெற்ற மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் முடிவொன்று எடுக்கப்பட்டது. அதாவது, மயிலத்தமடு - மாதவனை பகுதியை மேய்ச்சல் தரையாக gazette பண்ண வேண்டும் என்று. அதேபோல், ஏறாவூர் மற்றும் கொழும்பிலுள்ள நீதிமன்றங்களின் தீர்ப்புகளும் அந்த இடத்தை பண்ணையாளர்களுக்குக் கொடுக்க வேண்டுமென்றுதான் சொல்கின்றன. மாண்புமிகு சனாதிபதி அவர்கள் சொல்கின்ற விடயத்தை உரிய அதிகாரிகள் சரியாக நடைமுறைப் படுத்துவதில்லையா? என்ற கேள்வி எழுகின்றது. நீதிமன்றம் வழங்குகின்ற தீர்ப்பை நடைமுறைப்படுத்துவதில் ஏன் தாமதம் ஏற்படுகின்றது? நீதித்துறைக்கு எதிராகச் செயற்படு கின்றார்களா? சனாதிபதியின் சொல்லுக்கு மதிப்பளிக்க வில்லையா? போன்ற கேள்விகள் மக்கள் மத்தியில் எழுகின்றன.

நேற்று முன்தினம்கூட மட்டக்களப்பு கச்சேரிக்கு முன்னால் பண்ணையாளர்கள் ஆர்ப்பாட்டம் செய்தார்கள். அதன்போது, அரசாங்க அதிபரைச் சந்திப்பதற்குக்கூட பாராளுமன்ற உறுப்பினர்களுக்கு அனுமதி மறுக்கப்பட்டிருந்தது. அரசாங்க அதிபரைவிட எத்தனையோ மடங்கு protocolஇல் உயர்ந்தவர் களாக பாராளுமன்ற உறுப்பினர்கள் இருக்கின்றார்கள். எனினும், அவர்களுக்கு அதற்கான அனுமதி மறுக்கப்படு கின்றது. யார் இதைச் செய்தது? மக்களால் தெரிவு செய்யப்பட்ட மக்கள் பிரதிநிதிகள் மக்களின் பிரச்சினைகளை அடையாளங்கண்டு, அவற்றை உரிய அதிகாரிகளிடம் கொண்டுசெல்ல வேண்டும். உரிய அதிகாரிகள் அதற்கான அனுமதியை மறுப்பதை நாங்கள் மனித உரிமை மீறலாகவே பார்க்கின்றோம்; அந்த மக்களுக்குச் செய்கின்ற துரோகமாகவே பார்க்கின்றோம்.

இன்று அம்பாறை மாவட்டத்திலிருக்கின்ற பண்ணையாளர் களும் மட்டக்களப்பு மாவட்டத்திலிருக்கின்ற பண்ணையாளர் களும் மிகவும் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள். குறிப்பாக, அவர்களின் வாழ்வாதாரம் பாதிக்கப்பட்டு இருக்கின்றது. இந்த அரசாங்கம் இந்த விடயங்களைச் சரியாகக் கையாளும் என்ற நம்பிக்கை இருக்கின்றது. அதன் அடிப்படையில்தான் இந்த அரசாங்கத்துக்கு மக்கள் வாக்களித்தார்கள். கடந்த உள்ளூராட்சி மன்றத் தேர்தலில் ஆலையடிவேம்பு

[ගරු කවින්දිරන් කෝඩීස්වරන් මහතා]

பிரதேசத்திலுள்ள பண்ணையாளர்கள் அனைவரும் NPPக்குத்தான் வாக்களித்தார்கள். ஆனால், இன்று அவர்கள் வெளியே துரத்தப்பட்டு இருக்கிறார்கள்.

எங்களது அம்பாறை மாவட்ட ஒருங்கிணைப்புக் குழுவின் தலைவரான கௌரவ வசந்த பியதிஸ்ஸ அவர்கள் இங்கு இருக்கிறார். அவர் தனது செயற்பாடுகளைச் சரியாகவும் நேர்த்தியாகவும் முன்னெடுக்கின்ற ஒருவர். அதுமாத்திரமன்றி, இன, மத, மொழி வேறுபாடு பார்க்காமல் செயற்பாடுகளை முன்னெடுக்கின்ற ஒரு தலைவரும்கூட. அவர் இந்த விடயத்தைச் சரியான முறையில் கையாள வேண்டும். அவர் சரியான முறையில் கையாள்வார் என்ற நம்பிக்கை அங்கிருக்கின்ற அனைத்து மக்களிடமும் இருக்கின்றது. எனவே, சனாதிபதி அவர்கள் சொல்கின்ற விடயத்தை அங்கிருக்கின்ற அரச அதிகாரிகள் சரியான முறையில் நடைமுறைப்படுத்தி இதற்கான தீர்வை வழங்க வேண்டும். சனாதிபதி சொல்கின்ற விடயத்தை அவர்கள் சரியான முறையில் கடைப்பிடிக்க வேண்டும். எனினும், சில கட்சிகளைச் சேர்ந்த செயற்பாட்டாளர்கள் அதனை மறுதலிக்க முனைகின்றார்கள். அதேபோல், நீதித்துறை வழங்குகின்ற உத்தரவையும் சரியான முறையில் அதிகாரிகள் நடைமுறைப்படுத்த வேண்டும். அதிகாரிகள் சனாதிபதி அவர்களினதும் நீதித்துறையினதும் கட்டளைகளை வேண்டுமென்றே புறக்கணிக்கின்றவர்களாக இருக்கின்றார்கள் என்பதை இந்தச் சபையில் கூறி, எனது உரையை முடித்துக்கொள்கின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[மு.ப. 11.38]

ගරු ෆස්මින් ෂරීෆ් මහතා
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද අස්වැසුම සම්බන්ධවත්, ටයර් සම්බන්ධවත් තමයි කථා කරන්න තිබෙන්නේ.

கடந்த அரசாங்க காலத்தில் 'அஸ்வெசும' பயனாளிகளை எப்படித் தெரிவு செய்தார்கள் என்பது உங்களுக்குத் தெரியும். அதாவது, அரசாங்கக் கட்சியைச் சேர்ந்த MPs, பிரதேச சபை மற்றும் நகர சபை உறுப்பினர்கள் தங்களுடைய குடும்ப உறுப்பினர்களைத் தெரிவு செய்துவிட்டுத்தான் சாதாரண ஏழை மக்களைத் தெரிவு செய்தார்கள். ஆனால், இப்பொழுது அந்த நிலைமை இல்லை. அரச அதிகாரிகள்தான் பயனாளிகளைத் தெரிவு செய்கிறார்கள். 2023ஆம் ஆண்டு தெரிவு செய்யப்பட்டு 'அஸ்வெசும' கொடுப்பனவு கிடைக்கப்பெறாத கிட்டத்தட்ட 150,000 பேருக்கு இந்தத் தடவை எங்களுடைய அரசாங்கத்தால் அக்கொடுப்பனவைக் கொடுக்கக்கூடியதாக இருக்கின்றது. இலங்கையின் வரலாற்றில் முதற்தடவையாக இந்த முறைதான் 991,830 பேருக்கு 'அஸ்வெசும' கொடுப்பனவு கிடைக்கக்கூடியதாக இருக்கின்றது. 'அஸ்வெசும' பயனாளிகளைத் தெரிவுசெய்வதில் 22 அளவுகோல்கள் இருக்கின்றன. அவற்றுக்கு உட்பட்டுதான் அரச அதிகாரிகள் பயனாளிகளைத் தெரிவு செய்கிறார்கள். தகுதியுடையவர்கள் யாராவது தெரிவு செய்யப்படாமல் இருந்தால், அவர்கள் மீளவும் onlineமூலம் விண்ணப்பித்து அதனைப் பெற்றுக் கொள்ள முடியும். அதேபோன்று, தகுதியில்லாத எவருக்காவது 'அஸ்வெசும' கொடுப்பனவு கிடைக்கப் பெற்றிருந்தால், அவர்களுக்கு எதிராக முறைப்பாடு செய்து, அந்தக் கொடுப்பனவு கிடைப்பதை இல்லாமல் செய்ய முடியும்.

அடுத்து, தரமான ரயர்களையே தனியார் நிறுவனங்கள் இறக்குமதி செய்ய வேண்டும். அவ்வாறு செய்தால்தான் வாகனங்களில் பொருத்தப்படும் ரயர்களை கூடியகாலம் பாவிக்க முடியும். தரமற்ற ரயர்களைப் பயன்படுத்தினால், அவை வெடித்து உயிர்களை இழக்கக்கூடிய சந்தர்ப்பங்களும் ஏற்படுகின்றன.

அடுத்து, எங்களுடைய பிரதேசத்திலுள்ள பல முக்கியமான பிரச்சினைகள் பற்றி நான் இங்கு குறிப்பிட வேண்டும். கம்பளையிலுள்ள அம்புலுலாவ பிரதேசம், அதற்குக் கீழுள்ள பிரதேசங்களில் வசிக்கின்ற மக்களுக்குப் பாரிய பிரச்சினையாக மாறியுள்ளது. பத்து நாட்களுக்கு முன்னர் பெய்த கடும் மழை காரணமாக அப்பிரதேசத்திலுள்ள கிட்டத்தட்ட 20 வீடுகள் சேதமடைந்தன. அவ்வாறு வீடுகள் சேதமடைந்தவர்களுக்கு அரசாங்கம் இயன்ற உதவிகளைச் செய்தது. நாங்கள் நிச்சயமாக அம்புலுவாவவை அரசாங்கத்தின் பொறுப்பின்கீழ் கொண்டுவந்து மக்களுக்கு சேவை செய்வோம்.

அரசாங்கத்துக்கு எதிராகவும் முஸ்லிம் மக்களுக்கு எதிராகவும் செயற்பட்ட, குறிப்பாக இன முரண்பாட்டை ஏற்படுத்தி மக்களுக்கு இடையே பிளவுகளை ஏற்படுத்திய மதகுரு ஒருவரை விடுதலை செய்ய வேண்டுமென முஸ்லிம்களின் தலைவர் என்று சொல்லக்கூடியவரும் அவருடைய கட்சியைச் சேர்ந்த பிரதேச சபை உறுப்பினர்களும் நகர சபை உறுப்பினர்களும் கடந்த பாராளுமன்றத் தேர்தல் மற்றும் பிரதேச சபை தேர்தலில் போட்டியிட்டவர்களும் கூறிவந்தார்கள். அந்தக் கட்சியின் தலைவர், அந்தத் தேரர் முஸ்லிம்களுக்கு என்னென்ன அநியாயங்களைச் செய்தார் என்பதை மறந்துவிட்டு, அவருடைய விடுதலைக்காகப் போராடக்கூடியவராக இருக்கின்றார். இதற்குரிய பதிலை நான் குறித்த முஸ்லிம் தலைவரிடமிருந்து எதிர்பார்க்கின்றேன்.

அதேமாதிரி, இன்னொரு பிரச்சினை பற்றி இங்கு கூற வேண்டும். கண்டி, பூஜாபிட்டிய பிரதேச சபைக்குட்பட்ட பகுதியில் நாக தேவாலயம் அமைந்துள்ள பிரதேசத்தில் கிட்டத்தட்ட 200 வருடங்களுக்கு முன்னர் இருந்தே பரம்பரையாக வாழ்ந்து வருகின்ற ஒவ்வொரு காணி சொந்தக்காரருக்கும் எதிராக -ஊஉ- பௌத்த துறவி ஒருவர் பிரச்சினைகளை ஏற்படுத்திக்கொண்டு இருக்கின்றார். அவர் ஒன்றை தெளிவாக விளங்கிக்கொள்ள வேண்டும். எங்களுடைய அரசாங்கமானது, அங்கு 200 வருடங்களாகப் பரம்பரை பரம்பரையாக வாழ்ந்து வருகின்ற முஸ்லிம் களுடைய பக்கம்தான் நிற்கின்றது. நாங்கள் நீதி, நேர்மையுடன் சட்டத்துக்கு உட்பட்டு அவர்களுக்கு உதவி செய்ய வேண்டும். சட்டப்படி அதன் உரிமை நாக தேவாலயத்துக்கோ அல்லது குறித்த பௌத்த துறவிக்கோ இருந்தால், அவர் வழக்குத் தாக்கல் செய்து, அதற்குரிய சட்ட நடவடிக்கைகளை எடுக்க வேண்டும். கௌரவ ரியாஸ் பாருக் அவர்கள் இந்த விடயம் சம்பந்தமாக அதிக கவனம் செலுத்தி, கண்டி மாவட்ட ஊஉஐ உட்பட பலருடன் பேசி, அங்குள்ள மக்களுக்கு நீதியைப் பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை எடுத்து வருகின்றார்.

எங்களுடைய பிரதேசத்தைப் பிரதிநிதித்துவப்படுத்தும், முஸ்லிம்களின் தலைவர் என்று சொல்லக்கூடியவர் இது சம்பந்தமாக இதுவரை வாய்திறக்கவில்லை என்பதுதான் உண்மை! இது கவலைக்குரிய விடயமாகும். அவர் சார்ந்த கூட்டமைப்பில் electionஇல் போட்டியிட்ட සංඛ්‍යතான் இன்றைக்கு இவ்விடயத்தில் மும்முரமாக ஈடுபட்டு, அங்குள்ள முஸ்லிம்களின் காணியைப் பெற்றுக்கொள்வதற்கு நடவடிக்கை எடுத்து வருகின்றார். குறித்த தலைவரும் இந்த விடயத்தில் தலையிட முடியும். அவருடைய கூட்டமைப்பைச் சேர்ந்தவர்கள் இதைப் பற்றி கதைக்க வேண்டும். குறித்த தலைவர் அக்குறணையில் ஏற்பட்ட வெள்ளம் சம்பந்தமாக கடந்த பாராளுமன்ற அமர்வில் உரையாற்றினார். அதற்குரிய பதிலை கௌரவ ரியாஸ் பாருக் அவர்கள் அளித்தார். அவர் ஒன்றை மறந்துவிட்டு கதைக்கிறார். සජබஇன் ஆட்சிக்கு உட்பட்ட பிரதேச சபையின் தலைவர்தான் அங்கே ஆட்சிபுரிகிறார். அவருடைய அங்கத்தவர் மூலமாக election கேட்டுத்தான் அந்தப் பிரதேச சபைத் தலைவரைத் தெரிவு செய்வதற்கான நடவடிக்கையையும் எடுத்தார். இன்று அதை மறந்துவிட்டு, அக்குறணையில் ஏற்பட்ட வெள்ளம் சம்பந்தமாக முதலைக் கண்ணீர் வடிக்கின்றார். அவர் 30-40 வருடங்கள் மாறி மாறி ஆட்சிக்கு வந்த அரசாங்கங்களில் இருந்திருக்கிறார். எனினும், இது தொடர்பில் எந்த நடவடிக்கையும் எடுக்கவில்லை.

நான் இங்கு இன்னுமொரு முக்கியமான விடயத்தைக் குறிப்பிட வேண்டும். அதாவது, எதிர்வரக்கூடிய Budgetஇல் 4,160 மில்லியன் ரூபாயை ஒதுக்கி, கம்பளை வைத்தியசாலையைத் தரமுயர்த்துவதற்கான நடவடிக்கையை எமது அரசாங்கம் எடுத்துள்ளது. தேசிய மட்டத்தில் எமது அரசாங்கம் பல்வேறு வேலைத்திட்டங்களை முன்னெடுத்து வருகின்றது. கெட்டம்பே - பேராதெனிய பாலத்தின் புனரமைப்புப் பணிகள் இறுதித் தருவாயில் உள்ளன. விரைவில் அது மக்களின் பாவனைக்கு விடப்படும். அதேபோல, கொழும்பு - மீரிகம - கண்டி அதிவேக நெடுஞ்சாலையின் நிர்மாணப் பணிகளும் இறுதித் தறுவாயில் உள்ளன. அதுவும் எதிர்வரும் காலத்தில் மக்கள் பாவனைக்கு விடப்படும். அதேபோல், மஹய்யாவவில் உள்ள சுரங்கப் பாதையைச் சீர்செய்வதற்கும் நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது. இவை மாத்திரமல்ல, இன்னும் பல வேலைத்திட்டங்களை எமது அரசாங்கம் முன்னெடுத்து வருகின்றது.

'அஸ்வெசும' கொடுப்பனவைத் தகுதியுடையவர்களுக்கு மட்டும் வழங்குவதற்கு நாங்கள் நடவடிக்கை எடுத்து வருகின்றோம் என்பது உங்களுக்குத் தெரியும். 'அஸ்வெசும' கொடுப்பனவுக்காக 7 இலட்சம் பேர் தெரிவு செய்யப்பட்டுள்ளனர். அவர்கள் இக்கொடுப்பனவைப் பெற தகுதியுள்ளவர்களாக இருந்தால், எதிர்வரும் காலங்களில் அவர்களுக்கும் 'அஸ்வெசும' கொடுப்பனவு கிடைக்கும். இன்று சில பிரதேச செயலகங்களில் தகுதி இல்லாமல் இருந்தும் அதற்கான சந்தர்ப்பத்தைப் பெற்றிருந்தால், எதிர்வரும் காலத்தில் 'அஸ்வெசும' கொடுப்பனவு கிடைக்காதென்று கூறப்படுவதை நாங்கள் கேள்விப்படக்கூடியதாக இருக்கின்றது.

நான் பௌத்த மதத் தலைவர்கள்மீது மிகுந்த மதிப்பும் நம்பிக்கையும் வைத்துள்ளேன். இலங்கையில் 'தித்வா' சூறாவளியால் பாதிக்கப்பட்டு, புனரமைக்கப்பட்ட முதலாவது பன்சலையை தொரகல பிரதேசத்துக்கு வருகைதந்து எங்களுடைய கௌரவ பிரதி அமைச்சர் அவர்கள் திறந்துவைத்தார். எங்களுடைய பிரதேசத்திலுள்ள பல பிரச்சினைகளுக்கு எதிர்வரும் காலங்களில் அரசாங்கம் என்ற முறையில் நாங்கள் தீர்வுகளைப் பெற்றுக்கொடுக்க கடமைப்பட்டுள்ளோம். நன்றி!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) වී.එස්. රාධකිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[மு.ப. 11.46]

ගරු (ආචාර්ය) වී.එස්. රාධකිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நாங்கள் இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமாக விவாதித்துக்கொண்டு இருக்கின்றோம். இந்த நாட்டின் ஏற்றுமதியை அதிகரிக்க வேண்டிய சூழ்நிலையில், இறக்குமதிதான் அதிகரித்திருக்கின்றது என்பதை நாங்கள் தெரிந்துகொள்ளக்கூடியதாக இருக்கின்றது. இலங்கையின் இறக்குமதிச் செலவு 18.84 பில்லியன் அமெரிக்க டொலராகவும், ஏற்றுமதி வருமானம் 12.77 பில்லியன் அமெரிக்க டொலராகவும் இருக்கின்றது. அதாவது, கிட்டத்தட்ட 6 பில்லியன் அமெரிக்க டொலர் வித்தியாசம் காணப்படுகின்றது. ஒரு நாட்டில் ஏற்றுமதி அதிகரித்தால் அந்த நாட்டில் செல்வம் அதிகரிப்பதற்கான, வேலைவாய்ப்பு அதிகரிப்பதற்கான, பணச் சுழற்சி அதிகரிப்பதற்கான, வாழ்க்கைத்தரம் உயர்வதற்கான, poverty - வறுமை - குறைவதற்கான, நாட்டில் மக்கள் நிம்மதியாக வாழ்வதற்கான சூழ்நிலை ஏற்படும். நாங்கள் இறக்குமதியை நம்பிக்கொண்டு இருந்தால், நாட்டில் வேலைவாய்ப்பு சரியாக இருக்காது, அதிக வரியைச் செலுத்தவேண்டிய நிலைக்குத் தள்ளப்படுவோம். அதுமாத்திரமல்ல, நாட்டில் முதலாளி-தொழிலாளி என்ற வர்க்க பேதம், சமூக ஏற்றத்தாழ்வு ஏற்படுவதற்கும் வாய்ப்பும் இருக்கின்றது. மேலும், வறுமை அதிகரிக்கும், வேலைவாய்ப்பு இழப்பு ஏற்படும்.

இலங்கையைப் பொறுத்தளவில், ஏற்றுமதியை அதிகரிப்பதற்கு நாங்கள் பல்வேறு திட்டங்களை வகுக்க வேண்டும். புதிய அரசாங்கம் ஆட்சிக்கு வரும்பொழுது, நாட்டில் வறுமையை ஒழிப்பதாகவும் ஏற்றுமதியை அதிகரிப்பதாகவும் இறக்குமதியைக் குறைப்பதாகவும் சொன்னது. ஆனால், இன்று துரதிருஷ்டவசமாக மத்திய கிழக்கில் ஏற்பட்டுள்ள யுத்தம் காரணமாக பொருட்களை இறக்குமதி செய்யும்பொழுது அதிக டொலர்கள் வெளியே செல்கின்ற நிலைமை ஏற்பட்டிருக்கின்றது. இதை balance பண்ணுவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். இதைச் செய்ய வேண்டிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது. இன்று உங்களிடம் அரசாங்கம் இருந்தாலும், அரசு உங்களோடு இல்லை என்பதுதான் உண்மை! அதாவது, உங்களோடு 159 பாராளுமன்ற உறுப்பினர்கள் இருக்கிறார்கள்; சனாதிபதி இருக்கிறார். ஆகவே, அரசாங்கம் உங்களோடு இருக்கின்றது. ஆனால், அரச இயந்திரம் உங்களோடு இல்லை. அதாவது, நிருவாகம் உங்களோடு இல்லை. அதனால்தான் பல பிரச்சினைகள் ஏற்படுகின்றன.

நேர்மையாக வேலை செய்தாலும், செய்யாவிட்டாலும், இன்று யாரும் எந்த வேலையைச் செய்வதற்கும் முன்வருவ தில்லை. ஏனென்றால், தங்களை FCIDக்குக் கொண்டு போவார்கள் அல்லது பிரச்சினையை ஏற்படுத்துவார்கள் என்று பயப்படுகிறார்கள். இன்று சட்டப்படி வேலைசெய்கின்ற காரணத்தால் இந்த நாட்டில் நிருவாகக் கோளாறு இருக்கின்றது. நிருவாகக் கோளாறு இருக்கும் வரைக்கும் நாட்டில் எந்த வேலையிலும் நடைமுறைச் சிக்கல் இருக்கும் என்பது எல்லோருக்கும் தெரிந்த விடயமாக இருக்கின்றது.

[ගරු (ආචාර්ය) වී.එස්. රාධකිෂ්ණන් මහතා]

உள்ளூர் உற்பத்தியை அதிகரிப்பதற்கான நடவடிக்கை எடுக்கப்பட வேண்டும் என்பதில் நான் விசேடமாகச் சொல்லிக்கொள்ள விரும்புகின்ற விஷயம் என்னவென்றால், இந்த நாட்டின் ஆடை ஏற்றுமதி பற்றித்தான். இன்று எமது நாடு ஆடை ஏற்றுமதியில் 5.8 சதவீதம் வீழ்ச்சிகண்டு இருக்கின்றது. அதுமாத்திரமல்ல, தேயிலை உற்பத்தியிலும் வீழ்ச்சிகண்டு இருக்கின்றது. இன்று மலைநாட்டுப் பிரதேசங்களில் குறிப்பாக நுவரெலியா, பதுளை, இரத்தினபுரி போன்ற பகுதிகளில் இருக்கின்ற மக்கள் தேயிலை உற்பத்தித் தொழிலை நம்பி வாழ்ந்தாலும், அவர்களுடைய வாழ்க்கை மோசமான நிலையில் இருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது.

2024ஆம் ஆண்டில் தேயிலை ஏற்றுமதி மூலமான வருமானம் 1.43 பில்லியன் டொலராக இருந்தது. ஆனாலும், தேயிலை உற்பத்திமூலம் வருமானத்தை ஈட்டிக்கொடுக்கின்ற மக்கள் பல்வேறு பிரச்சினைகளை எதிர்நோக்குகின்றார்கள். 2014ஆம் ஆண்டு 966,000ஆக இருந்த இந்த மக்கள் தொகை இன்று 200,000ஆகக் குறைந்திருக்கின்றது. இந்த 200,000 பேரில் இப்போது 98,000 பேர்தான் தோட்டத்தில் வேலை செய்கிறார்கள். இந்த துர்ப்பாக்கிய நிலை மேலும் தொடரக்கூடாது. இந்த நிலைக்குக் காரணம், தோட்டத் தொழிலாளர்களின் குறைந்த வருமானமாகும். நீங்கள் சந்தோஷமாக கைதட்டினீர்கள், வருமானம் அதிகரித்து இருக்கின்றது என்று. எங்களைப் பொறுத்தவரையில், தேயிலைத் தோட்டங்களிலிருந்து கிடைக்கின்ற வருமானம் மிகவும் குறைவாகும். தொழிலாளர்கள் குறைவால் தோட்டப் பொருளாதாரம் ஆள் பற்றாக்குறையை எதிர்கொள்கின்றது. 2024ஆம் ஆண்டின் கணக்கெடுப்பின்படி, பதிவுசெய்யப்பட்ட தோட்டத்தொழிலாளர்களின் எண்ணிக்கை 98,198 ஆகும். குறைந்த ஊதியம், கடினமான வேலைச் சூழல், நகர்ப்புற வேலைகளுக்கு இளைஞர்கள் இடம்பெயர்தல் மற்றும் தொழில்வாய்ப்புகள் இன்மை என்பன இதற்குக் காரணங்களாக இருக்கின்றன.

அடுத்து, ஊட்டச்சத்து மற்றும் சுகாதாரப் பிரச்சினை! இலங்கையின் தோட்டத்துறை மிக மோசமான ஊட்டச்சத்து நிலையைக் கொண்டிருக்கின்றது. வறுமையால் அதிகமாகப் பாதிக்கப்படுபவர்கள் தோட்டத்துறையிலுள்ள மக்களாவர். அங்கு வறுமை நிலை கிட்டத்தட்ட 36 சதவீதமாகக் காணப்படுகின்றது. எனினும், Urbanஇல் இது 8 சதவீதமாகத்தான் இருக்கின்றது. கிராமத்தில் வறுமை நிலை 23 சதவீதமாக இருக்கின்றது. தோட்டத்துறையில் காணப்படும் உடல் மெலிவு, பொது சுகாதாரப் பிரச்சினைகளையும் கவனத்திற்கொள்ள வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன்.

இன்று மலையகத்தை ஒத்த தோட்டப்புறங்களில் அதிகமாக உற்பத்தி செய்யக்கூடிய பல்வேறு விடயங்கள் இருக்கின்றன. இவை தொடர்பில் எதிர்வருகின்ற Budgetஇலாவது சனாதிபதி அவர்கள் propose பண்ணுவதற்கான நடவடிக்கையை எடுக்க வேண்டும். விசேடமாக, பால் உற்பத்தி. பால் உற்பத்தியை அதிகரிப்பதற்கு நுவரெலியா, பதுளை, இரத்தினபுரி மாவட்டங்களில் மேற்கொள்ளப்படும் மாடு வளர்ப்பை அதிகரிப்பதற்கு நடவடிக்கை எடுக்கப்படல் வேண்டும். ஏனென்றால், இது தோட்டத்தொழிலாளர்களுக்கு மேலதிக வருமானத்தைப் பெற்றுக்கொடுக்கும். அதேபோல், மரக்கறி உற்பத்தியும் அதிகரிக்கப்பட வேண்டும். அதற்கான வசதி வாய்ப்புகளைச் செய்து கொடுக்க வேண்டும். இன்று தரிசு நிலங்களை வெளியாருக்குக் கொடுக்க முனைகின்ற இந்த அரசாங்கம், ஏன் அவற்றை தோட்டத்திலுள்ள தொழிலற்ற இளைஞர்களுக்குக் கொடுக்கக் கூடாது? வெளியாருக்கு தோட்டத்தில் இருக்கின்ற தரிசு நிலங்களைக் கொடுப்பதை எதிர்த்து நேற்று முன்தினம் கொழும்பில் பெரியதொரு போராட்டமே நடந்தது. தோட்டத்தொழிலாளர்களுக்கு அரை ஏக்கர், ஓர் ஏக்கர், இரண்டு ஏக்கர் வீதம் காணி கொடுத்து, அதில் ஊடுபயிர்களை அல்லது ஏனைய பயிர்களை வளர்த்து, அதன்மூலம் கிடைக்கப்பெறுகின்ற உற்பத்தியை வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்யக்கூடிய வேலைகளைச் செய்யலாம். ஏன் அதைச் செய்வதில்லை? என்ற கவலை எங்களுக்கு இருக்கின்றது.

விசேடமாக, horticulture, cut flower, butter fruit, strawberry, passion fruit, வாழைப்பழம் உட்பட ஏனைய பழ உற்பத்தி, பூ உற்பத்தி, pepper - மிளகு மற்றும் வாசனைத் திரவியங்கள் உற்பத்தி, காளான் உற்பத்தி போன்றவற்றுக்கு இந்த நிலங்களைப் பயன்படுத்தி, அவர்களுக்கு extra வருமானம் கிடைப்பதற்கான வசதிகளைச் செய்யலாம். எனினும், அவற்றைச் செய்வதற்கான நடவடிக்கை எடுக்கப்படவில்லை. எனவே, மேற்குறித்த உற்பத்திகளைச் செய்வதற்கென அவர்களுக்கு அரை ஏக்கர், ஓர் ஏக்கர் வீதம் காணி கொடுத்து, அதில் என்ன செய்யலாம் என்பதைச் சொல்லிக் கொடுத்து, அவர்களுக்கு loan வசதியைப் பெற்றுக்கொடுக்க வேண்டும் என்பது என்னுடைய கருத்தாக இருக்கின்றது.

பெருந்தோட்டப் பகுதியில் loan பெறப்போகின்றவர் களுக்குப் பிரதான பிரச்சினையொன்று இருக்கிறது. அங்கு வாழுகின்றவர்களுக்கு காணி உரிமை இல்லை. எந்த bankக்கு loan எடுக்கப் போனாலும் காணி உறுதிப்பத்திரத்தைக் கொண்டுவருமாறு சொல்கிறார்கள். எங்களுடைய மக்களுக்கு காணி உரிமை இல்லை என்பது எல்லோருக்கும் தெரிந்த விடயமாகும். எனவே, அவர்களுக்கு காணி உரிமையைப் பெற்றுக்கொடுப்பதற்கு அல்லது காணி வழங்குவதற்கான நடவடிக்கையை நாங்கள் அடுத்தகட்டமாக எடுக்க வேண்டும். இல்லாவிட்டால், bankக்குச் சொல்ல வேண்டும், "அது leased land. அதற்கு loan கொடுக்கலாம்" என்று. இவ்வாறான conditionஐக் கொண்டுவர வேண்டும். இந்த நாட்டில் வாழ்கின்ற சகல பிரஜைகளுக்கும் loan பெற முடியும். ஆனால், தோட்டப்பகுதியில் வாழ்கின்ற பிரஜைகளுக்கு அது இல்லையென்று சொல்லப்படுகின்றது. இதை நிவர்த்தி செய்யவேண்டிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

எமது நாட்டில் தேயிலை உற்பத்தியை மேலும் விஸ்தரிப்பதற்கு பல்வேறு அபிவிருத்தி சார்ந்த வேலைகளைச் செய்யலாம். இன்றைக்கு premium tea, organic tea, special tea, herbal tea, ready-to-drink tea எனப் பல்வேறு தேயிலை வகைகளை உற்பத்தி செய்து மக்களுக்கு வழங்கலாம். இன்று இலங்கை tourismக்கு மிகவும் பிரபல்யமடைந்து வருகின்றது.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

ගරු (ආචාර්ය) වී.එස්. රාධකිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි 12ත් 10ක් ඉවරද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, විනාඩි 10ක් ඉවරයි. තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) වී.එස්. රාධකෘෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
Okay. එනවේ, ඉව්වාරාන තේයිලෙ වකෙකළෙ උර්පත්ති සෙය්තු, ඉන්ත නාට්ටුක්කු වරුකින්ර වෙළිනාට්ටු touristක්කු වළංකුවතර්කු නටවටික්කෙ එටුක්ක වේණ්ටුම්. අතනෝටු චේර්න්තු පිස්කට්ටුකළෙයුම් විර්කලාම්; අතර්කාක ඔරු කටෙයෙ අමෙක්කලාම්. ඉව්වාරාන විටයංකළෙච් සෙය්තාල් එංකළුටෙය සමූකත්තින් වරුමානම් අතිකරික්කුම්.

පෙරුන්තෝට්ටත්තුක්කුප් පොරුප්පාන අමෙච්චර් අවර්කළ් ඉංකේ ඉරුප්පතාල්, නාන් ඔරු විටයත්තෙච් චොල්ලලාමෙන නිනෙක්කින්රේන්. මලෙයක සමූකම් පිර්පටුත්තප්පට්ට සමූකම් එන්පතු එල්ලෝරුක්කුම් තෙරියුම්. ඉන්ත අරචාංකත්තිල් මට්ටුමල්ල, නාංකළ් ඉරුන්ත අරචාංකත්තිලුම්, 1948ආම් ආණ්ටු ඉලංකෙ සුතන්තිරම් අටෙන්ත පිරකු ආට්චික්කුවන්ත අරචාංකංකළිලුම් මලෙයක සමූකම් backward community එන්රු අටෙයාළප්පටුත්තප්පට්ටු ඉරුක්කිරතු. අවර්කළුක්කු කල්වි උරිමෙ ඉරුක්කවිල්ලෙ; වාක්කුරිමෙ ඉරුක්කවිල්ලෙ. ඉවෙ එල්ලාම් පටිප්පටියාකක් කිටෙක්කප්පෙර්රු වරුම්පොළුතු, ඉන්රු අවර්කළුක්කුප් පල්වේරු පිරච්චිනෙකළ් ඉරුක්කින්රන. එනවේ, ඔර් ආණෙක්කුකුළුවෙ නියමිත්තු, අන්ත මක්කළුටෙය වීට්ටුප් පිරච්චිනෙයෙ එප්පටිත් තීර්ක්කලාම්, වාළ්වාතාරප් පිරච්චිනෙයෙ එප්පටිත් තීර්ක්කලාම්, කල්විප් පිරච්චිනෙයෙ එප්පටිත් තීර්ක්කලාම්, සුකාතාරප් පිරච්චිනෙයෙ එප්පටිත් තීර්ක්කලාම් එන්රු ආරායුංකළ්! අවර්කළුම් ඒනෙය සමූකත්තුක්කු ඉණෙයානවර්කළ්, ඒනෙය සමූකමුම් ඉන්තච් සමූකමුම් ඔන්රුතාන්, අවර්කළ් තාළ්ත්තප්පට්ටවර්කළ් අල්ලර් එන්රු චොල්ලුංකළ්! කටන්ත කාලංකළිල් ඉතනෙච් චෙය්යවිල්ලෙ. ඉව්වාරු චෙය්ය මුටියාවිට්ටාල්, 10 වරුට තිට්ටමොන්රෙයාවතු කොණ්ටුවන්තු, ඉන්ත මක්කළුටෙය එල්ලාප් පිරච්චිනෙකළෙයුම් මුටිවුක්කුක් කොණ්ටුවරුවතර්කු නටවටික්කෙ එටුක්ක වේණ්ටුමෙන තාළ්මෙයාකක් කේට්ටු, විටෙපෙරුකින්රේන්. නන්රි. වණක්කම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப் - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Sundaralingam Pradeep - Deputy Minister of Plantation and Community Infrastructure)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුන්දරලිංගම් ප්‍රදීප් නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப்)
(The Hon. Sundaralingam Pradeep)
கௌரவ இராதாகிருஷ்ணன் ஐயா அவர்களே! பெருந் தோட்டத்துறையில் இருக்கின்ற தரிசு நிலங்கள் ஏற்கெனவே விளம்பரப்படுத்தப்பட்டு, அமைச்சரவையின் அனுமதியின் பிரகாரமே சிலருக்கு வழங்கப்பட்டு இருக்கின்றன. எதிர்காலத்தில் மலையகத்தில் இருக்கின்ற இளைஞர் - யுவதிகளுக்கும் அந்தக் காணிகள் சுயதொழில் தேவை களுக்காக வழங்கப்படும் என்பதை நான் இந்த நேரத்தில் தெரிவித்துக்கொள்கின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උපාලි පන්නිලගේ අමාත්‍යතුමනි, ඔබතුමාට අවස්ථාව.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම - *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ස්ථාවර නියෝග 92 (2) (ආ) යටතේ මෙම රීති ප්‍රශ්නය අහන්නේ. මට දැන ගන්න පුළුවන්ද, අපේ ගරු සුන්දරලිංගම් ප්‍රදීප් නියෝජ්‍ය ඇමතිතුමා කථා කළේ කොයි Standing Order එක යටතේද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමා පිළිතුරක් දුන්නේ. *[බාධා කිරීම්]* ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

[පූ.භා. 11.59]

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඉතා වැදගත් යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා.

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් කිව්වා වාගේ, විපක්ෂයේ සිටියත් එතුමා ඉදිරිපත් කළ යෝජනා අපි අගය කරනවා. ඒ වාගේම අපේ වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා ප්‍රමුඛ එම අමාත්‍යාංශය මේ වෙනකොටත් ඒ සම්බන්ධයෙන් වැඩකටයුතු රාශියක් ආරම්භ කර තිබෙනවා. මෙතුමා ඉදිරිපත් කළ යෝජනාත් සැලකිල්ලට අරගෙන තවදුරටත් මේ ක්ෂේත්‍රයේ දියුණුව සම්බන්ධයෙන් අපි කටයුතු කරනවා කියන එක මා පළමුවෙන්ම මතක් කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද දින විවාදයට ගැනෙන ප්‍රධාන විෂය කරුණු තුන සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී මා සඳහන් කරන්න කැමැතියි, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් ඒ සම්බන්ධව හිතාමතාම අසත්‍ය කරුණු සමාජගත කරන්න උත්සාහ කළ බව. කිසිදු විද්‍යාත්මක පදනමකින් තොරව, පිළිගත හැකි කිසිදු මූලාශ්‍රයක් - source එකක් - භාවිත කරන්නේ නැතුව ආර්ථිකය පිළිබඳව ඉතා සාවද්‍ය කරුණු සමාජගත කරන්න එතුමන්ලා උත්සාහ කළා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් විසින් සිදු කළ ඒ ප්‍රකාශ පිළිබඳව මම විශේෂයෙන්ම කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය වසර දෙක තුළ අපගේ කාර්යභාරය වුණේ කුමක්ද? "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ අපි පළමුවෙන්ම ඉදිරිපත් කර තිබෙන්නේ ආර්ථිකය ස්ථාවර කිරීම සම්බන්ධවයි. අපි දන්නවා, 2024 වසරේ සැප්තැම්බර් මාසයේ පැවති ජනාධිපතිවරණයෙන් සහ නොවැම්බර් මාසයේ පැවැති මහ මැතිවරණයෙන් පසුව අපි මේ රටේ පාලන බලය ගන්නකොට, අපට භාර ගන්න වුණේ බංකොලොත්භාවයට පත් වුණු රටක් බව. එතකොට අපිට තිබුණු ප්‍රධානතම අභියෝගයක් තමයි අපේ රටේ ආර්ථිකය ස්ථාවර කරන එක. ඒක තමයි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ පැහැදිලිව ලියා තිබෙන්නේ. ඒ ඔස්සේ තමයි අපි ජනතාවගෙන් ජන වරමක් ලබා ගත්තේ.

2025 වර්ෂයේ තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සම්පූර්ණ වර්ෂයක් තුළ ආර්ථිකය පාලනය කළේ. එතකොට සැබෑ දත්තවලින් හැඟවෙන්නේ මොනවාද? එක එක කරුණු මතු කරලා ප්‍රබන්ධ විධියට කථා හදමින් මාධ්‍යවලින් කියන ඒවා එක්ක නැතුව සත්‍ය දත්තත් එක්ක එන්න. සත්‍ය දත්තවලින් මොනවාද කියන්නේ? දශක ගණනාවකට පසුව 2025 වර්ෂයේදී අපි අය වැය හිඟය සියයට 2.3ට ගෙනාවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊළඟට දේශීය වශයෙන් ගත්තාම, ප්‍රාථමික ගිණුමේ ශේෂය සියයට 5.4ක් ලෙස වාර්තා වුණා. අපි 2025 අවුරුද්දේ උපයා ගන්න බලාපොරොත්තු වුණේ රුපියල් බිලියන 4,990යි. නමුත් අපිට පුළුවන් වුණා, රජයට ආදායම් ලැබෙන ප්‍රධාන මූලාශ්‍ර තුනෙන්ම ඉලක්ක අභිභවා යන්න. ඒ නිසා රුපියල් බිලියන 5,500කට ආසන්න ප්‍රමාණයක් - රුපියල් බිලියන 500කට ආසන්න වැඩිපුර ප්‍රමාණයක් - උපයා ගන්න පුළුවන් වුණා. එහි ප්‍රතිඵලයක් විධියට තමයි අපට ප්‍රාථමික ගිණුමේ ශේෂය සියයට 5.4ක අතිරික්තයක් ලෙස වාර්තා කරන්න පුළුවන් වුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට ජංගම ගිණුමේ ශේෂය ගත්තාම, ඒකත් හැම දාම තිබුණු ප්‍රශ්නයක්. අපි පොඩි කාලයේ ඉඳලාම ඉගෙන ගත්තා, අපේ රට තුළ ආනයන අපනයන ආර්ථිකයක් තමයි තිබෙන්නේ කියලා. නමුත්, හැම දාම මොකක්ද වුණේ? හැම දාම අපිට ආනයන සඳහා යන වියදම වැඩි වුණා. ආනයන වියදම සහ අපනයන ආදායම අතර සැලකිය යුතු මට්ටමින් පරතරයක් - gap එකක් - තිබුණා. ඒක අවම කර ගැනීම තමයි අපට තිබුණු ප්‍රධාන ප්‍රශ්නය.

ඒ නිසා අපනයන ක්ෂේත්‍රයේ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරලා, අපනයන දිරිමත් කරලා, අපට වැඩිපුර ආදායම් හොයාගන්න පුළුවන් වුණා. ඩොලර් බිලියන 1.1ක වාගේ විදේශ ආයෝජන අපට ගෙන්න ගන්න පුළුවන් වුණා. සංචාරක කර්මාන්තය ඇතුළු මේ සියල්ල ඔස්සේ අපට ඩොලර් බිලියන 29කට වඩා උපයා ගන්න පුළුවන් වුණා. ඒකේ ප්‍රතිඵලයක් විධියට 2025 වර්ෂය අවසානයේදී අපේ ආර්ථිකය ස්ථාවර වෙලායි තිබුණේ. ජංගම ගිණුමේ ශේෂය ඩොලර් මිලියන 1,800කට ආසන්න ප්‍රමාණයක් තිබුණා. ඒ කියන්නේ, surplus එකක් තමයි අපි වාර්තා කළේ. අපි ආර්ථිකය ස්ථාවර කරගෙන තිබෙන ආකාරය සැබෑ දත්තත් එක්කයි බලන්න ඕනෑ. ඒ වාගේම 2025 අවුරුද්දේදී අපේ ආදායම් ඉලක්ක සියයට 110කින් සම්පූර්ණ කර ගන්න අපට පුළුවන් වුණා. ඒවාත් එක්ක තමයි අපට බලන්න පුළුවන් වෙන්නේ අපේ ආර්ථිකය ස්ථාවර කරගෙන තිබෙනවාද, නැද්ද කියන එක.

2026 වර්ෂයේදී මේ ඉලක්ක අපි තවදුරටත් අභිභවා යාමට උත්සාහ කරනවා. අපේ අපේක්ෂාව තමයි එම ඉලක්ක තවදුරටත් අභිභවා යාම. ඒ වාගේම, විදෙස් සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 7කට ආසන්න අගයකට මේ වෙනකොට ගෙනැල්ලා තිබෙනවා. මේ විධියට අපි ආර්ථිකය ස්ථාවර කරලා තිබෙනවා. විපක්ෂයේ මේ දෙගොල්ලන්ම එකතු වෙලා එක කාලයක් ආණ්ඩු කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒගොල්ලන් කිව්වා, මේ ආර්ථිකය හදන්න ඒගොල්ලන්ට තමයි පුළුවන් කියලා. ඒගොල්ලන් හදපු හැටි මම කියන්නම්. මේගොල්ලන් එකතු වෙලා 2015-2019 කාලයේ ආණ්ඩු කළා. මොකක්ද හැදුවේ? 2015දී ආර්ථික වර්ධනය කීයද? මේ කට්ටිය ආණ්ඩු බලය ගන්නකොට සියයට 5යි; 2016 වර්ෂයේදී සියයට 4.5යි; 2017 වර්ෂයේදී සියයට 3.6යි; 2018 වර්ෂයේදී සියයට 3.3යි; 2019 වර්ෂයේදී සියයට 2.3යි. මේක revise කරලා පසුව ඍණ සියයට 2.1 වුණා. මෙන්න, ආර්ථිකය හදපු හැටි. ආණ්ඩුව ගන්නකොට සියයට 5යි, බැහැලා යනකොට සියයට 2යි. ඉතින්, ආර්ථිකය හැදුවාලු. මේගොල්ලන්ට ආපහු ජනතාව රැවටෙනවාද? මේගොල්ලන්ට ආර්ථිකයක් හදන්න ආපහු භාර දෙනවාද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඒක විතරක් නොවෙයි කළේ. අපි 2022දී බංකොලොත් වුණේ නිකම් නොවෙයි. 2022දී තිබුණු ප්‍රධාන ප්‍රශ්නය මොකක්ද? අපට විදෙස් ණය ගෙවා ගන්න බැරි වුණා. ඒකේ ප්‍රධාන වශයෙන් තිබුණේ ISBs - International Sovereign Bonds. ඒවා කවුද ගත්තේ? මේ ආර්ථිය එලෙස කඩාගෙන වැටෙනකොට ඒ ඩොලර් බිලියන 15න් ඩොලර් බිලියන 12.5ක් අරගෙන, ඒ ණයත් අරගෙන තමයි මේ ආර්ථිකය කඩා දැම්මේ. ඒ නිසා මේගොල්ලන් මේ රටේ ආර්ථිකය පාලනය කරපු හැටි, මේ රටේ රාජ්‍ය පාලනය කරපු හැටි, මේ ආර්ථිකය කඩා දමලා මේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවූ හැටි පිළිබඳව ජනතාවට හොඳ අවබෝධයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට තවත් බොරුවක් කිව්වා. ඒ බොරුව තමයි අපේ රටේ විරැකියාව සියයට 40යි කියපු එක. එය මොන මූලාශ්‍රයෙන් ද දන්නේ නැහැ සොයා ගත්තේ. එය කොහෙන් සොයා ගත්ත දත්තයක් ද දන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රටේ විරැකියාව සියයට 3.9යි. සියයට හතරට ආසන්නයේ තමයි විරැකියාව තිබෙන්නේ.

අපි 2025 අවුරුද්දේ උද්ධමනය සියයට 2.1ක මට්ටමේ පවත්වාගෙන ගියා. 2022දී සියයට 68ට ගිය උද්ධමනය තමයි 2026 අවුරුද්දේ මුල් කාර්තුවේ සියයට 5ට ආසන්න මට්ටමෙන් තිබුණේ. මේ සැප්තැම්බර් මාසයේ, ඔක්තෝබර් මාසයේ තමයි උද්ධමනය සියයට 8කට ආසන්න මට්ටමට ළඟා වුණේ. ඉතින්, මේවා කොහෙන් හොයා ගන්න දත්ත ද මම දන්නේ නැහැ.

දුප්පත්කම වැඩි වෙලාලු. සියයට 60 ගණනක් දුප්පත්කමෙන් පෙළෙනවාලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාම ඉදිරිපත් කරන "Sri Lanka Poverty and Equity Brief: October 2026" කියන ලෝක බැංකු වාර්තාව අනුව දැන් අපේ රටේ දිළිඳුකම සියයට 15.8ට අඩු වෙලා තිබෙනවා. අපි බලය ගන්නකොට රටේ දිළිඳුකම සියයට 24යි. දැන් සියයට 15.8යි. ඒවා තමයි සැබෑ දත්ත. මෙන්න මේ සැබෑ දත්ත භාවිත කරලා තමයි අපි මේ රටේ ආර්ථිකය ස්ථාවර කරලා තිබෙනවාද, අපි තවදුරටත් මේ රටේ ජනතාවට ප්‍රතිලාභ ලබා දෙනවා ද කියන එක තීරණය කරන්න වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් මොකක්ද කරලා තිබෙන්නේ? අපි ආර්ථිකය ස්ථාවර කරලා තිබෙනවා. හැබැයි, ස්ථාවර කරපු ආර්ථිකයේ වර්ධනයක් අපට අවශ්‍යයි. ඒ වාගේම ස්ථාවර කරපු ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාව අතර බෙදිලා යන්න ඕනෑ. ඒ වෙනුවෙන් කටයුතු කිරීම තමයි වගකිව යුතු රජයක කාර්යභාරය වෙන්නේ. ඒ වෙනුවෙන් තමයි අපි මේ අණ පනත් ගේන්නේ. එතකොට අපට මොකක්ද කරන්න පුළුවන්? අපි මේ ස්ථාවර කරපු ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට ක්‍රමයෙන් ලබා දීමට කටයුතු කරනවා. ඒක කොහොමද කරන්නේ? අපි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කළා. 2025දී වැටුප් වැඩි කළා. 2026දී වැටුප් වැඩි කළා. ඒ වාගේම 2027දීත් වැඩි කරනවා. ඊළඟට, පෞද්ගලික අංශයේ මූලික වැටුප වැඩි කරන්න, අපි එකඟතාවකට ආවා. මලෙයහම් ප්‍රදේශවල සේවය කරන වතු කම්කරු ජනතාවගේ වැටුපත් වැඩි කළා. අපි වැටුප් විධියට ස්ථාවර කරපු ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට ලබා දෙනවා.

ඊළඟ එක සුබසාධනය. අද අපි කථා කරන අස්වැසුම වැඩසටහන හරහා ජනතාවට ප්‍රතිලාභ ලබා දෙනවා. ඊළඟට, සංවර්ධනය. අපි දන්නවා, අපි බලය ගන්නකොට ගොඩක් සංවර්ධන වැඩසටහන්, මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සියල්ලම වාගේ නතර කරලා තිබුණු බව. මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත -මීරිගම කොටසේ වැඩකටයුතු නතර කරලා තිබුණේ. අපි ඒ වැඩකටයුතු නැවත ආරම්භ කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කඩවත-මීරිගම කොටස පමණක් නොවෙයි, පොතුහැර-රඹුක්කන කොටසත්, රඹුක්කන-ගලගෙදර කොටසත් අපි ආරම්භ කළා. අපි මේ අවුරුද්දේ අග උතුරු අධිවේගී මාර්ගය මධ්‍යම අධිවේගී මාර්ගයට සම්බන්ධ වෙන කුරුණෑගල-ගලේවෙල දක්වාත් වැඩකටයුතු නැවත ආරම්භ කරනවා. ඒ, මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති.

අනෙක් පැත්තෙන්, විද්‍යුත් දුම්රිය ක්‍රමයකට යන්න අවශ්‍ය මූලික වැඩකටයුතු ටික අපි කරලා තිබෙනවා. ඉතින්, ප්‍රවාහන ක්ෂේත්‍රයේ දැවැන්ත වැඩසටහන් ගණනාවක් අපි ආරම්භ කරලා තිබෙනවා. නතර වෙලා තිබුණු කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ වැඩකටයුතු අපි නැවත ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම වරාය පිවිසුම් මාර්ගය වැනි දැවැන්ත ව්‍යාපෘති ආරම්භ කරලා සංවර්ධන වැඩසටහන් ආරම්භ කර තිබෙනවා.

ඊළඟට, ග්‍රාමීය සංවර්ධනය. අපේ රටේ ගම්වල තමයි සියයට 79ක්, 80ක් වාගේ ජනතාවක් ජීවත් වෙන්නේ. ඒ නිසා අපි "ප්‍රජා ශක්ති" දිළිඳු බව තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය සහ පළාත් සභා වැනි ආයතනවලට මුදල් වෙන් කරලා ග්‍රාමීය සංවර්ධනය සම්බන්ධයෙන් දැවැන්ත වැඩසටහන් ගණනාවක් ආරම්භ කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අන්න ඒ ස්ථාවර කරපු ආර්ථිකයෙන් දැන් ගමේ ජනතාවට ක්‍රමයෙන් ප්‍රතිලාභ ලබා දෙමින්, ඊළඟට ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීම සඳහා අපි කටයුතු කරමින් ඉන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මේ රටේ ජනතාව අපට ලබා දුන් ජන වරමට අනුව අපි නිසි පරිදි මේ රට කළමනාකරණය කරමින් ඉන්නවා. අපි දන්නවා, අපට තව බොහෝ දුර යන්න තිබෙන බව. තවම ගත වුණේ වසර දෙකක කාලයක් පමණයි. ඒ අතරතුර අපට අර්බුද ගණනාවකට මුහුණ දෙන්න සිදු වුණා.

ප්‍රධාන වශයෙන් අපි මේ අද කථා කරන මැද පෙරදිග අර්බුදය අපේ රටේ ආර්ථිකයට වාගේම ලෝකයේ ආර්ථිකයටත් යම් බලපෑමක් ඇති කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපි අවධානය යොමුකොට තිබෙනවා. ඒ වාගේම පසුගිය වර්ෂයේදී ඇති වෙච්ච "දිට්වා" සුළි කුණාටුව මඟින් අපේ රටේ ආර්ථිකයට බරපතළ ව්‍යසනයක් ඇති කළා. අපි ඒවාත් දරාගෙන, ඒවායෙනුත් ජන ජීවිතවලට වැඩි බලපෑමක් ඇති නොවන විධියට සහන සලසා දෙමින් තමයි මේ ආර්ථිකය ස්ථාවර කරමින් ආර්ථික වර්ධනයක් අපි අත් කරගෙන ඉන්නේ.

ඒ වාගේම මෙතැනදී පට්ටපල් බොරුවක් කිව්වා, රැකියා විරහිත උපාධිධාරීන් සම්බන්ධයෙන්. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය කියවා බලන්න. අපි රැකියා විරහිත උපාධිධාරීන් 30,000කට රැකියා ලබා දෙනවා කිව්වා. රාජ්‍ය සේවයේ ලක්ෂ 14ක් ඉන්නවා කියලා, ලක්ෂ 4කට ආසන්න ප්‍රමාණයක් 2019 සිට අපි බලයට පත් වනතුරු රාජ්‍ය සේවයට බඳවා නොගත්තේ ඇයි? රාජ්‍ය සේවයට බඳවා ගැනීම් නවත්වා තිබිලා දැන් බොරුවට කිඹුල් කඳුළු හෙළනවා. අපි තමයි දැන් රාජ්‍ය සේවයට නැවත බඳවා ගැනීමට කටයුතු කරන්නේ. ඒ අනුව 127,000ක් රාජ්‍ය සේවයට අලුතින් බඳවා ගැනීම සඳහා අපි මේ වනකොට කටයුතු කරමින් ඉන්නවා. අපි ගුරු සේවයට පමණක් 23,000කට ආසන්න ප්‍රමාණයක් මේ වර්ෂයේදී බඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු දැන් අවසන් කරමින් ඉන්නවා. ඒ ඔස්සේ විශාල වශයෙන් උපාධිධාරීන්ට රැකියා ලබා ගන්න පුළුවන්. අපි දන්නවා, උපාධිධාරීන්ට විතරක් නොවෙයි, අනෙකුත් අයටත් රැකියා විවර නොවුණු නිසා කාලාන්තරයක් තිස්සේ ගොඩ ගැසුණු ප්‍රශ්නයක් තිබුණු බව. අපි ඒක ක්‍රමයෙන් විසඳමින් ඉන්නවා. අපි මේ වසර දෙක තුළ ඒ සඳහා අවශ්‍ය මූලික පියවර ගනිමින් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට කියන්න ඕනෑ, අස්වැසුම වැඩසටහන පිළිබඳව ඉතාම අසත්‍ය කරුණු ප්‍රමාණයක් සමාජගත කරමින් ඉන්න බව. අද දිනයේ ඉදිරිපත් කර තිබෙන මේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් අපි කරන්නේ මොකක්ද? මේ පරිපූරක ඇස්තමේන්තුව මඟිනුත් කරන්නේ, මම කලින් කිව්වා වාගේම මේ රටේ ස්ථාවර කරපු ආර්ථිකයේ ප්‍රතිලාභ නැවත වතාවක් හැකිතාක් දුරට ජනතාව වෙත සාධාරණ විධියට බෙදී යෑම සඳහා කටයුතු කිරීමයි. අපි 2023දී ආරම්භ කරපු මේ අස්වැසුම වැඩසටහනේ ඒ වනකොට ප්‍රධාන කාණ්ඩ 4ක් තිබුණා. ඒ තමයි, සංක්‍රාන්ති, ආන්තික, අන්ත දිළිඳු සහ දිළිඳු කියන කාණ්ඩ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම ගත්තොත් මේ සංක්‍රාන්ති දිළිඳු බව කියන්නේ, කිසියම් හේතුවක් නිසා තාවකාලිකව දිළිඳු බවට පත් වනවා කියන එකයි. ඒ වනකොට ලංකාවේ ආර්ථික අර්බුදය නිසා කොටසක් තාවකාලික දිළින්දන් බවට පත් වුණා. මාස හයකට තමයි ඔවුන්ට ආධාර දෙන්න තීරණය කරලා තිබුණේ. නමුත්, 2026 ජූනි දක්වා ඒ කාණ්ඩවලට කාලය යම් දික් කිරීමක් කරගෙන ඇවිල්ලා යම් ආධාර මුදලක් ලබා දෙමින් තිබුණා. නමුත්, 2026 ජූනිවලින් පස්සේ අස්වැසුම ලබා දෙන්නේ අන්ත දිළිඳු සහ දිළිඳු කියන කාණ්ඩවලට පමණයි. ඒ ප්‍රමාණය ආසන්න වශයෙන් ලක්ෂ 12ක් වනවා. දැන් අලුතින් නැවත යාවත්කාලීන කළ දත්ත පද්ධතිය හරහාත් ඒ ප්‍රමාණය ඒ විධියටම ලබා දෙනවා. ඒ නිසා ලක්ෂ 14ක් අස්වැසුම ලේඛනයෙන් ඉවත් කළා කියන ඒ අසත්‍ය සමාජගත කිරීම පිළිබඳව අපි බොහෝ සේ කනගාටු වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

දැන් මොකක්ද වෙන්නේ? මේ මැද පෙරදිග අර්බුදය නිසා ඛනිජ තෙල් මිල ඉහළ යෑමත් එක්ක ජන ජීවිතයට ඇති වන බලපෑම අවම කිරීම සඳහා අපි මුල්වරට රුපියල් බිලියන 100ක සහනාධාරයක් ලබා දුන්නා. මෙවර අපි නැවතත් රුපියල් බිලියන 47ක සහනාධාරයක් ලබා දීලා ඉන්ධන පැත්තෙන් ජනතාවට දරන්න සිදුවන බර අවම කරන්න කටයුතු කරන අතරතුර, මේ ආධාරය ලබන, ඒ සමාජ ආරක්ෂණය අවශ්‍ය වන අයට අපි ආධාර ලබා දෙනවා. 2026 අප්‍රේල් මාසයේදීත් අපි අන්ත දිළිඳු කාණ්ඩයට අමතර රුපියල් 7,500ක් දීලා රුපියල් 25,000ක ආධාරයක් ලබා දුන්නා. ඒ වාගේම දිළිඳු කාණ්ඩයට රුපියල් 15,000ක් දුන්නා. දැන් මේ පරිපූරක ඇස්තමේන්තුව හරහා අපි බලාපොරොත්තු වනවා, මේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී ඒ අයට ලබා දෙන ආධාරය තවත් වැඩි කරන්න. ඒ අනුව නොවැම්බර් සහ දෙසැම්බර් කියන මාස දෙකේදී අස්වැසුම ආධාරය ලබන දිළිඳු කාණ්ඩයට දැනට ලබන රුපියල් 10,000 වෙනුවට, නොවැම්බර් මාසයේ තවත් අමතර රුපියල් 2,000ක් සහ දෙසැම්බර් මාසයේ තවත් අමතර රුපියල් 2,000ක් වශයෙන් රුපියල් 4,000ක දීමනාවක් ලබා දීමට මේ පරිපූරක ඇස්තමේන්තුව හරහා අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම අන්ත දිළිඳු කණ්ඩායමට රුපියල් 6,250ක ආධාරයක් ලබා දීමටත් අපි බලාපොරොත්තු වනවා. නොවැම්බර් මාසයේදී රුපියල් 3,000ක් සහ දෙසැම්බර් මාසයේදී රුපියල් 3,250ක් වශයෙන් එම මුදල ලබා දීමට අපි කටයුතු කරනවා. දැනට රුපියල් 17,000ක දීමනාවක් ලැබෙන අයට නොවැම්බර් මාසයේදී රුපියල් 20,000ක් සහ ඊට අමතරව දෙසැම්බර් මාසයේදී තවත් වැඩි මුදලක් ලබා දීමටත් අපි බලාපොරොත්තු වනවා. මැදපෙරදිග ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වයත්, විශේෂයෙන්ම ඉන්ධන මිල ඉහළ යෑමත් හේතුවෙන් අපේ රටේ ජන ජීවිතවලට ඇති වන බලපෑම අවම කිරීම සඳහා තමයි මෙම දීමනා ලබා දෙන්නේ. ඒ අනුව, එක් පැත්තකින් ස්ථාවර කළ ආර්ථිකය පවත්වාගෙන යන අතර, අනෙක් පැත්තෙන් ජනතාව අතරින් සමාජ ආරක්ෂණය අත්‍යවශ්‍ය අයට සහන ලබා දෙමින්, මහා පරිමාණ මෙන්ම කුඩා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිද ආරම්භ කරමින් ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම සඳහායි අපි කටයුතු කරමින් සිටින්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වෙනුවෙන් වන අපේ මේ ගමන් මහ පිළිබඳව මේ රටේ ජනතාවට හොඳ අවබෝධයක් තිබෙනවා. ජනතාව අපට ලබා දුන් ජන වරමට අනුව අපි කටයුතු කරන බව සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින්ම ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු ඇමතිතුමනි, ඔබතුමා එකඟ වනවා නම් මට කෙටි පැහැදිලි කිරීමක් කරගන්න අවස්ථාව ලබා දෙන්න.

ඊයේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදීත් මේ කාරණය පිළිබඳව සාකච්ඡා කළා. ගරු අමාත්‍යතුමාගේ අවසරය ලැබෙනවා නම් විතරක් මම මේ ප්‍රශ්නය අහන්නම්. ගරු ඇමතිතුමනි, ඊයේ එම කාරක සභාවේදී සඳහන් කළා, අස්වැසුම ප්‍රතිලාභවලින් අයින් කරපු category එක review කිරීම සඳහා process එකක් තිබෙනවා කියලා. නමුත්, මේ වනකොට අස්වැසුම ප්‍රතිලාභ අහිමි වූ බව පවසමින් මඩකලපුව දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් පැමිණිලි විශාල ප්‍රමාණයක් අපට ලැබී තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමා අපට පොඩි පැහැදිලි කිරීමක් කරන්න. ඒ ජනතාව කොතැනට ගිහිල්ලාද තමන්ගේ පැමිණිලි ඉදිරිපත් කරන්නේ? ග්‍රාම නිලධාරිවරයා වෙත හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිය විට එවැනි පැමිණිලි භාර ගන්න බැහැ කියලා තිබෙනවා. ඊයේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට පැමිණ සිටි නිලධාරි මහත්මයා අපට කිව්වා, ඒ සඳහා ක්‍රමයක් තිබෙනවා කියලා. එම නිසා, ඔබතුමාට පුළුවන් නම් ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න. මොකද, විශාල පිරිසකට අස්වැසුම ප්‍රතිලාභය අහිමි වෙලා තිබෙන බවට ප්‍රකාශයක් පළ වනවා අපිත් දැක්කා. ඔබතුමා කියනවා, ඒක සාවද්‍ය ප්‍රකාශයක් කියලා. ඔබතුමා නිවැරදි කාරණය පැහැදිලි කළා නම්, ඒ පිළිබඳව ජනතාවට දැනුම් දෙන්න අපට පුළුවන්.

බොහොම ස්තූතියි.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු මන්ත්‍රීතුමනි, විෂය භාර අමාත්‍යතුමා අද උදේ මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කළා. නමුත්, ගරු මන්ත්‍රීතුමා විමසූ කාරණය පිළිබඳව ජනතාව වෙනුවෙන් මම මූලික පැහැදිලි කිරීමක් කරන්නම්.

2026 වර්ෂයේ මේ වන විට ප්‍රධාන වශයෙන් අස්වැසුම ප්‍රතිලාභී කණ්ඩායම් දෙකක් සිටිනවා. ඒ තමයි, පළමු අදියර - Phase 1 - යටතේ හඳුනා ගත් අන්ත දිළිඳු සහ දිළිඳු යන කාණ්ඩ දෙක. එම අදියර දෙක යටතේ ආසන්න වශයෙන් 989,000ක පිරිසක් සිටිනවා. ඊට අමතරව Phase 2 යටතේ 2025දී ආරම්භ කළ ප්‍රතිලාභීන් 214,000ක් පමණ සිටිනවා. ඒ 214,000 ඒ විධියටම continue කරනවා. එම අදියර දෙක එකතු කළාම තමයි, ප්‍රතිලාභීන් දොළොස් ලක්ෂයකට ආසන්න සංඛ්‍යාව එන්නේ. Phase 1 එකේ ප්‍රතිලාභීන් තෝරාගෙන තිබෙන්නේ 2023 Social Registry එක පදනම් කරගෙනයි. සුබසාධක ප්‍රතිලාභ පනතට අනුව සෑම වර්ෂයකම ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් එහි recertification එකක් කළ යුතුයි. නමුත්, 2023, 2024 සහ 2025 යන වර්ෂවලදී එම recertification එක කරලා තිබුණේ නැහැ. 2025 වර්ෂයේදී ආරම්භ කළ එම ක්‍රියාවලිය තමයි 2026 වර්ෂයේදී අවසන් කරලා තිබෙන්නේ. මේ වන විට එම recertification ක්‍රියාවලිය හරහා සියයට 95ක පමණ ප්‍රමාණයක් අවසන් කර තිබෙනවා. එසේ අවසන් කළ ලේඛනය අනුව තමයි, ප්‍රතිලාභීන් 991,000ක පමණ ලේඛනයක් දැන් සකස් කර තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ කාරණය නිවැරදියි. සමහර වෙලාවට මීට පෙර ප්‍රතිලාභ ලැබූ පිරිසෙන් යම් පිරිසකට මෙවර ප්‍රතිලාභ නොලැබෙන්න පුළුවන්. සමස්ත ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 2,000කින් පමණ වැඩිවෙලා තිබුණත්, කලින් ප්‍රතිලාභ ලැබූ ඇතැම් පිරිසකට එම ප්‍රතිලාභ නොලැබී තිබෙන්නට පුළුවන්. ඒ වාගේම කලින් ප්‍රතිලාභ නොලැබූ පිරිසක් අලුතින් එම ලේඛනයට ඇතුළත් වෙලා තිබෙනවා. නමුත්, ප්‍රතිලාභීන්ගේ number එක වැඩිවෙලා තිබුණා. ඒක වෙන්න පුළුවන්. මොකද, මීට කලිනුත් අපට මේ වාගේ ප්‍රශ්න තිබුණා. Inclusion and exclusion errors පිළිබඳව ඔබතුමාත් දන්නවා. අස්වැසුම වැඩ පිළිවෙළ තුළ ඒ සම්බන්ධයෙන් විවේචනයක් තිබුණා. එම දෝෂ නිවැරදි කරන්න පුළුවන් එකම ක්‍රමය තමයි, recertification process එක. ඒ අනුව තමයි අපි කටයුතු කරලා තිබෙන්නේ.

දැන් පනතට අනුව අභියාචනා හෝ විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා දින 10ක කාලයක් ලබා දෙනවා. ඒ අනුව වැඩ කරන දින 10ක කාලයක් ලබා දී තිබෙන අතර, නොවැම්බර් 11 දක්වා අභියාචනා ඉදිරිපත් කරන්නත් පුළුවන්, විරෝධතා ඉදිරිපත් කරන්නත් පුළුවන්. Website එකට ගිහිල්ලා අදාළ තොරතුරු download කරන්න පුළුවන්. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ Unit එකක් ස්ථාපිත කරලා තිබෙනවා, එතැනටත් අභියාචනා සහ විරෝධතා ඉදිරිපත් කරන්න පුළුවන්. එම ක්‍රියාවලිය කරන්න පුළුවන් කියන එක තමයි ගරු ඇමතිතුමා විසිනුත් පැහැදිලි කළේ. ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව දැනට පැහැදිලි කරලා තිබෙනවා, එම කටයුත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා කරන්නත් පුළුවන්, website එක හරහා කරන්නත් පුළුවන් කියලා.

බෙහෙවින් ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.19]

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම, මෙම ඇස්තමේන්තුව හරහා තෙල්වලට යම් සහනයක් ලබා දීම පිළිබඳව කාගේවත් නොසතුටක් නැහැ කියලා මම හිතනවා. හැබැයි, මේ ආණ්ඩුව වැඩ පටන් ගන්නකොට කිව්වේ, නැවෙන් ගොඩබාන මිලටම ජනතාවට තෙල් ලබා දෙනවා කියායි. හැබැයි, දැන් ඇමතිවරයා කියනවා, ඒක ප්‍රායෝගික නැහැ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක ප්‍රායෝගික නැහැ කියලා අපට කියලා වැඩක් නැහැ නේ. ගිහිල්ලා ඒක ජනාධිපතිතුමාට කියන්න එපායැ. මොකද, ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමානේ ප්‍රකාශ කළේ, නැවෙන් ගොඩබාන මිලටම තෙල් ලබා දෙනවා කියලා. ඒක අපි කියපු කාරණයක් නොවෙයි නේ. නමුත්, දැන් ජනාධිපතිවරයාට ඒ බව කියන්නේ නැතුව අපට ඇවිල්ලා කියනවා, ඒක ප්‍රායෝගික නැහැ කියලා. ඒ ගැන අපට කියලා ඵලක් වෙන්නේ නැහැ. ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමාටම ඒක කියාගන්න.

අනික් කාරණය තමයි, ජනාධිපතිතුමා රැස්වීම්වලට සහභාගි වනකොට කියන්න ඕනෑ දේවල් අඩු ගණනේ එතුමාට ලියලා දෙන්න. ජනාධිපතිතුමා පසුගිය කාලයේ කිව්වා, තමන්ගේ පාලන කාල සීමාව තුළ කිසිදු බද්දක් වැඩි කළේ නැහැ කියලා. අලුතින් කිසිදු බද්දක් පැනෙව්වේ නැහැ කියලාත් කිව්වා. නමුත්, බලයට එනකොට නම් කිව්වා, පාසල් උපකරණ, ඖෂධ සහ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා පනවා තිබෙන VAT එක අයින් කරනවා කියලා. හැබැයි, VAT එක අයින් කළේ නැහැ, වැඩි කළා. මීට පෙර VAT ගහලා නොතිබූ භාණ්ඩවලටත් VAT එක ගැහුවා. ඒ වාගේම අභිංසක මිනිසුන්ගේ බැංකු ගිණුම්වලට ලැබෙන පොලියට සියයට 10ක බද්දක් - Withholding Tax එකක් - ගැහුවා. වාහන සඳහා අය කරන බදුත් වැඩි කළා.

ඊට අමතරව, IT sector එකේ උපදේශන සේවාවලට - consultanciesවලට - බදු ගැහුවා. බලයට ඇවිල්ලා වැඩ පටන් ගත්තේ තොරතුරු තාක්ෂණය කේන්ද්‍ර කරගෙන දැවැන්ත ආර්ථිකයක් හදන්න ඕනෑය කියලායි. එවැනි ආර්ථිකයක් හදන්න ඕනෑ. අපිත් ඒ මතයේ ඉන්නවා. හැබැයි, ඔබතුමන්ලා මොකක්ද කළේ? ආණ්ඩුවෙන් කිසිදු සහයෝගයක් නැතුව, බොහොම අමාරුවෙන් කියක් හෝ සොයාගන්නා IT sector එකේ නියුතු පුද්ගලයින්ටත් VAT එක ගැහුවා. ඔබතුමන්ලා බලයට ආවේ, ජාතික හැඳුනුම්පතේ ඉඳලා සියල්ල digitalize කරනවා කියලා. හැබැයි, තෙල් පෝලිමට, ගෑස් පෝලිමට අද වන විට TIN පෝලිමත් එකතු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අඩු ගණනේ තමන්ට භාර දී තිබෙන වගකීම නිසි පරිදි ඉටු කිරීමට අවශ්‍ය system එක හදාගන්න බැරි නම්, එහි පීඩනයත් මේ රටේ ජනතාව මත පැටවෙනවා නම්, එක්කෝ එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොකර ඉන්න ඕනෑ. එහෙම නැතුව ඒක ක්‍රියාත්මක කරන්න ලැහැස්ති වනවා නම්, ඊට අවශ්‍ය යටිතල පහසුකම් ටික හදන්න ඕනෑ. යටිතල පහසුකම් ටික සහ system එක හදන්නේ නැතුව, නිකම් ෂෝ එක දමන්න රැස්වීම්වලදී මේ ගැන කියන්න ඕනෑ හින්දා, ඒ වාගේම පාර්ලිමේන්තුවේදී මේ ගැන කියන්න ඕනෑ හින්දා විතරක් මෙවැනි වැඩ පිළිවෙළ අනිවාර්ය කරලා වැඩක් නැහැ. එවැනි වැඩ පිළිවෙළක් අනිවාර්ය කරලා ක්‍රියාත්මක කිරීමට පරිවර්තන කාල සීමාවක් ලබා නොදුන්නොත්, අවසානයේ මේ රටේ සාමාන්‍ය ජනතාව තමයි එයින් පීඩාවට පත් වන්නේ.

එක පැත්තකින් අද ජීවන වියදම වැඩිවෙලා තිබෙනවා. තෙල් බෙදාහරින්නන් සඳහා පොඩි සහනයක් ලබා දුන්නත්, අනෙක් පැත්තෙන් තෙල් මිල වැඩි වෙනවා නේ. ඒ කියන්නේ, තෙල් සඳහා අය කරන බද්ද වැඩි කරනවා නේ. අඩු ගණනේ තෙල් සඳහා පනවා තිබෙන බද්ද අඩු කරන්න. මොකද, ජනතාවට ගහන බදු සල්ලි මුදල් අමාත්‍යාංශයට අරගෙන, ඒ මුදල්වලින් ආපහු පෞද්ගලික ව්‍යාපාරිකයකුට සහනයක් දෙන්න අවශ්‍ය නැහැ. තෙල්වලට දැන් ආණ්ඩුව පනවා තිබෙන බද්ද යම් ප්‍රමාණයකින් අඩු කරන්න. එහෙම නේ පොරොන්දු වුණේ. හැබැයි, තිබුණු බදු ප්‍රමාණයටත් වඩා තෙල්වලට පනවන බදු ප්‍රමාණය වැඩි කළා. ඒ, රුපියල් 30ක්. අවසානයේදී මෙයින් පීඩනයට පත් වෙන්නේ මේ රටේ ජනතාව. තවත් පැත්තකින් කිරි පිටිවල මිල ගත්තත්, අත්‍යවශ්‍ය ආහාරවල මිල ගත්තත්, ඒ හැම එකකම මිල අද වනකොට ජීවන වියදමට එකතු වෙලා තිබෙනවා. නමුත් ඒ හා සමානව පඩි වැඩි වෙන්නේ නැහැ. දැන් ආණ්ඩුවේ ඉන්න මැති ඇමතිවරු දිහා බැලුවාම ගෑස් පෝලිමක් තිබෙන බවක් පෙනෙන්නේ නැහැ. හැබැයි, ගමට ගියාම, නගරවලට ගියාම ගෑස් පෝලිම් ගැන, තෙල් පෝලිම් ගැන ජනතාව කථා වෙනවා. ඒක ගම්වල, නගරවල දකින්නත් තිබෙනවා. හැබැයි, පාරිභෝගික අධිකාරිය දන්නේ නැහැ නේ, පාන් පිටි මිල වැඩි කරලා කියලා. මෙතැනට ඇවිල්ලා ලජ්ජා නැතිව කියනවා, අපෙන් අහන්නේ නැතුවලු, පිටි මිල වැඩි කළේ කියලා. එක්කෝ ඒ කථාව කියන්නේ නැතිව ඉන්න ඕනෑ. මීරිස් කරලේ ඉඳන් හැම දෙයකම මිල අද වනකොට වැඩි වෙලා තිබෙන්නේ. දැන් මේකට ආණ්ඩුවේ විසඳුම මොකක්ද? ආණ්ඩුවේ විසඳුම තවත් අලුතින් බද්දක් ගහන එකද? එහෙම නැත්නම් ඔබතුමන්ලාගේ සුපුරුදු පුරුද්ද වාගේ "අපි හොරු අල්ලනවා" කියලා පරීක්ෂණයක් කරන එකද? මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ සැලැස්ම මොකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවගේ ජීවන වියදම පාලනය කරන්න, දරා ගත හැකි තැනකට මේ රටේ ජීවන වියදම ගෙනෙන්න, පාසල් දරුවන්ගේ අධ්‍යාපනයට යන වියදම යම් ප්‍රමාණයකින් අවම කරන්න, ගෘහස්ථ ආර්ථිකය ශක්තිමත් කරන්න අවශ්‍ය කිසිදු සාර්ථක වැඩ පිළිවෙළක් අද වෙනකම් මේ අවුරුදු දෙකහමාරක කාලය ඇතුළත ආණ්ඩුව ක්‍රියාත්මක කරලා නැහැ. උද්ධමනය සියයට අටත් ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. හැම මාසයකම අපේ රටේ උද්ධමනය වැඩි වෙනවා.

"දිට්වා" සුළි කුණාටුවෙන් සිද්ධ වෙච්ච හානිය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා බොරු කිව්වා. ඒ

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

ආපදාවෙන් හානියට පත් වූ සමහර මිනිස්සු අද වෙනකම් කුඩාරම්වල ඉන්නේ. සමහරු අද වෙනකම් තාවකාලික නිවාසවල ඉන්නේ. අද වෙනකොට "දිවිවා" සුළි කුණාටුව ඇවිල්ලා අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. නමුත්, අද වෙනකම් ඒ ප්‍රදේශවල පාරවල් හදලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ කාරණාවලට ආණ්ඩුව මැදිහත් වෙන්නේ නැතිව මොන කයිවාරු ගැහුවත් ඵලක් වෙන්නේ නැහැ. මොකද, ආණ්ඩුව හොඳට බොරු කියන්න නම් දක්ෂයි. දැන් අය වැය දෙකක් ඉදිරිපත් කරලා ඉවරයි. මේ ආණ්ඩුව ඉදිරිපත් කරන තුන්වැනි අය වැය ළඟදීම එනවා. ඒක ඊට එහා ගිය බොරු අය වැයක් වෙයිද කියන එක තමයි අපිට තිබෙන ප්‍රශ්නය. මොකද, ඔබතුමන්ලා ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ගහලා මැතිවරණ කාලයේ බෙදුවා. නමුත් එලෙස බෙදපු ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් සත පහක වැඩක් නැහැ.

දැන් එක ඇමතිවරයෙක් කියනවා මම අහගෙන හිටියා, ආයෝජකයන් එනවාය කියලා. කොහෙන්ද එන්නේ? කවුද ආවේ? අද වෙනකම් ආයෝජකයෙක් ඇවිල්ලා බිහි වෙච්ච, ඔබේ ආණ්ඩුව විසින් නිර්මාණය කරපු රැකියාවක් පෙන්වන්න? ඉන්දියානු සමාගමක් සුළං බලාගාරයක් හදන්න අපේ රටට ආවා. ඒ අය හරවලා යැව්වා. වරායේ චීන සමාගමක් හිටියා, හරවලා යැව්වා. ලංකාවේ ආණ්ඩුවෙන් වන්දිත් ගන්නවා. ජපානයේ සමාගමක් හැරිලා ගියා. මේ වනකොට තමුන්නාන්සේලා මහා උජාරුවට කථා කරන ආයෝජකයෝ එක්කෙනා, එක්කෙනා හැරිලා යනවා.

තවත් පැත්තකින් ආයෝජකයන්ට හිතකර නැති පනත් ගෙනෙනවා. අපි විශ්වාස කරනවා, PTA එකේ යම් සංශෝධන වෙන්න ඕනෑ, ඒක නූතනත්වයට ගැළපෙන්න ඕනෑ කියලා. එදා තිබුණු ත්‍රස්තවාදී අරගළයට වඩා භාන්පසින් වෙනස් ත්‍රස්තවාදී සහ අන්තවාදී අරගළවලට තමයි අපිට මුහුණ දෙන්න වෙන්නේ. ඒක තමයි යථාර්ථය. දකුණු ආසියාතික කලාපය ගත්තත් එය අන්තවාදීන්ගේ ග්‍රහණයට ලක් වෙමින් යනවා. ඒකට අපි මුහුණ දෙන්න ඕනෑ, ඒකට අවශ්‍ය නව නීති ඕනෑ. අන්තවාදයට අවශ්‍ය නව නීති ගෙනෙනවා කියන්නේ, පව්ව ගහලා ඉන්න කොල්ලාව අල්ලා ගෙන ගිහිල්ලා හිරේ දමන එක නොවෙයි. කොණ්ඩය වවාගෙන ඉන්න කෙනා අල්ලා ගෙන ගිහිල්ලා හිරේ දමන එක නොවෙයි. ඇඳුම් මෝස්තරේ බලලා, "ෂා, මේ ඇඳුම් මෝස්තරේ පාතාලයේ මෝස්තරයක්" කියලා ඔහුව අල්ලා ගෙන ගිහිල්ලා හිරේ දාන එක නොවෙයි.

ඔබතුමන්ලා එක්ක එදා අරගළ කරපු අය අන්න අදත් පාරේ ඉන්නවා. ඔබතුමන්ලා එක්ක අරගළ කරලා, ගෙවල් ගිනි තියලා, ආණ්ඩු පෙරළපු අය අදත් පාරේ. ඒ, ඇයි? ඔබතුමන්ලා එදා වෙච්ච පොරොන්දු ඉටු කරන්නේ නැහැ. ඔබතුමන්ලා ඒ අයත් එක්ක පාරට බැහැලා, ඒ අයගේ ජීවිත පරදුවට තියලා කටයුතු කළා. එදා ආණ්ඩුව එක්ක හැප්පුණු අය තවමත් පාරේ ඉන්නේ ඇයි? ඊට එහාට ගියපු මර්දනයක් ක්‍රියාත්මක කරන්න තමුන්නාන්සේලා සූදානම් වෙන හින්දා. අද PSTA එක සම්බන්ධයෙන් සහ සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සමාජයේ විශාල කතිකාවක් තිබෙනවා. ආයෝජකයෝ ඔබේ බදු ප්‍රතිපත්තියට එකඟ වෙන්නේ නැත්නම්, ආණ්ඩුවක් විධියට ඔබ ගන්නා තීන්දු - තීරණ නිසා මේ රටේ ආයෝජකයෝ ලංකාවට ආකර්ෂණය වෙන්නේ නැත්නම්, තමුන්නාන්සේලා මේ රටේ ආයෝජකයන්ට අහිතකර පනත් තවදුරටත් ලංකාව තුළ ස්ථාපනය කරන්න උත්සාහ කිරීම තුළ මොකක්ද වෙන්නේ? ඉන්න ආයෝජකයා හැරිලා යනවා පමණක් නොවෙයි, අපේ රටට එන්න ඉන්න ආයෝජකයා එන්නේත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි යථාර්ථය.

පසුගිය කාලයේ අපේ රටේ එක්තරා පහළ අධිකරණයකින් පොලිස්පතිවරයාට නියෝගයක් හම්බ වෙනවා, අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන්. හේතුව මොකක්ද? තරුණයෙක්ව අල්ලාගෙන ගිහිල්ලා බොරුවට නඩු දමපු එක. ඒ කාලයේ කිව්වේ මොකක්ද? නාමල්ට විරුද්ධව බොරු සාක්ෂි දෙනකොට, නාමල්ට විරුද්ධව දිවුරුම් ප්‍රකාශ ගන්නකොට කමක් නැහැ, නාමල් විතරයි නේ. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද ඒක විපක්ෂයේ සිට මේ රටේ සාමාන්‍ය පුරවැසියා දක්වා ගලාගෙන ගිහිල්ලා තිබෙනවා. මේ ආණ්ඩුව විපක්ෂය මර්දනය කරනවා වාගේම අද මේ රටේ පුරවැසියා මර්දනය කරන තැනටත් ඇවිල්ලා තිබෙනවා. අවසානයේ අමාරුවේ වැටෙන්නේ පොලීසියේ නිලධාරීන්, ඔබතුමන්ලාගේ දේශපාලන න්‍යාය පත්‍රය ඉෂ්ට කරන්න ගිහිල්ලා. මත්ද්‍රව්‍ය දාලා පුද්ගලයෙක්ව උසාවියට ඉදිරිපත් කරනවා. පොලිස්පතිවරයා කැඳවනවා. හැබැයි, පොලිස්පතිවරයා ඒ පැත්ත පළාතක යන්නේ නැහැ.

අනෙක් කාරණය තමයි, හෝමාගම සිදු වුණු සිද්ධිය. පොලීසිය ඇතුළේ තරුණයෙක් ඝාතනය වෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඒ වෙනුවෙන් ලබා දීපු සාධාරණය මොකක්ද? අනෙක් පැත්තෙන් ත්‍රී වීලරයට වෙඩි තබනවා. ඒ අම්මා පොලීසියට කථා කළාම කියා තිබෙනවා, "ඔව්, මරන්න තමයි වෙඩි තිබ්බේ" කියලා. ඒ සිද්ධියට මුහුණ දුන්නේ වයස අවුරුදු 16 දරුවෝ දෙන්නෙක්. අම්මට පොලීසියෙන් කියා තිබෙනවා, "ඔව්, මරන්න තමයි වෙඩි තිබ්බේ" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නීතියක් කොහේද තිබෙන්නේ? පොලීසිය කියද්දිත් ත්‍රී වීලරය නතර කළේ නැත්නම් ඒකේ රෝදයකට වෙඩි තියන්න පුළුවන්. මොකද, ඒ ළමයා රෝදයේ එල්ලිලා යන්නේ නැහැ නේ, රෝදයට වෙඩි තැබුවාම ඇහට වදින්න. ඒක, ත්‍රී වීලරය හඹා ගිහිල්ලා, හිතාමතාම ඝාතනය කිරීමේ වුවමනාව ඇතිව තියපු වෙඩිල්ලක් බව තමයි පෙනෙන්නේ.

ඒ වාගේම ත්‍රිකුණාමලයේත් එවැනි සිද්ධියක් සිදු වෙලා තිබෙනවා. ත්‍රී වීලරයකට වෙඩි තියලා නාවික හමුදාවේ සෙබළෙක් ඝාතනය වෙනවා. හැබැයි, ඔබතුමන්ලාගේ න්‍යාය පත්‍රය මොකක්ද? ඒ, සංවිධානාත්මක අපරාධකරුවෝ දෙදෙනෙක් කියන එකයි. කොළඹ තදාසන්න ප්‍රදේශවල වාගේම ලංකාවේ හැම තැනකම ත්‍රී වීලර් ධාවනය කරනවා නේ. යම් හෙයකින් ත්‍රී වීලරයක යන මනුස්සයා ත්‍රී වීලරය නවත්වන්නේ නැතිව ගිහිල්ලා, අනෙක් පැත්තෙන් ටැක්සියක නැඟලා යන මනුස්සයෙක් ටැක්සිය නවත්වන්නේ නැතිව ගිහිල්ලා වෙඩි කන්න සිදු වුණොත් මගියාට තමයි වෙඩි වදින්නේ. එහෙම නැතිව නවත්වන්නේ නැතිව ගිය කෙනාට නොවෙයි වෙඩි වදින්නේ. මම කලින් කිව්ව වයස අවුරුදු 16 දරුවන් දෙදෙනා මෙවර සාමාන්‍ය පෙළ විභාගය ලියන්නයි බලාගෙන හිටියේ. මොකක්ද පොලීසියෙන් කිව්වේ? පොලීසියෙන් කිව්වා, මත්ද්‍රව්‍ය තිබෙනවා කියලා. ඒ, ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලීසියට පැහැදිලිවම බොරු සාක්ෂි හදලා පුරුදුයි. ඒක තමයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ න්‍යාය පත්‍රය.

කුරුණෑගල පොලීසිය ඇතුළෙත් පුද්ගලයෙක් ඝාතනය වෙනවා. තවත් තැනක ඉඩමක් search කරන්න ගිහිල්ලා ගෙදර මංකොල්ල කාලා ඇවිල්ලා තිබෙනවා. මම දැක්කා, ඒක අද newsවලත් පළ වෙලා තිබෙනවා. පොලීසියෙන් ඉඩමක් සෝදිසි කරන්න ගිහිල්ලා ඒ ගෙදර තිබෙන සල්ලි ටික හොරකම් කරගෙන ඇවිල්ලා. ඔබතුමන්ලා සම්පූර්ණයෙන් පොලීසිය දේශපාලනීකරණය කරනවා. ඒක තමයි අවසාන ප්‍රතිඵලය.

ඇඹිලිපිටියේ පොලීසියේ මහත්මයාට මොකක්ද වුණේ? පොලීසියෙන් ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරයෙකුගේ ගංජා හේනක් වැටලුවා. ඊට පස්සේ මොකද වුණේ? ඒ මන්ත්‍රීවරයාව

රිමාන්ඩ් කරන්නේ නැතිව අර පොලිස් නිලධාරියාව රිමාන්ඩ් කළා. ඒ පොලිස් නිලධාරියාට ගැහුවා. අන්තිමට තමුන්නාන්සේලාට චෝදනා ගොනු කරගන්න බැරි වුණා. ඒ නිසා ඒ පොලිස් නිලධාරියාව නිදහස් කළා. ලජ්ජයි නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද වෙනකල් ඒ මනුස්සයාට රස්සාව දීලා නැහැ නේ. ඒ මනුස්සයා රස්සාවක් කරපු කෙනෙක් නේ. ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරයෙකුගේ ගංජා හේන අල්ලපු එකද වැරැද්ද? ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරයෙකුගේ ගංජා හේන අල්ලපු එකේ වැරැද්දට ගුටිත් කාලා රස්සාවත් නැති වෙලා තිබෙනවා. අද වෙනකල් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඒ මනුස්සයාට රස්සාව ලබා දෙන්න මැදිහත් වුණාද, මානව හිමිකම් කොමිෂන් සභාවේ නියෝගයක් තිබියදීත්?

අනෙක් කාරණය තමයි, කාවන්තිස්ස ඇතාගේ සිද්ධිය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කාවන්තිස්ස ඇතා සම්බන්ධ ප්‍රශ්නයට මොකක්ද වුණේ? තමුන්නාන්සේලා සමාජයට, රටට පෙන්වන්න ඕනෑ හින්දා ගමේ ඉන්න මනුස්සයෙක්ව ගෙනැල්ලා ඒ වැරැද්ද භාර ගන්න කියනවා. බොරු සාක්ෂි හදන්න කියනවා. ගමේ අයට කියනවා, බොරු සාක්ෂි දෙන්න කියලා. ගමම ඇවිස්සෙනවා. අද ගම සම්පූර්ණයෙන්ම බොරු සාක්ෂි හදන එකට විරුද්ධව පොලීසිය එක්ක පැටලෙනවා. අවසානයේ මොකක්ද වෙන්නේ? අන්තිමට කාවන්තිස්ස ඇතාගේ ඇත්ත ඝාතකයන් හැංගෙනවා. හැංගෙනවාද, නැත්නම් කාවන්තිස්ස ඇතාගේ ඇත්ත ඝාතකයන් තමුන්නාන්සේලා හංගනවාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මේ රටට ආයෝජකයන් ගෙනෙන්න ඕනෑ නම් ඒ ආයෝජකයන්ට නිසි ගෞරවය ලබා දෙන්න. මේ රටේ ජනතාවට අවශ්‍ය රැකියා උත්පාදනය කරන්න. ආර්ථිකය හසුරුවනවා කියන කාරණය තමුන්නාන්සේලාට පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියවාරු ගහලා, අමු පව කියලා කරන්න බැහැ. ඒකට සැලැස්මක් අනුව වැඩ කරන්න ඕනෑ. අපි බලාගෙන ඉන්නවා, ජනාධිපතිවරයා තුන්වැනි අය වැයෙන් පව කීයක් කියනවාද කියලා ගණන් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දිවා ආහාර විවේකය සඳහා ගරු සභාවේ කටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටුවනු ලැබේ.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකතුමාගේ [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ravindra Bandara. You have nine minutes.

[අ.භා. 1.00]

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ රුපියල් බිලියන 47ක පරිපූරක ඇස්තමේන්තුව හරහා ප්‍රතිපාදන ගැළපීමක් සිදු වන මේ අවස්ථාවේ, මට කලින් කථා කළ අපේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා කියපු යම් කාරණයකින්ම මගේ කථාව පටන් ගන්න එක වඩාත් සුදුසුයි කියලා මම හිතනවා. මොකද, සුපුරුදු පරිදි එතුමා නොයෙකුත් කාරණා ගොඩක් කිව්වා. මුලින්ම කිව්වා, මේ රටේ ආයෝජන නැහැ, ආයෝජකයෝ එන්නේ නැහැ වාගේ කථාවක්. අවුරුදු දෙකක් තුළ ආර්ථික ස්ථායීකරණය ඇති කරගෙන ආයෝජනවලට රට විවෘත කරලා, නිෂ්පාදන ආර්ථිකයක් කරා යන ගමනේදී එතුමා ඒ විධියට කථා කළේ මුඛයෙන්ද, එහෙම නැත්නම්, වෙනත් තැනකින්ද කියලා අපට හිතෙනවා. මොකද, ආයෝජකයන්ගෙන් මිලියන 100ක කොමිස් මුදල් අරගෙන දැන් කථා කරනවා, ආයෝජකයෝ එන්නේ නැහැ කියලා. මම හිතන්නේ, ඒක රුපියල් මිලියන 70ක්, මිලියන 100ක් වාගේ මුදලක්.

ඒ වාගේම එතුමා තව දෙයක් කිව්වා. සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත ගැන කියලා ඇඳුම, පව්ව සටහන්, කොණ්ඩය පිළිබඳව කාරණා වගයක් මතු කළා. ඒ පනත් කෙටුම්පතෙහි තිබෙන්නේ, ලෝකයේ විවිධ මාෆියා කල්ලි, විවිධ අපරාධ කල්ලි, සංවිධානාත්මක අපරාධකාරයෝ භාවිත කරන ටැටූ එක සම්බන්ධව. එහෙම නැතිව ටැටූ එකක් ගහනවාට, කොණ්ඩය වෙන යම් විධියකට පිරන එක - කොණ්ඩය ගැන සඳහන් කරලා තිබුණෙත් නැහැ - ගැන නොවෙයි. ඇඳුම් විලාසිතා ගැන සඳහන් කරලා තිබෙනවා. අපේ රටේ එහෙම දෙයක් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. නමුත්, බන්ධනාගාරය දිහා බලලා කෙනෙකු හිතන්න පුළුවන්, අපේ රටෙත් අපරාධකාරයෝ අඳින නිශ්චිත ඇඳුම් තිබෙනවාද කියලා. ඒක සමහර වෙලාවට සාටකයක් වෙන්න පුළුවන්; කුරහන් පාට සාටකයක් වෙන්න පුළුවන්. මම එහෙම කියන්නේ නැහැ. නමුත්, බන්ධනාගාරය දිහා බලලා කෙනෙකු එහෙම හිතන්න පුළුවන්. ඒ නිසා අපි කියනවා, ඒ නිවැරදි විග්‍රහයන් එක්ක කටයුතු කරන්න කියලා. අඩු ගාණේ අධිකරණ ඇමතිතුමා කියපු කථාව ඇහුවා නම් ඒක ගැන පුළුල් අවබෝධයක් ලබා ගන්න පුළුවන් වෙයි.

ඒ වාගේම කිව්වා, "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට ලක් වෙච්ච අය කූඩාරම්වල ඉන්නේ කියලා. අපි දන්නවා, "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට ලක් වූ ජන ජීවිත යථා තත්ත්වයට පත් කරන්න රුපියල් කෝටි 50,000ක් වෙන් කරලා අර්ධ හානි සහ පූර්ණ හානි වූ නිවාස නැවත ඉදිකිරීම මෙන්ම විනාශයට පත් වූ මාර්ග, වාරිමාර්ග ඇතුළු සියලු යටිතල පහසුකම් සංවර්ධනය කරගෙන යන බව. මුලින් කිව්වේ වැලි කොට්ට සංවර්ධනය කියලා. නමුත්, ඒවායේ ස්ථිර ඉදිකිරීම් දැන් සිදු කරමින් යනවා.

ඒ වාගේම ඒගොල්ලන්ට අමතකයි, ඒගොල්ලන්ගේ කාලයෙත් නාය යෑම් සිදු වුණා කියලා. ගිය සතියේ තිබුණා, උද්ඝෝෂණයකුත්. මීරියබැද්ද නායයෑම සිදු වෙලා අවුරුදු 12ක්

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

ගත වෙලා තිබෙනවා. ඒක සිද්ධ වුණේ එතුමන්ලාගේ කාලයේ. ඒගොල්ලන්ට ගෙවල් හදා ගන්න පුළුවන් වුණේ 35යි. තව ගෙවල් එකසිය තිස් ගණනක් හදන්න තිබෙනවා. අපට තමයි ඒ ප්‍රශ්නත් විසඳන්න වෙලා තිබෙන්නේ. නාය යෑමකට ලක් වූ එක් ස්ථානයකවත් වැඩකටයුතු ටික කළමනාකරණය කරලා ඒකේ ගෙවල් ටික හදා ගන්න බැරි උන්නාන්සේලා දැන් අපට කියනවා, "දිටිවා" සුළි කුණාටුවෙන් විනාශයට පත් වූ ගෙවල් හැදුවේ නැහැ, ඒ වෙනුවෙන් අවශ්‍ය කටයුතු කළේ නැහැ කියලා. ජනාධිපතිතුමා ගිහිල්ලා තමයි, කබරගල ප්‍රදේශයේ ඉදිකළ නිවාස ව්‍යාපෘතිය ජනතා අයිතියට පත් කළේ. අපි එනකොටත් අත්හැරලා දමපු tea factory එකක ඔවුන් හිටියේ. අපි තමයි ඒ නිවාස ටික - ගෙවල් 52 - හදලා ඒගොල්ලන් පදිංචි කරන්න කටයුතු කළේ. ඒ නිසා එතුමා ඒ විධියට කථා කළේ කොහෙන්ද කියලා තමයි අපට හිතන්න තිබෙන්නේ.

දැන් කථා කරනවා, තෙල් පෝලිම් තිබෙනවා කියලා. තෙල් පෝලිම්, ගෑස් පෝලිම් ඇති වන එක නේ, ඒගොල්ලන්ගේ බලාපොරොත්තුව. යුද්ධය ඇති වනකොටම කිව්වා, පෝලිම් ඇති වෙනවා, අප්‍රේල් වනකොට විදුලිය කප්පාදු කරනවා, ගෑස් පෝලිම් ඇති වෙනවා කියලා. එහෙම නැහැ, අපි ඒ කටයුතු ඉතාම ලස්සනට කළමනාකරණය කරගෙන යනවා. ලෝකයටම බලපාන ඒ බාහිර කම්පනවලදීත් අපි ඒ කටයුතු කළමනාකරණය කරගෙන යනවා. නමුත් ඒ කාලයේ තෙල් පෝලිම්වල ඉඳලා මිනිස්සුන්ගේ ජීවිත නැති වුණා. ඒකෙන් කොයි තරම් නම් මිනිස්සු අපහසුතාවට පත් වුණාද? ආර්ථික වශයෙන් රට බංකොලොත්භාවයට පත් කළා.

එතුමා කියපු දේවල් ගැන ඉන් එහාට කථා කරන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. හැබැයි, දෙයක් කියනකොට ඒවා හිතන්න ඕනෑ. අද දවසේ ඔය නිල් පාට බස් එකේ එන්න සිද්ධ වෙලා තිබෙන්නේ ඇයිද කියන එක ඉස්සෙල්ලා හිතන්න ඕනෑ. මේ කියපු කාරණා සම්බන්ධයෙන් පුළුල් විග්‍රහයක් කළොත් ඒවා එතුමාටම අදාළ වෙනවා.

තෙල් ගැන කථා කරපු නිසා මම මේ කාරණාත් කියන්නම්. 2025.07.01 දින වනකොට පෙට්‍රල් ලීටරයක් රුපියල් 305ට තිබුණා. එතකොට 2026.02.01 වනකොට ක්‍රමානුකූලව ඒක රුපියල් 292ට අඩු වුණා. ඩීසල් ලීටරයක් රුපියල් 289ට තිබුණේ, 2025.07වැනි මාසයේ. 2026 දෙවෙනි මාසය වනකොට ඩීසල් ලීටරයක් රුපියල් 277ට අඩු වුණා. එතැනින් පස්සේ නේ, යුද්ධය තත්ත්වය ඇති වුණේ. ඉතාම පැහැදිලියි, ඒ මාසය දක්වා - ඒ මාස හතම - ක්‍රමානුකූලව තෙල් මිල අඩු වුණා කියලා. අඩු වෙලා, ඊට පස්සේ තමයි තෙල් මිල වැඩි වෙන්න ගන්නේ. 2026 තුන්වෙනි මාසයේ සියයට 0.34ක්, ඊළඟට, සියයට 8ක් ඒ විධියට ගිහිල්ලා සියයට 45කින් පෙට්‍රල් මිල වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම ඩීසල් මිල සියයට 43කින් වැඩි වෙලා තිබෙනවා. ඒ, අපේ ලංකාවේ මිල. ලෝක වෙළෙඳ පොළේ ගත්තාම, පෙට්‍රල් මිල සියයට 80කින් වැඩි වෙලා තිබෙනවා. ඩීසල් මිල සියයට 88කින් වැඩි වෙලා තිබෙනවා. ඉතින් මම හිතන්නේ, එතැන හිතන්න යමක් තිබෙනවා කියලායි. ජනතාවට සහන දෙන්න අප කටයුතු කර තිබෙනවා. අද දවසේ මේ රුපියල් බිලියන 41ක් වෙන් කරන්නෙත්, ඉදිරි මාස 3 සඳහා ඒ සහන දෙන්නයි. රුපියල් 70ක සහනාධාරයක් දෙනවා, ඩීසල් ලීටරයක් සඳහා. ඊට කලින් මාස 5ක් ඩීසල් ලීටරයක් සඳහා රුපියල් 100 ගණනේ සහනාධාර දුන්නා. ඒක තමයි ජනතාව පිළිබඳව වගකීම දරනවා කියලා කියන්නේ.

එතුමන්ලාට නොයෙක් කථා කියන්න පුළුවන්. ඒගොල්ලන් කියනවා නේ, බාන මිලට ඉන්ධන දෙනවා කිව්වා කියලා. සිපෙට්කෝ එකේ දත්ත අරගෙන බැලුවාම total cost එක ගත්තොත්, සුදු ඩීසල්වලට රුපියල් 520ක් යනවා. සුදු ඩීසල් ලීටරයක් රුපියල් 397ට දෙනවා. ඔක්ටේන් 92 පෙට්‍රල්වල total cost එක ගත්තාම, රුපියල් 496ක් වෙනවා. මම මේ CPC එක හරහා ගත්ත සත්‍ය දත්ත කියන්නේ. ඒක ලීටරයක් රුපියල් 424ට දෙනවා. එතකොට ඒ මිලට වඩා අඩුවෙන් දෙන්නේ. ඩීසල් ගත්තාම, ඒ සහනාධාර මුදල දුන්නාම රුපියල් 53ක පාඩුවක් තිබෙනවා. පෙට්‍රල් ගත්තාම, රුපියල් 92ක පාඩුවක් තිබෙනවා. ඒක දන්නවා. කවුරුත් දන්නවා, මේ රජය මේක කොහොමද කළමනාකරණය කරන්නේ කියලා. ඒගොල්ලන්ගේ කුණු ගොඩවලුත් අපි දැන් ඇදගෙන යනවා නේ.

අපි දන්නවා, ඒ කාලයේ ADB එක කරපු පාරවල්, iRoad ව්‍යාපෘති ඇතුළු ඔක්කෝම දාලා ගියා. ඒවා දැන් ආපහු හදනවා. JICA ව්‍යාපෘති නැවතිලා තිබුණා; ඒවා දැන් ආපහු ක්‍රියාත්මක වනවා. ඒ වාගේම, රෝහල්වල වැඩ නැවතිච්ච බිල්ඩින් ආයේ හැදෙනවා. අපේ දිස්ත්‍රික්කයේ විතරක් වැඩ නැවතිලා තිබුණු iRoad ව්‍යාපෘතියේ රුපියල් මිලියන 7,000ක වැඩ ආරම්භ වෙලා තිබෙනවා. මේ රජයේ පාරදෘශ්‍යතාව, මූල්‍ය විනය, දූෂණයෙන් තොර බව කියන එක IMF එකත් අගය කර තිබෙනවා. ආර්ථික ස්ථායීකරණය පැත්තෙන් ගත්තාම, දැන් මේ බොරුවට කෑ ගහන විපක්ෂයේ අය පිළිගත්තේ නැති වුණාට ජාත්‍යන්තර දර්ශකවල - Moody's ගත්තත්, Fitch Ratings ගත්තත් - ලංකාවේ ණය ගෙවීමේ හැකියාව කියන එක ඉහළ ගිහිල්ලා තිබෙනවා. ආපහු සැරයක් මේ රටේ පෝලිම් ඇති වෙයි කියලා, ආර්ථිකය බංකොලොත් වෙයි කියලා විපක්ෂය බලාපොරොත්තු වුණාට, නැවත එහෙම තත්ත්වයක් එන්නේ නැහැ.

1977න් පස්සේ අඩුම අය වැය හිඟය වාර්තා වෙලා තිබෙනවා, ගිය අවුරුද්දේ. අන්න ඒ වාගේ තමයි ණය තිරසරභාවයත්. IMF එක 2032 වර්ෂයට තමයි ණය තිරසරභාවය පිළිබඳ ඉලක්ක ලබා දී තිබෙන්නේ; පුරෝකථනය කරලා තිබෙන්නේ. අපේ නව රජය යටතේ ඒක 2025දී ළඟා කරගත්තා. එතකොට අවුරුදු 7ක් මෙහාට ඇදලා තිබෙනවා. මම හිතන්නේ ඕවා තමයි විපක්ෂයට ඇඬෙන කතන්දර. ඔයගොල්ලන් මේ වාගේ අවස්ථාවක බලයේ සිටියා නම් මොකද වෙන්නේ? ලෝකයේ මේ වාගේ යුද්මය තත්ත්වයක් තිබියදී, "දිටිවා" වැනි ස්වාභාවික කම්පනයක් එන අවස්ථාවේ බලයේ හිටියා නම් මොකද වෙන්නේ? එහෙනම් ඔන්න තෙල් පෝලිම් ඇතිවනවා. තෙල් හිඟයත් එක්ක ආයේ විදුලිය නැහැ. ගෑස් පෝලිම් ඇතිවනවා. පොහොර ටික එන්නේ නැහැ. ආයේ කාබනික පොහොර හඳුන්වා දෙනවා. අසූචි නැව් ගේනවා. ඕවා නේ, එන්නේ. නේද?

මහ ලොකු ආර්ථික ඔස්තාර්ලා කියලා පිරිසක් හිටියා නේ. රනිල් මහත්තයා ගැන කථා කරනවා. එතුමා කිව්වා, මාලිමා ආණ්ඩුව බලයට ආවාම ඩොලරයේ අගය රුපියල් 1,000ට යනවා කියලා. ඒ කථා තවම තිබෙනවා, සමාජ මාධ්‍යවල. ඊළඟට ඩොලරයට පීඩනයක් තිබෙන දවස්වල දයාසිරි මන්ත්‍රීතුමාත් මේ පාර්ලිමේන්තුවේ කිව්වා, "ලබන සතිය වෙනකොට ඩොලරයේ අගය රුපියල් 600වෙනවා" කියලා. කෝ, ඒ පුරෝකථන? රනිල් මහත්මයා කිව්වා, බිත්තරය රුපියල් 400 වෙනවා කියලා. ඔන්න ඔය වාගේ කථා කිව්වා. තවත් ආර්ථික ඔස්තාර්ලා වගයක් ඉන්නවා නේ. ඒ අයත් මේ දවස්වල එක එක ඒවා කියනවා මම දැක්කා. හැබැයි ඒගොල්ලන් කියන ඒවා එච්චර ගණන් ගන්න ඕනෑ නැහැ. ඒගොල්ලන් කියනවා, "මේක හරි අවදානම්. වාහන ගේන්න එපා" කියලා. අන්තිමට කියනවා, "භාණ්ඩාගාරය පිරිලා ඉතිරිලා. මට වැරදුණා" කියලා. මේ දවස්වල කියන ඒවාත් තව ටික දවසක් යනකෙට වැරදුණා කියලා කියනවා.

අලුත් බදු ගැනත් කථා කරනවා. අලුත් බදු නොවෙයි. අපි බදු දැල පුළුල් කළා. බදු ගෙවපු නැති අයගෙන් බදු අය කරගත්තා

විතරයි. ඩිජිටල් සේවා ගත්තාම, දේශපාලනඥයන් මැදිහත් වීමෙන් ඒවායේ නොයෙක් වංචා, දූෂණ තිබුණා. ඒකට සියයට 30ක අය කිරීමක් තිබුණා. ඒක කොටසකින් අය කරගත්තා. කොටසකින් අයකර ගත්තේ නැහැ. නමුත් ඒක සියයට 15 දක්වා අඩු කළා. විශේෂතා නැතුව, දේශපාලන මැදිහත්වීම් නැතුව ඒක හැමෝගෙන්ම අය කරගන්නවා. ඔයගොල්ලන් බලයේ හිටියා නම් දේපළ බද්දත් ඇවිල්ලා. ඒවා හරිගස්සලා තිබුණා. එහෙම තමයි වැඩ කටයුතු සිද්ධ වන්නේ.

ඒ වාගේම, IMF එක මේ අවුරුද්දට සියයට 3.7ක ආර්ථික වර්ධන වේගයක් පුරෝකථනය කළා. නමුත් ගිය අවුරුද්දේ සියයට 5 ඉක්මවා ගොස් මේ අවුරුද්දේ මුල් කාර්තුවේ සියයට 5.1ක් තිබුණා. දෙවන කාර්තුවේත් සියයට 4 ඉක්මවා තිබුණා. ආර්ථික වර්ධන වේගය ඒ පුරෝකථනවලට වඩා ඉහළින් තිබෙනවා. මම හිතන්නේ ඒක තමයි රජය ලෙස හරි දැක්මක් එක්ක යනවා කියලා කියන්නේ. ඒකත් එක්ක තමයි මේ විපක්ෂය දැඩි අසරණභාවයට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා විපක්ෂයට දැන් සටන් පාඨ නැහැ. මොකද, මේ ආර්ථික ස්ථායීකරණය අපේ ඊළඟ අය වැයත් එක්ක ස්ථීර වීමක් තමයි සිදු වන්නේ. ඒ කියන්නේ අපි නිෂ්පාදන ආර්ථිකයකට යන එක. පරිවර්තනීය අය වැයක් තමයි ඉදිරිපත් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රුපියල් බිලියන 41ක මුදල හරහා වන සහනය ලබා දෙන්නේත් ජනතාවටයි කියන එක අවසාන වශයෙන් මතක් කරමින්, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසාන කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Kins Nelson. You have 10 minutes.

[අ.භා. 1.09]

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. විශේෂයෙන්ම අද වසන්ත සමරසිංහ ඇමතිතුමා මේ සභාව විතරක් නොවෙයි, එතුමා මේ රටේ කුඩා හා මධ්‍ය පරිමාණයේ වී මෝල් හිමියන්වත් නොමඟ යැව්වා. එතුමා කිව්වා, මේ වෙනකොට ඔවුන්ට ලබා දෙන loan එකේ මුළු මුදලම ලබා දී තිබෙනවා කියලා. මම වගකීමෙන් කියනවා, මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 60දෙනෙකුට ඒ loan එක ලබා දීලා තිබෙන බව. රුපියල් මිලියන 25ක් තමයි දෙන්නේ. දින 60ක් ඇතුළත වාරික 4කින් දෙන්න නියමිතව තිබුණත් මේ වනකොට වාරික 2යි ලබා දීලා තිබෙන්නේ. මේ වනකොට රුපියල් මිලියන 12.5ක් ලබා දීලා තිබෙනවා. ඉතිරි මුදල කවදාද දෙන්නේ කියන එක පිළිබඳව අපි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී කථා කළා. එතකොට එතැන හිටපු අදාළ නිලධාරීන් කිව්වේ, ඉතිරි රුපියල් මිලියන 12.5 දෙන්න විධියක් නැහැ කියලායි. මේ මාසයේ 10වන දා වනකොට ඒ දින 60 අවසන් වෙනවා. නමුත්, වසන්ත ඇමතිතුමා මෙතැනට ඇවිල්ලා කියනවා, කුඩා හා මධ්‍ය පරිමාණ සියලු වී මෝල් හිමියන්ට ඒ ණය ලබා දීලා තිබෙනවා කියලා. ඉතින් මෙන්න මේක තමයි අප මේ පෙන්වා දෙන්නේ. පසුගිය රජයවල් අරවා කළා, මේවා කළා කියලා කියපු ඔබතුමන්ලා බලයට පත් වුණේ ඒවා නොකරනවා කියලා නේ. දැන් ඔබතුමන්ලාත් ඒවාම කරනවා නම්, පසුගිය රජයවල් සහ මේ රජය අතර මොකක්ද තිබෙන වෙනස? රටේ ජනතාවට ඇත්ත කියන්න. ඔබතුමන්ලා බලයට ඇවිත් දැන් අවුරුදු දෙකක් වෙනවා නේ. රටට සුබ වෙලා නැහැ. ආණ්ඩුවට අවුරුදු දෙකක් වුණාට රටට සුබ වෙලා නැහැ. ප්‍රශ්න තිබෙනවා තමයි. රටේ ජනතාවට ප්‍රශ්න තිබෙන කොට, මේ සභාවට, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා බොරු කියන්නේ නැතුව රටේ ජනතාවට ඇත්ත කියන්න.

කුළු බඩු ආනයනය කරන උදවිය අද දැඩි අපහසුතාවකට පත් වෙලා ඉන්නවා. මේ වනකොට වේළපු මිරිස් ගෙනාපු කන්ටේනර් 100කට වඩා රේගුව විසින් රඳවාගෙන තිබෙනවා. අදට හරියටම සති දෙකක් වනවා. අපි හේතුව සොයා බැලුවා. එක පැත්තකින් කියනවා, ඒ කන්ටේනර් ඇතුළේ තිබෙන වේළපු මිරිස් හරි ප්‍රමිතියට නැහැ කියලා. අනෙක් පැත්තෙන් කියනවා, තෙතමනය තිබෙනවා කියලා. ඇත්තටම තෙතමනය තිබෙනවා ඇති. මොකද, ලංකාවට විතරක් නොවෙයි නේ පසුගිය දවස්වල වර්ෂාව තිබුණේ. ඉන්දියාවටත් ඒ තත්ත්වය පැවැතුණා. අපි විශාල වශයෙන් අපේ රටට භාණ්ඩ ආනයනය කරන්නේ, ඉන්දියාව වාගේ රටවලින්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වනකොට වේළපු මිරිස් කන්ටේනර් 100ක් විතර සති තුනක් විතර තිස්සේ රේගුව විසින් තියාගෙන ඉන්නවා. ඒවා ගෙනාපු අය මේ වන කොට දැඩි අපහසුතාවට පත් වෙලා ඉන්නවා. මොකද, ඒවා එළියට ගත්තු දවසට මොනවා වෙයිද කියලා කියා ගන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා අපි මේ ආනයන අපනයන සම්බන්ධයෙන් වන පනත්, රෙගුලාසි වෙනස් කරනවාට වඩා රට තුළ තිබෙන නීතියට අනුව කටයුතු කරන්න ඕනෑ. අද රට තුළ නීතියක් තිබෙනවා නේ. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය -එස්එල්එස් සහතිකය ලබා දෙන ආයතනය- තිබෙනවා. ඒවා තිබියදී තවත් දේවල් සංශෝධනය කරන්නේ නැතුව අපි අපේ රටේ ඉන්න දේශීය ව්‍යාපාරිකයා ආරක්ෂා කරන්න ඕනෑ.

අද ඇහලුම් ක්ෂේත්‍රය ගත්තත්, මේ ප්‍රශ්නයම තමයි ඇති වෙලා තිබෙන්නේ. ඇහලුම් ක්ෂේත්‍රයට අදාළව පිට රටින් ආනයනය කරන ද්‍රව්‍ය නිදහස් කරන්න ගියාම විශාල ගැටලුවලට මුහුණ පාන්න සිදු වෙනවා. Online register වෙන්න කියනවාලු. Online register වෙන්න ගියාම system එක down යනවාලු. අදාළ නිලධාරීන් ඒ ගැන කථා කරන්නේ නැහැලු. මොකක්ද මේ කරන්නේ? රටේ විදේශ විනිමය ඉහළ නංවන්න ඕනෑ නම්, දේශීය ව්‍යාපාරිකයා ශක්තිමත් කරන්න ඕනෑ නම් බදු පිට බදු පටවලා හරියන්නේ නැහැ නේ.

ජනාධිපතිතුමා කියනවා මම දැක්කා, "අපි කිසිම බද්දක් වැඩි කරලා නැහැ" කියලා. ඒක හරි පුදුම කථාවක් නේ. බදු අය කරන්න ඕනෑ. ව්‍යාපාරිකයෙක් වුණාම රජයට බදු ගෙවන්න ඕනෑ. ඒකේ තර්කයක් නැහැ. ව්‍යාපාරිකයා බැඳිලා ඉන්නවා, රජයට බදු ගෙවන්න. හැබැයි, ජනාධිපතිතුමා කියනවා, බදු ගහලා නැහැ කියලා. ජනාධිපතිවරයා එකක් කියනවා; ඇමතිවරයා තව එකක් කියනවා. ව්‍යාපාරිකයෝ බලාගෙන ඉන්නවා, තමන් වෙනුවෙන් රජය මොකක්ද කරන්නේ කියලා. ව්‍යාපාරිකයන්ට කිසිම සහනයක් ලබා දීලා නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විශේෂයෙන්ම කුළු බඩු ආනයනය කරන අයට මේක විශාල ප්‍රශ්නයක්. ඒ වාගේම තමයි කහ නිෂ්පාදනය. දේශීයව කහ නිෂ්පාදනය කරන ගොවියා ශක්තිමත් කරන එක හොඳයි. හැබැයි, එක පාරටම රෑයක් එළි වන කොටම පිට රටින් කහ ආනයනය කරන එක නවත්වා තිබෙනවා. අපේ රටේ ඉල්ලුමට සරිලන්න දේශීය කහ ගොවියාට කහ නිෂ්පාදනය කරන්න පුළුවන්ද බැරිද කියන එක රජය සොයා බලන්න ඕනෑ. කහ වගා කරන්න ඕනෑ කියලා මුලදී කිව්වා. අද අපට දන්ත ලැබී තිබෙනවා. කහ කිලෝ එකක් ඉස්සර තිබුණේ රුපියල් 1,800ක් වාගේ මිලකට. දැන් එය රුපියල් 5,800ක් වෙලා තිබෙනවා. හැබැයි, රුපියල් 5,800කටවත්

[ගරු කිංස් නෙල්සන් මහතා]

අවශ්‍යතාවකට කහ නිෂ්පාදනය කරන්න අපට බැරි වෙලා තිබෙනවා. කහ කියන්නේ, කෑමවලට එකතු කරන දෙයක් විතරක් නොවෙයි. අපි දැකලා තිබෙනවා, ලෙඩක් හැදුණත් කහ පාවිච්චි කරනවා. ඒ වාගේම පිරිසිදු කටයුතු සඳහාත් අපි කහ පාවිච්චි කරනවා. නමුත්, අද රටේ අවශ්‍යතාවට කහ සපයා ගන්න බැරි වෙලා තිබෙනවා. ඉතින් ඒකට හේතුව මොකක්ද? අදාළ අමාත්‍යාවරයාට මා කියන්නේ කහ වගා කරන ගොවීන් හඳුනාගෙන රජය විධියට ඒගොල්ලන්ට දෙන්න පුළුවන් උදව්ව, සහනය මොකක් කියලා බලලා ඒවා ලබා දෙන්න කියලායි. ඒ විධියට කහ වගාව වැඩි කර ගත්තොත් හොඳයි කියන එක තමයි මා සඳහන් කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයටත් අත්‍යවශ්‍ය භාණ්ඩ ගැන ඇතුළත් වුණා. එකී අත්‍යවශ්‍ය භාණ්ඩ තමයි පාසල් උපකරණ, බෙහෙත්හේත්, කෘෂි උපකරණ ආදි දේවල්. මේ හැම එකකටම සියයට 18ක VAT එකක් පනවා තිබුණා. ඔබතුමන්ලා බලයට එන්න කලින් දිගින් දිගටම කියපු දේ තමයි මා ඒ කියපු අත්‍යවශ්‍ය භාණ්ඩවල VAT එක බින්දුවට ගේනවා කියන එක. ඉතින්, තවම එය බින්දුවට ගෙනැල්ලා නැහැ නේ. එහිදී ඔබතුමන්ලා කිව්වා පාසල් දරුවන්ගේ පොත්පත් ඇතුළු පාසල් උපකරණ ගැනත්. ඔබතුමන්ලා පාසල් දරුවන් වෙනුවෙන් වෙනත් වැඩ පිළිවෙළක් කරගෙන යනවා. හැබැයි ඔබතුමන්ලා කිව්වා, පාසල් උපකරණවලට තිබෙන සියයට 18 VAT එක ඉවත් කරනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෙදරක දරුවන් දෙන්නෙකු ඉස්කෝලේ යනවා නම් ඒ තාත්තාටයි අම්මාටයි ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙනවා, ඒ දරුවන්ට අවශ්‍ය කරන පොත්පත් ටික, පාසල් උපකරණ ටික අරගෙන දෙන්න ගියාම. පාසල් උපකරණවලට තිබෙන සියයට 18 VAT එක බින්දුවට ගේනවා කිව්වා. ඒවා කියපු නිසාමයි ජනතාව ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ. මම දන්නේ නැහැ ඒවා කරන්න පුළුවන්ද, බැරිද කියලා. හැබැයි එහෙම කිව්වා. දැන් ඒවා කරන්න බැරි නම්, "මට මේක කරන්න බැහැ, රජයට අමාරුයි, රටට අමාරුයි" කියලාවත් අඩුම ගාණේ කියන්න.

කෘෂි උපකරණ ගත්තත් ඒ වාගේමයි. අද කෘෂි උපකරණවල මිල තුන්ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. ට්‍රැක්ටරයකට අවශ්‍ය ටයර්වල මිල, මැෂින්වලට අවශ්‍ය උපකරණවල මිල තුන්ගුණයකින් වැඩි වෙලා. එදා ඔබතුමන්ලා ගොවි ජනතාව කැඳවා කිව්වා කෘෂි උපකරණවලට දාලා තිබෙන VAT එක සියයට බින්දුවට ගේනවා කියලා. ඒ වාගේම කිව්වා, බෙහෙත් හේත්, අප එදිනෙදා ආහාරයට ගන්නා දේවල් ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩවල VAT එක සියයට බින්දුවට ගේනවා කියලා.

ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමාටත්, පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන මටත් -අපි දෙන්නාටම - තිබෙන්නේ එකම ප්‍රශ්නය. අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා පසුගිය සති අන්තයේ පොළොන්නරුවේ හිටියේ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හැම ගමක් ගාණේම ගිහිල්ලා එතුමා ජනතාව සමඟ කථා කළා. එතුමා ඇත්ත තත්ත්වය දැක්කා. ඒ මිනිස්සු කිව්වේ අපට ජීවත් වෙන්න අමාරුයි කියලා. අපි දේශපාලන පක්ෂ, පාටවලින් තොරව හැම දෙනාම හම්බ වුණා. ඒ හැමෝම කියන කථාව තමයි ජීවත් වෙන්න අමාරුයි කියන එක.

වී මිල දිහා බලන්න. අද වීවලට මිලක් නැහැ. රජය කියනවා, කෘෂිකර්ම ඇමතිතුමාම කියනවා වී කිලෝ එකක් නිෂ්පාදනය කරන්න රුපියල් 137ක් යනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kins Nelson, you have two minutes left.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
හොඳමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

රජය සහතික මිලක් ලබා දීලා තිබෙනවා රුපියල් 120ක. රජය පිළිගන්නවා වී කිලෝ එකක් නිෂ්පාදනය කරන්න රුපියල් 137ක් යනවා කියලා. නමුත් සහතික මිලක් දීලා තිබෙනවා රුපියල් 120ක. එතකොට එළියේ වී මිල දී ගන්නේ කීයටද? අද එළියේ වී කිලෝ එක මිල දී ගන්නේ රුපියල් 85ට, 90ට. අපි මේවා කියන කොට ඇමතිවරු නැඟිටලා කියනවා, "බොරු කියන්න එපා" කියලා. ඉතින් මේක හරි ප්‍රශ්නයක් නේ. රටේ ජනතාව ඇත්ත දන්නවා. ගම්වලට ගිහින් බලන්න. ගොවි ජනපදවල ඉන්න මන්ත්‍රීවරු, ඇමතිවරු දන්නවා මේකේ ඇත්ත තත්ත්වය මොකක්ද කියලා. මේ ප්‍රශ්න විසඳීම කරන්නේ නැතිව පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා රටේ ජනතාවට බොරු කියලා වැඩක් නැහැ නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ ප්‍රශ්නය ගැන දිගින් දිගටම කියනවා. දිගින් දිගටම කිව්වත් මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්නේ නැහැ. එක බොරුවක් වහ ගන්න බොරු සීයක් කියනවා.

අද කන්න 2ක වී අපේ ගෙවල්වල තිබෙනවා. එම වී විකුණා ගන්න විධියක් නැහැ. මහ කන්නය කරන්න වතුර දීලා මඩ වැඩ දැන් පටන් අරගෙන තිබෙනවා. මා අහන්න කැමැතියි, පොහොර ගෙන්වන්න මොකක් හෝ වැඩ පිළිවෙළක් දැන් තිබෙනවාද, පොහොර සහනාධාරය කවදාද දෙන්නේ, ගොවියා වෙනුවෙන් මහ කන්නයේ අනුගමනය කරන වැඩ පිළිවෙළ මොකක්ද කියලා.

"දිවිවා" සුළි කුණාටුවෙන් හානියට පත් වුණු, ලෝක උරුමයක් විධියට නම් කළ පොළොන්නරුවේ ඇළහැර අමුණ හදනවාද? මොකක්ද ඒකට වෙලා තිබෙන්නේ? ඒක හදන්න පටන් අරගෙන තිබෙනවාද? තවම වැලි කොට්ට ගහලායි තිබෙන්නේ. අප මේවා ගැන මේ සභාවේ කථා කරන්නේ නැතිව වෙන කොහේ කථා කරන්නද? අප මේවා ගැන කථා කරන කොට ආණ්ඩුව කියන්නේ "මේවා ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ වෙච්ච දේවල්" කියලායි. අපේ ආණ්ඩු කාලයේ එහෙම වුණේ නැහැ. අපේ ආණ්ඩු කාලයේ වැඩ කළා. අවුරුදු 30කින් නිම කරන්න තිබුණු මහවැලි ව්‍යාපාරය කඩිනම් මහවැලි ව්‍යාපාරය යටතේ අවුරුදු 5කින් නිම කළා. ඒ කාලයේ මේ රටේ පංච මහා ජලාශ හදපු පක්ෂයක් අපි. ඒ කාලයේ එහෙම දේවල් කළා. මා නියෝජනය කරන පොළොන්නරුවේ මාදුරුඔය ව්‍යාපාරය පිහිටුවා පවුල් 50,000ක් පදිංචි කළා. පවුල් 50,000ක් පදිංචි කරලා ඒ පදිංචි කළ මිනිසුන්ට මාස 18ක් කන්න බොන්න දුන්නා, ට්‍රැක්ටර් දුන්නා; අපි ඒවා කළා. ඉතින් අපට ඇඟිල්ල දිගු කළාට වැඩක් නැහැ. අපි මේවා කියන්නේ ඇයි? ඔබතුමන්ලා බොහෝ දේවල් කරනවා කියලායි බලයට පත් වුණේ. අද රටේ ජනතාව බලාගෙන ඉන්නවා ඒවා එකින් එක ඉටු කරන්නේ කවදාද කියලා.

ලෝකයේ යුද්ධයක් තිබෙනවා තමයි. ලෝකයේ යුද්ධයක් තිබුණාට, එදා ඔබතුමන්ලා බලය ගන්න කලින් මේවා දැක්කේ නැද්ද? ලෝකයේ යුද්ධ කියන ඒවා ඇති වෙනවා. ඇයි එහෙම නම් කිව්වේ, මේ මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කරන්න බැරි දේවල් කරනවාය කියලා? ඔබතුමන්ලා එහෙම කිව්වා නේ. දැන් මිනිස්සු ඔබතුමන්ලා කෙරෙහි දැඩි විශ්වාසයකින් ඉන්නවා, ඒ දේවල් කරයි කියලා. ඔබතුමන්ලාට ඡන්දය දුන් උදවියගෙන්

ඔබතුමන්ලාගේ අර සියයට 3 පදනමේ අය බොහොම සතුටින් ඉන්නවා. හැබැයි, ඒ සියයට 42 හදන්න එකතු වෙච්ච අනෙක් අය අද බොහොම අසතුටින් ඉන්නවා, අපි රැවටුණා කියලා. මේක තමයි ඇත්ත කථාව. මේක හැම තැනම තිබෙන කථාවක්. ඔබතුමන්ලාගේ හිටපු කණ්ඩායම වාගේ පිරිසක් අපටත් ඉන්නවා. ඒ වාගේ සියයට ගණනක් අපෙත් ඉන්නවා, අපි වැරදි කළත්, හොඳ කළත් "අනේ හොඳයි" කියලා කියන අය. ඒ වාගේ අය ඔබතුමන්ලාටත් ඉන්නවා. හැබැයි, මම විශේෂයෙන්ම කියනවා, මේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන රෙගුලාසි ගෙනෙන්න කලින් අවශ්‍ය දේවල් කරලා, අපේ දේශීය ව්‍යාපාරිකයා ශක්තිමත් කරන්න කියලා.

දැන් කන්ටේනර් 100ක් සති 3ක් තිස්සේ හිර කරගෙන ඉන්නවා. ඒ ගැන හොයන්න, ඇමතිතුමනි. හොයලා ඒවාට කඩිනම් විසඳුම් ලබා දෙන්න කියමින්, මට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Asitha Niroshana Egoda Vithana. You have nine minutes, Hon. Member.

[අ.භා. 1.21]

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කර තිබෙන රෙගුලාසි අනුමත කිරීම සඳහා තමයි අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ. මීට කලින් කථා කරපු අපේ හිතවත් ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, ලෝක යුද්ධයක් වාගේ දෙයක් ඇයි පුරෝකථනය කළේ නැත්තේ කියලා. අපි දන්නේ නැහැ, පළමු ලෝක යුද්ධය සහ දෙවන ලෝක යුද්ධය ආරම්භ වෙද්දී කලින් කාවද දැනුවත් කළේ කියලා. ඒ වාගේම, මෑතක සිට තිබෙන මැද පෙරදිග යුද්ධයත් ඊට කලින් කාට හෝ කථා කරලා කියලා ද පටන් ගත්තේ කියලා මම දැන ගන්න කැමැතියි. එක්කෝ එතුමා අර ඥානා අක්කා පොළොන්නරුව කිට්ටුව ඉන්න නිසා පොඩ්ඩක් ඇයගෙන් අහලා දැනගෙන කලින් කිව්වා නම් අපට දැනුවත් වෙන්න තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ ඇති වන තත්ත්වයන් එක්ක තමයි අපට මහ ජනතාවගේ අවශ්‍යතා කළමනාකරණය කරන්න සිද්ධ වෙන්නේ. ඒවා සිදු වෙනවාද කියා අපට පුරෝකථනය කරන්න අමාරුයි. ඒ නිසා අපි විශ්වාස කරනවා, ඉදිරියේදී රටත්, ලෝකයත් ශුභ වාදී දිශාවට ගමන් කරයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා සඳහන් කළා, පෞද්ගලික ව්‍යාපාරිකයන් විසින්, වේළපු මිරිස් විශාල ප්‍රමාණයක් ලංකාවට ආනයනය කර තිබෙනවා, ඒවා වෙළෙඳ පොළට දමන්නේ නැතිව රඳවා තබා ගෙන ඉන්නවා කියලා. අද දවසේ අපි ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඉදිරිපත් කරන මේ රෙගුලාසි වැදගත් වන්නේ ඇයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මහජනතාවට ඉතා ඉහළ ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ ලබා දෙන්නේ කොහොමද කියන එක තමයි අපේ ආණ්ඩුව මේ රෙගුලාසිවලින් අපේක්ෂා කරන්නේ. ඒ නිසා ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමාට මම කියන්න කැමැතියි, ඒ වේළපු මිරිස් තොගය වෙළෙඳ පොළට නිදහස් කිරීම ප්‍රමාදවීමට බලපා තිබෙන ප්‍රධාන කාරණය, ඒවා ප්‍රමිතියෙන් තොර වීම කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාරණය නිසා තමයි යම් ප්‍රමාදයක් මතුව තිබෙන්නේ. අදාළ පර්යේෂණාගාර වාර්තා එක්ක තමයි ඒ තීන්දුව අරගෙන තිබෙන්නේ. තවමත් ඒවා වෙළෙඳ පොළට නිකුත් කිරීම පිළිබඳව තීරණයක් අරගෙන නැහැ. තවමත් ඒක process එකේ තිබෙන්නේ. නමුත්, ඔබතුමාට මතක ඇති, මීට කලින් සමහර ආහාර වර්ගවල කෘමි නාශක අඩංගු වෙලා තිබුණු බව. ඒවා විනාශ කරන්න අපි කටයුතු කළා. ඒ වාගේම තමයි, පසුගිය ආණ්ඩු කාලවල විෂ අඩංගු පොල් තෙල් ආනයනය කර තිබුණා. ඒවා පිළිකාකාරක අඩංගු පොල් තෙල්. පසුගිය පාලන කාලය තුළ ඒවා වෙළෙඳ පොළට නිදහස් කරලාත් තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි වග කියන්නේ ජනතාවට. ඒ නිසා පෞද්ගලික ව්‍යාපාරිකයන් වෙනුවෙන් පෙනී ඉන්න එපා, මහජනතාව වෙනුවෙන් පෙනී ඉන්න කියලා ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, මේක ආණ්ඩුව ඉතාම තදින් ආහාරවල ප්‍රමිතිය ආරක්ෂා කරන්න කටයුතු කරමින් සිටින වෙලාවක්. ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත යටතේ රෙගුලාසි අද ගරු සභාවට ඉදිරිපත් කරන්නේ.

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත විශේෂයෙන්ම ගෙනැල්ලා තිබෙන්නේ, ප්‍රමිතියෙන් සහ ගුණාත්මකභාවයෙන් යුතු භාණ්ඩ වර්ග ආනයනය සහ අපනයනය කිරීම සඳහායි. මෙම පනත යටතේ 2024.05.17 අංක 2384/35 කියන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් භාණ්ඩ වර්ග 161ක් සඳහා ආනයනයේදී ප්‍රමිතිකරණය සහ ගුණාත්මකභාවය තහවුරු කිරීමට අදාළ රෙගුලාසි හඳුන්වා දීලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊට අමතරව තමයි අද දවසේ අපි 2508/27 කියන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ත්‍රිරෝද, මෝටර් රථ සඳහා වන වායු පිරවූ ටයර් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති 1347 යටතේ සහ මගී මෝටර් රථ ටයර් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති 1212 යටතේ වන පිරිවිතර ඉදිරිපත් කරන්න කටයුතු කර තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ත්‍රිරෝද රථ ටයර් සම්බන්ධයෙන් සමාජයක් විධියට අපට යම් අවබෝධයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගී මෝටර් රථ සඳහා භාවිත කරන ටයර් වර්ග passenger car tyres කියලා අපි හඳුන්වනවා. පොදුවේ ගත්තාම, සාමාන්‍ය ප්‍රවාහනයේදී භාවිත කරන වාහන තමයි මේ මගී මෝටර් රථ කාණ්ඩයට අදාළ වෙන්නේ. අපි දන්නවා, දොර 4 සහිත, ඉදිරිපස එන්ජිම සහ පිටුපස ඩිකිය සහිත sedan වර්ගයේ වාහන තිබෙන බව. ඒ වාගේම දොර දෙක සහිත, sporty වර්ගයේ, පිටුපස වායු ගතිකත්වය අඩු, angle එක සහිත coupe වර්ගයේ වාහන වර්ග තිබෙනවා. ඒ වාගේම මේ කාණ්ඩයට අයිති hatchback වාහන වර්ග තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ කියන්නේ, පිටුපස ඩිකිය නොමැති අඩු ඉඩකඩක් සහිත වාහන වර්ග. ඒ වාගේම තමයි SUV රථ තිබෙනවා. ඒ කියන්නේ jeep model එක තිබෙන, පොළොව සහ වාහනය අතර ඉඩකඩ වැඩි, sporty වර්ගයේ වාහන. ඒ වාගේම තමයි මේ කාණ්ඩයට අයිති, jeep model එක සහිත, ඉඩකඩ වැඩි crossover කියන වාහන වර්ග තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ත්‍රිරෝද රථත් එක්ක මෙන්න මේ කියන වාහන වර්ගවලට භාවිත කරන ටයර් සඳහා තමයි අද දවසේ අපි පාර්ලිමේන්තුවට ප්‍රමිති පිරිවිතර ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් මගී මොටර් රථවල තිබෙන ප්‍රධානම ලක්ෂණය තමයි මගීන් සුළු ප්‍රමාණයක් ගමන් කිරීම. ඒ වාගේම එහි වේගය සහ සුවපහසුව වැදගත් වෙනවා. එම නිසා ධාවනයේදී ඇති වන ඝර්ෂණය අඩු වීම එම මගී මෝටර් රථ සඳහා භාවිත කරන ටයර්වල තිබිය යුතු ප්‍රධානම ලක්ෂණයක්. ඒ කියන්නේ ශබ්දය අඩුයි, ඝර්ෂණය අඩුයි. ඒ වාගේම දිගු කාලයක්, දිගු දුරක් ධාවනය කිරීමත් එම ටයර් වර්ගවලින් අපේක්ෂා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාල පරිච්ඡේදය තුළ මෙම ත්‍රිරෝද රථ කාණ්ඩය සහ මගී මෝටර් රථ සඳහා ටයර්

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

විශාල ප්‍රමාණයක් ලංකාවට ආනයනය කරලා තිබෙනවා. එසේ ආනයනය කරන ලද ටයර් වර්ගවල ප්‍රමිතිය පිළිබඳව පසුගිය කාලයේ බරපතළ ගැටලු මතු වෙලා තිබුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, පෞද්ගලික අංශය ටයර් ආනයනය විශාල වශයෙන් සිදු කරනවා. ඔවුන් ලාභය මත පදනම්ව තමයි ඒ දේවල් කරන්නේ. එම නිසා නිසි ප්‍රමිතියෙන් යුතු ටයර් වර්ග වාගේම, ප්‍රමිතියෙන් තොර ටයර් වර්ගත් පසුගිය කාලයේ විශාල වශයෙන් ආනයනය කර තිබෙනවා. මෙම මගී මෝටර් රථ සහ ත්‍රිරෝද මෝටර් රථවල ද, එම රථවල ගමන් කරන මගීන්ගේ ජීවිත ආරක්ෂාව වෙනුවෙනුත් - පොදුවේ ගත්තොත් මිනිස් ජීවිත ආරක්ෂාව වෙනුවෙනුත් - තමයි එම ටයර්වලට අදාළ කරන ප්‍රමිතිය ඉදිරිපත් කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2023 වර්ෂයේදී මගී මෝටර් රථ කාණ්ඩයට අදාළ වාහනවලට අවශ්‍ය කරන ටයර් මිලියන 7,116ක් ආනයනය කරලා තිබෙනවා. ඒ වාගේම 2023 වර්ෂයේදී ත්‍රිරෝද රථ සඳහා ටයර් මිලියන 16ක් ආනයනය කරලා තිබෙනවා. අවසන් වශයෙන් ගත්තොත්, 2025දී මෝටර් රථ සඳහා ටයර් මිලියන 6,836ක් ආනයනය කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒවායේ ප්‍රමිතිය පිළිබඳව බරපතළ ගැටලුවක් තිබෙනවා. ඒ නිසා තමයි මගීන්ගේ ජීවිත ආරක්ෂාව වෙනුවෙන් අපි මේ රෙගුලාසි මඟින් ප්‍රමිති පිරිවිතර ඉදිරිපත් කරලා තිබෙන්නේ. මෙහිදී අපේ මූලික අරමුණ තමයි ටයර්වල ගුණාත්මකභාවය තහවුරු කිරීමත්, පාරිභෝගික සුරක්ෂිතභාවය සහතික කිරීමත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ දේශීය නිෂ්පාදකයන් විශාල ප්‍රමාණයක් - සමාගම් ගණනාවක් - ටයර් නිෂ්පාදනය කරනවා. කෙනෙක් බාල වර්ගයේ ටයර් ගෙනාවාට පස්සේ වෙන්නේ අපේ දේශීය නිෂ්පාදකයාට අපේ වෙළෙඳ පොළ ඇතුළේ තරග කිරීමේ හැකියාව අහිමි වීමයි. එම නිසා ඒකත් මෙහි අමතර කාර්යයක් විධියට තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොදුවේ ගත්තාම ආණ්ඩුවේ වගකීම බවට පත් වන්නේ අපේ රටේ ආර්ථිකය ක්‍රමානුකූලව, ක්‍රමිකව ශක්තිමත් කරමින්, අපේ රටේ ජීවත් වන ජනතාවගේ ජීවිත ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කිරීමයි. ඔබතුමා දන්නවා, දැන් රෝහල්වල බාල බෙහෙත් තිබෙන බවට කථාවක් නැහැ කියලා. මොකද, මීට කලින් පැවති අණ්ඩු තමයි මහජනතාවගේ ජීවිත තුට්ටුවට දාලා බාල බෙහෙත් ගෙන්වලා මිනිසුන්ගේ ජීවිත නැති කළේ, ඇස් අන්ධ කළේ. නමුත්, අද රෝහල්වල බාල බෙහෙත් තිබෙන බවට කථාවක් නැහැ. මොකද, අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමිතිය ඉහළ නංවා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ඔබතුමා දන්නවා, පාසල් තුළින් දරුවන්ගේ ආහාර රටාව වෙනස් කිරීම සඳහා අපි පසුගිය කාලයේදී පාසල් දරුවන්ගේ ආහාර සම්බන්ධයෙන්, පාසල්වල කැන්ටීන් සම්බන්ධයෙන් විශාල තීන්දුවක් ගත් බව. ඒ වාගේම මගී ප්‍රවාහන සේවය ගත්තොත්, ත්‍රිරෝද රථ, පාසල් බස් රථ සහ කාර්යාල සේවා වැනි බස් රථ ජාතික ගමනාගමන කොමිෂන් සභාව යටතේ නියාමනය වීමක් තිබුණේ නැහැ. මීට මාස ගණනාවකට කලින් අපි ඒවා නියාමනය කරන්න අදාළ කරන ප්‍රමිතීන් ඉදිරිපත් කළා. මොකද, ආණ්ඩුව විසින් දරුවන්ගේ සහ කාර්යාල සේවා බස් රථ භාවිත කරන මිනිසුන්ගේ ජීවිත ආරක්ෂා කළ යුතු නිසා. ඒ වාගේම ඔබතුමා දන්නවා, අපි මෙට්‍රෝ බස් ව්‍යාපෘතියත්, දුම්රිය විද්‍යුත්කරණ වැඩසටහනකුත් ක්‍රියාත්මක කරමින් තිබෙනවා කියන එක.

මේ හැම දෙයක්ම කරන්නේ, අපේ රටේ ජනතාවගේ ජීවිත උසස් කරන්න, ඔවුන් ආරක්ෂා කරන්න, ඔවුන් සුරක්ෂිත කරන්න, හෙට දවසේ ඔවුන්ට ලස්සන ජීවිතයක් ලබා දෙන්නයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Kins Nelson?

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 86(අ) යටතේයි මා මෙම රීති ප්‍රශ්නය අහන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Make it very brief, Hon. Kins Nelson.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කළ අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, මම ලෝක යුද්ධයේ ඉස්සරහ දකිනවාද මොකක්ද කථාවක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක පැහැදිලි කරන්න ඕනෑ. මට මතකයි ගරු ජනාධිපතිතුමාත් කිව්වා, "එහේ හවින් යනකොට ලංකාවට උණ ගැනෙනවා නම් මොකටද රජයන්?" කියලා. යුද්ධයක් තිබුණත්, නැතත් ඔබතුමන්ලා මේ හැම එකකටම විසඳුමක් දෙනවා කියලා නේ කිව්වේ. ඒ විසඳුම ලබා දෙන්න බැරි වනකොට අපට චෝදනා කරන්න එපා. ඔබතුමන්ලා කිව්ව දේවල් තමයි මම පැහැදිලි කරලා දුන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, we noted that.

We will move on to the next speaker. The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne, you have 12 minutes. The Floor is yours.

[අ.භා. 1.31]

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ඉදිරිපත් කර තිබෙන 2026 අංක 8 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මඟින් මගී මෝටර් රථ සහ ඒවාට ඇතුළත් වන ටයර්

සම්බන්ධ ප්‍රමිතිය පිළිබඳව පාර්ලිමේන්තුවේ විවාද කරනවා. ඇත්තටම මෙහිදී අපි හඳුනාගන්න අවශ්‍යයි, මේ රෙගුලාසි පනවා තිබෙන්නේ මොනවාටද කියලා. මොකද, මහජන සෞඛ්‍යය, ජාතික ආර්ථිකය සහ පරිසරය සුරක්ෂිත කිරීමේ අරමුණින් ඕනෑම භාණ්ඩයක් ආනයනය කරද්දි ප්‍රමිතිය ගැන අපි වඩාත් සැලකිලිමත් විය යුතුයි කියලා මා හිතනවා. කලින් මන්ත්‍රීතුමාත් කිව්වා, වරායේ තිබෙන මිරිස් සම්බන්ධ ප්‍රශ්නයක්. අපි දන්නවා, එහි ප්‍රමිතිය සම්බන්ධ ගැටලුවක් නිසා තමයි ඒ ප්‍රමාදය ඇති වෙලා තිබෙන්නේ කියලා. මොන ප්‍රමාදයක් වුණත්, ප්‍රමිතියෙන් අඩු බෙහෙත්වත්, ප්‍රමිතියෙන් අඩු ආහාරවත්, ප්‍රමිතියෙන් අඩු භාණ්ඩවත් ලංකාවට ගෙනෙන්න ඉඩ දෙන්නේ නැහැ කියන ස්ථාවරයේ තමයි අපි ඉන්නේ. ඒ වාගේම ටයර් සම්බන්ධ ප්‍රතිපාදන ගෙන එද්දි දේශීය නිෂ්පාදකයින්ට සාධාරණ සහ තරගකාරී පසුබිමක් සහතික කිරීමත්, පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීමත් තමයි එහි අරමුණ වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට අමතරව, රුපියල් බිලියන 47ක පරිපූරක ඇස්තමේන්තුවක් අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් වනවා. එහි අරමුණ තමයි, මැද පෙරදිග පවතින යුද්මය වාතාවරණය හේතුවෙන් ඇත්තටම බලපෑමට ලක් වූ ජනතාවට සහන සැලසීමේ වැඩසටහන යටතේ ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් මාස සඳහා සුපිරි ඩීසල් හැර ඔටෝ ඩීසල් සහ කාර්මික ඩීසල් ඉන්ධන සඳහා මිල සහනාධාරයක් ලබා දීම. ඒ වාගේම අස්වැසුම වැඩසටහන යටතේ ලියාපදිංචි අන්ත දිළිඳු සහ දුප්පත් කාණ්ඩවල පවුල් වෙත අමතර දීමනාවක් මේ මාස දෙක ඇතුළත ලබා දීම. "දිවිවා" ව්‍යසනයෙන් විපතට පත්වූවන්ට සහන සැලසීම සඳහා 2026 වර්ෂයේ විවිධ මුදල් වෙන් කිරීම් කෙරුණා. එහිදී උපයෝජනය නොවූ බව හඳුනාගෙන ඇති මුදල් තමයි මේ අලුත් ප්‍රතිපාදනයට වෙන් කරලා තිබෙන්නේ. අපේ කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා ඇහුවා නේ, ලෝකයේ යුද්ධයක් පවතිනකොට ඒකට ක්‍රියාපටිපාටියක් ගන්න ආණ්ඩුවට බැරි නම් මොකටද ආණ්ඩු කියලා. ඒ ක්‍රියාපටිපාටිය තමයි මේ ගන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

මේ මොහොතේ අපට බලපෑම් ඇති වෙලා තිබෙන යුද්ධය මොකක්ද? ලංකාවේ සමහරු හැසිරෙන්නේ ලෝකයේ මේ වාගේ භයානක තත්ත්වයක් වර්තමානයේ නැහැ වාගේ නේ. මේ සමහර මිනිසුන්ට මෙහි බරපතළකමක් දැනෙන්නේ නැහැ. ලෝකයේ දිගටම තෙල් පෝලිම් තිබෙනවා. ලෝකයේ සියලුම තෙල්වල මිල ඉහළ යමින් පවතිනවා. Supply chain එක කඩා වැටිලා තිබෙනවා. බොහෝ රටවල උද්ධමනය ඉහළ යනවා. මම දැක්කා, පසුගිය දවස්වල යුරෝපය විසින් ආහාර සුරක්ෂිතතාව පිළිබඳ guidelines කිහිපයක් නිකුත් කරලා තිබෙනවා. මේ වාගේ විවිධාකාර සිදුවීම්වලට ලෝකයේ රටවල් මේ මොහොතේ මුහුණ දෙමින් ඉන්නවා. හැබැයි, ලංකාවේ විපක්ෂය හැසිරෙන්නේ ඇත්තටම එහෙම දෙයක් ලෝකයේ සිදු නොවනවා හා සමානවයි.

ජනතාවටත් අඩු වැඩි වශයෙන් මේ කියන narrative එක කියමින් - ඒ කියන්නේ ලෝකයේ මොකුත් බරපතළ දෙයක් මේ මොහොතේ සිද්ධ නොවෙයැයි සිතමින් - තමයි මේ සියලු තර්ක විතර්ක මේ අය ගෙන එන්නේ. ලංකාවේ බනිජ තෙල් මිල කියන එක වැදගත් වන්නේ ඇයි? කොහොමත් ලංකාවේ macroeconomic stability එකට ඍජුවම බලපාන දෙයක් තමයි, බනිජ තෙල් මිල. බනිජ තෙල් මිල ඉහළ යෑම නිසා උද්ධමනය වැඩි වනවා. ඒ නිසා ආහාරවල මිල ඉහළ යන්න පුළුවන්. ප්‍රවාහන ගාස්තු වැඩි වෙන්න පුළුවන්. එවැනි විවිධ හේතු නිසා අනෙකුත් සියලු බඩු භාණ්ඩවල මිලත් ඉහළ යෑම අපේ ජංගම ගිණුමටත් ඍජුවම බලපානවා. ඒ වාගේම අපි තෙල් ආනයනය කරන්න වැය කරන ඩොලර් ප්‍රමාණය වැඩිවන නිසා අපේ ජංගම ගිණුමට ඒකත් ඍජුවම බලපානවා.

මම උදාහරණයක් කියන්නම්. 2026 ජනවාරි ඉඳලා සැප්තැම්බර් වෙනකල් ලංකාව ඉන්ධන සඳහා එක්සත් ජනපද ඩොලර් බිලියන 4.49ක් වැය කරලා තිබෙනවා. හැබැයි, මේක 2025 වර්ෂය එක්ක සංසන්දනය කරලා බැලුවොත් - මෙබඳු වාතාවරණයක් නොතිබුණු කාලයේ - වැය කරලා තිබෙන්නේ එක්සත් ජනපද ඩොලර් බිලියන 2.96ක් පමණයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංසන්දනය කරලා බැලුවොත් ඇත්තටම මේක සියයට 51.5ක වැඩි වීමක්. මම ඒකයි කියන්නේ, external shocks කියන සමහර දේවල් පුරෝකථනය කරන්න බැහැ කියලා. අපි ජනවාරි, පෙබරවාරි, මාර්තු, අප්‍රේල් මාසවලදී හිතුවා, මේ තත්ත්වය අවුරුද්ද අන්තිමේදී කිසියම් ආකාරයකට සමනය වෙයි කියලා. නමුත්, අද වන විට ලෝකයම මේකට සූදානම් වෙමින් පවතින විධිය දැක්කාම පෙනෙන්නේ ලබන අවුරුද්දේත් මේ තත්ත්වයන් අපි කළමනාකරණය කර ගත යුත්තේ කොහොමද කියන එක පිළිබඳව හිතන්න ඕනෑ බවයි. ඒක හිතමින් තමයි අපි මෙවර අය වැයත් හදලා තිබෙන්නේ. ඒ අය වැය ලබන සතියේ ඉදිරිපත් කරනවා. මේ අවුරුදු දෙකේදී අපට තිබුණු ආර්ථිකය ස්ථාවර කර ගැනීම කියන ඉලක්කයෙන් ඔබබට ගිහිල්ලා, මේ ලෝක තත්ත්වයන් හමුවේත්, මෙබඳු අභියෝග හමුවේත් පරිවර්තනීය වෙනසක්, එහෙම නැත්නම් ආර්ථික වර්ධනයක් ඇති කර ගන්නේ කොහොමද කියන එක තමයි මේ අය වැයේ දී අපට තිබෙන අභියෝගය. අපි ඇත්ත කථා කරන්න ඕනෑය කියලා මෙතුමන්ලා හැම තිස්සේම කියනවා. ඒක තමයි ඇත්ත. ඒ ඇත්ත එක්ක තමයි අපි ජනතාවට මේ සහනය අරගෙන දෙන්නේ. එතකොට මේ බාහිර අංශයේ අවදානම් ගැන තමයි මම කථා කළේ. විශේෂයෙන් බාහිර කම්පන ගැන.

මේ බාහිර කම්පනත් එක්කම සංචාරක ව්‍යාපාරයේ ලොකු අඩුවීමක් දක්නට ලැබුණා, අවුරුද්ද මැද හරියේදී. හැබැයි, ඒක දැන් නැවතත් යථා තත්ත්වයට පත් වෙමින් යනවා. මේ නිසාම අපට විදේශ රටවලින් එන ආයෝජන අඩු වෙන්නත් පුළුවන්. එහෙම හැකියාවක් තිබෙනවා. ඒ වාගේම විදේශ ප්‍රේෂණ අඩු වෙන්නත් පුළුවන්. මොකද, මැද පෙරදිග කලාපයේ තිබෙන අසමතුලිතතා නිසා. නමුත්, සාපේක්ෂව ගත්තාම අපට හොඳ ප්‍රේෂණ ප්‍රමාණයක් තවමත් ලැබෙමින් පවතිනවා. අපි විශ්වාස කරනවා, බලාපොරොත්තු වනවා, මේ ප්‍රේෂණ ඉදිරියේදී - ලබන අවුරුද්දේ - හොඳම තත්ත්වයකට වැඩි කර ගන්න පුළුවන් වෙයි කියලා.

දැන් අපි මේ සහන ලබා දීලා තිබෙන්නේ කොහොමද? දැන් හැමෝම අහනවා නේ, ඇයි වරායෙන් ගොඩබාන මිලට තෙල් නොදෙන්නේ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවමත් ගොඩබාන මිලට වඩා අඩුවෙන් තමයි අපි තෙල් දෙන්නේ. මොකද, මේ ආණ්ඩුවෙන් යම් මුදලක් වෙන් කරලා තිබෙන්නේම ඒ සඳහායි. අද මම දැක්කා, Verité Research ආයතනය දත්ත සහිතව මේ සම්බන්ධව යම් ප්‍රකාශයක් නිකුත් කරලා තිබෙනවා. ඒගොල්ලන් කියනවා, මේක "still below the cost recovery formula" කියලා. ඒ කියන්නේ, අපි වියදම් කරන මුදලට වඩා අඩුවෙන් තමයි තවමත් ජනතාවට තෙල් දෙන්නේ. ඇත්තටම ඒක දීර්ඝ කාලීනව හොඳ තත්ත්වයක් නොවෙයි. නමුත්, අපට මුහුණ දෙන්න වෙලා තිබෙන අභියෝගය ඇතුළේ අපි ජනතාවට මේ පීඩනය එහෙමම තල්ලු කරන්නේ නැතිව කටයුතු කරන්න ඕනෑ. ආණ්ඩුවක් ඉන්නේ ඒකටනේ. අපි ඒක හැමදාම කිව්වා. මේ buffer එක තියාගන්න තමයි ආණ්ඩුව ඉන්නේ. ඒක තමයි මේ ආණ්ඩුවෙන් කරන්නේ. අපි ඔක්තෝබර් මාසය සඳහා රුපියල් බිලියන 15ක්, නොවැම්බර් මාසය සඳහා රුපියල් බිලියන 13.5ක් සහ දෙසැම්බර් මාසය සඳහා රුපියල් බිලියන 12.5ක් ඔටෝ ඩීසල් සහ කාර්මික ඩීසල් සඳහා සහනාධාර ලබා දෙන්න වෙන් කර දෙනවා.

[ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිදී අපි විශේෂයෙන් ඩීසල්වලට මුදල් වෙන් කර දෙන්නේ ඇයි? මොකද, ඩීසල් තමයි අපේ උද්ධමනය සඳහා වඩාත්ම බලපාන ප්‍රධාන ප්‍රවාහන සේවා සඳහා භාවිත වන්නේ. ඒ වාගේම මගී ප්‍රවාහනය සඳහා භාවිත වන්නේත් ඩීසල්. පොදු ජනතාව යන රථ වාහනවල වැඩි වශයෙන් ඩීසල් පාවිච්චි වන නිසාම තමයි අපි ඩීසල්වලට මේ සහනය නැවත වතාවක් ලබා දෙන්නේ, සුපර් ඩීසල්වලට දෙන්නේ නැතිව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට කියන්න තිබෙන කාරණාව මෙයයි. අස්වැසුම ගැන දැන් ලොකු වැරදි ප්‍රචාරයක් එළියේ අරගෙන යනවා, ලක්ෂ 14කගේ අස්වැසුම සහනාධාරය කපලා කියලා. සමහර මාධ්‍යයත් ඒකට දායක වෙලා තිබෙනවා. ඒක සම්පූර්ණ වැරදි වාර්තාවක්. ඒ ගැන මම කියන්නම්. මම හිතන්නේ උදේ වරුවේ විෂය භාර ගරු අමාත්‍යතුමාත් ඒ සම්බන්ධයෙන් සඳහන් කළා. නමුත්, මේ අවස්ථාවේ අපි මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන්නේ මේ නිසායි. කණ්ඩායම් 4ක් අස්වැසුම සඳහා සුදුසුකම් ලබමින් තිබුණා. ඒ කියන්නේ, අන්ත දිළිඳු, දුප්පත්, සංක්‍රාන්ති සහ අවදානම් සහගත කියන කාණ්ඩ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, මේ සංක්‍රාන්ති කණ්ඩායමට සහනාධාර ලබා දෙන කාලය ඉවර වෙන්න තිබුණේ 2024 දෙසැම්බර්වල බව. නමුත්, මේ කාලය අපි තවත් මාස 6ක් ඉස්සරහට ගෙනැල්ලා, තවත් මාස 4ක් එකතු කරලා 2025 අප්‍රේල් වෙනකල් දීර්ඝ කර සංක්‍රාන්තික කණ්ඩායම්වලට මේ සහනාධාරය ලබා දෙනවා. අවදානම් සහගත කණ්ඩායම්වල කාලය ඉවර වෙන්න තිබුණේ 2025 දෙසැම්බර්වල. ඒකත් නැවත වතාවක් 2026 ජූනි වෙනකල් දුන්නා. මේ දෙකම 2023 Aswesuma Programme එක සැලසුම් කරනකොට හදලා තිබුණු ඒවා.

අපි පිළිගන්නවා, මේ නිර්ණායකවල - criteria - ප්‍රශ්න තිබෙන බව. මේ නිර්ණායක අවුරුදු 2ක්, 3ක් test කරලා සමාජයේ පාවිච්චි කරලා බලන්න ඕනෑ. නමුත් ඒ යන්ත්‍රණය test කරන්නේ නැතිව, pilot project එකක්වත් කරන්නේ නැතිව එවකට හිටපු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා මැතිවරණයට කලින් මේක කර ගන්න ඕනෑ නිසා ඡන්ද ගුණ්ඩුවක් විධියට කලබලේ මේක පටන් ගත්තා. එතුමා කොහොමත් පැරදුණා. නමුත්, ඒකෙන් වෙච්ච damage එක දීර්ඝ කාලීනයි. ඒ නිසා තමයි අපි පසුගිය අවුරුදු දෙක ඇතුළත scientific විධියට, ඒ කියන්නේ සමාජ විද්‍යාත්මක, ආර්ථික විද්‍යාත්මක දත්ත අරගෙන මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහත්මයාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරලා, ඒ නිර්ණායක නැවත හදලා තිබෙන්නේ. ඉතා ඉක්මනින් එක දිස්ත්‍රික්කයක pilot test එකක් කරලා, ඇත්තටම cash transfers කරන්න ඕනෑ පවුල් මොනවාද කියලා හොයා බලා, මෙහි සමාලෝචනයක් කරලා, හරියටම ඒවා ලැබෙන්න ඕනෑ කණ්ඩායම් තෝරා ගන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම මෙහිදී දිගටම කියපු තවත් එක කාරණයක් තිබෙනවා. දැනට පුද්ගලයින් 980,000කට "අස්වැසුම" ප්‍රතිලාභ ලබා දීලා තිබෙනවා. ඒ list එක ඉදිරිපත් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාලෝචනයට යටත්ව මේ ප්‍රතිලාභය ලබා ගන්න තවත් 740,000ක් ඉන්නවා. ඒ කණ්ඩායම පිළිබඳව මේ වනවිට සමාලෝචනය කරමින් පවතිනවා. ජනවාරි, පෙබරවාරි වාගේ වනවිට ඒ කණ්ඩායමේ list එකත් හරියටම finalize කර ගන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. ඒ වාගේම මෙම ප්‍රතිලාභය නොලැබී ගිය කෙනෙකුට අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාවත් තිබෙනවා. ඒ නිසා අස්වැසුම ප්‍රතිලාභය කපා හැරලා කියන එක බොරු. ඒක මාධ්‍ය විසින් හදපු නිකම් දත්තයක් විතරයි. ඇත්ත දත්තය ගත්තොත්, සමාලෝචනය කරන්න තවත් පුද්ගලයින් 740,000ක් list එකේ ඉන්නවා.

කථාව අවසන් කරන්න පෙර තව කාරණයක් මම කියන්න කැමතියි. 2025දී තමයි අපි "රටම එකට" ජාතික මෙහෙයුම යටතේ "ඉවත් වෙනු" campaign එක පටන් ගන්නේ. ඒක ඇත්තටම පාතාලය, සංවිධානාත්මක අපරාධ මැඩලන්න වාගේම කුඩු මර්දනය කරන්න අපි ගත් එක දැවැන්ත ව්‍යාපෘතියක්. ඒ වාගේම ඒක අපි ජනතාවට දීපු පොරොන්දුවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වනවිට හමුදාව, පොලීසිය, නාවික හමුදාව, වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව ආදී වශයෙන් සියලු ආයතන සම්බන්ධ වෙලා මත්ද්‍රව්‍ය, කුඩු අතිවිශාල ප්‍රමාණයක් අල්ලනවා. ඒ වාගේම ඒවාට සම්බන්ධ පුද්ගලයින් පුනරුත්ථාපනය කරනවා. ජාත්‍යන්තර අපරාධ ජාලවලට සම්බන්ධ අපරාධකරුවන් රටු වරෙන්තු නිකුත් කිරීම මඟින් සහ වෙනත් ආකාරවලින් ලංකාවට ගෙනෙමින් පවතිනවා. අපි දිගටම ජනතාවට දීපු පොරොන්දුවක් තමයි දේශපාලනය, මත්ද්‍රව්‍ය සහ පාතාලය කියන අතිභයානක ජාලය කඩනවා කියන එක. දේශපාලනයට තිබුණු සම්බන්ධය අපි සම්පූර්ණයෙන්ම දැන් නතර කරලා තිබෙනවා. හිටපු දේශපාලනඥයින් නොවෙයි, අපේ ආණ්ඩු පක්ෂයේ ඉන්න අය තවදුරටත් මේ අපරාධ ජාල සමඟ සම්බන්ධකම් පවත්වන අය නොවෙයි කියන එක අපි ඔප්පු කරලා හමාරයි. එම නිසා ඒ සම්බන්ධයෙන් දැඩි නීති අවශ්‍යයි. අපි ඒ නීති හදමින්, නිසි ආකාරයට මේ සංවිධානාත්මක අපරාධ ජාලය මැඩලන්න නොබියව ක්‍රියා කරමින් ඉන්නවා. එහි වර්ෂ පූර්ණ සැමරුම හෙට තිබෙනවා. නැවත හැරී බලා මේ අත්කර ගත් ජයග්‍රහණය ගැන සලකා බලන්න, හිතන්න වාගේම අපේ රටේ අනාගතය ගැන සුබවාදීව බලන්න අපට මේක හොඳ අවස්ථාවක් කියලා මම හිතනවා. කථා කරන්න කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Elayathamby Srinath, please. You have eight minutes, Hon. Member.

[பி.ப. 1.44]

ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මහතා
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் இந்தச் சபையில் நடைபெறுகின்ற ஏற்றுமதி மற்றும் இறக்குமதி (கட்டுப்பாட்டு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்ற அதேநேரம், இன்றைய விவாதத் தலைப்புக்கு அப்பால் சென்று எமது மாவட்டத்தில் நிலவுகின்ற மிகவும் நெருக்கடியான பிரச்சினை சம்பந்தமாக கருத்துத் தெரிவிப்பதற்கு அனுமதிக்குமாறு கேட்டுக்கொள்கின்றேன்.

தற்போது மட்டக்களப்பு மாவட்டத்தின் மயிலத்தமடு - மாதவனை பகுதியில் ஏற்பட்டுள்ள பிரச்சினை பற்றி உங்கள் அனைவருக்கும் தெரியும். இப்பிரச்சினை சம்பந்தமாக எமது சக பாராளுமன்ற உறுப்பினர்களும் இந்தச் சபையில் உரையாற்றி இருந்தார்கள். அங்கு மிகவும் நெருக்கடியான சூழல் உருவாகிக்கொண்டு இருக்கின்றது. மயிலத்தமடு - மாதவனை பகுதி என்பது காலங்காலமாக மேய்ச்சல் தரையாகப் பயன்படுத்தப்பட்டு வந்த இடமாகும். பெரும்போக பயிர்ச்செய்கை செய்கின்ற காலங்களில் அந்த மேய்ச்சல்

தரைப் பகுதிக்கு மாடுகளைக் கொண்டு செல்வதற்கான அனுமதியை மட்டக்களப்பு மாவட்ட செயலகம் ஆரம்பக் கூட்டத்திலே பெற்றுக்கொடுப்பது வழமை. இந்த மேய்ச்சல் தரைக்கு கால்நடைகளைக் கொண்டுசெல்லும் நடைமுறை வருடாவருடம் அரசாங்கத்தின் அனுமதியுடனேயே இடம்பெற்று வருகின்றது. தற்போது இந்த நடைமுறையில் மாற்றத்தை ஏற்படுத்துவதற்காக இனவாதத்தை தூண்டுகின்ற சக்திகள் அந்த இடத்தில் விவசாயம் செய்து நெருக்கடி நிலைமையை உருவாக்க முனைந்துகொண்டு இருக்கின்றன.

இந்தச் சந்தர்ப்பத்தில் இவ்விடயம் சம்பந்தமாகப் பல தீர்மானங்கள் எடுக்கப்பட்டு, பல நெறிமுறைகள் கையாளப்பட்டு வருகின்றன. மாண்புமிகு சனாதிபதி அவர்கள் மட்டக்களப்புக்கு வருகை தந்திருந்தபோதுகூட, இந்தப் பகுதியை மேய்ச்சல் தரையாகப் பயன்படுத்துவதற்கான அனுமதி கோரப்பட்டு, அதற்கான நடவடிக்கை எடுப்பதாக உறுதிமொழியும் கொடுக்கப்பட்டு இருக்கின்றது. கடந்த காலங்களில் இவ்வாறான நெருக்கடி நிலை ஏற்பட்டபோது, ஏறாவூர் நீதிமன்றத்திலும் கொழும்பு நீதிமன்றத்திலும் இதற்கான அனுமதி வழங்கப்பட்டு இருக்கின்றது. தற்போதைய சூழலை குழப்புவதற்காகவும் பண்ணையாளர் களுக்கு நெருக்கடியை ஏற்படுத்துவதற்காகவும் அத்துமீறிய குடியேற்றவாசிகள் விவசாயம் செய்வதற்கான நடவடிக்கை களை இனவாத சக்திகள் தூண்டிக்கொண்டு இருக்கின்றன.

இந்த விடயத்தைக் கையாளவேண்டிய மிக முக்கிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது. இதற்கான காத்திருப்பு நீண்டகாலமாக இருந்தபோதிலும், அதற்கான நடைமுறைகள் சரியாக மேற்கொள்ளப்படவில்லை. அதாவது, பண்ணையாளர்களுக்கு நீதி பெற்றுக்கொடுக்கப்படவில்லை. இதனால் கடந்த 2ஆம் திகதி மக்கள் போராட்டம் சமூக சேவை அமைப்புகளின் உதவியுடன் இடம்பெற்றது. அவர்கள் அறவழியிலும் நீதியான முறையிலும் தங்களுடைய உரிமையைப் பெற்றுத்தருமாறு கோரி ஆர்ப்பாட்டத்தை முன்னெடுத்தபோது, அதற்கான தடை உத்தரவைப் பெறுவதற்கு பொலிஸ் திணைக்களம் முயற்சி எடுத்திருந்தது. அரசியலமைப்பின்படி மக்கள் தங்களின் உரிமைகளுக்காக குரல்கொடுப்பது தர்மமான முறையில் சரியானது என்று நீதிமன்றம் மிகத் தெளிவாகக் கூறி, அவர்களுடைய போராட்டத்துக்கான அனுமதியை பொலிஸ் திணைக்களம் குழப்பக்கூடாதிருப்பதற்கான ஏற்பாட்டைச் செய்தது.

இந்த ஆர்ப்பாட்டக்காரர்களின் அடிப்படைக் கோரிக்கை யாக அமைவது, மாண்புமிகு சனாதிபதி அவர்களால் உறுதியளிக்கப்பட்ட விடயத்தையும் நீதிமன்றத்தால் வழங்கப்பட்ட தீர்ப்பையும் நடைமுறைப்படுத்த வேண்டும் என்பதுதான். தொடர்ச்சியாகப் பண்ணையாளர்கள் நெருக்கடிக்கு உள்ளாக்கப்படுகின்றார்கள்; கடத்தப்படுகின்றார் கள்; துன்புறுத்தப்படுகின்றார்கள். அதுமாத்திரமல்ல, அந்தப் பிரதேசத்தில் இருக்கின்ற பசுக்கள் காயப்படுத்தப்படுகின்றன; கொலை செய்யப்படுகின்றன. இவற்றுக்கான நீதியைப் பெற்றுத்தருமாறு கோரியும் பண்ணையாளர்கள் தங்களது கால்நடைகளை அந்தப் பகுதியில் தொடர்ச்சியாக மேய்ப்பதற்கான பாதுகாப்பு உத்தரவாதத்தைப் பெற்றுத்தரு மாறு கோரியும்தான் இந்தப் போராட்டம் முன்னெடுக்கப் பட்டது.

போராட்டக்காரர்களின் கோரிக்கைகளைப் பெற்று, அவற்றை மாண்புமிகு சனாதிபதி அவர்களிடம் கையளிக்க வேண்டிய அரசாங்க அதிபர், அறைக்குள் புகுந்துகொண்டு வெளியே வராமல் இதனைத் திசைதிருப்ப முயற்சிப்பதுபோல் நடந்துகொண்ட முறை மிகவும் கண்டிக்கத்தக்கது. மக்களால் தெரிவுசெய்யப்பட்ட பிரதிநிதிகள் என்ற அடிப்படையில் நாங்களும் அந்த மக்களுடன் சேர்ந்து போராட்டத்தில் ஈடுபட்டோம். நாங்கள் அரசாங்க அதிபரிடம் சென்று இந்தக் கோரிக்கைகளைக் கையளிக்க முனைந்தபோது, மக்களால் தெரிவுசெய்யப்பட்ட மக்கள் பிரதிநிதிகளான எங்களைக்கூட சந்திக்காமல் அரசாங்க அதிபர் நழுவிக்கொண்டதோடு, சந்திக்கவிடாமல் இருப்பதற்கான நடவடிக்கையையும் பொலிஸ்மூலம் எடுத்திருந்தார். மக்களால் தெரிவுசெய்யப்பட்ட மக்கள் பிரதிநிதிகளைச் சந்திக்காது, அந்த மாவட்டத்தில் பிரச்சினைகளை ஏற்படுத்த முற்பட்டதை உண்மையிலே விசாரிக்க வேண்டும்.

உண்மையிலேயே அரசாங்க அதிபருக்கு இந்தப் பிரச்சினையைத் தீர்க்க வேண்டுமென்ற பற்று அல்லது அந்த மாவட்ட மக்கள் மீதான சமூகப் பார்வை அல்லது அந்த மாவட்ட மக்களின் அடிப்படை உரிமைகள், நில அமைப்பு போன்ற விடயங்கள் சம்பந்தமான போதிய அறிவு இருந்திருந்தால், அவர் இவ்வாறான நடவடிக்கைகளில் ஈடுபட்டிருக்க மாட்டார். உண்மையிலேயே அவருடைய நோக்கம் என்னவாக இருந்தது? அவர் எங்கேயோ இருந்து கிடைக்கின்ற உத்தரவை அமுல்படுத்துவதாக அல்லது இனவாத சக்திகள் தூண்டுகின்ற பிரச்சினையை இன்னும் எண்ணெய் ஊற்றி வளர்த்துவிடுவதாகத்தான் நாங்கள் கருதுகின்றோம்.

மக்கள் சுமுகமான முறையில், நியாயமான முறையில் ஒரு போராட்டத்தைச் செய்கின்றபொழுது, அவர்களுடைய கோரிக்கைகளை ஏற்று, அவற்றை உரிய அமைச்சரிடம் அல்லது உயர் அதிகாரிகளிடம் அல்லது மாண்புமிகு சனாதிபதியிடம் கொண்டுசெல்ல வேண்டிய பாரிய பொறுப்பைக் கொண்டுள்ள அரசாங்க அதிபர், அந்த மாவட்டத்தில் மக்கள் படுகின்ற அவலம் பற்றி எந்தவித அக்கறையுமின்றி தான்தோன்றித்தனமாகவும் ஏதேச்சாதிகார மாகவும் நடந்து கொண்ட முறையானது மிகவும் கண்டிக்கத்தக்கது. எனவே, அவர் இது தொடர்பில் விசாரணைக்கு உட்படுத்தப்பட வேண்டும்.

நாங்கள் இவ்விடயம் சம்பந்தமாக பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரிடமும் மாண்புமிகு சனாதிபதியிடமும் மாண்புமிகு சபாநாயகரிடமும் முறையிட இருக்கின்றோம். மக்களால் தெரிவுசெய்யப்பட்ட பிரதிநிதிகள் மக்கள் சார்பாக பிரச்சினைகளைக் கொண்டு செல்கின்றபோது, மக்களின் வரிப் பணம்மூலம் சம்பளம் பெறுகின்ற அரச அதிகாரிகள் இவ்வாறான மிலேச்சத்தனமான நடவடிக்கைகளில் ஈடுபடுவது மக்களைப் புண்படுத்துவதாக இருக்கின்றது. இவர்கள் மக்களின் தேவைகள் தொடர்பிலும் குறைகள் தொடர்பிலும் கவனம் செலுத்தி, அவற்றுக்குத் தீர்வு காணாது, தங்களது பதவியைக் காப்பாற்றுவதற்காகப் பயணிப்பதாகவே தெரிகின்றது. இந்த விடயம் தொடர்பில் குறித்த அரசாங்க அதிபர் விசாரிக்கப்பட்டு, இவ்வாறான நடவடிக்கைகள் மீண்டும் நடைபெறாமல் தடுக்க வேண்டும். மேலும், இவ்வாறான போராட்டங்கள் நடைபெறுகின்றபோது, மக்களின் குறைகளைத் தீர்க்கும் வகையில் அவர்கள் தங்களுடைய பணிகளை ஆற்ற வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். எதிர்காலத்தில் மயிலத்தமடு - மாதவனை மேய்ச்சல் தரை சம்பந்தமான பிரச்சினைக்கு இணக்கப் பாட்டுடன் கூடிய சுமுகமான, நீதியான தீர்வைப் பெற்றுக்கொடுப்பதற்கு இந்த அரசாங்கம் முன்வர வேண்டும்.

எங்களுடைய பண்ணையாளர்கள் காலாகாலமாக பெரும்போகத்தில் விவசாயம் செய்யும்போது தங்களுடைய கால்நடைகளை அந்த இடத்துக்குக் கொண்டுசென்று

[ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මහතා]

මේය්ත්තිරුක්කිරාර්කළ්. අතර්කු අප්පාල්, කටන්ත කාලංකළිල් ඉව්විටයම් තොටර්පිල් වළුංකප්පට්ට නීතිමන්ර උත්තරවුකළුම් මිකත් තෙළිවාක ඉරුක්කින්රන. මාණ්පුමිකු සනාතිපති අවර්කළ්කූට, කුරිත්ත ඉටත්තිල් අවර්කළුක්කාන මේය්ච්සල් තරෙයෙප් පෙට්රුක්කොටුප්පතර්කාන ඒර්පාටු කළෙත් තුරිතප්පටුත්තුමාරු අපිවිරුත්තික් කුළුක් කූට්ටත්තිල් විතන්තුරෙත්තු ඉරුක්කින්රාර්. ඉව්වාරු එල්ලා විටයංකළුම් නීතියාකවුම් නේර්මෙයාකවුම් නටෙපෙරුකින්රපොළුතු, ඉනවාතත්තෙත් තූණ්ටුම් වකෙයිල් අංකු මක්කළෙක් කුටියේර්ර්, නෙරුක්කටියෙ උණ්ටාක්කි, ඉනංකළුක්කිටෙයේ මුරුකල් නිලෙයෙ ඒර්පටුත්ත මුනෙකින්රවර්කළුක්කු එතිරාකත් තකුන්ත නටවටික්කෙ එටුක්ක වේණ්ටුම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up now.

ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) ඉළෙයතම්පි සිරිනාත්)
(The Hon. (Dr.) Elayathamby Srinath)
Sir, please give me a minute.

ඉන්ත නිකළ්වෙ ඔර් ඉනවාත චෙයර්පාටාකප් පාර්ක්කක්කූටාතු. ඉන්ත නිකළ්විල් තමිළ් මක්කළ් මට්ටුමල්ල, මුස්ලිම්, සිංකළ මක්කළුම්කූට කලන්තුකොණ්ටු තංකළුතෙය ආළමාන කරුත්තුකළෙ මුන්වෙත්තිරුන්තාර්කළ්. අංකු කුටියේර්රප්පට්ටු විවචායම් චෙය්කින්රවර්කළුක්කුත් තේවෙයාන නිලප්පකුතිකළ් අණ්මෙය මාවට්ටංකළිල් ඉරුක්කින්රපොළුතු, ඉතනෙ ඔරු පිරච්චිනෙයාක මුන්නෙටුත්තු, අරචාංකත්තෙ නෙරුක්කටික්කුළ්ළාක්ක වේණ්ටුම්, ඉනංකළුක්කිටෙයේ මුරුකල් නිලෙයෙ ඒර්පටුත්ත වේණ්ටුමෙන්ර එණ්ණප්පාට්ටුටන් චෙයර්පටුකින්රවර් කළෙක් කලෙප්පතර්කු අරචාංකම් ඉතයචුත්තියෝටු නටවටික්කෙකළෙ මුන්නෙටුක්ක වේණ්ටුම්. අව්වාරු චෙය්කින්රපෝතුතාන් නාට්ටිල් නිරන්තර අමෙති ඒර්පටුවතෝටු, ඉන්ත අරචාංකත්තුටන් තොටර්න්තු පයණික්ක මුටියුම් එන්ර නම්පික්කෙයුම් මන උරුතියුම් මක්කළුක්කු ඒර්පටුම්. එතිර්කාලත්තිල් ඉව්වාරාන පිරච්චිනෙකළුක්කුත් තීර්වු කාණුම් විටයත්තිල් අරස අතිකාරිකළ් පොරුප්පුටන් නටන්තුකොළ්ළ වේණ්ටුමෙනවුම් කේට්ටුක් කොළ්කින්රේන්. නන්රි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Manoj Rajapaksha. You have nine minutes.

[අ.භා. 1.53]

ගරු මනෝජ් රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු මනෝජ් රාජපක්ෂ)
(The Hon. Manoj Rajapaksha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙන එන රෙගුලාසි සහ 2026 අංක 7 දරන පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳව තමයි අද දවසේ අපි විවාද කරන්නේ. ඉතින් මෙම පනත්වල මූලික අරමුණු අපි දැන් සාකච්ඡා කරලා තිබෙනවා. ජාතික ආර්ථිකය, ඒ වාගේම මහජන සෞඛ්‍ය හා පරිසරය සුරක්ෂිත කිරීමේ අරමුණින් තමයි විශේෂයෙන්ම ආනයනය කිරීමේදී ප්‍රමිතිකරණය සහ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා ප්‍රමිතිකරණ තත්ත්ව පාලන රෙගුලාසි ප්‍රකාශයට පත් කරලා තිබෙන්නේ. ඉතින් මෙමඟින් බලාපොරොත්තු වෙන්නේ දේශීය නිෂ්පාදකයන්ට සාධාරණ, ඒ වාගේම තරගකාරී පසුබිමක් සහතික කිරීම හරහා පාරිභෝගික ආරක්ෂාව සැලසීමයි. විශේෂයෙන්ම පාරිභෝගිකයාගේ සුරක්ෂිතභාවය අරමුණු කරගෙන තමයි මෙම මඟී මෝටර් රථ සඳහා භාවිත කරන ටයර්, ඒ වාගේම ත්‍රිරෝද මෝටර් රථ සඳහා භාවිත කරන වායු පිරවූ ටයර් කියන ආනයනික ටයර් සඳහා ප්‍රමිතිය නියම කරනු ලබන්නේ.

විශේෂයෙන්ම අපි දන්නවා, ලංකාවේ ටයර් වෙළඳපොළේ ප්‍රමිතියෙන් තොර ටයර් තිබෙන බව. විශේෂයෙන්ම මඟී ආරක්ෂාව සඳහා ටයර්වල ප්‍රමිතිය බලපානවා. ඉතින් ලංකාවේ සෑම සියලු භාණ්ඩයකම ප්‍රමිතිය ඉහළ නැනක රඳවා ගැනීම අපේ වගකීමක් බවට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මෙම රෙගුලාසි මඟින් ටයර්වල ප්‍රමිතිය පිළිබඳ යම් ප්‍රමිතිකරණයක් තමයි ක්‍රියාත්මක කරන්නේ. විශේෂයෙන්ම ටයර් කර්මාන්තය කරන, ඒ හා බැඳුණු ව්‍යාපාරවලට සම්බන්ධ වෙලා ඉන්න බොහෝ අයගේ තිබෙන ඉල්ලීමක් තමයි උසස් තත්ත්වයේ ප්‍රමිතියෙන් යුත් ටයර් ලංකාවට ගේන්න යම් ක්‍රමවේදයක් සකස් කරන්න කියන එක. ඒ අනුව විශේෂයෙන්ම ජනතාවාදී රජයක් සහ ආණ්ඩුවක් විධියට සෑම සියලු භාණ්ඩයකම ප්‍රමිතිය ඉහළින්ම තියා ගන්නවා වාගේම ටයර්වල ප්‍රමිතිය රඳවා ගැනීම සඳහා මේ රෙගුලාසි ඉතාම වැදගත් වෙනවා.

ඊළඟට මම, අද ඉදිරිපත් කර තිබෙන පරිපූරක ඇස්තමේන්තුව ගැන කථා කරන්නම්. විශේෂයෙන් ගත්තොත්, 2026 අංක 7 දරන පරිපූරක ඇස්තමේන්තුවේ මුළු මුදල විධියට රුපියල් බිලියන 47ක් තියෙනවා. ඒ රුපියල් බිලියන 47න්, රුපියල් බිලියන 41ක්ම සාමාන්‍ය පරිපාලන වියදම් හා ආයතනික සේවා සඳහා වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම රුපියල් බිලියන 47න්, රුපියල් බිලියන 41ක්ම මැද පෙරදිග පවතින යුද්මය වටපිටාව තුළ ඍජුවම එහි බලපෑමට ලක් වෙච්ච පිරිස් සඳහා සහන සැලසීමට තමයි යොදවලා තිබෙන්නේ. ඉතින් අපි දන්නවා, මැද පෙරදිග ඇති වෙලා තියෙන මේ යුද්මය තත්ත්වය අද මුළු ලෝකයටම බලපෑම් කරලා තිබෙන බව. ඒ වාගේම දූපත් රාජ්‍යයක් වෙච්ච අපේ ලංකාව වාගේ රටකට මෙහි බලපෑම වැඩි වෙලා තියෙනවා. විශේෂයෙන්ම මුහුදු මාර්ග අවහිර වෙලා, ලෝක වෙළඳපොළේ තෙල් මිල ඉහළ ගිහිල්ලා, වෙනත් සැපයුම් මාර්ග අඩාළ වෙලා, තෙල්වලට තියෙන ඉල්ලුම වැඩි වෙලා තිබෙන තත්ත්වය ඇතුළේ මම හිතන්නේ අපට විශාල සහන ප්‍රමාණයක් සලසන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ අනුව තමයි මේ රුපියල් බිලියන 41ක මුදල වෙන් කරලා තිබෙන්නේ. උදාහරණයක් විධියට ගත්තොත්, 2026 ජනවාරි මාසයේ විතරක් ඉන්ධන සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 251ක් යොදවලා තියෙනවා. සැප්තැම්බර් මාසය වෙනකොට, ඇමෙරිකානු ඩොලර් මිලියන 415.1 විධියට වියදම වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ එම සංඛ්‍යා දෙක විතරක් සංසන්දනය කළත්, මේ ගෙවුණු මාස කිහිපයේ - ජනවාරි සිට සැප්තැම්බර් මාසය දක්වා - ඉන්ධන සඳහා විතරක් අමතරව, වෙන් කරන්න වෙච්ච මුදල ආසන්න වශයෙන් දෙගුණයක් බවට පත් වෙලා තියෙනවා. ඒක නිසා රජයට මේ ආර්ථිකය කළමනාකරණය කරගෙන යන්න වෙලා තිබෙන්නේ, ජනතාවට අවශ්‍ය සේවාවන්, පහසුකම්, සුඛසාධන කටයුතු ටික ලබා දෙන්න වෙලා තිබෙන්නේ, ලෝක පරිමාණයෙන් ඇති වෙලා තිබෙන අර්බුදකාරී තත්ත්වයත් එක්ක.

විපක්ෂය කියන විධියට රටක අභ්‍යන්තර සාධකවලින් විතරක්ම බැහැ, සියලු දේ කළමනාකරණය කරන්න. ඒකට බාහිර සාධකත් බලපානවා. එක වෙලාවක විපක්ෂයෙන් ඉදිරිපත් වුණා,

ආණ්ඩුව ප්‍රායෝගික නැහැ කියලා කථාවක්. මම හිතන විධියට, ආණ්ඩුව තමයි ප්‍රායෝගික. විපක්ෂය අප්‍රායෝගිකයි. ඔවුන් මේ තිබෙන තත්ත්වය හරියට තේරුම් ගන්න සමත් නැද්ද කියන එක තමයි මට හිතෙන්නේ. ලෝකය තුළ යුද වටපිටාවක් තිබෙනවා කියන එක අද කවුරුත් තේරුම් අරගෙන තිබෙනවා. ඒක කාගේවත් කැමැත්තකට හෝ වෙනත් කාර්යයන් නිසා ඇතිවුණු තත්ත්වයක් නොවෙයි. ඒක නිසා මෙන්න මේ තත්ත්වය ඇතුළේ අපට ආර්ථික වශයෙන් විශාල මැදිහත්වීමක් අමතරව කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒක අපි කරමින් තිබෙනවා. ඉතින්, අපි මේ කටයුතු කරගෙන යනකොට 2024-2025 වසරේ අපේ මූලික අරමුණ, පරමාර්ථය බවට පත් වෙලා තිබුණේ, ආර්ථිකය ස්ථාවර කර ගැනීම. ඒ සඳහා ආණ්ඩුවක් විධියට ගත හැකි සියලුම ක්‍රියාමාර්ග අපි තෝරා ගෙන තිබෙනවා. 2025 වසරේදී ආර්ථික වර්ධන වේගය සියයට 5ක් දක්වා ගෙන ගොස් තිබෙනවා. ඒ වාගේම දළ දේශීය නිෂ්පාදිතය රුපියල් ට්‍රිලියන 32.75ක් දක්වා ඉහළට ගෙන ගොස් තිබෙනවා. එහි සැබෑ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් ට්‍රිලියන 13.13ක් බවට පත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම සංරචක ගණනාවක් ඔස්සේ, ප්‍රධාන ධාරා 3ක් ඔස්සේ අපේ ආර්ථිකයේ වර්ධනය ගැන සොයා බැලුවත් ආර්ථිකයේ යම් වර්ධනයක් තිබෙනවා කියන එක ප්‍රකාශයට පත් වෙනවා. විශේෂයෙන් කෘෂිකාර්මික අංශය තුළ සත්ව පාලනය පැත්තෙන්, සත්ව නිෂ්පාදන පැත්තෙන් විශාල වර්ධනයක් තිබෙනවා. ඒ වාගේම පොල් නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා. වී නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා. කාර්මික අංශය තුළ සියයට 7.8ක වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. සේවා අංශය තුළ සියයට 3.3ක වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. පතල් කැණීම් සියයට 16.9කින් වර්ධනය වෙලා තිබෙනවා. ඉදිකිරීම් කර්මාන්තය සියයට 9.2කින් වර්ධනය වෙලා තිබෙනවා. විදුලිබල නිෂ්පාදනය සියයට 9.2කින් වර්ධනය වෙලා තිබෙනවා. නිෂ්පාදන කර්මාන්ත සියයට 6.2කින් වර්ධනය වෙලා තිබෙනවා. මේ විධියට සෑම සියලු ක්ෂේත්‍රයකින්ම වර්ධනයක් අපි අත්පත් කරගෙන තිබෙනවා. ඉතින්, මෙන්න මේ වර්ධනයන් ටික ජනතාවට ප්‍රතිලාභ ලෙස ලබා දීම තමයි දැන් අපි කරමින් තිබෙන්නේ. ඒ නිසා තමයි ලෝකයේ යුද වටපිටාවක් පවතින තත්ත්වයකදීත් විවිධ සුබසාධන කටයුතු සඳහා අමතර රුපියල් බිලියන 6ක මුදලක් අපි යොදවන්නේ. විශේෂයෙන්ම අස්වැසුම ප්‍රතිලාභය නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල වැඩි කර දෙන්න මේ මුදල යොදවා තිබෙනවා.

2025 වසරේ අත්පත් කරගනු ලැබූ එම ආර්ථික වර්ධනය අපි අපේ රටේ ජනතාවට පීඩාවක් ඇති නොවෙන පරිදි, ප්‍රතිලාභ ලෙස ලබා දී තිබෙනවා. රාජ්‍ය සේවකයින් බඳවා ගැනීම හරහා ඒක ප්‍රතිලාභයක් විධියට දීලා තිබෙනවා. ඒ වාගේමයි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම. ඒක ජනතාවට දෙන විශාල ප්‍රතිලාභයක්. වතු කම්කරුවන්ගේ වැටුප් වැඩිවීමත් එහෙමයි. ඒ, කාලාන්තරයක් තිස්සේ ඇදි ඇදී තිබුණු ප්‍රශ්නයක්. ඒ හින්දා අපේ රජය මැදිහත් වෙලා, ආණ්ඩුව මැදිහත් වෙලා වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කර තිබෙනවා. පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කර තිබෙනවා. සමාජ සුබසාධන දීමනා වැඩි කරලා තිබෙනවා. පාසල් දරුවන්ට ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් රුපියල් 6,000ක්ද, සපත්තු මිලදී ගැනීම සඳහා රුපියල් 3,000ක්ද ලබා දී තිබෙනවා. වැඩිහිටි දීමනාව ලබා දීම, ආබාධිත අයට දෙන දීමනා වැඩි කිරීම, විශ්‍රාම වැටුප් ලබා දීම වැනි පැති ගණනාවකින්ම අපි සුබසාධනය සලසා තිබෙනවා. අපි රජයක් විධියට අත්පත් කරගත්ත ආර්ථික වර්ධනය ජනතාවට සුබසාධන හා සහන ලෙස ලබා දෙන ගමන්ම ලෝක තත්ත්වයෙන් සහ ජාතික මට්ටමේ ඇති වෙන අභියෝගවලට සාර්ථකව මුහුණ දෙන්න ආර්ථික ශක්තියක් සාදා ගනිමින් අපි ඉදිරියට යනවා කියන කාරණය සිහිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. G. G. Ponnambalam. You have ten minutes and the Floor is yours.

[பி.ப. 2.02]

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கடந்த ஒக்ரோபர் மாதம் 31ஆம் திகதி திருகோணமலை மாவட்டத்தில் பாரியதொரு சம்பவம் நடைபெற்றிருக்கிறது. அத்துடன், இந்த வாரத்துக்குள் நடைபெற்ற இன்னும் இரு விடயங்களையும் நான் இந்தப் பாராளுமன்றத்தில் பதிவுசெய்ய விரும்பு கின்றேன். அவை பாரதூரமான விளைவுகளைக் கொண்ட சம்பவங்களாக இருக்கின்றன. எனவே, நான் இன்றைய விவாதத் தலைப்புக்கு அப்பாற் சென்று, இந்த விடயங்களைப் பதிவுசெய்ய வேண்டிய நிலைக்குத் தள்ளப்பட்டு இருக்கின்றேன்.

கடந்த ஒக்ரோபர் மாதம் 31ஆம் திகதி திருகோணமலை மாவட்டத்திலுள்ள தம்பலகாமம் பிரதேச செயலாளர் பிரிவிலிருந்து மொரவெவ பிரதேச செயலாளர் பிரிவுக்கு கிட்டத்தட்ட 1,200 கால்நடைகளை அதன் உரிமையாளர்கள் கொண்டுசென்று இருக்கிறார்கள். அவற்றைக் கொண்டு செல்வதற்கான அனுமதி கடந்த ஒக்ரோபர் மாதம் 20ஆம் திகதி பெறப்பட்டிருந்தது. Irrigation Department அதற்குரிய அனுமதியை 2023ஆம் ஆண்டு நவம்பர் மாதம் 20ஆம் திகதியே வழங்கியிருந்தது. அதாவது, தங்களுக்குரிய காணிகளில் இந்தக் கால்நடைகளைக் கொண்டுவந்து பராமரிப்பதற்குரிய அனுமதி 2023ஆம் ஆண்டே எழுத்துமூலம் வழங்கப்பட்டு இருந்தது. அதன் பிரகாரம், கடந்த ஒக்ரோபர் மாதம் எங்களுடைய பிரதி அமைச்சர் அருண் ஹேமச்சந்திரா அவர்களின் வேண்டுகோளுக்கு இணங்கவும், திருகோணமலை, தம்பலகாமம் பிரதேசத்தைச் சேர்ந்த கால்நடை சங்கத்தின் உறுப்பினர்களின் வேண்டுகோளுக்கு இணங்கவும், சம்பந்தப்பட்ட மாகாண அமைச்சு அதற்கான அனுமதியை வழங்கியிருந்தது. அதாவது, பெரும்போக காலப்பகுதியில் தம்பலகாமத்திலிருந்து இந்தக் கால்நடைகளை மொரவெவ பிரதேசத்துக்குக் கொண்டுசென்று, பராமரிப்பதற்கு அனுமதி வழங்கப்பட்டு இருந்தது. அவ்வாறு அனுமதி வழங்கப்பட்டு இருந்த நிலையிலே, தமிழ், முஸ்லிம் மக்கள் அந்த 1,200 கால்நடைகளையும் மொரவெவவுக்குக் கொண்டுபோய் இருக்கிறார்கள். அன்றைய தினம் இரவோடு இரவாக அங்கு குடியேறி இருக்கின்ற சிங்கள மக்கள் அந்தக் கால்நடைகளை சுட்டும் கொன்றும் அங்கிருந்து துரத்தியிருக்கிறார்கள். கிட்டத்தட்ட 14 கிலோமீற்றருக்கு அப்பால் அவர்கள் அவற்றைக் கொண்டுசென்று இருக்கிறார்கள். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் இதனைச் சுட்டிக்காட்டுவதற்குக் காரணம் இருக்கின்றது. இவ்வகையான இனவாதச் செயல்களுக்கு அனுமதி வழங்கப்படாது என்று இந்த அரசாங்கம் தெளிவாகச் சொல்கின்றது. அப்படி இருக்கையிலே, இந்த இனவாதச் செயல் நடைபெற்று இருக்கின்றது. இதனைச் சுட்டிக்காட்டுவதற்கு வெட்கமாகவும் இருக்கிறது.

மொரவெவ பிரதேசம் என்பது, உண்மையிலே குடியேற்றங்களால் மாற்றியமைக்கப்பட்ட ஒரு தமிழ் கிராமம். அரசாங்கம் வழங்கிய அனுமதியின் பிரகாரம் நேர்மையாக

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

நடந்து கொள்கின்ற தமிழ், முஸ்லிம் மக்களுக்கு இடமளிக்காத வகையில் நடவடிக்கைகள் எடுக்கப்படுகின்றது என்றால், அதற்கு என்ன காரணம் என்பதை இந்த அரசாங்கம் சொல்ல வேண்டும்.

அருண் ஹேமச்சந்திராவின் வேண்டுகோளுக்கு இணங்க அனுமதி பெறப்பட்டதற்குப் பிறகும் இவ்வகையான செயல்கள் நடைபெறுகின்றது என்றால், ஒன்றில் அருண் ஹேமச்சந்திரா நடிக்கிறார் அல்லது இந்த அரசாங்கம் இனவாதத்தைக் கட்டுப்படுத்துவதற்கு விருப்பமில்லை அல்லது அதிகாரம் இல்லை. இந்த இரண்டில் ஒன்று நடக்க வேண்டும். இந்த அரசாங்கத்தில் இருக்கக்கூடிய ஒரு தமிழ்ப் பிரதி அமைச்சருக்கு, அவர் சார்ந்த பிரதேசத்தில் தமிழ், முஸ்லிம் மக்கள் வருடாந்தம் செய்கின்ற ஒரு வேலைக்கு இடமளிப்பதற்கு அனுமதி வழங்கி, அம்மக்களின் உரிமையை உறுதிப்படுத்த முடியாத நிலை இருக்கிறது என்பதையாவது இந்த அரசாங்கம் ஏற்றுக்கொள்ள வேண்டும். ஒரு பக்கம் தமிழ், முஸ்லிம் மக்களுக்கு அந்த உரிமையைப் பெற்றுக் கொடுப்பதாகக் காட்டிக்கொண்டு, மறுபக்கம் 'துரத்துங்கள்' என்று சிங்கள மக்களுக்குச் சொல்கிறார்போலும். அப்படி இல்லை என்று சொன்னால், இந்த அரசாங்கம் அந்த மக்களைத் துரத்தியவர்களுக்கு எதிராக நடவடிக்கை எடுத்தாக வேண்டும்.

எனக்கு முன்னர் பேசிய பாராளுமன்ற உறுப்பினர்கள் குறிப்பிட்டதைப்போல, "இதற்கு முன்னர் இருந்த ஆட்சியாளர்கள் இனவாதிகள்! அவர்களால் உருவாக்கப்பட்ட பிரச்சினைதான் இது" என்று சுட்டிக்காட்டிக்கொண்டு, மயிலத்தமடு - மாதவனையில் பாதிக்கப்படுகின்ற கால்நடை உரிமையாளர்களுக்கு எந்தவிதமான தீர்வையும் கொடுக்காமல், இப்பிரச்சினையை வருடக்கணக்கில் இழுத்துக்கொண்டு செல்வதென்பது இந்த அரசாங்கம் இனவாதத்துக்கு முழுமையாகத் துணைபோகின்றது என்பதுதான் அர்த்தம். நீங்கள்தான் அரசாங்கம்! நிருவாகிகள் தவறு செய்யும்போது, அரசாங்கம் என்ற வகையில் நீங்கள் அதில் தலையிட வேண்டும். அதுதான் உங்களுடைய பொறுப்பு! அதில் தலையிடாமல், "இதற்கு முதல் இருந்த அரசாங்கம்தான் அதனைச் செய்தது. அவர்கள் இனவாதிகள்!" என்று கையை விரித்துக்கொண்டு இருப்பது அரசாங்கத்தின் பொறுப்பு இல்லையே! அவர்கள் செய்த தவறைத் திருத்துவதற்குத்தான் தாங்கள் வந்திருப்பதாக நீங்கள் சொல்கின்றீர்கள்! ஆட்சி மாற்றம் மட்டுமல்ல, system change என்றும் சொல்லிக்கொண்டு வந்த நீங்கள், எந்த விதத்திலும் systemஐ மாற்றாமல் நடந்துகொள்வதாக இருந்தால், அதற்கு இருக்கக்கூடிய ஒரேயொரு காரணம், நீங்கள் இனவாதத்துக்குத் துணை போகிறீர்கள் என்பதுதான். நீங்கள் தமிழ் மக்களுக்கும் முஸ்லிம் மக்களுக்கும் படம் காட்டுகிறீர்கள்! எங்களுடைய பிரதேசத்துக்கு வருகின்றபொழுது ஒரு கதையையும், நடைமுறையில் முற்றுமுழுதாக வேறுபட்ட ஒரு கதையையும் சொல்கிறீர்கள். இதற்கு முதல் இருந்த இனவாத அரசாங்கங்கள் நடந்துகொண்டதைப் போன்றே நீங்களும் நடந்து கொள்கின்றீர்கள் என்பதுதான் உண்மை!

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මම ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්නද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, let him finish.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
මම කථා කළාට පස්සේ කියන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will allow you later, Hon. Akmeemana. He has only two minutes to go.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, தமிழ்த் தேசிய மக்கள் முன்னணியின் வவுனியா மாவட்ட அமைப்பாளரான திரு. தவபாலன் அவர்களுடைய குடும்பத்தை பொலிஸ் கடுமையாக அச்சுறுத்தி இருக்கிறது. கிளிநொச்சியில் வசிக்கின்ற அவருடைய குடும்பத்தாரிடம் சென்று, தவபாலன் அவர்கள் அரசாங்கத்தை விமர்சிப்பதையும் அரசாங்கம் தொடர்பான விடயங்களை அம்பலப்படுத்திக் கொண்டு இருப்பதையும் தொடர்ந்து மேற்கொள்வாராக இருந்தால், நாங்கள் அவரை விசாரிப்பதற்காக உள்ளே எடுத்து, 3 வருடங்களுக்கு வெளியில் விடமாட்டோம் என்று பொலிஸ் அச்சுறுத்தி இருக்கின்றது.

அதுமட்டுமல்ல, புதிய சட்டமொன்று கொண்டுவரப்பட இருப்பதாகவும், அந்தச் சட்டத்தினூடாக நாங்கள் அவரை சரியாகக் கையாளுவோம் என்றும் தவபாலனின் குடும்பத்தை அச்சுறுத்தி இருக்கிறது. அதேபோன்று, மட்டக்களப்பைச் சார்ந்த எங்களுடைய தேசிய அமைப்பாளரான திரு. தர்மலிங்கம் சுரேஷ் அவர்கள் Facebookஇல் தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்தின் ஒரு புகைப்படத்தைப் பதிவேற்றியதாகச் சொல்லி, TID அவரை கொழும்புக்கு வருமாறு அழைத்திருக்கிறது. தர்மலிங்கம் சுரேஷ் அவர்கள் இன்றைக்கு மயிலத்தமடு - மாதவனை பகுதியில் கால்நடைப் பண்ணையாளர்களுக்கு நடக்கின்ற அநியாயத்தை அம்பலப்படுத்துவதற்காக அவர்களின் போராட்டத்துக்கு முழுமையாக ஒத்துழைப்பு வழங்கிக்கொண்டு இருக்கிறார் என்பது அனைவருக்கும் தெரிந்த விடயமாகும். கிழக்கு மாகாணத்தில் நடக்கின்ற அனைத்து அநியாயங்களையும் அம்பலப்படுத்துவதில் அவர் முன்நிற்கிறார்; அனைத்துப் போராட்டங்களிலும் கலந்துகொள்கிறார்.

இவை ராஜபக்ஷ அரசாங்கத்தின் காலத்திலோ அல்லது ரணில் விக்கிரமசிங்ஹவின் அரசாங்க காலத்திலோ நடந்த விடயங்கள் அல்ல. இவை இந்த அரசாங்கத்தின்கீழ் நடந்து கொண்டிருக்கின்ற விடயங்கள்! " பயங்கரவாதத் தடுப்புச் சட்டம் ஒரு கொடூரமான சட்டம்; அதனை நாங்கள் நீக்குவோம்" என்று சர்வதேசத்துக்கு சொல்லிக்கொண்டு, Facebookஇல் ஒரு புகைப்படத்தைப் பதிவேற்றினார் என்று கூறி இன்றைக்கு ஒரு கட்சியின் தேசிய அமைப்பாளரை அதே பயங்கரவாதத் தடுப்புச் சட்டத்தின்கீழ் விசாரணை செய்யப் பார்க்கிறீர்கள். பொலிஸாரே போய் அந்தக் குடும்பத்தை அச்சுறுத்துகின்ற அளவுக்கு, நீங்கள் கொண்டுவரப்போகும் சட்டம் இன்றைக்கு இருக்கின்ற பயங்கரவாதத் தடுப்புச்

சட்டத்தைவிடவும் மிக மோசமானது என்பதைத் தெரிந்து கொண்டு, அதை இப்போதே நீங்கள் பயன்படுத்த ஆரம்பித்திருக்கிறீர்கள் என்பதுதான் உண்மை! இன்றைக்கு பாராளுமன்றத்துக்கு வெளியே ஒரு போராட்டம் நடைபெறு கின்றது. இது ஏதோ தமிழ் மக்கள் போராடுகின்ற ஒரு விடயமல்ல.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. G. G. Ponnambalam, your time is up.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am finishing up, Sir.

இன்றைக்கு நீங்கள் பயங்கரவாதத் தடுப்புச் சட்டத்துக்கு மாற்றீடாக கொண்டுவருகின்ற மூன்று சட்டங்கள் அதைவிட மோசமானவை. அதாவது, Protection of the State from Terrorism Act - PSTA, Prevention of Organised Crimes Bill, Prevention of Foreign Terrorist Fighters Bill ஆகியவற்றை எதிர்த்து இன்றைக்கு சிங்கள மக்களே வீதிக்கு இறங்கி -தெற்கிலுள்ள அனைத்து சிவில் சமூகங்களும் ஒன்றிணைந்து- போராடுகின்ற அளவுக்குத்தான் உங்களுடைய செயற்பாடுகள் அமைந்திருக்கின்றன என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். நன்றி.

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Member?

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මෙතුමා මතු කරපු ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රශ්නය ගැන. එතැන වැරදි අදහසක් මතු කළා. ඒක නිවැරදි කරන්න ඕනෑ. මෙතුමා කිව්ව කාරණාව සම්බන්ධව සඳුදා දිනයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රැස්වීමක් පවත්වලා පශු සම්පත් ගොවීන්ට අවශ්‍ය කරන භූමිය වෙන් කරලා දීලා තිබෙනවා. මෙතුමා ඒ ගැන සොයන්නේ නැතිව මෙතැනට ඇවිල්ලා ජාතිවාදී කෝණයෙන් විතරක් ඒ ප්‍රශ්නය දිහා බලලා වැරදි ප්‍රකාශයක් කළා. තිඟකට්කිළමෙ තිරුකෝණමලෙ මාවට්ටත්තිල් මාවට්ට செயலாளர் ஒரு meeting நடத்திட்டு, அவங்க தம்பலகாமம் பிரதேசத்தில் கால்நடை வளர்க்கும் மக்களுக்கு தேவையான இடம் கொடுத்திருக்கு. நீங்க அது தெரியாமல், அதைப் பற்றி விசாரிக்காமல், இங்கு வந்து இனவாதம் கதைக்கிறீங்க.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We are not going in for a debate, Hon. G. G. Ponnambalam. - *[Interruption.]*

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Let me reply Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
He replied to you. We are not going in for a debate on this, Hon. Member.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
He referred to what I said. So, I must correct that.

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
It is wrong information. - *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, we are not going in for a debate on this. - *[Interruption.]* If I give you time, Hon. Ponnambalam, and then give him time, it would become a debate. - *[Interruption.]*

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Sir, I am raising a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, I will give you half a minute.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am very clear that the places that were identified by the Divisional Secretariat of Morawewa were the places to which all livestock was taken, and it is from those places they were chased out.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, that is all; that is it. - *[Interruption.]* Now, you also want to explain, Hon. Akmeemana?

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
Yes, give me a minute, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, I will give just 15 seconds for you, Hon. Member.

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
அது தப்பான விஷயம்! ஏனென்னா, திருகோணமலை மாவட்டத்தில கால்நடைகளுக்கு இடம் பகிர்வது நீண்டகாலமாக இருந்து வருகிற பிரச்சினை. அதுக்கு நாங்க இப்ப தீர்வு கொடுத்திருக்கு. Thampalakamam Division மக்கள் கேட்ட இடம் வந்து -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Member, that is it.

Next, I call upon the Hon. Wasantha Piyathissa. You have 11 minutes. - *[Interruption.]* Hon. Wasantha Piyathissa, would you speak on the subject of the Debate? - *[Interruption.]* Order, please! - *[Interruption.]* Order, please! Come on, Hon. Members, no cross talks here. - *[Interruption.]* Hon. Wasantha Piyathissa, the mike is on for you. Would you speak now? *[Interruption.]* Hon. Wasantha Piyathissa, we are waiting for you to start your speech.

Order, please! Will an Hon. Member propose the Hon. Kins Nelson to the Chair?

ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

වීසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. KINS NELSON took the Chair.

[අ.භා. 2.16]

ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද ආනයන හා අපනයන පාලනයට අදාළ රෙගුලාසි කිහිපයක් සම්බන්ධවත්, රුපියල් බිලියන 47ක පරිපූරක ඇස්තමේන්තුවක් පිළිබඳවත් අද දවසේ මේ පාර්ලිමේන්තුවේදී විවාද කරනවා. ඊට සම්බන්ධ වීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා. අද උදෑසන සිට මේ විවාදයට සහභාගි වුණු පක්ෂ, විපක්ෂ කථිකයින් - මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් - විසින් විශාල සංවාදයක් සහ තොරතුරු ප්‍රමාණයක් මේ සම්බන්ධව සභාගත කරනු ලැබුවා. තවදුරටත් ඒ පිළිබඳව යම් අදහස් කිහිපයක් මතු කරන්න මේ වෙලාවේ මා කැමැතියි.

අපේ ආණ්ඩුව බලයට ඇවිල්ලා මේ වන විට වසර දෙකක් ගත වෙලා තිබෙනවා. අපි බලය ලබා ගන්නකොට අපේ රටේ ආර්ථිකය, අපේ රටේ දේශපාලන සංස්කෘතිය පිළිබඳව පොදු ජනතාවගේ ආකල්ප, මතවාද කොහොමද තිබුණේ කියන එක අපි දන්නවා. ඒ අනුව අපට විශාල අභියෝගයක් තිබුණා, මේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට, මේ රටේ නිෂ්පාදන ක්ෂේත්‍රයට යළි පණ ලබා දීමට, බංකොලොත් ආර්ථිකය ක්‍රමානුකූලව ශක්තිමත් කරමින්, ස්ථාවර කරමින් එහි ප්‍රතිලාභ ජනතාවට බෙදා දීමට. ඒ ගමන් මහ ඔස්සේ තමයි අපි ඉදිරියට යන්නේ. ඒ වාගේම වැරදි දේශපාලන සංස්කෘතිය, සදාචාරය වෙනුවට වඩා හොඳ සමාජයක් ගොඩනැඟීමේ අභියෝගයත් අපට හැම පැත්තකින්ම තිබුණා. ඒ ගමන් මහ ඔස්සේ ඉදිරියට එන මේ මොහොතේ විපක්ෂයේ සුළු පිරිසක් සාධාරණ නොවන යම් යම් විවේචන ඉදිරිපත් කළාට, මේ ආණ්ඩුව යන ගමන මොකක්ද, ගරු ජනාධිපතිතුමා යන ගමන මොකක්ද කියන එක පිළිබඳව මේ රටේ පොදු ජනතාවට හැඟීමක් තිබෙනවා, අදහසක් තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. මේ වසර දෙක තුළ අපට මූලික වශයෙන් අභියෝග දෙකකට මුහුණ පාන්න සිද්ධ වුණු බව අපි දන්නවා.

"දිට්වා" සුළි කුණාටුව දේශීය වශයෙන් අපි මුහුණ දීපු බරපතළ අභියෝගයක්. ඒ වාගේම මේ මොහොතේත්, තවදුරටත් ඉදිරියට ඇදීයන මැද පෙරදිග යුද්ධය - ඇමෙරිකාව, ඊශ්‍රායලය, ඉරානය සම්බන්ධ වුණු යුදමය තත්ත්වය - නිසා ආනයනික භාණ්ඩ සියල්ලගේම මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම ඩොලර් බිලියන 4.2ක දේපළ හානියක් සිද්ධ වුණා, "දිට්වා" සුළි කුණාටුව නිසා. ඒ සියල්ලට මුහුණ දෙමින් තමයි අපි මේ මැදිහත්වීම කරන්නේ.

අපි බලයට එනකොට රාජ්‍ය ආයතන විශාල ප්‍රමාණයක් පාඩු ලබමින් තිබුණා. බොහෝ පිරිසකට වන්දි ලබා දිය යුතුවත් තිබුණා. විශේෂයෙන්ම කෘෂි ක්ෂේත්‍රයේ නියැළෙන්නන්ට. ඒ වාගේම EPF, ETF නොගෙවූ ජනතාවට ඒ සියල්ලට අදාළව රුපියල් බිලියන ගණන් වන්දි ලබා දෙමින්, ඒ ජනතාවත් ආරක්ෂා කරගනිමින්, ආර්ථිකය ශක්තිමත් කරගනිමින් මේ වන විට අපි ඉදිරියට යමින් ඉන්නවා.

අපට මතකයි, රුපියල් ට්‍රිලියන දශම 5ක් අපි වෙන් කළා, "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වෙච්ච ජනතාවට සහන සපයන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ මුදල අපි සොයා ගත්තේ ණය අරගෙනවත්, මුදල් අච්චු ගහලාවත් නොවෙයි.

අවුරුදු එකහමාරක් තුළදී අපි රජයක් විධියට, රටක් විධියට අත්පත් කරගත්, ඉතිරි කරගත් ධනය තමයි ඒ ජනතාවට නිවාස හදලා දෙන්නත්, ඒ වාගේම අවුරුද්දකට ආසන්න කාලයක් සමහර ජනතාව බලාගන්නත්, ගෙවල් කුලී ගෙවන්නත්, ගෙවල්වලට අවශ්‍ය උපකරණ අරගෙන දෙන්නත්, ඒ වාගේම පාලම්, මාර්ග, බෝක්කු හදන්නත් අපි මේ වනකොටත් වැය කරමින් ඉන්නේ. ඒ වාගේම ඔබතුමන්ලාට මතක ඇති, පොහොර මිල වැඩිවීම නිසා නැවතත් අපේ ගොවි ජනතාවට බරපතළ ප්‍රශ්නයක් ආ බව. ඒ මොහොතේදීත් අපි රුපියල් ට්‍රිලියන දශම එකක් වෙන් කළා, පරිපූරක ඇස්තමේන්තුවකින්. ඒ කියන්නේ රුපියල් කෝටි 10,000කට ආසන්න මුදලක් වෙන් කළා, ගොවි ජනතාවට සහන දෙන්න. පසුගිය කාලයේ පොහොරවල මිල වැඩි වුණේ කොහොමද? ආනයනික පොහොර මිටියක් රුපියල් 15,000යි, 16,000යි, 17,000යි. විවිධ සමාගම්වල තිබෙන, වෙළෙඳ ආයතනවල තිබෙන පොහොර අපි රජයක් විධියට මිලදී අරගෙන රුපියල් 10,200ට පොහොර මිටියක් ගොවි ජනතාවට දෙන්න කටයුතු කළා. අපි ගොවි ජනතාවට ඒ සහනය ලබා දුන්නා.

ඒ විතරක් නොවෙයි, අපි මේ වසර දෙක ඇතුළතදී ක්‍රමානුකූලව අපේ අපනයන ආදායම වැඩි කරගන්නත් සමත් වුණා. ඒ වාගේම 1977න් පස්සේ අවම අය වැය හිඟය පෙන්වන්නත් අපි සමත් වුණා, පසුගිය අය වැයේදී. ඒ වාගේම විදේශ ප්‍රේෂණ ප්‍රමාණයත් වැඩි කර ගනිමින්, ඉතා ඉහළ විදේශ ප්‍රේෂණ අගයකට එන්නත් අපට පුළුවන්කම ලැබුණා, පසුගිය වසරේදී. ලංකා ඉතිහාසයේ වැඩියෙන්ම සංචාරකයින් ආපු වසර බවට අපට 2025 වසර පත් කරගන්න පුළුවන් වුණා. ඒ වාගේම සංචාරක ගමනාන්ත වෙනස් කරමින්, ඒ ක්ෂේත්‍රය වර්ධනය කරන්න මේ වනකොට අපි විශාල මැදිහත්වීමක් සිද්ධ කරමින් ඉන්නවා, මුදල් වැය කරමින් ඉන්නවා. ඒ වාගේම ජංගම ගිණුමේ ශේෂය විශාල වශයෙන් වර්ධනය කරගන්නත්, ස්ථාවර කරගන්නත් අපි සමත් වුණා. ආයෝජන වැඩි කර ගන්නත් අපි සමත් වුණා. සියයට 70ක තිබුණු උද්ධමනය අපි සියයට 5කට ආසන්න ප්‍රමාණයකට ගෙනාවා. ලෝක යුද්ධයක් පවතින මේ වෙලාවේ යම් ප්‍රමාණයකින් අපේ රටේ උද්ධමනය වැඩි වෙලා තිබෙනවා. නමුත්, එය බරපතළ තත්ත්වයක් නොවී පවත්වාගෙන යන්න, අද මේ පරිපූරක ඇස්තමේන්තුවත් පිටිවහලක් වනවා, ඉවහල් වනවා. මෙහිදී අපි බලාපොරොත්තු වනවා, රුපියල් බිලියන 47ක පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කර ගන්න. මෙයින් අපි කරන්න බලාපොරොත්තු වන්නේ මොකක්ද?

මැද පෙරදිග ඇතිවෙලා තිබෙන යුද්ධය නිසා ජනතාවට යම් අපහසුතාවක් සිද්ධ වෙලා තිබෙනවා නම් ආර්ථික වශයෙන් තවදුරටත් සහන දෙන්න තමයි මේ තුළින් අපි බලාපොරොත්තු වන්නේ. ඒ අනුව අස්වැසුම සහනාධාරය ලබන ජනතාවට රුපියල් බිලියන 6කුත්, ඒ වාගේම ඉන්ධන සහනාධාරය සඳහා රුපියල් බිලියන 41කුත් අපි ලබා දෙනවා. ඒ වාගේම මතක ඇති, මීට පෙර මාස තුනකට අදාළව රුපියල් කෝටි 4,000කට අධික ප්‍රමාණයක් ඉන්ධන සහනාධාරය සඳහා අපි ලබා දුන් බව. ඊට අමතරව පෙට්‍රල් ලීටරයකට රුපියල් 20කුත්, ඩීසල් ලීටරයකට රුපියල් 100ක සහනාධාරයකුත් අපි ලබා දුන්නා. ඒ නිසා ජනතාව අපහසුතාවට පත් වෙද්දි, විවිධ බලවේග විසින් ජන ස්තර පීඩාවට පත් කරද්දි ඒ වෙනුවෙන් රටක් විධියට, රජයක් විධියට අපට කළ හැකි දේ කුමක්ද, ඒ සියල්ල කිරීම වෙනුවෙන් අපි මැදිහත් වෙලා තිබෙනවා.

අපට මොන තරම් ආර්ථික අර්බුද තිබුණත්, ආබාධිත ප්‍රජාව උදෙසා ලබා දෙන දීමනාව අපි වැඩි කළා. ඒ සහනාධාරය ලබා දෙන ආබාධිත ප්‍රජාවත් අපි වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම වැඩිහිටි ජනතාව උදෙසා ලබා දෙන ආධාර මුදල් ප්‍රමාණය රුපියල් 3,000 සිට රුපියල් 5,000 දක්වා අපි වැඩි කළා. ඒ වාගේම මේ සහනාධාරය ලබන පවුල් ප්‍රමාණයත් අපි වැඩි කරලා තිබෙනවා. මේ වනකොට 1,000,000කට ආසන්න අඩු ආදායම්ලාභීන් සහ වැඩිහිටියන් සඳහා අවශ්‍ය ඒ ආධාර මුදල් අපි ලබා දෙමින් තිබෙනවා.

ඒ වාගේම දශක ගණනාවක් තිස්සේ පසුගිය රජයන්ට මහපොළ ශිෂ්‍යාධාරය විධියට දෙන්න පුළුවන්කම ලැබුණේ රුපියල් 5,000ක් දක්වා වූ මුදලක් විතරයි. හැබැයි, අපි එතැන් සිට අය වැය දෙකක් ඉදිරිපත් කරලා අවසන් වනකොට මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 10,000ක් බවට පත් කරලා තිබෙනවා. ඒ අනුව අපි මහපොළ ශිෂ්‍යාධාරය දෙගුණ කරලා තිබෙනවා. ඒ වාගේම ආබාධිත දරුවෙක් විශ්වවිද්‍යාලයකට යනවා නම් ඔහුට ලබා දෙන ආධාරය වැඩි කරන්නත්, ආබාධිත දරුවෙක් පාසල් යනවා නම්, ඒ දරුවාට රුපියල් 5,000ක ආධාරයක් ලබා දෙන්නත්, පරිවාස භාරයේ ඉන්න දරුවෙක් වෙනුවෙන් රුපියල් 5,000ක ආධාරයක් ලබා දෙන්නත්, ඔහු අවුරුදු 18න් පස්සේ එළියට ඇවිල්ලා විවාහ වනවා නම්, ඔහුට නිවසක් හදාගන්න රුපියල් ලක්ෂ 10ක ආධාරයක් ආදී වශයෙන් පෙර නොවූ විරූ පුළුල් බලවේගයක් උදෙසා සහනාධාර ලබා දෙමින්, ආධාර උපකාර කරමින් මේ මැදිහත්වීම අපි සිද්ධ කරමින් තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් අහනවා, මේ ආණ්ඩුව මොනවාද කළේ කියලා. ඒ විතරක් නොවෙයි. මුදල් අච්චු ගහන්නේ නැතුව, මුදල් ණයට ගන්නේ නැතුව අධිවේගී මාර්ග හදන්න අපි පටන් අරගෙන තිබෙනවා. මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය දියුණු කරන්න විශාල මුදලක් වෙන් කරලා සුඛෝපභෝගී බස් රථ ගෙන්වන්නත් අපි සැලසුම් කරලා තිබෙනවා. ඒ වාගේම කර්මාන්ත ක්ෂේත්‍රය දියුණු කරන්න අපි සැලසුම් කරලා තිබෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තාම, අධ්‍යාපනය මිල කරන්න බැහැ. තමුන්නාන්සේලාට මේවා පෙනෙන්නේ නැහැ. මේ සමාජය පරිවර්තනය කරන්න නම්, මේ රටේ අධ්‍යාපනය වෙනස් කළ යුතුයි කියලා අපි කිව්වා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ආරම්භ කරන්න අදාළ ප්‍රතිපත්තිමය තීන්දු අරගෙන, ඒ දේවල් මේ මොහොතේ ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ නිසා මේ රට පොහොසත් රටක් බවට පත් කරලා, ඒ පොහොසත් රටේ ලස්සන මිනිසුන් ජීවත් වන සමාජයක් බවට මේ සමාජය පත් කරන්න, ගරු ජනාධිපතිතුමා ඇතුළු මේ රජය පියවරෙන් පියවර, පියවරෙන් පියවර වැඩ කටයුතු කරමින් ඉන්නවා.

ඒ විතරක් නොවෙයි. හොරකමට, වංචාවට, දූෂණයට තිත තබමින්, හොරකම් කළ, වංචා කළ අයට එරෙහිව අපි නීතිය ක්‍රියාත්මක කරමින් ඉන්නවා. විපක්ෂයේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා, විපක්ෂ නායකතුමා අහනවා, මේ ආණ්ඩුව මොනවාද කළේ කියලා. ඒගොල්ලන්ගේ පවුල්වලට දැනෙනවා ඇති, තමන්ට දැනෙනවා ඇති, වර්තමානයේ මොනවාද වෙමින් තිබෙන්නේ කියලා. ඒ නිසා දැන් මොළය කවල් වෙලා වාගේ තමයි ඒ අය පාර්ලිමේන්තුවේත් කථා කරන්නේ. මේ රටේ ජනතාව දන්නවා, ඔවුන් ලබා දුන් ජන වරමට අනුව මේ ආණ්ඩුව වැඩ කරනවාද, නැද්ද කියලා. ඒ නිසා මේ රටේ පොදු ජනතාවට අපි සහතික වනවා, හොරකම්, වංචා, දූෂණ නැතිව, නීතියේ ආධිපත්‍යය සියලුදෙනාට සාධාරණව ක්‍රියාත්මක වන්න ඉඩකඩ සලසමින්, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරමින්, මේ රට ආසියාවේ දියුණුම රාජ්‍යයක් බවට පත් කරන්න අපට කළ හැකි සියලු දේ ඉතා කැපවීමෙන්, උනන්දුවෙන් ඉටු කරන බවට. ඒ වාගේම වගකීම් සහගතව සහ විද්‍යාත්මකව මේ රට ගොඩනැඟීමට අදාළ සියලු පියවර ගන්නා බවත් මේ රටේ ජනතාවට මතක් කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.27]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පාර්ලිමේන්තුවට එනකොට අපි දැක්කා, පොල්දූව මංසන්ධියේ විශාල පිරිසක් ලොකු උද්ඝෝෂණයක් කරනවා. මම හිතන විධියට, එය ජන අරගළ ව්‍යාපාරයේ උද්ඝෝෂණයක්, මර්දනකාරී PSTB එකට එරෙහිව කරන. මට මතකයි, එදා ගෝඨාභය රාජපක්ෂ එළවපු අරගළය. එදා ඒ අරගළයටත් මේ ජන අරගළ ව්‍යාපාරය එකතු වෙලා තිබුණා, නායකත්වය දුන්නා. හරි හරියට, කරෙන් කර, උරෙන් උර ගැටිලා එදා ජේවීපී එකත් ඒ අරගළයට නායකත්වය දුන්නා. එතකොට මට තිබෙන ප්‍රශ්නය තමයි, එදා PTA එක අහෝසි කරනවා කියපු, ICCPR පනත අහෝසි කරනවා කියපු, පැය 24ක් රඳවා ගැනීමට විරුද්ධව කථා කරපු, තමන්ගේ ආණ්ඩුවක් යටතේ පළමු රාජකාරිය විධියට - එහෙමයි කිව්වේ, නේද, මන්ත්‍රීතුමා? - PTA එක අහෝසි කරනවා කියපු මේ ආණ්ඩුව අද ඊට වඩා බරපතළ PSTB එක ගෙනැල්ලා තිබීම. මේවායේ නම්වල ප්‍රශ්නයක් නැහැ. සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත, එහෙම නැත්නම් ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත කියන මේ නම්වල නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ පනත් කෙටුම්පත්වල අන්තර්ගත වෙලා තිබෙන කරුණු අනුව බරපතළ විධියට මානව හිමිකම් උල්ලංඝනය වනවා. ජනතාවගේ භාෂණයේ අයිතිය, උද්ඝෝෂණය කිරීමේ අයිතිය, රජයට විරුද්ධව ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ අයිතිය, වැඩ වර්ජනය කිරීමේ අයිතිය ආදී මේ සියල්ලක්ම අහෝසි කරලා ගෙනෙන පනත් කෙටුම්පත් තමයි මේවා. දෙවියනේ! අපේ රටේ මිනිස්සු හිතුවාද, ජේවීපී එක ඉන්න ආණ්ඩුවකින් මේ වාගේ පනත් කෙටුම්පතක් අරගෙන එයි කියලා?

අද එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය කියන ඒ හැම එකකින්ම ඉල්ලීම් කරලා තිබෙනවා, මේ පනත් කෙටුම්පත් ගේන්න එපා කියලා. මට ඊයේ නීතිඥ මහත්මයෙක් මෙහෙම කිව්වා. අපි හිතමු, GMOA එකේ වෛද්‍යවරුන් එක් දින වැඩ වර්ජනයක් කරනවා කියලා, එහෙම නැත්නම් මොකක් හරි උද්ඝෝෂණයක් කරනවා කියලා. ඒ අතරතුර යම් කිසි රෝහලක රෝගියකු මිය ගියොත්, ඒ වැඩ වර්ජනය, උද්ඝෝෂණය, එහෙම නැත්නම් අකුරට වැඩ කිරීමේ කාරණය නිසා තමයි ඒ රෝගියා මිය ගියේ කියලා, ඒ වැඩ වර්ජනය කරපු අයව අත්අඩංගුවට ගන්න පුළුවන්, රඳවා තබා ගන්න පුළුවන්. පැය 72 නොවෙයි, ඕනෑම කාලයක් තබා ගන්න පුළුවන්, අමාත්‍යාංශ ලේකම්වරයාට තිබෙන බලතලත් එක්ක. එහෙම නම් මේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරවලින් බලයට ආ, අරගළවලින් බලයට ආ, වැඩ කරන මිනිස්සු ගැන, වෘත්තිකයෝ ගැන කථා කරපු, අවුරුදු 76ක ශාපය ගැන කියපු ජේවීපී එකෙන් මේ මර්දනකාරී PSTB එක ගෙන ඒම පිළිබඳව අපේ රටේ ජනතාවට මම හිතන විධියට තිබෙන්නේ විශාල කනගාටුවක්. විපක්ෂය විධියට අපි භය නැතුව කියනවා, අපේ රජයක් යටතේ අපේ පළමු රාජකාරිය විධියට මේ මර්දනකාරී පනත අහෝසි කරනවා, කරනවාමයි කියන එක.

මන්ත්‍රී ධුර 159ක් තිබෙනවා කියලා, තමන්ට ඕනෑ ඕනෑ අණ පනත් ගෙනැල්ලා හැමදාම බලයේ ඉන්නද ඔබතුමන්ලා කල්පනා කරන්නේ? මීට වඩා බලයක් තිබුණු, යුද්ධය අවසන් කරපු, ආරක්ෂක ලේකම් විධියට හිටපු, හමුදා නායකයෙක් විධියට හිටපු, ගෝඨාභය රාජපක්ෂත් මිනිස්සු ඉදිරියේ දණ නැමුවා. එතුමාටත් දුවන්න වුණා, හැංගෙන්න වුණා, බලය අතහරින්න වුණා. ඒ නිසා මේ 159 කියන ඉලක්කම ලොකුයි කියලා හිතන්න එපා. මිනිස්සු නැඟිටිනකොට, මිනිස්සු විරෝධතාව දක්වනකොට, සුනාමියක් ආවා වාගේ තමයි මේ සේරම කඩාගෙන යන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපට මතකයි, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙනකොටත් මේ වාගේ ජාත්‍යන්තර සංවිධාන, සිවිල් සංවිධාන, වෘත්තිකයෝ කිව්වා, ඒක ගේන්න එපා කියලා. හැබැයි, ඔබතුමන්ලා උද්ධච්ච විධියට ඒ පනත ගෙනාවා. ඊයේ පෙරේදා අභාවප්‍රාප්ත වුණා, නීතිඥ ලාල් විජේනායක මහත්මයා. එතුමා ඔබතුමන්ලාගේ සංවිධානයේ, එහෙම නැත්නම් ඔබතුමන්ලාගේ NPP එකේ විධායක සභිකයෙක්. එතුමාත් කිව්වා, ඒ පනත ගේන්න එපා කියලා. ඔබතුමන්ලා ඒ එකක්වත් ඇහුවේ නැහැ. ඒ කියන දේවල් අහන්නේ නැතුව ඔබතුමන්ලා ඒවා ක්‍රියාත්මක කළා.

ඊළඟට බලන්න, මාධ්‍ය මර්දනය. මට ඊයේ එක සිදුවීමක් ආරංචි වුණා. මට හිතෙනවා, පනත ගෙනෙන්නත් කලින් මේක ක්‍රියාත්මක වෙනවාද කියලා. මොකද, ඊයේ පොල්පිතිගම ප්‍රදේශයේ සේවකයින් පිරිසක් අවුරුදු 12ක සේවා කාලය අවසන් කරලා රජයෙන් යම්කිසි සහනයක්, pension එකක් බලාපොරොත්තුවෙන් ඒ සම්බන්ධ ප්‍රවෘත්ති සාකච්ඡාවක් පන්සලක පවත්වන්න සූදානම් කර තිබුණා. නමුත් බුද්ධි අංශයෙන් ඇවිල්ලා ඒක කරන්න දීලා නැහැ. පොලිසිය ඇවිල්ලා ඒක නතර කර තිබෙනවා. ඒ කියන්නේ පනත ගෙනෙන්න කලින්ම මාධ්‍ය මර්දනය, සිවිල් සංවිධාන මර්දනය ක්‍රියාත්මක කරන්න පටන් ගෙන තිබෙනවාය කියන එක බොහොම පැහැදිලියි.

ඔයගොල්ලන් අවුරුදු 76ක සාපය, සාපය කියනවා. මට කලින් කථා කළ කථිකයෙක් කියා තිබුණා, 1990 ගණන්වලින් පසුව වෙළෙඳ ගිවිසුම් අත්සන් කර නැහැ කියලා. අත්සන් කරලා නැහැ නොවෙයි, ඔයගොල්ලන් අත්සන් කරන්න දුන්නේ නැහැ. සිංගප්පූරු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම අත්සන් කරන්න දුන්නේ නැහැ; ETCA එක අත්සන් කරන්න දුන්නේ නැහැ; MCC ගිවිසුම අත්සන් කරන්න දුන්නේ නැහැ. ඒ විධියට ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් එකක්වත් අත්සන් කරන්න දුන්නේ නැහැ. පාරට බැස්සා; වැඩ වර්ජන කළා; උද්ඝෝෂණ කළා; ගිනි තැබුවා. ඒ ගිවිසුම්වලට විරුද්ධව කටයුතු කළා. එසේ වසර 30ක් තිස්සේ මේ රටේ වෙළෙඳ ගිවිසුම් අත්සන් කරන්න දුන්නේ නැති, රටට ආයෝජකයින් ගෙනෙන්න අවස්ථාව දුන්නේ නැති පිරිසක් තමයි අද බලයට පත් වෙලා තිබෙන්නේ.

අද සෘජු විදේශ ආයෝජන ගැන කථා කරනවා. මම ආඩම්බරයෙන් කියනවා, සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ නියෝජ්‍ය ඇමතිවරයා හැටියට මම කටයුතු කරද්දී ලංකාවේ අද තිබෙන විශාලතම අපනයන සැකසුම් කලාපය වන බිංගිරිය අපනයන සැකසුම් කලාපය හදපු බව. ඔබතුමන්ලා ආණ්ඩු බලය අරගෙන අද වනවිට අවුරුදු දෙකක් ගත වෙලා තිබෙනවා. බිංගිරිය අපනයන සැකසුම් කලාපය තුළ අක්කර 1,000ක් තිබෙනවා. මේ අවුරුදු දෙක තුළ ඔබතුමන්ලා එක සෘජු විදේශ ආයෝජනයක් මේ රටට ගෙනාවාද කියලා මට කියන්න. සෘජු විදේශ ආයෝජන ගැන කථා කරනවා. නමුත් අපි හදපු සැකසුම් කලාපයට ආයෝජනයක් ගෙනෙන්න බැරි වෙලා තිබෙනවා. ඔන්න ආණ්ඩුවේ තත්ත්වය. සෘජු විදේශ ආයෝජන ගෙනෙන්න පුළුවන්ද, මර්දනකාරී අණපනත් තිබෙන රටකට? අද වනකොට ව්‍යාපාරිකයෙකුට ව්‍යාපාරයක් කරන්න බැහැ, අපනයනකරුවෙකුට අපනයනයක් කරගන්න බැහැ. ඔවුන් හොරු විධියට, ජාවාරම්කාරයෝ විධියට, මංකොල්ලකාරයෝ විධියට දකින්නේ. ඔවුන්ට කරදර කරනවා; බාධා කරනවා. ඒ නිසා අපට පැහැදිලිව පෙනෙනවා, මේ ආණ්ඩුව කටයුතු කරමින් යන්නේ සෘජු විදේශ ආයෝජන ගෙනෙන්නවත්, අපනයන ආර්ථිකය වැඩි කරන්නවත්, රාජ්‍ය ආදායම වැඩි කරන්නවත් නොවෙයි, තමන්ගේ මර්දනකාරී අණපනත් තුළින් බලය රැක ගැනීමේ වුවමනාව මතම පමණයි කියා. මර්දනකාරී අණපනත්වලින් බලය රකින්න පුළුවන්

කියලා ඔබතුමන්ලා හිතනවා නම් ඒක කරන්න බැහැ කියා අපි කියනවා. මොකද, ඊට වඩා ගව් ගණනක් ඉස්සරහින් ජනතාව ඉන්නවා, අපි නොවෙයි. සජබයවත්, විපක්ෂයේ අනෙකුත් පක්ෂවත් නොවෙයි, ජනතාව ඉස්සරහට එනවා. ඒක මතක තියා ගන්න. ඔය සේරම බාධක කඩාගෙන ජනතාව ඉස්සරහට එනකොට අර සුනාමිය ආවා වාගේ තමයි. ඒක කාටවත් වළක්වා ගන්න බැහැ.

දැන් ඇඟලුම් කර්මාන්තය ආශ්‍රිත ආර්ථිකයක් ගැන කිව්වා. කවුද ඇඟලුම් කර්මාන්තශාලා ආර්ථිකයට ගෙනාවේ? ඒකෙන් අපනයන ආදායම වැඩි වෙලා කිව්වා. ඔය කියන අවුරුදු 76ක සාපය කාලයේ තමයි ඇඟලුම් කර්මාන්තශාලා ඇති කර එම ආර්ථිකය මේ රටට ගෙනැල්ලා, අපනයන ආර්ථිකයක් ගෙනැල්ලා, අපනයන සැකසුම් කලාප ආරම්භ කරලා, එම ආර්ථිකය නිර්මාණය කළේ. ඒ, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව; අපේ ආණ්ඩුව; අපේ නායකයෝ. එදා චීනයෙනුත් ඇවිල්ලා කටුනායක අපනයන සැකසුම් කලාපය සම්බන්ධව බලලා ගියා, ඒ model එක ක්‍රියාත්මක කරන්න. අපි වාගේ නොවෙයි, අද අක්කර විසි තිස්දහසේ අපනයන සැකසුම් කලාප චීනයේ හදනවා. වෙනම නගර හදනවා, වෙනම කලාප හදනවා. හැබැයි, ඒගොල්ලනුත් අපෙන් තමයි ඉගෙන ගෙන ගියේ. නමුත් අපේ රටට ඉස්සරහට යන්න බැරිව ගියා. ඒකට බලපෑ ප්‍රධානම ප්‍රශ්නය වුණේ අවුරුදු 30ක් ඇතුළත ඔයගොල්ලන් මේ රට ආපස්සට ගෙන යන්න සන්නද්ධ ව්‍යාපාරයක් හැටියට,- ඉන්දියානු විරෝධය කියයි, අර විරෝධය කියයි, ගිවිසුම්වලට විරෝධයි කියයි. එහෙම තමයි ඒ කාලයේ කටයුතු කළේ.

ඔබතුමන්ලා බලයට ඇවිත් ආණ්ඩුව අවුරුදු දෙකක් කළා. බලන්න, අපි දන්නා ඉතිහාසය තුළ සෘජු හා වක්‍ර බදුවලින් වැඩියෙන්ම වක්‍ර බදු තිබුණු කාලය වන්නේ මේ අවුරුදු දෙකයි. ඔයගොල්ලන් දවස ගණනේ බදු වැඩි කරනවා. ඊයේ ඉන්ධන මිලත් වැඩි කළා නේද, මන්ත්‍රීතුමා? මම හිතන විධියට මෙතැන ඉන්න මේ මන්ත්‍රීතුමාට ඉන්ධනවලට රුපියල් 25,000ක්වත් යනවා, පුත්තලමට ගිහින් එන්න. මේ අනික් පැත්තේ වාඩි වෙලා ඉන්න මන්ත්‍රීතුමා මොනරාගල. අනික් මන්ත්‍රීතුමා රත්නපුරේ. මම හිතන විධියට රුපියල් විසි-තිස්දහසක් විතර ඉන්ධනවලට වැය වනවා. රුපියල් 30,000ක් යනවාලු, බුත්තල ඉඳලා එන අපේ ධර්මසේන මන්ත්‍රීතුමාට. ආරියවංශ මන්ත්‍රීතුමාටත් ඒ වාගේයි. මන්ත්‍රීවරුන්ට එච්චර වියදමක් යනවා නම් සුළු ව්‍යාපාරයක් කරන කෙනෙක්, තමන්ගේ මෝටර්සයිකලයෙන් රස්සාවට යන කෙනෙක්, ත්‍රී වීලර් එකක් පදින මනුස්සයෙක්, සුළු නිෂ්පාදනයක් කරන මනුස්සයෙක්, ස්වයං රැකියාවක් කරන මනුස්සයෙක්, වූන්පාන් බිස්නස් එක කරන කෙනෙක් කොහොමද මේ ඉන්ධන මිල දරා ගන්නේ? ලෝකයේ වැඩිම ඉන්ධන මිල තිබෙන රට බවට අද වනකොට අපේ රට පත් වෙලා. ඒ වුණාට ඔයගොල්ලන් කටින් බනල හිටෙව්වේ නම් කොහොමද? ඔයගොල්ලන් කොහොමද කිව්වේ? නැවෙන් බාන ගණනට තෙල් ටික දෙන්න පුළුවන් කිව්වා. එහෙම කිව්වා නේද, මන්ත්‍රීතුමා? එහෙම කිව්වා. අන්න, හිටපු බලශක්ති ඇමතිතුමාත් ඔළුව වනමින් - හිස සලමින් - ඒක අනුමත කරනවා. *[බාධා කිරීමක්]* නැව් ගාස්තු වැඩි වෙලාද? නැව් ගාස්තු වැඩි වෙලාලු. එහෙම නැතුව වෙන ප්‍රශ්නයක් නොවෙයි. නැවෙන් ගොඩබාන මිලටම තෙල් දෙනවා කියලා බලයට ආපු ආණ්ඩුව, අද වරායට නැවක් ගෙන්වා ගැනීමටවත් නොහැකි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. දැන් නැව එනතුරු මහ බලාගෙන ඉන්න තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. දැන් මේ රටේ ගෑස් නැහැ. කහ ගෑස් සිලින්ඩරත් නැහැ. නිල් ගෑස් සිලින්ඩරත් නැහැ. මේවා තමයි කළමනාකරණයේ දුර්වලතා. නැව් එන්නේ නැති ප්‍රශ්නය තිබෙන්නේ ලංකාවට විතරද? වෙනත් රටවලට නැව් පිළිබඳ ප්‍රශ්න නැද්ද? ලංකාවේ විතරද ගෑස් ප්‍රශ්න තිබෙන්නේ? ඔව්, ලංකාවේ විතරයි මේ ප්‍රශ්න තිබෙන්නේ. මොකද, මේ ආණ්ඩුවට ඒවා කළමනාකරණය කරගන්න බැහැ.

ඔබතුමන්ලාට මේ කටයුතු කර ගන්න බැරි නිසා තමයි supply එක නිසි පරිදි පවත්වාගෙන යන්න බැරි වෙලා තිබෙන්නේ. කල්තියා ඇණවුම් කළා නම්, මේ තත්ත්වයන් පිළිබඳව නිසි පරිදි අධ්‍යයනය කර සැලසුම් සහගතව කටයුතු කළා නම්, ඔබතුමන්ලාට නැව් ටික කළමනාකරණය කරගන්නත්, ගෑස් සහ තෙල් අවශ්‍ය පරිදි ගෙන්වා ගන්නත් පුළුවන් වෙනවා. එම නිසා අපට බොහොම පැහැදිලිව කියන්න තිබෙන්නේ මර්දනකාරී අණපනත් ගෙනැල්ලා ආණ්ඩුව දිගටම පවත්වාගෙන යන්න පුළුවන් කියලා ඔබතුමන්ලා හිතනවා නම් ඒවා සුම්මා තමයි කියන එකයි.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මංජුල සුගත් රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.38]

ගරු මංජුල සුගත් රත්නායක මහතා
(மாண்புமிகு மஞ்சுல சுகத் ரத்நாயக்க)
(The Hon. Manjula Sugath Rathnayaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අපි පාර්ලිමේන්තුව තුළ විවාදයට ගනු ලබන්නේ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඉදිරිපත් කර ඇති රෙගුලාසි සහ 2026 අංක 7 දරන පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳවයි.

විශේෂයෙන්ම ආනයන හා අපනයන (පාලන) පනත යටතේ මෙවැනි රෙගුලාසි ගෙන ඒමේ අවශ්‍යතාව මේ මොහොතේදී ඉතා වැදගත් වෙනවා. භාණ්ඩ ආනයනය කිරීමේදී ප්‍රමිතිකරණය සහ ගුණාත්මකභාවය තහවුරු කර ගැනීම මෙහිදී විශේෂ වෙනවා. ඒ වාගේම, ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම, මහජන සෞඛ්‍ය හා පරිසරය සුරක්ෂිත කිරීම මෙහි ප්‍රධාන අරමුණක්.

මෙම රෙගුලාසි යටතේ මෝටර් රථ සඳහා භාවිත කරන ටයර් සහ ත්‍රිරෝද රථ සඳහා භාවිත කරන වායු පිරවූ ටයර් සම්බන්ධයෙන් පරීක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කිරීම තමයි සිදු කරන්නේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ප්‍රමිති නියම කිරීම තුළින් දේශීය නිෂ්පාදකයින්ට සාධාරණ හා තරගකාරී පසුබිමක් සහතික කිරීමට හැකියාව ලැබෙනවා. අනෙක් අතට, පාරිභෝගික ආරක්ෂාව සහ සුරක්ෂිතතාව තහවුරු කරගැනීමේ හැකියාව ලැබෙනවා.

අනෙක් කාරණය තමයි, පරිපූරක ඇස්තමේන්තුව. ඒ සම්බන්ධයෙන් කියන්න තිබෙන්නේ මේකයි. අපි කවුරුත් දන්නවා, පසුගිය කාලයේ ඇති වූ මැද පෙරදිග යුද්ධය නිසා ලෝකයේ අනෙක් රටවලට වාගේම ලංකාවට විශේෂයන්ම ජනතාවගේ ජීවන රටාව වෙනස් කරන්න යම් පීඩනයක්, බලපෑමක් එල්ල කර තිබෙන බව. ඒ පීඩනය අවම කිරීම සඳහා යම් රටක ආණ්ඩුවක් ක්‍රියා කරන්න ඕනෑ. අපි දන්නවා, මේ වනකොට සමහර විදෙස් රටවල ආර්ථිකයට විශාල බලපෑම් එල්ල වෙමින් තිබෙන බව. ඒ වාගේම ඒ රටවල ජනතාවගේ නැඟී සිටීම් සිදු වෙමින් පවතිනවා. නමුත්, ලංකාවේ අපි ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විධියට මෙයට ඉතා හොඳින් ශක්තිමත්ව මුහුණ දීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් කැබිනට් මණ්ඩලය සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සියලුදෙනාම එකතු වෙලා ඊට අදාළ මැදිහත්වීම් කරමින් සුදුසු ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා.

[ගරු මංජුල සුගත් රත්නායක මහතා]

විශේෂයෙන්ම අපි දන්නවා, යුද්ධය පවතින මේ මොහොතේ ඉන්ධන ප්‍රශ්නය වැඩිපුරම බලපාන බව. ඒ නිසා ඉන්ධන සඳහා - විශේෂයෙන්ම ඩීසල් - සහනාධාරයක් ලබා දීමට මෙම පරිපූරක ඇස්තමේන්තුවෙන් මුදල් යොදවනවා. ඊට අමතරව, අස්වැසුම වැඩසටහනෙහි ලියාපදිංචි දුප්පත් සහ අන්ත දුගී කියන කාණ්ඩ යටතේ ඉන්න ජනතාවට අමතර දීමනාවක් ගෙවන්න සැලසුම් කර තිබෙනවා. ඒ ක්‍රියාමාර්ගය ගැනීමෙන් ජනතාවට ලොකු සහනයක් ලැබෙයි. ආණ්ඩුව විධියට අපි ජනතාවට මේ සහන විතරක් නොවෙයි, තව විශාල සහන ලබා දී තිබෙනවා.

අපි ගත්තොත්, දැන් අස්වැසුම දීමනා වැඩි කර තිබෙනවා. මෙම පරිපූරක ඇස්තමේන්තුවෙන් අමතර මුදලකුත් ලබා දෙනවා. ඊට අමතරව, වැඩිහිටි දීමනාව වැඩි කර තිබෙනවා, වකුගඩු දීමනාව වැඩි කර තිබනවා. අනෙක් පැත්තෙන්, රාජ්‍ය සේවය ගත්තොත්, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කර තිබෙනවා. ඒ වාගේම වාර්ෂික වැටුප් වැඩි කිරීමකුත් සිදු කරලා තිබෙනවා.

අනෙක් පැත්තෙන් ගත්තොත්, ගම්වල පාරවල් හදන්න වෙනදාටත් වඩා මුදල් විශාල ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. ප්‍රජා සංවර්ධන සභා හරහා අවශ්‍යතා මොනවාද කියා හඳුනා ගනිමින් ඒ සඳහා මුදල් වෙන් කිරීම් සිදු වෙනවා. පළාත් සභාවල ගත්තොත්, ප්‍රතිපාදන වෙන් කිරීම් විශාල වශයෙන් සිදු කර තිබෙනවා. නැඟෙනහිර පළාත් සභාව ගත්තොත්, 2025 වර්ෂයට වඩා 2026 වර්ෂයේදී තුන්ගුණයක් මුදල් වෙන් කර තිබෙනවා, සෞඛ්‍ය, අධ්‍යාපන සහ පශු සම්පත් ආදී විවිධ ක්ෂේත්‍ර සඳහා. මහජනතාව ගැන හිතන ජනතාවාදී ආණ්ඩුවක් තමයි තිබෙන්නේ.

නිවාස ගත්තොත්, නිවාස 19,000කට ආසන්න ප්‍රමාණයක් "දිවිවා" සුළි කුණාටුව නිසා විනාශයට පත් වුණා. ඒ සඳහා රුපියල් ලක්ෂ 50 බැගින් වෙන් කරලා ඒ නිවාස හදාගෙන යනවා. ඊට අමතරව, "යතිවර මාපිය නිවහන" ව්‍යාපෘතිය යටතේ, ගෞරවනීය ස්වාමීන් වහන්සේලාගේ දෙමව්පියන්ට -ස්ථිර නිවසක් නොමැති - නිවාස සාදා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වනවා. ඒ යටතේ, විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කය ගත්තොත්, එවැනි නිවාස 23ක් ඉදිකිරීමට යෝජනා වෙලා තිබෙනවා. එයින් 6ක වැඩ ආරම්භ කළා, පසුගිය දිනවල.

අනෙක් පැත්තෙන්, පාතාලය මැඩ පවත්වමින් යනවා. වෙනදාට වඩා ඒ සම්බන්ධයෙන් මැදිහත් වනවා, ආරක්ෂක අමාත්‍යාංශය. ඒ වාගේම තමයි වෙනදාට වඩා ශීඝ්‍රයෙන් හොරු, වංචාකාරයෝ, කොමිස් ගහන අය වැඩිපුර ප්‍රමාණයක් අල්ලාගෙන යනවා, ඒ අයට දඬුවම් පමුණුවනවා. ඒ නිසා ජනතාවට ආණ්ඩුව කෙරෙහි යම් විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව කාටත් සමානව නීතිය ක්‍රියාත්මක කරන ආණ්ඩුවක් විධියටත්, ඒ වාගේම ජනතාවට සහන සලසන ආණ්ඩුවක් විධියටත් මේ වෙනකොට ජනතාව පිළිගෙන ඉවරයි.

වැඩ නතර වෙච්ච අධිවේගී මාර්ග බොහොමයක් තිබුණා. දැන් ඒවායේ වැඩ කටයුතු නැවත ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම තමයි, ගොඩනැඟිලි හදලා සෑහෙන්න කාලයක් ගත වුවත් ඒ ගොඩනැඟිලිවල ඉතුරු වැඩ කටයුතු කරලා තිබුණේ නැහැ. එවැනි ගොඩනැඟිලිවල වැඩ නැවත ආරම්භ කරන්න මුදල් වෙන් කර තිබෙනවා. අම්පාර දිස්ත්‍රික්කය ගත්තොත්, අවුරුදු ගණනාවක් තිස්සේ මහජන පොළෙහි වැඩ කටයුතු නතර වෙලා තිබුණා. එහි වැඩ නැවත ආරම්භ කරලා ලබන දෙසැම්බර් වනකොට එම වැඩ කටයුතු අවසන් කරගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම තමයි, සංස්කෘතික මධ්‍යස්ථානවලට අදාළ ගොඩනැඟිලිවල වැඩ අවසන් කරන්න මුදල් වෙන් කිරීම් කර තිබෙනවා. මේ සියල්ලටම හේතු වුණේ ආණ්ඩුව ගෙන යන නිවැරදි මූල්‍ය කළමනාකරණ වැඩ පිළිවෙළයි. එය තමයි ඉතාම වැදගත් වන්නේ ආර්ථික ස්ථාවරභාවය සඳහා.

ගරු විපක්ෂ නායකතුමා කිව්වා, "දෙයියන්ගේ නාමයෙන් ජනතාවට වැඩ කරන්න" කියලා. ඇත්තවශයෙන්ම අපි ජනතාවගේ නාමයෙන් තමයි වැඩ කටයුතු කරන්නේ. "හිටියොත් හොඳට හැදී, දෙවියොත් නමට වදී" කියනවා වාගේ දෙවියොත් අපිට ආශීර්වාද කරනවා, මේ කරන වැඩ පිළිවෙළත් එක්ක. ඒ නිසා පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ජනතාවට ලබා

දීමේ අරමුණ වෙනුවෙන් අපි ආණ්ඩුව විධියට කටයුතු කරනවා කියන පණිවුඩය ලබා දෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හබීබ් රිෆාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[ප.ප. 2.48]

ගරු නීතිඥ හබීබ් රිෆාන් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹபீப் றிபான்)
(The Hon. Habeeb Rifan, Attorney-at-Law)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, யுத்தத்திற்குப் பின்னரான காலப்பகுதியில் கிழக்கு மாகாணத்தில் வாழுகின்ற முஸ்லிம் மக்கள் தமது பல்லாயிரக்கணக்கான ஏக்கர் காணிகளையும் ஆழ்கோள் எல்லைகளையும் இழந்து, இன்று நிலப் பிரச்சினையுடன் அதனோடு தொடர்பான சுகாதாரம், கல்வி, பொருளாதாரம் மற்றும் கலாசாரம் உள்ளிட்ட பல்வேறு பிரச்சினைகளுக்கும் முகங்கொடுத்து வருகின்றனர். கடந்த கால யுத்த சூழ்நிலையில் தீர்க்கப்படாமல் இருந்த அம்பாறை மாவட்டத்திலே வட்டமடு, தீகவாபி, பொத்துவில், கல்முனை வடக்கு, கருங்கா என்ற பல்வேறு நிலம் தொடர்பான பிரச்சினைகள் தொடர்ந்தும் தீர்க்கப்படாமலே இருக்கின்றன. அதேபோல், திருகோணமலை மாவட்டத்திலே முறிகண்டி, புல்மோட்டை, குரங்குபாஞ்சான், மூதூர் ஜபல்மலை, தோப்பூர், கருமலையூற்று, முத்துநகர் போன்ற முஸ்லிம் பிரதேசங் களிலுள்ள காணிகளில் இருந்து பலாத்காரமாக வெளியேற்றப் பட்ட முஸ்லிம்கள் இன்றும் மீள்குடியேற்றப்படாமலே இருந்து வருகின்றனர்.

உண்மையிலே, மட்டக்களப்பு மாவட்டத்திலே முஸ்லிம்கள் ஆயுதப் போராட்ட காலப்பகுதியில் பயங்கரவாத நடவடிக்கைகளினால் தங்களது 62க்கும் மேற்பட்ட சிறிய, பெரிய கிராமங்களில் இருந்து இன சுத்திகரிப்புச் செய்யப்பட்ட நிலையில், அவர்கள் இன்னும் குறித்த பிரதேசத்தில் மீளக் குடியமர முடியாமல் இருக்கின்றனர். அம்மாவட்டத்தில், இருநூறுவில், உருகாமம், கல்லியங்காடு, கித்துள் உள்ளிட்ட கிராமங்களையும், அதேபோன்று கல்குடா பிரதேசத்திலே மீறானாஊற்று, கிருமிச்சை, வாகனேரி, ஜப்பார்திடல், சாலம்பச்சேனை, ஹிஜ்ராபுரம், காரமுனை, உச்சோடகல், காணிக்கவேற்பை, குப்புலாக்கொடி, மதுரங்குளம், தோணிக்கல், வடமுனை, பங்குரான, அவக்கர்குடா, அக்கிரானை, சந்தியாறு, மாங்கேணி, ஊத்துச்சேனை என்ற பல கிராமங்களையும் மக்கள் இழந்து, அவர்கள் மீள் குடியேறுவதில் பல சிக்கல்களை முகங்கொடுத்து வருகின்றனர்.

குறிப்பாக, நிருவாக ரீதியிலே மட்டக்களப்பு மாவட்டத்திலே 28 சதவீதமான முஸ்லிம்கள் வாழ்ந்து வருகின்றனர். அம்மாவட்டத்திலுள்ள 14 பிரதேச செயலாளர் பிரிவுகளில் 4 பிரதேச செயலாளர் பிரிவுகள் முஸ்லிம் பிரதேசத்தை உள்ளடக்கி இருக்கின்றன. அம்மாவட்டத்தில் சுமார் 2,854 சதுர கிலோமீற்றர் நிலப்பரப்பு காணப்படுகின்றது. இதில் 28 சதவீதமான நிலப்பரப்பு கட்டாயமாக முஸ்லிம்களுக்குப் பகிர்ந்தளிக்கப்பட வேண்டும் என்ற அவசியத்தில் அரசாங்கம் இருக்கின்றது. ஆனால், மாவட்டச் செயலக அறிக்கையின் பிரகாரம், 4.2 சதவீதமான நிலப்பரப்பே வழங்கப்பட்டுள்ளது. அதாவது, 120 சதுர கிலோமீற்றர் பரப்பே அறிக்கையின் பிரகாரம் வழங்கப் பட்டுள்ளது. ஆனால், உண்மையிலே 42 கிலோமீற்றர் காணியில் முஸ்லிம் சமூகம் அங்கே வாழ்ந்து வருகின்றது. அது மொத்த நிலப்பரப்பில் 1.5 சதவீதமாகும். சுமார் 35,619 சனத்தொகையைக் கொண்ட கோரளைப்பற்று மத்தி பிரதேச செயலகம் வெறும் 6 சதுர கிலோமீற்றருக்குள் உள்ளடக்கப் பட்டுள்ளது.

ஆனால், 29,128 சனத்தொகையைக்கொண்ட கோறளைப்பற்று வடக்கு - வாகரை பிரதேச செயலகப் பிரிவுக்கு 589 சதுர கிலோமீற்றர் நிலப்பரப்பு வழங்கப்பட்டுள்ளது. அதேநேரம், 53,880 சனத்தொகையைக் கொண்ட காத்தான்குடி பிரதேச செயலகப் பிரிவுக்கு வெறுமனே 2.56 சதுர கிலோமீற்றர் நிலப்பரப்பு வழங்கப்பட்டுள்ளது. அதேபோல, இன்னுமொரு தமிழ் பிரதேசமான மண்முனைப்பற்று பிரதேச செயலகப் பிரிவு 36,737 சனத்தொகையைக் கொண்டிருக்கின்றது. அதற்கு 352 சதுர கிலோமீற்றர் நிலப்பரப்பு வழங்கப்பட்டுள்ளது. ஏறாவூர் பிரதேச செயலாளர் பிரிவை எடுத்துக்கொண்டால், அங்கு 46,351 சனத்தொகை காணப்படுகின்றது. அது வெறும் 3 சதுர கிலோமீற்றர் நிலப்பரப்புக்குள் அடக்கப்பட்டுள்ளது. சுமார் 29,096 சனத்தொகையைக் கொண்ட கோறளைப்பற்று மேற்கு பிரதேச செயலகப் பிரிவு வெறும் 28 சதுர கிலோமீற்றர் நிலப்பரப்புக்குள் அடக்கப்பட்டுள்ளது.

இவ்வாறான நிருவாக ரீதியான முறையற்ற வளப் பங்கீடுகள், காணிப் பங்கீடுகள் என்பன தொடர்ந்தும் எமது மக்களை மனஉளைச்சலுக்கு ஆளாக்கியுள்ளது. அவர்கள் பல்வேறு பிரச்சினைகளுக்கும் முகங்கொடுக்கின்றனர். இத்தகைய புறக்கணிப்புகளுக்கு எதிராக எமது கட்சியான ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் அரசியல் ரீதியாகவும், ஜனநாயக ரீதியாகவும் போராடி வருகின்றது.

2000ஆம் ஆண்டிலே, இந்தக் காணிப் பிரச்சினைகளைத் தீர்க்க வேண்டுமென உருவாக்கப்பட்ட பனம்பலான ஆணைக்குழுவின் விதந்துரையின் பிரகாரம் நாட்டில் புதிதாக 8 புதிய பிரதேச செயலகங்களை உருவாக்குவதற்கான முன்மொழிவு முன்வைக்கப்பட்டது. அதில் 6 பிரதேச செயலகங்கள் வர்த்தமானி அறிவித்தலின் பிரகாரம் இயங்கிக் கொண்டிருக்கின்றன. கோறளைப்பற்று மத்தி, கோறளைப்பற்று தெற்கு பிரதேச செயலகங்கள் இன்னும் வர்த்தமானியில் பிரசுரிக்கப்படவில்லை. ஆனால், காலாகாலமாக கோறளைப்பற்று மேற்கு, கோரளைப்பற்று மத்தி ஆகிய பிரதேச செயலகங்களின் காணி எல்லைகள் தொடர்பாக தீர்க்கமான ஒரு முடிவை எட்டுவதற்கான எந்தப் பொறிமுறையும் இதுவரை கொண்டுவரப்படவில்லை. இதில் கவலைக்குரிய விடயம் என்னவென்றால், பனம்பலான ஆணைக்குழுவின் சிபாரிசின் பிரகாரம், கோரளைப்பற்று மத்திக்கு 240 சதுர கிலோமீற்றர் நிலப்பரப்பு வழங்கப்பட்டிருந்தபோதும், இப்பொழுது வெறும் 6 சதுர கிலோமீற்றருக்குள்ளே கோறளைப்பற்று மத்தி பிரதேச செயலகம் முடக்கப்பட்டுள்ளது.

அதேவேளை, 176.6 சதுர கிலோமீற்றர் பரப்பளவைக் கொண்ட கோறளைப்பற்று மேற்கு - ஓட்டமாவடி பிரதேச செயலக நிருவாக எல்லைக்குள் காணப்பட்ட 5 கிராம சேவகர் பிரிவுகளை கோறளைப்பற்று தெற்கு பிரதேச செயலகத்துடன் இணைத்ததன் காரணமாக ஓட்டமாவடி - கோரளைப்பற்று மேற்கு பிரதேச செயலகம் 28 சதுர கிலோமீற்றருக்குள் முடக்கப்பட்டுள்ளது. குறித்த 5 கிராம சேவகர் பிரிவுக்குள் வாழுகின்ற மக்கள் பல்வேறு சிரமங்களையும், கெடுபிடிகளையும் நிருவாக ரீதியான பிரச்சினைகளையும் எதிர்கொண்டு வருகின்றனர்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, குறித்த பனம்பலான ஆணைக்குழுவின் அறிக்கையின் பின்னர், கோறளைப்பற்று மத்திக்கு வழங்கப்பட்ட காணி அதிகாரத்தை குறித்த பிரதேச செயலகத்தினால் பயன்படுத்த முடியவில்லை. ஆனால், கோறளைப்பற்று தெற்கு பிரதேச செயலகம் கோறளைப்பற்று மேற்கிலிருந்து பறிக்கப்பட்ட 5 கிராம சேவையாளர் பிரிவுகளையும் உள்ளடக்கி வர்த்தமானி அறிவித்தல் எதுவும் இல்லாமல் குறித்த காணி அதிகாரத்தைப் பயன்படுத்தி வருகின்றது. இது அதிகாரத் துஷ்பிரயோகமாகும்.

யுத்தத்தினால் பாதிப்படைந்த பிரதேசங்களான ஜப்பார்திடல், புனானை, சாலம்பைச்சேனை, ஊத்துச்சேனை, அக்கிரானை, கள்ளிச்சை, வடமுனை போன்ற கிராமங்களைச் சேர்ந்த மக்களை அவர்களது பூர்வீக நிலங்களிலிருந்தும் பயிர்ச்செய்கை நிலங்களிலிருந்தும் விரட்டியடிப்புச் செய்வதற்கான பல்வேறு நடவடிக்கைகளை அதிகார ரீதியாகச் செய்து வருகின்றனர். 2009ஆம் ஆண்டு யுத்தம் நிறைவடைந்த பின்னர், ஜப்பார்திடலில் மீளக்குடியேறிய பரம்பரையாக வாழ்ந்து வந்த 6க்கும் மேற்பட்ட குடியிருப்பாளர்மீது இதுவரையில் வழக்குத் தாக்கல் செய்யப்பட்டுள்ளது. சீனி முகம்மது என்பவரது நிலத்தை அத்துமீறிக் கையகப்படுத்தி அதில் ஒரு சகோதர இனத்தின் வழிபாட்டுத்தலம் அமைத்துக் கொடுக்கப்பட்டுள்ளது. தற்பொழுது அதன் அருகிலுள்ளவர்களின் காணிகளுக்கு எதிராகவும் வழக்குத் தாக்கல் செய்யப்பட்டுள்ளது. அப்துல் லத்தீப் என்பவருக்கு எதிராக வாழைச்சேனை நீதவான் நீதிமன்றத்திலே வழக்குத் தாக்கல் செய்யப்பட்டிருக்கின்றது.

இதேபோல சாலம்பைச்சேனை, பொத்தானை போன்ற பகுதிகளில் பரம்பரை பரம்பரையாக - பூர்வீகமாகக் குடியிருந்தவர்களை வெளியேற்றுவதற்கான மறைமுக மற்றும் நேரடி நடவடிக்கைகள் அரச இயந்திரத்தின் உதவியுடன் நடைபெற்று வருகின்றன. இதேபோன்று காரமுனை, உசன் ஏற்றம், திருக்கொண்டியாமடு போன்ற பிரதேசங்களில் பூர்வீகமாக வாழ்ந்து மீளக்குடியேறிய அப்பாவி மக்கள்மீது நூறுக்கும் மேற்பட்ட வழக்குகள் தாக்கல் செய்யப்பட்டிருக்கின்றன. ஒரு வழக்குத் தாக்கல் செய்து, அதில் வெற்றியடைந்தால் மீண்டும் வழக்குத் தாக்கல் செய்கின்ற நிலைமை வந்திருக்கின்றது. எனவே, மேற்படி பிரச்சினைகளை இந்த அரசாங்கம் உடனடியாகத் தீர்க்க வேண்டும். இதற்காக பனம்பலான ஆணைக்குழுவால் முன்மொழியப்பட்ட கோறளைப்பற்று மத்திக்கான அதிகாரத்தை வர்த்தமானியில் பிரசுரிப்பதன் மூலமாக தீர்வு வழங்கப்படல் வேண்டும்.

அதுதவிர, கோறளைப்பற்று மேற்கு - ஓட்டமாவடி பிரதேச செயலகத்திலிருந்து பிரிக்கப்பட்டு தற்காலிக இணைப்புச் செய்யப்பட்ட 5 கிராம சேவையாளர் பிரிவுகளையும் மீளவும் கோரளைப்பற்று மேற்குடன் இணைப்பதற்கான நடவடிக்கை

[ගරු නීතිඥ හබීබ් රිෆාන් මහතා]

මේර්කොල්ෆප්පඩල් වේණ්ඩුම්. පොත්තානෙ, ஜப்பார்திடல், சாலம்பைச்சேனை, காரமுனை, கள்ளிச்சை போன்ற கிராமங்களில் தற்போது எதிர்கொண்டு வருகின்ற மீள்குடியேற்ற முயற்சிகளுக்கு எதிரான அனைத்து நடவடிக்கைகளையும் இல்லாமல் செய்வதுடன், அவர்களுக்குக் காணி உரிமை வழங்கப்பட்டு, மீள்குடியேற்றுவதற்கான அனைத்து நடவடிக்கைகளையும் இந்த அரசாங்கம் செய்ய வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. KINS NELSON left the Chair and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[අ.භා. 2.57]

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි ද අද දින විවාදයට ගනු ලබනවා. ඊට කලින්, එක පැත්තකින් විපක්ෂයේ නාමල් රාජපක්ෂ මහත්මයාත්, විපක්ෂයේ සජිත් ප්‍රේමදාස පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙකුත් කියපු අසත්‍ය කථා ටික මුලින්ම නිවැරැදි කළොත් හොඳයි කියා මම හිතනවා. අපි සජිත් මහත්මයාගේ පාර්ශ්වයට උත්තරය දුන්නොත්, මෙන්න මෙහෙම දෙයක් තමයි කියන්න තිබෙන්නේ. අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව මර්දනය ක්‍රියාත්මක කරනවාලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුද ඒ කථා කරන්නේ? මේ පුතාණෝගේ පියාණෝ තමයි රණසිංහ ප්‍රේමදාස. 60,000ක් මරපු ඒ ප්‍රේමදාසගේ පරම්පරාව තමයි මේ මර්දනය ගැන කියන්නේ. ලක්ෂයකට වඩා රැඳවුම් කඳවුරුවල තියපු ප්‍රේමදාසගේ පාර්ශ්වය තමයි අප සම්බන්ධයෙන් මර්දනය ගැන කථා කරන්නේ. මේවා විහිළු නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විහිළු!

ඊට පස්සේ නාමල් රාජපක්ෂ කථා කරමින් කිව්වේ මොකක්ද? ආණ්ඩුව මර්දනය ගෙනෙනවාලු. නාමල් රාජපක්ෂ මහත්මයාට මම මේ කාරණය කියන්න ඕනෑ. කවුද මේ මර්දනය ගැන කථා කරන්නේ නාමල්? එතුමා දැන් පොලිස් රාජ්‍යයක් ගැන කථා කරනවා. තාජුඩීන් මැරුවේ කවුද නාමල්? මුළු රටම දන්නවා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

කියලා. ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් කරලා ඝාතනය කළේ කවුද?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

බාප්පයි. පෝද්දල ජයන්තගේ අතපය කඩලා මරන්න හැදුවේ කවුද?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

බාප්පයි. කීත් නොයාර්ගේ අතපය කඩලා මරන්න හැදුවේ කවුද?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

බාප්පලා. ඊට පස්සේ උපාලි තෙන්නකෝන් - මාධ්‍යවේදීන් ටික - අතපය කඩලා මරන්න හැදුවේ කවුද?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මහින්ද රාජපක්ෂලා, ගෝඨාභය රාජපක්ෂලා. ඒ විතරක් නොවෙයි. වතුර ඉල්ලපු රතුපස්වල මිනිසුන්ට වෙඩි තියලා ඝාතනය කළේ කවුද? අනේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඔයාලා, බාප්පලා, තාත්තලා. ඒ විතරක් නොවෙයි. කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ උද්ඝෝෂණයේදී වෙඩි තියලා තරුණයකු මැරුවේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඔය ගෝඨාභයලා, මහින්ද රාජපක්ෂලා නේ. ඒ අය දැන් සාතන, මර්දන ගැන කථා කරනවා. පොලීසිය කුලියාපිටිය පැත්තේ ගෙදරකට පැනලා ගෙයක් මංකොල්ල කෑවාලු. අපි කියනවා, ඒක වැරැදි වැඩක් කියලා. පොලීසිය නොවෙයි කවුරු කළත් ඒක වැරැදියි. ඒවා නොවෙන්න ඕනෑ. හැබැයි මේ මහත්තුරු කොහොමද? ගෙයක් නොවෙයි කොල්ල කෑවේ; මුළු රටම කොල්ල කෑවා නේ. මුළු රටම කොල්ල කෑවා. ගරු ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වා නේ, රට වටිටපු ආර්ථික ඝාතකයෝ කවුද කියලා. මහින්ද රාජපක්ෂ, අජිත් නිවාඩ කබ්‌රාල්, නාමල්ගේ බාප්පා, අර රට පැනලා ඉන්න හාදයා, බැසිල් රාජපක්ෂ; ඒ ගොල්ලන් ගැන නේ කිව්වේ. මේ ගෙයක් කොල්ල කාපු එකක් ගැන කියනවා, රටක් කොල්ල කාලා. ඒ විතරක් නොවෙයි. දැන් කථා කරනවා, තෙල් පෝලිම්, ගෑස් පෝලිම් ගැන. කොහේද නාමල්, තෙල් පෝලිම්, ගෑස් පෝලිම්? වැලිකඩ තිබෙනවාද? කොහේද තෙල් පෝලිම්, ගෑස් පෝලිම් තිබෙන්නේ? 2022ට යන්නකෝ. අරගළය ආවේ ඕපපාතිකවද? නැහැ නේ. තෙල් පෝලිම්වල ඉඳලා, සති ගණන් පෝලිම්වල ඉඳලා මිනිස්සු මැරුණා නේ. ගෑස් පෝලිම්වල මිනිස්සු මැරුණා නේ. ගෑස් ටැංකි පුපුරලා මිනිස්සු මැරුණා නේ. ගෑස් ලීප් පුපුරලා මැරුණා නේ. ඒක නේ ඇත්ත කතන්දරය. එදා තෙල් ටික දෙන්න බැරි වුණා නේ. දැන් ලෝක වෙළෙඳ පොළේ තෙල් ප්‍රශ්නයක් තිබෙනවා, යුදමය තත්ත්වයක් එක්ක. තෙල් නිෂ්පාදනය වෙනවා. හැබැයි, හෝමුස් සමුද්‍ර සන්ධිය වහලා; ගෙන්වා ගන්න බැහැ. ඒක ලෝකයටම බලපාපු ප්‍රශ්නයක්. හැබැයි, 2022දී කොහොමද? නාමල්ලාගේ, ගෝඨාභයලාගේ කාලයේ එහෙම ප්‍රශ්නයක් තිබුණේ නැහැ නේ. ලෝකයේ තෙල් හිඟයක් තිබුණේ නැහැ නේ. ඒ කාලයේ කොළඹ වරාය ආසන්නයෙන් තෙල් නැව් එහෙ ගියා, මෙහෙ ගියා. හැබැයි, ඒ තෙල් බාගන්න ඩොලර් මිලියන 30ක් තිබුණේ නැහැ නේ. එතකොට නේ තෙල් පෝලිම් තිබුණේ. එතකොට නේ ගෑස් පෝලිම් තිබුණේ. ඒවා නේ නාමල් කියන්න ඕනෑ. දැන් මැරිලා ඉපදිලා වාගේ බයිලා ගහනවා. ටොන්පව කියනවා.

මම හිතන විධියට, පව කියලා වැලිකඩට යන්න වෙනවා නම්, ඒ කප් එක ගහන්නේ නාමල්. එතුමා 2029දී - අනාගත - වැලිකඩ ජනාධිපතිතුමා. ඒ විතරක් නොවෙයි, පොලීසියේ ඝාතන ගැන කථා කරනවා, මේ නාමල්. මේගොල්ලන්ගේ සුරතලා, හිටපු පොලිස්පති දේශබන්දුගේ මෙහෙයුමකදී දකුණු පළාතේ හෝටලයකට ගිහිල්ලා වෙඩි තැබුවා නේ. හරියට ත්‍රස්තවාදීන් එක්ක යුද්ධ කරනවා වාගේයි නේ, හෝටලයට වෙඩි තියාගෙන, වෙඩි තියාගෙන ගිහිල්ලා එතැනදී පොලිස් නිලධාරියෙකුත් මැරුණේ. ඒ විතරක් නොවෙයි, නාමල්. ඔබතුමන්ලාගේ කාලයේ ආයුධ පෙන්වන්න ගිය එක්කෙනෙක්වත් ආවේ නැහැ නේ. මේ අවුරුදු දෙකයි මාස ගණන ඇතුළතදී එහෙම දේවල් වෙලා නැහැ නේ. දැන් පාරාජිකා වෙච්ච, කුජීත වෙච්ච සමහර කණ්ඩායම් එක එක අරගළ ව්‍යාපාර කියලා නැති බිල්ලෙක් මවනවා නේ. කොහේද, මර්දන පනත් ගෙනැල්ලා තිබෙන්නේ? අපිට රටේ ජනතාව තුනෙන් දෙකක ජන වරමක් දුන්නේ නීති හදලා හරි මේ රටේ නීතිය හා විධානය ඇති කරන්න කියලා. ඒක තමයි අපි මේ කරමින් ඉන්නේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සංශෝධනය කරන්න ඕනෑ. අපි විපක්ෂයෙන් අහනවා, ඒක කරන්න ඕනෑ නැද්ද කියලා. අපි ඒ පනත සංශෝධනය කරනවා. ඒකට තමයි අපට ජන වරම දුන්නේ.

කුජීත වෙච්ච පොඩි පොඩි සුන්බුන් කල්ලි දැන් ඒක අල්ලාගෙන නැති බිල්ලෙක් මවන්න හදනවා. අපිට ජනවරම දීලා තිබෙන්නේ අවශ්‍ය නීති සම්පාදනය කරන්න. ඒකට තමයි දීලා තිබෙන්නේ. ජනතාව අපිට චෝදනා කරන්නේ, ඔයගොල්ලන්ට දීපු බලය පාවිච්චි කරන්නේ නැහැ කියලා. හැබැයි, අපි ඒ බලය අවශ්‍ය ප්‍රමාණයට අවශ්‍ය මාත්‍රාවෙන් පාවිච්චි කරනවා. ඒක තමයි අපේ වෙනස. සුදු වැන් එවපු, මාධ්‍යවේදීන් මර්දනය කරපු අය දැන් නීතිය ගැන කථා කරනවා. ඒ කාලයේ මාධ්‍ය ආයතනවලට බලපෑම් කළා නේ. "සිරස" ආයතනයට බෝම්බ ගැහුවා නේ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

"සියත" ආයතනයට ගිනි තැබුවා නේ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

දැන් මේ විපක්ෂයේ ඉන්න දෙගොල්ලන්ටම එහෙම මර්දන ඉතිහාසයක් තිබෙන්නේ. නාමල්ලාත් එකයි, සජිත්ලාත් එකයි. මේගොල්ලන් නේ අවුරුදු දෙකයි මාසයක් වාගේ වෙන මේ ආණ්ඩුවෙන් අහන්නේ, මොනවාද කළේ කියලා. තිබෙන කඳුළු ගෑස් කල් ඉකුත් - expire- වෙලා. අපි එක උද්ඝෝෂණයකටවත් පහර දුන්නේ නැහැ. දැන් උද්ඝෝෂණත් අඩුයි. අපි උද්ඝෝෂණ එකකටවත් පහර දුන්නේ නැහැ නේ. ඒ නිසා නේ නයි සාධුලා වඩින්නේ, නයි හැරමිටිත් එක්ක. අපි නැහැ නේ බාධා කරන්නේ. ඕනෑ උද්ඝෝෂණයක් කරන්න පුළුවන්, ඒකට පහසුකම් තිබෙනවා. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව 24වෙනි දා පොල්දූව හන්දියට එන්න කිව්වා. අපි මොකක්ද කළේ? ගරු ජනාධිපතිතුමා කිව්වා, ගේට්ටුව ඇරලා දෙන්න කියලා පාර්ලිමේන්තුව වටලන්න. එහෙම නේ, අපි පහසුකම් සැපයුවේ. *[බාධා කිරීමක්]* අනේ, ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා අහගෙන ඉන්න. *[බාධා කිරීමක්]* ඒක තමයි ඇත්ත. දැන් මර්දනයක් ගැන කථා කරනවා. මර්දනය ගැන කථා කරනකොට උතුරේ කෙනාට රිදෙනවා. මලිත්ට ගහනකොට චංචලාට රිදෙනවා වාගේ, නාමල්ට ගහනකොට අර්චුනාට රිදෙනවා. ඒක අපට තේරුම් ගන්න පුළුවන්. ගරු අර්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමා බාධා කරන්නේ නැතුව ඉන්න.

එදා "යුක්තිය" මෙහෙයුම කියලා දේශබන්දුලා පාසල් ළමයින්ගේ කිරිපල්ල පවා අත ගෑවා. එහෙම තත්ත්වයක් නේ තිබුණේ. අහිංසක මිනිස්සු බන්ධනාගාරගත කළා. එහෙම මර්දනයක් කළ නාමල්ලා, අද මර්දනය ගැන කථා කරනවා. කොහේද නාමල්, දැන් මර්දනයක්? වැලිකඩ තිබෙනවාද මර්දනය?

ඊළඟට, නාමල් ඇඹිලිපිටියේ ගංජා හේනක් ගැන කථා කරනවා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමා පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා ඒ කථාව මෙතැන කියන්නේ නැතිව පුළුවන් නම් එළියේ කියන්න. මම අභියෝග කරනවා. මට ගංජා හේනක් තිබෙනවා කියලා පුළුවන් නම් එළියේදී කියන්න. මම විශ්වාස කරනවා, එළියේදී කියන්න වෙන්නේ නැහැ කියලා. මොකද, එළියට යන්න වෙන්නේ නැහැ නේ. එතුමාට කියන්න වෙන්නේ පාර්ලිමේන්තුව ඇතුළේම තමයි. මම එතුමාට අභියෝග කරනවා, පුළුවන් නම් අර නිල් පාට බස් එකට නඟින ගමන් කියන්නකෝ. ඔට්ටුයි කියන්න බැහැ. නාමල්ලා සහ සජිත්ගේ ගෝලයෝ අද මර්දනයක් ගැන කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටේ ආර්ථිකය ඉතාම හොඳින් කළමනාකරණය කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපේ ගරු අනුර කුමාර දිසානායක සහෝදරයාට සියයට 95කට වැඩි ගෞරවයක් යන්න ඕනෑ. මොකද, මේක වැටිච්ච රටක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා අපට හම්බ වුණු රට ගැන. කෝටි 80,000ක OD එකක් තිබුණු රටක් නේ හත්ඉලව්වේ අපට හම්බ වුණේ. කෝටි 80,000ක OD එකක් තිබුණු රටේ භාණ්ඩාගාරය පිරී ඉතිරී යනවා කියලා විපක්ෂයෙන්ම

[ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා]

කිව්වා. මේ කාලය තුළ අභ්‍යන්තර කම්පන, බාහිර කම්පන කොතරම් ආවාද? ලෝක බැංකුවම කිව්වා "දිටිවා" සුළි කුණාටුව නිසා ඩොලර් බිලියන 4.5ක හානියක් සිද්ධ වෙලා තිබෙනවාය කියලා. හැබැයි කෝටි 50,000ක් - බිලියන 500ක් - යොදවලා අපි රට යථා තත්ත්වයට ගත්තා. නාමල් රාජපක්ෂ "දිටිවා" ව්‍යසනය ගැන කියනවා. නාමල්, ඔබතුමන්ලාගේ ආණ්ඩු තිබුණා නේ. රත්නපුරයේ ගංවතුරෙන් අවතැන් වුණු මිනිස්සුන්ට තවම සහන දීලා නැහැ, ඒවා දෙන්නෙත් අපි. ඒක තමයි ඇත්ත.

අපි ඉතාම සීරුමාරුවට රටේ ආර්ථිකය තැනකට ගෙනැල්ලා තිබෙනවා. ආර්ථික වර්ධන වේගය සියයට 5ක මට්ටමට ගෙනැල්ලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඩොලර් බිලියන 6.9ක විදේශ සංචිත ප්‍රමාණයක් තිබෙනවා. එය ලබන මස අවසන් වෙනකොට ඩොලර් බිලියන 7 පනිනවා. ඒ විතරක් නොවෙයි. ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කර තිබෙනවා. අය වැය හිඟය සියයට 5.4කට ගෙනැල්ලා තිබෙනවා. දශක ගණනාවකට පස්සේ ප්‍රාථමික ගිණුමේ සියයට 5.4ක අතිරික්තයක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපි සංවර්ධන කටයුතු ඉතා වේගයෙන් ආරම්භ කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
(මාණ්පුමිකු ෂාන්ත පත්ම කුමාර சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි රටේ වේගවත් සංවර්ධනයක් ඇති කරලා තිබෙනවා. ඔබතුමා දන්නවා අපි මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත-මීරිගම කොටසේ වැඩ ආරම්භ කළ බව; පොතුහැර-රඹුක්කන කොටසේ වැඩ ආරම්භ කළ බව. හෙට අනිද්දා කුරුණෑගල-ගලේවෙල කොටසේ වැඩ ආරම්භ කරනවා. මම නියෝජනය කරන රත්නපුරයේ රුවන්පුර අධිවේගී මාර්ගයේ කහතුඩුව-ඉංගිරිය කොටසේ වැඩ දෙසැම්බර් මාසයේ පටන් ගන්නවා. ඒ විතරක් නොවෙයි, රත්නපුරය දක්වා යන කැලණිවැලි දුම්රිය මාර්ගයේ මූලික කටයුතු දැන් ආරම්භ කරලා තිබෙනවා. එම ව්‍යාපෘතියේ සමාජ සමීක්ෂණය අවසන් කරලා, ශක්‍යතා අධ්‍යයනය දෙසැම්බර් මස අවසන් කරනවා. ඊට පස්සේ පාර එළන එක පටන් ගන්නවා. යෝධ සංවර්ධනයක් නේ සිදු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සංවර්ධනයේ ප්‍රතිලාභ ජනතාවට ලබා දෙනවා. අද මෙම බිලියන 47ක පරිපූරක ඇස්තමේන්තුව ගෙනැල්ලා තිබෙන්නේ ඉදිරි මාස දෙක සඳහා ඩීසල් සහනාධාරය සහ අස්වැසුම් ප්‍රතිලාභීන් වෙනුවෙන් සහන ලබා දෙන්න. රජය අස්වැසුම් ප්‍රතිලාභය ලබන දිළිඳු සහ අන්ත දිළිඳු අයට දෙන දීමනා වැඩි කරලා තිබෙනවා. ඇත්ත කතන්දරය ඒකයි.

නාමල් රාජපක්ෂලා කියනවා, ඉන්දියාවේ සහ ජපානයේ ආයෝජකයෝ ආවේ නැහැලු; ආයෝජන ව්‍යාපෘති දාලා ගියාලු. ඒ පට්ටපල් බොරු. උන්නැහේලාගේ 2021-2022 කාලයේ නේ නිමල් සිරිපාල ජපන් සමාගම්වලින් මිලියන 2,000ක කප්පම් ඉල්ලා තිබුණේ. ඒ සමාගම් ව්‍යාපෘති 11ක් දාලා ගියා. හැබැයි, දැන් එම ව්‍යාපෘති 11ම පටන් අරගෙන සංවර්ධන කටයුතු කෙරෙනවා නේ. විපක්ෂයේ ඉන්න සජිත්ගේ ගෝලයා කිව්වා, එදා කළ මහා සංවර්ධනයක් ගැන. මම අහනවා, එතුමාගේ දිස්ත්‍රික්කයේ එදා රනිල් ආරම්භ කරනවාය කියපු වොක්ස්වැගන් කර්මාන්තශාලාව කොහේද මහත්තයෝ තිබෙන්නේ කියලා. මැරිලා ඉපදිලා වාගේයි මේ නාමල්ලා සහ සජිත්ගේ කණ්ඩායම කථා කරන්නේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මොන බාධක ආවත් අපේ ගමන අපි යනවා, බුරන බුරන බල්ලාට ගල් ගහ ගහා ඉන්නෙත් නැහැ. එහෙම වුණොත් අපේ වැඩේ කරන්න හම්බ වෙන්නේ නැහැ; කවදාවත් අපේ ගමන යන්න වෙන්නේත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ඇති කරලා මිසක් අපි මේ සටන නවත්වන්නේ නැහැ කියලා ප්‍රකාශ කරමින්, මට කාලය වෙන් කිරීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම කියලා බැන්නා. ඒ නිසා මට point of Order එකක් raise කරන්න අවස්ථාවක් දෙන්න, ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

කියන්නකෝ, එළියට ගිහින් ඒවා කියන්න කියලා. මිනිස්සු ගහලා පන්නයි. ගරු මන්ත්‍රීතුම, පුළුවන් නම් එළියට ගිහින් කියන්නකෝ. මේ පාර්ලිමේන්තුව,- *[බාධා කිරීම්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා. *[බාධා කිරීම්]*

[ප.ව. 3.10]

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரව தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டு மிக்க மகிழ்ச்சியடைகின்றேன்.

நமது நாட்டில் அமைந்துள்ள இயற்கை வளங்களைப் பாவித்து, நமது நாட்டின் எதிர்காலத்துக்கான சிறந்த திட்டங் களைச் செயற்படுத்த வேண்டிய கால கட்டத்தில் நாம் இருக்கின்றோம். நமது நாடு ஒரு விவசாய நாடாகும். நமது நாட்டில் விவசாயிகளால் உற்பத்தி செய்யப்படுகின்ற நெல்லைச் சிறந்த முறையில் கொள்வனவு செய்து, நமது நாட்டின் பொருளாதார வளர்ச்சிக்கும் விவசாயிகளின் வாழ்வாதாரத்துக்கும் பங்களிப்புச் செய்யக்கூடிய சிறந்த தீர்வுத் திட்டங்களை மாண்புமிகு ஜனாதிபதி அவர்களும் அரசாங்கமும் சமர்ப்பிக்கவுள்ள வரவு செலவுத்திட்டத்தில் முன்வைக்க வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

உதாரணத்துக்கு, அம்பாறை மாவட்டத்தில் 3 போகமாக கொள்வனவு செய்யப்பட்ட நெல், நெல் சந்தைப்படுத்தும் சபையின் 83 களஞ்சியசாலைகளில் களஞ்சியப்படுத்தப்பட்ட நிலையில் இருக்கின்றது. கிட்டத்தட்ட 70,275 மெற்றிக்தொன் நெல் இவ்வாறு களஞ்சியப்படுத்தப்பட்ட நிலையில் இருக்கின்றது. இந்த நெல்லை உடனடியாக களஞ்சிய சாலைகளிலிருந்து விடுவிப்பதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டும். ஒன்றரை வருட காலமாக எந்தெந்த நெற்களஞ்சிய சாலைகளில் எவ்வளவு நெல் இருப்பு இருக்கின்றது என்பது தொடர்பான தகவல்கள் அடங்கிய ஆவணத்தை நான் இந்தச் சபையில் ***சமர்ப்பிக்கின்றேன்.**

எனவே, அடுத்த போக வேளாண்மைக்கு முன்னர், எமது விவசாயிகளின் நெல்லைக் கொள்வனவு செய்து, நாட்டுக்கு வருமானம் ஈட்டக்கூடிய வகையில் புதிய திட்டங்களை முன்வையுங்கள்! இல்லையெனில், விவசாயிகள் எதிர்நோக்கும் பிரச்சினைகள் நமது நாட்டில் பாரிய தாக்கத்தை ஏற்படுத்தும் என்பதை விவசாயிகள் சார்பில் இந்தச் சபையில் சொல்ல விரும்புகின்றேன்.

பெரும்பான்மைப் பலத்துடன் ஆட்சிக்கு வந்தவர்கள் நீங்கள். தாங்கள் ஆட்சிக்கு வந்தால் பயங்கரவாதத் தடைச் சட்டத்தை இல்லாமல் செய்வோமென நீங்கள் வாக்குறுதியளித்தீர்கள். தற்போது பயங்கரவாதத்திலிருந்து அரசைப் பாதுகாப்பதற்கான சட்டமூலம் ஒன்றை உருவாக்கி யுள்ளீர்கள். இந்தச் சட்டமூலம் மக்களின் குரல்களை நசுக்குவதுடன், அவர்களின் உரிமைகளையும் பறிக்கும். இதன்மூலம் மீண்டும் பொலிஸாருக்கும் இராணுவத்தினருக்கும் அதிகாரங்களை வழங்கி, நமது நாட்டை மீண்டும் ஒரு யுத்த சூழ்நிலைக்குள் கொண்டுவருவதற்கான ஒரு செயற்பாடாகவே நாங்கள் இதனைப் பார்க்கக்கூடியதாக உள்ளது.

புதிய சட்டத்தின்மூலம் நீதிமன்றத்தின் தலையீடுகளின்றி பொலிசாரே நேரடியாக ஒருவரைக் கைதுசெய்து தடுப்புக் காவலில் வைப்பதற்கான அதிகாரம் வழங்கப்பட்டுள்ளதாக குற்றஞ்சாட்டப்பட்டுள்ளது. இலங்கை அரசாங்கத்தின் புதிய பயங்கரவாத எதிர்ப்புச் சட்டமூலத்தால் கைதிகள் சித்திர வதையை அனுபவிக்கும் அபாயம் உள்ளதாக இலங்கை அரசாங்கத்துக்கு ஐக்கிய நாடுகள் சபையின் மனித உரிமைகள் ஆணையம் கடும் எச்சரிக்கை விடுத்துள்ளது. இதேவேளை, சர்வதேச மனித உரிமைகள் அமைப்புகள், தொண்டு நிறுவனங்கள், இலங்கையின் சிவில் சமூக அமைப்புகள், அரசியல் கட்சிகள், இலங்கை சட்டத்தரணிகள் சங்கம் எனப் பல அமைப்புகளும் பயங்கரவாதத்திலிருந்து அரசைப் பாதுகாப்பதற்கான சட்டமூலம் மீளாய்வு செய்யப்பட வேண்டுமென கோரிக்கை விடுத்த வண்ணம் உள்ளன. எனவே, இச்சட்டமூலத்தை மீளாய்வு செய்யும் செயற்பாட்டில் அரசாங்கம் ஈடுபட வேண்டும்.

இலங்கை அரசைப் பாதுகாக்கும் புதிய சட்டமூலம் தொடர்பான தகவல்களைக் கூறாவிட்டால், 7 ஆண்டுகள் சிறை செல்லவேண்டிய நிலை ஏற்படுமென சர்வதேச மன்னிப்புச் சபை எச்சரித்துள்ளது. இலங்கை அரசாங்கத்தால் முன்மொழியப்பட்டுள்ள ஒழுங்கமைக்கப்பட்ட குற்றச்செயல் களைத் தடுத்தல் சட்டமூலத்தை உடனடியாகத் திரும்பப் பெறுமாறு இலங்கை அரசாங்கத்துக்கு சர்வதேச மன்னிப்புச் சபை கூறியுள்ளது. இச்சட்டமூலம் அதிகாரிகளுக்கு வரம்பற்ற அதிகாரங்களை வழங்கி, அடிப்படை மனித உரிமைகளைப் பலவீனப்படுத்தும் என்றும் எச்சரித்துள்ளது. சர்வதேச மன்னிப்புச் சபை 27.10.2026இல் வெளியிட்ட அறிக்கையில், தேசிய மக்கள் சக்தி அரசாங்கத்தால் கொண்டுவரப்படும் சட்டங்களில் மிகவும் கவலைக்குரிய சட்டங்களில் ஒன்றாக இதனை விபரித்துள்ளது. இச்சட்டத்தின் அடிப்படையில், சந்தேக நபர்களை விசாரணையின்றி 2 ஆண்டுகள் வரை சிறையில் அடைக்க முடியும் என்றும் மூத்த பொலிஸ் அதிகாரிகளிடம் பெறப்பட்ட வாக்குமூலங்களை நீதிமன்றத்தில் சாட்சியங்களாகப் பயன்படுத்த அனுமதிக்க முடியும் என்றும் நீதிமன்ற நடவடிக்கைகள் குறித்த ஊடகச் செய்திகளுக்கு கட்டுப்பாடுகளை விதிக்க முடியும் என்றும் சர்வதேச மன்னிப்புச் சபை சுட்டிக்காட்டியுள்ளது. மேலும், நீதிமன்ற உத்தரவு எதுவுமின்றி பொலிஸார் சோதனைகளை மேற்கொள்ளவும், தொலைபேசிப் பதிவுகள், சந்தாதாரர் விபரங்கள், சாதனங்களின் இருப்பிடத் தரவுகள் உள்ளிட்ட தனிப்பட்ட தகவல்களைப் பெறவும் அனுமதிக்கும் விதிகள் குறித்து அந்த அமைப்பு தனது தீவிர கவலையை வெளியிட்டுள்ளது.

முன்மொழியப்பட்டுள்ள சட்டமூலமானது, இலங்கையின் பயங்கரவாதத் தடுப்புச் சட்டத்தின்கீழ் - PTA - முன்னதாக இடம்பெற்ற தன்னிச்சையான தடுப்புக்காவல், சித்திரவதை மற்றும் பிற மனித உரிமை மீறல்களுக்கு வழிவகுத்த சூழல்களை மீண்டும் உருவாக்கக்கூடும் என்றும் எச்சரிக்கப்பட்டுள்ளது. மக்கள் ஆதரவு இருக்கும்பொழுது, ஏன் நீங்கள் இவ்வாறான பயங்கரவாதம் சார்ந்த சட்டமூலத்தை மீண்டும் கொண்டு வருகின்றீர்கள் என்ற கேள்வியை நான் இந்த அரசாங்கத்திடம் கேட்க விரும்புகின்றேன். உதவிப் பொலிஸ் அத்தியட்சகர் - ASP - அல்லது அதற்கு மேற்பட்ட தரத்திலுள்ள பொலிஸ் அதிகாரிகளிடம் அளிக்கப்படும் வாக்குமூலங்களை ஆதாரமாக ஏற்றுக்கொள்ள அனுமதிக்கும் விதியும் மற்றொரு முக்கிய கவலையாகச் சுட்டிக்காட்டப் பட்டுள்ளது. நீங்கள் மற்றவர்களைப் பழிவாங்குவதை நோக்கமாகக் கொள்ளாமல் நல்ல விடயங்களைச் செய்யுங்கள்! உங்களுக்கு மக்களுடைய ஆணை கிடைத்திருக்கின்றது. அந்த ஆணையை வைத்து நீங்கள் நல்ல விடயங்களைச் செய்வதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டும்.

அடுத்து, எங்களுடைய முஸ்லிம் சமூகம் சார்ந்த ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். கோட்டாபய ராஜபக்ஷ அவர்களின் அரசாங்க காலத்தில், அவருக்கு முஸ்லிம்கள் வாக்களிக்கவில்லை என்பதற்காக கொவிட் தொற்றால் மரணமடைந்த முஸ்லிம்களின் ஜனாஸாக்கள் எரிக்கப்பட்டன. இந்த உலகத்தில் எங்கும் நடக்காத ஒரு கொடூரம் இந்த இலங்கை நாட்டில் நடந்தது. அவ்வாறு எரிக்கப்பட்டவர்களின் தகவல்கள் தொடர்பில் எங்களால் கேட்கப்பட்ட கேள்விக்கு பதிலளிக்க முடியாத ஓர் அரசாங்கமாக இந்த அரசாங்கம் இருக்கின்றது. இந்த அரசாங்கத்துக்கு முஸ்லிம் சமூகம்

** පුස්තකාලයේ තබා ඇත.*

** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා]

பாரியளவில் உதவி செய்திருக்கிறது. மேற்குறித்த விடயத்துடன் சம்பந்தப்பட்டவருக்கு நீங்கள் அண்மையில் பதவி உயர்வு வழங்கி இருக்கிறீர்கள். அதாவது, அமைச்சின் செயலாளர் பதவி கொடுத்து இருக்கிறீர்கள்.

நான் இங்கு இன்னுமொரு சம்பவம் பற்றி சொல்ல வேண்டும். மீண்டும் ஒருமுறை முஸ்லிம் சமூகத்தின் மத உணர்வுகளும் உரிமைகளும் கேள்விக்கு உட்படுத்தப் படும்பொழுது, அரசாங்கம் மௌனம் காத்துக்கொண்டு இருக்கின்றது. அதாவது, எங்களுடைய முஸ்லிம் பெண் சுகாதார ஊழியர்களின் 'ஹிஜாப்' சம்பந்தமான விஷயம். இது பற்றி உங்களுக்குத் தெரியும். கல்முனை ஆதார வைத்தியசாலையில் சுகாதாரப் பணியாளர்களாக நியமனம் பெற்ற ஆறு முஸ்லிம் சகோதரிகள் 'ஹிஜாப்' அணிந்து சென்றமைக்காக அவர்களை அஷ்ரப் தள வைத்தியசாலைக்கு மாற்றி இருக்கிறார்கள். எங்களுக்கு ஒரு நீதி; அவர்களுக்கு ஒரு நீதி என்ற நிலைமை இருக்கக் கூடாது. இந்த நாட்டின் சனாதிபதி ஒருவர்தான். அவர்தான் எங்களுடைய அநுர குமார திஸாநாயக்க அவர்கள்! அவருக்கு நாங்கள் வாக்களித்தாலும் வாக்களிக்காவிட்டாலும், எதிர்க்கட்சியினர் உட்பட இந்த நாட்டின் எல்லா மக்களுக்கும் அவர்தான் சனாதிபதி! அரசாங்கமும் அவருடையதுதான். எனவே, நீங்கள் எல்லா சமயத்தவர்களையும் சமத்துவமான முறையில் நடாத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

முஸ்லிம்கள் இந்த நாட்டின் இரண்டாம் தரப் பிரஜைகள் அல்லர். அவர்களுக்கும் ஏனைய சமூகங்களைப் போன்றே மத சுதந்திரம், சமத்துவம், கண்ணியம் மற்றும் அடிப்படை உரிமைகள் உள்ளன. உண்மையிலேயே அரசாங்கம் இன, மத போதமற்ற ஆட்சியை முன்னெடுக்க விரும்பினால், முஸ்லிம்களின் உரிமைகள் தொடர்பான பிரச்சினைகளில் தெளிவான நிலைப்பாட்டையும் வெளிப்படைத் தன்மையையும் உறுதிப்படுத்த வேண்டும். இது எந்தவோர் அரசியல் கட்சிக்கும் எதிரான போராட்டம் அல்ல. இது ஒரு சமூகத்தின் உரிமை சார்ந்த கேரிக்கை! எனவே, எங்களுடைய உரிமையை நீங்கள் வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

நான் இன்னுமொரு விடயத்தைச் சொல்ல வேண்டும். எங்களுடைய அம்பாறை மாவட்டத்தின் பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் இருக்கின்ற உப தபால் அலுவலகம் சம்பந்தமாக, தன்னுடைய பாராளுமன்ற உறுப்பினர் பதவியை இராஜினாமா செய்த எம்.எஸ். அப்துல் வாசித் அவர்கள் 08.09.2026 அன்று இந்தச் சபையில் சொன்னார். அவருடைய கணக்கின்படி, 2024ஆம் ஆண்டு குறித்த Sub-Postmaster 20,000க்கும் மேற்பட்ட கடிதங்களை விநியோகிக்காமல் தனது வீட்டில் வைத்திருக்கிறார். அவர் தொடர்பில் பல்வேறு முறைப்பாடுகள் இருக்கின்றன. அவரை உடனடியாக சேவையிலிருந்து இடைநிறுத்தி, விசாரணைகள் நடைபெற்றுக் கொண்டு இருக்கின்றது. இது தொடர்பான ஆவணத்தை நான் பாராளுமன்றத்துக்குச் *சமர்ப்பிக்கின்றேன்.

அவருக்கு எதிராக அந்தப் பிரதேசத்திலுள்ள மக்கள் எல்லோரும் ஒன்றுகூடி இருக்கிறார்கள். வருடக்கணக்கில் கொடுக்க வேண்டிய வங்கிக் கடிதங்கள் எல்லாவற்றையும் தனது வீட்டில் வைத்திருந்தமை தொடர்பில் விசாரணை நடத்தி, அவரை வேறோர் இடத்துக்கு மாற்றும்படி கோரிய பொத்துவில் பிரதேச சபையின் உப தவிசாளரினதும் அதன் உறுப்பினரினதும் கடிதங்களையும், Assistant Superintendent of Posts, குறித்த உப தபால் அதிபருக்கு எதிரான குற்றச்சாட்டுக்கள் தொடர்பில் சமர்ப்பித்த அறிக்கையையும் நான் இந்தச் சபையில் ***சமர்ப்பிக்கின்றேன்.**

அவரை மீண்டும் அதே இடத்தில் பதவியில் அமர்த்தி இருப்பதாக இன்று கடிதம் வந்திருக்கிறது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நேற்றுக்கூட நான் கௌரவ பிரதி அமைச்சர் அவர்களை தொலைபேசியில் தொடர்புகொண்டு கதைத்தேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙම කාරණය පමණක් සඳහන් කර මම කථාව අවසන් කරන්නම්. මම දැන් නියෝජ්‍ය ඇමතිතුමියටත් කථා කළා. அவரை உடனடியாக வேறு இடத்துக்கு மாற்றுங்கள்! சுற்றுலாத்துறைக்குப் பெரும் வருமானத்தை ஈட்டித்தருகின்ற பசறிச்சேனையிலுள்ள உப தபால் அலுவலகம் என்பது வெளிநாட்டு சுற்றுலாப் பயணிகளுடன் தொடர்புடையது. எனவே, அவரை வேறோர் இடத்துக்கு மாற்ற வேண்டும்; அந்த மக்களுடைய கோரிக்கையை நிறைவேற்ற வேண்டும். இன்று அவர் கடமையேற்கச் சென்றபோது, மக்கள் எல்லோரும் கூடி அவரை எதிர்த்து இருக்கிறார்கள். 20,000 கடிதங்களை அவருடைய வீட்டில் பல ஆண்டுகளாக வைத்திருக்கிறார். அவர் மீதான குற்றச்சாட்டுகள் அனைத்தையும் இங்கு சொல்வதற்கு எனக்கு நேரம் போதாது. எனவே, கௌரவ வெகுசன ஊடக பிரதி அமைச்சர் அவர்கள் இது தொடர்பில் விசேட கவனத்தைச் செலுத்தி, குறித்த உப தபால் அதிபரை வேறோர் இடத்துக்கு மாற்றி, நல்ல ஒருவரை அங்கு நியமிக்க வேண்டுமெனக் கேட்டு விடைபெறுகின்றேன். நன்றி!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.20]

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා අද දින සභාවේදී ඉතාම වැරැදි සහගත ප්‍රකාශයක් සිදු කළා, ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සහ ඒ පනත් කෙටුම්පතේ ත්‍රස්තවාදය සම්බන්ධව දී තිබෙන නිර්වචනය සම්බන්ධයෙන්. අපි කිසිම කෙනෙක්, මේ රටේ උද්ඝෝෂණ කරනවාට විරෝධයක් නැහැ. පනතක්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

සම්බන්ධයෙන් හෝ වෙනත් ඕනෑම ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනතාවට උද්ඝෝෂණය කිරීමේ අයිතිය තිබෙනවා. ඒ අයිතිය අපි පිළිගන්නවා. ඒ සම්බන්ධව අපට කිසිම විරෝධයක් නැහැ. පනත් සම්බන්ධයෙන් විවේචන කරන්න පුළුවන්. පනත්වලට සංශෝධන යෝජනා කරන්න පුළුවන්. ඒ සම්බන්ධව අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. ජනතාව තමන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අභ්‍යාස කරන එක රණ්ඩු වීමට හේතුවක් නොවෙයි. ඒක අපට ප්‍රශ්නයක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණය කියන ගමන්ම අපි ඊටත් වඩා පොඩ්ඩක් විස්තරාත්මකව මේ නිර්වචනය මොකක්ද, මේ නිර්වචනය කොහොමද මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ කියන එක ගැන සාකච්ඡාවක් ඇති කර ගන්නට ඕනෑ. දැන් මේ හැමෝම කථා කරනවා, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පිළිබඳව. Protection of the State from Terrorism Bill එක, එහෙම නැත්නම් ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පතේ එක අරමුණක් තමයි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත - Prevention of Terrorism Act, PTA එක - අහෝසි, repeal කර දැමීම. ඒක අපි ජනතාවට ලබා දුන් පොරොන්දුවක්. ඒකට විපක්ෂයත් එකඟ වෙනවා. නමුත්, ගැටලුව තිබෙන්නේ නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඒ නිර්වචනයට උද්ඝෝෂණ; වෛද්‍යවරුන් විසින් කරන උද්ඝෝෂණ, වැඩ වර්ජන වැනි ක්‍රියාවන් ඇතුළත් වෙනවාද කියන කාරණයයි. එහෙම වෙනවා නම් ඒක වැරැදියි. එහෙම ඒවා ඒ නිර්වචනයට ඇතුළු වෙනවාද කියන එක තමයි අපි බලන්න ඕනෑ සහ විමසන්න ඕනෑ කාරණය.

අපි බලන්න ඕනෑ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ත්‍රස්තවාදයට ලබා දී තිබෙන නිර්වචනය මොකක්ද කියලා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ත්‍රස්තවාදය නැමැති වරදක් නිර්වචනය කරලා නැහැ. පනත යටතේ වැරැදි නිර්වචනය කරලා තිබෙනවා. නමුත්, ත්‍රස්තවාදය නැමැති වරදක් නිර්වචනය කරලා නැහැ. එතකොට මේ පනතේ නිර්වචනය කර තිබෙන වැරැදි යටතට එනවා, මිනී මැරීම, මංකොල්ලකෑම, දේපළ හානි සිද්ධ කිරීම, රජයේ දේපළ හානි සිද්ධ කිරීම, ජාතීන් අතර අසමඟිය ඇති වන ආකාරයට ප්‍රකාශන සිද්ධ කිරීම වැනි ක්‍රියාවන් ලැයිස්තුවක්. ඒ ක්‍රියාවන් ලැයිස්තුව Prevention of Terrorism Act එක යටතේ, එහෙම නැත්නම් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වරදක් බවට නම් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හැම වරදක්ම ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය යටතේත් වරදක්. මෙහි තිබෙන බොහෝ වැරැදි දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදක්. උදාහරණයක් හැටියට මංකොල්ලකෑම ගත්තොත්, එය දණ්ඩ නීති සංග්‍රහය යටතේත් වරදක්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේත් වරදක්. මේ දෙක අතර තිබෙන වෙනස මොකක්ද කියලා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ නිර්වචනයක් සිද්ධ කරලා නැහැ. එතකොට එකම වරද සඳහා දඬුවම් දිය හැකි නීති පද්ධති දෙකක් රට තුළ සකස් කරලා තිබෙනවා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ තිබෙන සමස්ත ප්‍රශ්නය ඒක නොවෙයි. මේ පනත ගැන, මේ නීති සංශෝධනය ගැන සාකච්ඡා කරන්නට අපට දීර්ඝ කාලයක් තිබෙනවා. මම හිතනවා, සමස්ත ප්‍රශ්නය තිබෙන්නේ මේ නිර්වචනයේ නොවෙයි කියලා. නමුත්, නිර්වචනයේ තිබුණු ගැටලුව තමයි එකම වරදට දඬුවම් දිය හැකි තවත් පද්ධතියක් ක්‍රියාත්මක කර තිබීම. ඒක සාමාන්‍ය අපරාධ නීතියට වඩා දැඩි නීති පද්ධතියක්.

නලින් බණ්ඩාර මන්ත්‍රීතුමාට මේ කාරණය අමතකයි. එතුමා 2018 වසරේදී යහ පාලන රජයේ ඉන්නකොට නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය ඇමති ධුරයක් දැරුවා. එතුමන්ලා ඒ රජයේ ඉන්නකොට ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත - Counter Terrorism Bill - කියලා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා. 2023දී රනිල් වික්‍රමසිංහ රජය යටතේ ඒ පනත් කෙටුම්පතට ඉතා සමාන පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා, ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත - Anti-Terrorism Bill - නමින්. මේ පනත් කෙටුම්පත් දෙක ගත් විට, 2018දී නලින් බණ්ඩාර මන්ත්‍රීතුමාත් කොටසක් වෙලා හිටපු, එතුමා නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය ඇමති ධුරය දරපු රජය විසින් ඉදිරිපත් කළ ත්‍රස්තවාදය පිළිබඳ නිර්වචනයත්, 2023දී රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ රජය යටතේ ඉදිරිපත් කළ ත්‍රස්තවාදය පිළිබඳ නිර්වචනයත් අඩු-වැඩි වශයෙන් එක සමානයි. යම් යම් සුළු වෙනස්කම් ප්‍රමාණයක් තිබෙනවා. නමුත් ඒවා අඩු-වැඩි වශයෙන් එක සමානයි. හැබැයි, නිර්වචනයක් ඉදිරිපත් කළා. ඒ වනතෙක්, ලංකාවේ ත්‍රස්තවාදය පිළිබඳව නිර්වචනයක් තිබුණේ නැහැ. නමුත් 2018දීත්, 2023දීත් නිර්වචනයක් ඉදිරිපත් කළා. ඒ නිර්වචනයට ආපු ප්‍රධානම විවේචනයක් තමයි අර නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා කියපු කථාව. ඒ, මොකක්ද? වැඩ වර්ජන, උද්ඝෝෂණ වැනි ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරකම් ඒ පනත් කෙටුම්පතේ නිර්වචනයට ඇතුළත් විය හැකියි කියන එක. 2023දී ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පස්සේ එය ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝගයට ලක් වුණා. එසේ අභියෝගයට ලක්වීමේදී එවකට අගවිනිසුරු ඇතුළු විනිසුරුවරුන් පස්දෙනෙකුගෙන් යුක්ත විනිසුරු මණ්ඩලයක් විසින් නියෝගයක් ලබා දුන්නා, ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන්.

මොකක්ද, ඒ නියෝගයේ කියන්නේ? ඒ නියෝගයෙන් මේ නිර්වචනය පිළිගන්නවා. ඒ කියන්නේ, 2018 ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත -CTB- මඟින් සහ 2023 ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත -ATB- මඟින් ඉදිරිපත් කර තිබෙන නිර්වචනය "legitimate dissent" එහෙම නැත්නම් ප්‍රජාතන්ත්‍රවාදී සුජාත සිදු කළ හැකි; ප්‍රජාතන්ත්‍රවාදී ලෙස සිදු කළ හැකි උද්ඝෝෂණ, වැඩ වර්ජන වාගේ ක්‍රියාකාරකම් මේ නිර්වචනයට ඇතුළත් විය හැකියි යන කාරණය; එහි අවදානමක් තිබෙනවා කියන කාරණය 2024.02.20 දින හැන්සාඩ්ගත කර තිබෙන මේ නඩු තීන්දුව විසින් තීරණය කරනවා. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය මේකට යෝජනාවක් ඉදිරිපත් කරනවා. ඒ නිර්වචනයත් එක්ක ඉස්සරහට යනවා නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයෙන් මේ නීතිය සම්මත කරන්නට ඕනෑ. ඒ නීතිය තුනෙන් දෙකක බලයෙන් සම්මත නොකරන්නට නම් ශ්‍රේෂ්ඨාධිකරණය යෝජනාවක් කරනවා. නවසීලන්තයේ ත්‍රස්තවාදය සම්බන්ධ නීතියේ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධව වැඩ වර්ජන, උද්ඝෝෂණ වැනි ක්‍රියාකාරකම් ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලින් ඉවත් කරන බැහැර කිරීමේ වගන්තියක් තිබෙනවා. එවැනි වගන්තියක් ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පතට -ATB එකට- ඇතුළු කරන්න කියලා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝගයක් නිකුත් කරනවා. කුමක් හෝ හේතුවකට එවැනි බැහැර කිරීමක් සහිතව ඒ පනත් කෙටුම්පත නවවන පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පතේ නිර්වචනයේ, CTB, ATB නිර්වචනවලට වඩා වෙනස්කම් බොහොමයක් තිබෙනවා. මේක විතරක් නොවෙයි, තිබෙන එකම වෙනස්කම. නමුත්, මේක දිගින් දිගටම සමාජගත කරන නිසා මේ ගැන කියන්නට ඕනෑ. 2024 වසරේ හැන්සාඩ්ගත කරලා තිබෙන ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගයේ තිබෙන බැහැර කිරීමේ වගන්තිය නවසීලන්තයේ ත්‍රස්ත නීතියේ තිබෙන ඒ වගන්තියට ඉතා සමානයි. Word for word වාගේම සමාන බැහැර කිරීමේ වගන්තියක් ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පතේ - PSTB එකේ - 3 (4) වගන්තියේ සඳහන් වෙනවා. ඒ අනුව උද්ඝෝෂණ සිදු කිරීම, වැඩ වර්ජන සිදුකිරීම ත්‍රස්තවාදී ක්‍රියාවක් නොවෙයි. උද්ඝෝෂණයක් හා වැඩ වර්ජනයකදී ත්‍රස්තවාදී ක්‍රියාකාරකමක් වැනි දෙයක් සිදුවීම තුළින්ම එය ත්‍රස්තවාදයක් කියලා නිර්වචනය කරන්න නොහැකියි කියන එක මේ පනත් කෙටුම්පතේ යෝජිත නීතියේ තිබෙන කොටසක්.

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

ඒ විතරක් නොවෙයි, දේපොළ හානි සම්බන්ධව ගත්තොත්, සාමාන්‍යයෙන් දේපොළ හානි සිද්ධ වුණාම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ඇති "mischief" කියන වචනයට අනුව, රජයට ඉතාම අඩු මට්ටමක දේපොළ හානියක් සිද්ධ කළත්, අත්අඩංගුවට ගැනීමට හෝ රැඳවුම් නියෝග නිකුත් කිරීමට ප්‍රමාණවත්. CTA එක යටතේ ඒක යම් මට්ටමකට ඉහළ දාලා තිබෙනවා. ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත - PSTB එක - යටතේ, ගේට්ටුවක් කැඩුවාට, බිල්ඩින් එකකට සුළු හානි සිද්ධ කළාට, පාරේ තාර කැඩුවාට, -ලංකාවේ උද්ඝෝෂණ කරද්දී සාමාන්‍යයෙන් මේවාට පොදු දේපොළ හානි යටතේ අත්අඩංගුවට ගන්නවා; රිමාන්ඩිගත කරනවා. අපි මේ ගැන දැනුවත්. ඒක ඔබතුමන්ලා අපට නැවත නැවත කියන්න ඕනෑ නැහැ. ඒ ගැන අපි දැනුවත්- එවැනි ආකාරයේ වැරදි ත්‍රස්තවාදය හැටියට අර්ථ නොගන්වන්නටම, දේපොළ හානි වෙනවා නම් ඒක සැලකිය යුතු දේපොළ හානියක් විය යුතුයි කියන එක පනත් කෙටුම්පතේම සඳහන් වෙනවා. එහෙම නැත්නම් ජීවිතයකට හානි කළ හැකි ආකාරයේ දේපොළ හානියක් වෙන්න ඕනෑ කියන එක තිබෙනවා. ඒ අනුව බොහොම පැහැදිලිව අපේ මේ පනත් කෙටුම්පත තුළ උද්ඝෝෂණ, වැඩ වර්ජන ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් ගණයට අයත් වන්නේ නැහැ. මේක ඉතාම ලිබරල් විධියට, කිසිම පරිස්සමක් නැතිව සමාජ මාධ්‍යවලත් බෙදා ගන්නවා මම දැක්කා. විවේචන කරන එක ගැටලුවක් නැහැ. අපිට කිසි ප්‍රශ්නයක් නැහැ. විවේචන කරන්න. නීති හදන්නේ අපිට විතරක් කියවන්නවත්, අපිට විතරක් තේරුම් ගන්නවත් නොවෙයි. සමාජයත් කියවන්න ඕනෑ. නමුත්, නිශ්චිත වශයෙන් නලින් බණ්ඩාර මහත්තයලාගේ කාලයේ ඉදිරිපත් කරපු පනතේ තමයි උද්ඝෝෂණ හා වැඩ වර්ජන ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් හැටියට තිබුණේ. අපි ඉදිරිපත් කරලා තිබෙන පනත් කෙටුම්පතේ එවැනි ක්‍රියාකාරකම් ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් ලෙස අර්ථ නොගැනෙන්න, විශේෂ බැහැර කිරීමේ වගන්තියක් ඇතිව තමයි ඉදිරිපත් කර තිබෙන්නේ. උද්ඝෝෂණ සහ වැඩ වර්ජන කිසිසේත්ම ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් කියන category එකට අයත් වෙන්නේ නැහැ.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තිලංක යූ. ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.31]

ගරු තිලංක යූ. ගමගේ මහතා
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි අනුමත කිරීම වාගේම, 2026 අංක 7 දරන පරිපූරක ඇස්තමේන්තුව අනුමත කිරීමට අදාළවයි මේ මොහොතේ විවාදය සිදු වෙන්නේ. විශේෂයෙන්ම මෙහිදී අපි මතක් කරන්න ඕනෑ අස්වැසුම ගැන අලුතින් සමාලෝචනයක් මේ දවස්වල සිදු කරමින් තිබෙනවා කියන එක. ඒ යටතේ අපි බලාපොරොත්තු වෙනවා, නව දිළිඳු, මේ මොහොතේ ආර්ථිකමය වශයෙන් යම් පීඩාවකට පත් වුණු ජනතාව වෙනුවෙන් ඒ අවශ්‍ය කරන ප්‍රතිලාභ, දීමනා ලබා දීම වෙනුවෙන් කටයුතු කරන්න. යම් ආකාරයකින් ගොඩනැහෙන යම් කථා බහක් ගැන අද දවසේ පාර්ලිමේන්තුව තුළත්, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කරුණු ඉදිරිපත් කරද්දී ප්‍රකාශ කළා. අපි කොයි වෙලාවකවත් අස්වැසුම කපපු එක නොවෙයි කළේ. අපි එක පැත්තකින් අස්වැසුම සඳහා ලබා දෙන මුදල වැඩි කළා. අස්වැසුම ප්‍රතිලාභීන් ප්‍රමාණය වැඩි කළා. නමුත්, අපි රජයක් විධියට මේ බලය ලබා ගන්නා මොහොතේ වෙනමම ආකෘතියක් යටතේ තමයි අස්වැසුම වැඩසටහන හදලා තිබුණේ. යම් යම් කණ්ඩායම්වලට 2024, 2025 වනකොට එය අවසන් වෙන්න, 2026 වන විට සියල්ල අවසන් වෙන විධියට වැඩකටයුතු හදලා තිබුණේ. අපි කළේ මෙය ලබා දීම යම් විධියකින් දීර්ඝ කිරීම සහ තවදුරටත් අස්වැසුම ප්‍රතිලාභීන් සඳහා ලබා දෙන මුදල් ප්‍රමාණයන් වැඩි කිරීමයි. කෙනෙකුට යම් ආකාරයෙන් අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා නම් ඔවුන්ට හැකියාව තිබෙනවා අභියාචනා ඉදිරිපත් කරන්න වාගේම නොලැබිය යුතු පිරිසකට ලැබිලා තිබෙනවා නම් විරෝධතා දක්වන්න. විශේෂයෙන්ම ඒ ගැනත් මේ වෙලාවේ මම මතක් කරන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමානය වනවිට ලෝකයේ යුද්ධය තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. අපි මේ රට භාර ගැනීමෙන් පසු ආර්ථිකය කළමනාකරණය කරලා, ආර්ථික ස්ථායීතාවක් ඇති කරලා රට ඉදිරියට අරගෙන ආවා. මුල් කාල වකවානුවේ - අපි බලයට පත් වෙලා පළමුවැනි අවුරුද්ද තුළ - එහි ප්‍රතිලාභ ජනතාවට ඉතාම හොඳින් ලැබෙන විධියට භාණ්ඩවල මිල ගණන් අඩු කරමින් සහ මේ රටේ ආර්ථිකයේ ස්ථාවරත්වයක් ගොඩ නඟමින් ඒ කටයුතු කරගෙන යන අවස්ථාවේ තමයි අපට විශේෂ අවස්ථා දෙකකට මුහුණ දෙන්නට සිදු වුණේ.

රටකට අභ්‍යන්තර කම්පන එන්න පුළුවන්. ඒ වාගේම රටක් බාහිර කම්පනවලට ගොදුරු වෙන්නත් පුළුවන්. අපේ රට ඒ දෙකටම ගොදුරු වූ මොහොතක් මේක. රට අභ්‍යන්තරයෙන් ඇති වූ කම්පන තිබෙනවා. "දිට්වා" සුළි කුණාටුව ආවා. ඒ හේතුවෙන් ආර්ථිකයට, ජන ජීවිතවලට සහ දේපළවලට හැම පැත්තෙන්ම දැවැන්ත, බරපතළ හානි සිදු වුණා. ඒ තත්ත්වය තුළ ආර්ථිකයට සහ දේපළවලට සිදු වූ බලපෑමෙන් යම් ආකාරයකට ගොඩ එන්න, ඒ සඳහා මුදල් වෙන් කරන්න, අවශ්‍ය පහසුකම් ලබා දෙන්න අපට හැකියාව ලැබුණා. ඇත්තටම ගත්තොත්, අද වනවිට ඒ සියලු සංවර්ධන කටයුතු සහ අනෙකුත් පහසුකම් ඒ ප්‍රදේශවල ජනතාවට ළඟා කර දෙමින් තිබෙනවා. අපට ඉදිරියටත් කරන්න තව වැඩ කොටසක් තිබෙනවා. අපට ඒ සඳහා අවශ්‍ය මුදල් පිළිබඳව ගැටලුවක් නැහැ. රුපියල් පිළිබඳව තිබුණු අර්බුදය අපි මහහරවාගෙන තිබෙනවා. අපි රට භාර ගන්න කොට එක පැත්තකින් රුපියල් අර්බුදයක් තිබුණා. අනෙක් පැත්තෙන් ඩොලර් අර්බුදයක් තිබුණා. අපි ඒක හොඳටම දන්නවා.

මේ සුන්බුන් විපක්ෂයේ කෑ ගහන අයට අද ඒක අමතක වෙලා වාගෙයි කෑ ගහන්නේ. හැබැයි අපි දන්නවා, රටේ ජනතාවට ඒක අමතක නැහැ කියලා. මොකද, රටේ ජනතාව තමයි පෝලිම්වල හිටියේ. රටේ ජනතාව තමයි පෝලිම්වල මැරුණේ. රටේ ජනතාවට තමයි කන්න නැති වුණේ. රටේ ජනතාවට තමයි රැකියා අහිමි වුණේ. රටේ ජනතාවගේ ව්‍යාපාර, කර්මාන්තශාලා වැහුණා. ආයෝජකයෝ රට හැර දාලා ගියා. මේවා රටේ ජනතාව දන්නවා. නමුත් මෙතැන ඉන්න විපක්ෂයේ අයට ඒවා අමතක වෙලා වාගේ තමයි කථා කරන්නේ. එහෙම තත්ත්වයක් තිබුණු රටක තමයි අපි රුපියල් අර්බුදය සහ ඩොලර් අර්බුදය විසඳමින් ඉන්නේ. ඒ වෙනුවෙන් අපි සියලුදෙනා දැවැන්ත කැපකිරීමක් කරනවා. සියලු වරප්‍රසාද කප්පාදු කරගනිමින්, අපට මොනවා හරි විධියකින් ලැබුණු දීමනා හෝ වෙනත් ප්‍රතිලාභ තිබුණා නම්, ඒ සියල්ල කප්පාදු කරගනිමින් තමයි අපි මේ හැම දෙයක් ගැනම කටයුතු කරන්නේ. අපි අභ්‍යන්තර කම්පනවලට මුහුණ දුන්නා. ඒ වාගේම අපට බාහිර කම්පනයකටත් මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඉරානය සහ ඊශ්‍රායලය අතර පවතින යුද්මය

තත්ත්වය, ඇමෙරිකාවත් එයට සම්බන්ධ වීම නිසා ඇති වී තිබෙන දරුණු තත්ත්වයට අපට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. ඒ යුද්මය තත්ත්වයේ ප්‍රතිවිපාකවලට අපට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. ඒක අපට පාලනය කරන්න බැහැ.

විශේෂයෙන්ම බලශක්ති ක්ෂේත්‍රයට, ඉන්ධනවලට මේ තත්ත්වය බලපා තිබෙනවා. බලශක්ති ක්ෂේත්‍රයට බලපෑමක් ඇති වෙනවා කියන්නේ හැම ක්ෂේත්‍රයකටම ඒක බලපානවා කියන එකයි. බලශක්තියත් එක්ක හැම ක්ෂේත්‍රයක්ම ගැටගැහිලා තිබෙනවා. විශේෂයෙන්ම ප්‍රවාහන ක්ෂේත්‍රයට එය ඍජුවම බලපානවා. ඉන්ධන මිල ගණන් වැඩි වීම දරාගන්න බැහැ කියලා අපි දන්නවා. ඒ තත්ත්වය දරාගන්න බැරි නිසා අපි රජයක් විධියට ඒ සඳහා යම් ගෙවීමක් කරනවා. පසුගිය දවස්වල ඩීසල් ලීටරයක් සඳහා රජය විසින් රුපියල් 100ක් ගෙවිවා. නමුත් එළැඹෙන මාස දෙක, තුන තුළත් ඒ මුදල් ගෙවීම් කටයුතු කරන්න අවශ්‍ය නිසා මේ වෙලාවේ පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් මුදල් ප්‍රමාණයක් ඒ සඳහා යොදවා ගන්න අපි බලාපොරොත්තු වෙනවා. එයින් බලාපොරොත්තු වෙන්නේ, විශේෂයෙන්ම වැඩි වූ ඉන්ධන මිල හේතුවෙන් ජනතාවට ඇති වන බලපෑම අවම කිරීම සඳහා රුපියල් 70ක වාගේ සහනාධාරයක් ලබා දීමයි. ඒ කටයුත්ත සඳහා තමයි මේ මුදල් වෙන් කරන්නේ. පසුගිය කාලය පුරාම අපි ඒ සඳහා මුදල් වෙන් කරලා ලබා දුන්නා. එහෙම නොවුණා නම් ජනතාවට මේ බර තවත් වැඩි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම premium එක වැඩි වෙලා තිබෙනවා. නැව්වල රක්ෂණ ගාස්තු විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. නැව් ගාස්තු වැඩි වෙලා තිබෙනවා. මොකද, හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා ගමනාගමනය සම්පූර්ණයෙන්ම ඇනහිටලා තිබෙනවා. නැව්වල ආරක්ෂාව සම්බන්ධයෙන් ඇති වී තිබෙන තත්ත්වය නිසා නැව් ගමනාගමනය සිදු වෙන්නේ නැහැ. එදා අපට තිබුණේ ඉන්ධන එන්නේ නැති ප්‍රශ්නයක් නොවෙයි. ඉන්ධන එනවා. නැව් ගමන් මාර්ග හරහා ඉන්ධන නැව් ගමන් කරනවා. හැබැයි, අපට ඩොලර් මිලියන 30ක්, 40ක් හොයා ගන්න බැරි වීම නිසා ඉන්ධන නැව් ඇවිල්ලා තිබියදීත් ඒවාට ප්‍රමාද ගාස්තු ගෙවලා තමයි තියාගන්න සිදු වුණේ. දැන් තිබෙන්නේ එහෙම තත්ත්වයක් නොවෙයි. දැන් ඉන්ධන තිබෙනවා. දැන් තිබෙන්නේ ඒ ගැන අර්බුදයක් නොවෙයි. හැබැයි, මේ යුද්මය තත්ත්වය නිසා ඉන්ධන මිල වැඩි වීම තමයි අපට දරාගන්න නොහැකි වෙලා තිබෙන්නේ. රටක් විධියට ගත්තාම, ඒකේ බලපෑම අපට ඇති වෙලා තිබෙනවා.

අපි දන්නවා, පසුගිය කාලයේ අපේ රටින් දෙනිකව ගලාගෙන ගියේ ඩොලර් මිලියන තුනක්, හතරක්, පහක් වාගේ ප්‍රමාණයක් බව. හැබැයි, පසුගිය කාලයේ අපි වාහන ආනයනය කරන්න අවස්ථාව ලබා දීම ආදි සියල්ල ගත්තාම, දෙනිකව ඩොලර් මිලියන 30 ඉක්මවා - 40, 50, 80 දක්වා - අපේ රටින් පිටතට ගලා යන තත්ත්වයට පත් වුණා. හැබැයි, එහෙම තත්ත්වයක් ඇති වුණත්, ඕනෑම ආකාරයකින් ඒ සියල්ල දරාගන්න පුළුවන් ආර්ථිකයක් හදාගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. මා හිතන විධියට, මීට පෙර අපට එහෙම දරා ගන්න පුළුවන් තත්ත්වයක් තිබුණේ නැහැ.

විශේෂයෙන්ම අපනයන ආදායම වැඩි කරගෙන අපි දැවැන්ත ජයග්‍රහණයක් අත් පත් කරගෙන තිබෙනවා. 2024 පළමු මාස 9 තුළ අපනයන ආදායම ඩොලර් බිලියන 12.01යි. 2025 පළමු මාස 9 තුළ අපනයන ආදායම ඩොලර් බිලියන 12.9ක් දක්වා අපි වැඩි කර ගන්නවා. ඒ වාගේම තමයි, මේ අවුරුද්දේ පළමු මාස 9 වන විට අපනයන ආදායම ඩොලර් බිලියන 13.61 දක්වා වැඩි කර ගන්න අපි සමත් වෙලා තිබෙනවා. සමස්තයක් විධියට ගත්තාම ගිය අවුරුද්දේ සියයට 21ක වර්ධනයක් අත් පත් කරගෙන තිබෙනවා. පසුගිය අවුරුද්දට සාපේක්ෂව සැප්තැම්බර් මාසයේ පමණක් සියයට 1.3ක වර්ධනයක්, ඒ කියන්නේ මාසිකව ඩොලර් බිලියන එකකට වැඩි ආදායමක් උත්පාදනය කරගෙන තිබෙනවා. ඒ අනුව රටට ඩොලර් උපයන ප්‍රධානම ක්ෂේත්‍රයක් ලෙස අපනයන ආදායම වැඩි කර ගන්න අපි සමත් වෙලා තිබෙනවා.

අපි විදේශ ප්‍රේෂණ වැඩි කර ගන්නත් සමත් වෙලා තිබෙනවා. ඒ වාගේමයි ඍජු විදේශ ආයෝජන. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කිව්වා මට මතකයි, අපට ඍජු විදේශ ආයෝජන නැහැ කියලා. නමුත්, ඒ සම්බන්ධයෙන් 2021 සිට list එකක් කියන්න අපට පුළුවන්. ඒ අනුව, 2021 වර්ෂයේ ඍජු විදේශ ආයෝජන ඩොලර් මිලියන 592යි; 2022දී ඩොලර් මිලියන 884යි; 2023දී ඩොලර් මිලියන 713යි; 2024දී ඩොලර් මිලියන 759යි. ඒ තිබුණු තත්ත්වය වෙනස් කරලා තමයි අපි 2025දී ඍජු විදේශ ආයෝජන ඩොලර් මිලියන 1,048ක් අත් පත් කරගෙන තිබෙන්නේ. අපි මේ වන කොට ඩොලර් බිලියන එකකට වඩා වැඩි ප්‍රමාණයකින් ඍජු විදේශ ආයෝජන අත් පත් කරගෙන තිබෙනවා. ඒ අනුව, අපි ආර්ථිකය ඩොලර්වලිනුත් ස්ථාවර කරමිනුයි යන්නේ. හැබැයි, ලෝකයේ පවතින මේ යුද්මය තත්ත්වය සුවිශේෂී තත්ත්වයක්. ඒ නිසා තමයි අපේ රටට මේ පීඩනය ඇවිල්ලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි හිතනවා, මේ යුද්මය තත්ත්වය යම් ආකාරයකින් පහව ගිය ගමන් නැවත අප බලාපොරොත්තු වුණු ගමන අපේ රටට, අපට යන්න පුළුවන් වෙයි කියලා. එතෙක් මේ වෙලාවේ මේ තත්ත්වයන්ට මුහුණ දෙමින් තමයි අපට මේ රට ඉදිරියට අරගෙන යන්න සිදු වෙන්නේ. විශේෂයෙන්ම මේ රටේ ජනතාව ඒ ගැන තේරුම් ගනිමින් ඉන්නවා. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා පාර්ලිමේන්තුව තුළ හඬ නඟන්නේ මේක අප නිසා ඇති වුණු ප්‍රශ්නයක් විධියට පෙන්වමිනුයි. මා හිතන විධියට, සැබෑ තත්ත්වය ජනතාව තේරුම් අරගෙනයි තිබෙන්නේ. මේ වැඩ පිළිවෙළ තුළ ඇති කරන ආර්ථික ස්ථායීකරණයත් එක්ක අප බලාපොරොත්තු වන ආකාරයෙන් මේ රටේ ආර්ථිකය ගොඩනඟා ගන්න අපට පැහැදිලිවම පුළුවන් වෙනවා. ඒකට අවශ්‍ය කරන පදනම නොවැම්බර් 12වන දා ඉදිරිපත් කරන අයවැය කථාවේදීත් හඳුනාගන්න පුළුවන් වෙයි කියා සඳහන් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.41]

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම රටට වැදගත්, ඉතාම කාලෝචිත මාතෘකා දෙකක් ගැන තමයි අද සාකච්ඡා කරමින් තිබෙන්නේ. එකක් තමයි, පාරිභෝගික ආරක්ෂාව හා සුරක්ෂිතතාව තහවුරු කිරීමේ අරමුණින් සහ දේශීය නිෂ්පාදකයන්ට සාධාරණ තරගකාරී පසුබිමක් සහතික කිරීම වෙනුවෙන් පනවා ඇති 2026 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි. ඒ අනුව ඒ පිළිබඳව අදහස් දැක්වීමක් ද අද මෙහිදී සිදු වෙමින් තිබෙනවා.

මේ වන විට මගී මෝටර් රථ ටයර් ආනයනය සඳහා ප්‍රමිති සහතික කිරීමටත්, ත්‍රිරෝද මෝටර් රථ සඳහා වන වායු පිරවූ ටයර්

[ගරු මංජුල සුරවීර ආරච්චි මහතා]

ආනයනය සඳහා ප්‍රමිති සහතික කිරීමටත් අදාළ රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර තිබෙනවා. එම රෙගුලාසි 2027 ජනවාරි 01වන දා සිට මේ රට තුළ ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා අපේ රටට ආනයනය කරන භාණ්ඩ හා සේවා වාගේම, දේශීය නිෂ්පාදන ගත්තාම ඒ බොහෝ දේවලට ප්‍රමිතියක් නැති බව අපි දන්නවා. පසුගිය කාල සීමාව ගත්තොත්, රට පාලනය කිරීමේදී විධිමත් විධිවිධාන, ක්‍රියාමාර්ග, නීති රීති, අණ පනත් සම්මත කිරීමේ යම් යම් ප්‍රමාදයන් නිසාම අපේ රටේ පරිභරණය කරන භාණ්ඩවලින් සියයට 80කට වැඩි ප්‍රමාණයකම ප්‍රමිතිය පිළිබඳ ගැටලු තිබෙනවා; SLS සහතික පිළිබඳ ගැටලු තිබෙනවා. එදිනෙදා පාරිභෝගික ද්‍රව්‍ය විධියට අප පාවිච්චි කරන සබන්, ෂැම්පු, සුවඳ විලවුන් ආදි බොහෝ දේවල් ද ප්‍රමිතියක් නැති තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. ඒ වාගේම එදිනෙදා පරිභරණය කරන ආහාර ද්‍රව්‍ය විශාල ප්‍රමාණයකට අදාළවත් ප්‍රමිති පිළිබඳ ගැටලු මතු වෙලා තිබෙනවා. ඒ වාගේම රට තුළ ඇඟලුම් ක්ෂේත්‍රයේ සමහර නිෂ්පාදනවල, පාවහන්වල අදාළ ප්‍රමිති සම්බන්ධයෙන් වන ගැටලු; SLS සහතික පිළිබඳ ගැටලු ද මතු වෙලා තිබෙනවා. ප්ලාස්ටික් සහ ගෘහ භාණ්ඩ නිෂ්පාදන ආනයනයේදී වාගේම දේශීය නිෂ්පාදනයේදීත් ප්‍රමිතිය පිළිබඳ ගැටලු දිගින් දිගටම මතු වෙලා තිබෙනවා. ඒ වාගේම, වාහන අමතර කොටස් ගෙන්වීමේදී සහ අමතර කොටස් නිෂ්පාදන සම්බන්ධයෙනුත් ප්‍රමිති නැහැ. ජංගම දුරකථන සහ ඒවායේ උපාංග සම්බන්ධයෙන් ගත්තත් එහෙමයි. ආනයනයේදී වාගේම රට තුළ පාරිභෝගික භාණ්ඩ විධියට පරිභරණය කරන ඒවායේත් ප්‍රමිති නැති, ප්‍රමිති සහතික කරන්න බැරි බරපතළ ගැටලුකාරී තත්ත්වයක් සහිත වටපිටාවක තමයි අප අද මේ කාලෝචිත මාතෘකාව සාකච්ඡා කරමින් ඉන්නේ.

විශේෂයෙන්ම අපි දන්නවා, අද අප මේ කථා කරන මාතෘකාවට අදාළ ප්‍රමිතියෙන් තොර ටයර් වර්ග දෙක ගැන. මේවා රටේ වැඩි බහුතරයක් පරිභරණය කරන ද්‍රව්‍යයි. වැඩි වශයෙන් තිබෙන්නේ ආනයනය කරන ඒවායි. මොකක්ද ඒකෙන් වෙන්නේ? ප්‍රමිතියෙන් තොර, එම බාල ද්‍රව්‍ය රටට ගෙන්වීම නිසා සහ ඒවා අපේ රට තුළ පරිභෝජනය කිරීම, පරිභරණය කිරීම නිසා ගැටලු කිහිපයක්ම මතු වෙනවා. විශේෂයෙන්, වැඩි පැය ගණනක් ධාවනයට යොදවන්න පුළුවන් ටයර් වෙනුවට ඉතාම කෙටි කාලයක් ඇතුළත ක්ෂය වෙලා යන ටයර් ගෙන්වීමක් සිද්ධ වෙනවා. එයින් පාරිභෝගිකයාට විශාල හානියක් සිද්ධ වෙනවා. මොකද, ඝර්ෂණය සහ උණුසුම නිසා එම ටයර් ඉතා ඉක්මනින් ක්ෂය වෙලා යනවා. එම ක්ෂයවීම් නිසා පාරිභෝගිකයාට වන පාඩුව වාගේම අනෙක් පැත්තෙන් රට තුළ විශාල වශයෙන් අනතුරුදායක තත්ත්වයන් ද ඇති වෙන්න පුළුවන්; වාහන ලිස්සා යෑමේ අනතුරු වැඩි වෙන්න පුළුවන්. විශේෂයෙන්ම වාහනයකට යොදන ටයරයක තිබෙන රැළි - treads - රටාවේ නොගැළපීම් නිසා අනතුරුවලට භාජන වෙන්න තිබෙන හැකියාව වැඩියි. ගෙන්වනු ලබන - ආනයනය කරනු ලබන - බාල ටයර් වර්ග භාවිතය නිසා රටේ රිය අනතුරු වැඩි වශයෙන් සිදු වන තත්ත්වයක් දකින්න තිබෙනවා. එම තත්ත්වයට රටක් විධියට වග කියන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම අපි දන්නවා, ටයර් පුපුරා යෑම් ද සුලබ වශයෙන් සිදු වන බව. මොකද, ප්‍රමිතියෙන් තොර ටයර් පාවිච්චි කිරීම හේතුවෙන් ඒවා පුපුරා යෑම් හරහා අනතුරු සිද්ධ වෙන්න පුළුවන්. ඒ වාගේම රෝද පෙළ ගැස්ම - wheel alignment - පිළිබඳ ප්‍රශ්න නිසාත් වාහනයේ සුක්කානම හරහා පාලන අසමතුලිතතාව ඇති වෙන්න පුළුවන්; පාලනය බිඳ වැටෙන්න පුළුවන්. ඒ නිසාම විශාල වශයෙන් අනතුරු සිද්ධ වෙන්න පුළුවන්. හැබැයි, මේ ආනයනික ටයර් මේ රටේ මිනිසුන් වාහනවලට යොදා පාවිච්චි කිරීම නිසා සිදු වන අනතුරු පිළිබඳ නිසි සංඛ්‍යාවක් අද වනකල් - තවම - කාටවත් සිදු කර ගන්න බැරි වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසාම රිය අනතුරු කොච්චර නම් සිදු වනවාද, මාරාන්තික අනතුරු කොච්චර ප්‍රමාණයක් සිදු වනවාද, ජීවිත කොච්චරක් කෙළවර වනවාද කියන කාරණා පිළිබඳව නිවැරැදිව දැනගන්න අපට බැරි වෙලා තිබෙනවා.

ටයර්වල ආයු කාලය කෙටි වීම නිසා පරිසර ප්‍රශ්න ගොඩකුත් ඇති වෙලා තිබෙනවා. ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේදීත් මෙය අර්බුදයක් බවට පත් වෙලා තිබෙන බව අපි දකිනවා. මොකද, රට පුරා ටයර් ලක්ෂ ගණන් කඳු වශයෙන් ගොඩගැහිලා තිබෙනවා. මේවා අපේ රටට විශාල වශයෙන් පරිසර ප්‍රශ්න ගෙන දෙන්න සමත් වෙලා තිබෙනවා. විශේෂයෙන්, ටයර් කියන්නේ ඉතා කෙටි කාලයකදී දිරා පත් වන ඒවා නොවෙයි. ඒවා දිරාපත් වන්නේ නැතුව ඔහේ තිබෙනවා. ඒ ටයර් කඳු අවධිමත් ලෙස තැන තැන ගොඩ ගසා තිබීම තුළ පරිසර ප්‍රශ්න වාගේම සෞඛ්‍ය ප්‍රශ්න ද ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, ඒ ටයර් ගොඩ ගැහුණු අවධිමත් පරිසරයන් තුළ ඩෙංගු වැනි මාරාන්තික උවදුරු ඇති වීම කියන ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. මේ ප්‍රශ්න නිසාම, අවධිමත් ලෙස තැන තැන දාලා තිබෙන ටයර් අනාරක්ෂිත ලෙස ගිනි තැබීම, විනාශ කිරීමට උත්සාහ කිරීම වාතය අපිරිසිදුවීමට සහ පරිසර පද්ධතියට අසමතුලිතතාවක් ගෙන ඒමට ද බලපා තිබෙනවා. ඒ නිසා මෙවැනි පරිසර ප්‍රශ්න ඇති වෙන, ආර්ථික ප්‍රශ්න ඇති වෙන ප්‍රමිතියෙන් තොර ටයර් ගෙන්වීම සම්බන්ධයෙන් සහ රට ඇතුළේ ඒවා යෙදවීම සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන ගැටලු නිරාකරණය කිරීමට මැදිහත්වීම ගැන ආණ්ඩුව විධියට අපි ස්තුතිවන්ත වෙනවා.

අපි දන්නවා, භාණ්ඩ වර්ග 161ක් සඳහා SLS සහතික - අපනයන භාණ්ඩවලට අදාළ ප්‍රමිති සහතික - නිකුත් කිරීමේ උත්සාහයක් පසුගිය ආණ්ඩු කාලයේ අරගෙන තිබෙනවා කියලා. මෙහිදී ආහාර පාන වර්ගවල ප්‍රමිතිය සහතික කිරීම සඳහා ගත්තු ඉතා හොඳ ක්‍රියාමාර්ගත් තිබෙනවා. අද දවස ඇතුළත මේ ටයර් වර්ග දෙක සම්බන්ධයෙන් ප්‍රමිති සහතික කිරීමට ලැබීමත් එක්ක මේ වෙනකොට භාණ්ඩ වර්ග 163ක ප්‍රමිති සහතික නිකුත් කිරීම පිළිබඳ සංවාදයක් මතු වෙලා තිබෙනවා. රටක් විධියට ගත්තොත්, මේක හොඳ ප්‍රවේශයක් කියලා අපි හිතනවා. ඒ වාගේම අපට තව බොහෝ දේවල් කරන්නත් තිබෙනවා. මේ ආයතන පද්ධති සියල්ලම එකතු වෙලා දේශීය නිෂ්පාදනවලට අදාළ ප්‍රමිති වටිනාකම් හැදීම කාලෝචිත වාගේම, අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් කරන වැඩක් විධියට අපි තේරුම් ගන්න ඕනෑ. ඒකට අදාළ වැඩ කොටසක් ආණ්ඩුවට කරන්න තිබෙනවා. මේ විධියට වැඩ කරගෙන ඉදිරියට යන අතරේ ආණ්ඩුවක් විධියට අපි ජාත්‍යන්තර සහයෝගය අරගෙන, විශේෂයෙන්ම "දිට්වා" ව්‍යසනය නිසා අර්බුදයට පත්වෙච්ච, යම් යම් ලෝක තත්ත්වයන් නිසා අර්බුදයට පත්වෙච්ච මේ රට ස්ථාවර කරගනිමින් පිළිවෙළකට, ක්‍රමානුකූලව නැඟිටින්න උත්සාහ කරනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව සහ අනෙකුත් මිත්‍රශීලී රටවල් සමඟ ඉතා සුහදශීලීව ගනුදෙනු කරමින් රටේ ආර්ථිකයත්, සමාජ ජීවිතයත්, ජන ජීවිතයත් ඉහළට ඔසවා තැබීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් අපි ඉදිරියට යනවා. මේ වාගේ වටපිටාවක් ඇතුළේ අපි දකිනවා, විපක්ෂයේ ඉන්න අය මේ ආණ්ඩුවේ ගමන් මඟ පිළිබඳව සමාජයට විශාල වශයෙන් බොරු ප්‍රචාරය කරමින්, වැරදි පරාවර්තනයක් ඇති කරමින් විගඩම් නටමින් ඉන්න ආකාරය. ඊයේ දවස ඇතුළෙත් මේ පාර්ලිමේන්තුවේ ලස්සන විගඩමක් තිබුණා. ඒ මොකක්ද? මේ උත්තරිතර පාර්ලිමේන්තුවේ සෙංකෝලය සමඟ හැංගිමුත්තන් කිරීමේ සෙල්ලම. පැය භාගයක්,

විනාඩි 45ක් පමණ සෙල්ලම් කරලා කට්ටිය කෑමට ගියා. ඉතින්, අපි විපක්ෂයට කියන්න කැමැතියි, ඔය නෙයියාඩම් නටන ඒවා නටාගෙන ඉන්න, හැබැයි, අපි ඉතාම ශක්තිමත්ව මේ රටේ ජනතාවගේ ජීවිත ඉදිරියට ගෙනියන්න අදාළ සැලසුම් සහගත වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරමින්, කෙටිකාලීන, මැදිකාලීන, දිගුකාලීන මාවතේ ක්‍රමානුකූලව ගමන් කරනවා කියන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි ගරු මන්ත්‍රීතුමා.

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
මට තව සුළු වේලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි දන්නවා, "දිට්වා" සුළි කුණාටුවෙන් විනාශයට පත්වෙච්ච, ආන්දෝලනයට පත්වෙච්ච සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ මිනිස්සු දැඩි ලෙස අපහසුතාවට පත්වෙච්ච පනංගම්මන මාර්ගය ගැන. ඒක ජාත්‍යන්තරයේත් අවධානය යොමු වුණු කාරණයක්. එය පොඩි පාලමක්. ලී කොට ටිකක් දාලා අමාරුවෙන් ගියේ. නාය ගිය ඒ පාලම, එතැන තිබෙන බැම්ම සහ පාර හදන්න අපි ආණ්ඩුවක් විධියට විශාල උත්සාහයක් ගනිමින් හිටියා. කියන්න සතුටුයි, අපි මේ 6වැනි දා රුපියල් මිලියන 1,004ක මුදල් ප්‍රමාණයක් යොදවා පනංගම්මන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුත්ත පටන් ගන්නවා. ජනතාව වෙනුවෙන් ඒ විශාල කාර්යභාරය අපි කරනවා. ඒ සඳහා අපි මුල්ගල් තියන්න කටයුතු කරමින් ඉන්නවා.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, විපක්ෂය මොන චෝදනා එල්ල කළත් ප්‍රමිතියක් නැති රටකට ප්‍රමිතියක් දෙමින්, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" උදා කිරීම සඳහා අපි ක්‍රමානුකූල ගමනක් ආරම්භ කර තිබෙන බව. එහි ජයග්‍රහණ ජනතාවට ක්‍රමානුකූලව ලබා දෙනවා කියන පණිවුඩය දෙමින්, මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.52]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම Library එකෙන් තොරතුරු අරගෙන මේ විවාදයට ලැහැස්ති වෙනකොට radio එකේ කියන දෙයක් මම අහගෙන හිටියා. කවුද කිව්වා, හැට දහසක් මරපු කට්ටිය නියෝජනය කරන පරම්පරාවේ අය අපි කියලා. අපි එහෙම නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක පුද්ගලයෙකුගේ හරි ජීවිතය විනාශ වුණා නම් අපි කිසිසේත්ම ඒවා අනුමත කරන්නේ නැහැ. අපි එහෙම නැහැ. නමුත් අපට පෙරළා අහන්න වෙනවා, 1989 භීෂණ කාලයේ ගරුතර ස්වාමීන් වහන්සේලා, ආගමික නායකයන්, විශ්වවිද්‍යාල මහාචාර්යවරු, ගුරුවරු, වෘත්තීය සමිති නායකයින්, කලාකරුවන් හා තවත් දසදහස් ගණනක් පුද්ගලයන් ඝාතනය කළේ කවුද, ඒ පරම්පරාවෙන් එන කට්ටියද ඔය කියලා. අපි එහෙම කියන්න සූදානම් නැහැ. ඒ වාගේ චෝදනා කරනකොට පොඩ්ඩක් හිතන්න ඕනෑ, කාටද මේ චෝදනාව කරන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වැදගත් කාරණාවක් සම්බන්ධයෙන් තමයි අපට කථා කරන්න තිබෙන්නේ. මම අහගෙන ගරු ජනාධිපතිතුමා කියනවා, සාධාරණ විවේචන ඉදිරිපත් කරන්න, කටු ගහන්න එපා කියලා. අපි කටු ගහන ජාතියේ මිනිස්සු නොවෙයි. මම සාධාරණ විවේචනයක් ඉදිරිපත් කරන්නම්.

ඇත්තටම අපේ රටේ දරිද්‍රතාවේ තත්ත්වය මොකක්ද? මොකද, අද අපි කථා කරන්නේ ඩීසල් සඳහා සහනාධාර දෙන එක ගැන සහ අස්වැසුම සහනාධාර ලබා දෙන එක ගැනයි. 2012දී අපේ රටේ දරිද්‍රතාව සියයට 22.5යි. 2019 වසර අවසන් වෙනකොට ඒක සියයට 14.3ට අඩු වුණා. හැබැයි, අද නිරපේක්ෂ දරිද්‍රතාව - absolute poverty - සියයට 16ක් හැටියට ඉදිරිපත් වෙලා තිබෙනවා, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරපු දත්තවලට අනුව. ඒ නිරපේක්ෂ දරිද්‍රතාව - absolute poverty. ඒ කියන්නේ, පුද්ගලයෙකුට කිලෝ කැලරි 2,030ක් ගන්න වෙනවා, මැරෙන්නේ නැතිව ජීවත් වෙන්න. අපි ඒක calculate කරන ක්‍රමවේදයක් තිබෙනවා. ඒ කියන්නේ, අවම ආදායම ලබන සියයට 10 අයින් කරලා, ඊළඟ සියයට 10, 20, 30 එකතු කරලා ඒගොල්ලන් කොච්චර වියදම් කරනවාද කියලා බලනවා, කිලෝ කැලරි 2,030ක් ගන්න. ඇත්තවශයෙන් ඒගොල්ලන් ඇඳුම්වලට, අනෙක් දේවල්වලට - ආහාර නොවන දේවල්වලට - කරන වියදම බලලා තමයි දරිද්‍රතා රේඛාව හදන්නේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් තමයි ගෘහස්ථ ආදායම් වියදම් සමීක්ෂණය - Household Income and Expenditure Survey, HIES එක - කරන්නේ. අපේ ගරු විපක්ෂ නායකතුමා දිගින් දිගටම මේ ගැන ප්‍රශ්න කළා. අපි කවුරුත් දන්නවා, ඇයි මේක ලබා දෙන්න පරක්කු කියලා. ගිය සතියට කලින් සතියේ පැවැති සාකච්ඡාවකට එතුමාත් සහභාගි වුණා. අපි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ කළ සාකච්ඡාවේදී ඔවුන් කිව්වා, "ඔව්, අපි සතුව දැන් ඒ දත්ත තිබෙනවා. 2025 පළමුවැනි කාර්තුවට අදාළ දත්ත අපට ඉදිරිපත් කරන්න පුළුවන්" කියලා. ඒ බල කිරීම මත මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව අද website එකේ මේ දත්ත ඉදිරිපත් කරලා තිබෙනවා. 2019න් අවුරුදු හයකට පස්සේ අපේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය කුමක්ද කියලා අපි පළමුවැනි වතාවට දන්නවා. මේ දත්තවල මොනවාද තිබෙන්නේ? මම එක කාරණාවක් කියන්න ඕනෑ. මේ තිබෙන්නේ preliminary draft එකක්. ඒ කියන්නේ කාර්තු හතරෙන් පළමුවැනි කාර්තුවේ දත්ත විතරයි මේ අරගෙන තිබෙන්නේ. ආර්ථික අර්බුදය තිබුණු කාලයේ - 2022, 2024 කාලයේ - අපේ රටේ බොහෝ දෙනා කිව්වා, දරිද්‍රතාව සියයට 25, 26 දක්වා ඉහළ ගියා කියලා. නමුත්, ඒකට නිල දත්ත - official data - නැහැ. එතකොට 2019න් පස්සේ 2025 තමයි නිල දත්ත තිබෙන්නේ. මොකක්ද මේකෙන් කියන්නේ? 2019දී අපේ රටේ ලක්ෂ 30ක් විතර අන්ත දුප්පත්, ජීවත් වෙන්න බැරි තරම් දුප්පත් අය හිටියා. ඒ කියන්නේ, absolute poverty line එකෙන් පහළ. ඒගොල්ලන් කියනවා, ලක්ෂ 30 අද ලක්ෂ 34ට විතර වැඩි වෙලා තිබෙනවා කියලා. ඒ කියන්නේ, ලක්ෂ හතරක් අලුතින් දරිද්‍රතාවට පත් වෙලා තිබෙනවා. ජීවත් වෙන්න බැහැ. කන්න නැහැ. කිලෝ කැලරි 2,030ක් ගන්න බැහැ. අමතක කරන්න එපා, මම මේ කියන්නේ අර්බුදය තිබුණු කාලය හැර. සාමාන්‍ය කාල දෙකක් අතර ප්‍රශ්නය තමයි අද අපි කථා කරන්නේ. දැන් කවුරු හරි කියන්න පුළුවන්, "ඉතින්, ලක්ෂ හතරකින් නේ වැඩි වෙලා තිබෙන්නේ. මහ ලොකු ගණනක් නොවෙයි" කියලා.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තවශයෙන් ප්‍රශ්නය තිබෙන්නේ අන්ත දුප්පත් සහ දුප්පත් කියන කණ්ඩායම් අතර විතරක් නොවෙයි. කරුණාකරලා මේක තේරුම් ගන්න. ඔයගොල්ලන් සංක්‍රාන්තික හා අවදානම් කට්ටියගේ අස්වැසුම කැපුවා. කපලා අන්ත දුප්පත් සහ දුප්පත් කට්ටියට විතරක් අස්වැසුම ලබා දෙන්න තමයි අද බිලියන හයක් වෙන් කර ගන්නේ.

දැන් බලන්න, ලෝක බැංකුව කියනවා, ලංකාවේ දරිද්‍රතා රේඛාවෙන් ඉහළ ඉන්න අයට දිනක් ජීවත් වෙන්න ඩොලර් 4.20ක් ඕනෑ කියලා. ඒක ඇත්තවශයෙක් බලන්නේ ක්‍රය ශක්තියේ සමානතාව අනුව. එය පොඩ්ඩක් complex වැඩක්. ඩොලර් හතරයි විස්ස තුන්සිය තිහෙන් වැඩි කරලා මේ ගණන හදන්න බැහැ. ක්‍රය ශක්තියට අදාළව ඩොලර් එක රුපියල් කීයක්ද කියලා කියනවා. රුපියල් අනූ ගණනකට තමයි ගණන හැදෙන්නේ. එහෙම වුණොත් සියයට 16ක් දුප්පත් කියලා, ලෝක බැංකුවත් කියනවා. ඒ කියන්නේ, පහළ මැදි ආදායම් රටකට දිනකට ජීවත් වෙන්න ඩොලර් 4.20ක් ඕනෑ කියනවා. හැබැයි, අපි තවදුරටත් පහළ මැදි ආදායම් රටක් නොවෙයි, ඉහළ මැදි ආදායම් රටක්. 2019 අවුරුද්දේදී අපේ රට ඉහළ මැදි ආදායම් ලබන රටක් බවට පත් වුණා, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේදී අපි ආයෙත් පහළ මැදි ආදායම් ලබන රටක් බවට පත් වුණා. නැවතත් 2024 අවුරුද්දේදී අපේ රට ඉහළට ආවා. එතකොට එහෙම බැලුවොත්, ඔවුන් කියනවා අපේ රටේ දරිද්‍රතාව සියයට 60ක් කියලා. එතකොට ඒ සියයට 60 හැදෙන්නේ මෙන්න මෙහෙමයි. දැන් අපි කිව්වා නේ, ක්‍රය ශක්තියට සමානවයි මේක මනින්න ඕනෑ කියලා. එතකොට සියයට 16ක් එන්න නම්, ඒ අය හදන විධියට ඩොලර් එක රුපියල් අනූ ගණනකට ගත්තාම මාසයකට රුපියල් 11,430යි. මාසයකට රුපියල් 11,430ට දරිද්‍රතාව 16,000ක් නම්, මාසයකට රුපියල් 17,600කට - ඒක තමයි, Department of Census and Statistics කියන්නේ - සියයට 16යි කියලා ඒගොල්ලන් කියනවා. ඒක වෙන්න බැහැ නේ. ඊට වඩා වැඩි වෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 11,000ට අඩුවෙන් සියයට 16ක් ඉන්නවා නම්, රුපියල් 17,000ට අඩුවෙන් ඊට වඩා වැඩි ප්‍රමාණයක් ඉන්නවා. ඒ කියන්නේ, මේ සියයට 16යි කියන ප්‍රමාණය ඇත්තවශයෙන්ම අවුල් සහගතයි කියන එක තමයි මම මේ කියන්න උත්සාහ කරන්නේ. නමුත් ඉහළ මැදි ආදායම්, ඒ කියන්නේ ඩොලර් 8යි ශත 30 කියන එක රුපියල් 22,600කට ගත්තොත් සියයට 60ක් කියලා කියනවා. ඇත්තටම අපි සාධාරණ විධියට හිතලා බැලුවොත් එහෙම සියයට 16ත්, 60ත් අතර ප්‍රමාණයක් අපේ රටේ දරිද්‍රතාවෙන් පෙළෙනවා කියන එක තමයි මගේ අදහස. දැන් තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. දැන් ප්‍රශ්නය තිබෙන්නේ, ඒකේ මැද කොහේද තිබෙන්නේ කියන එකයි.

ගරු මන්ත්‍රීතුමන්ලා මේක අහලා නැත්නම් හොඳට අහගන්න. 2016දී මූර්ත මධ්‍යන්‍ය ආදායම රුපියල් 43,511යි. 2025දී රුපියල් 41,625යි. මූර්ත ආදායමේ මධ්‍යන්‍යය අඩු වෙලා. ඒ කියන්නේ කෝටිපතියෝ අයින් කළාම, අන්ත දරිද්‍රතාවෙන් පෙළෙන අය අයින් කළාම එන මධ්‍යන්‍යය. එතකොට මේක අහගන්න. මූර්ත වියදමේ මධ්‍යන්‍යය 2016දී රුපියල් 40,186යි, 2025දී රුපියල් 51,593යි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම නම් මේ කථාව ඇත්ත නේ. ඒ කියන්නේ අපේ රටේ මැද පන්තියට දරාගන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා කියන එක අද ප්‍රථම වතාවට ඔබතුමන්ලාගේ DCS එකෙන් ඉදිරිපත් කරලා තිබෙනවා, ඒක කාට කාටත් බලාගන්න පුළුවන්. මේ රටේ මධ්‍යන්‍යය ගත්තාම, ඒ කියන්නේ සමාන ගණනක් දකුණු පැත්තේත්, සමාන ගණනක් වම් පැත්තේත් ඉන්නවා. ආදායමත් වියදමත් අතර මූර්ත වෙනස රුපියල් 10,000ක් වනවා. ඒකෙන් මොකක්ද කියන්නේ? එක්කෝ ණය ගන්න ඕනෑ, එහෙම නැත්නම් අඩුවෙන් කන්න ඕනෑ, එහෙම නැත්නම් නොකා ඉන්න ඕනෑ, එහෙම නැත්නම් සම්පූර්ණයෙන්ම අනාගතය අමතක කරන්න ඕනෑ, එහෙම නම් පිට රට යන්න ඕනෑ. ඒ නිසා අද සාකච්ඡාවට ගන්නා මේ රුපියල් බිලියන 47 දීලා තිබෙන ක්‍රමය වැරදියි කියන එකයි මගේ මතය.

මම අහගෙනයි හැමෝම කියනවා, ඩීසල් ලීටරයකට රුපියල් 70ක සහනාධාරයක් දුන්නා කියලා. ඒකේ වැරැද්දක් නැහැ, ඒකේ අවුලක් නැහැ. අපි ඒක නරකයි කියන්නේ නැහැ. හැබැයි, රුපියල් 7,000ක් ලැබෙන කෙනා ලීටර 100ක් SUV එකට ගැහුවොත්, hand tractor එකට, එහෙම නැත්නම් motorcycle එකට ලීටර 25ක් ගැහුවොත් ලැබෙන්නේ රුපියල් 1,750යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ගණනත් හදාගත්තා. මේ බලන්න, දුප්පත්ම සියයට 20 ගත්තාම - මේ අද ඉදිරිපත් වෙච්ච දත්ත - මුළු ආදායමෙන් ඔහුට ලැබෙන්නේ සියයට 4යි. දෙවන සියයට 20ට සියයට 8.5යි. තුන්වැනි සහ හතරවැනි සියයට 40ට ලැබෙන්නේ සියයට 32යි. පොහොසත්ම සියයට 20ට ලැබෙනවා, සියයට 56ක්. එතකොට, මෙන්න මේ යථාර්ථය ඇතුළත තමයි සහනාධාරය දෙන්න ඕනෑ. ඔබතුමන්ලා කියනවා නම්, සංක්‍රාන්ති සහ අවදානම් අයට එහෙම නැහැ, ඒ නිසා ඒ අයට ඕනෑ නැහැ කියලා. එතකොට එතැන ලොකු අවුලක් එනවා. මම කියන්නම්, ඇත්ත කථාව. දහතුන් ලක්ෂයක් කැපුවාද, දොළොස් ලක්ෂයක් කැපුවාද කියන එක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය.

අපි දේශපාලනයෙන් එහාට ගිහිල්ලා දත්ත ගැන කථා කරමු. අද මේ රුපියල් බිලියන 6න් අස්වැසුම දෙන්න සුදුසු පවුල් 991,800ක් ඉන්නවා. ඕක තමයි ඇත්ත, 991,800යි. ඉවත් කිරීම් තිබෙනවා, 331,693ක්. මොකද, අන්ත දුප්පත් කාණ්ඩයේ ඉඳලා දුප්පත් වෙලා ඉහළට ගිය අය, දුප්පත් කාණ්ඩයේ ඉඳලා අන්ත දුප්පත් වෙලා පහළට වැටුණු අය, සංක්‍රාන්ති කාණ්ඩයෙන් පහළට වැටුණු අය සහ ඉහළට ගිය අය ආදී වශයෙන් මේක ඇතුළත ගොඩක් වෙනස්කම් වුණා. වෙනස්කම් වෙලා අවසානයේදී දෙවැනි revision එකත් එනවා. දෙවැනි revision එකට 215,000ක් එකතු වනවා. එතකොට 1,206,800කට විතර ලැබෙනවා. එතකොට ලක්ෂයක විතර වෙනසක් තිබෙනවා, ඒක ප්‍රශ්නයක් නැහැ. නමුත්, ප්‍රශ්නය තිබෙන්නේ එතැන නොවෙයි. ඔබතුමන්ලා අයින් කළා, සංක්‍රාන්ති කාණ්ඩයේ 188,694ක් සහ අවදානම් කාණ්ඩයේ 248,251ක්. ඒ කියන්නේ, 436,945ක් අයින් කළා.

දැන් ඔබතුමාට තේරෙනවා නේ, මගේ තර්කය මොකක්ද කියලා. මගේ තර්කය මේකයි. ඔව්, මේක කළේ HIES එක ගැන සලකන්නේ නැතිව. HIES එකෙන් කියනවා, ඇත්තවශයෙන්ම අපේ රටේ මූර්ත ලෙස ආදායම් සහ වියදම් බෙදී යන්නේ කොහොමද කියන එක. පහළ මැද පන්තිය කියන කණ්ඩායම අතිශය අමාරු තැනක ඉන්නේ. ඒ අය සමාජය තුළ ඒ අයගේ දුක කියන්න කැමැති නැහැ. ඒ අය ලජ්ජාවට පත් වනවා. ඒ අය ඒවා කියන්නේ නැහැ. සමහර වෙලාවට ආහාර ගැනීමක් නැතිවම දරුවන් ඉස්කෝලයට යවනවා. නමුත් ඔබතුමන්ලා මේ කරන වැඩෙන් වෙන්නේ මොකක්ද? සහනාධාර අත්‍යවශ්‍ය පිරිසක් සම්පූර්ණයෙන්ම මේකෙන් අයින් වනවා.

බලන්න, රුපියල් බිලියන 41ක fuel subsidy එකක් දෙනවා නේ. ඔය රුපියල් බිලියන 41න් කීයක් යනවාද, සහනාධාර අනවශ්‍ය අයට? ඒ අයගෙන් බොහෝදෙනෙකුට SUVs තිබෙනවා. ඒ හැමෝටමත් මේ සහනාධාරය ලැබෙනවා නේ. මටත් ලැබෙනවා නේ; ඔබටත් ලැබෙනවා නේ. මට අවශ්‍ය නැහැ, සහනාධාරය. මට පුළුවන්, මගේ පෙට්රල් වියදම දරාගන්න. මට ඒ සහනාධාරය ඕනෑ නැහැ. ඒ සහනාධාරය දෙන්න ඕනෑ කී ලක්ෂයක් මේ රටේ ඉන්නවාද කියලා මම දැන් පෙන්වා දුන්නා.

සජබයේ අපි ඉදිරිපත් කළේ සමාජ සාධාරණයක් සහිත වෙළෙඳ පොළ ආර්ථිකයක්. ඔයගොල්ලන්ගේ සමාජ සාධාරණත්වය තිබෙන්නේ පොතේ විතරයි; ඔයගොල්ලන්ගේ සමාජ සාධාරණත්වය තිබෙන්නේ ගරු ජනාධිපතිතුමාගේ stage එකේ විතරයි. නමුත් action එකේ සමාජ සාධාරණත්වය නැහැ. ඒක තමයි ඇත්ත කථාව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ අවදානම් සහ සංක්‍රාන්ති කියා ඔයගොල්ලන් කපපු ලක්ෂ හතක පිරිසට - ඒගොල්ලන් register එකෙන් අයින් කළේ නැහැ. Welfare Benefits Board එකේ register එකේ ඒ අය ඉන්නවා; නම, ගම, address එක දන්නවා - රුපියල් 4,000 ගණනේ මාසිකව දුන්නත්, ඔයගොල්ලන්ට වැය වන්නේ ඔය පොහොසත් අයට fuel subsidy එක දෙන්න යන මුදලින් සියයට 50යි, රුපියල් බිලියන 24යි. කවුරු හෝ කියන්න පුළුවන්, සල්ලි නැහැ කියලා. රජයට සල්ලි තිබෙනවා. ප්‍රාථමික ගිණුමේ ශේෂය විධියට බලාපොරොත්තු වුණේ මම හිතන විධියට රුපියල් බිලියන 360යි. හැබැයි, අවසානයේදී රුපියල් බිලියන 1,200කට මේ ප්‍රාථමික ගිණුමේ ශේෂය යනවා. ඒකට මූලික හේතුව තමයි, වියදම් කරගන්න බැරි වෙලා තිබීම. සමාවෙන්න, මෙහෙම කියනවාට. ඒක ඔයගොල්ලන්ගේ නොහැකියාව. සල්ලි තිබෙනවා. බදු ගහලා, බදු ගහලා සල්ලි ගත්තා. Treasury එකේ සල්ලි තිබෙනවා, නමුත් වියදම් කරගන්න බැහැ.

මම ඉරිදා ගියා, දඹුල්ලේ තිබෙන "ප්‍රභාෂ්වර" කෘෂි ශීතාගාර සංකීර්ණය බලන්න. ඒක අපි ගොවි මහත්වරුන්ට හදා දුන් උෂ්ණත්වය හා තෙතමනය පාලනය කළ මෙට්‍රික් ටොන් 5,000ක ධාරිතාව සහිත ගබඩාවක්. ඉන්දියාවේ නරේන්ද්‍ර මෝදි අගමැතිතුමා එම සංකීර්ණය විවෘත කරලා අවුරුදු දෙකක් වෙනවා. නමුත් තවම වැඩ නැහැ. මම ඇහුවා, ඒ මොකද කියලා. Solar panels සවි කරගන්න බැරි වුණාලු. දෙවියනේ! අවුරුදු දෙකක් තිස්සේ බැරි වුණාද, ඒකට solar panels සවි කරගන්න? නොහැකියාව නේ. මොකක්ද ප්‍රශ්නය?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
මම ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

රජයට මුදල් තිබෙනවා. කරුණාකරලා තේරුම් ගන්න, IMF එක කියන පදයටම නටන්න එපා. ඔයගොල්ලන් IMF එක ගෙදර යවනවා කියලා ආපු අය. අවසානයේ, logically, IMF එකත් එක්ක සාකච්ඡාවක් කරලා ඒ තර්කය ජයග්‍රහණය කරගන්න බැරිව, සහනාධාර අවශ්‍ය පුද්ගලයින්ගේ සහනාධාර කපා අනවශ්‍ය පුද්ගලයින්ට සහනාධාර දෙනවා. මේක කරන්න එපා. අපි මේ කථා කරන්නේ සද්භාවයෙන්. අපි කටු ගහන මිනිස්සු නොවෙයි. ජනාධිපතිතුමා කිව්වා, logically තර්කයක් ඉදිරිපත් කරන්න කියලා. අපි ඒ තර්කය ඉදිරිපත් කළා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු කන්දසාමි ප්‍රභු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 4.06]

ගරු කන්දසාමි ප්‍රභු මහතා
(මාණ්පුමිකු කන්තසාමි පිරභු)
(The Hon. Kanthasamy Prabu)
කෞරව තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළේ, இன்றையதினம் நாங்கள் 1969ஆம் ஆண்டின் 01ஆம் இலக்க, இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் மற்றும் 2026ஆம் ஆண்டின் 07ஆம் இலக்க குறைநிரப்பு மதிப்பீடு தொடர்பாக விவாதித்துக் கொண்டு இருக்கின்றோம்.

தேசிய பொருளாதார, பொதுச் சுகாதார மற்றும் சுற்றாடலைப் பாதுகாக்கும் நோக்கில் இறக்குமதி செய்யப்படுகின்ற பொருட்களின் தரம் தொடர்பாக உறுதிப்படுத்துவதற்காக தரக் கட்டளைச் சட்ட ஒழுங்குவிதியினை நாங்கள் திருத்தி இருக்கின்றோம். இதன் ஊடாக, இந்த நாட்டில் இறக்குமதி செய்யப்படுகின்ற பயணிகள் போக்குவரத்துக்குப் பயன்படுத்தப்படுகின்ற வாகனங்களின் ரயர்களுக்கான SLS 1212 தரச்சான்றிதழைக் கட்டாயமாகப் பெற வேண்டியிருக்கின்றது. அதைப்போன்று, முச்சக்கர வண்டிகளின் காற்று நிரப்பப்பட்ட ரயர்களுக்காக SLS 1347 தரச்சான்றிதழை நிச்சயமாகப் பெற வேண்டும் என்பது இதனூடாகத் திருத்தப்படுகின்றது.

மத்திய கிழக்கு யுத்தத்தின் பின்னர் ஏற்பட்டுள்ள எரிபொருள் நெருக்கடியின் காரணமாக, எமது நாட்டிலும் பொருளாதார நெருக்கடி நிலைமை உருவாகிக் கொண்டிருப்பது உங்களுக்குத் தெரியும். எனினும், அந்த எரிபொருள் நெருக்கடியை மக்கள் தாங்கிக்கொள்ளக்கூடிய விதமாக, மானியங்களை வழங்குவதற்கு எமது அரசாங்கம் முற்பட்டுக் கொண்டு இருக்கின்றது. அந்த வகையில், 2025ஆம் ஆண்டு 51.5 சதவீத செலவினம் ஏற்பட்டு இருந்தது. 2026ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் வரைக்கும் 415.1 பில்லியன் அமெரிக்க டொலர்கள் செலவு செய்யப்பட்டுக் கொண்டு இருக்கின்றது. அதனை ஈடு செய்வதற்காக 41 பில்லியன ரூபாய் நிதி ஒதுக்கீடுகள் செய்யப்படுகின்றது.

'அஸ்வெசும' கொடுப்பனவு தொடர்பாக இதற்கு முன்னர் பேசிய பாராளுமன்ற உறுப்பினர் அவர்கள், பிழையான தகவல் ஒன்றை வெளியிட்டு இருந்தார். பலருக்கு இந்தக் கொடுப்பனவு நிறுத்தப்பட்டு இருப்பதாகவும் அவர் குற்றஞ்சாட்டி இருந்தார். அது ஒரு தவறான குற்றச்சாட்டாகும். நாங்கள் 'அஸ்வெசும' திட்டத்தை ஆரம்பிக்கும்பொழுது, ஒரு வருட காலத்தில் இதன் பயனாளிகளைக் குறைப்பதற்கான நடவடிக்கையை மேற்கொள்வார்கள் என்று முன்னைய ஆட்சியாளர்கள் குறிப்பிட்டு இருந்தார்கள். ஆனாலும், நாங்கள் இந்த வருடமும் தொடர்ச்சியாக அந்தக் கொடுப்பனவுகளை வழங்கி வருகின்றோம். குறைந்த வருமானம் பெறும் குடும்பங்களை மீண்டும் அடையாளம்

[ගරු කන්දසාමි ප්‍රභු මහතා]

கண்டு, முறையான பயனாளிகளுக்கு 'அஸ்வெசும' கொடுப்பனவை வழங்க வேண்டும் என்பதற்காகவே, இந்த குறைநிரப்பு பிரேரணையின் மூலம் 6 பில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடுகள் மேற்கொள்ளப்படுகின்றது. அதிகஷ்டமான, கஷ்டமான அல்லது வறுமைக்கோட்டின் கீழ் வாழும் மக்களுக்கு 'அஸ்வெசும' கொடுப்பனவை நாங்கள் சரியான முறையில் வழங்குகின்றோம். அதேபோன்று, தவறான விதத்தில் பயனாளிகள் விடுபட்டு இருந்தால், மேன்முறையீடு செய்வதற்கான சந்தர்ப்பமும் அவர்களுக்கு வழங்கப்படு கின்றது. மேன்முறையீட்டின் ஊடாக அவர்கள் தமக்கான கொடுப்பனவைப் பெற்றுக்கொள்ள முடியும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்னுமொரு விடயத்தை இந்த நேரத்தில் ஞாபகமூட்ட விரும்புகின்றேன். மட்டக்களப்பு மாவட்டத்தில் நிலவும் மயிலத்தமடு - மாதவனை தொடர்பான பிரச்சினையைத் தற்பொழுது பூதாகரமான பிரச்சினையாக எழுப்பி உள்ளார்கள் என்பது உங்களுக்குத் தெரியும். மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தமட்டில், விவசாயம், கால்நடை வளர்ப்பு, மீன்பிடி போன்ற துறைகளில் கூடுதலான மக்கள் ஈடுபட்டுள்ளனர். அவர்களின் ஜீவனோபாயமாக இந்த மூன்று தொழில்களுமே இருக்கின்றன. மயிலத்தமடு - மாதவனை பிரதேசத்தில் உள்ள மேய்ச்சல் தரையை நீண்டகாலமாகப் பயன்படுத்தி பண்ணையாளர்கள் தங்களது பசுக்களை அங்கு வளர்த்து, வாழ்வாதாரத்தை மேற்கொண்டு வருகின்றார்கள். இது ஒரு நீண்டகாலப் பிரச்சினை என்பதை இந்தச் சபையில் உள்ள கௌரவ உறுப்பினர்கள்கூட ஏற்றுக்கொண்டு இருக்கின்றார் கள். நாங்கள் ஆட்சிபீடம் ஏறுவதற்கு முன்பிருந்தே, இந்தப் பிரச்சினை தொடர்பாக அப்பண்ணையாளர்கள் வீதியோரத்தில் போராடிக் கொண்டு இருந்தார்கள். பாராளுமன்றத் தேர்தலுக்கு முன்பிருந்தே அவர்கள் அந்தப் போராட்டத்தில் ஈடுபட்டுக் கொண்டிருந்தார்கள்.

தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் ஊடாக, முதுகெலும்பு இல்லாத என்னால் மாண்புமிகு சனாதிபதி அவர்களை மட்டக்களப்பு மாவட்டத்திற்கு அழைத்து, இந்தப் பிரச்சினையைத் தீர்ப்பதற்காக விசேட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தை நாங்கள் நடாத்தியிருந்தோம். அந்தக் கூட்டத்தில், 1,570 ஏக்கர் மேய்ச்சல் தரையை விடுவிக்குமாறு பண்ணையாளர்கள் கேட்டிருந்தார்கள். மாண்புமிகு சனாதிபதி அவர்கள் அந்த மேய்ச்சல் தரையை விடுவிக்குமாறு உரிய அதிகாரிகளுக்குப் பணிப்புரை விடுத்திருந்தார். இதனை முதுகெலும்பு இல்லாத என்னால் நிறைவேற்றித்தர முடியுமாக இருந்தது. கடந்த நல்லாட்சிக் காலங்களில் எந்தவொரு நிபந்தனையும் இல்லாமல் இரண்டு கைகளையும் உயர்த்தி, அது போதாது என்று இரண்டு கால்களையும் உயர்த்தி ஆதரவை வழங்கிய முதுகெலும்புள்ள அரசியல்வாதிகள் எங்கே? ஏன் இந்த நீண்ட காலப் பிரச்சினையை உங்களால் முடிவுக்குக் கொண்டுவர முடியவில்லை.

கௌரவ சம்பந்தன் ஐயா அவர்கள் எதிர்க்கட்சித் தலைவராக இருந்த வேளையிலும், மாகாண சபையில் அமைச்சர்களாகப் பதவியில் இருந்த வேளையிலும், ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரசுடன் இணைந்து மாகாண சபையின் ஆட்சி அதிகாரத்தைக் கைப்பற்றிய உங்களால் ஏன் இந்தப் பிரச்சினையைத் தீர்க்க முடியவில்லை? இத்தனை காலமாக அவர்கள் ஏன் போராடவேண்டி இருக்கின்றது? இதனைத் தீர்த்துக் கொள்வதற்கான சந்தர்ப்பம் ஏன் கிடைக்கவில்லை? என்பதை நான் இந்த நேரத்தில் ஞாபகமூட்ட விரும்புகின்றேன். முதுகெலும்புள்ள உங்களால் ஏன் அதனை நிறைவேற்றிக் கொள்ள முடியவில்லை? அவர்களுக்கான தீர்வுகளை ஏன் வழங்க முடியவில்லை? என்பதை நீங்கள் இந்த நேரத்தில் சிந்தித்துப் பார்க்க வேண்டும். அந்தக் கால கட்டத்தில் இருந்தவர்கள் ஏன் இதனை முறைப்படுத்தவில்லை என்பதுதான் இன்னும் கேள்விக்குறியாக இருக்கின்றது.

அதேபோன்று, 2020ஆம் ஆண்டு நடைபெற்ற பாராளுமன்றத் தேர்தலிலே Cycle சின்னத்தில் போட்டியிட்ட கட்சிக்கு இரண்டு ஆசனங்கள் கிடைக்கப் பெற்றிருந்தன. ஓர் ஆசனம் bonus அடிப்படையில் கிடைக்கப் பெற்றிருந்தது. அப்போது ஏன் Cycle கட்சியின் பிரதானி அதைக் கிழக்கு மாகாணத்திற்கு வழங்கவில்லை. அவர் அந்தப் பாராளுமன்ற உறுப்பினர் பதவியைத் தனது செயலாளருக்கு வழங்கியிருந்தார். ஒரு போராட்டத்தின்போது அவருடைய கட்சியைச் சார்ந்தவர்கள் மட்டக்களப்பிற்கு வந்து போராட்டத்தில் ஈடுபடுகின்றார்கள்.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
இது பிரதேச வாதம்!

ගරු කන්දසාමි ප්‍රභු මහතා
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
பிரதேச வாதம் பற்றி இங்கே குறிப்பிடவில்லை. வடக்கிற்குத் தேவையானபோது கிழக்கில் இருந்து மக்களைக் கொண்டுசென்று ஆர்ப்பாட்டத்தில் ஈடுபடுகின்றீர்கள்! அதேபோன்று, கிழக்கில் ஏதேனும் தேவைக்களுக்காக அல்லது உங்கள் அரசியல் நாடகத்தை நடத்துவதற்காக வடக்கிலிருந்து கிழக்கிற்கு ஆட்களைக் கொண்டுவந்து போராட்டத்தை நடத்துகின்றீர்கள்! இவ்வாறுதான் இந்தத் தமிழ் பேசும் கட்சிகள் தொடர்ச்சியாகப் போலித் தேசிய வாதத்தை முன்னெடுத்துக் கொண்டு வருகின்றார்களே தவிர, மக்களின் நலனை நோக்காகக் கொண்டு அவர்கள் செயற்படவில்லை என்பது இங்கு பிரதானமாகத் தெரிகின்றது.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Sir, I rise to a point of Order.

ගරු කන්දසාමි ප්‍රභු මහතා
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
மன்னிக்க வேண்டும். எனது உரையின் பின்னர் நீங்கள் point of Order பெற்றுக்கொள்ளுங்கள்! ஆகவே, இதை நீங்கள் தெளிவாகத் தெரிந்துகொள்ள வேண்டும். தயவுசெய்து அரசியல் நாடகத்தில் ஈடுபட வேண்டாம்; இந்த அரசியல் நாடகத்தை நிறுத்த வேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

පාරාලුමන්ර නිලෙයියර් කට්ටළෙකළ් 91(h)ඉන් පිරකාරම් එංකළුටෙය කෙළරව පාරාලුමන්ර උරුප්පිනර් ඔරු කරුත්තෙක් කූරිනාර්. උණ්මෙයිල් අන්දප් පිරදේසත්තිල් නටක්කින්ර අත්තනෙ අම්සංකළුම් අවරුක්කුත් තෙරියුම්. ඔරු පණ්ණෙයාළර් කටත්තිච් චෙල්ලප්පට්ටු, ඕර් උයිලිප්පු -

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතැන Point of Order එකක් නැහැ නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ගරු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ගරු කන්දසාමි ප්‍රභු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු කන්දසාමි ප්‍රභු මහතා
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)

එන්නතාන් කුරිප්පිට්ටිරුන්තාලුම්, අන්තක් කාලකට්ටත්තිලේ ඉරුන්තවර්කළුක්කු අතු නෝකත්තාන් චෙය්යුම්. මුතුකෙළුම්පු උළ්ළවර්කළාක ඉරුන්තපටියිනාල් අවර්කළ් පේසුකින්රාර්කළ්. නන්රි! ඉරුන්තාලුම්, අරසාංක අතිපර්මීතු තප්පාන ඕර් අපිප්පිරාය්ත්තෙ ඉවර්කළ් කුරිප්පිට්ටු ඉරුන්තාර්කළ්. අන්රෙය තිනම් අරසාංක අතිපරුක්කු එතිරාකප් පෝරාට්ටම් ඔන්රු මුන්නෙටුක්කප්පට්ටු ඉරුන්තතු. අනෙවරුම් ඔන්රිණෙන්තු අන්තප් පෝරාට්ටත්තිල් ඈටුපට්ටිරුන්තාර්කළ්. අතිලේ පණ්ණෙයාළර්කළෙවිට, අවරුටෙය කට්සියෙච් චාර්න්තවර්කළුම් ඒනෙය කට්සියෙච් චාර්න්තවර්කළුම්තාන් ඔන්රිණෙන්තු අන්තප් පෝරාට්ටත්තිල් ඈටුපට්ටිරුන්තාර්කළ්. පිරතේස සපෙත් තවිසාළර්කළ් උට්පට පිරතේස සපෙ උරුප්පිනර්කළ් අටංකිය කුළුවිනරේ අංකේ පෝරාට්ටත්තිල් ඈටුපට්ටාර්කළේ තවිර, පොතුමක්කළෝ අල්ලතු පණ්ණෙයාළර්කළෝ අප්පෝරාට්ටත්තිල් ඈටුපටවිල්ලෙ.

කිරාන් පිරතේස චෙයලකත්තිල් ඔරුංකිණෙප්පුක් කුළුක් කූට්ටත්තිල් නාංකළ් කලන්තුකොණ්ටපෝතු, අවර්කළ් කාලෙයිල් පෝරාට්ටත්තෙ මුන්නෙටුත්තාර්කළ්. පිරකු, මාලෙවේළෙයිල් ජනාතිපති චට්ටත්තරණි ඔරුවර් වන්තු ඔරු කූට්ටත්තෙ නටත්තුකින්රාර්. අන්තක් කූට්ටත්තිල් කලන්තු කොණ්ටවර්කළුම් පෝරාට්ටත්තිල් ඈටුපට්ටවර්කළුම් උණ්මෙයිල් පණ්ණෙයාළර්කළා එන්ර සන්තේකම් එළුකින්රතු. අවර්කළින් මුකංකළෙප් පාර්ක්කුම්පෝතු, අවර්කළ් පණ්ණෙයාළර්කළා එන්ර කේල්වි එළුකින්රතු. ඉවර්කළාල් උරුවාක්කප්පටුකින්ර ඔරු විටයමාකත්තාන් නාන් ඉතනෙක් කරුතුකින්රේන්. එනවේ, ඉව්වාරාන පෝලියාන ඕර් අරසියල් නාටකත්තෙ තයවුසෙය්තු නිරුත්තික් කොළ්ළුමාරු තාළ්මෙයුටන් කේට්ටුක්කොළ්කින්රේන්. අන්තප් පේච්සුවාර්ත්තෙයිල් කලන්තුකොළ්වතර්කාක අරසාංක අතිපර් ඉවර්කළෙ අළෛත්තිරුන්තාර්. ඒළු පේර් කොණ්ට කුළුතාන් පේච්සුවාර්ත්තෙක්කු වර ඉරුප්පතාකක් කුරිප්පිට්ටිරුන්තනර්. ආනාල්, ඉන්තු පේර් මාත්තිරමේ කලන්තුකොණ්ටතාකවුම්, ඒනෙය පාරාලුමන්ර උරුප්පිනර්කළ් අතිල් කලන්තු කොළ්වතර්කුත් තයාරාක ඉල්ලෙ එන්රුම් අවර් කුරිප්පිට්ටු ඉරුන්තාර්.

පේච්සුවාර්ත්තෙයිල් කලන්තුකොළ්වතාක ඉරුන්තාල්, ඌටකවියලාළර්කළෙයුම් ඔන්රිණෙත්තුක්කොණ්ටු වන්තු විළක්කමළිප්පතර්කුම් සන්තිප්පුකළෙ මේර්කොළ්වතර්කුම් ඉරුප්පතාක අවර්කළ් කුරිප්පිට්ටිරුන්තාර්කළ්. අන්ත අටිප්පටෙයිල් අවර්කළාකවේ අංකිරුන්තු වෙළියේරි යිරුන්තාර්කළ්. තවරාක අරසාංක අතිපරෛච් චුට්ටික්කාට්ටි ඉන්ත උයරිය සපෙයිල් පිළෛයාන තකවලෙ මුන්වෛක්කිරාර්කළ්. එනවේ, අතෛත් තවිර්ත්තුක්කොළ්ළුමාරු උංකළෛත් තාළ්මෙයුටන් වේණ්ටික්කොළ්කිරේන්. මේලුම්, අරසියල් නාටකත්තෛයුම්, කාළ්ප්පුණර්ච්චියෙයුම් තයවුසෙය්තු උණ්ටු පණ්ණ වේණ්ටාම් එන්රු කේට්ටුක්කොණ්ටු එනතු උරෛයෙ නිරෙවු සෙය්කින්රේන්. නන්රි.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
උණ්මෙයිල්, කෙළරව උරුප්පිනර් අවර්කළ් කුරිප්පිට්ට විටයම්,-

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
කෙළරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, නිලෙයියර් කට්ටළෙ 91(ඒ)ඉන් පිරකාරම්, අවර් එමතු කට්සියෙක් කුරිප්පිට්ටුප් පේසියිරුන්තාර්. එමතු කට්සියෙක් කුරිප්පිට්ටුප් පේසියතන් අටිප්පටෙයිල් අතර්කු answer පණ්ණ වේණ්ටුම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පක්ෂයේ,- පුද්ගල නම් සඳහන් කළේ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
උණ්මෙයිල්, නිලෙයියර් කට්ටළෙ 91(ඒ)ඉන් පිරකාරම්, අවර් කුරිප්පිට්ට විටයම් තවරාකුම්. නාංකළ් අරසාංක අතිපරෛච් චන්තික්කච් චෙන්රපෝතු, අවර් එංකළුක්කු අනුමති වළංකවිල්ලෙ එන්පතේ උණ්මෙයාන විටයම්. අන්තප් පණ්ණෙයිල් ඔරුවරෛක් කටත්තිච් චෙන්රු කොලෙ චෙය්යක්කූටිය නිලෛමෙයිලිරුන්තු අවරෛ නාංකළ් මීට්ටෙටුත්තෝම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.17]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා පසුගිය සති අන්තයේ මේ රටේ ආර්ථිකය පිළිබඳව ඉතාම වැදගත් ප්‍රකාශයක් කළා. ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා ලෙසත් කටයුතු කරනවා. ආර්ථිකය සම්බන්ධයෙන් එතුමා හැම දෙයම දන්නවා කියලා අපි විශ්වාස කරනවා. එතුමා කිව්වා, 2024 වර්ෂයේදී මේ රජය බලයට පත් වීමෙන් පසුව එකම බද්දක්වත් අලුතින් පැනෙව්වේත් නැහැ, එකම බද්දක්වත් වැඩි කළේත් නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සේවා අපනයන ආදායම් මත සියයට 15ක ආදායම් බද්දක් අලුතින් පැනෙව්වා. නේවාසික ඩිජිටල් සේවා මත අලුතින් සියයට 18ක VAT එකක් පැනෙව්වා. ව්‍යාත්තීය සේවා සපයන්නන් වෙනුවෙන් කරන ගෙවීම් මත අලුතින් සියයට 5ක රඳවා ගැනීමේ බද්දක් පැනෙව්වා. ඒ අනුව, අලුතින් බදු 3ක් පනවා තිබෙනවා. අලුතින් කිසිදු බද්දක් පැනෙව්වේ නැහැ කිව්වා. නමුත්, අලුතින් බදු 3ක් පනවා තිබෙනවා.

ඊට අමතරව සිගරට්, වාහන, මෘදුපාන සහ දුම්කොළ නිෂ්පාදන මත පනවා තිබූ බදු සියයට 5.9කින් වැඩි කළා. මත්පැන් මත පනවා තිබූ බදු නැවත වරක් සියයට 5.9කින් වැඩි කළා. පොලී සහ වට්ටම් මත අය කරන ආදායම් බද්ද සියයට 10කින් වැඩි කළා. ඒ වාගේම, මත්පැන්, දුම්කොළ, ඔට්ටු ඇල්ලීම සහ සූදු ව්‍යාපාරවලින් ලබන ආදායම් මත අය කරන බද්ද සියයට 45 දක්වා වැඩි කළා. ප්‍රාග්ධන ලාභ බද්ද සියයට 15ක් කළා. ඒ වාගේම, ඒකක භාර, අන්‍යෝන්‍ය අරමුදල් සහ රාජ්‍ය නොවන සංවිධාන මත සියයට 30ක බද්දක් පැනෙව්වා. මූල්‍ය සේවා මත පැවැති එකතු කළ අගය මත බද්ද සියයට 18ක සිට සියයට 20.5ක් දක්වා වැඩි කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා, මුදල් ඇමතිතුමා හැටියට අලුතින් බදු 3ක් පනවා තිබෙනවා. නමුත්, මෙතුමන්ලා ඒක දන්නේ නැහැ. බදු වර්ග 7ක බදු ප්‍රමාණය වැඩි කළා. ඒ බව දන්නේත් නැහැ. එතකොට කවුද, මේ රටේ මුදල් ඇමති? අනුර කුමාර දිසානායකද නැත්නම් වෙන කවුරුහරිද?

මේ රටේ ජනාධිපතිවරයා තමන්ගේ විද්වතුන් කැඳවා තිබුණා. ඒ අතර හිටපු අය විද්වතුන්ද නැද්ද කියන්න අපි දන්නේ නැහැ. කෙසේ වෙතත්, මේ රටේ පුරවැසියන් භාරපන්දහසක් කැඳවලා, රටේ ජනාධිපතිවරයා, මුදල ඇමතිවරයා හැටියට "මම අලුතින් කිසිම බද්දක් පැනවූයේ නැහැ" කියලා ප්‍රකාශයක් කරනවා නම් ඒක ලොකු බොරුවක් නේ; ඒක ලොකු පවයක් නේ. ඒ වාගේම බදු වර්ග 7ක බදු ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා. "මම එහෙම දෙයක් කළේ නැහැ" කියලා කියනවා නම් එයින් අදහස් වෙන්නේ ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට තමන්ගේ වගකීම් ඉෂ්ට කරන්නේ නැහැ කියන එකයි. එහෙම නැත්නම් බදු පනවන්නේ වෙන කවුරුහරිද? හුලංගමුවද? නැහැ. වෙන කවුද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක පුදුම වැඩක් නේ. බදු පැනවීම ගැන රටේ ජනාධිපතිවරයා - මුදල් ඇමති - දන්නේ නැත්නම්, මේ රටට මොකක්ද වෙන්නේ? මොකක් හෝ දෙයක් ලස්සනට ගොතලා කථාවක් පවත්වන එක මුදල් ඇමතිවරයාගේ වගකීම නොවෙයි නේ. ඒක ආර්ථිකය කළමනාකරණය කිරීම නොවෙයි නේ. බදු ගහලා, ගහලා, ජනතාව මත විශාල පීඩනයක් ගොඩනඟලා, අවසානයේදී ඒ පීඩනය මතින් එකතු කරගත් මුදල් ටික නිසි පරිදි වියදම් කර ගැනීමට නොහැකි ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. ඒක තමයි ලජ්ජාවට කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ ඉන්න ඕනෑම මන්ත්‍රීවරයෙකුට මම දැන් අභියෝගයක් කරනවා. මම දැන් නිශ්චිතව කිව්වා, බදු 3ක් ස්ථිරසාරව අලුතින් හඳුන්වා දී තිබෙන බවත්, බදු වර්ග 7ක බදු ප්‍රමාණය වැඩි කර තිබෙන බවත්. ඒක එහෙම නොවෙයි කියලා ආණ්ඩු පාර්ශ්වයේ ඉදිරි පෙළේ ඉන්න කවුරු හරි ඇමතිවරයෙකුට කියන්න පුළුවන් නම්, මම ඒ අභියෝගය භාර ගන්නවා සහ දැන් මගේ කථාව නතර කරනවා.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
මේ ආණ්ඩුව හැමදාම වගකීම් භාර ගන්නවා නේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අභියෝගය භාර ගන්නවාද? අභියෝගය භාර ගන්නවා නම් ඒ ගැන කියන්න. බදු 3ක් අලුතින් පැනවූයේ නැද්ද? කයිවාරු ගහලා වැඩක් නැහැ නේ, ගරු ඇමතිතුමා. අවශ්‍ය නම් ඔතැන ඉඳගෙන mike එකට කියන්න, මගේ ප්‍රකාශය වැරැදියි කියලා. මම බදු 3ක් අලුතින් පැනවීම ගැනත්, බදු වර්ග 7ක බදු වැඩි කිරීම ගැනත් කිව්වා. ඔබතුමාට ඒක වැරැදියි කියලා කියන්න පුළුවන් නම් mike එකට කියන්න. කියන්න බැහැ නේ. *[බාධා කිරීමක්]* ලක්මාලි හේමචන්ද්‍ර මැතිනිය කියන්න, මේ බදු 3 අලුතින් පැනවූයේ නැද්ද කියලා. ඔබතුමිය නැඟිට්ටා නේ. හරි, හරි, වාඩි වෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත පිළිබඳවත් මම විශේෂයෙන් කථා කරන්න ඕනෑ. මෙම පනත් කෙටුම්පතේ යෝජිත 46වැනි වගන්තියේ සඳහන් වෙනවා, "වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද සාක්ෂි ආඥාපනතේ 25වන, 26වන සහ 30වන වගන්තිවල විධිවිධාන මේ පනත යටතේ වූ බරපතළ අපරාධයක් සම්බන්ධයෙන් වන යම් නීති කෘත්‍යයක දී අදාළ නොවිය යුතුය" කියලා.

සාක්ෂි ආඥා පනතේ 25වන වගන්තියේ කියා තිබෙන්නේ මොකක්ද? පොලිස් නිලධාරියෙකුට කරන පාපෝච්චාරණය සම්බන්ධයෙන් තමයි එම වගන්තියේ තිබෙන්නේ. සාක්ෂි ආඥා පනතේ 26වන වගන්තියේ කියා තිබෙන්නේ අත්අඩංගුවේ සිටියදී කරන පාපෝච්චාරණය සම්බන්ධයයි. සාක්ෂි ආඥා පනතේ 30වන වගන්තියේ කියා තිබෙන්නේ මොකක්ද? එහි සඳහන්ව තිබෙන්නේ, එක් අයෙකුගේ පාපෝච්චාරණයක් තවත් අයට විරුද්ධව භාවිත නොකළ යුතුයි කියන කාරණයයි. අවුරුදු සිය ගණනක් මේ රටේ ක්‍රියාත්මක වෙච්ච, අධිකරණවලදී ප්‍රායෝගික භාවිතයේ තහවුරු වෙච්ච, පොලීසියේ අත්අඩංගුවේ ඉන්න තැනැත්තෙකුට, පොලීසිය භාරයේ ඉන්න තැනැත්තෙකුට නිදහස අහිමිවීම නිසා ඇතිවන ප්‍රායෝගික තත්ත්වයන් පිළිබඳව සලකලා, මේ රටේ ක්‍රියාත්මක වන අතිශය වැදගත් වූ, ගෞරවනීය වූ සාක්ෂි ආඥා පනතේ 25, 26 සහ 30වන වගන්ති යටපත් කරනවා. මොකක්ද ඒ කියන්නේ? පොලීසිය තුළ දීර්ඝ කාලයක් රඳවාගෙන, සතියක් දෙකක් නොවෙයි, වසර දෙකක් දක්වා කාලයක් රඳවාගෙන, ඒ කාලය අතරතුර පීඩාවට පත් කරලා, නිංසාවට පත් කරලා, හුදෙකලාවට පත් කරලා, සබඳතාවන්ගෙන් ඈත් කරලා, අසරණ කරලා, ඉන්පස්සේ ලබා ගන්නා පාපෝච්චාරණයක් මඟින් විතරක් ඒ තැනැත්තාව අධිකරණයක මරණීය දඬුවම දක්වා හෝ නැත්නම් ඉතා බරපතළ සිර දඬුවම් දක්වා වූ දඬුවම්වලට ලක් කරන්න පුළුවන් විධියේ දුෂ්ට, කෲර නීතියක් තමයි මේ හඳුන්වා දෙන්නේ. අනුර කුමාර දිසානායක විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් සිටියදී මේ සභාවේ ඉඳන්

මෙවාට විරුද්ධව කථා කළා. ගරු අගමැතිතුමිය විපක්ෂයේ මන්ත්‍රීවරියක් වශයෙන් සිටියදී මෙවාට විරුද්ධව කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ මුලසුන දරන ඔබතුමාත්, මේ පාර්ලිමේන්තුවේ ඉන්න ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු සියලු දෙනාමත්, එදා මේ මර්දන නීතිවලට විරුද්ධව කථා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම ඉක්මනින්ම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමන්ලා අරගළවලට පැටලිලා, පාපෝච්චාරණ මත අධිවෝදනා ගොනු කරලා තිබෙන අවස්ථාවලදී අපි අධිකරණවල පෙනී ඉඳලා; ඔබතුමන්ලාට වෙච්ච හිරිහැර, කරදර ගැන සලකලා, අධිකරණවල තර්ක කරලා, දීර්ඝ කාලයකට පසුව ඔබතුමන්ලා බේරා ගත්තා. දැන් අද එවැනි මර්දනකාරී නීති පනවන්නේ අනුර කුමාර දිසානායක ජනාධිපති වන JVP- NPP පාලනයකින් වීම, ඒක හරිම පුදුම දෙයක්. ඒක පුදුම දෙයක්. අද මේ රටේ තරුණයෝ දහස් ගණනක් පාරට බැහැලා, අද මේ පාර්ලිමේන්තුව ඉදිරිපිට අරගළ කරන්නේ, මේ රටේ මිනිසුන්ගේ හෘදය සාක්ෂියට තදින්ම වැදිලා තිබෙන්නේ, මේ නීතිය ප්‍රායෝගික නොවන නිසායි, මේ රටේ මානව හිමිකම් පල්ලෙහාට දමන නිසායි. ඒ නිසා තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානය කියන්නේ, "මේ නීතිය ජාත්‍යන්තර ප්‍රමිතියට නැහැ" කියලා. මේ නීතිය කිසිම සැලකිල්ලක් නැතිව, නිසි සැලකිල්ලක්, සාකච්ඡාවක් නැතිව, සම්මත කරගන්න උත්සාහ කර තිබෙනවා; පළමුවන වර කියවීම සඳහා ඉදිරිපත් කරනවා, ඒ සම්බන්ධයෙන් කිසිම සාකච්ඡාවක් නැතිව. පාර්ලිමේන්තුවේ සාකච්ඡාව පටන් ගන්නේ ඊට පස්සේ. ඒක වැරදියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එපමණක් නොවෙයි, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කියනවා, මේ නීතිය ඉල්ලා අස් කරගන්න කියලා. ජාත්‍යන්තරය පැත්තකට දාන්න. අපේ රටේ මානව හිමිකම් කොමිෂන් සභාව කියනවා, "මේ නීතිය නරකයි, වැරදියි, ගැළපෙන්නේ නැහැ" කියලා. එවැනි තත්ත්වයක් තුළ මෙවැනි මර්දනකාරී නීතියක් අරගෙන එන දුෂ්ට ආණ්ඩුවක් බවට මේ අනුර කුමාර දිසානායකගේ ආණ්ඩුව පත්වෙන එක, එක අතකින් මේ රටේ ජනතාවට පිටුපෑමක්; අනෙක් අතට මහා දෝෂයක්. මේ මන්ත්‍රීවරුන්ට, මේ ඇමතිවරුන්ට හෘදය සාක්ෂියක් තිබෙනවා නම්, කරුණාකරලා කියන්න මේ නීති දෙකම ඉල්ලා අස් කර ගන්නවා කියලා. මෙවා දුෂ්ට නීති, රටට වැදගත් නැති නීති, රට පස්සට අරගෙන යන නීති, ලෝකය ඉදිරියේ ලජ්ජා කරන නීති, රට ආපසු හරවන නීති බව සඳහන් කරමින්, මම නතර වෙනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.25]

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ විවාදයට භාජන කර තිබෙන කාරණා සම්බන්ධයෙන් අදහස් පළ කරන්න කලින් මට මොහොතකට ඉඩ දෙන්න, සඳුදා දිනයේදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වුණු යම් සිදුවීමක් පිළිබඳව ප්‍රකාශයක් කරන්න. සඳුදා දිනයේදී සංවිධානාත්මක අපරාධ කල්ලිවලට සම්බන්ධ යම් ගැටුමක් හේතුවෙන් සිදු වූ වෙඩි තැබීමක් ත්‍රිකුණාමලයේදී සිද්ධ වුණා. ඒ හේතුවෙන් එක් දරු පියෙක්, ස්වාමිපුරුෂයෙක්, තරුණයෙක්; ඒ ගැටුම්වලට සම්බන්ධ නැති තරුණයෙක් ජීවිතක්ෂයට පත් වුණා. ඒක යම් හුදෙකලා සිදුවීමක් නොවෙයි. ඒක ලංකාවේ දැනට ක්‍රියාත්මක කරන සංවිධානාත්මක අපරාධ ජාලයට සම්බන්ධ ඒ සාමාජිකයන්ගේ ගැටුම්වල ප්‍රතිඵලයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජීවිතක්ෂයට පත්වූ එම තරුණයාගේ පවුලේ උදවිය වෙත සංවේගය ප්‍රකාශ කරන්න මා මේක අවස්ථාවක් කර ගන්නවා. මොකද, මේ සිදුවීම ත්‍රිකුණාමලය නගර සීමාවේ සිටින ජනතාව කම්පාවට පත් කළ සිදුවීමක්, සංවේගයට පත් කළ සිදුවීමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ මේ විවාදයේදී මතු වෙච්ච කාරණා කීපයකට මම ඒ ආශ්‍රයෙන්ම උත්තර දෙන්න කැමතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාතාලය හා මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන සංවිධානාත්මක අපරාධවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම කියන එක කාලයක් තිස්සේ ජනතාවට විශ්වාස කරන්න බැරිව තිබ්බ්ච කාරණාවක්. ඕනෑම ආණ්ඩුවක් ආවාට පස්සේ මත්ද්‍රව්‍යවලට විරුද්ධව සටන් කරයි කියන එක, මත්ද්‍රව්‍යවලට සම්බන්ධ පාතාල නායකයින්, සංවිධානාත්මක අපරාධකරුවන් අල්ලලා මේවා අවසන් කරයි කියන එක ජනතාව විශ්වාස නොකළ කාරණාවක්.

ඒකට හේතුව මා කියන්නම්. උදාහරණයක් ලෙස ගත්තොත්, ගමක මත්ද්‍රව්‍ය ජාවාරම් කරන - මත්ද්‍රව්‍ය විකුණන - කෙනෙකු නීතියේ රැහැනට කොටු වුණාට පස්සේ ඔහුට විරුද්ධව නීතිය ක්‍රියාත්මක වුණේ ඔහු ළඟ ඒ මොහොතේ තිබුණු මත්ද්‍රව්‍ය ප්‍රමාණයට පමණයි. ඕක තමයි සාමාන්‍යයෙන් මත්ද්‍රව්‍යයට එරෙහිව වර්තමානයේ, දැනට පවතින නීතිය ක්‍රියාත්මක කිරීමේදී සිද්ධ වන ක්‍රමවේදය. ඔහු කොපමණ පරිමාණයෙන් ඒ ජාවාරම් කළා වුණත්, කොයි තරම් සංවිධානාත්මකව ඒ ජාවාරම් කළා වුණත්, ඔහු අත්අඩංගුවට පත් වන මොහොතේ ඔහු ළඟ තිබුණු මත්ද්‍රව්‍ය ප්‍රමාණය සලකා බලා තමයි නඩු පැවරීම සිද්ධ වෙන්නේ. ඒ අනුව, ඉහළ අධිකරණවලින් හරි ඇප අරගෙන ඒ ජාවාරම්කරුවන් කෙටි කාලයකින් නැවත සමාජයට එනවා. ඒ ආවාම මොකද වෙන්නේ? කලින් කළාටත් වඩා සංවිධානාත්මකව, කලින් කළාටත් වඩා සාර්ථකව ඔවුන් මේ ජාලය මෙහෙයවනවා. ඒ නිසා ජනතාව තුළ කාලයක් තිස්සේ තිබුණු මතයක් තමයි, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ඇල්ලුවාට වැඩක් නැහැ, ප්‍රධාන වශයෙන් විකුණන අය අහු වෙන්නේ නැහැ, ඇල්ලුවත් ටික කාලයකින් එළියට එනවා, මේවාට විරුද්ධව ජනතාව අදහස් ප්‍රකාශ කළාට වැඩක් නැහැ කියන එක. ඒවාට භය

[ගරු රොෂාන් අක්මීමන මහතා]

වුණා, ජනතාව. ඒ නිසා තමයි සංවිධානාත්මක අපරාධ වැළැක්වීමට ශක්තිමත් නීතියක් අපේ රටට අවශ්‍ය වුණේ. මොකද, අත්අඩංගුවට ගන්න මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වලා, ඔවුන්ගේ දුරකථන ආදිය පරීක්ෂා කරලා ඔවුන් කාටද මත්ද්‍රව්‍ය සපයා තිබෙන්නේ, ඔවුන් කාගෙන්ද මත්ද්‍රව්‍ය ලබා ගන්නේ, මොන සංවිධානාත්මක අපරාධ ජාලයට ද ඔවුන් සම්බන්ධ කියන එක හඳුනාගෙන ඒ සමස්ත ජාලයටම එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට, සංවිධානාත්මක අපරාධ කල්ලියක් සහ එහි සාමාජිකයෙක් වී සංවිධානාත්මක අපරාධ සිදු කිරීම කියන වරද නිශ්චිතව නිර්වචනය කිරීමක් මේ වනකල් ලංකාවේ නීතිවල නැහැ. ඒ නිසා තමයි සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත වාගේ පනත් කෙටුම්පතක් අපට ගෙනෙන්න වෙන්නේ; එහි අවශ්‍යතාව අපි හඳුනා ගන්නේ. මේ "රටම එකට" ජාතික මෙහෙයුම ක්‍රියාත්මක කිරීම හරහා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සාර්ථකව අත්අඩංගුවට ගෙන නීතිය ක්‍රියාත්මක කිරීමට යාමේදී අපට පෙනෙනවා, දැනට තිබෙන නීතියේ ඇති අඩුපාඩු.

උදාහරණයකට, ශිරාන් බාසික් කියන ප්‍රධාන මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවා මීට කලින් අත්අඩංගුවට ගත් අවස්ථාවල ඔහු මහා පරිමාණ ජාවාරම්කරුවෙකු වෙලා සිටියදීත් ඔහුට එරෙහිව පවරා තිබුණේ ඉතා පුංචි නඩුවක්. මත්ද්‍රව්‍ය පොඩි ප්‍රමාණයක් ළඟ තබා ගැනීම සම්බන්ධ නඩුවක් තිබුණේ. ඒ නිසා තමයි ඔහු ගැලවිලා ඩුබායිවලට ගිහිල්ලා මේ ජාලය මෙහෙයවුයේ. ඒ වාගේ අඩුපාඩු වර්තමාන නීතියේ තිබෙනවා. ඒ නිසා අපි අවංකවම මත්ද්‍රව්‍යයට එරෙහිව සටනක් කරනවා නම්, අපි සද්භාවයෙන්, අවංකවම ජනතාව වෙනුවෙන් පාතාලයට එරෙහිව, සංවිධානාත්මක අපරාධවලට එරෙහිව සටනක් කරනවා නම් - ජනතාව සහ ආණ්ඩුව එකතු වෙලා - සංවිධානාත්මක අපරාධ මැඩලීම සඳහාම වූ යම් නිශ්චිත නීතියක් ගෙන ඒමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ වෙනුවෙන් තමයි සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ. මේ පනත් කෙටුම්පත ගෙනෙනකොට ඒකට කලබල වෙලා තිබෙන්නේ කවුද?

අද නාමල් රාජපක්ෂ පාර්ලිමේන්තුවට ඇවිල්ලා සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පතෙහි තිබෙන සංවිධානාත්මක අපරාධකරුවන්ගේ ඇඳුම් විලාසිතා සම්බන්ධ වගන්තිය විතරක් අරගෙන කථා කළා. මම බැලුවා, නාමල් රාජපක්ෂ ඒ පනත් කෙටුම්පතෙහි තිබෙන ඒ වගන්තිය ගැන කථා කරන්නේ ඇයි කියලා. එතකොට තමයි කල්පනා වුණේ, නාමල් රාජපක්ෂලාගේ කල්ලියටත් නිල ඇඳුමක් තිබෙනවා කියලා. සාටක නිල ඇඳුමක් දමාගෙන ලංකාවේ වංචා දූෂණ කරපු, හොරකම් කරපු කල්ලියක් හිටියා. අපි දන්නවා, නාමල් රාජපක්ෂ, යෝෂිත රාජපක්ෂ, චමල් රාජපක්ෂ, ශෂීන්ද්‍ර රාජපක්ෂ, ශමීන්ද්‍ර රාජපක්ෂ කියලා ඔය ආකාරයට රාජපක්ෂ කල්ලියක් හිටපු බව. ලංකාවේ අපරාධකාරයෝ. "සාටකයෝ සාතකයෝ" කියලා ජනතාව අරගළ කාලයේ කථා කළෙත් ඒකයි.

දැන් නාමල් භය වෙලා ඉන්නවා. නාමල්ට විරුද්ධව දැනට නීතිය ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ දූෂණ විරෝධී පනත යටතේ. හැබැයි, දැන් මේ සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත ආවොත්, සංවිධානාත්මක අපරාධවලටත් හසු වේවිද මන්දා කියලා භය වෙලා ඉන්නවා. අර ඇඳුම් විලාසිතා සම්බන්ධ කොටස දැකලා තමයි භය වෙලා ඉන්නේ. ඔවුන්ගේ කාලයේ සංවිධානාත්මක අපරාධ කල්ලිවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක වුණේ කොහොමද කියලා මතක් කරලා බලන්නකෝ. පොලිසිය හෝ නීතිය ක්‍රියාත්මක කරන යම් ආයතනයක් මහන්සි වෙලා අපරාධකාරයෙකු අල්ලාගෙන ආවාට පස්සේ මොකක්ද වුණේ? දේශපාලනඥයෝ ඒ අපරාධකාරයාගෙන් අල්ලස් ගත්තා, නිදහස් කරන්නම් කියලා. පොලීසියෙන් මහා පරිමාණයේ පාතාලකරුවෝ අල්ලාගෙන ආවාට පස්සේ අර හිටපු අධිකරණ ඇමතිවරයකුගේ පුතා සහ සමගි ජන බලවේගයේ ආසන සංවිධායක කෙනෙකු එකතු වෙලා ඔවුන්ව නිදහස් කරන්න අල්ලස් ගත්තා. මේගොල්ලන් අපරාධ මැඩලනවා කියලා, ආණ්ඩු කරනවා කියලා බිස්නස් කළේ. මේගොල්ලන් ජනතාව වෙනුවෙන් කටයුතු කළේ නැහැ.

අනෙක් කාරණය මේකයි. සංවිධානාත්මක අපරාධකාරයෝ අහු වුණාට පස්සේ තමන්ගේ රහස් හෙළි වෙයි කියලා, දේශපාලන සම්බන්ධතා හෙළි වෙයි කියලා ආයුධ පෙන්වන්න වාගේ එක්කගෙන ගිහිල්ලා මරා දමන ක්‍රමයක් තමයි තිබුණේ. ශිෂ්ට සම්පන්න සමාජයක නීතිය ක්‍රියාත්මක කරන්නේ ඒ විධියටද? ඒ වෙනුවට අපි ශිෂ්ට සම්පන්න සමාජයක් විධියට යම් සමාජයක නීතිමය අවශ්‍යතා හඳුනාගෙන, කාලීන අවශ්‍යතා හඳුනාගෙන යම් නෛතික රාමුවක් සකස් කරන්න ගියාම, ඒ සම්බන්ධව කලබල වෙලා ඉන්නවා, ඒ නීති හදන්නේ නැතිව මේ රටේ අපරාධ වර්ධනය වෙන්න ඉඩ හැරපු අය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලීසිය ඇතුළු නීතිය ක්‍රියාත්මක කරන ආයතන මේ පාතාලයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කළා; ඉතිහාසයේදීත් එය කළා. නමුත් ඒ නීතිය ක්‍රියාත්මක කරපු වේගයට වඩා වැඩි වේගයකින් සංවිධානාත්මක අපරාධ වර්ධනය වුණා. ඒ ඇයි? ඒ සංවිධානාත්මක අපරාධවලටම නිශ්චිත වූ, ඒවා වැළැක්වීම සඳහාම නිශ්චිත වූ බලය ලබා දුන්නු නීතියක් ලංකාවේ නොතිබුණු නිසා. ඒ අවශ්‍යතාවයි අප මේ සපුරන්නේ. ඉතින් ඒ වෙනුවෙන් නීතියක් ගෙන ආවාට පස්සේ ඒ සම්බන්ධව බොරු භීතිකාවක් හදලා ඒක වළක්වන්න වුවමනාව තිබෙන්නේ කාටද කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

ඒ වාගේම, මේ විවාදයේදී මතු වෙච්ච තවත් කාරණාවක් සම්බන්ධයෙන් කියන්න ඕනෑ. උගත් මන්ත්‍රීතුමකු වන හර්ෂ ද සිල්වා මහත්මයා ගරු කටයුතු මන්ත්‍රීතුමෙක්. එතුමා, බොහොම විශ්වාසදායි කරණු කියනවා කියලා නමක් දරා තිබෙන මන්ත්‍රීතුමෙක්. නමුත්, එතුමා අද දක්ෂ ලෙස සංඛ්‍යා හරඹයක් කළා. මේ ආණ්ඩුව යටතේ දරිද්‍රතා අනුපාතය වර්ධනය වෙලා කියලා පෙන්වන්න එතුමා බොහොම අපූරුවට දත්ත දෙකක් උපුටා ගත්තා. 2019 වර්ෂයේදී ලංකාවේ දරිද්‍රතා අනුපාතය සියයට 11.5යි කියලා එතුමා දත්තයක් උපුටා දැක්වුවා. ඊළඟට කිව්වා, 2025 අවුරුද්දේ දරිද්‍රතා අනුපාතය සියයට 16.9යි කියලා. එතුමා දරිද්‍රතා අනුපාතය කොහොමද සංසන්දනය කළේ? 2019 අවුරුද්දේ දරිද්‍රතා අනුපාතය සහ 2025 අවුරුද්දේ දරිද්‍රතා අනුපාතය තමයි සංසන්දනය කළේ. ඒ දෙක දිහා විතරක් බැලුවාම පෙනෙනවා, 2019ට වඩා 2025දී දරිද්‍රතාව වැඩි වෙලා කියලා. ඒ කියන්නේ මාලිමාව ආණ්ඩුව ආවාට පස්සේ දුප්පත්කම වැඩි වෙලා කියන එකයි. හැබැයි ඒ මැද වර්ෂ කෝ? 2019 ඉඳන් 2025 වනකල් අවුරුදු 6ක කාලය අතුරුදහන් වුණාද? ඒකට මොකක්ද වුණේ? ඒ කාලයේ මේ රටේ ආර්ථික බංකොලොත්භාවයක් ආවා; ආර්ථික අර්බුදයක් ආවා. හර්ෂ ද සිල්වා මහත්මයා ආර්ථික උපදේශකවරයෙකු වෙලා හිටපු, ඇමතිවරයෙකු වෙලා හිටපු ඒ ආණ්ඩුවෙන් ගත්තු ස්වෛරීත්ව බැඳුම්කර ණය, අධිපොළියට ගත්තු ණය, ගිනි පොලියට ගත්තු ණය ගෙවාගන්න බැරුව මේ ආර්ථිකය බංකොලොත් වුණා. ලංකාව එදා දණ ගැහුවා, ජාත්‍යන්තරය හමුවේ. 2023දී දරිද්‍රතා අනුපාතය සියයට 27 දක්වා වැඩි වුණා. ඒ කොටස කිව්වේ නැහැ, ඒ උගත් මන්ත්‍රීතුමා. එය අමතක වුණාද දන්නේ නැහැ, එතුමාගේ උගත්කම නිසා. එහෙම

නැත්නම් උගත්කම වැඩිකමට යම් උජ්පරවැට්ටියක් දැම්මා වෙන්නත් පුළුවන්, සාමාන්‍ය ජනතාව අන්දන්න. මොකද, මේක දරිද්‍රතා අනුපාතයද, මේක වර්ෂ අනුව වෙනස් වෙන්නේ කොහොමද, මේක මනින්නේ කවුද කියලා සාමාන්‍ය ජනතාව දන්නේ නැහැ නේ. ඒ නිසා එතුමා කරුණු දෙකක් අරගෙන TV එකට voice-cut එකක් දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා බදු ගැන කථා කළා; මේ ආණ්ඩුව ඇවිල්ලා අලුතින් බදු ගැහුවා කිව්වා. අපි කිසිම බද්දක් අලුතෙන් පනවා නැහැ. අලුතෙන් බදු ගැහුවා නම් රාජ්‍ය ආදායම වැඩි කරගන්න කොට අපේ අය වැය ලේඛනයට අපි එය ගෙනෙන්න ඕනෑ. කවුද මේ බදු ගැන කථා කරන්නේ? 2015-2019 යහ පාලන ආණ්ඩුවේදී සියයට 8ක් ලෙස තිබ්බ VAT එක සියයට 15 කරපු මහත්වරු තමයි මේ බදු ගැන කථා කරන්නේ. මෙතුමන්ලාට කිසිම අයිතියක් නැහැ, බදු ගැන කථා කරන්න. ඇයි? ආර්ථිකයේ කිසිම ප්‍රශ්නයක් නොනිබුණු කාලෙක, යම් ආකාරයකට මහා පරිමාණ සමාගම්වලට, ව්‍යාපාරිකයන්ට බදු පනවා රාජ්‍ය ආදායම වැඩි කරගන්න පුළුවන්කම තිබුණු කාලෙක, ආර්ථික වර්ධනය හොඳින් තිබුණු කාලෙක ඒ වර්ධනය වන ආර්ථිකයෙන් බදු අය කර ගන්නේ නැතුව සාමාන්‍ය වැඩ කරන ජනතාව මත පනවා තිබුණු VAT එක සියයට 8 ඉඳන් සියයට 15 දක්වා මේ ගොල්ලන් වැඩි කළා. ඒවා කරපු මේ අය දැන් ඇවිත් ජනතාව ගැන කථා කරනවා.

මහා පරිමාණ අරක්කු ව්‍යාපාරිකයන්ට බදු සහන දුන්නේ කවුද? මේගොල්ලන්ගේ කාලයේ තමයි අරක්කු කොමිපැනිකාරයන්; අර්ජුන් ඇලෝසියස්ලා බදු නොගෙවා හිටියේ. අප ඇවිල්ලා ඒ නොගෙවපු බදු අය කරගෙන, ඒ මහා පරිමාණ ව්‍යාපාරිකයන්ගෙන් බදු අය කරගෙන බදු සන්ධානය පුළුල් කළාට පස්සේ, බදු පදනම පුළුල් කළාට පස්සේ මේ අයට ඒක බලාගෙන ඉන්න බැහැ, ඇලියාව. විපක්ෂයේ ඔබතුමන්ලාට කිසිම අයිතියක් නැහැ, මේ රටේ ජනතාවගේ බදු බර ගැන කථා කරන්න. මොකද, ඒ බදු බර වැඩි කළේ ඔබතුමන්ලායි.

අපි පසුගිය අවුරුදු දෙකේ ආර්ථික ස්ථාවරභාවය ඉතාම සාර්ථකව ඇති කරගෙන තිබෙනවා. එහි ප්‍රතිලාභය මේ රටේ වැඩ කරන ජනතාවට අනිවාර්යයෙන්ම ලැබෙනවා. මේ ආර්ථික ස්ථාවරභාවය ලබා ගන්න වැඩ කළේ මේ රටේ ජනතාවයි. ඒ වැඩ කරපු එකේ ප්‍රතිලාභය ආණ්ඩුව විධියට අපි ඉදිරි අය වැයේදී මේ රටේ ජනතාවට ලබා දෙනවා කියන සහතිකය ලබා දෙන්න මා කැමැතියි.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.36]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

පරිපූරක ඇස්තමේන්තුවක් සම්බන්ධයෙනුත් අද මේ විවාදයේදී කතා බහ කරනවා. එහිදී අවධානයට ගන්නේ මීට පෙර මුදල් වෙන් කිරීම් කීපයක් සංශෝධනය කරලා ඒවා ජනතාවගේ පාවිච්චියට යොමු කරන්නේ කොයි ආකාරයෙන්ද කියන එක ගැනයි.

ඒ ගැන කථා කරන්න පෙර කාරණයක් මතක් කර දෙන්න අවශ්‍යයි. මේ ආණ්ඩුවේ අය එදා විපක්ෂයේ හිටපු අවස්ථාවේ, පැවැති හැම ප්‍රශ්නයටම තමන්ට උත්තරයක් තිබුණු බව පසු ගිය ආණ්ඩුවලට ඉතා දක්ෂ ලෙස පෙන්වා දුන්නා. ඒ, තෙල් ප්‍රශ්නය ගැන වෙන්න පුළුවන්, ජීවන වියදම ගැන වෙන්න පුළුවන්, විරැකියාව ගැන වෙන්න පුළුවන්, ණය ගෙවීම ගැන වෙන්නත් පුළුවන්. බිලියන 46ක් සොච්චමක් කියලා කියපු කට්ටියට අද එය ප්‍රශ්නයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා.

ත්‍රිකුණාමලයේ සීනි කර්මාන්තශාලාවෙන් මුළු රටම සංවර්ධනය කරන්න පුළුවන් කියලා, ඉල්මනයිට්වලින් මේ රටේ ස්වයංපෝෂිත බවක් ඇති කරන්න පුළුවන් කියලා කිව්වත්, බලයට ආවාට පසුව තමයි මේ පවතින වාතාවරණය තුළ ප්‍රායෝගික අත්දැකීම මොකක්ද කියලා දැන ගන්නේ. ආණ්ඩුවේ ඉන්න එක විපක්ෂයේ සිටියාට වඩා ලෙහෙසි කාර්යභාරයක් නොවෙයි කියන එක දැන් ඔප්පු වෙනවා. ඔබතුමන්ලා ආණ්ඩු පක්ෂයට ආවාට පසුව දැන් හැම උත්තරයක්ම දෙනවා, එදා ඒ කියපු දේ ඉටු කරන්න බැරි ඇයි කියන එක ඔප්පු කරන්න. ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩි වෙනවාලු. ඒ නිසා ආර්ථිකය කඩා වැටෙනවාලු. ට්‍රම්ප් බෝම්බ ගහන නිසා ප්‍රශ්නයක් ඇති වෙනවාලු. මෙම පරිපූරක ඇස්තමේන්තුව ගෙනැල්ලා තිබෙන්නේ ඒ නිසාලු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකක් සඳහා ද මේ අය මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරලා තිබෙන්නේ? ඉන්ධන මිල ඉහළ යෑම සම්බන්ධයෙන් සහන සැලසීම සඳහා රුපියල් බිලියන 41ක් වෙන් කර තිබෙනවා. එය බොහොම හොඳයි. මොකද, එය ඉදිරිපත් කරලා තිබෙන්නේ ජනතාව ආරක්ෂා කිරීම සඳහායි. හැබැයි, මේ යටතේ ජනතාව ආරක්ෂා කරන කොට හැමදෙනාටම එක විධියටයි සහන ලැබෙන්නේ. ඔබට අපට වුණත්, සාමාන්‍ය බස් එකේ යන අයට වුණත්, විරැකියාවෙන් පෙළෙන අයට වුණත්, මේ ඔක්කෝටම එක වරප්‍රසාදයයි ලැබෙන්නේ. මෙසේ තෙල් මිලේ බලපෑම අවම කිරීමේදී මීට වඩා target කරන්න ඕනෑ කියන එක තමයි මගේ මතය. ඒ නිසා තමයි මීට මාස හයහතකට ඉස්සර වෙලා ජනාධිපතිතුමා ඇවිල්ලා කථා කරන අවස්ථාවේදී අපි ඇහුවේ, සුද්දන්ට මේ වරප්‍රසාදය දිය යුත්තේ ඇයි කියලා. ඒ අයට licence එක දීලා තිබෙන්නේ තමන්ගේ ඩොලර් ටික ගෙනැල්ලා, මේ රටට තෙල් ගෙනැල්ලා, මේ රටේ විකුණන්න පුළුවන් මිල සංශෝධනයක් ඇති කරලා කටයුතු කරගෙන යන්න. හැබැයි, ඒ වෙනුවෙන් අපේ රටෙන් ඒ අයට සහනාධාරයක් දෙන්න අවශ්‍ය නැහැ. මේ රටේ CPC එකේ වෙළෙඳ පොළේ කොටසක් අරගෙන ඒ අයට සහනාධාර දීම අනවශ්‍ය බව තමයි මා කියන්නේ. මේ සම්බන්ධයෙන් පරීශීලනය කරන අවස්ථාවේදී අපට පෙනුණා, ඇයි මේ වාගේ තත්ත්වයක් ඇති වන්නේ කියලා. මොකද, අපේ තෙල් පිරිපහදුව මඟින් ඩීසල් සියයට 30ක් නිෂ්පාදනය කරනවා. ඒ වාගේම aviation fuel, බුම්තෙල් ආදිය සියයට 65ක් පමණ නිෂ්පාදනය කරනවා. ඒ

[ගරු රවී කරුණානායක මහතා]

සම්බන්ධයෙන් යම් ලාභයක් ලැබෙනවා. ඒ ලාභය ලැබුණාට පසුව අප ඉදිරිපත් කරන base rate එක සහ අනෙක් අය ආනයනය කරලා විකුණන මිල අතර ලොකු වෙනසක් ඇති වෙනවා කියන එක තමයි ඔප්පු වෙලා තිබෙන්නේ. ඒ නිසා CPC එකේ නිෂ්පාදන පිරිවැය සහ LIOC එක, Sinopec එක, RM Parks විකුණන තෙල් මිල අතර තිබෙන වෙනස තමන්ට දරා ගන්න බැරි තත්ත්වයක් බව ඒ කොම්පැනි තුන කියනවා. ඒ නිසා මේ අවස්ථාවේදී අපි මොනවාද කරන්න අවශ්‍ය වන්නේ? මේ කියන සහනාධාරය ආණ්ඩුවේ වුවමනාව අනුව දෙන්න අවශ්‍ය නම් දෙන්න. නමුත් ඒක ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත දිය යුත්තක් මිසක් සුද්දන්ට market share එක නිකම් කඩලා දීමක් විය යුතු නැහැ කියන එක මම නැවත සඳහන් කරනවා. ඒක දැන් මේ තුළිනුත් ඔප්පු වෙනවා. ඒ බව මතක තියා ගන්න.

පිටරට ඉඳන් මේ රටට ඇවිල්ලා අපේ ඉන්ධන distribution එකට සම්බන්ධ වන කොම්පැනි 4ක් තිබෙනවා. ඒ අය ඩීසල්වලට රුපියල් 128ක tax එකක් ගෙවනවා. ඒ වාගේම පෙට්‍රල්වලට රුපියල් 145ක් ගෙවනවා. ඉතින් ඒ ගෙවලා තමයි මෙවැනි දෙයක් ඇති වන්නේ. ඒ නිසා මා නැවත මතක් කරන්නේ මේකයි. මේ ජනතාවට සහනාධාර දෙන්න අවශ්‍යයි කියන එක ආණ්ඩුවේ කැමැත්ත. හැබැයි, අනිවාර්යයෙන්ම වැයෙන් කොටසක් අහක් කරලා ඒ සහනාධාර දෙන එක කළ යුතු බව මතක තියා ගන්න අවශ්‍යයි. ඊට පසුව එය අපේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට දිය යුතුයි කියන මතයේ මා සිටිනවා, අනිල් ජයන්ත ඇමතිතුමනි. නිකරුණේ මේ සුද්දන්ට අපේ market share එක කඩලා දෙන්න අවශ්‍යතාවක් නැහැ කියන එක මා නැවත මතක් කරනවා. හැබැයි, මෙහිදී අපටත් ජනතාවටත් අවශ්‍ය වන්නේ, market realistic price එකක්. අද අපේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විකුණන ඉන්ධන මිල ඉතාම අධික මට්ටමක තමයි තිබෙන්නේ. සාමාන්‍ය ලෝක වෙළෙඳ පොළේ මිලට වඩා අපි යම් ප්‍රමාණයක් එකතු කරලා තිබෙන ප්‍රශ්නය නිසා තමයි අද ජීවන වියදමට ලොකු බරක් ඇති වෙලා තිබෙන්නේ.

මෙම පරිපූරක මුදල් වෙන් කිරීමේ දෙවැනි කාරණය තමයි "අස්වැසුම" ප්‍රතිලාභීන්ට සහන ලබා දීම. අද උද්ධමනය සියයට 8යි, සියයට 8.1යි, සියයට 8.3යි. ඒ හේතුවෙන් එම ජනතාවට අද ජීවන වියදම දරා ගන්න බැරි නිසා කරන ගැළපීමක් ලෙස මේ ආණ්ඩුව රුපියල් බිලියන 6ක් - මිලියන 6,000ක් - පාවිච්චි කරනවා, අන්තිම මාස තුනට අදාළව. ඒ, ලක්ෂ 8කට price adjustment factor එකට අනුව සහන ලබා දෙන්නයි. ඒ තුළින් ආණ්ඩුව බලන්නේ, උද්ධමනය දරා ගන්න බැරි එම පිරිසගේ ක්‍රය ශක්තිය - purchasing power - අඩු වෙලා තිබෙන නිසා ඒ අයට යම් විධියක සහනයක් හැටියට මේ දීමනා ලබා දීමටයි. නමුත් ඒක තාවකාලික උපක්‍රමයක් මිසක් දීර්ඝ කාලීන සැලැස්මක් නොවෙයි. අපට අවශ්‍ය වන්නේ මොකක්ද? ඵලදායිතාව වැඩි කරලා, ඒ තුළින් අපේ ආර්ථිකය වර්ධනය කරලා, ඒ වර්ධනය කිරීමේ ප්‍රතිලාභයක් ලබාගෙන කටයුතු කිරීම තමයි අවශ්‍ය වන්නේ. නමුත් ඒ බවක් පෙනෙන්නට නැහැ. සහනාධාර දෙනවා කියන්නේ, ගලාගෙන යන ගඟකට නිකම් ඔහේ ඉනි කපනවා වාගේ දෙයක්. එම ප්‍රශ්නය විසඳන්න යම් විධියක ස්ථිරසාර විසඳුමක් අවශ්‍යයි. හැබැයි, විසඳුමක් තිබෙන බවක් අපට පෙනෙන්නේ නැහැ. ඒ විසඳුම දෙන එක තමයි අපි කරන්න අවශ්‍ය වෙන්නේ. එයට හොඳ උදාහරණයක් තමයි ඉන්දියාව. ඉන්දියාව අවුරුදු 12කින් - 2012 ඉඳන් 2024 වෙනකොට - මිලියන 500කගේ දුප්පත්කම නැති කරලා තිබෙනවා. අන්තිම අවුරුදු දෙක තුළ ඒ ප්‍රමාණය මිලියන 750 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ, මිලියන 750කගේ දුප්පත්කම නැති කරලා තිබෙනවා, ඒගොල්ලන් අනුගමනය කරපු ආර්ථික ක්‍රමවේද සහ නිර්භීතකම තුළ. ලංකාවත් එය කරන්න අවශ්‍යයි.

මම දැක්කා මහ බැංකුවේ අධිපති කියලා තිබෙනවා, "භය නැතිව තීන්දු ගන්න තිබෙනවා. නමුත්, ඒවා ක්‍රියාත්මක නොවෙන එක තමයි තිබෙන ප්‍රශ්නය" කියලා. මම සාමාන්‍යයෙන් කෙනෙක් කියපු දෙයක් බොහොම කලාතුරකින් පාවිච්චි කරන්නේ. හැබැයි, එතුමා ඒ කියලා තිබෙන දේ හරි. හැබැයි ඒ කියන්නේ, වැදි බණ. එක පැත්තකින් උද්ධමන වේගය පාලනය කරන්න පොලී අනුපාතය වැඩි කරනවා. අනෙක් පැත්තෙන් ආණ්ඩුවට කියනවා, "එයා කියන දේ කරන්න එපා. නමුත්, එයා කියන දේ අනෙක් අය කරන්න ඕනෑ" කියලා. අනිල් ජයන්ත ඇමතිතුමාට තමයි කියන්නේ, ඒ වැදි බණ ටික කියන්න කියලා. ඒ කියන්නේ, ආණ්ඩුව මම කියන දේ කරන්න; නමුත්, මම කරන දේ කරන්න එපා කියන එක තමයි එයා කියන්නේ. මහ බැංකු අධිපතිතුමා මොනවාද කියන්නේ? එතුමා කියනවා, ආණ්ඩුව භය නැතිව තීරණ ගන්න අවශ්‍යයි කියලා. ඒක හරි. එතුමා කියන එක හරි. හැබැයි, එලෙස නොකරන එක තමයි තිබෙන ප්‍රශ්නය. ඉතින්, ආණ්ඩුවට ඇඟිල්ල දික් කරලා කියනවා, ප්‍රශ්නයක් ඇති වුණොත් කරුණාකරලා මහ බැංකුවට බණින්න එපා, මුදල් අමාත්‍යාංශය තමයි ඒකට වග කියන්න ඕනෑ කියලා.

අවුරුදු 12කින් ඉන්දියාවේ මිලියන 500කගේ දුප්පත්කම නැති කරලා තිබෙනවා. හැබැයි, ලංකාවේ හාත්පසින්ම අනෙක් පැත්ත නේ. 2022දී අපි බංකොලොත් වෙලා තිබෙනවා. ඊට පසුව ලෝක බැංකුවේ දත්ත අනුව අපේ දුප්පත්කම සියයට 75කින් වැඩි වෙලා තිබෙනවා. ඒ සියයට 75 වැඩි වෙලා තිබෙන්නේ ඉතාම භයානක ස්වරූපයකින්. ඒගොල්ලෝ කියනවා, දුප්පත්කම තව වැඩි වන ප්‍රවණතාවක් තමයි පෙනෙන්න තිබෙන්නේ කියලා.

Therefore, Hon. Minister, I think we must be realistic and take decisions in order to ensure that we are in line with a more prosperous type of approach to the economy rather than adopting subsidy-oriented measures just to placate the people for the moment.

තවත් ප්‍රශ්නයක් තිබෙනවා. සියයට 1ක් වන ඉහළ තලයේ කට්ටියට සම්පූර්ණ වත්කම්වලින් සියයට 31ක් තිබෙනවා. ඒ කියන්නේ, රටේ ආර්ථිකය 100 නම් ජනගහනයේ උඩ තලයේ ඉන්න සියයට 1ට ආර්ථිකයේ සියයට 31ක වත්කම් ප්‍රමාණයක් තිබෙනවා. අනෙක් පැත්තට අඩුම ආදායමක් උපයන සියයට 50ට රටේ තිබෙන සමස්ත වත්කම්වලින් සියයට 4ක ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. ඒක භයානකයි. ඒක නිවැරදි කරන්න අවශ්‍යයි.

ඉන්දියාවේ Cockroach Janata Party වාගේ ඒවා ඇති වන්නේ, ජනතා විරෝධය ඇති වෙලා තිබෙන නිසායි; තරුණ අරගළය තුළින් ඇති වුණේ. එම නිසා තරුණයන්ගේ ගැටලු සම්බන්ධව නිවැරදි පියවර ගන්න අවශ්‍යයි. අපි ආර්ථිකය හදන්න අවශ්‍යයි. ඒක දේශපාලනීකරණය කරන්න අවශ්‍යතාවක් නැහැ. එම නිසා අපි පක්ෂ භේද පැත්තකට කරලා, ආර්ථිකය නිවැරදි මාවතකට ගේන්න ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියන එක මතක් කරනවා. ගරු අනිල් ජයන්ත ඇමතිතුමනි, අපි ඔබතුමාගෙන් ප්‍රශ්න අහන්නේ, මේවා හෙළිදරවු කර ගන්නයි. ඒවාට උත්තර කොහොමද ලැබෙන්නේ කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, "Daily Mirror" පුවත් පතේ පළ වෙලා තිබෙනවා, "Sri Lanka's indirect taxes are among the highest in the world" කියලා. ඒ වාගේම තමයි ලෝක බැංකුව මීට මාසයකට පෙර ඉදිරිපත් කරලා තිබෙන වාර්තාවේ කියනවා, "ජීවන වියදම ඉතාම අධික ලෙස ඉහළ ගිහිල්ලා තිබෙනවා. පවුල් සියයට 75ක් පමණ අර්බුදයට පත් වෙලා තිබෙනවා" කියලා. ගෝලීය අවම වේතන ලබන රටවල් 130 අතර ශ්‍රී ලංකාව 120 වන ස්ථානයේ තමයි සිටින්නේ.

අද අපි කථා කරන්නේ, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඉදිරිපත් කර තිබෙන රෙගුලාසි ගැනයි. මම එක සරල උදාහරණයක් ගන්නවා ටයර් සම්බන්ධයෙන්. අපි ටයර් 120,000ක් පරිභෝජනය කරනවා. ඒකෙන් 50,000ක් දේශීයව නිෂ්පාදනය කරනවා. අපට සියයට සියයම ලංකාවේ නිෂ්පාදනය කරලා අවශ්‍යතාව සපුරන්න පුළුවන්. නමුත්, කරන්නේ නැහැ. චීනයෙන් dumping කියන strategy එක පාවිච්චි කරලා ලාභයට ටයර් ආනයනය කරනවා. හැබැයි, දේශීයව ටයර් එකක් නිෂ්පාදනය කරන්න යන වියදම ඇමෙරිකානු ඩොලර් 3.2ක් වෙනකොට, අපි ආනයනය කරන ටයරයකට duty එක යන්නේ ඩොලර් 2.2යි. ඉතින්, අපි මේ රටේ නිෂ්පාදනය කරනවාට වඩා ටයර් ආනයනය කරනවා. ආනයනික ටයර් සඳහා සියයට 30ක උපරිම මට්ටමේ duty එකක් පැනවීමේ හැකියාව තිබෙනවා. නමුත්, ඒක ක්‍රියාත්මක කරන්නේ නැතිව සියයට 20ක duty එක ක්‍රියාත්මක කරනවා. මේ රටේ ජාතික ප්‍රතිපත්තියක් නැහැ, මොනවාද නිෂ්පාදනය කරන්න අවශ්‍ය වන්නේ, මොනවාද ආනයනය කරන්න අවශ්‍ය වන්නේ කියලා. ඒවා නිවැරදි කරන්න අවශ්‍යයි. නැත්නම් වෙන්නේ මොකක්ද?

අපි නිෂ්පාදනය කරන අපේ solid tyres ලෝකයේ හතරවැනි ස්ථානයේ තමයි තිබෙන්නේ. Pneumatic tyresවලින් ලෙහෙසියෙන් අපට පළමුවන, දෙවන, තුන්වන තැනට එන්න පුළුවන්. ඇයි, ඒ අවස්ථාව නැති කරගන්නේ? SLS Standards දමනවා. ඒගොල්ලන්ට standards දමන්න, ඕනෑ එකක් කරන්න පුළුවන්. නමුත්, හරියාකාරව ඒ දේවල් නිවැරදි කරන්න ප්‍රතිපත්ති ඇති කිරීම ගැන අපට උත්තරයක් නැහැ. ඊයේ Public Finance Committee එකට රජයේ නිලධාරීන් කැඳෙව්වා. ඒ ආපු රජයේ නිලධාරීන්ට මම හිතන්නේ ඉදිරි දැක්මක් සහිතව කටයුතු කරන්න අවස්ථාවක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම තව මිනිත්තුවක වාගේ කාලයක් ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

නිලධාරීන්ගෙන් ප්‍රශ්න කරනකොට ඒගොල්ලන් උත්තර දෙන්නේ යම් විධියක භීතිකාවකින්. ඒගොල්ලන් දන්නේ නැහැ, කොහොමද ඒ කටයුතු ඉදිරියට ගෙන යන්නේ කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ සම්බන්ධයෙන් ඉදිරි දැක්මක් සහිතව කටයුතු කරන්න ඒගොල්ලන්ට අවස්ථාව ලබා දෙන්න. මොකද, නැත්නම් වෙන්නේ අපේ නිෂ්පාදන නැති වෙලා, අපි ආනයනය කරලා වෙළෙඳාම් කරන තත්ත්වයට පත් වේවි. එතකොට අපේ සීමිත සම්පත්වල ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. අපේ නිෂ්පාදන ප්‍රතිපත්තිය නැති වුණාම අන්තිමට තිබෙන්නේ අපේ සේවා අංශය. ඒකවත් අපි වර්ධනය කරන්න අවශ්‍යයි.

මේ අවස්ථාවේ මොනවාද වෙලා තිබෙන්නේ, අපේ HSBC එකට? මම වෙළෙඳ ඇමති වශයෙන් ඉන්නකොට එංගලන්තයට ගිහිල්ලා, ඒ ගමනේ ප්‍රතිඵලයක් විධියට ගෙනාපු HSBC ආයතනයේ 4,200ක් වැඩ කළා. අද ඒක වහලා ඉන්දියාවට යනවා. ඒ වාගේම, RR Donnelley කියන ඇමෙරිකානු කොම්පැනිය අවුරුදු 25ක් ලංකාවේ තිබුණා. එහි සිටි 3,900ක් සේවකයන් රටින් පිට වෙනවා. ඇයි? සියයට 20ක් වන tax on export services දරාගන්න බැහැ. මතක තබා ගන්න, ඇමතිතුමනි. එම බදු ප්‍රතිපත්තිය වෙනස් කරනකොට අපි කිව්වා, එය කරන්න එපා, වෙනස් කළොත් අන්තිමට reverse investment එකක් ඇති වේවි කියලා. "Newswire" වෙබ් අඩවියේ ඔක්තෝබර් 31වැනි දා තිබෙනවා, "Sri Lanka's IT/BPO export earnings drop by 15.5% ..." කියලා. මේ තුළින් අපේ සේවා අංශය, යම් විධියක සංවිධානාත්මක ගමනකට ගෙනයන්න පුළුවන් හැකියාව නැති වෙනවා. අනික් පැත්තෙන් ආණ්ඩුව කියනවා, 2030 වෙනකොට ඇමෙරිකානු ඩොලර් බිලියන 36ක් දක්වා අපේ අපනයනය වැඩි කරනවා කියලා. ඒ වෙනකොට ආර්ථික වර්ධන වේගය සියයට 15ක්, 16ක් වාගේ අගයක තිබෙන්නට ඕනෑ, ඒ වාගේ දෙයක් ඉෂ්ට කරන්න. ඒ නිසා අපි මීට වඩා ඕනෑකමකින් අපේ ආර්ථික ප්‍රතිපත්ති හදලා, අපේ තිබෙන ප්‍රතිපත්ති රටට ඔබින විධියට, රැකියා ඇති කරන්න පුළුවන් විධියට සකස් කරන්න ඕනෑ. මහ බැංකුව උද්ධමනය පාලනය කිරීමට නොවෙයි, රටේ ආර්ථිකයේ වර්ධනයක් ඇති කිරීමට, රැකියා ඇති කිරීමට අවශ්‍ය කරන දේවල් තමයි කරන්න අවශ්‍ය වන්නේ. ඒ නිසා foreign exchange management එක වෙන්න පුළුවන්, විපක්ෂයක් වශයෙන් මම කියන්නේ IMF එකත් එක්ක අනිවාර්යයෙන්ම ගිවිසුමක් ගහන්න අවශ්‍යයි කියලා. ඒක ඔබතුමන්ලා දරන ප්‍රතිපත්තියට යම් විධියක විශ්වාසදායි තත්ත්වයක් ඇති කරන්න කටයුතු කරනවා මිසක්, නිකරුණේ කිරීමක් නොවෙයි. ඒ නිසා මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා ආණ්ඩුවට මේ කාරණය කියන්න. ඒ තමයි, ආයතන නිර්දේශපාලනීකරණය කරලා, නිවැරදි මාර්ගයක ගමන් කරමින්, ආර්ථිකය හදලා රටේ ජනතාවට ශුභවාදීව ඉදිරියට ගමන් කරන්න අවශ්‍ය කටයුතු සකස් කරන්න.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.50]

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වේලාව ලබා දීම ගැන බොහොම ස්තුතියි.

අද දවසේ මාතෘකාව පිළිබඳව සහ ඒකත් එක්ක මේ රටේ ආර්ථිකය ගැන, මේ රටේ ආර්ථිකයේ දැන් සිදුවෙමින් තිබෙන දේවල් ගැන පසුගිය පැය කිහිපයේ ටිකක් වැඩිපුර විවාදයක් මතු වුණා. ඒ ගැන තමයි මම උත්තර දෙන්න යන්නේ.

විශේෂයෙන්ම මට කලින් කථා කරපු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා සහ තවත් මන්ත්‍රීවරු කිහිපදෙනෙක් පසුගිය අවුරුදු දෙකේ මේ රටේ ආර්ථික ගමන ගැන විවේචනය කළා. ඒකට බරපතළ විවේචනයක් කියන්න බැහැ. බරපතළ විවේචනයක් නම් යම්කිසි කරුණු කාරණා එක්ක ඉදිරිපත් කරන්න එපායැ. පොඩි ආඩපාළි කීමක් කළා; පොඩි වගන්ති ටිකක් කිව්වා. විශේෂයෙන්ම එක දිගට කියවාගෙන ගියා මම දැක්කා. මේ රටේ උද්ධමනය සියයට 8ක් වෙලා; "දිවිවා" සහන හරියට දීලා නැහැ; ආයෝජකයෝ ගෙනැල්ලා නැහැ; ආයෝජකයෝ හැරිලා ගියා; රැකියා අවස්ථා ඇති වෙලා නැහැ; පසුගිය අය වැය දෙකේ හරිහමන් දෙයක් වුණේ නැහැ; ඒවා බොරු අය වැයවල්; තවත් බොරු අය වැයක් ගෙනෙන්න යනවා වාගේ කිසිම පදනමක් නැති

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

පොඩි වාචාල පන්නයේ විවේචන ටිකක් ඉදිරිපත් කළා. ඇත්තටම මේ ගැන කථා කරන්න ගියොත්, අපි දන්නවා පවතින තත්ත්වය මොකක්ද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය මේ රටට විතරක් නොවෙයි, ලෝකයටම බලපා ඇති ඉතාම නරක තත්ත්වයක්. මාස 10කට ආසන්න කාලයක් තිස්සේ මැද පෙරදිග යුද්ධයක් ඇවිළෙන මොහොතක, ලෝකයේ නැව් ගාස්තු, ඉන්ධන ගාස්තු වැඩි වෙච්ච තත්ත්වයක අපි මේ තරමින් ආර්ථිකය ඇදගෙන යනවා. එතකොට මේ වෙද්දි මේ තත්ත්වය මුළු ලෝකයටම බලපා තිබෙනවා. හැබැයි, ඒ තත්ත්වය මැද්දේත් අමාරුකම් තියාගෙන අපි මේ දේවල් ඉස්සරහට අරගෙන යන විධියක් තිබෙනවා. මේ ආණ්ඩුව බලයේ ඉන්න නිසා වෙන්න ගිය බොහෝ දේවල් වළක්වාගෙන තිබෙනවා, ඒ වාගේම බොහෝ දේවල් ස්ථාවර කරලාත් තිබෙනවා. පොදුවේ ලෝකයටම දැනෙන අපහසුකම අපේ ජනතාවටත් දැනෙද්දි ඔවුන්ට යම් ආකාරයකට අස්වැසුමක්, ඒ කියන්නේ සහනයක් වෙන්න පුළුවන්කමක් මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය තුළ අපි ඇති කරලා තිබෙනවා.

උදාහරණයක් ගත්තොත්, අපි මේ ආණ්ඩුව භාර ගන්නකොට සියයට 2.1ක් වාගේ තිබුණු උද්ධමනය මේ අවුරුද්දේ පෙබරවාරි වෙද්දි සියයට 1.6කට ආවා. එහෙම සියයට 1.6කට ආපු උද්ධමනය තමයි යුද තත්ත්වයත් එක්ක මේ වෙද්දි සියයට 7.3 - 8ත් අතර ප්‍රමාණයකට ගිහින් තිබෙන්නේ. ඒ වාගේම පසුගිය අවුරුද්දේ සියයට 5ක්ව තිබුණු ආර්ථික වර්ධන වේගය, 2026 අවුරුද්දේ පළමුවැනි කාර්තුවේ පෙබරවාරි වනකොට සියයට 5.1ක් දක්වා එසවුණා. ඒක තමයි මීට මාස කිහිපයකට කලින් නැවත සියයට 4.2 දක්වා අඩු වුණේ. ඒ වාගේම සියයට 6.1ක්ව තිබුණු විදේශ සංචිත ප්‍රමාණය, 2026 අවුරුද්දේ පෙබරවාරි මාසයේදී සියයට 7.3කට ආවා. ඒක තමයි පසුගිය ටිකේ සියයට 6.5ක්-6ක් වන තෙක් අඩු වී තිබෙන්නේ. මම කියන්නේ මෙකයි. මේ ඔක්කෝම විශාල ප්‍රමාණයකින් වැඩි වෙලා, පසුව යුද තත්ත්වයකට මුහුණ දුන් නිසා තාවකාලිකව මෙහි යම් අඩු වීමක් සිද්ධ වී තිබෙනවා. යුද්ධයක් කියන්නේ, සාමාන්‍ය තත්ත්වයක් නොවෙයි. ඒ යුදමය තත්ත්වය මැද්දේත් අපි දැවැන්ත වශයෙන් මුදල් වෙන් කරලා භාණ්ඩාගාරය පිරවූ නිසා, ආර්ථිකය ගොඩනඟපු නිසා, හොරා කෑම නැවැත්වූ නිසා අපට පුළුවන් වෙලා තිබෙනවා, ජනතාවට ඒ මුදල්වලින් යම් සහනයක් ලබා දීලා මේ තත්ත්වයට මුහුණ දෙන්න ජනතාව යම් ආකාරයකට සූදානම් කරන්න.

විශේෂයෙන් මේ වෙද්දිත් අපි ඉන්ධන සහනාධාරයක් ලබා දීලා තිබෙනවා. අදත් ඉන්ධන ගැන කථාව ඇති වුණා. වෙළෙඳ පොළේ දිය යුතු මිලට වඩා අඩු මිලකට ඉන්ධන ලබා දෙන්න රජය විශාල පිරිවැයක් දරනවා. රජය මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරපු නිසා තමයි එහෙම කරන්නේ. මීට කලින් එහෙම කරලා නැහැ. කලින් රුපියල් බිලියන 90ක් වෙන් කරලා තිබුණා, දැන් නැවත රුපියල් බිලියන 41ක් වෙන් කරලා තිබෙනවා, ඉන්ධන වෙනුවෙන් සහනාධාර ලබා දෙන්න.

ඒ වාගේම මතක තබාගන්න, "දිවිවා" සුළි කුණාටුවෙන් ඩොලර් මිලියන 3.5ක පමණ හානියක් අපට වූ බව. ඒක ලංකාවේ මෑත ඉතිහාසයේ සිදු වූ විශාලම ස්වාභාවික හානිය. මේ ව්‍යසනයෙන් හානි වූ අයට සහන සලසන්න අපි පසුගිය අවුරුද්දේ ණය ගන්නේ නැතිව රුපියල් බිලියන 500ක් -රුපියල් කෝටි 50,000ක්- වෙන් කළා. ඊළඟ අවුරුද්දේ තවත් රුපියල් බිලියන 200ක් මේ සඳහා වෙන් කරන්න තිබෙනවා. මෙහෙම තත්ත්වයක් තුළද රාජපක්ෂලා අපට රට දීලා ගියේ, එහෙම නැත්නම් 2022දී රාජපක්ෂලා මෙහෙම තත්ත්වයක්ද රටේ ඇති කරලා තිබුණේ? ඒ වාගේම රනිල්ලා එහෙම තත්ත්වයක්ද හදලා තිබුණේ? එහෙම තත්ත්වයක් නොවෙයි තිබුණේ. පසුගිය අවුරුදු දෙක තුළ සිදු වූ ආර්ථික වර්ධනයත් එක්ක තමයි මේක වෙන්නේ. 2024දී ඩොලර් මිලියන 500කට ආසන්නව තිබුණු ආයෝජන ප්‍රමාණය, 2025දී ඩොලර් බිලියනයකට ආසන්න ප්‍රමාණයකට අපි වැඩි කළා; දෙගුණ කළා.

ඒ වාගේම ආයෝජකයෝ හැරිලා ගියා කිව්වා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ජපන් ආයෝජකයෝ හැරිලා ගියා ලු. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේදී ජපන් ආයෝජකයෝ හැරිලා ගියා. කටුනායක ව්‍යාපෘතියේ ආයෝජකයින්ගෙන් හිටපු ඇමති පගා ඉල්ලපු නිසා ඒ සිද්ධිය මුළු ලෝකයේම ප්‍රසිද්ධ වෙලා ඇමතිත් ධුරයෙන් අයින් කරලා, ඊට පස්සේ ජපානයෙන් ව්‍යාපෘති 11ක් අකුළාගෙන ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුවේ ජනාධිපතිතුමා පත් වෙලා මාසයක්, දෙකක් ඇතුළත -පාර්ලිමේන්තු මැතිවරණයට කලින්- ජපානයෙන් ඒ ව්‍යාපෘති 11ම නැවත පටන් ගන්නවා කියලා අපට දැනුම් දුන්නා. ඒකට අදාළ සාකච්ඡා කරලා ඒ කටයුතු අපි ඉස්සරහට ගෙනිච්චා. ඔවුන් මේ ආණ්ඩුව ගැන එහෙම විශ්වාසයක් තමයි ඇති කර ගත්තේ, හැරිලා ගියා නොවෙයි. හිටපු ජපාන තානාපතිතුමා 2024 වසර අවසානයේ ලංකාවෙන් යද්දි ලංකාවේ සභාපතා පුවත් පතකට interview එකක් දීලා කිව්වා, පැවති රජයන් අල්ලස් ගැනීම, පගාව ගැනීම ඇතුළේ තමන්ගේ ආයෝජන අධෛර්යවත් කළේ කොහොමද කියලා. දැන් අපට කියනවා, ජපන් ආයෝජකයින් හැරිලා ගියා ලු. මට තේරෙන්නේ නැහැ, ඒක ඒ විධියට හරවන්නේ කොහොමද කියලා.

ඊට පස්සේ කියනවා, ඉන්දියාවෙන් මෙරට ඇති කරන්න ගිය සුළං බලාගාර ව්‍යාපෘතියක් සම්බන්ධ ආයෝජනයක් හැරිලා ගියා කියලා. බොරු නේ. රටට අවාසි, රටට පාඩු සුළං බලාගාර ව්‍යාපෘතියක් තිබුණා, ඒකකයක් ඩොලර් ශත 8.25ට ගන්න. ඒක අහෝසි වෙලා, ඒ වෙනුවට ඒ ව්‍යාපෘතියම දැන් ක්‍රියාත්මක වනවා, ඒකකයක් ඩොලර් ශත 4ට. ඒ කියන්නේ, හරි අඩක් අඩුවට. ඒක තමයි මේ ආණ්ඩුව කළේ. අකුළාගෙන ගියා නොවෙයි, හරි විධියට වෙනස් කළා. ඒකට තමයි අපි මේ කාලය ගත්තේ.

ඒ වාගේම ඊළඟ අවුරුද්දේ අය වැයෙන් ඉතිහාසයේ වැඩිම ප්‍රාග්ධන වියදම වෙන් වනවා. රුපියල් බිලියන 2,000ක ප්‍රාග්ධන වියදම මේ ඉතිහාසයේ වෙන් වන වැඩිම ප්‍රාග්ධන වියදමයි. පසුගිය අවුරුද්දේ ප්‍රාග්ධන වියදමෙන් සියයට 76ක් වියදම් කරලා තිබෙනවා. 2020න් පස්සේ -අවුරුදු 5කට පස්සේ- වෙන් වූ වැඩිම ප්‍රාග්ධන වියදම ඒකයි. මේ යුද අමාරුකම් ඔක්කෝම තිබියදී ආර්ථිකය ඉස්සරහට ගියේ නැහැ, ආයෝජකයෝ ආවේ නැහැ කියලා දැන් බයිලා කියවනවා.

මම දැක්කා ඊට පස්සේත් එතුමා කිව්වා, අන්තවාදය, ත්‍රස්තවාදය වාගේ ඒවාට නීති ගේන්න ඕනෑ, හැබැයි එහෙම ගෙනෙනකොට පව්ච ගැහුවාට හිරේ දාන එක, කොණ්ඩ වවන එකට හිරේ දාන එක, ඇඳුම් මෝස්තරය බලලා හිරේ දාන එක නොවෙයි කරන්න ඕනෑ කියලා. මේ වෙද්දි මේ පාර්ලිමේන්තුවේ යම්කිසි විධියකට මේ සම්බන්ධවත් සාකච්ඡා සිදු වනවා නේ. මේ දවස්වල නාමල් රාජපක්ෂට ලොකු වැඩකුත් නැහැ නේ. දවල්

මෙතැන ඉන්නවා, රෝට ගිහිල්ලා නිදාගන්න නේ තිබෙන්නේ. එතකොට අඩුම තරමේ මේවා ගැන කියවා දැනුවත් වෙන්න එපායැ. එතුමා දන්නේ නැහැ, ඒ පනත් කෙටුම්පත් දෙකක් කියලාවත්. ත්‍රස්තවාදය ගැන තිබෙන්නේ ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පතේ - PSTB එකේ. සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත වෙනම එකක්. එතුමා කිව්වේ මේ දෙක කලවම් කරලා. පනත් කෙටුම්පත් දෙකක් ගෙනෙනවා කියලාවත් දන්නේ නැහැ. අඩුම තරමින් මේ සම්බන්ධව මූලික දැනුමක්වත් නැහැ. කියවා නැහැ, දන්නේ නැහැ. ඒ ගැනත් කියන්නේ බයිලා. පව්ව කෙටුවාට, කොණ්ඩය වැව්වාට, ඇඳුම් ඇන්දාට හිරේ දානවා කියලා ඒ පනත් කෙටුම්පතේ නැහැ. සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පතට වෙනස්කම් කරන්න ඕනෑ නම්, ඒවාට අදාළව අපි සාකච්ඡා කරමු. නමුත් ලංකාවට එවැනි පනතක් අවශ්‍යයි. සංවිධානාත්මක අපරාධ කල්ලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන්න ලංකාවේ නිශ්චිත පනතක් නැහැ; නීතියක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින විවාදයේ වැඩ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
කලින් කථා කළ මන්ත්‍රීතුමෙකු කිව්වා වාගේ, සංවිධානාත්මක අපරාධ කල්ලියක සාමාජිකයෙක්, නායකයෙක් කියලා මුළු රටම දැනගෙන හිටියත්, ඒ වෙලාවේ අතේ මොනවා හරි තිබුණේ නැත්නම්, ඒ වෙලාවේ වරදකට අහුවුණේ නැත්නම්, හිරෙන් නිදහස් වෙලා කිසි අවුලක් නැතුව එළියට ගිහිල්ලා, "ටාටා, බායි" කියලා එදා ඒ පුද්ගලයා රටින් ගියා. මේ රටේ තිබුණේ එහෙම නීතියක්. ඊට පස්සේ ඒ රටවල ඉඳගෙන ආයෙත් ඒකම පටන් ගන්නවා. මේ රටේ මත්ද්‍රව්‍ය ව්‍යාපාර, අපරාධ හැම දෙයක්ම නැවත නැවත සිදු වන්නේ එහෙමයි. එතකොට ඒකට නීතියක් අවශ්‍යයි. ඒ නීතියේ ඉලක්කය සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින්. සංවිධානාත්මක අපරාධ කල්ලියක් කියන්නේ මොකක්ද කියලා ඒකේ අර්ථ කථනය කරලා තිබෙනවා, define කරලා තිබෙනවා. එතකොට සංවිධානාත්මක අපරාධ කල්ලියක සාමාජිකයෙකු වී වරදක් කිරීම කියන එක වෙනම සඳහන් කරලා තිබෙනවා. එහෙම නැතුව කොහේ හරි, කවුරු හරි, මොකක් හරි කළා කියලා ඒකට අහුවෙන්නේ නැහැ. ඒක ඉලක්කගත පනත් කෙටුම්පතක්. ඒකට වෙන කවුරුවත් අහුවෙන්නේ නැහැ.

දූෂණ විරෝධී පනත සම්මත වුණාට පස්සේ දැන් ඇප නැතුව නාමල් රාජපක්ෂ හිරේ ඉන්නවා නේ. නාමල් කියනවා නේ, ඒ පනත යටතට මේ රටේ සාමාන්‍ය ජනතාව අහුවෙනවා කියලා. එහෙම වෙන්නේ නැහැ. සාමාන්‍ය ජනතාව නාමල් රාජපක්ෂ වගේ දූෂණයට සම්බන්ධ වෙලා නැත්නම් එහෙම අහුවෙන්න විධියක් නැහැ. ඒ වාගේ තමයි සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පතත්. ඒක ඉලක්කගත පනත් කෙටුම්පතක්. ඒ ඉලක්කගත පනත් කෙටුම්පතේ සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙක් කියන්නේ කවුද කියලා define කරලා තිබෙනවා. ඒක එහෙම පිරිසක් හඳුනාගැනීම වෙනුවෙන් ගෙනෙන පනත් කෙටුම්පතක්. ඒකේ ඇඳුම් ගැන, ටැටූ ගැන කියනවා. ඒක කියන්නේ වෙන විධියකට. ඒක අපරාධ කල්ලියකට අනන්‍ය එකක්. අඩුම තරමින් ඒ පනත් කෙටුම්පත කියවා බැලුවානම්, සාටකය දාගෙන හිටියා කියලා සංවිධානාත්මක අපරාධ කල්ලියක් හැටියට සලකන්න බැහැ කියලා තේරෙනවා. එව්වර හොඳට ඒක define කරලා තිබෙනවා. අඩුම තරමින් නාමල් රාජපක්ෂවත් බය වෙන්න ඕනෑ නැහැ. ඒක ඊට වඩා ඉතාම sharp පනත් කෙටුම්පතක්. සාටකය දාගෙන ඉන්න නාමල් රාජපක්ෂටත් නඩු තිබෙනවා; චෝදනා තිබෙනවා. බැසිල් රාජපක්ෂටත් චෝදනා, නඩු තිබෙනවා. ශෂීන්ද්‍රටත් චෝදනා, නඩු තිබෙනවා. ඒ හැමෝටම චෝදනා, නඩු තිබුණා කියලා ඔවුන් සංවිධානාත්මක අපරාධ කල්ලියක් හැටියට ඒ පනත් කෙටුම්පත යටතේ අහුවෙන්නේ නැහැ. ඒක ඉලක්කගත පනත් කෙටුම්පතක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ඒ පනත් අවශ්‍ය වන්නේ ඇයි? මේ රටේ සංවිධානාත්මක අපරාධ කල්ලි නායකයින්ට වුණේ දේවල් දෙකයි. එකක්, ආයුධ පෙන්වන්න ගිහිල්ලා වෙඩි තිබ්බා. දෙවැනි එක, ඒ වෙලාවේ මොකක්වත් වරදක් නැහැ කියලා, අල්ලපු වෙලාවේ ඇප දුන්නා. Airport එකේදි කැමරාව ඉස්සරහ "ටාටා, බායි" කියලා රට ගියා. නමුත්, ඒ දෙකම වෙන්න බැහැ. ඒ දෙකම අශිෂ්ටයි. ඒ දෙකම වැරදියි. මේ රටේ සංවිධානාත්මක අපරාධ මැඩලන්න නීතියක් ඕනෑ. ඒ නීතිය තමයි අපි මේ ගෙනෙන්නේ. ඒකේ අඩුපාඩු තිබෙනවා නම් අපි ඒ ගැන කථා කරමු, ප්‍රශ්නයක් නැහැ. නමුත් මේක ඉලක්කගත පනත් කෙටුම්පතක්. මේ ගැන බොරු කියන්න එපා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.00]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උඩට රැවුලක් තිබෙන කෙනෙක් තමන්ගේ wifeගේ නමට වඩා නාමල් රාජපක්ෂගේ නම තමයි හැමදාම කියන්නේ. වෙන එකක් කථා කරන්න කෝ. අනේ! හැමදාම කියවන්නේ, "නාමල් රාජපක්ෂ, නාමල් රාජපක්ෂ, නාමල් රාජපක්ෂ" කියලා. Toilet එකට ගියාමත් නාමල් රාජපක්ෂ, කැන්ටින් එකට ගියාමත් නාමල් රාජපක්ෂ. වෙන මොකක් හරි කථා කරමු කෝ. මම දැන් දෙමළෙන් මගේ කථාව කරන්නම්.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தமிழீழ விடுதலைப் புலிகளுடைய போராட்டத்தை நேரில் பார்த்தவன் என்ற வகையில், ஒரு தமிழனாக சில விடயங்களை நான் இன்றைக்குப் பாராளுமன்றத்தில் கதைக்கவேண்டி

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්විසුතා මහතා]

இருக்கின்றது. சுமார் 39 வருடங்கள் போராடியவர்கள் நாங்கள் என்பது உங்களுக்குத் தெரியும்! மட்டக்களப்பு ஆட்கள் கொண்ட team ஒன்று இறங்கி இருக்கின்றதென்று சொன்னால், 'ஆமி'க்காரருக்கு 'சூ' போகும். அம்பாறை ஆட்கள் இறங்கி இருக்கின்றார்கள் என்று சொன்னால், இரண்டு underwear போடுகின்ற அளவுக்குத்தான் ஒரு காலத்தில் இருந்தது.

இன்றைக்கு எங்களுடைய பாராளுமன்ற உறுப்பினர் கௌரவ பிரபு அவர்கள் சொல்லியிருக்கிறார், கிழக்கு மாகாணத்திற்கு வடக்கிலிருந்தும் வடக்கு மாகாணத்திற்கு கிழக்கிலிருந்தும் ஆட்களைக் கொண்டுவந்ததாக. சரியான கவலை! நாங்கள் கிழக்கு மாகாணத்துக்கு வரவில்லை. மக்களுடைய பிரச்சினைகளைக் கதைக்க அங்குள்ள நீதிமன்றத்துக்கு வந்தோமே ஒழிய, வேறு ஒன்றுக்கும் வரவில்லை. வடக்கிலே மனச்சாட்சியுடன் இருக்கின்ற எந்த தமிழனும் அம்பாறை பையன்களையும் மட்டக்களப்பு பையன்களையும் மறக்க மாட்டார்கள். உங்களுக்குத் தெரியுமோ தெரியாது, இன்றைக்கு எங்களுடைய துரோகியாக வர்ணிக்கப்படுகின்ற கருணாவை களத்தில் இறக்கித்தான் ஒரு காலத்தில் ஆனையிறவு அடிபாடு முடிக்கப்பட்டது. அந்தளவுக்கு மட்டக்களப்பு, அம்பாறை என்றால், யாழ்ப்பாண மண்ணுக்கு இற்றைவரைக்கும் ஒரு மரியாதையும் நன்றிக் கடனும் இருக்கிறது. இந்த 5 நிமிடங்களும் மட்டக்களப்பைப் பற்றி கதைக்கவேண்டிய தேவை இருக்கின்றது.

அன்புத் தம்பியோ, அண்ணையோ தெரியவில்லை! கௌரவ பிரபு அவர்களே, நான் கதைத்து முடிந்த பின்பு கதையுங்கள். உங்களுக்கு decency தெரியும் என்று நினைக்கின்றேன். இன்றைக்கு எங்களுடைய தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்கள் நான்கு பேரைக் கூப்பிட்டுக் கேட்டிருக்கிறார், கடந்த நல்லாட்சிக் காலத்திலே இரண்டு கைகளையும் இரண்டு கால்களையும் உயர்த்தி ஆதரவு வழங்கியவர்கள் எங்கே போய்விட்டார்கள் என்று.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

அவர்கள் காலை கொடுத்தார்கள்; கையை கொடுத்தார்கள். ஆனால், நீங்கள் அநுரகுமார திஸாநாயக்காவுக்குக் கொடுக்க முடியாததை அல்லவா கொடுக்கின்றீர்கள்! வெட்கம் இல்லாமல் விரித்துக் கொடுக்கின்றீர்கள்! அந்தக் காலத்திலே மயிலத்தமடு பிரச்சினை தொடர்பாக அங்கே இருந்த சகல குடியேற்றவாசிகளும் வெளியேற்றப்பட்டார்கள். கௌரவ பிரபு அவர்களே, 1,200 ஏக்கர் காணியை விடுவித்ததாக இன்றைக்கு நீங்கள் சொல்கின்றீர்கள். முஸ்லிம் தாதியர்களின் 'ஹிஜாப்' விவகாரம் சம்பந்தமான வழக்கு தொடர்பாகத்தான் நான் அன்றைக்கு மட்டக்களப்புக்கு வந்தேன். அந்த விடயத்தில், நான் எங்களுடைய அண்ணன்மார்களுடன் சண்டை! நீங்கள் கதைத்தது பிழை. இன்றைக்கு சுகுணனுக்கு வைத்தியசாலை நிருவாகத்தைக் கொடுத்திருக்கின்றீர்கள். பரவாயில்லை! அது நல்லது. ஆனால், மட்டக்களப்பில் பிரச்சினை வராமல் பார்த்துக் கொள்ளுங்கள் என்பதுதான் என்னுடைய நிலைப்பாடு. நீங்கள் மட்டக்களப்பிலே பிறந்தவராக இருந்து கொண்டு, உங்களுடைய மண் சார்பாக 2 வருடங்கள் அரசாங்கத்தைப் பிரதிநிதித்துவம் செய்துகொண்டு, மயிலத்தமடு - மாதவனை பிரச்சினை தொடர்பாக வடக்கிலே இருந்து எங்களுடைய 'கட்டைக் கழுத்தன்' வந்த கத்துகின்ற அளவிற்கு நிலைமையை வைத்திருக்கிறீர்களே! உண்மையாகவே நான் அந்த அரசாங்க அதிபருடைய அலுவலகத்தைத் தாண்டித்தான் அன்று நீதிமன்றத்திற்குப் போனேன். நான் சில விடயங்களைக் கதைத்திருப்பேன். ஆனால், அங்கு தவறான ஆட்கள் நின்றார்கள். அதனால்தான் நான் கதைக்கவில்லை. எங்களுடைய அண்ணைமாருக்கு மற்றைய ஆட்களுடைய background தெரியாது; அரசியல் தெரியாது. அதனால் அவர்கள் வந்து கதைக்கவில்லை. அது எனக்குத் தெரியும். ஆனால், மட்டக்களப்பில் இன்றுவரை மகாவலி குடியேற்றத் திட்டத்தால் எத்தனையோ தமிழ் மக்கள் பாதிக்கப்படுகிறார்கள்.

நீங்கள் தமிழ் பேசும் ஒருவர். நீங்கள் உங்களுடைய மண்ணுக்கு விசுவாசமாக இருக்க வேண்டும். இந்தப் பாராளுமன்ற உறுப்பினர் பதவி இன்றைக்கு இருக்கும். நாளைக்கு இல்லாமல் போகும். நாளைக்கு நீங்களும் நானும் road இலிருந்துகொண்டு பிச்சையெடுக்க வேண்டி ஏற்படலாம். NPP கட்சியைச் சேர்ந்தவர்கள் ஒட்டுமொத்தமாக பாராளுமன்றத்திற்குத் தெரிவு செய்யப்படாமல் போகலாம். இவை யாருக்குத் தெரியும்!

நீங்கள் மட்டக்களப்பில் பிறந்தவர். மட்டக்களப்புக்கு என்று ஒரு மரியாதை இருக்கின்றது; மட்டக்களப்புக்கு என்று ஒரு வீரம் இருக்கின்றது. இன்றைக்கு அந்த அப்பாவி மக்களுடைய மாடுகளைச் சுட்டுக் கொல்கிறார்கள். நீங்கள் இன்றைக்கு என்ன செய்கிறீர்கள் என்றால், இதுபற்றி பேசாமல் வெளியில் செல்கிறீர்கள். நான் Standing Order 91 (h) என்பதைச் சொன்னதற்குக் காரணம், அவர் அதற்குப் பதில் சொல்ல வேண்டும் என்பதற்காக. தயவுசெய்து விளங்கிக் கொள்ளுங்கள்! மட்டக்களப்பு என்பது வீரம் செறிந்த மண். அந்த மண்ணில் இருந்துகொண்டு, 'காலை கொடுக்கிறார்கள்; கையை கொடுக்கிறார்கள்' என்று நீங்கள் பேசுகின்றீர்கள். நீங்கள் கொடுக்கக் கூடாததை அல்லவா கொடுத்துக் கொண்டிருக்கிறீர்கள். அப்படிக் கொடுக்காதீர்கள்! அது அசிங்கம்.

என்னைப் பொறுத்தவரைக்கும், அந்த மக்கள் அன்றாட வாழ்க்கைக்காகக் கஷ்டப்படுகிறார்கள். மட்டக்களப்பு மக்கள் எப்படி உங்களுக்கு இனி vote போடுவார்கள் என்று எனக்குத் தெரியவில்லை. எங்களுடைய நிசாம் காரியப்பர் அவர்களுடன் கதைக்கும்போது, "பிரபு பாவம், அவரைப் பற்றி பேச வேண்டாம் doctor" என்று அவர் சொன்னார். அவர் மட்டக்களப்பிலிருந்து வந்த பஸ்ஸில் ஏறி பாராளுமன்றம் வந்துவிட்டார். அடுத்தமுறை அந்த பஸ் ஓடாது. அது ஓடுமோ, ஓடாதோ என்று எனக்குத் தெரியாது.

இன்றைக்கு எனக்கு ஒதுக்கிய இந்த 5 நிமிடத்தையும் மட்டக்களப்பு மண்ணுக்காகப் பயன்படுத்த வேண்டுமென்று நினைத்தேன். ஏனென்றால், அந்த மக்கள் பாவம்! அவர்கள் மேய்ச்சல் தரையை மட்டும்தான் கேட்கிறார்கள். வடக்கில், கிழக்கில், ஏன் எல்லா இடமுமே கடந்த அரசாங்கங்களைப் பற்றிய குறைகளையே பேசிப் பேசி நீங்கள் ஆட்சிக்கு வந்தீர்கள். அவர்கள் மேய்ச்சல் தரையைத்தான் கேட்கிறார்கள்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම අවසන් කරන්නම්, Sir.

தனி நாட்டைக் கேட்டுப் போராடிய ஓர் இனம், விடுதலைக்காகப் போராடிய ஓர் இனம், இன்றைக்கு தங்களுடைய மாடுகளை மேய்ப்பதற்கு மேய்ச்சல் தரையைக் கேட்கின்றபோது உங்களைப்போல இனத் துரோகிகள் அந்த மண்ணில் இருந்துகொண்டு ஒற்றுமையில்லாமல் அந்த மண்ணைக் காட்டிக்கொடுப்பதை நான் வெட்கமாக கருதுகின்றேன். Please, பதில் சொல்லுங்கள்!

ගරු කන්දසාමි ප්‍රභූ මහතා
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කන්දසාමි ප්‍රභූ මන්ත්‍රීතුමා.

ගරු කන්දසාමි ප්‍රභූ මහතා
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் எனது பெயரைக் குறிப்பிட்டுப் பேசியிருந்தார். அதன் அடிப்படையிலேயே நான் இந்த ஒழுங்குப் பிரச்சினையை எழுப்புகின்றேன்.

மட்டக்களப்பு மண் வீரம் செறிந்த மண். அதனை நானும் அறிவேன். அந்த மண்ணிலிருந்து வந்தவன் என்ற அடிப்படையிலே, அப்பிரதேச மக்களின் பிரச்சினைகளை நான் அறிவேன். அவர்களின் பிரதிநிதியென்ற ரீதியில் அவர்களின் பிரச்சினைகளைத் தீர்ப்பதற்குத்தான் நான் முற்பட்டுக் கொண்டிருக்கின்றேன். நான் பாராளுமன்ற உறுப்பினராகத் தெரிவு செய்யப்பட்ட சந்தர்ப்பத்திலே மயிலத்தமடு - மாதவனை பிரதேசத்துக்குச் சென்று அந்த மக்களின் பிரச்சினைகளை அறிந்து, அவர்களுக்குத் தேவையான வசதி களையும் மகாவலி அதிகாரசபையின் ஊடாக மேற் கொண்டிருக்கின்றேன். உங்களது பாராளுமன்ற உறுப்பினர் கள் போகாத இடங்களுக்கு நான் சென்றிருக் கின்றேன் என்பதையும் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

பேசும்போது கௌரவம் என்ற ஒரு விடயம் இருக்கின்றது. ஆகவே, கேவலமான வார்த்தைகளைப் பிரயோகிக்காமல் அழகாக - வடிவாக தமிழிலே பேசுங்கள்! வைத்தியர் என்ற மரியாதையே இப்பொழுது உங்களிடம் இல்லாமல் போயிருக்கின்றது. நான் அடுத்த பஸ்ஸில் வருவேனோ, இல்லையோ தெரியாது. ஆனால் நீலக் colour பஸ்ஸில் நீங்கள் -

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.06]

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් සඳහන් කළා, ගරු ජනාධිපතිතුමා බදු සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශ කළා කියලා. ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්නයි මම මේ අවස්ථාව යොදා ගන්නේ. ගරු ජනාධිපතිතුමා විසින් පැහැදිලිවම කිව්වේ අපේ ආණ්ඩුව යටතේ මේ කරන ලද සියලු වැඩ කටයුතු අතරතුර වාගේම ආදායම ස්ථාවර කිරීම තුළ කිසිදු අතිරේක බද්දක් පනවන්නේ නැතිව, අලුත් බදු පනවන්නේ නැතිව මේ බදු ව්‍යූහය තුළ අපි ආදායම් එකතු කර ගත්තාය කියන කාරණයයි. හැබැයි, එතුමා කළ ප්‍රකාශය වැරදි විධියට අර්ථ කථනය කරලා තිබෙනවා. මම පැහැදිලි කරන්නම්, එතුමා මොකක්ද කිව්වේ කියන එක. මොකද, අපේ ආණ්ඩුව යටතේ බදු ව්‍යූහයේ තිබෙන අඩුපාඩුකම් අපි හඳුන්න ඕනෑ. අකාර්යක්ෂමතා ටික පිටු දකින්න ඕනෑ. එවැනි වැඩකටයුතු ගණනාවක් අපට කරන්න සිද්ධ වෙනවා. මම එය ඔප්පු කරලා පෙන්නුම් කරන්නම්, සමාජ මාධ්‍යවල පළ වූ තොරතුරු උපුටා ගෙන. මෙන්න මෙහෙම බදු වැඩි කළා කියලා සමාජ මාධ්‍යවල තොරතුරු පළ වෙනවා.

ඇත්තටම අපිට වැදගත් වෙන්නේ රටේ ආදායම ස්ථාවර කර ගැනීමයි. මෙතැනදී අඩුපාඩුකම් තිබෙනවා නම් යම් යම් අනුපාතවල ගැළපීම් සිද්ධ කරන්න ඕනෑ. ඒවා අලුතෙන් බදු ගැසීමක් නොවෙයි. එවැනි කාරණා සිදු කිරීමේ ප්‍රතිඵලයක් විධියට තමයි ඉතාම සුවිශේෂී ජයග්‍රහණයක් අපට ගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීම මත අත්පත් කර ගන්න ලැබුණේ. 2022දී අපේ රටේ බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 8.2ක් වශයෙනුයි තිබුණේ. එවැනි බදු ආදායමක් තිබියදී රටක් ඉදිරියට ගෙන යන්න බැහැ. මොකද, ඒ රට බිඳ වැටෙනවා. ඒ නිසා තමයි 2025දී ඒක සියයට 16.7 දක්වා වැඩි කර ගන්න අපිට පුළුවන්කම ලැබුණේ, අලුතෙන් බදු හඳුන්වා දෙන්නේ නැතිව තිබෙන බදු ව්‍යූහයේ කරන ලද ගැළපීම් අනුව. ඒ නිසා විපක්ෂයේ මන්ත්‍රීතුමා සඳහන් කළේ අපි නොකරපු දෙයක්. ඒ වාගේම ජනාධිපතිතුමා ඇත්තටම කරපු දේවල් පිළිබඳව එතුමා කිව්වේත් නැහැ. ඒ, මොනවාද? ජනාධිපතිතුමා විසින් විශේෂ බදු සහන ලබා දීමක් කළා.

ආණ්ඩුව භාර ගන්නකොටම බදු වැඩි කර ගන්න අපි කරපු දේ තමයි, ආදායම් බදු ගෙවන පුද්ගලයන්ට වාසියක් වෙන්න උපරිම වශයෙන් රුපියල් 20,500ක බදු සහනයක් ලබා දීම. හැබැයි, ඒ කාරණය එතුමා කිව්වේ නැහැ. ඒ කියන්නේ, ඒවා අපි ලබා දුන්නු සහන. ඒ වාගේම කිරි, දියර කිරි සහ යෝගට් සඳහා බදු සහන ලබා දුන්නා. ඒ වාගේම අපි පාසල් දරුවන්ට අවශ්‍ය උපකරණ සඳහා යම් බදු සහනයක් ලබා දෙන්න බලාපොරොත්තුවෙන් හිටියත්, ඒ තිබුණු වැඩසටහන තුළින් එය කරන්න බැරි වුණු නිසා ඒ දරුවන්ට උපකරණ ලබා ගැනීමට රුපියල් 6,000 ගණනේ දුන්නා. ඒවා බදු අඩු කරන්න අපි කරපු දේවල්.

දැන් මම සඳහන් කරන්නම්, social media හරහා සිදු කරන වැරදි මත දැක්වීම් කීපයක් පිළිබඳව. එවැනි එක වැරදි මතයක් තමයි, නිෂ්පාදන බද්ද සියයට 6කින් වැඩි කළා, නමුත් ජනාධිපතිතුමා බොරු කිව්වාය කියන එක. අපේ ආණ්ඩුව එන්නත්

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

කලින්ම සිට වැඩසටහනක් තිබුණා. ඒ වැඩසටහනට අනුව පසුගිය අවුරුද්දේ රටේ සාමාන්‍ය උද්ධමනය වැඩි වෙනවා නම් ඒ උද්ධමනයට සියයට 4ක් එකතු කරලා භාණ්ඩ වර්ග 5ක මිල වැඩි කරන්න ඕනෑ. ඒක ඇත්තටම මේ චෝදනාව කරපු කණ්ඩායම තමයි වැඩියෙන්ම කරලා තිබුණේ. ඒගොල්ලන්ට ඕනෑ නම් ඒක අඩු කරන්න තිබුණා. 2023දී උද්ධමනය සියයට 17.4ක්ව තිබුණා. ඒගොල්ලන්ට උපරිම සීමාවක් පැනවිලා තිබුණා. ඒ නිසා 2024 ජනවාරි 01වැනි දා උද්ධමනය සියයට 14කින් වැඩි කළා, ඒ තිබුණු ව්‍යුහය තුළ. හැබැයි, 2025 වසරේදී උද්ධමනය වැඩිවීම සියයට 1.9ක් නිසා අපි එය සියයට 5.9කින් වැඩි කළා. ඒකට අර formula එක අනුව තමයි සියයට 4ක් එකතු වුණේ. හැබැයි, අපේ ආණ්ඩුව යටතේ එය 2026 ජනවාරි 01වැනි දාත් වැඩි වෙන්න තිබුණා. නමුත් අපි ඒක වැඩි කළේ නැහැ. ඇයි, ඒ? "දිට්වා" සුළි කුණාටුවෙන් ඇති වූ බලපෑම නිසා මහජනතාවට තිබුණු පීඩනය සැලකිල්ලට භාජන කරලා, වැඩි කරන්න නියමිතව තිබුණු එකකුත් වැඩි කළේ නැහැ.

ඊළඟට, වැරදි අර්ථ කථනයක් ඉදිරිපත් කළා, පොලිය මත අතිරේක බදු පනවලා කියලා. ඇත්තටම රැඳවුම් බද්දක් කියන්නේ අතිරේක බද්දක් නොවෙයි. ආදායම් බදු ගෙවන සමාගමක් හෝ පුද්ගලයෙක් - අපි කවුරුත් - තමන්ගේ ආදායම් මත බදු ගෙවන්න ඕනෑ. හැබැයි, ඒ බදු ආදායම උපයන ස්ථානයේදීම - ප්‍රභවයේදීම - එම බදු මුදල අයකර ගැනීම, එම බදු අයකර ගැනීමේ ක්‍රමවේදයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ, ගරු ඇමතිතුමනි.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මම ඉක්මනින්ම කථාව අවසන් කරනවා.

ඒ අනුව පොලිය මත රඳවා ගැනීමේ බද්දක් විධියට අයකර ගන්නට තිබුණා සියයට පහක්. කලින් ආණ්ඩුව යටතේදී බදු ගෙවන්න යටත් වෙන පුද්ගලයාත්, නැති කෙනාත් දෙන්නාම මේ සියයට පහ ගෙව්වා. අපි කළේ ඒ විකෘතිය නිවැරදි කළ එකයි. එහෙම කරලා බදු ගෙවන්න ඕනෑ නැති කෙනාට කිව්වා, "ඔයා කීයක්වත් ගෙවන්න ඕනෑ නැහැ. ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක් ලබා දෙන්න" කියලා. හැබැයි ඒ අනුපාතය අපි සියයට දහයකින් වැඩි කර ගත්තේ බදු අය කරන්න නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියයට දහය එකතු කර ගන්නා ප්‍රමාණය, එයා ගෙවන අවසාන බද්දෙන් අඩු කරනවා. ඒ නිසා කිසිදු බදු වැඩි කිරීමක් නැහැ. හැබැයි ඒකෙන් බදු අනුකූලතාව, බදු ගෙවීමේ ප්‍රවණතාව වැඩි කර ගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව සඳහන් කරන්න ඕනෑ විශේෂ කාරණා දෙකක් තිබෙනවා. මේගොල්ලන් කිව්වා, බොරු කියනවා කියලා. අපි අපනයන සේවා - export services - මත අලුතෙන් බද්දක් පැනෙව්වා කියලා කිව්වා. රට ඇතුළේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, අපනයනය වාගේ සියලු කටයුතුවලදී බදු පැනවෙන්න ඕනෑ. සේවා සැපයීමේදීත් රට ඇතුළේදීද, අපනයනයේදීද කියලා ප්‍රශ්නයක් නැහැ, බදු පැනවෙන්න ඕනෑ. හැබැයි පැවතිච්ච තත්ත්වයේදී මෙන්න මේ අපනයන සේවාවලට බදු පනවන්නේ නැතිව තිබිලා තිබෙනවා. එතකොට මේ තුළ විකෘතියක් ඇති වෙලා තිබෙනවා. අසාධාරණයක්, අසමතුලිතතාවක් ඇති වෙලා තිබෙනවා. ඒ තත්ත්වය ඉවත් කරලා සාධාරණ බව රැකීම සඳහා අපනයනය කරන භාණ්ඩ හා සේවා සඳහා අපි බද්දක් අය කරනවා. එතැනදීත් අපි විශේෂ සහනයක් ලබා දෙනවා, ඒ සමාගම්වලට. සාමාන්‍යයෙන් සමාගමක් තමන්ගේ ලාභයෙන් සියයට 30ක් ගෙවන්න ඕනෑ. හැබැයි අපි මෙතැනදී සිදු කරන්නේ, ඒ විධිමත්භාවය ගෙනෙන ගමන්ම ඒ සමාගම්වලට සියයට 15ක සහනයක් දෙන එක. ඒ කියන්නේ, අඩු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් අමතරව ලැබෙනවා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
බොහොම ස්තුතියි.

ඒ වාගේම තනි තනි පුද්ගලයින් විධියට අපනයනවලින් ලාභයක් උපයා තිබුණා නම්, ඔහු සියයට 36 දක්වා ගෙවන්න ඉඩ තිබුණා. හැබැයි, අපි කළේ මේ අපනයන සේවා තුළ සුවිශේෂී තත්ත්වයක් තිබෙන නිසා ඔහුව බදු ව්‍යුහයට ගෙනෙන ගමන්ම විශේෂ සහනයක් ලබා දෙනවා. ඒ අනුව ඔහු උපරිම ගෙවන්නේ අපනයන සේවාවලින් ලබන ලාභයෙන් සියයට 15යි. මෙමඟින් බදු අය කිරීමේ විධිමත් භාවය සහ බදු අය කිරීමේ කාර්යක්ෂමතාවය තමයි වැඩි කරලා තිබෙන්නේ.

ඊළඟට තවත් බොරුවක් කියනවා, මූල්‍ය සේවා මත ගෙවනු ලබන වැට් එක සියයට 20.5ක් දක්වා වැඩි කළා කියලා. ඇත්තටම මොකක්ද එතැන සිදු වුණේ? එකක් තමයි, වැට් එක අය කිරීමේදී සාමාන්‍ය භාණ්ඩ හා සේවාවලට වැට් එක අය කරනවා. ඒක සියයට 18යි. ඊට අමතරව, Social Security Contribution Levy ලෙස සාමාන්‍ය භාණ්ඩ හා සේවාවලට සියයට 2.5ක් අය කරනවා. මූල්‍ය සේවාවලට බදු අය කරන්නේ, සියයට 18ත්, 2.5ත් වශයෙන් එකම පදනමක් මත, එකම අගයක් මත. එතකොට වර්තමානයේ මූල්‍ය සේවා සපයන කෙනෙකු වැට් ගෙවන කොට, වැට් එක ගණනය කරන්න ඕනෑ වෙනම පදනමකින්, සියයට 2.5 ගණනය කරන්න ඕනෑ වෙනම පදනමකින්. ඒ වාගේම ඒ සඳහා ලිපි ගොනු ලබා දෙන්නත් ඕනෑ. අනවශ්‍ය කාර්යයක්; අනවශ්‍ය පිරිවැයක්. ඔවුන්ට පහසුකම් සැපයීම සඳහා අපි මේ දෙකම එකට එකතු කරලා තමයි මේ වැඩකටයුත්ත කළේ. ඒ නිසා එතුමන්ලා මතු කළ කාරණය ජනතාව නොමඟ යවන කාරණයක්.

ඊළඟට කිව්වා, ඩිජිටල් සේවා මත සියයට 18ක වැට් එකක් ගැහුවා කියලා. මම හිතන විධියට, මේක ඉදිරිපත් කරපු අයත් මේ වැට් ගැන, අනුපාත ගැන අවබෝධයක් නැතුව කියපු කාරණයක්. මෙතැනදී කළේ, ඩිජිටල් සේවා මත බද්දක් අය කිරීම නොවෙයි. භාණ්ඩ හා සේවා සැපයීම වැට් එකට යටත්. ඒ සේවා සපයන්නේ කොහොමද? අපිට භෞතිකව ගිහිල්ලා සේවා සපයන්න පුළුවන්, වෙනත් මාර්ගවලින් සේවා සපයන්න පුළුවන්. මෙහි ඇති සුවිශේෂී කාරණය තමයි, ඩිජිටල් පුවරුවක් මත, වේදිකාවක් මත සේවා සැපයීම. ඒ ඩිජිටල් වේදිකාවකදී සේවා සපයන අය මේ දක්වා නොගෙවමින් සිටියේ, ඔවුන් ගෙවිය යුතු දෙයක්. ඒ නිසා අපි විධිමත්භාවය රැකලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සඳහන් කරන්න කැමතියි මේ ඉදිරිපත් කරන ලද චෝදනා සියල්ලම වැරදියි කියලා. ජනාධිපතිතුමා කිසිදු ආකාරයක බොරුවක් කියලා නැහැ. අපි බදු

ව්‍යුහය ශක්තිමත් කරලා තිබෙනවා, විධිමත් කරලා තිබෙනවා, කාර්යක්ෂමතාව වැඩි කරලා තිබෙනවා. එහි ප්‍රතිඵලයක් විධියට ආණ්ඩුව සාර්ථකව ස්ථාවරව ඕනෑම අභියෝගයකට මුහුණ දෙමින්, නොසැලී ඉදිරියට ගමන් කරනවා. "දිවිවා" සුළි කුණාටුව විතරක් නොවෙයි, මැද පෙරදිග අර්බුදය හමුවේ පවා ඉදිරියට ගමන් කරන්න පුළුවන් ආකාරයට බදු පදනම පුළුල් කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් මහජනතාවටත් ස්තුතිවන්ත වෙනවා. ඔවුනුත් නිසියාකාරව බදු ගෙවමින් සිටිනවා. එම ලැබෙන බදු ආදායමින් ජනතාවට අවශ්‍ය සහන දිගටම ලබා දෙමින් තිබෙනවා. දැනටමත් විශාල සහන ප්‍රමාණයක් ලබාදීලා තිබෙනවා. ඉදිරියේදීත් ඒ සහන ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා, ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.15]

ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ ප්‍රධාන වශයෙන්ම අපි සාකච්ඡා කරමින් ඉන්නේ, මේ අලුත් Supplementary Sum එක හරහා විවිධ ක්ෂේත්‍ර සඳහා, විශේෂයෙන්ම ඉන්ධන සහනාධාරය ලබාදීම ඇතුළු කාරණා කිහිපයක් වෙනුවෙන් මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන්. මේ විවාදය තුළ බලශක්ති ක්ෂේත්‍රයට අදාළව, විශේෂයෙන් ඉන්ධන සම්බන්ධයෙන් අපිට කරුණු දෙකක් අහන්න ලැබුණා. එක කරුණක් තමයි, ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සඳහන් කළා, ඉන්ධන වෙනුවෙන් සහනාධාරය දෙන්න එපා, ඒ වෙනුවට "අස්වැසුම" ලැබෙන අයට - දුප්පත් මිනිසුන්ට - රුපියල් 4,000ක් ලබා දෙන්න කියන අදහසක්. ඒ වාගේම ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගෙන් ඉදිරිපත් වුණා, ඒ සහනාධාරය රජයේ CPC එකට විතරක් දෙන්නය කියන අදහසක්.

මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන අතරේ, අපි කල්පනා කර බලන්න ඕනෑ, මේ ඉන්ධන සහනාධාරය ලබා දෙන්න හේතු වෙච්ච කාරණය මොකක්ද කියලා. අපි දන්නවා, මැද පෙරදිග යුද්ධය ඇතිවීමත් එක්ක ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල වැඩිවීම නිසා, ඊට සාපේක්ෂව දේශීය වෙළෙඳ පොළේ ඉන්ධන මිල යම් ප්‍රමාණයකින් ඉහළ දමන්න සිද්ධ වුණු බව. මේ chart එක දිහා බැලුවාම අපට පෙනෙනවා, මේ අවුරුද්දේ මාර්තු මාසය වෙනකම් අපේ ඉන්ධන මිල එකම අගයක පවත්වාගෙන යන්න බැරි වුණු බව. හැබැයි, මේ අසීමිත නැග්ම අපට පෙනෙන්නේ පෙබරවාරි මාසයේ අන්තිම වෙනකොට ලෝකයේ ඇති වෙච්ච, විශේෂයෙන් මැද පෙරදිග කලාපයේ ඇති වෙලා තියෙන යුද්ධය නිසා වෙච්ච අසීමිත මිල වැඩි වීමක් බවයි. ඒ මිල වැඩිවීම කොයි තරම් ප්‍රමාණයක්ද කියලා කිව්වොත්, සාමාන්‍යයෙන් පෙබරවාරි මාසයේ Singapore Plattsවල තිබුණේ Petrol 92 Octane බැරලයක් ඩොලර් 75.28ක් වශයෙන්. එහි average ගණන ඔක්තෝබර් මාසයේ ඩොලර් 140 දක්වා වැඩි වෙලා තියෙනවා; සියයට 86.6කින් වැඩි වෙලා තියෙනවා. ඒ වාගේම ඩීසල් ගත්තොත්, පෙබරවාරි මාසයේ තිබුණේ බැරලයක මිල ඩොලර් 89.93ක් වශයෙන්. දැන් ඒක ඩොලර් 173.17ක් දක්වා වැඩි වෙලා තියෙනවා. ඒ කියන්නේ සියයට 92.5ක වැඩි වීමක් තියෙනවා. ඒ වාගේම Brent Crude Oilවලත් මේ වාගේ වැඩිවීම ගැන අපට සාකච්ඡා කරන්න පුළුවන්. හැබැයි, අපි වගකිව යුතු රජයක් හැටියට මෙතැනදී ගත් පියවර තමයි ලෝක වෙළඳපොළේ ඇති වන මිල වැඩිවීම සම්පූර්ණයෙන්ම මේ රටේ ඉන්ධන පාරිභෝගිකයාට ලබා දෙන්නේ නැතුව එයින් කොටසක් පමණක්, ඉතා සුළු කොටසක් පමණක් පාරිභෝගිකයාට ලබා දෙමින් ඉතිරි කොටසින් කොටසක් සහනාධාරය හැටියට රජය දරන්නත්, අනික් කොටස ඒ ඉන්ධන බෙදා හරින සමාගම් විසින් දැරිය යුතුයි කියන ප්‍රතිපත්තිය තුළ හිඳිමින් කටයුතු කිරීම. ඒ ප්‍රතිපත්තිය තුළ තමයි අපේ රජය හිටියේ. ඒ අනුව අපි කලින් විශේෂයෙන් මාර්තු, අප්‍රේල්, මැයි වාගේ කාලවල මිල වැඩිවීමත් එක්ක ඇති වන තත්ත්වය වළක්වාලීම සඳහා ඩීසල්වලට රුපියල් 100ක් සහ පෙට්‍රල්වලට රුපියල් 20ක් ආදී වශයෙන් රුපියල් බිලියන 57ක් වියදම් කරලා ඒ සහනාධාරය ලබා දෙන්න කටයුතු කළා. හැබැයි, නැවත වරක් ලෝක වෙළඳපොළේ මිල ඉහළ යාමත් එක්ක විශේෂයෙන් ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් මාසවලට සහන දෙන්න කටයුතු කළා. ඩීසල් සඳහා ඔක්තෝබර් මාසයේදී රුපියල් 70ක් ලබා දෙන්නත්, එතැනින් පසුව නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල ඩීසල් සඳහා සහනාධාරය ලබා දෙන්න තවත් එක් මාසයකට ඩොලර් බිලියන 13.5ක් බැගින් වෙන් කරන්න රජය කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී අපි විශේෂයෙන් ඩීසල් සඳහා සහනාධාරය ලබා දෙන්න කටයුතු කළේ, ඇත්තටම ඩීසල් කියන්නේ රටේ ප්‍රවාහනයට, ඒ වාගේම ආර්ථිකයට, කර්මාන්තවලට, කෘෂිකර්මාන්තයට අතිශයින් වැදගත් වන ඉන්ධන ද්‍රව්‍යයක් නිසායි. ඒ නිසා තමයි අසීමිත ලෙස ඩීසල්වල මිල ඉහළ දමන්නේ නැතුව අපි සහනාධාරය ලබා දෙන්න කටයුතු කළේ.

දැන් මෙතැනදී එක තර්කයක් ආවා, මේ පිරිවැය කළමනාකරණය, මිල මත තමයි ඉන්ධන මිල තීරණය කරන්න ඕනෑ කියලා. ඒ අනුව ඉන්ධනවලට සහනාධාර ලබා දෙන්න එපා කියන මතයක් මේ සභාව තුළ විශේෂයෙන් සජබ නියෝජනය කරන මන්ත්‍රීවරයෙකුගෙන් අපට අහන්න ලැබුණා. මම බැලුවා, අද මෙහෙම අවස්ථාවක සජබ ආණ්ඩුවක් තිබුණා නම්, මොකද තත්ත්වය කියලා. හැබැයි, රටේ ජනතාවගේ වාසනාවට සජබ ආණ්ඩුවක් නොවෙයි, දැන් ඉන්නේ. මේ වෙලාවේ කවුරුත් පේන්නත් නැහැ, පාර්ලිමේන්තුවේ. මේ මන්ත්‍රීවරු අතරේ සජබ මන්ත්‍රීවරු ඇත්තෙත් නැහැ. හැබැයි, සජබ ආණ්ඩුවක් බැරි වෙලාවත් තිබුණා නම්, අපි එහෙම උපකල්පනය කළොත්, CPC එක ඩීසල් විකුණන්නේ රුපියල් 520ට. ඒ වාගේම Sinopec එක ඩීසල් ලීටරයක් විකුණන්නේ රුපියල් 572ට. ඒ වාගේම RM Parks ඩීසල් ලීටරයක් විකුණන්නේ රුපියල් 571කට. එතකොට මේ කියන තර්කවලට අනුව ඩීසල් මිල ඒ විධියට තීරණය කරනවා, සජබ ආණ්ඩුවක් තිබුණා නම්. ඒ වාගේම සජබ ආණ්ඩුවක් තිබුණා නම්, අද Petrol 92 Octane ලීටරයක් විකුණන්නේ රුපියල් 496ට. ඒ වාගේම Sinopec එක විකුණන්නේ රුපියල් 473ට; RM Parks විකුණන්නේ රුපියල් 535කට.

ඒ වාගේම අද තවත් අදහසක් ආවා, විශේෂයෙන් රවී කරුණානායක මන්ත්‍රීතුමාගෙන්. එතුමා සජබ නියෝජනයක් නොවෙයි. එතුමා කිව්වා, මේ තෝරා ගත් කොටසකට, රජයේ කොටසට සහනාධාර දෙන්න. හැබැයි, අනික් අයට සහනාධාර ලබා දෙන්න කටයුතු කරන්න එපා කියලා. එතකොට එහෙම බැලුවාම CPC එකට - රජයේ කොටස කියලා ගත්තොත්, CPCඑකට - සහනාධාර ලබා දෙන්න කටයුතු කරන්න; හැබැයි, අනික් අයට සහනාධාර ලබා දෙන්න කටයුතු කරන්න එපා කියලායි කිව්වේ. මේ මගේ අතේ තියෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2023 Sinopec සමාගමත් එක්ක අත්සන් කරපු ගිවිසුම. ඒ අත්සන් කරපු ගිවිසුමේ 6.1 වගන්තියේ පැහැදිලිව සඳහන් වෙනවා, “equal treatment for all players” කියලා. ඒ කියන්නේ, ඉන්ධන බෙදාහරින සියලු සමාගම් සම්බන්ධයෙන්

[ගරු අනුර කරුණාතිලක මහතා]

බලශක්ති අමාත්‍යාංශයත්, තොග ගබඩා කරන සමාගමත් - CPSTLඑකත් - එක හා සමාන ලෙස කටයුතු කළ යුතුයි කියන එක තමයි මේ වගන්ති තුළ තිබෙන්නේ. මා හිතන්නේ රවී කරුණානායක මන්ත්‍රීතුමාත් 2016-2017 වාගේ කාලය තුළ කැබිනට් ඇමතිවරයෙකු හැටියට ඉන්න කොට අත්සන් කරපු හැම ගිවිසුමක් තුළම මේ වගන්තිය තිබුණා. Sinopec, LIOC, RM Parks ආදි සමාගම් සමඟ ඇති කරගත් ඒ සියලු ගිවිසුම්වල තිබෙනවා - රවී කරුණානායක මහත්මයාත් අත්පුඩි ගහලා හිත යටින් සන්තෝෂ වෙච්ච ගිවිසුම්වල තිබෙනවා - මේ කියනවා වාගේ එක් පාර්ශ්වයකට විතරක් වෙනස් කොට සැලකීමට හැකියාවක් නැහැ කියලා. රවී කරුණානායක මහත්මයා ආණ්ඩුවේ ඉන්න කොට එක දෙයක් කියනවා; හැබැයි, විපක්ෂයට ආවාම තවත් දෙයක් කියනවා. රවී කරුණානායක මහත්මයා අර indirect tax එක ගැන කිව්වෙත් ඔය වාගේම එකක් තමයි. නමුත්, මේ ජාතික ජන බලවේගය ආණ්ඩුව කිසිම indirect tax එකක් අලුතින් එකතු කරලා නැහැ. අනිල් ජයන්ත ඇමතිතුමා ඒ ගැන පැහැදිලි කළා. රවී කරුණානායක මහත්මයාලා ගෙන ගිය ආර්ථික ක්‍රමවේදය තුළ ඇති කරපු indirect tax එක තමයි අපි තවමත් මේ ක්‍රියාත්මක කරමින් යන්නේ. එතුමාට ආණ්ඩු පක්ෂයේ ඉන්න කොට මේ රටේ ජනතාව සම්බන්ධයෙන් දැනුණේ නැති අනුකම්පාවක් විපක්ෂයට ආවාම දැනිලා තිබෙනවා.

මම දැක්කා, සමාජ මාධ්‍ය තුළත්, අද ප්‍රධාන පුවත්පතකත් පළ වෙලා තිබෙන, කලින් හිටපු ඛනිජ තෙල් ඇමතිවරයෙකුගේ ප්‍රකාශයක්. එතුමා සිංගප්පූරුවේ Platts මිල සඳහන් කරමින් කියා තිබෙනවා, අද වනකොට ඩීසල් සහ Petrol 92 Octaneවල මිල පිළිවෙළින් රුපියල් 337ක්, 336ක් සහ 280ක් වෙන්න ඕනෑ කියලා. මම බැලුවා ඒ මහත්මයා කොහොමද මේ calculations කරලා තිබෙන්නේ කියලා. එතුමා, හිටපු ඇමතිවරයෙක්; සංඛ්‍යා ලේඛන, දත්ත ගැන නිතර කථා කරන මහත්මයෙක්. "Daily Mirror" එකේත් අද එතුමාගේ ප්‍රකාශයක් තිබෙනවා. සාමාන්‍යයෙන් ඔක්තෝබර් මාසයේ Singapore Plattsවල, ඩීසල්වල මිල ඩොලර් 162යි. තෙල් බැරල් එකක ආසන්න වශයෙන් ලීටර් 159ක් තිබෙනවා. අපි හිතමු exchange rate එක රුපියල් 331යි කියලා. 162 කියන සංඛ්‍යාව 331න් වැඩි කළාම එනවා, රුපියල් 53,622ක්. ඒක ලීටර්වලට හරවා ගත්තාට පසුව රුපියල් 337.24ක් එනවා. ඒ කියන්නේ, අර කියපු රුපියල් 336ට ආසන්න අගයක්. ඒ මහත්මයා කියන්නේ, Singapore Platts rate එකට CPC එක තෙල් විකුණන්න ඕනෑ කියලායි. හිටපු ඇමතිවරයෙකු නොවෙයි, ඕනෑම කෙනෙක් දන්නවා, සිංගප්පූරුවෙන් මිල දී ගත්තු ඉන්ධන ලංකාවට ගෙන එනකොට ඒ මිලට premium එකක්, insurance එකක්, freight charge එකක් එකතු වෙනවා කියලා. ඒවාත් එකතු වෙලා තවත් අදාළ බදු එකතු වෙලා තමයි landing cost එක හැදෙන්නේ. ඊට පසුව මෙහෙයුම් කටයුතුවලට අදාළව බැලුවාම තමයි අනෙකුත් අවසන් මිල එන්නේ. ඒ මහත්මයාලාත් හිටපු, ඒ මහත්මයාලාත් අනුමත කරපු මා සඳහන් කරපු අර ගිවිසුම්වල සඳහන් වෙනවා, පැහැදිලි මිල සූත්‍රයක්. ඒ මිල සූත්‍රයට අදාළව තමයි මේ වනකොට ඉන්ධන මිල තීරණය වෙන්නේ. ඇත්තටම, ඒ මහත්මයා මීට වඩා අපට පැහැදිලි කරලා කියන්න ඕනෑ, තමන් ඉදිරිපත් කරන සංඛ්‍යාලේඛන අනුව, සිංගප්පූරුවෙන් ගන්නා මිලටම ලංකාවේ ඉන්ධන පිරවුම්හල්වල තෙල් විකුණන්නේ කොහොමද කියලා. ඒ මහත්මයා ඒ ගැන මීට වඩා පැහැදිලිව කියනවා නම් හොඳයි.

ඒ වාගේම අපි දන්නවා, ඉන්ධන මිල විශාල වශයෙන් ඉහළ යාමත් එක්ක, එනම් මුල් කාලයේ අපේ රටේ ඉන්ධන මිල වැඩිවීමත් එක්ක පරිභෝජන රටාවේ යම්කිසි විධියක වෙනසක් සිද්ධ වුණා කියලා. නමුත් දැන් අපේ පරිභෝජන රටාව දිහා බැලුවාම තිබෙන තත්ත්වය මා කියන්නම්. ඩීසල් විතරක් මම උදාහරණයට ගන්නම්. සාමාන්‍ය මාසික අගය විධියට පෙබරවාරි මාසයේ තිබුණේ කිලෝ ලීටර් 6,007යි. හැබැයි, මාර්තු මාසයේ අර panic buying එක ඇති වෙච්ච වෙලාවේ මිනිස්සු කලබල වෙලා වැඩි වශයෙන් මිල දී ගන්න කටයුතු කළ නිසා ඒ මාසයේදී කිලෝ ලීටර් 7,715ක් මිල දී ගැනීම සඳහා අපි කටයුතු කළා. Auto diesel ගැන තමයි මම මේ සාකච්ඡා කරන්නේ. හැබැයි, මේ වනකොට - ඔක්තෝබර් 31වන දා වනකොට - නැවත වරක් පෙබරවාරි මාසයේ තිබිච්ච තත්ත්වයටම කිලෝ ලීටර් 6,188ක් සාමාන්‍යයෙන් මාසිකව අපි පාවිච්චි කරනවා. ඒ කියන්නේ මැද පෙරදිග යුද්ධය නිසා විශාල වශයෙන් මිල වැඩි වුණත්, අපේ සාමාන්‍ය පරිභෝජන රටාව නැවත වරක් යුද්ධයට කලින් තිබුණු ස්වරූපයටම ඇවිත් තිබෙනවා. අපි රටක් හැටියට quota system එක හඳුන්වා දීලා යම් යම් ක්‍රියාමාර්ග ගත්තත්, අපේ පරිභෝජන රටාවේ අත්‍යවශ්‍ය නොවන පරිභෝජනය අවම කර ගැනීම සඳහා කටයුතු කරන්න අපට තවමත් පුළුවන් වෙලා නැහැ. රටක් හැටියට අපි කල්පනා කරන්න ඕනෑ ලෝක මට්ටමින් යුද්ධයක් පවතින මේ කාලය තුළ අපේ පරිභෝජන රටාවේ අත්‍යවශ්‍ය නොවන පරිභෝජනය සීමා කරගත යුතුයි කියන එක. ඒ මතයේ අපි ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක වෙළෙඳ පොළේ ඛනිජ තෙල් මිල විශාල වශයෙන් වැඩිවීමට සාපේක්ෂව දේශීය වෙළෙඳ පොළේ මිල වැඩි නොවුණු නිසා සමහර ඉන්ධන සමාගම් දේශීය වෙළෙඳ පොළට, තමන්ගේ ඉන්ධන පිරවුම්හල්වලට ඉන්ධන සැපයීම සීමා කළ බව අපි දන්නවා. එතකොට මේකේ බර කරට ගන්න සිද්ධ වුණේ රාජ්‍ය ආයතනය හැටියට තිබෙන CPC එකට. පෙබරවාරි මාසයේ ඩීසල්වල සාමාන්‍ය ප්‍රතිශතයක් හැටියට market share එක තිබුණේ සියයට 60.6යි. හැබැයි, ඔක්තෝබර් මාසය වනකොට CPC එකේ ඩීසල්වල market share එක සියයට 76.8 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ, අනෙක් සමාගම් වෙළෙඳ පොළට ඩීසල් සැපයීම සීමා කරන කොට ඒ බර කරට අරගෙන වගකිව යුතු රාජ්‍ය ආයතනයක් හැටියට Ceylon Petroleum Corporation එක වැඩ කරලා තිබෙනවා.

LIOC එක ගත්තොත්, පෙබරවාරි මාසයේ සියයට 19ට තිබුණු ඩීසල්වල market share එක ඔක්තෝබර් මාසයේදී සියයට 12.6 දක්වා අඩු වෙලා තිබෙනවා. Sinopec ගත්තොත්, පෙබරවාරි මාසයේ market share එක සියයට 11.6ක් ලෙස තිබුණා. දැන් ඒක සියයට 4.3 දක්වා අඩු වෙලා තිබෙනවා.

මේ ආකාරයට බැලුවාම, තරගකාරිත්වය හදලා ඒ තරගකාරිත්වය හරහා ඉන්ධන පාරිභෝගිකයන්ට සාධාරණ තරගකාරී මිලක් ලබා දෙන්න ගෙනාපු සමාගම් මේ වාගේ අර්බුදකාරී අවස්ථාවක තමන්ගේ වගකීම ඉෂ්ට කරන්නේ නැතිව ඒ වෙනුවට වෙළෙඳ පොළට ඉන්ධන සැපයීම සීමා කරන තත්ත්වයක් තමයි මේ සංඛ්‍යාලේඛන දිහා බැලුවාම අපට පෙනෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ ගිවිසුම් අනුව ceiling price එකක් හා floor price එකක් ප්‍රකාශයට පත් කරන්න - declare කරන්න - අමාත්‍යාංශයට පුළුවන්. හැබැයි, බැරි වෙලාවත් අපි ceiling price එක waive කළොත්, ගන්න වෙන්නේ මේ සමාගම්වල උපරිම මිලයි. RM Parks එකේ උපරිම මිල තමයි අපට ඩීසල් සඳහා ගන්න වෙන්නේ. ඒ කියන්නේ, රුපියල 571ක්. එය ceiling price එකක් හැටියට ප්‍රකාශයට පත් කළොත්, ඩීසල් මිල රුපියල් 571ක් කියලා තමයි අපට ප්‍රකාශයට පත් කරන්න වෙන්නේ. වගකිව යුතු රජයක් හැටියට අපට ඒක කරන්න බැහැ. ඒ නිසා තමයි අපි CPC එකේ මිල ප්‍රකාශයට පත් කරන්නේ. අනෙක් සමාගම්වල ceiling price එක අපි ප්‍රකාශයට පත් කරන්නේ නැහැ. මේ අමාරු අවස්ථාවේ ලෝකයේ ඉන්ධන

ක්ෂේත්‍රයේ ඇති වෙලා තිබෙන අර්බුදය කළමනාකරණය කර ගනිමින් අපේ රටේ ඉන්ධන පාරිභෝගිකයන් සාපේක්ෂව අපහසුතාවට පත් කරන්නේ නැතිව වගකිව යුතු රජයක් හැටියට ඉන් කොටසක් දරමින් අපි කටයුතු කරනවා. ඉදිරියේදීත් වගකිව යුතු රජයක් හැටියට ඉන්ධන පාරිභෝගිකයා අපහසුතාවට පත් කරන්නේ නැතිව මේ ආකාරයට කටයුතු කරන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. මාහට කාලය ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පරිපූරක මුදල: ඉන්ධන සඳහා මිල සහනාධාරයක් ලබා දීම සහ අස්වැසුම වැඩසටහන යටතේ අමතර දීමනාවක් ලබා දීම

குறைநிரப்புத் தொகை: எரிபொருள் விலைக்கான மானியம் வழங்குதல் மற்றும் அஸ்வெசும திட்டத்தின்கீழ் மேலதிகக் கொடுப்பனவு வழங்குதல்

SUPPLEMENTARY SUM: PROVISION OF PRICE SUBSIDY FOR FUEL AND AN ADDITIONAL ALLOWANCE UNDER ASWESUMA PROGRAMME

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් බිලියන හතළිස් හතක් (රු.47,000,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

ශීර්ෂය	119	-	බලශක්ති අමාත්‍යවරයා	
වැඩසටහන	01	-	මෙහෙයුම් වැඩසටහන	
			පුනරාවර්තන වියදම්	රු. 41,000,000,000
ශීර්ෂය	102	-	මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා	
වැඩසටහන	01	-	මෙහෙයුම් වැඩසටහන	
			පුනරාවර්තන වියදම්	රු. 6,000,000,000
			මුළු වියදම	**රු. 47,000,000,000**

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම

ஒத்திவைப்பு

ADJOURNMENT

ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

වනජීවීන් සහ වනරක්ෂිත විනාශ වීම වැළැක්වීම සඳහා මානව සහ භෞතික සම්පත් සැපයීම

வன ஒதுக்கங்கள் மற்றும் வனவிலங்குகளின் அழிவைத் தடுப்பதற்காக மனித மற்றும் பௌதிக வளங்களை வழங்குதல்

PROVISION OF HUMAN AND PHYSICAL RESOURCES TO PREVENT DESTRUCTION OF FOREST RESERVES AND WILDLIFE

[අ.භා. 5.32]

ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"දශක දෙකකට ආසන්න කාලයක සිට අපේ රටේ වන සංරක්ෂණ සහ ජාතික වනෝද්‍යාන, දඩයක්කරුවන්ගේ සහ නීති විරෝධී ලෙස වන සම්පත විනාශ කරන්නන්ගේ දැඩි පීඩනයට ලක්ව ඇති බව මෙම සභාවේ අවධානයට යොමු කරමි. විශේෂයෙන්ම ජාතික වනෝද්‍යානයන්හි ස්වාභාවික වාසභූමිවල ජීවත් වන වනජීවීන් ද මේ හරහා දැඩි අනාරක්ෂිතභාවයකට මුහුණ දී සිටී.

මෑත කාලීනව මෙම අපරාධකරුවන් නවීන තාක්ෂණික ආයුධ සහ ක්‍රමවේද උපයෝගී කර ගනිමින් වනජීවීන්ට සහ වනරක්ෂිතවලට එල්ල කරන හානිය තවත් උග්‍ර වී තිබේ. උදාහරණයක් ලෙස මෑත කාලීනව අලි සහ ඇතුන් විශාල සංඛ්‍යාවක් දඩයක්කරුවන්ගේ ගොදුරු බවට පත්වීම දැක්විය හැක.

එබැවින්, උද්ගතව ඇති මෙම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා,

01. සුදුසුකම්ලත් නව නිලධාරින් බඳවා ගැනීම: වන සංරක්ෂණ හා වනජීවී ක්ෂේත්‍රය පිළිබඳ මනා දැනුමක් සහ තාක්ෂණික කුසලතා සහිත නව නිලධාරින් දෙපාර්තමේන්තුවට බඳවා ගැනීමටත්,

02. නවීන තාක්ෂණික උපකරණ ලබා දීම: වනය සහ සතුන් ආරක්ෂා කිරීම සඳහා අති නවීන ඩ්‍රෝන කැමරා, -Drone cameras- රේඩියෝ තරංග සන්නිවේදන උපකරණ සහ අනෙකුත් නවීන තාක්ෂණික මෙවලම් නිලධාරින් වෙත ලබා දීමටත්,

[ගරු උපුල් කිත්සිරි මහතා]

03. භෞතික සම්පත් සංවර්ධනය: වනජීවී අපරාධ මර්දන මෙහෙයුම් කඩිනම් කිරීම සඳහා අවශ්‍ය ආයුධ මෙන්ම ප්‍රමාණවත් නිල රථ සහ වාහන ලබා දීමටත්,

අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලය පුරාවට විවිධ ක්ෂේත්‍ර ඔස්සේ අපේ රටේ වනජීවී සම්පත සහ අලි-මිනිස් ගැටුම ගැන විවිධ කරුණු කාරණා මතු වුණා. අපි දන්නවා, අපේ ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් සියයට 29.2ක් වනාන්තර සඳහා වෙන් කරලා තිබෙනවා බව. ඒ වාගේම ජලාශ සඳහා සියයට 4.4ක් වෙන් කරලා තිබෙනවා. එතකොට අපේ භූමි ප්‍රමාණයෙන් අපට අනෙකුත් කටයුතු සඳහා ඉතිරි වෙන්නේ, වර්ග කිලෝමීටර 43,575ක වාගේ භූමි ප්‍රමාණයක් තමයි. ඒ භූමිය ඇතුළේ තිබෙන මිනිසුන්ගේ වාසස්ථාන, අනෙකුත් කෘෂි කාර්මික භූමි, කර්මාන්තශාලා ආදී වශයෙන් ගත්තාට පස්සේ, අපේ රටේ ජන ඝනත්වය ගත්තත් ඒ ඉතිරි භූමිය ඇතුළේ ජනඝනත්වය වර්ග කිලෝමීටර 500ත්, 1,000ත් අතර වාගේ ඉතා විශාල ප්‍රමාණයක් වෙනවා.

1937 අංක 2 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ තමයි, අපේ රටේ වනජීවීන්, වන සංරක්ෂණ කලාප හා වනජීවී ප්‍රදේශ අපි නම් කරන්නේ. එහිදී ලංකාවේ පළමුවැනි වනාන්තර දෙක හැටියට යාල සහ විල්පත්තුව වනාන්තර 1938දී අපි ස්ථාපනය කරනවා. අද වෙනකොට ජාතික වනෝද්‍යාන 26ක් අපේ රටේ -මේ කුඩා භූමිය ඇතුළේ- තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ විශාල භූමි ප්‍රමාණයක අපට පෙව විවිධත්ව දකින්න පුළුවන්. විශේෂයෙන්ම 2022ත් පස්සේ ගත්තොත්, අපේ රටේ වනාන්තරවල ජීවත් වන අලි 2,400ක් පමණ විවිධ කාරණා නිසා මිය ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම අලි -මිනිස් ගැටුම නිසා අපේ රටේ මිනිස් ජීවිත 850ක වාගේ ප්‍රමාණයක් අපට අහිමි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ඒ අපරාධකරුවන් නවීන තාක්ෂණික ක්‍රමවේද වනසතුන් දඩයම් කිරීම සහ වනාන්තර විනාශ කිරීම සඳහා භාවිත කරනවා. ඒ නිසාම මම මේ ගරු සභාවට ප්‍රධාන වශයෙන්ම යෝජනා කරන්නේ, අපි සුදුසුකම්ලත් නිලධාරීන් බඳවා ගැනීම කළ යුතුයි කියන එකයි. එතැනදී කාරණා දෙකක් තිබෙනවා. එකක් තමයි, නවීන තාක්ෂණික දැනුම තිබෙන කණ්ඩායම් බඳවා ගැනීම. ඊළඟ එක, වනාන්තරයට, වනජීවීන්ට ආදරය කරන පිරිසක් බඳවා ගැනීම. විශේෂයෙන්ම ගත්තොත් වනජීවී ක්ෂේත්‍රය ඇතුළේ එවැනි නිලධාරීන් පිරිසක් ඉන්නවා. එයට තවත් පිරිසක් එකතු කිරීම තුළින් අපට පුළුවන් මේ ගැටලුව නිරාකරණය කර ගන්න. මා එය යෝජනාවක් හැටියට කරනවා.

ඒ වාගේම තමයි අපිට නවීන තාක්ෂණය පාවිච්චි කරන්න පුළුවන්. මොකද, ලෝකයේ දියුණු තාක්ෂණය අපේ රට තුළත් තිබෙනවා. අප්‍රිකානු කලාපය ඇතුළේ වනාන්තර ආරක්ෂා කිරීම සඳහා කෘත්‍රිම බුද්ධිය - AI - උපයෝගී කර ගනිමින් නවීන තාක්ෂණික ක්‍රමවේද භාවිත කරනවා. ඒ හරහා සතුන් ගැවසෙන ප්‍රදේශ හඳුනා ගන්න පුළුවන්. ඒ වාගේම වනාන්තරවලට හානි කරන විධිය වේලාසනින් හඳුනාගෙන එම දත්ත මත පදනම් වෙලා නවීන තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ ඒවා මැඩ පවත්වන්නත් පුළුවන්. මේ වෙනකොටත් විශේෂයෙන්ම ගරු ඇමතිතුමා මැදිහත් වෙලා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ ඒ අදාළ අමාත්‍යාංශවලට විවිධ උපකරණ ලබා දෙමින්, අවශ්‍ය cadre එක බඳවා ගැනීමට කටයුතු කරනවා. ඒ අනුව මම මේ සභාවට යෝජනා කරන්න කැමැතියි, විශේෂයෙන්ම වනජීවීන් ආරක්ෂා කිරීම සඳහාත්, වනාන්තර තුළ සිදුවන අපරාධ මර්දනය කිරීම සඳහාත් එම නිලධාරීන්ට අවශ්‍ය උපකරණ වාගේම නවීන ආයුධ ලබා දෙමින් තවදුරටත් එම කටයුතු ශක්තිමත් කර අපි වනාන්තර ආරක්ෂා කරගෙන, මෙම ගැටුම් අවම කර ගනිමු කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කරමින් අදහස් දැක්වීමට ගරු පද්මසිරි බණ්ඩාර මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි හතරක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.38]

ගරු පද්මසිරි බණ්ඩාර මහතා
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

විශේෂයෙන්ම මෙහිදී සඳහන් කරන්නට ඕනෑ, රටේ තිබෙන ප්‍රධාන ගැටලු අතරින් එක් ප්‍රධානම ගැටලුවක් තමයි, මේ අලි-මිනිස් ගැටුම කියන එක. අලි-මිනිස් ගැටුම ආරම්භ වුණේ අද ඊයේ නොවෙයි, සෑහෙන කාලයකට පෙරයි. නමුත්, එය ප්‍රබල තත්ත්වයට පත් වුණේ වසර 10ක පමණ කාලයක සිටයි. ඒ කාල පරාසය තුළ වනාන්තරවල සිටි අලි ඇතුන් සංඛ්‍යාව වැඩිවීමත්, ඒ එක්කම ඒ සතුන්ට ජීවත් වීම සඳහා තිබුණු වනාන්තර විශාල ප්‍රමාණයක් අහිමි වීමත්, මානව කටයුතු වැඩිවීමත්, සංවර්ධන කටයුතු කළමනාකරණයකින් තොරව හා වනජීවීන් ගැන සැලකිල්ලක් නොකර සිදු කිරීමත් කියන කාරණා මත ලංකාවේ අලි-මිනිස් ගැටුම වර්ධනය වෙලා තිබෙනවා කියන එක තමයි අපට දැනෙන්නේ.

අපි දන්නවා, විශේෂයෙන්ම මෑත කාලයේදී අලි-මිනිස් ගැටුම වර්ධනය වෙලා තිබෙන්නේ ලංකාවේ වියළි කලාපවල බව. අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර, හම්බන්තොට සහ කිලිනොච්චිය වාගේ වියළි කලාපීය ප්‍රදේශවල තමයි එම ගැටලුව උග්‍ර වෙලා තිබෙන්නේ. එම ගැටලුව ඇති වෙන්න මම මුලින් සඳහන් කළ කාරණා බලපා තිබෙනවා වාගේම, ඊට අමතරව ප්‍රධානම වශයෙන් බලපා තිබෙන්නේ පරිසර විනාශයයි. වනජීවීන් දඩයම් කරන දඩයක්කරුවන්ගේ ආර්ථිකය ශක්තිමත් කරගන්න භාවිත කරන වියළි කලාපීය ප්‍රදේශ බොහොමයක් අපට දකින්න ලැබෙනවා. ඒ නිසා අපේ ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මෙම යෝජනාව කාලීන වටිනාකමකින් යුත් යෝජනාවක් බව මා සඳහන් කරන්න කැමැතියි.

එතුමාගේ යෝජනාව තුළ සඳහන් කර තිබෙනවා, සුදුසුකම්ලත් නව නිලධාරීන් බඳවා ගැනීම පිළිබඳව. අපි දන්නවා, පසුගිය දවස්වල සිවිල් ආරක්ෂක බලකායේ නිටපු 5,000කට ආසන්න පිරිසක් පරිසර අමාත්‍යාංශයට බඳවාගෙන, ඔවුන් පුහුණු කරලා, එක් එක් ප්‍රදේශවලට මුදා හැරපු බව. නමුත්, වියළි කලාපවල ජීවත් වන අපට තවම දැනුණේ නැහැ, ඒ අයගේ කාර්යභාරය හරියාකරව කරනවාද කියන එක.

අද ලෝකය තුළ නූතන තාක්ෂණික උපකරණ ඕනෑ තරම් පාවිච්චි කරනවා. ඒ අතර ඩ්‍රෝන යානාත් තිබෙනවා. පැරණි සාම්ප්‍රදායික සමාජය තුළ මී මැසි පාලනයත් මෙම ගැටුම පාලනයට පාවිච්චි කළා. අපිට එය උදාහරණයක් හැටියට ගන්න පුළුවන්. ඒ කියන්නේ, නවීන තාක්ෂණික ක්‍රමවේද භාවිත කර මී

මැස්සාගේ හඬ ඇසෙන විධියේ ඩ්‍රෝන යානා සකස් කර අලි-මිනිස් ගැටුම් තිබෙන කලාප තුළ එම යානා පියාසර කරවීමෙන් අලින් පලවා හැරීම සඳහා කටයුතු කරන්න පුළුවන්. ඒ වාගේම මම සඳහන් කරන්න කැමැතියි, අවශ්‍ය කරන භෞතික සම්පත් කොතෙක් දුන්නත්, නිලධාරීන් විසින් ඒවා නිසි කළමනාකරණයකට යටත්කොට භාවිත කළේ නැත්නම් අපි කොච්චර සම්පත් සැපයුවත් ඒ කාර්යභාරය ඉටු කරගන්න බැරි වන බව. මට හිතෙන විධියට අද ඒ අර්බුදය තිබෙනවා.

පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, අපි මහජන දිනවලට සහභාගි වන හැම අවස්ථාවකම ඉතා බරපතළ විධියට අලි මිනිස් ගැටුම් පිළිබඳව වාර්තා වන බව. මැදිරිගිරිය, මීගස්වැව, තඹාල, සුංගාවිල, වැලිකන්ද, දිඹුලාගල, ඇලහැර ආදී ප්‍රදේශවල රාත්‍රී කාලයේ සමහර විට අ 10ට පෙරත්, එහෙම නැත්නම් දවසේ ඕනෑම වෙලාවක එවැනි ගැටුම් සිදු වෙනවා. ඒ ප්‍රදේශවාසීන් මේ ප්‍රශ්නය පිළිබඳව හැම මොහොතකම අපව දැනුවත් කරනවා. එම නිසා, නූතන තාක්ෂණය පාවිච්චි කරමින් මෙම ගැටලුව අවම කිරීම සඳහා කටයුතු කරනවා නම් හොඳයි කියන කාරණය මම නැවතත් මතක් කරමින්, මෙම යෝජනාව නැවතත් ස්ථිර කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

[ප.ව. 5.42]

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(මාණ්පුමිකු තුරෛරාසා රවිකරන්)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வனங்களையும் வன விலங்குகளையும் பாதுகாப்பதற்காக முன்வைக்கப்பட்டுள்ள இந்தப் பிரேரணை வரவேற்புக்குரியது. தகுதியான அலுவலர்கள், நவீன தொழில்நுட்பங்கள், வாகனங்கள் ஆகியவற்றை வழங்குவது அவசியம். அதேவேளை, இவற்றின் பயன்கள் வன்னி மக்களையும் சென்றடைய வேண்டும் என்பதே எமது கோரிக்கை. காட்டு யானைகளின் தாக்குதல்களால் முல்லைத்தீவிலும் மனித உயிர்கள் பறிபோகின்றன. உயிரிழப்புகளுக்கும் சொத்துச் சேதங்களுக்கும் ஓரளவு இழப்பீடுகள் வழங்கப்பட்டாலும், தென்னை உள்ளிட்ட பயிர்களுக்கான இழப்பீடுகளைப் பெறுவதில் முல்லைத்தீவு மக்கள் சிரமங்களை எதிர்கொள்கின்றனர். இவற்றுக்குத் தாமதமற்ற தீர்வு வேண்டும். அமைக்கப்பட்ட வேலியின் நீளத்தைவிட, குறைக்கப்பட்ட உயிரிழப்புகளும் சேதங்களுமே நடவடிக்கையின் வெற்றியை வெளிப்படுத்தும். முல்லைத்தீவு அடங்கலான தமிழர் தேசத்தில் வனப் பாதுகாப்புத் திணைக்களம் மற்றும் வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களமும் தமக்குரிய கடமைகளை ஆற்றுவதற்கு அப்பாற்பட்டு கட்டமைக்கப்பட்ட தமிழ் இன அழிப்பின் கருவிகளாகவே அரசால் வழிப்படுத்தப்படுகின்றன.

யானை - மனித மோதலைக் கட்டுப்படுத்த காட்டு யானைகளுக்கு, அவைகளின் வாழிடங்களிலேயே நீர், உணவு கிடைப்பது உறுதிப்படுத்தப்பட வேண்டும். வன்னியில் மட்டும் 457 குளங்கள் புனரமைக்கப்படாதுள்ளன. இவ்வாறான குளங்களைப் புனரமைப்பதற்கு பெரும் முட்டுக்கட்டையாக இருப்பது இவ்விரு திணைக்களங்களுமே! துணுக்காயில் கழிவு முகாமைத்துவத்துக்கும் கரைதுறைபற்றில் மருத்துவமனைக் கழிவுகளை எரியூட்டுவதற்கும் ஒட்டுசுட்டானில் கைத்தொழில் பூங்கா அமைப்பதற்கும் தடைகளை முன்வைக்கும் இத்திணைக்களங்கள், முறிகண்டி பிள்ளையார் கோவிலுக்கு எதிரேயுள்ள அடர் வனப்பகுதியில் இராணுவக் குடியிருப்பு களுக்காக மேற்கொள்ளப்பட்ட காடழிப்பை எவ்வாறு அனுமதித்தன? பொதுமக்களுக்கும் மக்களின் அபிவிருத்திக்கும் 108 சட்டங்களை முன்னிறுத்தும் இத்திணைக்களங்கள் படையினரிடத்தே ஏன் அச்சட்டங்களை முன்னிறுத்தவில்லை? கூகுள் வரைபடமே காட்டிக்கொடுக்கும் இக்காடழிப்பை, இலங்கை அரசு எவ்வாறு கைவிட்டது? எல்லோருக்கும் ஒரே சட்டம் என்றால், உங்கள் ஆட்சியிலும் படையினருக்கு விதிவிலக்கா எனக் கேட்டு, விடை பெறுகின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.45]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 159ක් ඉන්න මේ ලොකු කණ්ඩායමට අපට විනාඩි 2කින් උපදෙස් දෙන්න බැහැ. ඒ නිසා මා දන්නා දෙයක් කියන්නම්.

මේක හොඳ Ordinance එකක්, මම support කරනවා. හැබැයි, පොඩ්ඩක් study කරලා බලන්න, USAවල hunting season කියලා එකක් තිබෙනවා. පොඩ්ඩක් හොයලා බලන්න, ඌරා තමයි අපේ රටේ වගාවන්ගෙන් සියයට 40කට පමණ හානි කරන්නේ. අපි ඌරා පිළිබඳව සලකා බලමු. Fauna and Flora Protection Ordinance එක ගැන මම ඇති වෙන්න ඉගෙන ගෙන තිබෙනවා. ඒකේ තිබෙනවා, ඌරා දඩයම් කරන්න පුළුවන් වුණත්, හාවා වැනි සතුන් දඩයම් කරන්න බැහැ කියලා. හැබැයි, hunting season කියන එක හදුන්වා දුන්නොත්, ඌරෝ ටික මරා දමන්න පුළුවන්. වගාවන්ට බරපතළ හානි කරන සතෙක් නිසා ඌරා කියන්නේ ලොකු ප්‍රශ්නයක්,

අපි "කාවන්තිස්ස" කියනවා, නැත්නම් "අග්බෝ" කියනවා. කොළඹ ඉන්න මිනිසුන්ට "කාවන්තිස්ස" හෝ "අග්බෝ" කියන්නේ, වටිනා අලි ඇතුන්. ඒ වුණාට ගම්වල මිනිස්සුන්ට ඒ සතුන් "යක්කු" වගේ. ඒක මතක තියාගන්න.

අපේ ගම්වල මිනිස්සුන්ගේ වගාවන් ආරක්ෂා කරනවා නම්, ඇත්තටම අපි කරන්න ඕනෑ මොකක්ද? ඌරා නැති කර දමන්න ඕනෑ. "ඌරා" කිව්වාම සමහරු බය වෙනවා. නමුත් මම කියන්නේ, කැලේ සිටින ඌරෝ ටික නැති කරලා දමන්න ඕනෑ නිසා ඒ සඳහා මොකක් හෝ ක්‍රමයක් ගේන්න කියලායි. ඌරන් දඩයම් කරන්න පුළුවන් වන විධියට Fauna and Flora Protection Ordinance එක සංශෝධනය කරන්න. ඒ වාගේම ඒ දඩයම් කරන මස් ටික විකුණන්න පුළුවන් ක්‍රමයක් සකස් කරන්න. ඌරෝ නැති කළා කියලා කිසිදු ආගමික ප්‍රශ්නයක් හෝ මොකුත් වෙන්නේ නැහැ.

මම පේරාදෙණිය රෝහලේ හිටපු කාලයේ ඌරෙක් OPD එකට ඇවිල්ලා හිටියා. අපි ඒ ඌරාව මැරුවා. ඒ සිදුවීම මට

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

මතකයි. සාමාන්‍යයෙන් ඌරන්, peacock වාගේ සතුන් තමයි වගාවලට වැඩියෙන් හානි කරන්නේ. මම දන්නේ නැහැ, peacockට කියන සිංහල වචනය. *[බාධා කිරීමක්]* මොනරා නේද? ඒ සතුන් විශාල ප්‍රමාණයක් එකපාරටම වගා භූමියට ඇතුළු වුණොත් ඉවරයි. එහෙම වුණොත්, ඒ වගා භූමියේ නැවත මොකුත්ම වගා කරන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) ඉරාමනාතන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තව තත්පර 20ක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම අලි ඇතුන් සම්බන්ධයෙන් කථා කරන්න කැමැති නැහැ. අපි "කාවන්තිස්ස" සහ "අග්බෝ" කිව්වාට, ගමේ ඉන්න මිනිස්සුන්ට ඒ සතුන් යක්කු වාගේයි. ඒක මම පිළිගන්නවා. මම පොළොන්නරුවටත් ගිහිල්ලා තිබෙනවා, අනුරාධපුරයටත් ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා මේ ගැන පොඩ්ඩක් කල්පනා කරලා බලන්න. ඔයගොල්ලන්ට උපදෙස් දෙන්න අපට බැහැ නේ. හැබැයි, hunting season ක්‍රමවේදය හඳුන්වා දීම සහ මම කලින් සඳහන් කළ Fauna and Flora Protection Ordinance එක සංශෝධනය කිරීම ගැන පොඩ්ඩක් හිතලා බලන්න. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

[ප.ප. 5.42]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) පත්මනාතන් සත්තියලිංගම්)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
නන්දි, කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ! වනවළත් තුරෛ සම්පන්තමාකක් කොණ්ඩුවරප්පට්ට ඔත්තිවෛප්පුවේළෛප් පිරේරණෛ මීතාන විවාතත්තිල් උරෛයාට්රුවතිල් මකිළ්ච්චියතෛකිරේන්. එංකළුතෛය පිරතේසත්තිලේ ඉරුක්කින්ර වනංකළ් මික මෝසමාක අළික්කප්පට්ටු වරුවතාකච් චොල්ලප්පටුකින්රතු. අතේනේරත්තිල්, මක්කළුතෛය කාණිකළුක්කුළ් එල්ලෛක් කට්කළ් ඉට්ටු, අවෛයුම් වනමාක්කප්පටුකින්රන. ඉප්පෝතු එනක්කු මුන්නර් පේසිය කෞරව උරුප්පිනර් කුරිප්පිට්ටතුපෝල, තිට්ටමිටප්පටාත නීණ්ටකාලත් තිට්ටමෝ එතිර්කාලච් චින්තනෛයෝ ඉල්ලාමල් මුන්නෛය අරසාංකත්තාල් තිට්ටංකළ් කොණ්ඩුවරප්පට්ටිරුක්කින්රන. අවට්රිල් මිකවුම් මුක්කියමාන තිට්ටම්තාන් එංකළුතෛය පිරතේසත්තිල් මුන්නෙටුක්කප්පටුකින්ර "කිවුල් ඔයා නීර්ප්පාසනත් තිට්ටම්" ආකුම්. ඉත්තිට්ටත්තිනූටාක කිට්ටත්තට්ට 13,000 ඒක්කර් වනප්පකුති අළික්කප්පට ඉරුක්කිරතු. ඒර්කනවේ, වවුනියා වටක්කුප් පිරතේසමානතු යානෛ - මනිත මෝතල් - human-animal conflict - මිකවුම් මෝසමාක ඉටම්පෙරුකින්ර ඕර් ඉටමාකුම්. අන්තප් පිරතේසත්තිල් මේලුම් 13,000 ඒක්කර් කාට්ටෛ අළිත්තුවිට්ටාල්, ඉන්තප් පිරච්චිනෛ මිකවුම් තීවිරමාකිවිටුම්. ඉප්පෝතු ඌර් මක්කළ් එනක්කු call පණ්ණි ඔරු විටයත්තෛච් චොන්නාර්කළ්. නාන් චොල්කින්ර වවුනියා වටක්කුප් පිරතේසත්තිල් ඔරු මණිත්තියාලත්තුක්කු මුන්නර්, 45 වයතුටෛය ඔරු විවසායි තන්නුටෛය වයලුක්කු පෝය්ක්කොණ්ටිරුන්ත නේරත්තිල් යානෛ තාක්කි චෙත්තිරුක්කින්රාර් එන්ර චෙය්තියෛ අවර්කළ් චොන්නාර්කළ්.

ඉව්වාරාන සූළ්නිලෛයිල්, වනසීවරාසිකළ් පාතුකාප්පුත් තිණෛක්කළත්තින් පුතිය අලුවලකත්තෛ වවුනියා වටක්කිල් අමෛප්පතු තොටර්පාක කෞරව අමෛච්චර් අවර්කළ් පරින්තුරෛත්තිරුන්ත නිලෛයිල්, ඉන්ත අලුවලකත්තෛ නයිනාමටු එන්ර ඉටත්තිල් ආරම්පිප්පතර්කාන ඒර්පාටුකළ් චෙය්යප්පට්ටතාක අන්ත ඌර් මක්කළ් චොල්කිරාර්කළ්. නයිනාමටුවුක්කු පක්කත්තිල් ඉරුක්කින්ර කුළවිච්චට්ටාන් එන්ර ඉටත්තිල්, චිල නාට්කළුක්කු මුන්නර් ඔරුවර් යානෛ අටිත්තු චෙත්තිරුක්කින්රාර්. අප්පටියාන පිරච්චිනෛකළ් ඉරුක්කින්ර නිලෛයිල්, අන්තත් තිණෛක්කළත්තින් පුතිය අලුවලකත්තෛ මිකවුම් කුරෛන්ත තොකෛයිලාන මක්කළ් වාළ්කින්ර පෝකස්වෙව එන්ර ඉටත්තුක්කු මාර්රුවතර්කුරිය ඒර්පාටුකළ් චෙය්යප්පට්ටු වරුවතාක ඌර් මක්කළ් තෙරිවිත්තිරුක්කිරාර්කළ්. කෞරව අමෛච්චර් අවර්කළේ! නීංකළ් ඉන්ත විටයත්තෛ තයවුචෙය්තු කවනත්තිල් කොළ්ළ වේණ්ටුම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) පත්මනාතන් සත්තියලිංගම්)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
මට තව පොඩි වේලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

වවුනියා නගරත්තිල් කුරංකුකළින් තොල්ලෛයුම් අතිකරිත්තු වරුකින්රතු. අණ්මෛයිල් එන්නිටම් මරුන්තු එටුක්ක වන්ත නෝයාළි ඔරුවර්, තනක්කු tensionආක ඉරුප්පතාකත් තෙරිවිත්තාර්. කාරණත්තෛක් කේට්ටපෝතු, වීට්ටිල් චමෛත්ත උණවෛක්කූට පාතුකාප්පාක වෛක්ක මුටියවිල්ලෛ එන්රුම් refrigeratorඉර්කුළ් පොරුට්කළෛ වෛක්ක මුටියවිල්ලෛ එන්රුම් කුරංකුකළ් අතනෛත් තිරන්තු එල්ලාවර්රෛයුම් එටුත්තුච් චාප්පිට්ටු විට්ටුප් පෝකින්රන එන්රුම් චොන්නාර්. කෞරව අමෛච්චර් අවර්කළේ! කුරංකුකළින් අට්ටකාචත්තෛ ඉල්ලාමල් පණ්ණුවතර්කු විඥ්ඤාන රීතියාක ඒතාවතු තොළිල්නුට්පම් ඉරුක්කින්රතා එන්පතෛ ආරාය්න්තු, නටවටික්කෛ එටුක්ක වේණ්ටුමෙන්රු කේට්ටු විටෛ පෙරුකින්රේන්. නන්දි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 2ක කාලයක් ලැබෙනවා.

[ප.ප. 5.50]

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(මාණ්පුමිකු සිවඥානම් ශ්‍රීදරන්)
(The Hon. Sivagnanam Shritharan)
කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, ඉන්රෛය තිනම් ඉන්තච් චපෛයිල් වනසීවරාසිකළ්, වනවළප් පාතුකාප්පු තොටර්පාන ඔත්තිවෛප්පුප් පිරේරණෛ මීතාන විවාතම් නටෛපෙරුකින්රතු.

மிக முக்கியமாக, கிளிநொச்சி மாவட்டத்தில் ஆனையிறவுக்குப் பக்கத்தில் இருக்கின்ற தட்டுவன்கொட்டி கிராமத்தில் 15 பேருக்கு வீடுகள் வழங்கப்பட்டு இருந்தன. அந்த வீடுகள் வனசீவராசிகளுக்கோ, வனவளத் திணைக்களத்துக்கோ பிரச்சினை இல்லாத, மக்கள் புழங்குகின்ற போக்குவரத்துப் பாதைக்கு அருகிலே வழங்கப்பட்டு இருந்தன. உங்களுடைய இராணுவத் தளபதிகள், அரச அதிகாரிகள், அமைச்சர்களின் பிரதிநிதிகள் சென்றுதான் அந்த வீடுகளை வழங்கியிருந்தார்கள். ஆனால், அவை திடீரென வனசீவராசிகள் திணைக்களத்துக்கு ஒதுக்கப்பட்டன. அங்கு வனசீவராசிகளுக்குப் பிரச்சினை இருக்கிறதென இதற்குக் காரணம் கூறப்பட்டு இருக்கிறது. அந்த மக்கள் நீண்டகாலமாக யுத்தத்தால் பாதிக்கப்பட்டவர் கள்; 40 வருடங்களுக்கும் மேலாக அவர்களுக்கு வீடுகள் வழங்கப்படாமல் இருந்தன. இதனைக் கருத்திற்கொண்டு அவர்களுக்கு வழங்கப்பட்ட வீடுகளில் அவர்கள் குடியிருப்பதற்கான வசதியை ஏற்படுத்திக் கொடுக்க வேண்டும்.

எனக்கு முன்னர் பேசிய கௌரவ (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம் அவர்கள் சொன்னதுபோல, வடக்கு, கிழக்கில் குரங்குகளின் பிரச்சினை அதிகமாக இருக்கின்றது. அதற்கான தீர்வு இதுவரை எட்டப்படவில்லை. குரங்குகளின் பிரச்சினையால் அங்குள்ள மக்களால் எந்தவொரு விவசாய உற்பத்தியையும் செய்ய முடியவில்லை. வாழை, முருங்கை போன்றவற்றைக்கூட உற்பத்தி செய்ய முடியாத அளவுக்கு அங்குள்ள மக்கள் குரங்குகளால் பாரிய தொல்லைகளைச் சந்திக்கிறார்கள். யாழ்ப்பாணத்தின் சாவகச்சேரியிலிருந்து வடமராட்சி கிழக்கு ஊடாக வவுனியா வரைக்குமான பெரும் பகுதியிலுள்ள மக்கள் இவ்வாறு குரங்குகளின் தொல்லைகளால் பாதிக்கப்படுகின்றார்கள். ஆகவே, குரங்குகளின் தொல்லையைக் கட்டுப்படுத்த நவீன முறை கண்டுபிடிக்கப்பட வேண்டும். விவசாயிகளுக்குப் பாதிப்பு இல்லாத வகையில், விலங்குகள் சட்டத்துக்கு ஏற்ற வகையில் விஞ்ஞான ரீதியான முறையைக் கையாண்டு இதற்கான தீர்வைக் காண்பதற்கான முயற்சிகளை நீங்கள் எடுக்க வேண்டுமென நாங்கள் வலியுறுத்துகிறோம்.

மிக முக்கியமாக, வனசீவராசிகள் மற்றும் வன இலாகாவின் சட்டங்கள் மக்களைப் பாதிப்பதாக இருக்கக் கூடாது; ஒருசாராருக்கு மட்டுமாக இருக்கக்கூடாது. குறிப்பாக, வவுனியா - செட்டிகுளம் பகுதியில் முன்னெடுக்கப்படுகின்ற கீழ்மல்வத்து ஓயா திட்டத்துக்காக 2,000 ஏக்கருக்கும் மேற்பட்ட காடுகளை உடனே விடுவித்து, அங்கு அநுராதபுரத்தைச் சேர்ந்தவர்களைக் குடியேற்றுவதற்கான முயற்சிகள் நடைபெறுகின்றன. அதேநேரம், கிளிநொச்சி மாவட்டத்தில் முக்கொம்பன், அறிவியல் நகர் பகுதிகளில் மக்கள் குடியிருப்புக் காணிகளை விடுவிப்பதற்கு வன இலாகா தடை விதிக்கிறது. எனவே, இவற்றுக்கான சரியான முறையை எல்லோருக்கும் ஏற்ற விதத்தில் சட்டத்தின் அடிப்படையில் சமமாக கடைப்பிடிக்குமாறு கேட்டு, விடைபெறுகின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 2ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.52]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கொண்டுவரப்பட்டுள்ள வனத்தைப் பாதுகாத்தல் மற்றும் வனசீவராசிகளைப் பாதுகாத்தல் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணையை நான் வரவேற்கின்றேன். மயிலத்தமடு - மாதவனை போன்ற இடங்களில் புற்றரைகளும் காணப்படுகின்றன; வனங்களும் காணப்படுகின்றன. அவைகூட அண்மையில் சட்டவிரோத மாகக் குடியேறியவர்களால் தீயிட்டுக் கொளுத்தப்பட்டு அழிக்கப்பட்டு இருக்கின்றன. இதனால் அந்தப் பகுதிகளில் வாழ்கின்ற காட்டு யானைகள் ஊர்களுக்குள்ளும் நகரங்களுக்குள்ளும் செல்லக்கூடிய நிலைமை ஏற்பட்டு இருக்கின்றது. தம்பானம்வெளி என்ற இடத்தில் வல்லிபுரம் கணேஸ் என்பவர் யானையால் தாக்கப்பட்டு கொல்லப்பட்டு இருக்கிறார்.

அண்மையில்கூட, காடுகளை அல்லது புற்றரைகளை அழிப்பதற்கு எதிராக மட்டக்களப்பு கச்சேரிக்கு முன்பாகப் பாரிய ஆர்ப்பாட்டமொன்று நடாத்தப்பட்டது. GAஐச் சந்தித்து, இவ்வாறான செயற்பாடுகளைத் தடுத்து, கால்நடைகளுக்கான மேய்ச்சல் தரையையும் காடுகளைப் பாதுகாப்பதற்குமான நடவடிக்கைகளை எடுக்க முற்பட்டபோதுதான் அங்கு குழப்பகரமான நிலை ஏற்பட்டது. குறித்த வனப் பகுதியில் சட்டவிரோதமாகக் குடியேறியவர்களை நாங்கள் நல்லாட்சிக் காலத்தில் வெளியேற்றியிருந்தோம் என்பதை தம்பி பிரபு அவர்கள் அறியவில்லை என நினைக்கின்றேன். நாங்கள் நீதிமன்றத் தீர்ப்பைப் பெற்று, சட்டவிரோதமாக அந்த இடத்தில் குடியேறி காடுகளை அழித்தவர்களை வெளியேற்றி யிருந்தோம். ஆரம்பக்கூட்டத் தீர்மானத்தின் பிரகாரம், கால்நடைகள் பராமரிக்கப்படுகின்ற புற்றரையாகத்தான் அவ்விடம் காணப்பட்டது. அந்த இடத்தில் காட்டு யானைகளும்கூட வாழக்கூடிய ஒரு சூழ்நிலை காணப்பட்டது. இப்போது அவை அழிக்கப்படுவதால் நகருக்குள்ளும் ஊர்களுக்குள்ளும் செல்கின்ற நிலை காணப்படுகின்றது. இதனால்தான் எமது பண்ணையாளர்களும் சிவில் சமூகத்தினரும் ஓர் ஆர்ப்பாட்டத்தை மேற்கொண்டு, இவற்றைத் தடுக்குமாறு கோரினார்கள்.

அதனை தம்பி பிரபு அவர்கள் விளங்கிக்கொள்ளாமல் அரசியல் நாடகமாகக் காட்ட விரும்புகின்றார். நிச்சயமாக அது அரசியல் நாடகமல்ல. பண்ணையாளர்களின் வாழ்வாதாரத் தையும் காடுகளையும் புற்றரைகளையும் பாதுகாப்பதற்கான செயற்பாடுகள்தான் எடுக்கப்பட்டதே ஒழிய, அதில் எந்தவிதமான அரசியல் நாடகமும் இல்லை. உண்மையில் அரசாங்க அதிபர் அந்த இடத்தில் எங்களுக்கு ஒத்துழைக்கவில்லை. அது சம்பந்தமாக நாங்கள் கௌரவ சபாநாயகரிடம் கடிதமொன்றைக் கையளித்து இருக்கிறோம். எங்களுடைய விடயத்தில் protocol அல்லது அரசியல் சிறப்புரிமை பேணப்படவில்லை. அங்கு அரசியல் நாடகம் நடக்கவில்லை. மாறாக, இயற்கை வளத்தைப் பாதுகாப்பதற் கான செயற்பாடே நடைபெற்றது என்பதை தம்பி பிரபு அவர்கள் விளங்கிக்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[පි.ප. 5.55]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற வனவளம் மற்றும் வனசீவராசிகள் சம்பந்தமான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

විසේඩමාක, අම්පාරෙ මාවට්ටත්තින් තිරුක්කෝවිලුන්ල වට්ටමඩු පිරතේසත්තිල් 1956ආම් ආණ්ඩිල් ඉරුන්තු පණ්ණෙයාළර්කළ් තංකළතු මාටුකළෙ මේය්ත්තු වන්තාර්කළ්. ඉතු තොටර්පාන gazetteකූට වෙළියිටප්පට්ටු ඉරුන්තතු. අප්පෝතු, අවසරකාලච් චට්ටම් නටෙමුරෙයිල් ඉරුන්තතු. අවසරකාලච් චට්ටත්තින්කීළ් වෙළියිටප්පට්ට වර්ත්තමානි අරිවිත්තල් එන්රපටියාල් අතු නීක්කප්පට්ටතු. ඉප්පොළුතු Forest Departmentඉන් අතිකාරිකළ් අන්තප් පිරතේසත්තිල් පණ්ණෙයාළර්කළ් මාටුකළෙ මේය්ක්ක මුටියාතු එන්රුකූරි, අංකුළ්ළ මාටුකළෙත් තුරත්තුකින්ර නිලෙ කාණප්පටුකින්රතු. 1,000ක්කුම් මේර්පට්ට පණ්ණෙයාළර්කළින් වාළ්වාතාරම් අතිල් තංකියිරුක්කිරතු. ඉන්රු අන්තප් පණ්ණෙයාළර්කළ් වීතිකළිල් ඉරංකි, තංකළතු වාළ්වාතාරත්තුක්කුප් පෝරාට වේණ්ටිය ඔරු තුර්ප්පාක්කිය නිලෙක්කුත් තළ්ළප්පට්ටු ඉරුක්කිරාර්කළ්. Forest Departmentඉන් අතිකාරිකළ්, 30-40 වරුටංකළාක මාටුකළෙ මේය්ත්තු වන්ත අන්ත ඉටත්තිලිරුන්තු මාටුකළෙත් තුරත්තිවිට්ටු, විවසායිකළුක්කු විවසායම් චෙය්වතර්කුක් කාණිකළෙක් කොටුක්කිරාර්කළ්. අවර්කළ් වට්ටමඩු පිරතේසත්තිලුළ්ළ මේය්චල් තරෙයෙ ඉල්ලාමල් චෙය්වතු මට්ටුමල්ලාමල්, අංකිරුක්කින්ර මරංකළ් මර්රුම් ඒනෙය පර්රෙකළෙයුම් වෙට්ටි වයල් චෙය්වතර්කු අනුමති කොටුත්තිරුක්කිරාර්කළ්. අතාවතු, අංකු පණ්ණෙයාළර්කළ් තුරත්තප්පටුකිරාර්කළ්; illegalආක විවසායම් චෙය්යප්පටු කින්රතු. ඉතනාල් අංකු මුරුකල් නිලෙ කාණප්පටුකින්රතු.

අන්තප් පිරතේසත්තිල් යානෙ - මනිත මෝතල් මිකවුම් කූටුතලාක ඉරුක්කින්රතු. කුරිප්පාක, යානෙකළින් අට්ටූළියම් කූටුතලාක ඉරුක්කින්රතු. අංකු විවසායත්තින් මූලම් කිටෙක්කින්ර විළෙච්චලෙ යානෙකළ් අළික්කින්ර තුර්ප්පාක්කිය නිලෙ කාණප්පටුකින්රතු. ආකවේ, අන්ත ඉටත්තිල් යානෙ වේලියෙ අමෙයුංකළ්! නීංකළ් ඉන්තච් චෙලවුකළෙච් චෙය්වතර්කු මුතල් අන්තප් පිරතේසත්තිල් යානෙ වේලියෙ අමෙත්තු අංකුළ්ළ විවසායිකළින් වාළ්වාතාරත්තුක්කු උතව වේණ්ටුමෙන ඉන්ත සපෙයිල් කෞරව අමෙච්චර් අවර්කළිටම් කේට්ටුක්කොළ්කින්රේන්.

නන්රි!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි අමාත්‍යතුමා. ඔබතුමාට පිළිතුරු කථාව සඳහා විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.58]

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව ඉතාම කාලීන සහ වැදගත් යෝජනාවක්. විශේෂයෙන්ම අපේ රටේ වන සංරක්ෂණය සහ වනජීවීන් සංරක්ෂණය සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු තුනක් එතුමා විසින් අවධාරණය කර තිබෙනවා. මේ සාකච්ඡාවේදී අපේ රටේ වනජීවී සහ වන සංරක්ෂණ ක්ෂේත්‍රයට අදාළව මතු වෙලා තිබෙන ගැටලු කිහිපයක් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු විසින් මතු කළා. විශේෂයෙන්ම කිලිනොච්චි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ඒ සමහර ගැටලුවලට සැලකිය යුතු මට්ටමේ විසඳුම් අපි ලබා දුන්නා. ඒ වාගේම අපට ලබා දිය හැකි මට්ටමේ විසඳුම් ප්‍රමාණයකුත් අපි ලබා දුන්නා. අනෙකුත් ගැටලු සම්බන්ධයෙනුත් අපි මැදිහත් වෙමින් ඉන්නවා.

විශේෂයෙන්ම අපේ රටේ පසුගිය පාලන කාලයන් තුළ තිබුණු වැරදි දේශපාලන සංස්කෘතිය විසින් වන සංරක්ෂණ සහ වනජීවී ක්ෂේත්‍රය නොසලකා හැරලා තමයි තිබුණේ. ඔවුන් මේ ක්ෂේත්‍රයට අවශ්‍ය කරන ව්‍යෘත්තීමයභාවය ලබා දීම සඳහා අවධානය යොමු කරලා තිබුණේ නැහැ. බොහෝ දේශපාලනඥයන් මේ ජාතික සම්පත්, විශේෂයෙන්ම ජාතික උද්‍යාන තමන්ගේ සුඛ විහරණය සඳහා තමන්ට අවශ්‍ය විධියට පාවිච්චි කළා මිසක් මේ ක්ෂේත්‍රයට නවීන තාක්ෂණය කැඳවන්න, මේ ක්ෂේත්‍රයේ ව්‍යෘත්තීමයභාවය ඇති කරන්න මැදිහත් වෙලා තිබුණේ නැහැ. නමුත්, අපේ රජය තේරී පත් වුණාට පස්සේ අපි මේ ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු හඳුනාගෙන, ඒ වෙනුවෙන් විශේෂ මැදිහත්වීම් ප්‍රමාණයක් සිදු කරලා තිබෙනවා. මේ ක්ෂේත්‍රයට පසුගිය කාලය මුළුල්ලේම අවශ්‍ය කරන බඳවා ගැනීම් සිදු කරලා තිබුණේ නැහැ. ඒ වාගේම, මේ ක්ෂේත්‍රයේ කටයුතු කරන නිලධාරීන් සඳහා අවශ්‍ය කරන පුහුණු වැඩසටහන්, විශේෂයෙන්ම ජාතික වශයෙන් සහ ජාත්‍යන්තර වශයෙන් ලබා දිය හැකි අවස්ථා ලබා දීමට කටයුතු කළේ නැහැ. එවැනි ආකාරයට සීමිත පිරිසක් අතරේ තමයි ඒ පුහුණු සහ චාරිකා වෙන් වෙලා තිබුණේ. නමුත් අපි මේ අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ මේ සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමින් ඉන්නවා.

විශේෂයෙන්ම අපි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත්, පොදුවේ පරිසර අමාත්‍යාංශය යටතේ තිබෙන සියලු ආයතන සඳහාත් ඒ බඳවා ගැනීම් අනුමත කරගෙන තිබෙනවා. මීට සති දෙකකට කලින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට නිලධාරීන් 229දෙනෙකු අපි බඳවා ගත්තා. ඒ වාගේම, තවත් නිලධාරීන් 89දෙනෙකු බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන නිලධාරීන් 155දෙනෙකු බඳවා ගැනීම සඳහා අපි අවසර අරගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් අවශ්‍ය කරන කටයුතු මේ වෙනකොටත් සිදු වෙමින් තිබෙනවා. මෙන්න මේ ක්ෂේත්‍රයේ සිටින නිලධාරීන්ට අවශ්‍ය කරන ව්‍යෘත්තීමයභාවය ලබා දීම සඳහාත්, අවශ්‍ය පුහුණුව ලබා දීම සඳහාත් අපි මැදිහත් වෙමින් ඉන්නවා. විශේෂයෙන්ම පශු වෛද්‍යවරුන් විදේශ රටවලට යවා ඔවුන්ට පුහුණුව ලබා දෙන්නත් අවශ්‍ය කටයුතු කර තිබෙනවා.

ඒ වාගේම, අපි පසුගිය කාලයේ ඉන්දියාවත් එක්ක අත්සන් කරලා, International Big Cat Alliance කියන සන්ධානයට ඇතුළු වුණා. ඒ හරහාත් අපි බලාපොරොත්තු වෙනවා, අපේ රටට

ආවේණික කොටියා සහ දිවියා කියන සත්ත්වයින් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය කරන අලුත් දැනුම සහ තාක්ෂණය අරගෙන එන්න. ඒ වාගේම, ගරු මන්ත්‍රීතුමා මතු කරලා තිබුණු ආකාරයට මේ ක්ෂේත්‍රයට අලුත් පිරිස්, අලුත් දැනුම කැඳවන්න ඕනෑ. ඒ සඳහා අපි පරිසර අමාත්‍යාංශය ලෙස වැඩ පිළිවෙළක් සකස් කරමින් ඉන්නවා. පසුගිය ලෝක පරිසර සමුළුවේදී අපි යෝජනාවක් ඉදිරිපත් කළා, පරිසර ක්ෂේත්‍රය පිළිබඳ විශේෂ උනන්දුවක් තිබෙන තරුණ තරුණියන් පරිසර ක්ෂේත්‍රයේ වැඩ කටයුතු සඳහා සම්බන්ධ කර ගැනීමට ලෝක මට්ටමින් - ජගත් මට්ටමින් - අවශ්‍ය කරන වැඩ පිළිවෙළක් නැහැ, යන්ත්‍රණයක් නැහැ, ඒ සඳහා යන්ත්‍රණයක් සැකසිය යුතුයි කියලා. මේක ලෝක පරිසර සමුළුවේදී පිළිගෙන තිබෙනවා. තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය සමඟ එකතු වෙලා අපේ රටේ තරුණ තරුණියන් සහ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් පරිසර ක්ෂේත්‍රයට සම්බන්ධ කර ගන්න විධිමත් යන්ත්‍රණයක් සකස් කිරීමේ වැඩ පිළිවෙළකට අපි දැන් අනුගත වෙලා ඉන්නවා. ඒ වාගේම මේ ක්ෂේත්‍රයට තාක්ෂණය ගෙන ඒම සඳහාත් විශේෂ මැදිහත්වීමක් අපි සිදු කරමින් ඉන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි දන්නවා එක පැත්තකින් අපේ රටේ කෘෂි කර්මාන්තයේ අස්වැන්න වැඩි කර ගැනීම සම්බන්ධයෙන් වන කාරණයේදී අවධානය යොමු වෙන්නේ, වැඩි ඉඩම් ප්‍රමාණයක වගා කරලා අස්වැන්න වැඩි කර ගන්නයි. ඒක තමයි බලාපොරොත්තු වෙන්නේ. නමුත්, අපේ රජය යටතේ අපි දැන් ඒකක ඉඩම් ප්‍රමාණයකින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමේ දිශාවට කෘෂි කර්මාන්තය පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය කරන ආරම්භය අරගෙන තිබෙනවා. ඒ වාගේම අපි වන සංරක්ෂණ සහ වනජීවී සංරක්ෂණ ක්ෂේත්‍රයටත් ඒ තාක්ෂණය කැඳවීම සඳහා මැදිහත් වෙමින් ඉන්නවා.

විශේෂයෙන්ම අලින් දුම්රියෙහි ගැටීම නැවැත්වීම සඳහා මේ වනකොටත් අපි මේ තාක්ෂණය භාවිත කිරීම පිළිබඳ අත්හදා බලමින් ඉන්නවා. ඒ වාගේම අලි-මිනිස් ගැටුම විසඳීම සඳහා කෘත්‍රිම බුද්ධිය සහ ඊට අදාළ තාක්ෂණය ගෙන ඒම සඳහා අපි පසුගිය දා වීන තානාපති කාර්යාලයත් සමඟ විශේෂ සාකච්ඡාක් කළා, ඔවුන් සතුව තිබෙන තාක්ෂණය කොහොමද අපේ රටට සම්බන්ධ කර ගන්නේ කියන එක සම්බන්ධයෙන්.

ඒ වාගේම අපි ඉදිරියට සැලසුම් කර තිබෙනවා, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇත් අතුරු සෙවණක් ස්ථාපිත කරන්න. ඒ වාගේම අනුරාධපුර - පුත්තලම මාර්ගය ආශ්‍රිතව වනජීවී රෝහලක් ස්ථාපිත කරන්නත් අපි බලාපොරොත්තු වනවා. එහි වැඩ කටයුතු ලබන අවුරුද්දේ සිට ආරම්භ කරන්න අපි තීරණය කරලා තිබෙනවා. දැනටමත් මේ ක්ෂේත්‍රයේ මේ වන විනාශය වැළැක්වීම සඳහා අපි ත්‍රිවිධ හමුදාව සමඟ එකතු වෙලා "වන සුරැකුම" ඒකාබද්ධ මෙහෙයුම් ඒකකයක් - මධ්‍යස්ථානයක් - හදලා, ඒ "වන සුරැකුම" මධ්‍යස්ථානයේ කටයුතු අපි පවත්වාගෙන යනවා. ඊට අමතරව, පසුගියදා අපි අපේ රටේ අලි-ඇතුන් ආරක්ෂා කිරීම සඳහා "හස්ති සේනා" නමින් වන වැඩ පිළිවෙළ ත්‍රිවිධ හමුදාවත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් සම්බන්ධ කරගෙන ආරම්භ කළා. නමුත් අපි පිළිගන්නවා, තවදුරටත් මේ ක්ෂේත්‍රයට තාක්ෂණය, විද්‍යාව සහ අලුත් දැනුම කැඳවන්න ඕනෑ, අලුත් ක්‍රමවේද කැඳවන්න ඕනෑ කියලා. ඒ අනුව, අපි ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, භෞතික සම්පත් සංවර්ධනය සඳහාත් අපි පසුගිය අවුරුදු දෙක තුළ විශේෂ මැදිහත්වීමක් කළා. ඒ කියන්නේ, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන කැබ් රථ, මෝටර් සයිකල් වාගේම ට්‍රැක්ටර් ආදී භෞතික සම්පත් සම්පාදනය සඳහා. ඊට අමතරව, තවදුරටත් මේ ක්ෂේත්‍රයට අවශ්‍ය කරන භෞතික සම්පත් සම්පාදනය සඳහා මැදිහත් වෙමින් ඉන්නවා.

අවසාන වශයෙන්, මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් ගරු උපුල් කිත්සිරි මැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම සඳහා සියලුදෙනාගේම සහාය අපි බලාපොරොත්තු වනවා. ඒ වෙනුවෙන් ඔබ සියලුදෙනාගේ යෝජනා, අදහස් සහ සහභාගිත්වය ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොඑමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.05ට, 2026 නොවැම්බර් 05වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

අප්පොழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப.6.05க்கு, பாராளுமன்றம் 2026 நவம்பர் 05, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.05 p.m. until 9.30 a.m. on Thursday, 05th November, 2026.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 1වන ප්‍රශ්නයට - 2338/2026 - පිළිතුර දීමට අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මහතා මාසයක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 1ஆம் இலக்க வினாவுக்கு - 2338/2026 - விடையளிப்பதற்கு, நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார அவர்கள் ஒரு மாத கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. Harshana Nanayakkara, Minister of Justice and National Integration, has requested for one month's time to reply to Question No. 01 - 2338/2026 - raised by the Hon. Ajith P. Perera, appearing in today's Order Paper.

2026 වසර සඳහා විදේශ රැකියා ඉලක්ක: විස්තර
2026ஆம் ஆண்டுக்கான வெளிநாட்டு வேலைவாய்ப்பு இலக்குகள்: விபரம்
FOREIGN EMPLOYMENT TARGETS FOR 2026: DETAILS

2389/2026

2. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

(අ) (i) 2026 වර්ෂය සඳහා විදේශ රැකියා සඳහා යොමු කිරීමට ඉලක්කගත සංඛ්‍යාව කොපමණද;

(ii) 2026.01.01 දින සිට 2026.06.30 දිනට විදේශ රැකියා සඳහා යොමු කළ සංඛ්‍යාව කොපමණද;

(iii) ඉලක්කගත සංඛ්‍යාව සපුරා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මේ වනවිට තානාපතිවරයෙකු නොමැති ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ පුරප්පාඩුවී පවතින කාලසීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දූත මණ්ඩල ප්‍රධානීන් අතරින් ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් සහ බාහිරව පත් කර ඇති සංඛ්‍යාව කොපමණද; යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) 2025.01.01 දින සිට මේ දක්වා අමාත්‍යාංශය විසින් විදේශ සංචාර සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) සංචාරය කරන ලද රටවල්, දිනයන්, සංචාරයට සම්බන්ධවූ සංඛ්‍යාව සහ සංචාරවල අරමුණු කවරේද;

(iii) එම එක් එක් සංචාරය සඳහා ගුවන් ගමන්, නවාතැන් සහ දීමනා ඇතුළු මුළු වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අත්සන් කළ ගිවිසුම්, අවබෝධතා ගිවිසුම් සහ ලබාගත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද; යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

වෙළිනාට්ටලුවල්කළ්, වෙළිනාට්ටු වේලෙවාය්ප්පු මට්රුම් සුට්රුලා අමෙච්සරෛක් කේට්ට විනා:

(අ) (i) 2026ආම් ආණ්ටු වෙළිනාට්ටු වේලෙවාය්ප්පුකළුක්කාක අනුප්පුවතට්කු ඉලක්කාකක් කොළ්ළප්පට්ට එණ්ණික්කෛ යාතු එන්පතෛයුම්;

(ii) 2026.01.01ආන් තිකති මුතල් 2026.06.30ආන් තිකති වරෛ වෙළිනාට්ටු වේලෙවාය්ප්පුකළුක්කාක අනුප්පප්පට්ටුළ්ළවර්කළින් එණ්ණික්කෛ යාතු එන්පතෛයුම්;

(iii) ඉලක්කු එණ්ණික්කෛයෛ අටෛවතට්කාක මේට්කොළ්ළප්පටුම් නටවටික්කෛකළ් යාවෛ එන්පතෛයුම්;

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ආ) (i) තට්පෝතු තූතුවරොරුවර් ඉල්ලාත ඉලංකෛත් තූතරාණ්මෛක් කුළුක්කළුම්, වෙට්රිටම් නිලවුම් කාලප්පකුතියුම් වෙව්වේරාක යාතු එන්පතෛයුම්;

(ii) තූතරාණ්මෛක් කුළුක්කළින් පිරතානිකළුළ්, ඉලංකෛ වෙළිනාට්ටුච් චේවෛයෛච් චාර්න්තෝරින් එණ්ණික්කෛයුම්, වෙළියිලිරුන්තු නියමික්කප්පට්ටවර්කළින් එණ්ණික්කෛයුම් යාතු එන්පතෛයුම්;

අවර් කුරිප්පිටුවාරා?

(இ) (i) 2025.01.01ஆந் திகதி முதல் தற்போதுவரை அமைச்சினால் வெளிநாட்டு விஜயங்களுக்காகச் செலவிடப்பட்ட தொகை எவ்வளவு என்பதையும்;

(ii) வெளிநாட்டு விஜயம் மேற்கொண்ட நாடுகள், திகதிகள், பங்கேற்றவர்களின் எண்ணிக்கை மற்றும் அவ்விஜயங்களின் நோக்கங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு விஜயத்துக்குமான விமானப் போக்குவரத்து, தங்குமிடம் மற்றும் கொடுப்பனவுகள் உள்ளிட்ட மொத்தச் செலவு வெவ்வேறாக யாது என்பதையும்;

(iv) கையொப்பமிட்ட ஒப்பந்தங்கள், புரிந்துணர்வு ஒப்பந்தங்கள் மற்றும் பெற்றுக்கொண்ட நன்மைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House the -

(i) targeted number of persons to be directed for foreign employment for the year 2026;

(ii) number of persons directed for foreign employment from 01.01.2026 to 30.06.2026; and

(iii) measures that will be taken to achieve the targeted number?

(b) Will he state -

(i) Sri Lankan Diplomatic Missions which currently do not have an appointed Ambassador and the duration for which each such position remained vacant; and

(ii) out of the number of Heads of Missions, the number of officers belonging to the Sri Lanka Foreign Service and the number of persons appointed externally?

(c) Will he also state the -

(i) amount expended by the Ministry on foreign visits from 01.01.2025 to date;

(ii) countries visited, dates of visit, number of participants, and the objectives of the said visits;

(iii) total expenditure incurred for each such visit including airfare, accommodation, and allowances, separately; and

(iv) agreements and Memoranda of Understanding signed, and the benefits accrued, separately?

(d) If not, why?

ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

(අ) (i) 2026 වර්ෂයේ විදේශ රැකියා සඳහා යොමු කිරීමට ඉලක්කගත සංඛ්‍යාව 250,000කි.

(ii) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පරිගණක දත්ත පද්ධතියට අනුව 2026.01.01 දින සිට 2026.06.30 දින දක්වා විදේශ රැකියා සඳහා කාර්යාංශයේ ලියාපදිංචිය ලබාගෙන ඇති සංඛ්‍යාව 125,018කි.

(iii) 2026 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව දේශීය වශයෙන් සහ විදේශීය වශයෙන් රැකියා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීමට කටයුතු කිරීම මේ වන විට සිදු කරමින් පවතී.

ඉහත කී ඉලක්ක සපුරා ගැනීම පිණිස ජාතික මට්ටමෙන් සහ දිස්ත්‍රික් මට්ටමින් රැකියා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීමට කටයුතු සිදු කරනු ලැබේ. 2026 ක්‍රියාකාරී සැලැස්මට අනුව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අළෙවිකරණ අංශය විසින් ශ්‍රී ලංකාවේ පළාත් 09 කේන්ද්‍රකොට ගනිමින් මෙම ජාතික මට්ටමේ රැකියා ප්‍රවර්ධන වැඩසටහන් 09ක් පැවැත්වීමට සැලසුම් කර ඇති අතර මේ වන විට දකුණු, බස්නාහිර, සබරගමුව, ඌව, උතුරු මැද හා වයඹ යන පළාත් කේන්ද්‍ර කර ගනිමින් ජාතික මට්ටමේ රැකියා ප්‍රවර්ධන වැඩසටහන් 06ක් පවත්වා ඇත.

එසේම මේ වසර තුළ උතුරු, මධ්‍යම හා නැඟෙනහිර යන පළාත් කේන්ද්‍ර කර ගනිමින් ඉදිරි විදේශ රැකියා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීමට මේ වන විටත් කටයුතු සැලසුම් කර ඇත.

තවද අළෙවිකරණ අංශය මඟින් මුළු දිවයිනම ආවරණය වන පරිදි වෘත්තීය පුහුණු මාර්ගෝපදේශන වැඩසටහන් පවත්වනු ලැබේ. මේ වන විට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පළාත් කාර්යාල මඟින් එවැනි වැඩසටහන් 87ක් පවත්වා ඇති අතර ඉදිරියේදී ද තවත් වැඩසටහන් 123ක් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

එසේම 2026 වසර තුළ දකුණු කොරියාව සහ ජපානය යන රටවල විදේශ රැකියා ප්‍රවර්ධන වැඩසටහන් 02ක් පවත්වා ඇති අතර මෙම වසර තුළ තවත් එක් විදේශ රැකියා ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් සිටී.

මෙයට අමතරව විදේශ දූත මණ්ඩල සමඟ ශ්‍රී ලාංකික ප්‍රජාව සඳහා විදේශ රැකියා අවස්ථා ලබා ගැනීම හා ඔවුන්ගේ කුසලතා නංවාලීම පිළිබඳව සාකච්ඡා පවත්වා අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතී.

එසේම විදේශ රැකියා අවස්ථා සම්බන්ධයෙන් ජාත්‍යන්තර වෙළෙඳ පොළ සමීක්ෂණ සිදු කරමින් අදාළ රටේ ශ්‍රී ලංකා තානාපති කාර්යාල, මහ කොමසාරිස් කාර්යාල මඟින් තොරතුරු සත්‍යාපනය කර එම අවස්ථාවන් ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත ලබාදීමට කටයුතු කරනු ලැබේ.

(ආ) (i)

	දූත මණ්ඩලය/තනතුර	තනතුර	පුරප්පාඩු වූ දිනය	සටහන්
1	ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, කැනඩාව, ඔටාවා	මහ කොමසාරිස්	06.07.2025	නම් කර ඇත
2	ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, චීනය, බීජිං	තානාපති	01.05.2026	නම් කර ඇත
3	ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ජර්මනිය, බර්ලින්	තානාපති	16.03.2026	-
4	ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ජෝර්දානය, අම්මාන්	තානාපති	20.01.2026	නම් කර ඇත.
5	ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, කෙන්යාව, නයිරෝබි	මහ කොමසාරිස්	29.11.2024	නම් කර ඇත.
6	ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, සීෂෙල්ස්, වික්ටෝරියා	මහ කොමසාරිස්	01.12.2024	-
7	ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ඇමෙරිකා එක්සත් ජනපදය, වොෂින්ටන් DC	තානාපති	01.08.2026	-

(ii)
- ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් නිලධාරීන් සංඛ්‍යාව - 31
- බාහිරව පත් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව - 12

(ඇ) (i) විදේශ කටයුතු අංශය - රු. 68,270,493.00
විදේශ දූත මණ්ඩල - රු. 15,371,541.90
විදේශ රැකියා අංශය - රු. 1,894,425.48
සංචාරක අංශය - රු. 1,672,782.03

(ii) විදේශ කටයුතු අංශය - ඇමුණුම 01* (ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ඇමුණුම 01 බලන්න.)
විදේශ රැකියා අංශය - ඇමුණුම 02* මඟින් දක්වා ඇත.
සංචාරක අංශය - ඇමුණුම 03* (ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ඇමුණුම 03 බලන්න.)

(iii) විදේශ කටයුතු අංශය - ඇමුණුම 01* (ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ඇමුණුම 01 බලන්න.)
විදේශ රැකියා අංශය - ඇමුණුම 02* මඟින් දක්වා ඇත.
සංචාරක අංශය - ඇමුණුම 03* (ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ඇමුණුම 03 බලන්න.)

(iv) විදේශ කටයුතු අංශය - ඇමුණුම 04* (ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ඇමුණුම 03 බලන්න.)
විදේශ රැකියා අංශය - ඇමුණුම 05* මඟින් දක්වා ඇත.
සංචාරක අංශය - ඇමුණුම 06* මඟින් දක්වා ඇත.

(ඈ) අදාළ නොවේ.

** ප්‍රශ්නකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු විජිත හේරත් මහතා]

(අ) (i) 2026ஆம் ஆண்டில் வெளிநாட்டு வேலை வாய்ப்புக்களுக்காக அனுப்பி வைப்பதற்கு இலக்காகக் கொள்ளப்பட்டுள்ள எண்ணிக்கை 250,000 ஆகும்.

(ii) இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தின் கணினித் தரவு முறைமைக்கு அமைய 2026.01.01ஆம் திகதி முதல் 2026.06.30ஆம் திகதி வரை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தில் பதிவைப் பெற்றுக்கொண்டுள்ளவர்களின் எண்ணிக்கை 125,018 ஆகும்.

(iii) 2026ஆம் ஆண்டின் செயலாற்றுகைத் திட்டத்துக்கு அமைய உள்நாட்டு ரீதியில் வேலைவாய்ப்பு மேம்பாட்டு நிகழ்ச்சித்திட்டங்களை நடாத்துவதற்கு உரிய நடவடிக்கைகளை மேற்கொள்ளல் தற்போதாகும் போது மேற்கொள்ளப்பட்டு வருகின்றன.

மேலே குறிப்பிடப்பட்டு உள்ள இலக்குகளை அடைந்து கொள்வதற்காக தேசிய மட்டத்திலும் மாவட்ட மட்டத்திலும் வேலைவாய்ப்பு மேம்பாட்டு நிகழ்ச்சித்திட்டங்களை நடாத்துவதற்குரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்றன. 2026 செயலாற்றுகைத் திட்டத்திற்கு அமைய இலங்கை வெளிநாட்டு வேலை வாய்ப்புப் பணியகத்தின் விற்பனைப் பிரிவினால் இலங்கையின் 9 மாகாணங்களையும் மையமாகக் கொண்டு இந்தத் தேசிய மட்டத்திலான 9 வேலைவாய்ப்பு மேம்பாட்டு நிகழ்ச்சித்திட்டங்களை நடாத்துவதற்குத் திட்டமிடப்பட்டு உள்ளதுடன், தற்போதாகும் போது தென், மேல், சப்ரகமுவ, ஊவா, வடமத்திய மற்றும் வடமேல் ஆகிய மாகாணங்களை மையமாகக் கொண்டு 6 தேசிய மட்டத்திலான வேலைவாய்ப்பு மேம்பாட்டு நிகழ்ச்சித்திட்டங்களும் நடாத்தப்பட்டு உள்ளன.

அவ்வாறே இந்த ஆண்டுக்குள் வடக்கு, மத்திய மற்றும் கிழக்கு ஆகிய மாகாணங்களை மையமாகக்கொண்டு எதிர்வரும் வெளிநாட்டு வேலைவாய்ப்பு மேம்பாட்டு நிகழ்ச்சித் திட்டங்களை நடாத்துவதற்குத் தற்போதாகும் போது நடவடிக்கைகள் திட்டமிடப்பட்டு உள்ளன.

மேலும், விற்பனைப் பிரிவின் ஊடாக முழு இலங்கையும் தழுவப்படும் வகையில் தொழில்சார் பயிற்சி வழிகாட்டல் நிகழ்ச்சித் திட்டங்கள் நடாத்தப்படுகின்றன. தற்போதாகும் போது இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தின் மாகாண அலுவலகங்களின் ஊடாக அவ்வாறான 87 நிகழ்ச்சித்திட்டங்கள் நடாத்தப்பட்டு உள்ளதுடன், எதிர்வரும் காலத்திலும் மேலும் 123 நிகழ்ச்சித்திட்டங்களை நடாத்துவதற்கு உரிய நடவடிக்கைகள் எடுக்கப்பட்டு உள்ளன.

அவ்வாறே 2026ஆம் ஆண்டுக்குள் தென்கொரியா மற்றும் யப்பான் ஆகிய நாடுகளில் 2 வெளிநாட்டு வேலைவாய்ப்பு மேம்பாட்டு நிகழ்ச்சித்திட்டங்கள் நடாத்தப்பட்டு உள்ளதுடன், இந்த ஆண்டுக்குள் மேலும் ஒரு வெளிநாட்டு வேலைவாய்ப்பு மேம்பாட்டு நிகழ்ச்சித்திட்டத்தை நடாத்துவதற்கு உரிய நடவடிக்கைகள் ஆயத்தம் செய்யப்பட்டு வருகின்றன.

இதற்கு மேலதிகமாக வெளிநாட்டுத் தூதுக் குழுக்களுடன் இலங்கை மக்களுக்காக வெளிநாட்டு வேலைவாய்ப்புக்களைப் பெற்றுக்கொள்ளல் மற்றும் அவர்களுடைய திறன்களை விருத்தி செய்தல் என்பன தொடர்பான கலந்துரையாடல்களை நடாத்தித் தேவையான நடவடிக்கைகள் ஆயத்தம் செய்யப்பட்டு வருகின்றன.

அவ்வாறே வெளிநாட்டு வேலைவாய்ப்புகள் தொடர்பில் சர்வதேச சந்தை மதிப்பாய்வுகளை மேற்கொண்டு உரிய நாட்டில் இலங்கைத் தூதரகங்கள், உயர்ஸ்தானிகர் அலுவலகங்கள் என்பவற்றின் ஊடாக தகவல்களை உறுதிப்படுத்திக்கொண்டு மேற்படி வாய்ப்புகளை இலங்கை மக்களுக்குப் பெற்றுக்கொடுப்பதற்கு உரிய நடவடிக்கைகள் எடுக்கப்படும்.

(ஆ) (i)

	தூதரகம் / பணியகம்	பதவி	வெற்றிடம் ஏற்பட்ட திகதி	குறிப்புகள்
1	கனடாவின் ஒட்டாவாவில் அமைந்துள்ள இலங்கை உயர்ஸ்தானிகராலயம்	உயர்ஸ்தானிகர்	06.07.2025	நியமிக்கப்பட்டுள்ளார்
2	சீனாவின் பெய்ஜிங்கில் அமைந்துள்ள இலங்கைத் தூதரகம்	தூதுவர்	01.05.2026	நியமிக்கப்பட்டுள்ளார்
3	ஜேர்மனியின் பேர்லினில் அமைந்துள்ள இலங்கைத் தூதரகம்	தூதுவர்	16.03.2026	-
4	ஜோர்தானின் அம்மானில் அமைந்துள்ள இலங்கைத் தூதரகம்	தூதுவர்	20.01.2026	நியமிக்கப்பட்டுள்ளார்
5	கென்யாவின் நைரோபியில் அமைந்துள்ள இலங்கை உயர்ஸ்தானிகராலயம்	உயர்ஸ்தானிகர்	29.11.2024	நியமிக்கப்பட்டுள்ளார்
6	சீஷெல்ஸின் விக்டோரியாவில் அமைந்துள்ள இலங்கை உயர்ஸ்தானிகராலயம்	உயர்ஸ்தானிகர்	01.12.2024	-
7	ஐக்கிய அமெரிக்காவின் வாஷிங்டன் டி.சி.யில் அமைந்துள்ள இலங்கைத் தூதரகம்	தூதுவர்	01.08.2026	-

(ii) • இலங்கை வெளிநாட்டுச் சேவையைச் சேர்ந்த அதிகாரிகளின் எண்ணிக்கை - 31

• வெளியிலிருந்து நியமிக்கப்பட்ட பணியாளர்களின் எண்ணிக்கை -12

(இ) (i) • வெளிநாட்டு அலுவல்கள் துறை

- ரூ. 68,270,493.00

• வெளிநாட்டுத் தூதரகங்கள்

- ரூ. 15,371,541.90

• வெளிநாட்டு வேலைவாய்ப்புத் துறை

- ரூ. 1,894,425.48

• சுற்றுலாத்துறை- ரூ.1,672,782.03

(ii) • வெளிநாட்டு அலுவல்கள் துறை - விபரம் இணைப்பு 01*இல் தரப்பட்டுள்ளது. (ஆங்கில இணைப்பு 01ஐப் பார்க்கவும்)

• வெளிநாட்டு வேலைவாய்ப்புத் துறை - விபரம் இணைப்பு 02*இல் தரப்பட்டுள்ளது. (சிங்கள இணைப்பு 02ஐப் பார்க்கவும்)

• சுற்றுலாத்துறை - விபரம் இணைப்பு 03*இல் தரப்பட்டுள்ளது. (ஆங்கில இணைப்பு 03ஐப் பார்க்கவும்)

(iii) • வெளிநாட்டு அலுவல்கள் துறை - விபரம் இணைப்பு 01*இல் தரப்பட்டுள்ளது. (ஆங்கில இணைப்பு 01ஐப் பார்க்கவும்)

• வெளிநாட்டு வேலைவாய்ப்புத் துறை - விபரம் இணைப்பு 02*இல் தரப்பட்டுள்ளது. (சிங்கள இணைப்பு 02ஐப் பார்க்கவும்)

• சுற்றுலாத்துறை - விபரம் இணைப்பு 03*இல் தரப்பட்டுள்ளது. (ஆங்கில இணைப்பு 03ஐப் பார்க்கவும்)

(iv) • வெளிநாட்டு அலுவல்கள் துறை- விபரம் இணைப்பு 04*இல் தரப்பட்டுள்ளது. (ஆங்கில இணைப்பு 04ஐப் பார்க்கவும்)

• வெளிநாட்டு வேலைவாய்ப்புத் துறை - விபரம் இணைப்பு 05*இல் தரப்பட்டுள்ளது. (சிங்கள இணைப்பு 05ஐப் பார்க்கவும்)

• சுற்றுலாத்துறை - விபரம் இணைப்பு 06*இல் தரப்பட்டுள்ளது. (சிங்கள இணைப்பு 06ஐப் பார்க்கவும்)

(ஈ) பொருந்தாது.

(a) (i) The targeted number of persons to be directed for foreign employment for the year 2026 is 250,000.

(ii) According to the computer system of the Sri Lanka Bureau of Foreign Employment, the number of persons who obtained registration with the Bureau of Foreign Employment from 01.01.2026 to 30.06.2026 was 125,018.

(iii) Measures are being taken to conduct employment promotion programmes locally and overseas, in accordance with the 2026 Action Plan.

In order to achieve the above targets, arrangements are being made to conduct employment promotion programmes at national and district levels. Accordingly, the Marketing Division of the Sri Lanka Bureau of Foreign Employment has planned to conduct nine national-level employment promotion programmes, covering all nine provinces of Sri Lanka. So far, six national-level employment promotion programmes have been conducted covering the Southern, Western, Sabaragamuwa, Uva, North Central and North-Western Provinces.

Further, arrangements have already been made to conduct foreign employment promotion programmes in the Northern, Central and Eastern Provinces during this year.

In addition, vocational training guidance programmes covering the entire Island are being conducted by the Marketing Division. So far, 87 such programmes have been conducted through the provincial offices of the Sri Lanka Bureau of Foreign Employment and arrangements have been made to conduct a further 123 programmes.

Furthermore, two foreign employment promotion programmes have been conducted in South Korea and Japan during 2026 and arrangements are being made to conduct one more foreign employment promotion programme during this year.

In addition, discussions were held with foreign missions regarding securing foreign employment opportunities for the Sri Lankan community and enhancing their skills, and the necessary arrangements are being made.

Further, international market surveys are being conducted regarding foreign employment opportunities and the relevant information is being verified through Sri Lankan Embassies and High Commissions in the respective countries with a view to making such opportunities available to the Sri Lankan community.

---

* පුස්තකාලයේ තබා ඇත.

* நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.

* *Placed in the Library.*

[ගරු විජිත හේරත් මහතා]

(b) (i)

	Mission/Post	Designation	Date on which the vacancy occurred	Notes
1	High Commission of Sri Lanka, Ottawa, Canada.	High Commissioner	06.07.2025	Designated
2	Embassy of Sri Lanka, Beijing, China.	Ambassador	01.05.2026	Designated
3	Embassy of Sri Lanka, Berlin, Germany.	Ambassador	16.03.2026	-
4	Embassy of Sri Lanka, Amman, Jordan.	Ambassador	20.01.2026	Designated
5	High Commission of Sri Lanka, Nairobi, Kenya.	High Commissioner	29.11.2024	Designated
6	High Commission of Sri Lanka, Victoria, Seychelles.	High Commissioner	01.12.2024	-
7	Embassy of Sri Lanka, Washington, D.C., United States of America.	Ambassador	01.08.2026	-

(ii) • Number of officers belonging to the Sri Lanka Foreign Service - 31

• Number of externally appointed persons - 12

(c) (i) Foreign Affairs Section - Rs. 8,270,493.00
Sri Lankan Mission abroad - Rs. 15,371,541.90
Foreign Employment Section - Rs. 1,894,425.48
Tourism Section - Rs. 1,672,782.03

(ii) • Foreign Affairs Section - Details are given in Annex 01*.

• Foreign Employment Section - Details are given in Annex 02*. (Please refer Annex 02 in Sinhala.)

• Tourism Section - Details are given in Annex 03*.

(iii) • Foreign Affairs Section - Details are given in Annex 01*.

• Foreign Employment Section - Details are given in Annex 02*. (Please refer Annex 02 in Sinhala.)

• Tourism Section - Details are given in Annex 03*.

(iv) • Foreign Affairs Section - Details are given in Annex 04*.

• Foreign Employment Section - Details are given in Annex 05*. (Please refer Annex 05 in Sinhala.)

• Tourism Section - Details are given in Annex 06*. (Please refer Annex 06 in Sinhala.)

(d) Not relevant.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති: පසු විපරම් යාන්ත්‍රණය

சமூர்த்தி அபிவிருத்தி திணைக்களத்தின் சமூக அபிவிருத்திக் கருத்திட்டங்கள்: பின்னாய்வுப் பொறிமுறை

COMMUNITY DEVELOPMENT PROJECTS OF DEPARTMENT OF SAMURDHI DEVELOPMENT: FOLLOW-UP MECHANISM

2455/2026

3. ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් පසු විපරම් කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එය සිදු කරනු ලබන ආකාරය කවරේද;

(iii) 2026 වර්ෂය සඳහා වැටුප් හා අනෙකුත් පරිපාලන කටයුතු සඳහා සහ සවිබලගැන්වීම් වැඩසටහන් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සවිබලගැන්වූ පවුලක් `දරිද්‍රතාවයෙන් මිදුණු පවුලක්' ලෙස හඳුනාගැනීම සඳහා භාවිත කරන නිර්ණායක හෝ මිනුම් දර්ශක කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சமூர்த்தி அபிவிருத்தி திணைக்களத்தினால் நடைமுறைப்படுத்தப்பட்ட சமூக அபிவிருத்திக் கருத்திட்டங்கள் தொடர்பில் பின்னாய்வுப் பொறிமுறையொன்று நடைமுறையில் உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அது எவ்வாறு மேற்கொள்ளப்படு கின்றது என்பதையும்;

(iii) 2026ஆம் ஆண்டில் சம்பளங்கள் மற்றும் ஏனைய நிருவாக நடவடிக்கைகளுக்காகவும், வலுவூட்டல் நிகழ்ச்சித்திட்டங்களுக்காகவும் ஒதுக்கப்பட்டுள்ள நிதி ஒதுக்கீடுகளின் அளவு வெவ்வேறாக யாது என்பதையும்;

(iv) வலுவூட்டப்பட்ட குடும்பமொன்றை 'வறுமையி லிருந்து விடுபட்ட குடும்பம்' என அடையாளம் காண்பதற்குப் பயன்படுத்தப்படும் அளவு

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

கோல்கள் அல்லது அளவீட்டுக் குறிகாட்டிகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Development, Social Security and Community Empowerment:

(a) Will he inform this House -

(i) whether a follow-up mechanism is in operation regarding the community development projects implemented by the Department of Samurdhi Development;

(ii) if so, the manner in which it is conducted;

(iii) separately, the amount of provisions allocated for salaries and other administrative activities, and for empowerment programmes, for the year 2026; and

(iv) the criteria or indicators used to identify an empowered family as a "family lifted out of poverty"?

(b) If not, why?

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)

(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

(අ) (i) ඔව්.

(ii) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සවිබලගන්වනු ලබන අස්වැසුම ප්‍රතිලාභීන් සහ ක්‍රියාත්මක කරනු ලබන අනෙකුත් ව්‍යාපෘතීන් දෙපාර්තමේන්තු නිලධාරීන් හරහා නිරන්තර අධීක්ෂණය හා පසු විපරම් කිරීමට ලක් කෙරෙන අතර, එය පහත පරිදි ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සිදු කිරීමට සංවිධාන ජාලයක් ක්‍රියාත්මක වේ.

අධීක්ෂණ මට්ටම	වගකීම	අධීක්ෂණය කරනු ලබන කාලය
ජාතික මට්ටම - i	විෂය භාර ගරු අමාත්‍යතුමා, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශ ලේකම්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, අදාළ අංශ භාර අධ්‍යක්ෂවරු	කාර්තුමය
ජාතික මට්ටම - ii	අමාත්‍යාංශ ලේකම්/සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්/ අංශ ප්‍රධානීන්	මාසිකව
දිස්ත්‍රික් මට්ටම	දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, සමෘද්ධි කළමනාකරුවන්	මාසිකව
ප්‍රාදේශීය මට්ටම	ප්‍රාදේශීය ලේකම්, බැංකු සමිති කළමනාකරු, මූලස්ථාන කළමනාකරු, ව්‍යාපෘති කළමනාකරු	මාසිකව
කලාප මට්ටම	සමෘද්ධි බැංකු කළමනාකරු/සමෘද්ධි සංවර්ධන නිලධාරීන් (ක්ෂේත්‍ර)/සංවර්ධන නිලධාරීන්	සතිපතා
ග්‍රාම නිලධාරී වසම	සමෘද්ධි සංවර්ධන නිලධාරී	සතිපතා

එයට අමතරව ප්‍රතිලාභීන් සහ ව්‍යාපෘතීන් පිළිබඳ තොරතුරු EIS පරිගණක පද්ධතියට ඇතුළත් කෙරෙන අතර, එම පද්ධතිය හරහාද වැඩසටහන පසුවිපරම් කිරීම සිදු කරනු ලබයි.

එමෙන්ම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් සඳහා පවත්වනු ලබන මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ද මේ සම්බන්ධ ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කරනු ලබයි.

(iii)

වැය විෂය	වෙන් කර ඇති ප්‍රතිපාදන (රු.)
වැටුප්	22,500,000,000.00
පරිපාලන කටයුතු	680,800,000.00
සවිබල ණය පොලී	500,000,000.00
සවිබලගැන්වීම	3,700,000,000.00

(iv) සවිබලගැන්වූ පවුලක් දරිද්‍රතාවෙන් මිදුණු පවුලක් ලෙස හඳුනා ගැනීම සඳහා පහත පරිදි ආර්ථික, අධ්‍යාපන, සෞඛ්‍ය හා සාමාජීය මිනුම් දර්ශක භාවිත කිරීමට සැලසුම් කර ඇත.

<u>**ආර්ථික මිනුම් දර්ශක**</u>

- ප්‍රතිලාභියෙකුගේ මාසික ඒකපුද්ගල ආදායම අවම වශයෙන් රුපියල් 40,000කින් වර්ධනය වීම.
- පුද්ගල ඉතිරි කිරීම් වාර්ෂිකව අවම වශයෙන් සියයට 10කින් වර්ධනය වීම.

<u>**අධ්‍යාපනික මිනුම් දර්ශක**</u>

- දරුවන් පාසැල් යන වසර ගණන වැඩි වීම
- අස්වැසුම පවුල්වල දරුවන් උසස් අධ්‍යාපනයට යොමුවන ප්‍රමාණය ඉහළ යාම
- විවිධ භාෂා හැකියාවන් සහිත දරුවන් ප්‍රමාණයේ වර්ධනය

<u>**සෞඛ්‍ය මිනුම් දර්ශක**</u>

- පවුලේ දරුවන් අතර මන්දපෝෂණය අවම වීම.

  (වයසට සරිලන බර පැවතීම, උසට සරිලන බර පැවතීම, වයසට සරිලන උස පැවතීම)
- වයස අවුරුදු 05ට අඩු ළමා මරණ අවම වීම
- පවුලේ නිදන්ගත රෝග අවම වීම
- පවුල්වල මත්ද්‍රව්‍ය, දුම්වැටි භාවිතය අවම වීම

<u>**සාමාජීය මිනුම් දර්ශක**</u>

- පවුලේ භෞතික සම්පත් සංවර්ධනය වීම (නිවාස හා සනීපාරක්ෂක පහසුකම්, ගෘහ භාණ්ඩ, වාහන ආදිය)
- නිවසෙහි ගෙබිමෙහි ස්වභාවය (ටයිල් සවි කිරීම වැනි)
- ආහාර පිසීම සඳහා භාවිත කරන ඉන්ධන මාධ්‍යය (දර භාවිතයෙන් ගෑස් භාවිතයට මාරු වීම)
- සෑම නිවසකටම විදුලි පහසුකම් තිබීම
- නිවාස සඳහා පිරිසිදු පානීය ජලය පහසුවෙන් ලබා ගැනීමේ මූලාශ්‍රයන් පැවතීම.

(ආ) අදාළ නොවේ.

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

(අ) (I) ඔව්.

(II) සමුර්ත්ති අපිවිරුත්ති තිණෙක්කළත්තින්මූලම් වලුවූට්ටප්පටුකින්ර අස්වෙසුම පයනාලිකළ් මර්රුම් නටෙමුරෙප්පටුත්තප්පටුකින්ර පිර කරුත්තිට්ටඩ්ඩංකළ් තිණෙක්කළත්තින් උත්තියෝකත්තර්කළ් ඌටාක තොටර්ච්චියාන කණ්කාණිප්පු මර්රුම් පින් පණි ආය්වුකළුක්කු උළ්ළාකුකින්රතුටන්, අතු කීළුළ්ළ පිරකාරම් කිරාමිය මට්ටත්තිලිරුන්තු තේසිය මට්ටම් වරෙ මේර්කොළ්වතර්කාන වලෙයමෙප්පොන්රුම් සෙයර්පටුකින්රතු.

කණ්කාණිප්පු මට්ටම්	පොරුප්පුක්කළ්	කණ්කාණික්කප්පටුකින්ර කාලම්
තේසිය මට්ටම් - I	විටයප් පොරුප්පු කෙළරව අමෙච්චර්, කිරාමිය අපිවිරුත්ති සමූකප් පාතුකාප්පු මර්රුම් සමූක වලුවූට්ටුකෙ අමෙච්චින් සෙයලාළර්, සමුර්ත්ති අපිවිරුත්ති තිණෙක්කළත්තින් පණිප්පාළර් නායකම්, උරිය පිරිවුප් පොරුප්පු පණිප්පාළර්කළ්	තවණෙයඩිප්පටෙයිල්
තේසිය මට්ටම් - II	අමෙච්සුච් සෙයලාළර්/සමුර්ත්ති අපිවිරුත්ති තිණෙක්කළත්තින් පණිප්පාළර් නායකම්/පිරිවුත් තලෙවර්කළ්	මාතාන්තම්
මාවට්ට මට්ටම්	මාවට්ට සෙයලාළර්, මාවට්ට සමුර්ත්ති පණිප්පාළර්, සමුර්ත්ති මුකාමෙයාළර්කළ්	මාතාන්තම්
පිරතේස මට්ටම්	පිරතේස සෙයලාළර්, වංකිච් චංක මුකාමෙයාළර්කළ්, තලෙමෙප්පීට මුකාමෙයාළර්කළ්, කරුත්තිට්ට මුකාමෙයාළර්කළ්	මාතාන්තම්
වලය මට්ටම්	සමුර්ත්ති වංකි මුකාමෙයාළර්කළ්, සමුර්ත්ති අපිවිරුත්ති උත්තියෝකත්තර්කළ් (කළත්තුරෙ)/ අපිවිරුත්ති උත්තියෝකත්තර්කළ්	වාරාන්තම්
කිරාම උත්තියෝකත්තර් පිරිවු	සමුර්ත්ති අපිවිරුත්ති උත්තියෝකත්තර්	වාරාන්තම්

අතර්කු මේලතිකමාක පයනාලිකළ් මර්රුම් කරුත්තිට්ටම් තොටර්පාන තකවල්කළ් EIS කණිනි වලෙයමෙප්පිල් පතිවේර්රප්පටු වතුටන්, අන්ත වලෙයමෙප්පින් ඌටාකවුම් වේලෙත්තිට්ටමානතු පින් පණිවු ආය්වුකළ් මේර්කොළ්ළප්පටුකින්රතු.

මේලුම්, සමුර්ත්ති අපිවිරුත්තිත් තිණෙක්කළත් තින් පණිප්පාළර් තලෙමෙ අතිපතියින් තලෙමෙයිල් සකල මාවට්ට සමුර්ත්ති පණිප්පාළර්කළුක්කාක නටාත්තප්පටුකින්ර මාතාන්ත මුන්නේර්ර මීළාය්වුක් කූට්ටත්තිලුම් ඉවෙ තොටර්පාන මුන්නේර්රන්කළ් තොටර්පිල් කලන්තුරෙයාටප්පටුකින්රතු.

(III)

සෙලවු විටයම්	ඔතුක්කප්පට්ටුළ්ළ නිති ඔතුක්කීටු (රූපාය්)
සම්පළම්	22,500,000,000.00
නිරුවාක නටවටික්කෙකළ්	680,800,000.00
වලුවූට්ටල් කටන් වට්ටි	500,000,000.00
වලුවූට්ටල්	3,700,000,000.00

(IV) වලුවූට්ටප්පට්ට කුටුම්පම් ඔන්රෙ වරුමෙ නිලෙයිල් ඉරුන්තු මීණ්ට කුටුම්පම් ඔන්රාක ඉනඞ්කාණුම් පොරුට්ටු කීළ් කුරිප්පිටප්පටුකින්ර පිරකාරම් පොරුළාතාර, කල්වි, සුකාතාර මර්රුම් සමූක රීතියාන අළවෙ සුට්ටිකළෙ පයන්පටුත්තුවතර්කුත් තිට්ටමිට්ටුළ්ළතු.

<u>පොරුළාතාර රීතියාන අළවෙච් සුට්ටි</u>

- පයනාළි ඔරුවරින් මාතාන්ත තනිනපර් වරුමානමානතු ආකක්කුරෙන්තතු 40,000 රූපායාල් අතිකරිත්තල්.
- තනිනපර් සේමිප්පානතු වරුටාන්තම් ආකක් කුරෙන්තතු 10% ආල් අතිකරිත්තල්.

<u>කල්වි රීතියාන අළවෙච් සුට්ටි</u>

- සිරුවර්කළ් පාටසාලෙ සෙල්කින්ර වරුටඞ්කළින් එණ්ණික්කෙ අතිකරිත්තිරුත්තල්.
- අස්වෙසුම කුටුම්පඞ්කළින් පිළ්ළෙකළ් උයර් කල්වික්කු උළ්ළාකින්ර එණ්ණික්කෙ අතිකරිත්තල්.
- පල්වේරු මොළියාර්රල්කළෙ උටෙය පිළ්ළෙකළින් එණ්ණික්කෙයිල් වළර්ච්චි.

<u>සුකාතාර රීතියාන අළවෙච් සුට්ටි</u>

- කුටුම්පත්තිල් පිළ්ළෙකළුක්කු ඉටෙයේ පෝෂාක්කින්මෙ කුරෙන්තිරුත්තල්. (වයතුක්කුප් පොරුත්තමාන නිර්රෙයෙක් කොණ්ටිරුත්තල්, උයරත්තුක්කුප් පොරුත්තමාන නිර්රෙයෙක් කොණ්ටිරුත්තල්, වයතුක්කුප් පොරුත්තමාන උයරත්තෙක් කොණ්ටිරුත්තල්)
- වයතු 5 වරුටඞ්කළිලුම් කුරෙන්ත සිසු මරණම් කුරෙවටෙන්තු උළ්ළතුම්.
- කුටුම්පත්තිල් නාට්පට්ට නෝය්කළ් කුරෙවාක උළ්ළතුම්.
- කුටුම්පඞ්කළිල් පෝතෙප්පොරුළ් පුකෙත්තල් පාවනෙ කුරෙන්තුළ්ළතුම්.

சமூக ரீதியான அளவைச் சுட்டி

- குடும்பத்தின் பௌதிக வளங்கள் அபிவிருத்தி அடைந்திருத்தல். (வீடு மற்றும் கழிப்பறை வசதிகள், வீட்டுத் தளபாடங்கள், வாகனங்கள் போன்றவை)
- வீட்டின் தரையின் தன்மை. (' டயில்' பதித்திருத்தல்)
- உணவு தயாரிக்கும் பொருட்டு பயன்படுத்துகின்ற எரிபொருள் வகை. (விறகு பாவனையில் இருந்து எரிவாயு பாவனைக்கு மாறுதல்)
- அனைத்து வீடுகளுக்கும் மின்சார வசதிகள் உள்ளமை.
- வீடுகளுக்குத் தூய்மையான குடிநீர் வசதிகளைப் பெற்றுக் கொள்வதற்கான மூலக்கூறுகள் உள்ளமை.

(ஆ) ஏற்புடையதல்ல.

(a) (i) Yes.

(ii) The Aswesuma beneficiaries empowered by the Department of Samurdhi Development and other implemented projects are continuously subjected to monitoring and follow up through department officials and an organizational network operated to facilitate this process from the rural level to the national level as follows:

Monitoring Level	Responsibility	Timeframe for monitoring
National level-i	Hon. Minister in charge of the subject, Secretary to the Ministry of Rural Development, Social Security and Community Empowerment, Director General of the Department of Samurdhi Development, relevant Assistant	Quarterly
National level-ii	Ministry Secretary/Director General of the Department Samurdhi Development/Heads of	Monthly
District level	District Secretary/District Samudhi Director/ Samurdhi Managers	Monthly
Divisional level	Divisional Secretary/Bank District Managers/ Headquarters Managers/Project Managers	Monthly
Zonal level	Samurdhi Bank Managers/ Samurdhi Development Officers (Field)/Development Officers	Weekly
Grama Niladhari Division	Samudhi Development Officers	Weekly

In addition, information regarding beneficiaries and projects is entered into the EIS system, through which ongoing data-based monitoring is conducted.
Furthermore, progress related to this is also discussed at the monthly progress review meetings. held for all district Samudhi Directors, under the chairmanship of the Director General of the Department of Samurdhi Development.

(iii)

Expenditure Item	Allocated Provision (Rs.)
Salaries	22,500,000,000.00
Administrative Activities	680,800,000.00
Interest on Savibala Loans	500,000,000.00
Empowerment	3,700,000,000.00

(iv) It is planned to use the following economic, educational, health and social indicators to identify an empowered family as a family that has been lifted out of poverty.

Economic Indicators

- The monthly individual income of a beneficiary increasing to at least Rs. 40,000.
- Achieving a minimum annual increase of 10 per cent in individual savings.

Educational Indicators

- Increase in the number of years children attend to school.
- Increase in the number of children from Aswesuma families pursuing higher education.
- Increase in number of children with multi -language capabilities.

Health Indicators

- Low level of child malnutrition within the family - proper weight for age, proper weight for height, proper height for age.
- Low percentage of child mortality rate for children under five years.
- Reduction in chronic diseases within the family.
- Reduction of drug addiction and cigarette use within families

Social Indicators

- Development of the physical resources of the family - housing and sanitary facilities, furniture, vehicles et cetera.
- The nature of the flooring - such as being tiled.
- The fuel used for cooking - shifting from using firewood to gas.
- Availability of electricity facilities in every house.
- Access to safe and clean drinking water sources for households.

(b) Not relevant.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.